323 වන කාණ්ඩය - 04 වන කලාපය
தொகுதி 323 - இல. 04
Volume 323 - No. 04

2025 නොවැම්බර් 19 වන බදාදා
2025 நவம்பர் 19, புதன்கிழமை
Wednesday, 19th November, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 637]
පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම [තීරුව 637]
පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 638]
රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 638]
යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම [තීරුව 638]
ගරු දයාසිරි ජයසේකර මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් වන ත්‍රිපුද්ගල කමිටුව [තීරුව 639]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා** [තීරුව 640]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 641-654]

**අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා** [තීරුව 661]

**විසර්ජන පනත් කෙටුම්පත, 2026 – [දහවන වෙන් කළ දිනය]:**
[ශීර්ෂ 130, 253-279, 312-319, 321 (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන); ශීර්ෂ 193, 221, 328 (කම්කරු)] - කාරක සභාවේදී සලකා බලන ලදී [තීරු 662– 872]

**කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව** [තීරුව 873]

**කල්තැබීමේ යෝජනාව:**
විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සීමිත සමාගමක් බවට පත් කිරීමේ යෝජනාව [තීරු 876-892]

**ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු** [තීරු 892-928]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
நிலையியற் கட்டளைகள் பற்றிய குழு: உறுப்பினர் நியமனம் [ப: 637]
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர் பதிலீடு [ப: 637]
சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம் [ப: 638]
ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம் [ப: 638]
உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம் [ப: 638]
கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்களின் நடத்தை தொடர்பில் ஆராய மூவர் அடங்கிய குழு [ப: 639]

**அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்** [ப: 640]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 641-654]

**அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்** [ப: 661]

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026 - [ஒதுக்கப்பட்ட பத்தாம் நாள்]:**
[தலைப்புக்கள் 130, 253-279, 312-319, 321 (பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி); தலைப்புக்கள் 193, 221, 328 (தொழில்)] – குழுவில் ஆராயப்பட்டது [ப: 662 - 872]

**கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு** [ப: 873]

**ஒத்திவைப்புப் பிரேரணை:**
விசேட பொருளாதார மத்திய நிலையங்களை வரையறுக்கப்பட்ட கம்பனியாக மாற்றுவதற்கான முன்மொழிவு [ப:876-892 ]

**வினாக்களுக்கு எழுத்துமூல விடைகள்** [ப:892-928]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Committee on Standing Orders: Nomination of Member [Col. 637]
Committee on Parliamentary Business: Substitution of Member [Col. 637]
Sectoral Oversight Committee on Environment, Agriculture and Resource Sustainability: Nomination of Member [Col. 638]
Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection: Nomination of Member [Col. 638]
Sectoral Oversight Committee on Infrastructure and Strategic Development: Nomination of Member [Col. 638]
Three-Member Committee on the Conduct of Hon. Dayasiri Jayasekara [Col. 639]

MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS [Col. 640]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 641-654]

MINISTERIAL CONSULTATIVE COMMITTEES [Col. 661]

APPROPRIATION BILL, 2026 – [Tenth Allotted Day]:
Considered in Committee – [Heads 130, 253-279, 312-319, 321 (Public Administration, Provincial Councils and Local Government); Heads 193, 221, 328 (Labour)] [Cols. 662– 872]

SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD [Col. 873]

ADJOURNMENT MOTION:
Proposal to Convert Dedicated Economic Centres into a Limited Company [Cols. 876-892]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 892-928]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 නොවැම්බර් 19 වන බදාදා***
*2025 நவம்பர் 19, புதன்கிழமை*
*Wednesday, 19th November, 2025*

**පූ.භා. 9.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.00 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
நிலையியற் கட்டளைகள் பற்றிய குழு: உறுப்பினர் நியமனம்
COMMITTEE ON STANDING ORDERS: NOMINATION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 116හි විධිවිධාන සහ 2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් පී. පෙරේරා මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### II

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர் பதிலீடு
COMMITTEE ON PARLIAMENTARY BUSINESS: SUBSTITUTION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2025 නොවැම්බර් 18 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඩී.වී. චානක මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### III

### පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
சுற்றாடல், கமத்தொழில் மற்றும் வளங்களின் நிலைத்தன்மை பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம்
SECTORAL OVERSIGHT COMMITTEE ON ENVIRONMENT, AGRICULTURE AND RESOURCE SUSTAINABILITY: NOMINATION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111හි විධිවිධාන සහ 2025 මාර්තු 17 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### IV

### රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம்
SECTORAL OVERSIGHT COMMITTEE ON GOVERNANCE, JUSTICE AND CIVIL PROTECTION: NOMINATION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111හි විධිවිධාන සහ 2025 මාර්තු 17 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් පී. පෙරේරා මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

### V

### යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු නම් කිරීම
உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம்
SECTORAL OVERSIGHT COMMITTEE ON INFRASTRUCTURE AND STRATEGIC DEVELOPMENT: NOMINATION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111හි විධිවිධාන සහ 2025 මාර්තු 17 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ

[ගරු කථානායකතුමා]

ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චතුර ගලප්පත්ති මහතා ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## VI

### ගරු දයාසිරි ජයසේකර මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් වන ත්‍රිපුද්ගල කමිටුව
### கௌரவ தயாசிறி ஜயசேக்கர அவர்களின் நடத்தை தொடர்பில் ஆராய மூவர் அடங்கிய குழு
### THREE-MEMBER COMMITTEE ON THE CONDUCT OF HON. DAYASIRI JAYASEKARA

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2025 සැප්තැම්බර් 24 දින සභා ගර්භය තුළ දී පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතාගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ සුනිල් වටගල මහතා විසින් 2025 සැප්තැම්බර් 25 දින පැවැති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සැලකිල්ලට ගෙන, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීම සඳහා නියෝජ්‍ය කථානායක, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතාගේ සභාපතිත්වයෙන් ද, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතාගේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතාගේ සාමාජිකත්වයෙන් ද යුක්ත ත්‍රිපුද්ගල කමිටුවක් මා විසින් පත් කරන ලද බව මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි.

## 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පිළිගන්වන ලද වාර්තා
## நிலைக்கட்டளை இல. 52(6)இன்படி சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
## REPORTS PRESENTED UNDER STANDING ORDER NO. 52(6)

### පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත
### மாகாண சபைத் தேர்தல்கள் (திருத்தம்) சட்டமூலம்
### PROVINCIAL COUNCILS ELECTIONS (AMENDMENT) BILL

"පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ වාර්තාව" - [ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

***පනත් කෙටුම්පත 2025 නොවැම්බර් 20වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයි නියෝග කරන ලදී.***

*சட்டமூலம் 2025 நவம்பர் 20, வியாழக்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்படக் கட்டளையிடப்பட்டது.*

*Bill ordered to be read a Second time upon Thursday, 20th November, 2025.*

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා වාර්තා
## அமைச்சுசார் ஆலோசனைக் குழு அறிக்கைகள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, බලශක්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද, 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 18(3) වගන්තියේ (ඊ) ඡේදය සමඟ කියවිය යුතු 50 වගන්තිය යටතේ ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි සම්බන්ධයෙන් බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 අගෝස්තු 26 දිනැති අංක 2451/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ටී.කේ. ජයසුන්දර මහතා**
(மாண்புமிகு ரீ.கே. ஜயசுந்தர)
(The Hon. T.K. Jayasundara)

Hon. Speaker, I present a petition from Mr. O.K.D. Upul of No. 04, Kurunduwatta, Pelawatta Road, Pitigala.

**ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා**
(மாண்புமிகு (கலாநிதி) நந்தன மில்லகல)
(The Hon. (Dr.) Nandana Millagala)

ගරු කථානායකතුමනි, යටියන්තොට, මහවිල පාර, කෝන්ගහ කොටුව යන ලිපිනයෙහි පදිංචි එච්.එම්. සංජීව නුවන් කුමාර කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)

ගරු කථානායකතුමනි, වග, කහහේන, අංක 440/සී යන ලිපිනයෙහි පදිංචි කේ.බී.ටී.කේ. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -819/2025- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## 2015 සිට සිදු වූ කාන්තාවන්ට එරෙහි ගෘහස්ථ හිංසන සිදුවීම්: විස්තර
### 2015 முதல் நடைபெற்ற பெண்களுக்கு எதிரான குடும்ப வன்முறைச் சம்பவங்கள்: விபரம்
### INCIDENTS OF DOMESTIC VIOLENCE AGAINST WOMEN FROM 2015: DETAILS

853/2025

**2. ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තා වූ ගෘහස්ථ කාන්තා හිංසන සිද්ධීන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගෘහස්ථ කාන්තා හිංසන සිද්ධීන් වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) ගෘහස්ථ කාන්තා හිංසන සිද්ධීන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் இதுவரை இலங்கையில் பதிவான பெண்களுக்கு எதிரான குடும்ப வன்முறைச் சம்பவங்களின் எண்ணிக்கை ஆண்டு வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) பெண்களுக்கு எதிரான குடும்ப வன்முறைச் சம்பவங்களைத் தடுப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) பெண்களுக்கு எதிரான குடும்ப வன்முறைச் சம்பவங்கள் தொடர்பிலான சட்ட நடவடிக்கைகளைத் துரிதமாகச் செயற்படுத்துவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House the -

(i) number of incidents of domestic violence against women that were reported in Sri Lanka in each of the years from 2015 up to the present, separately;

(ii) measures that are taken to prevent incidents of domestic violence against women; and

(iii) measures that are taken to expedite legal action with regard to incidents of domestic violence against women?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
ගරු කථානායකතුමනි, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ජාතික කාන්තා කමිටුවේ ස්ථාපිත 1938 කාන්තා උපකාරක දුරකථන සේවාව වෙත සහ ශ්‍රී ලංකා පොලීසිය වෙත 2015 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ලද ගෘහස්ථ කාන්තා හිංසන පැමිණිලි පහත පරිදි වේ.

| අංකය | වර්ෂය | 1938 කාන්තා උපකාරක දුරකථන සේවය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව | ශ්‍රී ලංකා පොලීසිය වෙත ලද පැමිණිලි සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|
| 01. | 2015 | 399 | 124907 | 125306 |
| 02. | 2016 | 791 | 129494 | 130285 |
| 03. | 2017 | 754 | 127927 | 128681 |
| 04. | 2018 | 846 | 124224 | 125070 |
| 05. | 2019 | 1173 | 124703 | 125876 |
| 06. | 2020 | 2324 | 121513 | 123837 |
| 07. | 2021 | 3499 | 122778 | 126277 |
| 08. | 2022 | 1796 | 137677 | 139473 |
| 09. | 2023 | 2034 | 136221 | 138255 |
| 10. | 2024 | 1534 | 144024 | 145558 |
| 11. | 2025 සැප්තැම්බර් දක්වා | 1114 | 111929 | 113043 |

මේ පැමිණිලිවල එකතුව ගත්තාම බොහෝ වර්ෂවල 125,000කට ආසන්න පැමිණිලි සංඛ්‍යාවක් ලැබිලා තිබෙනවා.

[ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා]

(ii) කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග සහ පොලීසිය විසින් ගන්නා ක්‍රියාමාර්ග විධියට කොටස් දෙකක් යටතේ තමයි උත්තරය සකස් කරලා තිබෙන්නේ.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග:

1. ගෘහස්ථ හිංසනවලට අදාළව ලැබෙන පැමිණිලිවලට අදාළ වින්දිත කාන්තාවන් 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත යටතේ නඩු පැවරීමේ කටයුතු සඳහා නීති ආධාර කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා පොලීසිය වෙතට යොමු කරනවා.

2. ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත පිළිබඳව සහ කාන්තාවන් හා දරුවන් මුහුණ දෙන හිංසනය වැළැක්වීම හා ප්‍රතිචාර දැක්වීම සම්බන්ධව පොලිස් ස්ථානාධිපති වරුන්, පොලිස් ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිවරුන් තුළ සංවේදීභාවය හා ප්‍රතිචාර දැක්වීම වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා, කාන්තා කමිටුව විධියට. එවැනි වැඩසටහන් පසුගිය වසරවල දිගටම සංවිධානය කරලා ඒවා ක්‍රියාත්මක කරලා තිබෙනවා.

| වර්ෂය | දිස්ත්‍රික්කය |
|---|---|
| 2025.02.28 | අනුරාධපුරය |
| 2025.03.11 | හම්බන්තොට |
| 2025.10.17 | මොනරාගල |

3. 2025 වර්ෂයේ ජාතික කාන්තා කමිටු ක්‍රියාකාරී සැලැස්ම යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් කරලා තිබෙනවා.

   - සේවා ස්ථානවල සේවය කරන නිලධාරින් සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනතේ ප්‍රතිපාදන පිළිබඳව දැනුවත් කිරීමේ සහ ආකල්ප සංවර්ධන වැඩසටහන් පවත්වලා තිබෙනවා. මේ වනවිට 2025 වර්ෂය සඳහා රාජ්‍ය අංශයෙ වැඩසටහන් 4ක් පවත්වලා තිබෙනවා.

     මේ විධියට විවිධ වැඩසටහන් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධ කාන්තා කමිටුව හරහා සිදු කරලා තිබෙනවා. ඒ සම්බන්ධ විස්තර ප්‍රමාණයක් තිබෙනවා.

ශ්‍රී ලංකා පොලීසිය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග:

1. දැනුවත් කිරීමේ හා උපදේශන වැඩසටහන් පැවැත්වීම

   ශ්‍රී ලංකා පොලීසියේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යාංශය හා පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථාන මට්ටමින් ස්ථාපිත කර ඇති ළමා හා කාන්තා අපයෝජන නිවාරණ ඒකක සහ මෙම විෂයයට අදාළව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත රජයේ නිලධාරින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරින්, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරින් හා නීති ආධාර සේවා කොමිෂන් සභාවේ දිස්ත්‍රික් නියෝජිතයන් සමඟ එක්ව ගෘහස්ථ හිංසන වළක්වා ගැනීමට අවශ්‍ය උපදේශන වැඩසටහන් පවත්වනු ලබයි. තවද ළමා හා කාන්තා අපයෝජන නිවාරණ ඒකක, මහජන ආරක්ෂක කමිටු හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත රජයේ නිලධරයන්ගේ සහාය ඇතිව ග්‍රාමීය මට්ටමින් දැනුවත් කිරීම් සිදු කරනු ලබයි.

2. කාන්තා හිංසනයට එරෙහිව ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කිරීම

   කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසන සම්බන්ධයෙන් ඉතා කඩිනමින් අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම හා අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා කාන්තා හා ළමා අපයෝජන හා විමර්ශන කාර්යාංශය තුළ 109 හදිසි මෙහෙයුම් මැදිරිය ස්ථාපිත කර ඇති අතර, එමඟින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබයි.

3. නිලධාරින් සඳහා දැනුම හා පුහුණුව ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

   ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන කාර්යාංශය මඟින් පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථාන මට්ටමින් පවත්වාගෙන යනු ලබන ළමා හා කාන්තා අපයෝජන නිවාරණ ඒකකවලට අනුයුක්ත නිලධාරින් සඳහා ජාතික පොලිස් අභ්‍යාස ආයතනය මඟින් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සහ එම පනතේ ප්‍රතිපාදන ක්‍රියාවේ යෙදවීම සම්බන්ධව අවශ්‍ය දැනුම ලබා දීම අරමුණු කර ගනිමින් සහතිකපත් හා ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කර ඇත.

(iii) ජාතික කාන්තා කමිටුව මෙන්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෘහස්ථ කාන්තා හිංසන සිද්ධීන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පහත ක්‍රියාමාර්ග ගනු ලබයි.

1. 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත සංශෝධනය කිරීමට අදාළ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

   ඒකේ අඩුපාඩු ටිකක් තිබෙනවා. ඒක සංශෝධනය කරන්න අවශ්‍ය මූලික කටයුතු මේ වනවිට සිදු වෙමින් යනවා.

2. පොලිස් ළමා හා කාන්තා කාර්යාංශවල නිලධාරින් ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත යටතේ නෛතිකව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව දැනුවත් කිරීම.

3. ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවක් සම්බන්ධ-යෙන් පැමිණිල්ලක් ලද වහාම විමර්ශන පවත්වා ආරක්ෂණ නියෝග ලබා ගැනීම

හා පැමිණිලි පාර්ශ්වයන් අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවන්හිදී දෙපාර්ශ්වයම උපදේශනය සඳහා යොමු කිරීමට කටයුතු කිරීම සිදු කෙරේ.

මොකද අපි දන්නවා, බොහෝවිට එවැනි අවස්ථාවල අධිකරණ ක්‍රියාමාර්ගවලට යන්න කැමැති නැහැ කියලා. ඒ නිසා උපදේශනය සඳහා යොමු කිරීම කරනවා.

4. ගෘහස්ථ කාන්තා හිංසන යටතේ ශ්‍රී ලංකාවේ බලපවත්නා නීතිය ප්‍රකාරව ක්‍රියා කළ යුතු පහරදීම්, අපචාර, ස්ත්‍රී දූෂණ වැනි සිදුවීම් සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වයන්ට එරෙහිව කඩිනමින් අධිකරණ ක්‍රියා--මාර්ගයන්ට එළඹීමට කටයුතු කරනු ලබයි.

5. 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනතේ ප්‍රතිපාදන යටතේ කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවීමට අදාළව එම කොමිෂන් සභාවේ සභාපති ඇතුළුව නියෝජිතයන් මේ වනවිට ගරු ජනාධිපතිතුමා විසින් පත් කර ඇත.

කාන්තාවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් හෝ අත්‍යාසන්න උල්ලංඝනය වීමකදී ඒ සඳහා මැදිහත්වීමේ හැකියාව පවතී. තවද, අයිතිවාසිකම් කඩවූවන්ගේ පැමිණිලි ලබා ගැනීම, ඒවා විමර්ශනය කිරීම හා ඊට අදාළ යම් නඩු කටයුතුවලදී එකී අධිකරණවල අවසරය සහිතව ඊට මැදිහත්වීම මෙන්ම සිය මෙහෙයවීමෙන් නඩු පැවරීමටද හැකියාව පවතී.

ඒ කියන්නේ, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබලගැන්වීමේ පනත යටතේ කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාව පිහිටුවන්න අවශ්‍ය නීතිමය තත්ත්වය සකස් වෙලා තිබෙනවා. පසුගිය කාලයේ ඒක පිහිටුවන්න කටයුතු කරලා තිබුණේ නැහැ. මේ වෙනකොට එම කොමිෂන් සභාවට අදාළ සාමාජිකයන් හත්දෙනා පත් කර තිබෙනවා. ඒ වාගේම සභාපති පත් කර තිබෙනවා. ඊට අමතරව විධායක අධ්‍යක්ෂවරයෙක් අවශ්‍යයි. ඒ වාගේම cadre එකක් අනුමත කර ගන්න අවශ්‍යයි. ඒ වාගේම කොමිසම පැවැත්වීමට තැනක් සකස් කර ගන්න ඕනෑ. ඒ ක්‍රියාවලිය අවසන් වුණාම කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසම බලාත්මක වෙනවා.

තවද, මෙම පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කාන්තා අයිතිවාසිකම් සඳහා වන පාර්ලිමේන්තු කොමසාරිස් යනුවෙන් හඳුන්වනු ලබන තැනැත්තෙකුද පත් කළ යුතුව ඇත.

ඒ කියන්නේ, ඔම්බුඩ්ස්මන්වරයෙක් පත් කරන්න මේ සම්මත වෙලා තිබෙන පනතට අනුව තීරණය කර තිබෙනවා. තවම ඒ පත් කිරීම කරලා නැහැ. ඒ පත් කිරීම කර ගන්න අවශ්‍ය වෙනවා.

එසේම කාන්තා අභිවෘද්ධිය සහ සවිබලගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සකස් කරන්නත් මේ පනත අනුව කාන්තාවන් පිළිබඳ ජාතික කොමිසමට බලය ලැබී තිබෙනවා. ඉදිරියේදී ඒ සම්බන්ධයෙනුත් අවශ්‍ය කටයුතු කරනවා.

6. ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය හා ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය සමඟ ඉදිරියේදී එළිදැක්වීමට අදහස් කර ඇති ඒකාබද්ධ පැමිණිලි වාර්තා කිරීමේ පද්ධතිය අනුව පැමිණිලි ද්විකරණය වැළැක්වේ. එමෙන්ම ඒකාබද්ධ ප්‍රවේශයෙන් විසඳුම ලබාදෙන තෙක් පැමිණිල්ල විමර්ශනය කෙරේ.

(ආ) අදාළ නොවේ.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වර්තමානයේ අපේ රටේ කාන්තා හිංසනය ශීඝ්‍රයෙන් වැඩිවීමක් දක්නට ලැබෙනවා.

විශේෂයෙන්ම සියයට 20ක් කාන්තාවන්, ඒ කියන්නේ පහෙන් එකක් ගෘහස්ථ හිංසනයට ලක් වෙනවා. ඒ වාගේම ඔබතුමා සඳහන් කළා, 1938 helpline එක හරහා දළ වශයෙන් 2,000කට ආසන්න සංඛ්‍යාවක් ගෘහස්ථ හිංසන සම්බන්ධයෙන් පැමිණිලි කර තිබෙනවා කියලා. මේ ආකාරයට පැමිණිලි කිරීමෙන් පසුව ගන්නා ක්‍රියාමාර්ග කෙටියෙන් සඳහන් කරන්න පුළුවන් නම් හොඳයි. මොකද, ඔබතුමාගේ පිළිතුරෙහි සඳහන් කළා, කඩිනම් පියවර ගන්නවා කියලා. ඒ මොනවාද කියලා මම දැනගන්න කැමැතියි. මොකද, මේ අවස්ථාවේ ජනතාව දැනුවත් වුණොත් හොඳයි කියලා මම හිතනවා.

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன)
(The Hon. (Dr.) Namal Sudarshana)

ගරු කථානායකතුමනි, ජාතික කාන්තා කමිටුව විසින් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව මම පිළිතුරේදීත් සඳහන් කළා. ජාතික කාන්තා කමිටුවට පැමිණිලි ලැබුණාම, එම කමිටුව හරහා නීති ආධාර කොමිෂන් සභාවට සහ ශ්‍රී ලංකා පොලීසියට එම පැමිණිලි යොමු කරනවා. ඊට අමතරව, කාන්තාවන්ගේ ගැටලු සම්බන්ධයෙන් මැදිහත් වෙන්න උපදේශන සේවයකුත් ක්‍රියාත්මක වනවා. පොලීසිය විසින් තමයි ඒ අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන්නේ. ජාතික කාන්තා කමිටුවට ලැබෙන පැමිණිලි පොලීසිය වෙත සහ නීති ආධාර කොමිෂන් සභාවට යොමු කිරීමක් තමයි එම කමිටුව හරහා සිද්ධ කරන්නේ.

**ගරු නීතිඥ චමින්ද්‍රානී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා අහනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව. මේ දවස්වල පාර්ලිමේන්තුවේ කථා කරනකොටත් "කාන්තා හිංසනය" කියලා හැම තිස්සෙම මේ පිළිබඳව කියනවා. හැබැයි අපි පැහැදිලිව කිව්වා, රටේම කාන්තා හිංසනය සම්බන්ධයෙන් වූ වගකීම ඔබතුමන්ලා භාර ගෙන ඒ වැඩ කටයුත්ත හරියට කරන්න ඕනෑය කියලා. මොකද, 'කරනවා, කරනවා' කියලා කියනවා. ආරච්චිකට්ටුව

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වයස අවුරුදු 21ක ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරියට කරපු හිංසනය සම්බන්ධව ඔබතුමන්ලා පක්ෂයක් හැටියට එක පැත්තකින් තීන්දුවක් ගත්තා වෙන්න පුළුවන්. නමුත්, ආණ්ඩුව හැටියට රටේ කාන්තා හිංසනය සම්බන්ධව ගත්ත තීන්දුව මොකක්ද?

ඒකෙදි දෙවැනි වතාවටත් හිංසනයක් කළා. මොකද, මේ පිළිබඳව මාධ්‍යයෙන් අහනකොට සභාපතිවරයා එම මන්ත්‍රීතුමියට නැවත වතාවක් කියනවා, "බුරු දෙනක්" කියලා. ඒ වාගේ අපහාස කරන්න කාටවත් අයිතියක් නැහැ. ඔයගොල්ලන් හැම කෙනෙකුටම වාගේ නෝනා කෙනෙක් ඉන්නවා, දරුවෝ ඉන්නවා, අම්මලා ඉන්නවා. මේ රටේ හැම කෙනෙක්ම කාන්තාවන්ට ගරු කරනවා. හැබැයි අපි ආණ්ඩුවෙන් අහනවා, ඒ සිද්ධිය සම්බන්ධව ගත් තීන්දුව මොකක්ද කියලා. නීතිමය තත්ත්වය පැත්තක තියන්න; අධිකරණය ඉදිරියට ගිහිල්ලා ගන්න තීන්දුව පැත්තකින් තියන්න. හැබැයි, අමාත්‍යාංශය හැටියට, ආණ්ඩුව හැටියට කාන්තා හිංසනය සම්බන්ධව ගත් තීන්දුව මොකක්ද කියලා ප්‍රකාශයක් කරන්න කියලා මා ඉල්ලනවා.

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன)
(The Hon. (Dr.) Namal Sudarshana)
ඔබතුමා අදාළ සිද්ධිය සම්බන්ධව පැමිණිල්ලක් කරන්න. එතකොට ඒකට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනෙයි.

ගරු කථානායකතුමනි, මම පැහැදිලිව ප්‍රකාශ කළා, කාන්තා කොමිසම පිහිටුවන්න පවා අපි අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙන බව. මේ කාන්තා කොමිසම පිහිටුවන්න අවශ්‍ය ක්‍රියාමාර්ග කාලයක් තිස්සේ අරගෙන තිබුණේ නැහැ. ඒකට අවශ්‍ය මූලික වැඩ පිළිවෙළ අපි සකස් කර තිබෙනවා. කාන්තා කොමිසම පිහිටුවීම අතිශයින්ම වැදගත් කාර්යයක්. කාන්තා කොමිසම කියන්නේ, නඩු පවරන්න පුළුවන් ආකාරයේ නෛතිකභාවයක් පවා තිබෙන එකක්. ඒ අනුව කාන්තා කොමිසම පත් කරන්න අවශ්‍ය කටයුතු අපි මේ වන විට සූදානම් කරලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -1270/2025- (2), ගරු සුජීව දිසානායක මහතා.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)
ගරු කථානායකතුමනි, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදලට පරිත්‍යාග කරන ලද ඉඩම: විස්තර
රெஜீ ரணதுங்க கல்விசார் புலமைப் பரிசில் நிதியத்துக்கு நன்கொடையாக வழங்கப்பட்ட காணி: விபரம்
LAND DONATED TO REGGIE RANATUNGA EDUCATIONAL SCHOLARSHIP FUND: DETAILS

1295/2025

**4. ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) දිළිඳු දරුවන්ගේ අධ්‍යාපනික, සෞඛ්‍ය සහ සමාජ සුබසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 'රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල', 2000 අංක 28 දරන (සංස්ථාගත කිරීමේ) පනත අනුව පිහිටුවා ඇති බවත්;

(ii) ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ, පන්සිල්ගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් පර්චස් 100ක පමණ විශාලත්වයකින් යුතු ඉඩමක් 2003.04.07 දින එයට පරිත්‍යාග කරන ලද බවත්;

(iii) 2005 වර්ෂයේදී ඉහත ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදිකර වෘත්තීය පුහුණු ආයතනයක් ආරම්භ කරන ලද අතර 2021 වර්ෂයේදී එම ආයතනය වසා දමන ලද බවත්;

(iv) 2023 වර්ෂයේදී එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර, එම ඉඩම වටා කම්බි ගසා, ගේට්ටුවක් සවිකර, එම ඉඩමේ පොල් පැළ සිටුවා එය පෞද්ගලික භුක්තියට නතු කර ගැනීමට කූට ලෙස හා වංචනික ලෙස කටයුතු කර ඇති බවත්;

එතුමිය දන්නේද?

(ආ) ඉහත ඉඩම පොදු ජනතාවගේ පොදු කටයුතු සඳහා රජයේ සුදුසු ආයතනයක් වෙත පැවරීමට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) 2000ஆம் ஆண்டின் 28ஆம் இலக்க (கூட்டிணைத்தல்) சட்டத்தின் பிரகாரம், வறிய பிள்ளைகளின் கல்வி, சுகாதாரம் மற்றும் சமூக நலன்களை மேம்படுத்தும் நோக்கில் 'ரெஜீ ரணதுங்க கல்விசார் புலமைப் பரிசில் நிதியம்' ஆரம்பிக்கப்பட்டது என்பதையும்;

(ii) கம்பஹா மாவட்டத்தில், மினுவங்கொட, பன்சில்கொட கிராம அலுவலர் பிரிவிலுள்ள 100 பேர்ச்சஸ் பரப்பளவு கொண்ட காணி, 2003.04.07ஆம் திகதி அந்நிதியத்துக்கு நன்கொடையாக வழங்கப்பட்டது என்பதையும்;

(iii) 2005ஆம் ஆண்டு, மேற்படி காணியில் கட்டடமொன்று நிர்மாணிக்கப்பட்டு, தொழிற் பயிற்சி நிலையமொன்று ஆரம்பிக்கப் பட்டதுடன், 2021ஆம் ஆண்டு அந்நிலையம் மூடப்பட்டது என்பதையும்;

(iv) 2023ஆம் ஆண்டு, அக்கட்டடத்தை உடைத்த கற்றி, மேற்படி காணியைச் சுற்றி கம்பி வேலி அமைத்து, வாயிற்கததவை பொருத்தியது மாத்திரமன்றி, அக்காணியில் தென்னங் கன்றுகளையும் நாட்டி, அதனை தனியார் உடைமை கொள்வதற்கான நடவடிக்கைகள் மோசடியான முறையில் மேற்கொள்ளப் பட்டுள்ளன என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) மேற்படி காணியைப் பொது மக்களின் பொதுப் பயன்பாட்டுக்காக, பொருத்தமான அரச நிறுவனம் ஒன்றிடம் கையளிப்பதற்கு மேற்கொள்ளக்கூடிய நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Is she aware that-

(i) the "Reggie Ranatunga Educational Scholarship Fund" was established with the aim of promoting the educational, health and social welfare of poor children under Incorporation Act, No. 28 of 2000;

(ii) a land of about 100 perches in extent belonging to the Pansilgoda Grama Niladhari Division, Minuwangoda, Gampaha District was donated to the Fund on 07.04.2003;

(iii) a building was constructed on this land in 2005 and a vocational training institute was started, but the institute concerned was closed down in 2021; and

(iv) in 2023, the building was demolished, the land was fenced, a gate was constructed and coconut trees were planted on the said land, thereby acting illegally and fraudulently to acquire the said land for private possession?

(b) Will she inform this House of the steps that can be taken to transfer the land to an appropriate government institution for use for public purposes?

(c) If not, why?

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) දිළිඳු දරුවන්ගේ අධ්‍යාපනික, සෞඛ්‍ය සහ සමාජ සුබ සාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් "රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල" 2000 අංක 28 දරන (සංස්ථාගත කිරීමේ) පනත අනුව පිහිටුවා ඇති බව සනාථ කිරීම සඳහා විධිමත්ව ලද තොරතුරු අප අමාත්‍යාංශය සතුව නැත.

(ii) ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ පන්සිල්ගොඩ ග්‍රාම නිලධාරි වසමට අයත් පර්චස් 100ක පමණ විශාලත්වයකින් යුතු ඉඩමක් 2003.04.07 දින එයට පරිත්‍යාග කරන ලද බව සනාථ කිරීම සඳහා තොරතුරු අප අමාත්‍යාංශය සතුව නැත.

(iii) ඉහත ඉඩම "රෙජී රණතුංග ශිෂ්‍යත්ව අරමුදල" මඟින් 2007.03.05 දින එකඟතා ගිවිසුමක් මත එම වර්ෂයේ සිට වසර 10ක කාලයක් සඳහා ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යෑම සඳහා ලබා දී ඇති නමුත්, 2021 වර්ෂයේදී ශිලා බැසීමේ අවදානමකට ලක්වීම හේතුවෙන් එම ස්ථානයෙන් ඉවත් කරගෙන අලුත්වැඩියා කටයුතු සඳහා අදාළ වත්කම්ද සමඟ නැවත "රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල" වෙත භාර දී ඇත.

(iv) 2021 වර්ෂයෙන් පසුව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය, රෙජී රණතුංග ශිෂ්‍යත්ව පදනම සමඟ සහ එම ගොඩනැඟිල්ල සඳහා කිසිදු බැඳියාවක් ඇති කරගෙන නොමැති අතර, එම ගොඩනැඟිල්ල හා ඉඩම සඳහා කිසිදු අයිතිවාසිකමක්ද නොදරයි.

(ආ) මෙම ඉඩම හා ගොඩනැඟිල්ල සඳහා මෙම අමාත්‍යාංශය කිසිදු අයිතිවාසිකමක් නොදරන බැවින් මේ පිළිබඳ පිළිතුරු ලබා දිය නොහැක.

(ඇ) අදාළ නොවේ.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. අප සතුව තිබෙන තොරතුරු අනුව, රෙජී රණතුංග අධ්‍යාපනික ශිෂ්‍යත්ව අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත යටතේ තමයි මෙය පිහිටුවා තිබෙන්නේ.

ඒ ඉඩම බෙදන අවස්ථාවේදී ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම මත ඒ ජනතාවට යහපතක් වීමේ අරමුණින් රණතුංග පදනමට එය ලබා දීලා තිබෙනවා. එහිදී ඒ වෙනුවෙන් අත්සන් කරලා තිබෙන්නේ හිටපු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා. නමුත්, එතුමා 2005 වර්ෂයේදී එම ඉඩමේ ගොඩනැඟිල්ලක් ඉදිකරලා ජනතාවට යම් සේවාවක් සැපයීමට ක්‍රියාමාර්ග අරගෙන, 2021දී එම ආයතනය වහලා 2023දී එම ගොඩනැඟිල්ල කඩා ඉවත් කරලා ඒ ඉඩමේ කම්බි වැටක් ගහලා පොල් හිටවලා තිබෙනවා. හේතුව, 2021දී එම ගොඩනැඟිල්ල කඩා ඉවත් කර ගත්තාට පස්සේ ඒ ප්‍රදේශයේ ජනතාව විසින් ක්‍රීඩා තරග සඳහා, අවුරුදු උත්සව පැවැත්වීම සඳහා ඒ පොදු ඉඩම පාවිච්චි කළා. ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින් ඉතා කූට ලෙස -වංචනික ලෙස- ඉතිහාසය පුරාම කළේ මිනිස්සුන්ගේ ඉඩම් කොල්ල කෑමේ ක්‍රියාදාමය. ඒ එක් ක්‍රියාදාමයක් විදියට තමයි, මේ ඉඩමත් කොල්ල කාලා එතුමාගේ පෞද්ගලික දේපළක් විදියට සලකා වැට ගහලා තිබෙන්නේ. ඒ නිසා මම ඔබතුමියගෙන් ඉල්ලීමක් කරනවා, පොදු දේපළ අවභාවිත කරන පුද්ගලයන්ට එරෙහිව යම් ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් නම් ගන්නා ලෙස.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, ඒ පිළිබඳව ගරු මන්ත්‍රීවරයාට කරන්න තිබෙන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරන එක. අධ්‍යාපන අමාත්‍යාංශයට මේ පිළිබඳව කිසිම සම්බන්ධයක් නැහැ.

**ගරු රුවන්තිලක ජයකොඩි මහතා**
(மாண்புமிகு ருவன்திலக்க ஜயக்கொடி)
(The Hon. Ruwanthilaka Jayakody)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න වෙන්නේ මෙහි පදනම සම්බන්ධයෙනුයි. මොකද, ඒක ලියාපදිංචි වෙලා නැති නිසා. ගරු අග්‍රාමාත්‍යතුමියනි, ඒ පදනම, ඒ සංස්ථාගත අරමුදල පිහිටුවා ඇති බවට අප ළඟ යම් ලේඛන වගයක් තිබෙනවා. මම ඒවා ඉදිරිපත් කරන්නම්. ඒ පදනම විධිමත් ලෙස නියාමනය වෙලා නැහැ කියලා තමයි අපට තිබෙන දත්ත අනුව පෙනෙන්න තිබෙන්නේ.

ඒ නිසා මම ඉල්ලීමක් කරනවා, ඒවාත් එක්ක මේක විධිමත් ලෙස නියාමනය වෙලාද කියන එක සම්බන්ධයෙන් සොයා බලා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

ගරු කථානායකතුමනි, පැමිණිල්ලක් ලැබුණොත් අදාළ ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. හැබැයි, අපේ අධ්‍යාපන අමාත්‍යාංශයට මේ පිළිබඳ කිසිම තොරතුරක් නැහැ. අපිත් එක්ක ලියාපදිංචි වෙච්ච එකක් නොවෙයි මේක.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 5 -1336/2025- (1), ගරු ලාල් ප්‍රේමනාත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

## සීමාසහිත රංගිරි දඹුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය: වංචා පිළිබඳ චෝදනා
## வரையறுக்கப்பட்ட ரங்கிரி தம்புள்ளை பல்நோக்குக் கூட்டுறவுச் சங்கம்: மோசடி தொடர்பான குற்றச்சாட்டுகள்
## RANGIRI DAMBULLA MULTI-PURPOSE CO-OPERATIVE SOCIETY LIMITED: ALLEGED FRAUDS

819/2025

**1. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සීමාසහිත රංගිරි දඹුල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ විශාල වංචා රැසක් සිදු වී ඇති බව දන්නේද;

(ii) එම වංචාවල ස්වරූපය කවරේද;

(iii) එම වංචා සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வரையறுக்கப்பட்ட ரங்கிரி தம்புள்ளை பல்நோக்குக் கூட்டுறவுச் சங்கத்தில் பாரியளவிலான பல மோசடிகள் இடம்பெற்றுள்ளன என்பதை அறிவாரா;

(ii) மேற்படி மோசடிகளின் தன்மை யாது;

(iii) மேற்படி மோசடிகள் தொடர்பாக மேற்கொள்ளப்படுகின்ற நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce, Food Security and Co-operative Development:

(a) Will he inform this House -

(i) whether he is aware that a large number of massive frauds had been committed in Rangiri Dambulla Multi-purpose Co-operative Society Limited;

(ii) the nature of those frauds; and

(iii) the actions that are being taken in relation to the frauds referred to above?

(b) If not, why?

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මෙම සමුපකාර සමිතියේ කටයුතු සම්බන්ධව ලැබී ඇති සාමාජික පැමිණිලි ලිපියක සඳහන් කරුණු සම්බන්ධව මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 4 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 46(1) වගන්තිය යටතේ පරීක්ෂණයක් මේ වනවිට මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් විසින් සිදු කෙරෙමින් පවතී.

(ii) 46(1) වගන්තිය ප්‍රකාරව සිදු කරන පරීක්ෂණය අවසන් වීමෙන් අනතුරුව වංචා හා අක්‍රමිකතා සිදුව ඇත්නම් ඒ බව අනාවරණය වනු ඇත.

පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව දැනටමත් සිදු කර ඇති විශේෂ විගණනයට අනුව 1973 සමුපකාර රීති මාලාවේ 22 (i) වගන්තිය අනුව විධිමත් අනුමැතීන් රහිතව සමිතියේ මහ සභා නියෝජිතයින් 91දෙනෙකුට රුපියල් 885,703ක් වටිනා භාණ්ඩ මලු බෙදා දීම සම්බන්ධයෙන් ඒ සඳහා වගකිව යුතු අයගෙන් එම මුදල අය කර ගැනීමට අධිභාර කිරීම සඳහා අධිභාර සහතික සමිතියේ හිටපු අධ්‍යක්ෂවරු වෙත නිකුත් කර ඇත.

මෙම අධිභාර සහතික මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම හා එකී අධිභාර කටයුතු ගරු මහෙස්ත්‍රාත් අධිකරණය වෙත මුදල් අය කර ගැනීම සඳහා ඉදිරිපත් කිරීම වළක්වාලන ලෙසට

සර්ටියෝරාරි රිට් ආඥාවක් නිකුත් කරන ලෙසත්, එතෙක් ඉහත කටයුතු වළක්වාලමින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරන ලෙසත් අභියාචනාධිකරණය, කොළඹ වෙත CA/WRIT/966/2025 අංකය යටතේ වගඋත්තර පාර්ශ්වය නඩුවක් ගොනු කර ඇත.

(iii) I. 1982 පොදු දේපළ විෂයෙහිලා සිදු කරන වැරදි පිළිබඳ පනත යටතේ කටයුතු කිරීම.

II. මධ්‍යම පළාතේ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 58 යටතේ ආරවුල් බේරුම්කරණය කිරීම හා බේරුම්කරණ තීන්දු මත අදාළ මුදල අය නොවුවහොත් එය අය කර ගැනීම සඳහා සමුපකාර සමිති ප්‍රඥප්තියේ 59 වගන්තිය අනුව එම තීන්දුව ගරු අධිකරණයට යොමු කිරීම.

III. මුදල් අය කර ගැනීම සඳහා මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය අනුව අධිභාර ක්‍රියාවලියකට යොමු වීම.

IV. 46(1) පරීක්ෂණය අනුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුගෙන් යම් මුදලක් අයවීමට ඇති බව තහවුරු වුවහොත් ඔවුන්ගේ ධුරයන් අහෝසි කිරීම.

V. සේවකයන් යම් විනය වරදක් සිදු කර ඇති බවට අනාවරණය වුවහොත් මධ්‍යම පළාත් සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය හා එම රෙගුලාසි අනුව විනය ක්‍රියාමාර්ග ගැනීම.

(ආ) අදාළ නොවේ.

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම්: විස්තර

## காணிச் சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகள்: விபரம்

## LANDS OWNED BY LAND REFORM COMMISSION: DETAILS

1336/2025

**5. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු ලාල් ප්‍රේමනාත් මහතා වෙනුවට)**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு லால் பிரேமநாத் சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. Lal Premanath)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණු මේ වනවිට ඉටුවී තිබේද;

(ii) එම කොමිෂන් සභාවට අයත් මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) රජයේ ඉඩම් අයත්ව තිබෙන රජයේ ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන කවරේද;

(v) එම එක් එක් ආයතනයට අයත් ඉඩම් අතරින් වෙනත් පාර්ශ්ව වෙත පවරා ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) காணிச் சீர்திருத்த ஆணைக்குழு தாபிக்கப்பட்டமைக்கான நோக்கம் தற்போது நிறைவேறியுள்ளதா என்பதையும்;

(ii) அந்த ஆணைக்குழுவுக்குச் சொந்தமான அனைத்துக் காணிகளினதும் மொத்த அளவு எவ்வளவு என்பதையும்;

(iii) அரசாங்கக் காணிகளைத் தம்வசம் கொண்டுள்ள அரசாங்க நிறுவனங்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iv) அந்த நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்;

(v) மேற்படி ஒவ்வொரு நிறுவனத்துக்கும் சொந்தமான காணிகளில் வேறு தரப்பினருக்குக் கையுதிர்க்கப்பட்ட காணிகளின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether the objectives of establishing the Land Reform Commission have been achieved by now;

(ii) the total extent of land owned by the said Commission;

(iii) the number of government institutions which own State lands;

(iv) the names of the aforesaid institutions; and

(v) the extent of lands disposed to other parties, out of the lands owned by each of the aforesaid institutions, separately?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) බොහෝ අරමුණු ඉටුවී ඇත.

(ii) 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත මඟින් ප්‍රකාශිත ඉඩම් ප්‍රමාණය අක්කර 1,418,391 රූඩ් 3 පර්චස් 37 හා අංක 39 දරන පනත මඟින් ප්‍රකාශිත ඉඩම් ප්‍රමාණය අක්කර 418,754 රූඩ් 2 පර්චස් 28කි.

උක්ත ප්‍රකාශිත ඉඩම් අතුරින් වරින්වර සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ මෙම කොමිෂන් සභාවට පැවරී ඇති ඉඩම් දිස්ත්‍රික් මට්ටමින් පැවරී ඇති අතර, පවරා ගැනීමේදී පැවරුණු සමස්ත ඉඩම් ප්‍රමාණය මැනුම් කර නොමැත. **(ඇමුණුම**)** මේ වනවිට පිළියෙල කර ඇති ඉඩම් ලේඛනයට අනුව හඳුනා ගනු ලැබූ ඉඩම් මිනින්දෝරු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වී සිතියම්ගත කරමින් පවතී.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

---

***** පුස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු අමිර්තනාදන් අඩෛක්කලනාදන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය ඊයේ සවස 4.00ට තමයි අමාත්‍යාංශයට ලැබී තිබෙන්නේ. නමුත්, අපි පිළිතුර ලැහැස්ති කරගෙන ඇවිත් තිබෙනවා. මොකද කරන්නේ? *[බාධා කිරීමක්]* දැන් වේලාව පෙර වරු 9.26යි නේ. මේවාත් සටහන් කරගන්න, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි,- *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම හිතුවා, මේ ප්‍රකාශය කිරීම සඳහා මට අවස්ථාව ලැබෙයි කියලා. ගරු කථානායකතුමනි, බදුල්ල දුම්රිය මාර්ගයේ ඉදල්ගස්හින්නත්, ඔහියත් අතරදී අනාරක්ෂිත යැයි NBRO එකෙන් හඳුනාගෙන තිබුණු ස්ථානයක් ආරක්ෂිත තත්ත්වයට පත් කිරීම සඳහා එහි තිබූ rock එක ඊයේ රාත්‍රියේදී blast කරලා තිබෙනවා. ඒක හදාගෙන යන අවස්ථාවේදී තමයි නැවත එම රේල් පාරට ගල් වැටිලා එම මාර්ගයේ දුම්රිය ධාවන කටයුතු නතර වෙලා තිබෙන්නේ. දැනට ත්‍රිවිධ හමුදාවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයිනුත්, ඒ වාගේම ඒ rock එක blast කරපු, නැත්නම් destroy කරපු contractorsලාත් එතැනට mobilize වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, හෙට රාත්‍රිය වනවිට එම දුෂ්කරතාව ඉවත් කරලා බදුල්ල දුම්රිය මාර්ගයේ දුම්රිය ධාවනය කරවන්න අපි උත්සාහ කරනවා. අද දවසේ නානුඔය දක්වා දුම්රිය වැඩ කරනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, විපක්ෂය වෙනුවෙන් වැදගත් අදහසක් ඉදිරිපත් කරන්න තිබෙනවා. බාධා කිරීමකින් තොරව මට මිනිත්තුවක කාලයක් ලබා දෙන්න. මිනිත්තුවක කාලයක් දුන්නොත් ඇති.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නයක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරනකොටත් කිව්වා, පළාත් සභා මැතිවරණයට මුදල් වෙන් කරලා තිබෙනවා, පාර්ලිමේන්තුවෙන් ඒ සඳහා ක්‍රමයක් සකස් කරලා දෙන්න කියලා. ඊයේ පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සභානායකතුමා අදහසක් දුන්නා, ඒ පිළිබඳව කමිටුවක් පත් කිරීම සම්බන්ධව විෂය භාර ඇමතිවරයා අද දවසේ මේ සභාව දැනුවත් කරන බවට. අපි කියන්නේ මෙයයි. රජය ජනතාවට පොරොන්දු වුණා, වසරක් ඇතුළත පළාත් සභා මැතිවරණය පවත්වනවා කියලා. පැරණි මිශ්‍ර සමානුපාතික ක්‍රමයට මේ මැතිවරණය පවත්වනවා නම් ඉතා ඉක්මනින් මැතිවරණය පවත්වන්න පුළුවන්කම තිබෙන නිසා විපක්ෂයක් හැටියට ඒ සඳහා අපේ සම්පූර්ණ සහයෝගය දෙන්න ලැහැස්තියි.

අනවශ්‍ය විධියට සීමා නිර්ණයවලටයි, කමිටුවලටයි කියලා කල් මරන්නේ නැතුව කටයුතු කරන්න. ඒ සඳහා අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන්න ලැහැස්ති බව අපි ප්‍රකාශ කරනවා. පැරණි මිශ්‍ර සමානුපාතික ක්‍රමයට, එහෙම නැත්නම් මොනවා හෝ ක්‍රමයකින් ඉක්මන් මැතිවරණයක් පැවැත්වීමේ ක්‍රමයකට අපේ සහාය ලැබෙන බව අපි රජයට ප්‍රකාශ කර සිටිනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ඉදිරිපත් කරපු කාරණයේදී මගේ නම සඳහන් කළ නිසාත්, එම කාරණාව වැදගත් නිසාත් මම ඒ සම්බන්ධයෙන් කියන්න ඕනෑ. ගරු කථානායකතුමනි, අද දිනයේදී රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා මේ පිළිබඳව නිවේදනයක් කරන්න සූදානම් වෙලා ඉන්නවා. අපි ඒ ගැන දැනුම් දුන්නා. නමුත්, ඊට කලින් ගයන්ත මන්ත්‍රීතුමා මේ ගැන අවධානය යොමු කිරීම ගැන එතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමා එම නිවේදනය පසුව ඉදිරිපත් කරයි. ඡන්ද ක්‍රමය පිළිබඳව, මැතිවරණයක් පවත්වන්නේ කොහොමද කියන එක පිළිබඳව නිසි

ක්‍රමයක් තිබෙන්න ඕනෑ. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, දැනට සම්මත වෙලා තිබෙන ඡන්ද ක්‍රමයේ තිබෙන්නේ ප්‍රාදේශීය සභා ක්‍රමය අනුවම සකස් කරපු කේවල සහ අනුපාත මිශ්‍ර ක්‍රමය. දැනට බලපැවැත්වෙන පළාත් සභා ඡන්ද නීතියක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒක තමයි මිශ්‍ර ක්‍රමය මත පැවැත්වෙන ඡන්ද නීතිය. එහි technical කොටසක් තමයි සීමා නිර්ණය කියන්නේ. සීමා නිර්ණය නැතිකම තමයි දැනට තිබෙන ප්‍රශ්නය. විපක්ෂයට හෝ ආණ්ඩු පක්ෂයට විවිධ අදහස් තිබෙන්න පුළුවන්, මේක කරන්න ඕනෑ මෙහෙමයි කියලා. නමුත් දැනට නීතියක් සම්මත වෙලා තිබෙනවා, එතුමන්ලාගේ කාලයේම සම්මත කරපු; එතුමන්ලාම ගෙනැල්ලා සම්මත කරපු නීතියක් තිබෙනවා. එම නිසා අපි විශ්වාස කරනවා, ඇමතිතුමා මේ පිළිබඳව ප්‍රකාශයට පත් කළාට පස්සේ,- අනිවාර්යයෙන්ම ඡන්ද ක්‍රමයක් හදද්දී විවිධ පක්ෂවල, විවිධ පුද්ගලයන්ගේ අදහස් උදහස් අරගෙන තමයි එය කරන්න වෙන්නේ. ඒක මැතිවරණය කල් දමන්න කරන දෙයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. නමුත් ඒක ප්‍රජාතන්ත්‍රවාදීව සාකච්ඡා කරලා තමයි කරන්න වෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු සභානායකතුමනි, පැරණි මිශ්‍ර සමානුපාතික ක්‍රමයට ඡන්දය පැවැත්වුවොත් කල් මැරීමක් සිද්ධ වෙන්නේත් නැහැ, මේ ප්‍රශ්නයට ක්ෂණිකව උත්තරයක් දෙන්නත් පුළුවන්. එහෙම නැත්නම් මේ සඳහා කල් මරන්නේ නැතිව ඉක්මනට කරන ක්‍රමයකට යමු කියලායි අපි කියන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, කල් මැරීමේ ප්‍රශ්නය තිබෙන්නේ අපට අදාළව නොවෙයි නේ. කල් මැරීම තමයි, අවුරුදු 7ක් තිස්සේ ඡන්දය පවත්වා නැති එක. එතුමන්ලා තිබ්බෙත් නැහැ. නමුත්, ඡන්ද ක්‍රමයක් හදිසියේ ඇති කළාට පසුව ඇති වෙන ගැටලු ගැන ඔබතුමන්ලාටම අදහස් තිබෙනවා, පළාත් පාලන ඡන්ද ක්‍රමය ගත්තොත්. ඒ නිසා සංවාදයෙන් තමයි ඒක කරන්න වෙන්නේ. අපට අරමුණක් නැහැ, ඡන්දය කල් දමන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා, මොකක්ද point of Order එක?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92 යටතේ ඔබතුමාගෙන් අවසර ඉල්ලන්නේ. *[බාධා කිරීමක්]* ස්ථාවර නියෝග 28. (උ) යටතේ මට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ස්ථාවර නියෝග 92,- *[බාධා කිරීමක්]* ස්ථාවර නියෝග 28. (උ) යටතේ මම මේ කාරණය ඉදිරිපත් කරන්නේ. ගරු සභානායකතුමනි, ස්ථාවර නියෝග 52 (6) යටතේ ගරු පළාත් පාලන ඇමතිතුමා අද වාර්තාවක් ඉදිරිපත් කළා. එහි පළාත් සභා ඡන්දය පිළිබඳව ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පැහැදිලි විස්තරයක් තිබෙනවා. ඒකේ තිබෙනවා, පරණ ක්‍රමයට කළ හැකියි කියලා. ඒක කරනවා නම් මැතිවරණය සංශෝධන පනත් මඟින් පරිචය කරන ලද උපලේඛන හා ආකෘති අදාළ මූලික ප්‍රඥප්තීන්, ප්‍රතිපාදන, සුදුසු නීති පැනවීම සඳහා හැකියි කියලා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මෙතුමා අවස්ථාව ඉල්ලන්නේ,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මම ඉල්ලන්නේ ස්ථාවර නියෝග යටතේ. *[බාධා කිරීමක්]* ස්ථාවර නියෝග යටතේ මට අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝගයේ අංකය කියන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
28(උ) යටතේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. 28(උ)හි තිබෙනවා, සභා කටයුතුවලට කලින් යෝජනාවක් ඉදිරිපත් කළ හැකියි කියලා. ඒක කථානායකට ලිඛිතව දැනුම් දෙන්න ඕනෑ නැහැ. ඒක කියවන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මෙහෙමයි. ඒ වුණාට ස්ථාවර නියෝග 146,-

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මේකේ තිබෙනවා පටන් ගන්න කලින් යෝජනාවක් කරන්න පුළුවන් කියලා.

ස්ථාවර නියෝග 52 යටතේ ඇමතිවරයා ඉදිරිපත් කරලා තිබෙන පළාත් සභා ඡන්දය තියන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් නියෝගයක් නිකුත් කරලා තිබෙනවා, නීතිපතිවරයා. එහෙම නම් පරණ ක්‍රමයට තියන්න පුළුවන්, මේක. මම හිතන විදියට, ඇත්තටම මේ ඇමතිතුමා ඉල්ලා අස්වෙන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මොකද, ජනාධිපතිවරයා ඔබතුමා අකාර්යක්ෂම ඇමතිවරයෙක් කියලා එතුමාගේ අය වැය කථාවේදී කියා තිබුණා. හැබැයි, ඔබතුමා තවම මේ පළාත් සභා ඡන්දය සම්බන්ධයෙන් කල් මරනවා. මොකද, ඔබතුමන්ලාට පළාත් සභා ඡන්දයට යන්න හැකියාවක් නැහැ. ගරු කථානායකතුමනි, පැහැදිලිව-

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27 - දැනුම්දීම් යටතේ ප්‍රශ්න හෝ යෝජනා පිළිබඳව සඳහන් කරනවා. ඊළඟට ඒකේ දිගුවක් හැටියට ස්ථාවර නියෝග 28හි මේ යෝජනා ගැන සඳහන් වෙනවා. මේක අනාගතය සඳහා අධ්‍යයන කටයුත්තකට හරි පූර්වාදර්ශයක් වුණොත් ඒක බරපතළ ප්‍රශ්නයක් වෙනවා, පාර්ලිමේන්තුවට. ඒ නිසා මේ කරුණු ටික හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
නැහැ, නැහැ, නැහැ.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
මොකද, කිසි තේරුමක් නැහැ. උදේට කාලය අරගෙන අදාළ නැති දෙයක් මේ කථා කරන්නේ. අද දවසෙම විවාද කරන්න පුළුවන්, මේ ගැන.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමා ලේකම් මණ්ඩලයෙන් අහලා අපිව දැනුවත් කරන්න. ඔබතුමා කියන කාරණය-

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 28හි සඳහන් වෙන්නේ මෙන්න මේකයි:

"28. ස්ථාවර නියෝග අන් කිසි නියමයක් කර ඇතොත් මිස, මතු සඳහන් යෝජනා සම්බන්ධයෙන් හැර, ඉදිරිපත් කිරීමට අදහස් කරන කවර හෝ යෝජනාවක් සම්බන්ධයෙන් දැනුම්දීමක් කරනු ලැබිය යුත්තේ ය:-

(අ) පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාව තුළ දී කරන ලද යෝජනාවක්;

(ආ) පාර්ලිමේන්තුව හෝ කවර වූ හෝ විවාදයක් කල් තැබීම සඳහා කරනු ලබන යෝජනාවක්;

(ඇ) විශේෂ කාරක සභාවක වාර්තාවක් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට යොමු කරනු ලැබීමට හෝ මුද්‍රණය කිරීමට කරනු ලබන යෝජනාවක්;

(ඈ) පිට අය ඉවත් කිරීමට කරනු ලබන යෝජනාවක්.

(ඉ) මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු සේවය තාවකාලිකව අත්හිටුවීමට කරනු ලබන යෝජනාවක්;

(ඊ) වරප්‍රසාද පිළිබඳ වූ කාරණයක් සම්බන්ධ යෝජනාවක්;

(උ) එදින පාර්ලිමේන්තුවේ කටයුතු පිළිබඳව ක්‍රියාකර අවසන් වූ වහාම කිසියම් අලුත් කාරණයකට අවතීර්ණ වීමට පෙර අවසන් වූ ඒ කටයුතුවලින් පැන නඟින යෝජනාවක්." *[බාධා කිරීමක්]*

ගරු කථානායකතුමනි, ඒ නිසා මේ කිසිවක් අදාළ නැහැ. කිසිවක් අදාළ නැහැ.

ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකර අපේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අනුව කටයුතු කරන්න කියලා. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඔබතුමා කියන විධියට,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒක හොඳට කියවාගෙන එන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, මොකක්ද මේ කරන්නේ? *[බාධා කිරීමක්]* ඒක අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, කරුණාකර මේ සභාවේ කටයුතු කරගෙන යන්න ඔබතුමා හරියාකාරව උදවු කරන්න. එහෙම නැතිනම් මේ සභාවට ඔබතුමාගේ සහයෝගය ලැබෙන්නේ නැහැ කියන එක තමයි අපට වාර්තා කරන්න වෙන්නේ. *[බාධා කිරීමක්]*

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒකට විරුද්ධයි. ඉහත කී කාරණය ගැන අපට පැහැදිලි කරන්න ඕනෑ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒ වාගේම, ඔබතුමන්ලාගේ චණ්ඩි බැඳලා තියාගන්න. *[බාධා කිරීමක්]* ගරු කථානායකතුමනි, අපි නම් කිසිසේත් ඉඩ දෙන්නේ නැහැ- *[බාධා කිරීම්]* මොකක්ද මේ කරන්නේ?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒ ලියා තිබෙන එක පැහැදිලිව තිබෙනවා නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මොකක්ද මේ තත්ත්වය? ඔබතුමන්ලාට තේරෙන්නේ නැද්ද? *[බාධා කිරීම්]* ගරු ගයන්ත මන්ත්‍රීතුමා, ඔබතුමාට තේරෙන්නේ නැද්ද, මොකක්ද මේ කරන විකාරය කියලා? *[බාධා කිරීම්]* ඔබතුමන්ලා කථා කරන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන. මොකක්ද මේ කරන්නේ? *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වාඩි වෙන්න, වාඩි වෙන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
කථානායකලා ගොඩයි. *[බාධා කිරීම්]* ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාද, කථානායක? *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, ඔබතුමා ඒක නිවැරැදි කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද මේ කරන්නේ? *[බාධා කිරීම්]*

ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා.

## අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා
## அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
## MINISTERIAL CONSULTATIVE COMMITTEES

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2025 මාර්තු 19 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, 2024 දෙසැම්බර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙනුවට, මතු සඳහන් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා පත් කළ යුතු ය:-

1. ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව;
2. වරාය සහ සිවිල් ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව; සහ
3. නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත, 2026 - කාරක සභා අවස්ථාව, දසවන වෙන් කළ දිනය.

## විසර්ජන පනත් කෙටුම්පත, 2026
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2026
## APPROPRIATION BILL, 2026

*කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී.-*
***[ප්‍රගතිය: නොවැම්බර් 18]***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி: நவம்பர் 18]*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*

*Considered further in Committee.- [Progress: 18th November]*
*[HON. SPEAKER in the Chair.]*

**130 වන ශීර්ෂය.- රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 3,243,000,000

**தலைப்பு 130.- பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 3,243,000,000

HEAD 130.- MINISTER OF PUBLIC ADMINISTRATION, PROVINCIAL COUNCILS AND LOCAL GOVERNMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 3,243,000,000

**193 වන ශීර්ෂය.- කම්කරු අමාත්‍යවරයා**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 214,000,000

**தலைப்பு 193.- தொழில் அமைச்சர்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு, ரூபாய் 214,000,000

HEAD 193.- MINISTER OF LABOUR
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 214,000,000

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
පළමුවන උපලේඛනය, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 130, 253 සිට 279, 312 සිට 319 සහ 321; කම්කරු අමාත්‍යාංශය - වැය ශීර්ෂ අංක 193, 221 සහ 328.

සලකා බැලීම පූර්ව භාග 10.30 සිට අපර භාග 6.00 දක්වා.

කපා හැරීමේ යෝජනාව, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 9.38]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ගරු සභාපතිතුමනි, "2026 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේදී අද දින, එනම් 2025.11.19වන බදාදා විවාදයට ගැනෙන අමාත්‍යාංශ සහ ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලින්, අදාළ අංක 130, 253 සිට 279, 312 සිට 319, 321, 193, 221 සහ 328 දරන වැය ශීර්ෂයන්ගෙන් සම්ප්‍රදායානුකූලව එක් එක් වැඩසටහනෙහි සියලු පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය"යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. පළාත් සභා, පළාත් පාලන ආයතන -නගර සභා, ප්‍රාදේශීය සභා 332ක්-, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 338ක්, ග්‍රාම නිලධාරි කාර්යාල 14,000කට වැඩි ප්‍රමාණයක් ඇතුළු රාජ්‍ය ආයතන ගණනාවක රාජ්‍ය නිලධාරින් මේ අමාත්‍යාංශය යටතේ අධීක්ෂණයට භාජනය වෙනවා. එහෙම නම්, මෙය ඉතාම වැදගත් අමාත්‍යාංශයක්.

මම බලාපොරොත්තු වෙනවා, මේ විවාදය තුළ මේ අමාත්‍යාංශයට අදාළ කාරණා කිහිපයක් ඉදිරිපත් කරන්න. මේ අය වැය විවාදයේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් වාගේම ඇමතිවරුන් තමන්ගේ කථාවලදී දිගින් දිගටම කිව්වේ 76 වසරක කාරණාව සම්බන්ධයෙන්. *[බාධා කිරීමක්]* නැහැ, 76 වසරක වැඩ පිළිවෙළ. *[බාධා කිරීමක්]* ගරු බිමල් රත්නායක ඇමතිතුමා, ඊළඟ වාක්‍ය ඔබතුමා කියන්න. ඔබතුමා හැම වෙලාවේම ඒක කියනවා නේ. හරිද? මම අහන්නේ, 77 වැනි අවුරුද්ද ගැන දැන් කථා කරන්නේ නැත්තේ ඇයි කියලායි. ඒක ගැන කථා කරන්න එපායැ, තමුන්නාන්සේලා? තමුන්නාන්සේලාගේ දේශපාලන ජීවිතය පටන් ගත්තු දවසේ ඉඳලාම කථා කළේ අර කිව්ව කාලය ගැන නේ. විපක්ෂයේ ඉඳගෙන නොයෙකුත් ආකාරයෙන් විවේචන ඉදිරිපත් කළා. අපි විවේචනය නරකයි කියනවා නොවෙයි.

මේ ඇමතිවරු බොහෝ දෙනෙක් අය වැය විවාදය පටන් ගන්න කොට කිව්වා, "අපි මේ රට භාර ගන්න කොට තෙල් පෝලිම්, ගෑස් පෝලිම් ඔක්කොම තිබුණා" කියලා.

දැන් අපි පැහැදිලිවම අහන්න ඕනෑ, ඒ කථාව ඇත්තද කියලා. එවැනි කථා කියලා මේ රටේ ජනතාවගේ බුද්ධියට තමුන්නාන්සේලා තවමත් සමච්චල් කරනවා නේ. ඔය ඉස්සරහා පේළියේ ඉන්න කැබිනට් ඇමතිවරයෙක් -විශ්වවිද්‍යාල මහාචාර්යවරයෙක්- එහෙම කිව්වා. පසුපෙළ මන්ත්‍රීවරයෙකු කිව්වා නම් කමක් නැහැ. එතුමන්ලා නොවෙයි එහෙම කිව්වේ. ගරු සභානායකතුමනි, පාර්ලිමේන්තුවේ අත් දැකීම් තිබෙන මන්ත්‍රීවරයකු හැටියට, ඇමතිවරයෙකු හැටියට වැඩ කරපු පුද්ගලයකු වශයෙන් ඔබතුමා ඒ අය දැනුවත් කරන්න. මේක බොරුවෙන් යන්න පුළුවන් ගමනක් නොවෙයි. මොකද, අද සමාජය දැනුවත්. විහිළුවට, සමච්චලයට ලක් වෙන්න නරකයි, කැබිනට් ඇමතිවරයෙක්. ඒ නිසා මම ඒ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කරනවා. එතැනින් එහාට මම සංඛ්‍යා ලේඛන කියන්නේ නැහැ. මා සංඛ්‍යා ලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්නේ, තමුන්නාන්සේලා කථා කරපු කාරණා නිසාමයි.

දැන් බලන්න, 2018 GDP at current market price, රුපියල් බිලියන 15,352යි. ඒක ඒ විධියට ඇවිල්ලා 2021 අවුරුද්දේ අඩු වෙනවා. අඩු වෙනවා කියන්නේ, ඩොලර් එක වෙනස් වෙනකොට අඩු වෙනවා. මේ රුපියල්වලින් තිබෙන්නේ. 2023 වෙනකොට ඒක රුපියල් බිලියන 27,420 යි. තමුන්නාන්සේලා ආණ්ඩුව ගත්තේ 2024 අග භාගයේ. 2024 වෙනකොට එය රුපියල් බිලියන 29,899යි. 2018ත් 2024ත් අතර ලොකු වෙනසක් තිබෙන්නේ, ඩොලර් එක වෙනස් වුණු නිසා. එහෙම නැතුව ගොඩක් ඉස්සරහට ඇවිල්ලා නොවෙයි.

ඒ වාගේම, දැන් අපි ගනිමු per capita income එක US Dollarsවලින්. ඒක පුද්ගල ආදායම 2018දී ඇමෙරිකානු ඩොලර් 4,372යි. ඒක තුන්දහස් ගණනකට අඩු වෙනවා. කොවිඩ් තත්ත්වය තුළ, 2021දී ඇති වූ බංකොලොත්භාවයත් එක්ක එය ඩොලර් 1,000ක් අඩු වෙනවා. ඒක 2022දී ඇමෙරිකානු ඩොලර් 3,464යි. 2023දී ඇමෙරිකානු ඩොලර් 3,801යි. 2024දී තමුන්නාන්සේලාගේ ආණ්ඩුව එන්න ඉස්සෙල්ලා එය ඇමෙරිකානු ඩොලර් 2,416ක් වෙනවා. ඒ කියන්නේ, ඩොලර්වලින් බැලුවාම 2018ට වඩා එහාට ගිහින් තිබෙනවා. එහෙම නම් තමුන්නාන්සේලා කොහොමද කියන්නේ, තමුන්නාන්සේලා ආණ්ඩුව ගන්න කොට මිනිසුන් පෝළිම්වල හිටියා, එහෙම නැත්නම් දරිද්‍රතාව තිබුණා, මේ මේ ප්‍රශ්න තිබුණා කියලා. තමුන්නාන්සේලා වගකීම භාර ගන්නා විට මේ රට එක මාවතකට ඇවිල්ලා තිබුණේ. අපි ඒක පිළිගන්න ඕනෑ. ඒක කවුද කළේ, කවුද හරි කියන එක නොවෙයි වැදගත්. ඒ වෙලාවේ මේ රට එතැනට ඇවිල්ලා තිබුණා.

අපි පිළිගන්නවා, තමුන්නාන්සේලාට ආණ්ඩුව ලැබුණේ 2020 -2021 කාලයේ ඇති වුණු තත්ත්වයත් එක්ක බව. ඔබතුමන්ලාට ආණ්ඩුව ලබා ගන්න මේ රටේ ජනතාවගෙන් සියයට 43ක් ජනාධිපතිවරණයේදී ඡන්දය ලබා දුන්නා. ඒ ඡන්දය ලබා දුන්නු ජනතාවගේ ගරුත්වය, එහෙම නැත්නම් බලාපොරොත්තු ඉටු කරන්නද ඔබතුමන්ලා වැඩ කරන්නේ? මම ඒ සම්බන්ධයෙන් කරුණු එකින් එක ගන්න කැමැතියි.

විශේෂයෙන්ම පළාත් පාලන මැතිවරණය තියලා දැන් මාස 6ක් වෙනවා. ඒ පළාත් පාලන මැතිවරණය තියලා මාස 6කට පසුව ඊයේ දිනයේ තමයි සීතාවක ප්‍රාදේශීය සභාවේ බලය පිහිටෙව්වේ. පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමාගේ අවධානයටයි, මම මේ කාරණය කියන්නේ. ඇයි ඒ සඳහා මාස 6ක් ගියේ? ඒ ප්‍රාදේශීය සභාවේ බහුතරයේ කැමැත්තට ඒකේ බලය පිහිටුවන්න අවශ්‍ය පහසුකම සලසා දෙන්න බැරි වුණා, ඔබතුමාගේ අමාත්‍යාංශයට. පළමුවැනි වතාවේ ඒ ප්‍රාදේශීය සභාවේ සභික මහත්වරු එළියට ආවා. ඇයි එළියට ආවේ? සභික මන්ත්‍රීවරුන් එහෙම එළියට ආවත් නිලධාරින්ගේ අභිමතය තිබෙනවා නම් ඒ ප්‍රාදේශීය සභාව පිහිටුවන්න පුළුවන් වෙන්න එපායැ. කවුද එළියට ආවේ? එළියට ආපු පිරිස, බහුතරය. ඒ හින්දා තමයි පළාත් පාලන කොමසාරිස්වරයාට එය කල් දාන්න සිදු වුණේ. එතකොට එතැනින්ම පෙනෙනවා, බහුතරය තිබෙන්නේ කොතැනද කියලා. සභික මන්ත්‍රීවරු දෙවැනි වතාවටත් එළියට ආවා. ඒ අවස්ථාවේදීත් බහුතරය පෙන්නුවා. ඊයේ දිනයේදී මොකක්ද වුණේ? සර්වජන බලය පක්ෂයේ නායකතුමා වන දිලිත් ජයවීර මන්ත්‍රීතුමා කියනවා අපි දැක්කා, "මගේ සභිකයෙක් සල්ලිවලට අරගෙන" කියලා. තමුන්නාන්සේලා කොච්චර ලජ්ජා වෙන්න ඕනෑද? "මගේ සභිකයෙක් මුදලට අරගෙන තමයි සීතාවක ප්‍රාදේශීය සභාවේ බලය ඊයේ පිහිටුවූයේ" කියලා එතුමා කිව්වා.

මේ රටේ ජනතාව එදා තමුන්නාන්සේලාට ඡන්දය දෙනකොට තමුන්නාන්සේලාගෙන් මේවා බලාපොරොත්තු වුණාද? මට මතකයි, යහ පාලන ආණ්ඩුව තිබුණු කාලයේ 2018 පැවැති පළාත් පාලන මැතිවරණයේදී ප්‍රාදේශීය සභා, නගර සභා ගොඩක් ගියේ පොහොට්ටුවටයි කියලා. නමුත්, ඒ කාලයේ අපේ රජය තිබියදීත් අපි ලැස්ති වුණේ නැහැ ඒ ආයතනවල බලය බලෙන් පිහිටුවන්න. එතැනින් එහාටයි තමුන්නාන්සේලා යන්න ඕනෑ. ජනාධිපතිතුමා

මේ සභාවේදීත්, පිටතදීත් හැම වෙලාවේම කියන්නේ, "අපෙන් ආණ්ඩුව ගන්න නම් අපිට වඩා උඩින් යන්න; අපිට වඩා හොඳට යන්න" කියලායි. තිබුණාටත් වඩා යටට තේ දැන් මේ ගිහින් තිබෙන්නේ.

මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. අද Commission to Investigate Allegations of Bribery or Corruption විසින් වැරැදි කරන අයට, අයථා විධියට මුදල් අවභාවිත කරන හැම කෙනාටම දඬුවම් කරනවා. දැන් ගොඩක් පළාත් පාලන ආයතනවලට මොකද වෙලා තිබෙන්නේ? දැන් අපේ දිලිත් ජයවීර මහත්මයා කියන විධියට එතුමාගේ පක්ෂයේ සභිකයා අරගෙන තිබෙන්නේ සල්ලිවලට නේ. ඒක corruption නොවෙයි ද? එහෙම නම්, ඒ ප්‍රාදේශීය සභාවේ කොහොමද වැඩ කරන්නේ?

ගරු ඇමතිතුමනි, පළාත් පාලන ආයතනවල පළමුවැනි අය වැය ඉදිරිපත් වුණා. අය වැය ඉදිරිපත් වුණාම ඒ ආයතනවල බලය මුලදී තිබුණු විධියට නැහැ. *[බාධා කිරීමක්]* ගරු සභානායකතුමනි, මට අවස්ථාව දෙන්න; බාධා කරන්න එපා. මොකද, අපි ඔබතුමන්ලාට බාධා කරන්නේ නැහැ. අප මේ කියන්නේ කරුණු. මේවාට අවධානය යොමු කළොත් තමයි ඔබතුමන්ලාට ඉස්සරහට යන්න පුළුවන් වෙන්නේ. අපි නරකක් කියන්නේ නැහැ. පළාත් පාලන ආයතන ගණනාවකම දැන් මොකක්ද වුණේ? පළමුවැනි අය වැය පැරදුණා.

ඇයි ඒ පැරදුණේ? රහස් ඡන්ද තියලා, වරදාන, වරප්‍රසාද, මුදල් දීලා පිහිටුවපු ප්‍රාදේශීය සභාවල ඒ සභාපතිලාට ඒවා කරගෙන යන්න අමාරුයි. මොකද, අය වැයේදී ඡන්දය තියන්නේ එළිපිට. එතකොට අර හොරට දීපු කට්ටිය එළිපිට ඡන්ද දෙනවා, විරුද්ධව. එතකොට අභිමතය ක්‍රියාත්මක කරන්න ඔබතුමාට නිලධාරින් නැහැ. එතකොට අභිමතය ක්‍රියාත්මක කරන්න පළාත් කොමසාරිස්ලා නැහැ; කොමසාරිස්වරියෝ නැහැ.

ගරු ඇමතිතුමා, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ බලන්න. ඔබතුමා පුත්තලම දිස්ත්‍රිකයෙන් ඡන්ද ඉල්ලලා ආවේ. ආනමඩුව ආසනය ඔබතුමා නියෝජනය කරන ගමේ මේ වෙනකොට ප්‍රාදේශීය සභා දෙකක් තවම පිහිටුවලා නැහැ. මේක ඇත්තටම ලජ්ජා වෙන්න ඕනෑ කාරණාවක්. අපි චෝදනා කරනවා නොවෙයි. ඇයි ඒ? ආනමඩුව ප්‍රාදේශීය සභාවෙත් බහුතරය සභාවෙන් එළියට ආවා. බහුතරය සභාවෙන් එළියට ආවේ ඇයි? අපට ඕනෑ විවෘත ඡන්දයක් කියලා ඒ අය සභාවෙන් එළියට ආවා; දෙපාරක් එළියට ආවා. මේක මගේ ප්‍රාදේශීය සභාවේත් වුණා. මාවතගම ප්‍රාදේශීය සභාවේත් පළවෙනි වතාවේ ඒ අය සභාවෙන් එළියට ආවා. ඊට පස්සේ අපි අධිකරණ ක්‍රියාවලියකටත් ගියා. ඊට පස්සේ දෙවැනි වතාවේ තමයි අපි ප්‍රාදේශීය සභාව පිහිටුවා ගත්තේ.

ඒ නිසා මේක ඔබතුමන්ලාට ඡන්දය දීපු ජනතාව බලාපොරොත්තු වූ ක්‍රමය නොවෙයි. ඔබතුමන්ලාට ජනතාව ඡන්දය දුන්නේ, ජනාධිපතිවරණයේදී සියයට 43ක් ඡන්දය දුන්නා. සියයට 3 හිටපු කණ්ඩායමට සියයට 40කින් වැඩි කරලා දුන්නා. නමුත්, මෙවැනි ක්‍රියා තුළින් අයථා විධියට බලය රඳවා ගන්න කටයුතු කරනවා නම්, ඒ ක්‍රියා නිසා ඔබතුමන්ලාට ඡන්ද දීපු විශාල ප්‍රමාණයක් ඔබතුමන්ලා අතහැරලා යනවා. ඒක තමයි ඇත්ත. ඒ නිසා කරුණාකරලා තිබුණු තැනටත් වඩා නරක - worst - තැනට යන්නේ නැතුව, එතැනින් එහාට හොඳ තැනට ගිහිල්ලා ආදර්ශයක් දෙන්න. එතකොට අපි එතැන ඉන්නවා. පළාත් පාලන මැතිවරණයත් එක්ක විශාල හානියක් තමුන්නාන්සේලාට සිද්ධ වෙලා තිබෙනවා. පළාත් පාලන මැතිවරණයේදී ඔබතුමන්ලාට මහ මැතිවරණයේදී ලබා දුන් ඡන්ද ප්‍රමාණයෙන් මිලියන දෙකකට වඩා ප්‍රමාණයක් ලැබුණේ නැහැ.

ඒ වාගේම පළාත් සභා මැතිවරණය ගැන මෙතැන කථා කළා. ඒක කථා කරන්නම ඕනෑ කාරණාවක්. අපේ සභානායකතුමා එතුමාගේ විග්‍රහයේදී අපට කිව්වා, අවුරුදු 7ක් ඔබතුමන්ලා තමයි පළාත් සභා මැතිවරණය තියන්නේ නැතුව කල් දැම්මේ කියලා. ඔව්, අපි පිළිගන්නවා. අපිත් ඒකට හවුල්. යහ පාලන රජය කාලයේ අපි මේ මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්න ගිහිල්ලා ලොකු අවුලක පැටළුණා. ඇත්තටම අනා ගත්තා. අපි එතැන හිටියේ නැතත්, පක්ෂයක් හැටියට අපට ඒකට එකඟ වෙන්න වුණා. මම හිතන හැටියට තමුන්නාන්සේලාගේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තුන්දෙනාත් ඒකට ඡන්දය දුන්නා. ඒ සීමා නිර්ණය තුළ ගැටලු ගණනාවක් එන නිසා තමයි එදා ඒක එපා කිව්වේ. දැන් අපේ චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කියපු විධියට, පළාත් සභා ඇමතිතුමා කාරණා වගයක් සභාවට ඉදිරිපත් කළා.

ඒ අනුව - නීතිපතිවරයා මීට කලිනුත් මේක කියා තිබුණා - මේ තිබෙන ඡන්ද ක්‍රමය නැවත ගෙනෙන්න පුළුවන්, මේ සභාවට යෝජනාවක් ගෙනැල්ලා. *[බාධා කිරීමක්]* ඔව්. එහෙම කරන්න පුළුවන්කම තියාගෙනත් තව කමිටු දමාගෙන ආපසු අපි අවුලකට යනවාද? දැන් බලන්න, පළාත් පාලන මැතිවරණය විශාල අවුලකට ගිහිල්ලානේ තිබෙන්නේ. ඒ මොකද? ඊට අදාළ සංශෝධනය සිදු වන්නේ කොට්ඨාස ක්‍රමයට විතරක් කියලා අපි හිතුවා. එහිදී මන්ත්‍රී සංඛ්‍යාව වැඩි වෙනවාද කියලා බැලුවේ නැහැ. අවසානයේ 4,000ගණනට තිබුණු මන්ත්‍රී සංඛ්‍යාව 8,000ක් වුණා. මේක තමුන්නාන්සේලාට වෙනස් කරන්න තිබුණා. අපි කිව්වා, විපක්ෂය විධියට ඒකට අපේ සහාය දෙන්නම් කියලා. පළාත් පාලන මැතිවරණයට යන්න කලින් ඒවා වෙනස් කරලා හදා ගන්න තිබුණා. නමුත් හදා ගත්තේ නැහැ. හරි විධියට හදා ගන්නේ නැතුව හදිසි කරලා පරණ ක්‍රමයටම මැතිවරණයට ගියා. එතැන වැරැද්දක් තිබෙන බව දැන දැන ගියේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒකට හදිසියි, දැන් හදිසි නැහැ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මොකද, ඒ වෙලාවේ හිතුවා මැතිවරණය කල් ගියොත් ඡන්ද අඩු වෙයි කියලා. *[බාධා කිරීම්]* නැහැ. මම කියන්නේ ඔබතුමන්ලාට ඕනෑකම තිබුණානේ. *[බාධා කිරීමක්]* ඔව්. *[බාධා කිරීමක්]* මගේ වෙලාව ඕනෑ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඒක කරුණක් වශයෙන් නිවැරදි නැහැ. ගරු කථානායකතුමාගේ මූලිකත්වයෙන් සියලු පක්ෂ නායකයන් එකතු වෙලා සියයට 100ක එකඟතාවෙන් තමයි අපි ඒ ඡන්දය පවත්වන්න තිබෙන ක්‍රමයටම යනවා කියලා එකඟතාවකට ආවේ. එහෙම නැතුව, අපේ විශේෂ ප්‍රශ්නයක් හෝ ආණ්ඩුවේ බල කිරීමක් මත නොවෙයි. නොවැම්බර් මාසයේ තමයි පක්ෂ නායක රැස්වීමේදී පළාත් පාලන ඡන්දයට අදාළව ඒක තීන්දු කළේ. ඒකයි ඇත්ත.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

සභානායකතුමනි, ඔබතුමන්ලා ආණ්ඩු බලය ගත්තානේ. ඔබතුමන්ලා ආණ්ඩු බලය ගනිද්දී ජනතාවට කිව්වේ, "අපි වෙනසක් කරනවා, හොඳ ක්‍රමයක් ගෙනෙනවා, තිබෙන තැනට වඩා හොඳ තැනකට ගෙනෙනවා" කියලායි. එතකොට, අනෙක් පක්ෂ නායකයන් කිව්වාය කියලා වැරදි දෙයක් කරන එක වැරදියිනේ. මම ඔබතුමාට කියන්නේ, මම එතැන හිටියා නම් මම විරුද්ධ වෙනවා. මොකද, මම ප්‍රාදේශීය සභාවෙන් දේශපාලනයට ආපු කෙනෙක්. ඒ නිසා මට ප්‍රාදේශීය සභාව ගැන හොඳ අවබෝධයක් තිබෙනවා. ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත ගෙනාවා. එතුමා අත්දැකීම් තිබුණු පුද්ගලයෙක්, නගර සභාවේ මන්ත්‍රීවරයකු හැටියට හිටපු කෙනෙක්. එවකට පළාත් පාලන නියෝජ්‍ය ඇමති හැටියට කටයුතු කළේ මගේ පියා. එතුමාත් ගම් සභාවෙන් ආපු කෙනක්. ඒ අයගේ අත්දැකීම් එක්ක තමයි ඒ ප්‍රාදේශීය සභා ක්‍රමය ඇති කර තිබුණේ. එතකොට, ඒකටත් එහා ගිය එකක් එපායැ, අපි ගෙනෙන්න. නමුත් අපි ගෙනැල්ලා තිබෙන්නේ ඊට වඩා ඉතා ප්‍රාථමික එකක්නේ. ඔබතුමාත් පිළිගන්නවානේ, දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය. දැන් මාස 6ක් යනකම් පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර ඇමතිවරයාගේ ආසනය තුළ ප්‍රාදේශීය සභාව පිහිටුවා ගන්න බැරිව ඉන්නවා. ඉතින්, මෙතැන ගැටලුවක් නැද්ද? නිලධාරින් අද මේකට අයථා විධියට මැදිහත් වෙලා තිබෙනවා. නිලධාරින් ඒ අයගේ අභිමතයක් ගැන කථා කරනවා. රජයේ අභිමතය කාටද තිබෙන්නේ? අභිමතය තිබෙන්නේ රටේ ජනතාවට. ජනාධිපතිතුමා විධායකය හැටියට ඇමති මණ්ඩලයක් පිහිටුවනවා. ඒ ඇමතිවරු හරහා දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ ලේකම්ලාට යම් යම් බලතල යනවා.

ඒ අයට අභිමතය පාවිච්චි කරන්න පුළුවන් අවස්ථා එනවා. ඒ අභිමතය පාවිච්චි කරන්න හොඳ දේකට; අසරණ මිනිහෙකුට උදව්වක් කරන්න. ඒවාට තමයි අභිමතය පාවිච්චි කරන්න තිබෙන්නේ. රජයෙන් ක්‍රියාත්මක කරන්න ඕනෑ අත්‍යවශ්‍ය කාර්යයක් ඉෂ්ට කරන්න අභිමතය පාවිච්චි කරන්න. මහජනතාව පළාත් පාලන ආයතනවලට පත් කරන සභිකයන්ට විරුද්ධව, සභිකයන්ගේ බහුතරයට විරුද්ධව නිලධාරින් ඒ අභිමතය පාවිච්චි කරනවා නම්, මොකක්ද ඒකේ තිබෙන සාධාරණත්වය, මොකක්ද එතැන තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය? සභානායකතුමනි, ඔබතුමන්ලා බලයට ආවේ මේවා හදන්න. ඔබතුමන්ලා මේවා හදන්න ඇවිල්ලා, ඒ නිලධාරින්ට අයුතු විධියට එහෙම නැත්නම් වැරැදි කරන්න මාර්ගය පෙන්වනවා නම් එතැන හැදීමක් වෙන්නේ නැහැ නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ඡන්දයේදී බහුතර බලය ගන්න-

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

ඒක තමයි. මේ ක්‍රමයේ වැරැද්දක් තිබෙන එක ඇත්ත. ඇයි ඒ සභාව මාස හයක් කල් ගියේ? පළාත් පාලන කොමසාරිස් කැඳෙව්වා ඡන්දය තියලා සභාපති තෝරන්න. එතකොට බහුතරයක් කිව්වා, අපට ඕනෑ ප්‍රසිද්ධ ඡන්දයක් කියලා. මම ඔබතුමාට පැහැදිලි කරන්නේ මේකයි. ඒ බහුතරය සභාවෙන් එළියට ආවා. ඒ බහුතරය සභාව ඇතුළේ හිටියා නම් සීතාවක සභාව පිහිටවපු විධියට පිහිටුවන්න තිබුණා. නිලධාරින් වැඩ කටයුතු කිරීමේදී දේශපාලන වශයෙන් මේ වාගේ දේවල් කරන්න බැහැ. ඒක වැරැදියි. අපි පැහැදිලිව මේ කාරණය කියනවා. තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා බලයට ඇවිල්ලා අවුරුද්දයි මාස ගණනක් ගෙවිලා තිබෙන්නේ. තව තිබෙන්නේ අවුරුදු තුනයි. වැරැදි වැඩ කරන නිලධාරින්ට අපි මේ කාරණය කියන්න ඕනෑ. පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ තමයි සියලු නිලධාරින්ගේ විනය ඇතුළු හැම දෙයක්ම පරිපාලනය වෙන්නේ. ඒ නිසා අපි නිලධාරින්ට කියනවා, වැරැදි කරන්න එපා කියලා. එවැනි වැරැදි කරපු නිලධාරින් ගැන ඕනෑ තරම් උදාහරණ තිබෙනවා.

පාස්පෝට් ඔෆිස් එකේ ජනරාල්වරයා ඇමතිවරයා හරි වෙන කවුරු හරි කියන ඒවා කරලා අද හිරේ ගිහිල්ලා ඉන්නවා. අපි පැහැදිලිව, වගකීමෙන් කියනවා, වැරැදි වැඩ කරන නිලධාරින්, විශේෂයෙන් ජනතාවට තමන්ගේ අභිමතය පෙන්වන නිලධාරින් විශ්‍රාම ගිහිල්ලා තිබුණත් අපි ඒ අය නීතිය ඉදිරියට ගෙන එනවා කියලා. ඒක තමයි වෙන්න ඕනෑ. අද තිබෙන මේ තත්ත්වය එච්චර හිතකර තත්ත්වයක් නොවෙයි.

පළාත් සභා මැතිවරණය ගැන කථා කරපු නිසා ඒ ගැනත් කියන්න ඕනෑ. තමුන්නාන්සේලා මැතිවරණය කල් දාන්න හදන්න එපා. මැතිවරණ කල් දාන්න හොඳම ක්‍රමය මොකක්ද? අපි දැක්කා, රනිල් වික්‍රමසිංහ මහත්තයා පළාත් පාලන මැතිවරණය කල් දැම්මේ කොහොමද කියලා. මැතිවරණ කොමිසම පළාත් පාලන මැතිවරණය තියන්න සූදානම් කරලා තිබෙන කොට එතුමා මේ සභාවට ඇවිල්ලා කිව්වා, "පළාත් පාලන මැතිවරණය තියන්න කොච්චර ලෑස්ති වුණත් එහෙම එකක් නැහැ. භාණ්ඩාගාරයේ මුදල් නැහැ" කියලා.

භාණ්ඩාගාරයේ මුදල් නැහැ කිව්වා. ඒ වෙලාවේ එතුමාට එහෙම කියන්න පුළුවන්කම තිබුණා, රට බංකොලොත් වෙලා තිබුණු නිසා. නමුත් ඒක නොවෙයි ඇත්ත. ඒ වෙලාවේ ඡන්දය තියන්න තිබුණා. නමුත් තමන්ට එහි ප්‍රතිඵල වාසිදායක තත්ත්වය නැහැ කියලා පෙනෙනකොට ඒ විධියට කියලා ඡන්දය කල් දැම්මා. දැන්, අපේ ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මොකක්ද කිව්වේ? එතුමා අය වැය කථාවේදී කිව්වා, "පළාත් සභා මැතිවරණයට අපට මුදල් තිබෙනවා, හැබැයි ඒකට ක්‍රමයක් නැහැ" කියලා. ඇයි, ක්‍රමයක් නැත්තේ? එතුමා කිව්වා, පළාත් සභා මැතිවරණයට මුදල් තිබෙනවාය කියලා. රනිල් වික්‍රමසිංහ මහත්මයා කියපු එකේ අනෙක් පැත්ත කිව්වා. රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමා කිව්වා, "ඡන්දයට ලැහැස්ති වුණාට අපට මුදල් නැහැ" කියලා. වත්මන් ජනාධිපතිතුමා කිව්වා, "අපට මුදල් තිබෙනවා, පළාත් සභා මැතිවරණය තියන්න ක්‍රමයක් නැහැ" කියලා. ඒ ක්‍රමය තමයි අර නීතිපතිතුමා එවලා තිබෙන ලිපියේ තිබෙන්නේ, "පරණ ඡන්ද ක්‍රමයට යන්න යෝජනාවක් ගෙනැල්ලා ඡන්දය පවත්වන්න" කියලා. ඒකට අපි සහාය දෙනවා. අපි කවුරුවත් විරුද්ධ වෙන්නේ නැහැ. මෙතැන සිටින කිසිම කෙනෙක් ඒකට විරුද්ධ වෙයි කියලා මම හිතන්නේ නැහැ.

උතුරුකරය නියෝජනය කරන රාසමාණික්කම් මන්ත්‍රීතුමා, පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් හැටියට ඒ යෝජනාව ගෙනැල්ලා තිබෙනවා. ඒක ආණ්ඩුවේ යෝජනාවක් හැටියට ඔබතුමන්ලා අරගෙන එන්න, සභානායකතුමා. අපි ඒකට සම්පූර්ණ සහයෝගය දෙනවා. මොකද, මේවා කල් දමන්න, කල් දමන්න ජනතාවගේ අයිතිවාසිකම්වලට තමයි ප්‍රශ්න ඇති වෙන්නේ. අපි පසුගියදා පළාත් සභාවේ සිටින ප්‍රධාන නිලධාරින්, ආයතන ප්‍රධානින් හමු වුණු අවස්ථාවේදී ඒ අය කිව්වේ මොකක්ද? "පළාත් සභා සම්පූර්ණ අරාජික වෙලා තිබෙන්නේ" කිව්වා. ඇයි? දේශපාලන නායකත්වය දෙන්න අවශ්‍ය මිනිස්සු ටික නැහැ. සභාව කල් දමලා අවුරුදු හතක් වෙනවා; සමහර ඒවා අවුරුදු අටක් වෙනවා. එතකොට ඒක ඒ ප්‍රදේශයේ ජනතාවට කරන ලොකු අසාධාරණයක්.

දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අපි පළාත් සභා ක්‍රමයක් ඇති කරලා මුදල් යවනවා. නමුත් ඒවා අධීක්ෂණය කරන්න එතැන සභාවක් නැහැ. ජනතාවගේ නියෝජනය එතැන ඉන්න ඕනෑ, ඒ සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන්න. ඒ නිසා, ගොඩක් විෂයයන් අද විමධ්‍යගත කරලා තිබෙනවා. නිලධරින් විතරයි අද ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ ගන්නේ. ඒක හරිද? පළාත් සභාවල ඉන්න නිලධාරින්ට අද ඒ තීන්දු ගන්න බැරි තැනට පත් වෙලා තිබෙනවා. ආණ්ඩුකාරවරයෙක් විතරක් පත් කරනවා. එතුමා ජනාධිපතිවරයා පත් කරන නියෝජිතයා. එතුමාට දේශපාලන සම්බන්ධයක් නැහැ. එතකොට මැද ඉන්න ආයතනයක් හැටියට පළාත් සභා ක්‍රියාත්මක නොවීම තුළ විශාල හානියක් සිදු වෙනවා. උඩින් ඉන්නවා පාර්ලිමේන්තුව, විධායකය, කැබිනට් මණ්ඩලය. ඊළඟට මැද ඉන්නේ පළාත් සභාව. ප්‍රාදේශීය සභා, නගර සභා තිබෙන්නේ පළාත් සභා යටතේ. කොමසාරිස්වරයා ඉන්නේ ආණ්ඩුකාරවරයා යටතේ. ඒක නේ මේ යම් යම් තීන්දු තීරණ ගන්නේ.

අපි දැක්කා, පසුගිය සතියේ අපේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවා. මොකක්ද ඒ යෝජනාව? එතුමාගේ ප්‍රාදේශීය සභාවේ බහුතරය අපට ආවා; සමගි ජන බලවේගයේ ප්‍රාදේශීය සභාව. ඒ ප්‍රාදේශීය සභාව ගෙනාපු යෝජනා ටික, සභාව ඒකමතිකව සම්මත කරලා තිබෙන යෝජනා ටික පළාත් පාලන කොමසාරිස් නවත්වනවා, ආණ්ඩුකාරතුමා දෙන උපදෙස් අනුව. එහෙම කරන්න පුළුවන්ද? ඒක කොච්චර වැරදිද? මහජන නියෝජිතයා - තමන්ගේ කොට්ඨාසයෙන් පත් වෙන මහජන නියෝජිතයා ගෙනෙන යෝජනාව සභා සම්මත වුණාට පස්සේ නවත්වනවා. ඒකේ වැරැද්දක් තිබෙනවා නම්, හොරකමක් තිබෙනවා නම්, ආණ්ඩුකාරතුමා නොවෙයි කවුරු වුණත් ඒ ගැන හොයලා බලලා ඒක නැවැත්වූවාට කමක් නැහැ.

නමුත් මෙවැනි තත්ත්වයක් තමයි අද උදා වෙලා තිබෙන්නේ. මේ පාලන ක්‍රමය හරි විධියට යන්න නම් අනිවාර්යයෙන්ම ජනාධිපති, පාර්ලිමේන්තුව, පළාත් සභාව, පළාත් පාලන ආයතන යන මේ හතරම තිබෙන්න ඕනෑ. ඒවා තිබෙන්නේ නැතිව මේ පාලන ක්‍රමයට හරියට යන්නේ නැහැ. ඔබතුමන්ලා කොච්චර උත්සාහ ගත්තාද, පසුගිය අය වැය යෝජනා ක්‍රියාත්මක කරන්න. කෝ, පුළුවන් වුණාද? මම මේක පෞද්ගලිකව කියනවා නොවෙයි. අය වැය යෝජනා ටික ගම දක්වා, ගමේ භූමිය දක්වා, ජනතාව දක්වා ක්‍රියාත්මක කරන්න තමුන්නාන්සේලාට පුළුවන් වුණාද? සියයට 30ක් නැහැ. ඒක තමයි ඇත්ත. ඇයි ඒ? ඒකට අවශ්‍ය පසුබිම, එහෙම නැත්නම් අවශ්‍ය පළාත් සභාව මැද නැහැ. එතැන ඉන්නේ ආණ්ඩුකාරතුමා විතරයි. ඊළඟට ඉන්නේ නිලධාරින්. දැන් පළාත් පාලන ආයතන පිහිටෙව්වා. දැන් බලන්න, budget එකට අර තිබුණු තත්ත්වයත් එක්ක ඒක ගෙනියන්න බැහැ, සභාපතිට. සභාපති ප්‍රාදේශීය සභාව ගෙනියන්න නම් ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ට අල්ලස් දෙන්න වෙලා තිබෙනවා. නැත්නම්, එයා budget එකට විරුද්ධව ඡන්දය දෙනවා. කොච්චර වැරදි ක්‍රමයක්ද මේ තිබෙන්නේ?

ගරු සභානායකතුමනි, අපි අත් දෙකම ඔසවලා හරි සහයෝගය ලබා දෙන්නම්. ඊළඟ පළාත් පාලන මැතිවරණය එන්න ඉස්සෙල්ලා අනිවාර්යයෙන්ම පළාත් පාලන ඡන්ද ක්‍රමය සංශෝධනය කිරීම සඳහා කටයුතු කරන්න.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කොයි පැත්තෙන්ද සංශෝධනය කරන්න ඕනෑ?

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
නැහැ, මේ ඡන්ද ක්‍රමය.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා කියන්නේ පරණ මනාප ක්‍රමයද?

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
පරණ ක්‍රමයත් හොඳයි. මනාප ක්‍රමය නරක ක්‍රමයක් නොවෙයි නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතකොට කාන්තා නියෝජනය?

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ඒකත් ඇතුළත් කරන්න ඕනෑ. 1987 පනතින් තරුණ නියෝජනය, -

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමා, තරුණ නියෝජනය තිබෙන්නේ nominationsවලට නේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ඔව්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
කාන්තා නියෝජනය කෙළින්ම මන්ත්‍රීතුමියන්ලා සියයට 25ක් නේ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
නැහැ, මෙහෙමයි. ගරු සභාපතිතුමනි, මෙතුමා කියපු කාරණාවට මම පොඩි කරුණක් කියන්නම්. එක පාරට අපට මේක සාකච්ඡා කරන්න බැරි වෙනවා. නමුත්, මම පොඩි කරුණක් පැහැදිලි කරන්නම්. ඒ ඡන්ද ක්‍රමය තුළ nominations ලබා දීලා සියයට 30ක තරුණ නියෝජනයක් තිබුණා. ඒකෙන් තමයි මමත් ආවේ. මගේ තාත්තා හිටියා කියලා නොවෙයි, මම ප්‍රාදේශීය සභාවට ආවේ. ඒ වාගේම අපට කාන්තාවනුත් මේකට ඇතුළත් කරන්න පුළුවන්. ඇතුළත් කරලා අපට පුළුවන් ප්‍රමාණයක් - සියයට ගණනක් - අනිවාර්ය පත් වීමක් හැටියට ඒකෙන්ම ගැසට් කරන්න ඕනෑ. ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කරන්න පුළුවන්. මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හදලා තිබෙනවා නම් ඒකේ හදන්න බැරි වෙන්න බැහැ නේ. කාන්තා නියෝජනය අනිවාර්ය කරන්න පුළුවන්. Nominations විතරක් නොවෙයි. *[බාධා කිරීමක්]* ඔව්, ඒක තමා. මම කියන්නේ ඒ පනතම නොවෙයි. අලුත් පනතක් අපි

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

හදන්න ඕනෑ කියලායි කියන්නේ. ඒ කියන්නේ ගැළපෙන විධියට. මොකද, මනාප ඡන්ද කියන එක නරක දෙයක් නොවෙයි. ඇත්තටම මනාප කියන එක ඔබතුමන්ලා තමයි කාලයකදී බලු පොරයක්, අරක, මේක කියලා විවේචනය කරලා, මිනිස්සුන්ගේ ඔළුවලට ඕක දැම්මේ. නමුත්, ඒක නරක දෙයක් නොවෙයි නේ. ඔබතුමන්ලාගේ 159දෙනෙක් ඇවිල්ලා ඉන්නේ, මනාප ක්‍රමයට නේ. මනාප ක්‍රමය ඉතා හොඳ ඡන්ද ක්‍රමයක් හැටියටයි මම දකින්නේ. මොකද, ඉස්සර කතිරය ගැහුවේ පක්ෂයට විතරයි. දැන් මනාප ක්‍රමය බලන්න කෝ. පක්ෂයට විතරක් නොවෙයි, ඡන්දදායකයාටත් අයිතියක් තිබෙනවා නේ, තමන් කැමැති කෙනෙකුට මනාපයක් දෙන්න. ලැයිස්තුවක් අපි දමනවා නේ. නමුත්, ඒ ලැයිස්තුවම පත් වෙන්නේ නැහැ.

කුරුණෑගල දිස්ත්‍රික්කය ගත්තොත්, අපේක්ෂකයන් 18දෙනෙක් ඉදිරිපත් කරනවා. මෙවර මැතිවරණයෙන් ඔබතුමන්ලාගේ 12දෙනෙක් පත් වෙලා ආවා. ඔබතුමන්ලාගේ ඔක්කෝම සිටියේ මන්ත්‍රීවරු 15යි. අපෙන් ආවේ 03දෙනයි. එතකොට, අමාරු වෙලාවක වුණත් තමන් කැමැති පක්ෂයට ඡන්දය දෙනවා වාගේම, තමන් කැමැති අපේක්ෂකයා තෝරලා එවන්න ජනතාවට අයිතියක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි දෙකක කාලයක් පමණයි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සභාපතිතුමනි, මට තව පොඩ්ඩක් කාලය ඕනෑ වනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මෙතුමාට තව විනාඩි දෙකක් දෙන්න.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සභානායකතුමනි, එම නිසා මම කියන්නේ මෙයයි. දැන් ඔබතුමාගේ ගොඩක් කථාවලින් මට පෙනෙනවා, මේක හරි තැනට ගෙනෙන්න ඔබතුමාට අවශ්‍ය වෙලා තිබෙන බව. ඒකනේ සමහර වෙලාවට කැකෝ ගහන්නේ. හරි තැනට ගෙනෙනවා නම් ඒකට උදවු කරන්න අපිත් ලැහැස්තියි. හරි තැනට ගෙනෙනවා නම්, අපි පළාත් පාලන ආයතන මැතිවරණයේ ඉඳලා හදන්න ඕනෑ. දැන් පළාත් සභා මැතිවරණ ක්‍රමයත් සංශෝධනය කරන්න ඕනෑ. අපට පළාත් සභා ඡන්දය කල් දමන්න ඕනෑ නම්, ඕනෑ තරම් ක්‍රම තිබෙනවා. සීමා නීර්ණය අනුව ගියොත් පළාත් සභා ඡන්දය කල් දමන්න ඕනෑ නම් අපට පුළුවන්. ඔබතුමන්ලා ඉන්න කාලයේ පළාත් සභා පිහිටුවන්න බැහැ. සීමා නිර්ණය කියන්නේ, ඡන්දය කල් දමන්න ගන්නා ක්‍රමවේදයක්. ඒක රනිල් වික්‍රමසිංහ මහත්තයා පෙන්නුවා. එතුමාටත් දොස් කියනවා නොවෙයි. එතුමා ඒක පෙන්නුවා. එම නිසා ඔබතුමන්ලා ඒ ගමන් මඟ යන්න එපා. ඔබතුමන්ලා හරි මඟ යන්න. අපට අවාසි වුණත් නැතත්, පළාත් සභා ඡන්දය තියන්න ඕනෑ. පරණ ක්‍රමය අනුව තියන්න. මනාප ක්‍රමය නරකයි කිව්වාට, බැලුවාම ඒක ඇත්තටම හොඳ ක්‍රමයක්. ඒ, ඡන්දදායකයාගේ අයිතිවාසිකම අපි රකින්නේ. පක්ෂයට විතරක් නොවෙයි, අපේක්ෂකයාටත් ඡන්දය දෙන්න පුළුවන්. ඒ ක්‍රමය ගැන කල්පනා කරලා වෙනස් කරනවා නම් හොඳයි.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ කාලයේ තමයි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත සංශෝධනය වුණේ. මම හිතන විධියට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ බැසිල් රාජපක්ෂ මහත්මයා ගෙනාපු සංශෝධනයක් තමයි කට්ටිය එකතු වෙලා බදා ගත්තේ. යහ පාලන ආණ්ඩුවෙන් ගෙනාවාට, ඒක කලින් ඇවිල්ලා තිබුණු සංශෝධනයක්. ඒක හොඳ ක්‍රමයක් නොවෙයි කියලා දැන් පැහැදිලියි. ඒකෙන් මන්ත්‍රී සංඛ්‍යාව දෙගුණයක් වෙලා තිබෙනවා. සභාවල අද ඉඩ නැහැ. මන්ත්‍රී සංඛ්‍යාව 20ක් හිටියා නම්, දැන් 40ක් වෙලා තිබෙනවා. එතකොට ඉතාම අමාරු තැනකට පත් වෙලා තිබෙනවා. අනෙක් ප්‍රශ්නය තමයි, සභාව පිහිටුවනකොට දූෂණ ගොඩයි. මන්ත්‍රීවරු සල්ලිවලට ගන්නවා. වරදානවලට ගන්නවා. ඊළඟට, අය වැය කිට්ටු වනකොට සභාපතිට ඉන්න නැහැ. අර, ගත්ත අයට ආපහු දෙන්න ඕනෑ. මුදල් විතරක් නොවෙයි, හැම අංශයෙන්ම. මෙම ක්‍රමය නිසා ප්‍රශ්න ගණනාවක් මතු වෙලා තිබෙනවා. අද ඇමතිතුමාත් අමාරුවේ වැටිලා තිබෙන්නේ ඒකයි. එතුමාගේම ආසනයේ ආනමඩුව ප්‍රාදේශීය සභාව පිහිටුවන්න බැරි වෙලා ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩියක කාලයක් පමණයි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු සභාපතිතුමනි, මම අවසාන වශයෙන් තව පොඩි කාරණාවක් කියන්න ඕනෑ.

මට තව පොඩි වෙලාවක් දෙන්න, ගරු සභාපතිතුමනි. තව විනාඩි දෙකක් දෙන්න. *[බාධා කිරීමක්]* .ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා, විනාඩි තුනක් දෙනවා කියලා.

රාජ්‍ය සේවයේ වැටුප් සම්බන්ධව කථා කිරීමේදී විශේෂයෙන් මේ කාරණය කියන්න ඕනෑ. අපේ යහ පාලන රජය කාලයේ රාජ්‍ය සේවයේ වැටුප් දෙගුණයකින් වැඩි කළා. ඔබතුමන්ලාගේ පක්ෂයෙනුත් මන්ත්‍රීතුමන්ලා 06දෙනෙක් පාර්ලිමේන්තුවේ හිටියා. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, ඔබතුමාත් එම පාර්ලිමේන්තුවේ හිටියා.

අපි ඒ වෙලාවේ දෙගුණයකින් වැටුප් වැඩි කළා කියන්නේ 2015 ඉඳලා 2020 වනකොට සියයට 107කින් අපි රාජ්‍ය සේවකයින්ගේ වැටුප වැඩි කළා. ගරු සභාපතිතුමනි, ඒ වැටුප් වැඩිවීමට අදාළව විශ්‍රාම වැටුපත් වෙනස් වන්න ඕනෑ. 2020දී ගෝඨාභය රාජපක්ෂ මහතා චක්‍රලේඛයක් මඟින් ඒක cancel කළා. එතකොට ඒ අයට ලොකු අසාධාරණයක් වුණා. මොකද, වැටුප් වැඩි කිරීම අවුරුද්දෙන් අවුරුද්ද සිදු වුණාට ඒක 2015දී ලබා දුන් වැටුප හැටියට තමයි අපි සැලකුවේ. ඒ අනුව තමයි 2016 ඉඳලා ඒ අයට විශ්‍රාම වැටුපට ඒක එකතු වන්න ඕනෑ. නමුත් ඒක තවමත් හරියට කෙරිලා නැහැ. තමුන්නාන්සේලා දන්නවා, විශ්‍රාම වැටුපේ විෂමතා ගණනාවක් තිබෙන බව. ඒ වාගේම රාජ්‍ය සේවකයන්ට තවත් අසාධාරණකම් ගණනාවක් වෙලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මම මේ කාරණයත් කියන්න ඕනෑ. අද පර්මිට් ගැන කථා කරනවා. මම කියන්නේ මන්ත්‍රීවරුන්ට ලබා දෙන පර්මිට් ගැන නොවෙයි, රාජ්‍ය නිලධාරින්ට ලබා දෙන පර්මිට් ගැන. මේක සමාන වෙන්න ඕනෑ. අද ව්‍යාපාරිකයෝ වැනි මුදල් තිබෙන අය රුපියල් බිලියන ගණන් වටිනා වාහන ගෙනැල්ලා තිබෙනවා. දොස්තරවරුන්ට, ඉංජිනේරුවන්ට, පරිපාලන සේවයේ

නිලධාරින්ට වාහනයක් ගෙන්වන්න අපි පර්මිට් ක්‍රමයක් ලබා දීලා තිබුණා. ඇයි එහෙම ලබා දුන්නේ? ඔවුන්ට ලොකු වැටුපක් දෙන්න බැරි හින්දා ඔවුන්ටත් වාහනයක් ගන්න, සමාජයේ සමානත්වයක් ඇති කරන්න තමයි ඒ තත්ත්වය ඇති කරලා තිබුණේ. එයත් ලබා දුන්නේ සියයට 100ක් duty-free නොවෙයි. මේ වන විට issue කළ permits තිබෙනවා, 30,000ක් විතර. *[බාධා කිරීමක්]* අපේ සංවිධායකතුමා මට තව විනාඩි තුනක් දෙනවාලු.

ගරු සභාපතිතුමනි, සභානායකතුමනි, මම කියන්නේ ඔබතුමන්ලා මේ ගැන බලන්න ඕනෑ කියලායි. අද අපි කියනවා, දොස්තරලා රට දාලා යනවා කියලා. දැන් තමුන්නාන්සේලා ආවා කියලා ඒක නැවතිලා නැහැනේ. දොස්තරලා රට දාලා යන එක අඩු වෙලාත් නැහැ, නැවතිලාත් නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, එතුමාට තව විනාඩි තුනක් ලබා දෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
අමතරව තව විනාඩි 3ක් ලබා දෙනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
අපට ඒ අයව තියාගන්න ඕනෑ නම් මම කියන්නේ මෙන්න මේවා ගැන සාධනීයව හිතන්න කියලායි. ඒ අයගේ ජීවන තත්ත්වය අනුව, ගන්න වැටුප අනුව අද වාහනයක් ගන්න බැහැනේ. අද වාහනයක මිල තිබෙන්නේ රුපියල් ලක්ෂ 100න් උඩනේ. තමුන්නාන්සේලා Vitz එක රුපියල් ලක්ෂ 12ට දෙනවා කිව්වාට එහෙම එකක් වෙලා නැහැනේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි කිව්වේ නැහැ.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ඔබතුමා නොවෙයි, සමහරුන් කිව්වානේ. අද ඒ රාජ්‍ය නිලධාරින්ට පර්මිට් එකක් දෙන්න පුළුවන් තැනට රට පත්වෙලා තිබෙනවා. පසුගිය කාලයේ වාහන ගේන්න බැරිව හිටියා, ඩොලර් නැති නිසා. අඩුම ගාණේ රාජ්‍ය නිලධාරින් කොටසකටවත් ඒ සහනය ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න.

ගරු සභානායකතුමනි, ඒ වාගේම මම තව එක කාරණයක් ගැන කියනවා, මම මේක කියන්නම ඕනෑ. මම ජාතිවාදයක්, ආගම්වාදයක් ගැන කථා කරන කෙනෙක් නොවෙයි, මම එහෙම හිතන්නේත් නැහැ. නමුත් මම පැහැදිලිවම කියන්න ඕනෑ, ත්‍රිකුණාමලයේ සිද්ධිය සම්බන්ධයෙන්. *[බාධා කිරීමක්]* නැහැ, ජනාධිපතිතුමා කිව්වා, ඒක ගැන තමයි මම කියන්නේ. ජනාධිපතිතුමා කිව්වා, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මහ-ජන ආරක්ෂක අමා-ත්‍යාං-ශයේ ලේකම්තුමා හරහා කැඳවනවා කියලා. ඒකෙන් ලොකු අපහාසයක් තමුන්නාන්සේලාට සිද්ධ වුණා. බලන්න, ඒ වීඩියෝ එක. ඒ පොලිස් නිලධාරින්ගේ හැසිරීම කොහොමද? ආගම මොකක්ද කියන එක නොවෙයි එතැන තිබෙන ප්‍රශ්නය. බෞද්ධද, හින්දුද, ඉස්ලාම්ද එහෙම නැත්නම් ක්‍රිස්තියානිද කියන එක නොවෙයි ප්‍රශ්නය.

එහෙම කොහොමද පොලිස් නිලධාරියෙක් හැසිරෙන්නේ? ආගමික ස්ථානයකට ගිහිල්ලා ඒ හැසිරුණු ආකාරය ගැන කොච්චර ලජ්ජා වන්න ඕනෑද? මේකට ඇමතිතුමා හෝ ආණ්ඩුව නියෝජනය කරන කවුරුවත් සම්බන්ධ නැත්නම් මම ඔබතුමාට කියනවා, මේ පොලිස් නිලධාරියාගේ වැඩ තහනම් කරලා - interdict කරලා - පරීක්ෂණයක් ආරම්භ කරන්න කියලා. මොකද, අපේ රටේ එහෙම වෙන්න දෙන්න බැහැ. *[බාධා කිරීමක්]* බෞද්ධ කථාව නොවෙයි මම මේ කියන්නේ. කිසිම තැනකවත් එහෙම වෙන්න බැහැ. තමුන්නාන්සේලා ආවේ එහෙම වෙන ඒවා නවත්වන්න. ඒ නිසා ඒ කාරණයත් මම මතක් කරනවා. එහෙම කළොත්, හැම කෙනාටම නීතිය සාධාරණයි කියලා තමුන්නාන්සේලා කියන කථාව හරියනවා. ඒ නිසා ඒ විධියට වැඩකටයුතු කරන්න කියා මම මතක් කරනවා.

විශේෂයෙන් මම ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වනවා, කාලය ලබා දීම සම්බන්ධව. ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් මට වැඩිපුර කාලය ලබා දුන්නා. ඒ ගැනත් සතුටු වනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මමත් කිව්වා, තව කාලය ලබා දෙන්න කියලා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
හොඳයි, එහෙනම් ඒ පැත්තෙන් ගන්න ඒ කාලය. අපි කැමැතියි, යහපත් පාලනයකට. ඒ සඳහා තමුන්නාන්සේලා ජනතාවට පොරොන්දු ලබා දුන්නා. ජනතාව ඒ ගැන බලාපොරොත්තු තබාගෙන ආවා. ඒවා එකින් එක කඩන්නේ නැතිව ඒ යහපත් පාලනය ඇති කරන්න. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය ගොඩක් වැඩ කරන්න පුළුවන් අමාත්‍යාංශයක්. පළාත් පාලන ආයතන සියල්ලම අධීක්ෂණය වෙනවා, ඔබතුමාගෙන්. එතැන දේශපාලන අධිකාරිය තිබෙනවා. පළාත් සභා 9ත් තිබෙනවා. පළාත් සභා පිහිටු වූ පසුව ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුන්සිය ගණනක් තුළින් ග්‍රාම නිලධාරි කොට්ඨාස දක්වා රජයේ සියලුම පරිපාලන කටයුතු එතැනින් කෙරෙනවා. මම පැහැදිලිව කියන්න ඕනෑ, යහ පාලන ආණ්ඩුව කාලයේ -2019දී- මම අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරද්දී "ගම්පෙරළිය" වැඩසටහන යටතේ ව්‍යාපෘති 10,000කට වඩා ක්‍රියාත්මක කරන්න අපට පුළුවන් වුණු බව.

එහෙනම්, රජයේ නිලධාරින් වැඩ කරන්නේ නැහැයි කියන්න බැහැ. ඔවුන්ගෙන් වැඩ ගන්න ක්‍රමවේදය අපි හදාගන්න ඕනෑ. ඒ අය මේ රටේ සංවර්ධනයට ගොඩක් දායක වෙලා තිබෙනවා. ඉදිරියේදීත් ඒක ක්‍රියාත්මක කරගන්න නම් අවශ්‍ය සහයෝගය ඒ අයට ලබා දෙන්න කියා මම මතක් කරනවා. රාජ්‍ය නිලධාරින්ගේ ප්‍රශ්න දෙස අපි සානුකම්පිතව බලන්න ඕනෑ. විශේෂයෙන් සංවර්ධන නිලධාරින්ගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. ඒ වාගේම ග්‍රාම නිලධාරින්ගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. තවම ඔවුන්ගේ සේවා ව්‍යවස්ථාව සකස් කර නැහැ. මෙන්න මේවා ගැනත් සාධනීයව හිතා බලන්න. ඒ වාගේම විශ්‍රාමිකයින් ගැනත් සාධනීයව හිතා බලා අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Prof.) A.H.M.H. Abayarathna. You have 18 minutes.

[පූ.භා. 10.10]

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු සභාපතිතුමනි, අද දවසේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අදාළ වැය ශීර්ෂ පිළිබඳවත් කෙරෙන සාකච්ඡාවේදී මම මුලින්ම මට කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණයකට අදාළව යමක් සඳහන් කරලා මගේ කථාවට ප්‍රවේශ වන්න කැමැතියි. එතුමා සඳහන් කළා, ඊයේ දවසේ සීතාවක ප්‍රාදේශීය සභාව පිහිටුවීම පිළිබඳව. ගරු සභාපතිතුමනි, එතුමා සඳහන් කළා, මන්ත්‍රීවරුන් සල්ලිවලට විකුණුනා කියලා. මම හිතන්නේ, දේශපාලන පක්ෂ හැටියට අපි හැමෝටම වගකීමක් තිබෙනවා, සල්ලිවලට විකිණෙන්නේ නැති ජනතා නියෝජිතයන් නිර්මාණය කර ගැනීමට. හැබැයි මම පෙන්වා දෙන්න කැමැතියි, මෙහිදී ජන මතය තිබුණේ කොහොමද කියලා.

සීතාවක ප්‍රාදේශීය සභාවේ මාලිමාවට ආසන 23යි. ඊට පස්සේ වැඩිම ආසන ගණනක් ගත්තේ සමගි ජන බලවේගය, ආසන 8යි. අනෙක් පක්ෂවලට ඊට වඩා අඩුවෙන් තමයි ආසන තිබෙන්නේ. අඩුම තරමින් මාලිමාවට විකල්පයක් ලෙස කිසිම දේශපාලන පක්ෂයක් ජනතාව හඳුනා ගත් බවක් මේ ප්‍රතිඵලවලින් පෙනෙන්නේ නැහැ. එහෙම තත්ත්වයක් මත තමයි ගොඩක් තැන්වල ප්‍රශ්න පැන නැඟුණේ. ඒ පිළිබඳව සංවාදයක් ගොඩනඟා ගැනීම අවශ්‍ය වනවා.

ගරු සභාපතිතුමනි, එතුමා සඳහන් කළා, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත වෙනස් කිරීමට අදාළව තිබුණු සාකච්ඡාව ගැන. ඔබතුමන්ලා කවුරුත් දන්නවා, ඒ වනකොට මැතිවරණ කොමිෂන් සභාවට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් නිකුත් කර තිබුණු බව, හැකි ඉක්මනින් මැතිවරණය පවත්වන්න කියලා. ඒ නිසා තමයි කඩිනමින් අවශ්‍ය සංශෝධන ටික කරලා මැතිවරණයකට යන්න අපට සිද්ධ වුණේ. එතුමා කියනවා, පක්ෂ නායක රැස්වීමේ එතුමා හිටියා නම් මේ තීරණයට විරුද්ධ වනවා කියලා. ඒ කියන්නේ විපක්ෂ නායකතුමා සම්බන්ධ වෙලා ගත් තීරණය වැරදියි; විපක්ෂ නායකතුමා ගත්ත තීරණයට එතුමා විරුද්ධයි කියන අදහස තමයි කියවෙන්නේ.

කොහොම නමුත්, එතුමා පළාත් සභා පිළිබඳවත් සාකච්ඡා කළා. අපි අද දවසේ ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කරනවා. ගරු සභාපතිතුමනි, ඇත්තටම පළාත් සභාවලට අදාළව තිබුණු සමානුපාතික නියෝජන ක්‍රමය අහෝසි කරලා යහ පාලන සමයේ අලුත් මැතිවරණ ක්‍රමයක් ගෙනාවා. එතුමන්ලාත් ඊට සම්බන්ධ වෙලා හිටියා. ඒ ක්‍රමයේදී යෝජනා කරලා තිබෙන්නේ සියයට 50ක් කොට්ඨාස පදනම් කරගෙනත්, තවත් සියයට 50ක් අමතර ලැයිස්තුවකිනුත් පත් කර ගන්න. ඒ කොට්ඨාස පදනම් කර ගත් සීමා නිර්ණය කමිටු වාර්තාවත් ඉදිරිපත් කළා. ඒ කමිටු වාර්තාව ඉදිරිපත් කරපු ඇමතිවරයාත් ඊට විරුද්ධව ඡන්දය දීලා මේ පාර්ලිමේන්තුවේදීම එම යෝජනාව පරාජය කළා. දැන් අපට තිබෙනවා, එතැනින් ඉදිරියට වඩාත් යහපත් ක්‍රමයක් සකස් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ගවලට යොමු වන්න. ජනාධිපතිතුමාගේ කථාවේදී එතුමා සඳහන් කළේ පාර්ලිමේන්තුවෙන් ඒ නීති සම්පාදනය කරලා දෙන්න කියන කාරණයයි. එහෙම නැතිව ඒක කරන්න කියලා විපක්ෂයට කිව්වා නොවෙයි. පාර්ලිමේන්තුවට තමයි ඒ වගකීම තිබෙන්නේ කියන කාරණය තමයි එතුමා සඳහන් කළේ. මම ඊට වඩා ඒ ගැන යමක් සඳහන් කරන්න යන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ආනමඩුව ආසනය ගැනත් මම යමක් කියන්න ඕනෑ. එතුමා සඳහන් කළා, ඒ මගේ ආසනය කියලා. ඒක ඇත්ත. දැනට ඔබතුමන්ලාගේ ඉන්න නියෝජිතයෝ අපිත් එක්ක කරන සාකච්ඡා ඇහුවොත් හරි පැහැදිලියි, ඔබතුමන්ලා එදා ගත්ත තීරණයට විරුද්ධව තමයි දැන් ඒ සභිකයෝ වැඩිපුර ප්‍රමාණයක් ඉන්නේ කියන එක.

ගරු සභාපතිතුමනි, එතුමාගේ කථාවෙන්ම මම මගේ කථාවට ආරම්භයක් ගන්නම්. 76 අවුරුද්දක් ගැන කථා කරනවා, 77වන අවුරුද්ද ගැන කථා කරන්නේ නැහැ කිව්වා. ඒ නිසා මම කැමැතියි, 77වන අවුරුද්ද ගැන මගේ කථාවේදී අදහස් ඉදිරිපත් කරන්න. අපි දන්නවා, 2018 අවුරුද්දේ දින 52 ආණ්ඩුව පත් වුණාට පස්සේ ඇති වූ දේශපාලන ව්‍යාකූලත්වය පිළිබඳව, ඒ වාගේම 2019 අවුරුද්දේදී ඇති වූ පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳව, 2020-2021 කාලයේ පැවති කොවිඩ් වසංගතය, ඒ වාගේම 2022දී ඇති වූ ආර්ථික හා දේශපාලන අර්බුදකාරී වටපිටාව මත රාජ්‍ය සේවයට බඳවා ගැනීම් නතර වෙලා තිබුණු බව.

රාජ්‍ය සේවය ස්වාභාවික මරණයක් කරා ගමන් කරමින් තිබුණා. පුහුණුවීම් කටයුතුවල බිඳ වැටීමක් ඇතිවෙලා තිබුණා. රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය බඳවා ගැනීම් සහ අඛණ්ඩතාව සඳහා කළ යුතු බඳවා ගැනීම් සිද්ධ වුණේ නැහැ. රාජ්‍ය සේවය තුළින් කෙරෙන සීමිත බඳවා ගැනීම් ප්‍රමාණයක් පමණයි සිද්ධ වුණේ. විවෘත පදනමින් කළ යුතු බඳවා ගැනීම් සියල්ල නතර කරලා තිබුණා. එම නිසා මෙන්න අපි බලයට පත් වූ වහාම 77වන අවුරුද්දේ පළමුවැනි පියවර හැටියට, නතර කර තිබුණු රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමට අවශ්‍ය බඳවා ගැනීම් ආරම්භ කළා. එම නිසා රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය සහ අඛණ්ඩතාව වෙනුවෙන් වූ බඳවා ගැනීම් කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමට අදාළව අන්තර්කාලීන පියවරක් හැටියට, "රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය සඳහා වන කමිටුව" අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් අපි ස්ථාපිත කළා. එම කමිටුව සිදු කරනු ලබන නිර්දේශ සලකා බලා අමාත්‍ය මණ්ඩලය විසින් බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලබා දෙනවා. ඒ අනුව දැන් අපි එම ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා.

බඳවා ගැනීම් නතර කර තිබුණු වටපිටාවක් ඇතුළේ රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට 76,982ක් -77,000කට ආසන්න පිරිසක්- බඳවා ගැනීම සඳහා මේ වන විට අනුමැතිය ලබා දී තිබෙනවා. ඒ වාගේම, "උපාධිධාරීන්ට රැකියා දෙනවා කිව්වා, නමුත් දැන් දෙන්නේ නැහැ" කියලා පසුගිය දවස්වල කථා කරනවා අපි දැක්කා. බඳවා ගැනීමට අනුමැතිය ලබා දුන් 77,000කට ආසන්න රාජ්‍ය සේවකයින් අතර උපාධිධාරීන්ටත් අවස්ථා විශාල ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබෙනවා. එම නිසා අපි උපාධිධාරීන්ට පොරොන්දු වුණු විධියට රැකියා ලබා දීම සඳහා මේ වැඩ පිළිවෙළ ඇතුළේ ඒ අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මේ වන විටත් උපාධිධාරීන් 12,309ක් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීලා තිබෙනවා. තව විශාල පිරිසක් බඳවා ගැනීමටත් නියමිතයි. මෙම බඳවා ගැනීම් සඳහා අයදුම් පත් කැඳවීම, විභාග පැවැත්වීම සහ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සිදු වෙමින් පවතිනවා. ඒ වාගේම සමහර ප්‍රශ්න විසඳීම සඳහා සමහර පළාත් සභා අධිකරණ ක්‍රියාමාර්ගවලට ගිහිල්ලා තිබුණා. එම අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වූ තැන්වලට, උපාධිධාරීන් ගුරුවරුන් හැටියට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතුත් අපි මේ වන විට ආරම්භ කර තිබෙනවා.

ඒ වාගේම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ පවතින දීප ව්‍යාප්ත සේවාවලද, ඒකාබද්ධ සේවාවලද බඳවා ගැනීම් අඛණ්ඩව

සිදු කිරීම අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා. සියලු අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාළ බඳවා ගැනීම්, ඒ වාගේම ග්‍රාම නිලධාරි කාර්යාල දක්වා වන බඳවා ගැනීම් සහ පළාත් සභාවලට අවශ්‍ය දීප ව්‍යාප්ත සේවාවලට අදාළ බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පත් කිරීම් බලධාරිත්වය යටතේ හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පත් කිරීම් බලධාරිත්වය යටතේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින්.

2021 වර්ෂයේ සිට විවෘත පදනම මත බඳවා ගැනීම් සඳහා අයවැයුම්පත් කැඳවා තිබුණේ නැහැ. අලුතින් තරුණ තරුණියන්ට අවස්ථාවක් දෙන්න ඉඩකඩ තිබුණේ නැහැ, 2021 වර්ෂයේ ඉඳලා. සමහර ඒවාට අයදුම්පත් කැඳවා තිබුණත් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා දීලා තිබුණේ නැහැ. ඒ නිසා නියමිත බඳවා ගැනීම් සිදු කෙරුණේ නැහැ. එම නිසා අපි ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවය, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය යන සේවාවල ඇතිවෙලා තිබුණු පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර තිබෙනවා. ඒ අනුව මේ වනවිට ශ්‍රී ලංකා පරිපාලන සේවයට 194ක්, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට 257ක්, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයට 146ක්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට 191ක්, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට 86ක් වශයෙන් 874ක් බඳවාගෙන තිබෙනවා. මේ සේවාවලට බඳවා ගත්තේ නැත්නම් රාජ්‍ය සේවය විධිමත්ව පවත්වාගෙන යෑම කොහෙත්ම කරන්න පුළුවන්කමක් නැහැ. ඒ බඳවා ගැනීම් නවත්වලා තිබුණේ. නවත්වලා තිබුණු දේවල් තමයි අපි දැන් පටන්ගෙන කරගෙන යන්නේ. අපි ඉදිරියටත් අවශ්‍යතාව අනුව බඳවා ගැනීම් කරන්න කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි, ගරු සභාපතිතුමනි. ඉදිරියේදී ශ්‍රී ලංකා පරිපාලන සේවයට 130ක්, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයට 211ක්, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයට 77ක්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට 100ක්, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයට 13ක්, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට 118ක් ආදී වශයෙන් තවදුරටත් බඳවා ගැනීමට නියමිතයි. අපි තවදුරටත් රාජ්‍ය සේවය ශක්තිමත් කිරීමට රාජ්‍ය සේවයේ මර්මස්ථානවලට අවශ්‍ය කරන බඳවා ගැනීම් සිදු කිරීම සඳහා මේ වනවිටත් අවශ්‍ය කටයුතු සිදුකර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මෙන්න, අපේ රටට නිදහස ලැබී 77වන අවුරුද්දේ කරපු දේවල්. 76වන අවුරුද්දේ අග භාගයේ ඉඳලා නොකරපු දේවල්, අපි 77වන අවුරුද්දේදී කරන්න පටන් ගෙන තිබෙනවා. 77වන අවුරුද්ද තුළ රැකියා අපේක්ෂාවෙන් හිටපු උපාධිධාරීන් ඇතුළු තරුණ තරුණියන්ටත්, මේ ආයතනවල ගුණාත්මක සේවයක් පවත්වා ගැනීම අපේක්ෂා කරපු ජනතාවටත් ඒ සඳහා අපි දැන් අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 2018 වර්ෂයෙන් පසුව ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සේවා නිලධාරි සේවයට විවෘත පදනමින් බඳවා ගැනීම් සිදුකර තිබුණේ නැහැ. 2020 වර්ෂයේදී බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවලා තිබුණා. හැබැයි, බඳවා ගැනීම සඳහා අනුමැතිය දීලා තිබුණේ නැහැ. නමුත්, අපි ලබා ගත් අනුමැතිය යටතේ 2025.05.18වන දින පවත්වන ලද විවෘත තරග විභාගයෙන් 1,908 දෙනෙකු බඳවාගෙන තිබෙනවා. ඒ අතර උපාධිධාරීනුත් 700කට වැඩි පිරිසක් ඉන්නවා. මේකේ සීමිත බඳවා ගැනීම්වල යම් ගැටලුවක් තිබුණා. ඒ ගැටලුව නිරාකරණය කිරීම සඳහාත් අපි කටයුතු කරමින් ඉන්නවා. සමහර වෙලාවට අනවබෝධය නිසා ආයතනවල යම් යම් ගැටලු පැන නඟින බව පෙනෙනවා.

ඒ අනවබෝධය නිසා පවතින ගැටලු නිරාකරණය කර ගනිමින් මේ සීමිත කණ්ඩායමටත්, තව කණ්ඩායමකටත් ඇත්තටම රැකියා ලබා දීලා තිබෙන්නේ. ඒගොල්ලන් ඒ තත්ත්වයට පත් කිරීම තමයි කරන්න තිබෙන්නේ. ඒ සඳහා අපි අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

ඒ වාගේම කළමනාකරණ සේවා නිලධාරි සේවයේ 2024 වර්ෂය සඳහා වූ විවෘත තරග විභාගයට අයදුම්පත් කැඳවලා එම විභාගය අපි ඔක්තෝබර් 05වැනි දා පවත්වා තිබෙනවා. ඒ විභාගයෙනුත් තව තරුණ තරුණියන් කණ්ඩායමක් බඳවා ගැනීමට අපි කටයුතු කරනවා.

ඊළඟට, රජයේ ඩිජිටල්කරණ කටයුතු වේගවත් කිරීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට බඳවා ගැනීම සඳහා විවෘත සහ සීමිත තරග විභාග වෙනුවෙන් අයදුම්පත් කැඳවා තිබෙනවා. දැන් අපි වැඩේ පටන් අරගෙන තිබෙන්නේ. මේ සියලුදෙනා බඳවා ගත්තාට පස්සේ රාජ්‍ය සේවය වඩාත් සක්‍රිය රාජ්‍ය සේවයක් බවට පත් කිරීමේ ඉඩකඩ අපට ලැබෙන බව ඉතාම පැහැදිලියි. මම මේ කිව්වේ 77වන අවුරුද්දේ කරපු වැඩ.

ඒ වාගේම තමයි, රජයේ භාෂා පරිවර්තක සේවයට බඳවා ගැනීම සඳහා අපි අයදුම්පත් කැඳවා තිබෙනවා. පුස්තකාලයාධිපති සේවයට බඳවා ගැනීමට විවෘත සහ සීමිත තරග විභාග සඳහා අයදුම්පත් කැඳවා තිබෙනවා. ඒ වාගේම තමයි, රාජ්‍ය සේවය ගත්තාම, රියැදුරු සේවයේ පුරප්පාඩු රාශියක් තිබුණා. එම නිසා රාජ්‍ය කටයුතුවලට බාධාවක් ඇති වෙලා තිබුණා. ඒ අනුව රියැදුරු සේවයේ පුරප්පාඩු 1,000ක් පිරවීම සඳහා අවශ්‍ය කරන බඳවා ගැනීම් කිරීමට අපි කටයුතු කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි පළාත් සභාවක, පළාත් පාලන ආයතනයක, එහෙමත් නැත්නම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩවලට ගියාම පැන නැඟුණු ප්‍රධාන ගැටලුව තමයි, කාර්මික නිලධාරීන් සහ තාක්ෂණ නිලධාරීන්ගේ හිඟය. එම තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගෙන තිබුණේ නැහැ. රජයේ සංවර්ධන කාර්යයන් සඳහා බාධාවක් තිබුණා. එම නිසා කාර්මික නිලධාරි හිඟය පිරවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට කාර්මික නිලධාරීන් 150දෙනෙක් බඳවා ගැනීමට අනුමැතිය දීලා තිබෙනවා. ඒ සඳහා ඔක්තෝබර් මස 25 හා 26 දින තරග විභාග පැවැත්වූවා. ඒ අනුව ඔවුන් කඩිනමින් බඳවා ගැනීමට නියමිතයි.

තවත් කාරණයක් තමයි, ග්‍රාම නිලධාරි සේවයේ දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳී පැවති සේවා ව්‍යවස්ථා ගැටලුව. අපි දැන් ඒක නිරාකරණය කර තිබෙනවා. සංගම්වල එකඟතාව මත එය නිමාවට පත් කරලා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය පරිදි ඒවා ක්‍රියාත්මක තත්ත්වයට පත් කර තිබෙනවා. 2025 ඔක්තෝබර් 15වැනි දා ඉඳලා ග්‍රාම නිලධාරි සේවයේ සේවා ව්‍යවස්ථා ගැටලුව අපි නිරාකරණය කර තිබෙනවා. ග්‍රාම නිලධාරි සේවයේ පුරප්පාඩු 1,938ක් පිරවීම සඳහාත් මේ වෙනකොට අයදුම්පත් කැඳවා තිබෙනවා. මෙන්න, 77වන අවුරුද්දේ සිදු කරන වැඩ.

රෙජිස්ට්‍රාර් සේවයේ බඳවා ගැනීම් නවත්වා තිබුණු නිසායි මේක විශේෂයක් වෙන්නේ, ගරු සභාපතිතුමනි. සාමාන්‍ය විධියට බඳවා ගැනීම් කරලා තිබුණා නම් මේ ප්‍රශ්නය ගැන අපට කථා කරන්න වෙන්නේ නැහැ. රෙජිස්ට්‍රාර් සේවයේ බඳවා ගැනීම් සඳහා දැන් අයදුම්පත් කැඳවා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. 2025 අය වැය යෝජනා අනුව රජයේ නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වැඩි කරපු බව ඔබ කවුරුත් දන්නා කාරණයක්. 2025 අය වැය යෝජනාවේ ප්‍රධානතම යෝජනාවක් වුණු රජයේ නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීමේ යෝජනාව 2025 වර්ෂයේ අප්‍රේල් මස පළමුවැනි දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරලා තිබුණා.

ඒ සඳහා අවශ්‍ය විධිවිධාන ඇතුළත් රජයේ නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීමට අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025,

[ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා]

2025.03.25 දිනැතිව නිකුත් කළා. පසුගිය අය වැය සම්මත වුණේ 2025 මාර්තු 21වැනි දා. 2025 මාර්තු 25වැනි දිනම අපි අදාළ චක්‍රලේඛය සම්මත කරලා නිකුත් කළා. ඒ අනුව රජයේ නිලධාරින්ට 2025 අප්‍රේල් මාසයේ සිටම අදාළ වැටුප් වැඩිවීම ලබා ගැනීමට හැකියාව ලැබුණා. 77වන අවුරුද්දේ කරපු වැඩ, මේ. මොකද, රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩිවීමක් දීර්ඝ කාලයකින් සිද්ධ වෙලා තිබුණේ නැහැ. අපි ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු කළා, ඔවුන්ගේ ඉල්ලීමකුත් නැතුව.

ඒ වාගේම රාජ්‍ය සේවක වැටුප් වැඩිවීම සඳහා දළ වශයෙන්, 2025 වර්ෂයේදී රුපියල් බිලියන 110ක් වෙන් කරලා තිබෙනවා. 2026 වර්ෂයේදී තව රුපියල් බිලියන 110ක්, 2027 වර්ෂය සඳහා තව රුපියල් බිලියන 110ක් වශයෙන් රුපියල් බිලියන 330ක් මේ සඳහා වැය වෙනැයි අපේක්ෂා කරනවා. ඒ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපාදන අපි වෙන් කරලා තිබෙනවා. ඒ, ඇයි? වඩාත් කාර්යක්ෂම රාජ්‍ය සේවයක් සඳහා ඔවුන්ගෙන් ගෞරවනීය සේවයක් සලසා ගැනීමටත්, ඔවුන්ගේ සේවය ගෞරවනීය සේවයක් හැටියට පවත්වා ගැනීමටත් අපි රාජ්‍ය නිලධාරින්ගේ වැටුප් වැඩි කරලා තිබෙනවා, රුපියල් බිලියන 330ක් වෙන් කරමින්.

ඒ වාගේම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025හි විධිවිධාන අනුව දීමනා සංශෝධනය විය යුතුව තිබුණු සෞඛ්‍ය, දුම්රිය සහ තැපැල් වැනි ආයතනවල දීමනා සියල්ල කඩිනමින් සංශෝධනය කරලා අනුමත කළා. එම නිසා ඒ නිලධාරින්ට අදාළ දීමනා ලබා ගැනීමට හැකියාව ලැබුණා. රජයේ නිලධාරින් විසින් තමන්ගේ නිත්‍ය රාජකාරිවලට අමතරව සිදු කරනු ලබන කාර්යයන් සඳහා ගෙවිය යුතු දීමනා අපි වැඩි කරලා තිබෙනවා. ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. ඒ වාගේම, රාජ්‍ය සේවයේ ධාරිතා සංවර්ධනය සඳහා; විශේෂයෙන්ම දීප ව්‍යාප්ත සේවාවන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා ඉන්දියාවේ යහ පාලනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානය - NCGG ආයතනය - හා ලංකාව අතර තිබෙන අවබෝධතා ගිවිසුම අනුව නිලධාරින් 1,500ක ප්‍රමාණයක් පුහුණු කිරීම අවුරුදු 5ක් තුළ සම්පූර්ණ කිරීමට අපි කටයුතු කර තිබෙනවා, ඉන්දියාවේ සහයෝගය මත. මේ රාජ්‍ය නිලධාරින් විදේශ සංචාරයකටවත්, වන්දනා ගමනකටවත් කිසිසේත්ම ගිහිල්ලා තිබුණේ නැහැ. මේක ඔවුන්ට අවශ්‍ය කරන පුහුණුව ලබා දීම සඳහා වූ විදේශ සංචාරයක් පමණක් නොවෙයි. ඇත්තටම මේ මඟින් ඔවුන්ගේ රැකියාවේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය වටපිටාව අපි සම්පූර්ණ කර තිබෙනවා. පසුගිය මැයි මාසයේ මේ කටයුත්ත ආරම්භ වුණා. මේ වනවිට නිලධාරින් 243දෙනෙක් ඒ පුහුණුවට ගිහිල්ලා තිබෙනවා. සීමිත නිලධාරින් පිරිසකට විතරක් නොවෙයි, පොදුවේ හැමෝටම අපි මේ අවස්ථාව ලබා දීලා තිබෙනවා. හැම දාම විදේශ සංචාරවලට යන නිලධාරින් වෙනුවට රාජ්‍ය සේවයේ ඉන්න කවදාවත් අවස්ථාවක් නොලැබුණු නිලධාරින්ට අපි මේ අවස්ථාව ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මේ අවුරුද්ද තුළ දීප ව්‍යාප්ත සේවාවන්හි සේවාරම්භක පුහුණු වැඩසටහන් රාශියක් එකවර පවත්වා තිබෙනවා. මේක අභියෝගාත්මක වැඩක්. නමුත් ඒ කාර්යය කරලා තිබෙනවා, අපේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය.

ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයට 108දෙනෙකුත්, පරිපාලන සේවයට 151දෙනෙකුත්, ගණකාධිකාරී සේවයට 234දෙනෙකුත්, වාස්තු විද්‍යාත්මක සේවයට 11දෙනෙකුත්, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට 75දෙනෙකුත්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට 195දෙනෙකුත් සඳහා සේවාරම්භක පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අමාත්‍යාංශය හැටියට අපි කටයුතු කර තිබෙනවා. මේ තමයි, 77වන අවුරුද්දේ මේ ටිකට අපි කර තිබෙන වැඩ ටික.

ඊළඟට, දැනට අඩුපාඩුවක්ව පවතින රාජ්‍ය සේවයේ මාණ්ඩලික නොවන නිලධාරින්ගේ පුහුණු අවශ්‍යතා පිළිබඳව කටයුතු කිරීමට රාජ්‍ය සේවා පුහුණු ආයතනය ඇරඹීමට නියමිතයි. ඒ වාගේම මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය හඳුන්වා දීමට අපි කටයුතු කරමින් තිබෙනවා. ඒ අනුව ඒකාබද්ධ සේවා 3ක් හා දීප ව්‍යාප්ත සේවා 3ක් ආවරණය වන පරිදි බඳවා ගැනීමේ සිට විශ්‍රාම ගැන්වීම සඳහා වන මානව සම්පත් ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට විශ්‍රාම වැටුප් වැන්දඹු, වැන්දඹු පුරුෂ, අනත්දරු හා ආබාධිත විශ්‍රාම වැටුප් ඇතුළු අනෙකුත් සියලු පසු ප්‍රතිලාභ ගෙවීම සඳහා 2025 අය වැය වැඩසටහන මඟින් රුපියල් බිලියන 490.3ක ප්‍රතිපාදන ලබා දී තිබුණා. මේ අවුරුද්දේ ඒක ඊට වඩා වැඩි කර තිබෙනවා. ඒ නිසා විශ්‍රාමිකයන්ට යම් යම් ගැටලු තිබුණත් ඒ ගැටලු නිරාකරණය කිරීම සඳහා අපි කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම ජනාධිපතිතුමා සඳහන් කළා වැටුප් සහ විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් ස්ථාපිත කරලා පවතින ගැටලු, අක්‍රමිකතා නිරාකරණය කිරීම සඳහා කටයුතු කරන බවට. අපි ඒකට අදාළ ක්‍රියාමාර්ග ගන්න පිළියම් යොදමින් ඉන්නවා.

ඒ වාගේම තමයි අනියම්, ආදේශක ආදී තාවකාලික පදනමින් සේවය කරපු සේවකයන් -ඔබතුමන්ලාගේ කාලයේ බඳවා ගෙන සේවයේ ස්ථිර කර නොසිටි සේවකයන්- 9,800ක් ස්ථිර කිරීමට අපි කටයුතු කර තිබෙනවා. ගුරු-විදුහල්පති දුෂ්කර දීමනාව වැඩි කර තිබෙනවා. දුම්රිය ගේට්ටුකරුවන්ගේ දීමනාව සියයට 100කින් වැඩි කර තිබෙනවා. ඒ වාගේම ඌන සේවා උපාධිධාරින්ට ගැටලුවක් පවතිනවා, ඔවුන්ගේ සේවය සම්බන්ධව. ඒ ගැටලුවත් නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අපි ගනිමින් තිබෙනවා.

ගරු සභාපතිතුමනි, පළාත් පාලන ආයතන පිළිබඳව නියෝජ්‍ය ඇමතිතුමා ඉදිරියේදී සාකච්ඡා කරයි. පළාත් පාලන ආයතන පදනම් කරගෙන බිමේ ජනතාවට අවශ්‍ය කරන සේවා වඩාත් ගුණාත්මකව, කඩිනමින් ලබා ගැනීම සඳහා අවශ්‍ය සියලු කටයුතු අපි සූදානම් කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අපි වෙන් කර තිබෙනවා. විශේෂයෙන්ම කසළ ප්‍රතිචක්‍රීකරණය වැනි වැඩසටහන් හඳුන්වා දීමට අපි කටයුතු කර තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, your time is over.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

පසුගිය දවස්වල දිගින් දිගටම ප්‍රශ්නයක් මතු කළා, කැබ් රථ සම්බන්ධව. පක්ෂයේ කාඩර්වරුන්ට කැබ් රථ දෙන්න කටයුතු කරනවා කියලා කිව්වා. නැහැ, අපි මේ කැබ් රථ මිලදී ගන්නේ ප්‍රාදේශීය ලේකම්වරු වාගේම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ටද ඒවා ලබා දීම ඇතුළත්වයි. පළාත් පාලන අමාත්‍යාංශයට අදාළව විතරක් කැබ් රථ 450කට අධික ප්‍රමාණයක් ඕනෑ. සමහර ප්‍රාදේශීය ලේකම්වරු යන්නේ කැලි හැලෙන වාහනවල. ඒගොල්ලන්ටර බැහැර ප්‍රදේශවල රාජකාරි කරන්න යන්න හොඳ වාහනයක් නැහැ. ඒ වෙනුවෙන් තමයි අපි මේ වාහන මිලදී ගැනීම සඳහා කටයුතු කරන්නේ. ඒ නිසා පළාත් පාලනය

වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවාවන් ගුණාත්මක තත්ත්වයට පත් කිරීම සඳහා අපි අවශ්‍ය කටයුතු සිදු කරමින් තිබෙනවා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය පරිපාලනය ශක්තිමත් කිරීමට කරන වැඩසටහන තුළ අපි කල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීමට රුපියල් මිලියන 388ක් වෙන් කර තිබෙනවා. ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කටයුතු අවසන් කර තිබෙනවා. තවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගණනාවක වැඩකටයුතු අවසන් කිරීමට සහ අලුතෙන් ආරම්භ කිරීමට කටයුතු කර තිබෙනවා. 77වන අවුරුද්දේ අපි කරපු වැඩවලින් සියයට 10ක්වත් මට මෙතැනදී කියා ගන්න වුණේ නැහැ. තව සියයට 90ක් අපි කරපු වැඩ තිබෙනවා. විපක්ෂයෙන් හරි වෙලාව දෙනවා නම් අපි ඒ තොරතුරු ඉදිරිපත් කරන්න සූදානම්.

බොහොම ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු සභාපතිතුමනි, ගරු විපක්ෂ නායකතුමාත් සභාවේ ඉන්න නිසා යම් ඉල්ලීමක් කරන්න මම බලාපොරොත්තු වෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාටත් දැනුම් දීලා අපටත් - සභානායකටත් - දැනුම් දීලා තිබෙනවා, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා අද දිනයේත් ඒ වාගේම නොවැම්බර් 26, නොවැම්බර් 27, දෙසැම්බර් 01 යන දිනවලදීත් විවාදයට ගැනෙන අමාත්‍යාංශවලට අදාළව බෙදීම් ඉල්ලන බව. ඒක ප්‍රශ්නයක් නැහැ. ඒ සම්බන්ධයෙන් එතුමාට අයිතියක් තිබෙනවා. නමුත්, විපක්ෂ නායකතුමාටත් අවබෝධයක් තිබෙනවා නේ, කාලය ගැන. ඊයෙත් පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් වෙනකොට පස්වරු 7.15 විතර වුණා. අපට කාලය දීර්ඝ කරන්නත් වුණා, විනාඩි 15ක් විතර. Votes 3ක් ආවා.

පොදු බෙදීමකුත් ආවා. ඇතුළේ Headsවලටත් බෙදීම් ගියා. මන්ත්‍රීවරුන්ටත් වඩා කාර්ය මණ්ඩලයට මේ කාරණය බලපානවා. පස්වරු 7.30ට විතර රැස්වීම් අවසන් වෙලා ගෙවල්වලට ගිහින් පසුවදා නැවත එන්නත් වෙනවා. ඒ නිසා අපේ ඉල්ලීම මේකයි. බෙදීම් ඉල්ලලා තිබෙන දවස්වල විතරක් කල් තැබීමේ විවාදය ගන්නේ නැතිව සවස 6.00ට ඡන්ද විමසීමට යමු. එතකොට ඔබතුමන්ලාට Headsවලට ඕනෑ තරම් ඡන්ද ගන්න පුළුවන්. එතකොට අපට 6.30, 6.45 වෙනකොට සභාවේ කටයුතු අවසන් කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. ඒ නිසා ඔබතුමන්ලා මේ ගැන කල්පනා කරලා අපට දැනුවත් කරන්න පුළුවන් නම් හොඳයි. ඒක තමයි අපේ ඉල්ලීම.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Sajith Premadasa. You have 15 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[පූ.භා. 10.32]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු සභාපතිතුමනි, විශේෂයෙන් 76 වසරක් පුරාවටත්, ඊට පෙරත්, ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ව්‍යුහය තුළ අපේ රට ශක්තිමත් කරන්නට විශිෂ්ට සේවාවක් ඉෂ්ට කරපු අපේ රටේ විශ්‍රාමික ප්‍රජාව අද අන්ත අසරණභාවයට පත් වෙලා තිබෙනවා. වර්තමාන රජය 2025දී කරපු වැටුප් වැඩිකිරීම අදියර තුනකින් -2025, 2026, 2027 වශයෙන්- ක්‍රියාත්මක කරනකොට රජයට අමතක වුණා, විපක්ෂයේ ඉන්නකොට විශ්‍රාමිකයන්ට දුන්නු පොරොන්දු ටික. 2020-2024 කාලය තුළ විශ්‍රාම ගිය අය 154,000ක් ඉන්නවා. ඒ 154,000ට කිසිම වැඩි වීමක් වෙන්නේ නැහැ, තමන්ගේ විශ්‍රාම වැටුප. විරුද්ධ පක්ෂයේ ඉන්නකොට එක තැනකට ගෙනැල්ලා මේ විශ්‍රාමිකයන්ට ලබා දුන්න පොරොන්දු ප්‍රමාණය කඩ කරන්නේ ඇයි කියලා මම අහන්න කැමැතියි. බොරු නම්, අන්න පොල්දූව හන්දියට විශ්‍රාමිකයන් විශාල පිරිසක් ඇවිල්ලා ඉන්නවා. මම යෝජනා කරනවා, ඔබතුමන්ලාගේ නියෝජිත කණ්ඩායමකට ගිහින් ඒ අය එක්ක කථා කරන්න කියලා. එහෙම නැත්නම් ගරු ජනාධිපතිතුමාට කියන්න ඔවුන්ව හමුවෙන්න කියලා. ඒ අයගේ එක මැසිවිල්ලක් තමයි හමුවෙන්න කිසිම වෙලාවක් දුන්නේ නැහැ කියන එක. 2020-2024 කාලයේ විශ්‍රාම ගිය 154,000ට එක සතයක වැඩිකිරීමක් නැහැ; එක සතයක ප්‍රතිලාභයක් නැහැ. ඉතින්, අපි යෝජනා කරන්නේ මේ ප්‍රශ්නය විසඳන්නට වෙනම අපක්ෂපාතී කමිටුවක් අවශ්‍යයි කියන එකයි. ජනාධිපතිවරයා යෝජනා කළ සමස්ත කමිටුවේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යන අතරතුර විශේෂිත වූ කමිටුවක් අවශ්‍යයි, මේ ප්‍රශ්නය විසඳන්නට. එය විසඳන තෙක් අගතියට පත් වුණු මේ 154,000ට අන්තර් කාලීන දීමනාවක් ලබා දීම ඉතාම සුදුසුයි, එය ක්‍රියාත්මක කළ යුතුයි කියා අපි යෝජනා කරනවා.

ඒ වාගේම 2025 අය වැයේ වැටුප් වැඩි කිරීම ක්‍රියාත්මක වෙන්නේ අප්‍රේල් පළමුවැනිදා ඉඳලායි. ඒ වැඩිකිරීම 2025 ජනවාරි, පෙබරවාරි, මාර්තු විශ්‍රාමිකයන්ට ගළපා තිබෙනවා. ඒක හොඳයි. ඒ අයට මේ ගැළපීම කරන්න පුළුවන් නම්; ඒ හොඳ වැඩේ කරන්න පුළුවන් නම් 2020-2024 කාලය තුළ විශ්‍රාම ගිය 154,000 සහමුලින්ම අමතක කරලා දමන්නේ ඇයි? ඒ අයව සහමුලින්ම කුණු බක්කියට දමලා, සහමුලින්ම බැහැර කරලා. එහෙම කරන්න එපා. ජනාධිපතිවරණය දිනපු පළියට, මහ මැතිවරණයෙන් තුනෙන් දෙකක බලයක් පාර්ලිමේන්තුවේ ගත්ත පළියට, පළාත් පාලන මැතිවරණයෙන් බහුතරයක් දිනපු පළියට එහෙම කරන්න එපා. ඒ නිසා මේ 154,000 වෙනුවෙන් අපි යෝජනා කරපු මේ පියවර ටික ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම 2016-2020 කාලය තුළ විශ්‍රාම ගිය 130,000කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. අපි ඉල්ලීමක් කරනවා, මේ අයට ප්‍රදාන පත්‍රයේ තිබෙන විශ්‍රාම වැටුප ලබා දෙන්න කටයුතු කරන්න කියලා. ඒ වාගේම ඒ අයටත් 2020-2025 කාලය සඳහා තිබෙන ඒ හිඟ මුදල ලබා දෙන්න කියලා.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ඒ විශ්‍රාම ගිය ප්‍රජාව බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ; විශ්‍රාම වැටුපෙනුයි ඔවුන් ජීවත් වෙන්නේ. ඒ අය ගැන සානුකම්පිකව, සංවේදීව හිතලා, ඒ අය වෙනුවෙන් දයාව, කරුණාව, මෛත්‍රිය ඇති කරගෙන මේ කියන යෝජනා ක්‍රියාත්මක කරන්න. මේ යෝජනා ක්‍රියාත්මක කරනකොට අමතක කරන්න එපා, වැඩිහිටි ප්‍රජාවට, විශ්‍රාමික ප්‍රජාවට, ලක්ෂ 15ක තැන්පතුවකට සීමා වන ආකාරයට දෙන්න පොරොන්දු වුණු සියයට 15 පොලිය ගැන. කරුණාකර ඒ යුතුකමත් මැතිවරණ කාලයේ කියපු ආකාරයටම ඉෂ්ට සිද්ධ කරන්න කටයුතු කරන්න කියලා අපි මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, මම තවත් කාරණාවක් කෙරෙහි ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. අද අපේ රටේ උප්පැන්න, මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර්වරු 1,500ක් ඉන්නවා. උප්පැන්න සහ මරණ රෙජිස්ට්‍රාර්වරු 300ක් ඉන්නවා. අතිරේක විවාහ රෙජිස්ට්‍රාර්වරුත් 300ක් ඉන්නවා. ඔක්කොම 2,100ක් ඉන්නවා. ඔබතුමාත් මේ ක්ෂේත්‍රය ගැන හොඳින් දන්නවා. මොකද, මේ ක්ෂේත්‍රය ඔබතුමාගේ පවුලේ සාමාජිකයින්ටත් සම්බන්ධයි. හැබැයි, ඒ රෙජිස්ට්‍රාර්වරුන්ට උපත් සහ මරණවලදී ගෙවන්නේ රුපියල් 75යි. මම යෝජනා කරනවා, ඒක රුපියල් 300ක් කරන්න කියලා. හැම උපතකටම, මරණයකටම සහතික තුන ගණනේ ලබා දෙන්නට ඕනෑ. නාගරික බල ප්‍රදේශවල කාර්යාල දීමනාව රුපියල් 1,500යි, ග්‍රාමීය ප්‍රදේශවල කාර්යාල දීමනාව රුපියල් 750යි. ඒ වාගේම, තීන්ත දීමනාව කියලා එකක් ලබා දෙනවා, රුපියල් 350ක. අපි ඉල්ලා සිටිනවා, නාගරික ප්‍රදේශවල කාර්යාල දීමනාව රුපියල් 5,000ක් කරන්න කියලා; ග්‍රාමීය ප්‍රදේශවල කාර්යාල දීමනාව රුපියල් 3,000ක් කරන්න කියලා; තීන්ත දීමනාව රුපියල් 2,000ක් කරන්න කියලා. ඒ වාගේම, විසිහතර පැයම සේවය කරන, වසර 30ක්, 35ක්, 40ක්, 45ක් සේවය කරපු අයත් එම සේවයේ ඉන්නවා. පසුගිය දවසක අපි දැක්කා, ගම්පහ දිස්ත්‍රික්කයේ අවුරුදු 52ක සේවාවක් කරපු පුද්ගලයෙකුත් ඉන්නවා. ඒ අය ගැන පැහැදිලි ඇගැයීමක් නැහැ. ඒ අය වෙනුවෙන් කරුණාසහගත දීමනාවක් ලබා දීම ඉතාම සුදුසුයි.

රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය විවෘත කරපු 1864 කාලයේදී විවාහයක් වනකොට ඇත්ත වශයෙන්ම ඒ රෙජිස්ට්‍රාර්වරයා තමයි ඒ විවාහ වුණු යුවළට තමන්ගේ මුදලින් යම්කිසි තුටු පඬුරක් ලබා දුන්නේ. දැන් ඒක වෙනස්. අපි ඒක පිළිගන්නවා. නමුත්, මේ ක්ෂේත්‍රය පිළිබඳව කරුණාකර පියවර ගන්න. උසාවියේ දිවුරුම් දෙන්න සලස්වා ඒ අය අඩුම ගණනේ මුළු දිවයිනටම බලපාන ආකාරයට සාම විනිසුරුවන් බවට පත් කරන්න. අඩුම ගණනේ ඒකෙන් පටන් ගන්න, මේ වැඩසටහන. ඒ දේ හරි ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න. මොකද, ඔබතුමන්ලා 2025 ජූලි 04වැනි දා පොරොන්දු වෙලා තිබෙනවා, Cabinet Paper එකක් දාලා මේ ඔක්කොම කරනවා කියලා. මේ ඔක්කොම කරනවා කිව්වාට, ඇත්ත වශයෙන්ම ඒ දේ ඉෂ්ට සිද්ධ කරලා නැහැ.

ගරු ඇමතිතුමාට මම මේ කාරණයත් කියන්න ඕනෑ. ඔබතුමාගේ පියාත් මේ රෙජිස්ට්‍රාර් කාර්යභාරය ඉෂ්ට කරලා තිබෙනවා කියන එක අපට ආරංචි වුණා. මා දන්නා තොරතුරු අනුවයි මේ කියන්නේ. ඒක වැරදි නම්, වැරදියි කියන්න. වැරදි නම් නිවැරදි කරන්න. ඒ වාගේම, ඔබතුමාගේ සහෝදරියත් ඒ කාර්යභාරය ඉෂ්ට කරනවා. ඒ පියා නිසාවත්, සහෝදරිය නිසාවත් නොවෙයි, අඩුම ගණනේ ඒ ක්ෂේත්‍රයේ අය ඉෂ්ට සිද්ධ කරන මේ විශිෂ්ට සේවාව, වැදගත් සේවාව, මේ ගෞරවනීය සේවාව, ඇගැයීමට ලක් කිරීම සඳහා හෝ මේ කරපු යෝජනා ටික, කරුණු කාරණා ටික ක්‍රියාත්මක කරන්න කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේ බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම, විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ ග්‍රාම නිලධාරි ක්ෂේත්‍රය ගැන. අපි හැමදාම ග්‍රාම නිලධාරි ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු ඉදිරිපත් කර තිබෙනවා. තවමත් බොහෝ ගැටලු විසඳිලා නැහැ. ග්‍රාම නිලධාරි සේවා ව්‍යවස්ථාව මේ වන විට ගැසට් කර තිබෙනවා. හැබැයි, ඒක බලාත්මක කරන ගැසට් පත්‍රය නිකුත් කරලා නැහැ. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ වෙනුවෙන් මැදිහත් වෙලා ඒ යුතුකම ඉෂ්ට කර දෙන්න කියලා. ඒ වාගේම, සේවා ව්‍යවස්ථාවට ග්‍රාම නිලධාරින්ගේ කාර්යාලගත සහ ක්ෂේත්‍රගත වැටුප් තවමත් ලබා දීලා නැහැ. ඒ යුතුකමත් ඉෂ්ට කරන්න කියලා, මේ රටේ ග්‍රාම නිලධාරිවරුන් සියලුදෙනා වෙනුවෙන් මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම, පසුගිය රජය ග්‍රාම නිලධාරින්ට ක්ෂේත්‍ර කටයුතු සඳහා මාසිකව ඉන්ධන ලීටර 20ක දීමනාවක් ලබා දීමට estimate කර තිබුණා. නමුත්, එය ඔබතුමන්ලාගේ මංගල අය වැයෙන් කප්පාදු කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මීට සම්බන්ධ තොරතුරු, කරුණු කාරණා ඇතුළත් ලේඛන මම **සභාගත*** කරනවා.

ඒ යුතුකමත් ඉෂ්ට කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලා සිටිනවා.

බොහෝ ග්‍රාම නිලධාරිවරුන් කියන දෙයක් තමයි, "අස්වැසුම" වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී ඒ අය බැහැර කර තිබෙනවා කියන එක. "ග්‍රාම ශක්ති" වැඩසටහන, එහෙම නැත්නම් "ප්‍රජා ශක්ති" වැඩසටහන ක්‍රියාත්මක කරන කොට අද ග්‍රාම නිලධාරිවරුන් පැත්තක තියලා ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයා තමයි ඒකේ ප්‍රධාන නියෝජිතයා බවට පත් කරලා තිබෙන්නේ. එහෙම කරන්න එපා. ඒකෙන් බැහැර වෙන්න.

ආණ්ඩුව දැන් අග්‍රහාර රක්ෂණ අරමුදල සඳහා අය කරනු ලබන වාරිකය නම් ඉහළ නංවා තිබෙනවා. වාරිකය ඉහළ දැම්මාට රාජ්‍ය සේවකයන්ට ලැබෙන ප්‍රතිලාභය ඉහළ දමන්නට ඔබතුමන්ලා කටයුතු කරලා නැහැ. කරුණාකර ඒ කාරණාව පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරලා, මේ රටේ විශිෂ්ට සේවාවක් ඉෂ්ට කරන ග්‍රාම නිලධාරි ක්ෂේත්‍රයට ඔබතුමාගේ සහයෝගය, අනුග්‍රහය, ආශීර්වාදය ලබා දීලා මේ යෝජනා ක්‍රියාත්මක කරන්න උත්සුක වන්න කියා අපි ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

ඊළඟට මම ඔබතුමාට කියන්න කැමැතියි, පළාත් පාලන ආයතන ක්ෂේත්‍රයේ අද බරපතළ ගැටලු රැසක් තිබෙන බව. ඔබතුමන්ලා කියනවා, පුනරාවර්තන වියදම් යටතේ වන පඩි ගෙවීම්වලින් සියයට 20ක් දරන්න කියලා. ඔබතුමන්ලා පොඩ්ඩක් JVP එකේම සභාපතිවරුන්ගෙන් අහන්නකෝ බලන්න, ඔය බොහෝ සභා ඒ විධියට කරගෙන යන්න පුළුවන්ද කියලා? මේ අවුරුද්දේ සියයට 20ක් ගෙවන්න ලු; ලබන අවුරුද්දේ සියයට 40 කරනවා ලු; ඊට පස්සේ සියයට 60 කරනවා ලු. ඇත්ත වශයෙන්ම මේකෙන් මුළු පළාත් පාලන ක්ෂේත්‍රයම කඩා වැටෙනවා.

මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමනි. විශේෂයෙන්ම සමගි ජන බලවේගය, සමගි ජන සන්ධානය, ඒ වාගේම විපක්ෂය සභාපතිත්වය දරන සභාවල ගැටලු රාශියක් තිබෙනවා. ඒ සේවාව කාර්යක්ෂමව ක්‍රියාත්මක කරන්න සමහර නිලධාරින්ගෙන් ලැබිය යුතු සහයෝගය ලැබෙන්නේ නැහැ. ඒ සඳහා ඔබතුමා මැදිහත් වෙන්න ඕනෑ. මොකද, පළාත් පාලන

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ක්ෂේත්‍රය කියන්නේ අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යූහය තුළ ක්‍රියාත්මක වන බිම් මට්ටමේ පොදු ජනතාවට සමීපතම ක්ෂේත්‍රයයි. අපටත් වඩා ජනතාවට සමීපයි. ජනාධිපතිවරයාටත්, අගමැතිවරියටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාටත්, පළාත් සභා මන්ත්‍රීවරයාටත් වඩා ජනතාවට සමීප සේවාව සපයන්නේ පළාත් පාලන ක්ෂේත්‍රයයි. ඒ ක්ෂේත්‍රයේ ගැටලු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගැටලුවලට විසඳුම් ලබා දීම ගැන කථා කරද්දී, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු ඇමතිතුමනි. මේ අය වැය ක්‍රියාවලිය ක්‍රියාත්මක වන මේ කාරක සභා අවස්ථාවලදී හෝ ඒ සභාපතිවරුන් මේ පාර්ලිමේන්තුවට කැඳවා ඒ ප්‍රශ්නවලට විසඳුම් සැපයීම උදෙසා ඔබතුමාත් සමඟ ඔවුන්ට සාකච්ඡාවකට අවස්ථාවක් ලබා දෙන්න කියා මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා. මොකද, හිතාමතාම පළාත් පාලන ක්ෂේත්‍රය අඩපණ කිරීමේ ක්‍රියාවලියක් මේ අවස්ථාවේදී ක්‍රියාත්මක වනවාදෝ කියා අපට හිතෙනවා.

මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. විශේෂයෙන්ම අපි නැවත වරක් කථා කළ යුතුයි, ත්‍රිකුණාමලයේ සිදු වූ අවාසනාවන්ත සිද්ධිය ගැන. ත්‍රිකුණාමලයේ සිදු වූ ඒ අවාසනාවන්ත සිද්ධිය පිළිබඳව කථා කිරීමේදී අපි නැවත නැවත ප්‍රකාශ කරනවා, බුදු දහමට ප්‍රමුඛස්ථානය ලබා දීම, එය පෝෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන බව. ඒක අපේ රටේ උත්තරීතර නීතිය. එක එක්කෙනාට පෞද්ගලික මතිමතාන්තර තිබුණාට අපට ඒක අදාළ නැහැ. ඒ උත්තරීතර නීතියට ගරු කරන්නට ඕනෑ. එලෙසම අනෙකුත් සියලු ආගම් සුරක්ෂා වන ආකාරයට, රැකෙන ආකාරයට, ඒවාට නිසි තැන, නිසි ආකාරයට සලකන විධිය ගැනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්ව තිබෙනවා. මේ තත්ත්වය තුළ අපි ඇත්ත වශයෙන්ම සංහිඳියාවට මුල් තැන දෙන්න ඕනෑ. සමහර අන්තවාදීන් බලාගෙන ඉන්නවා, කොහොම හරි ගිනිකූර පත්තු කරලා ජාතිවාදය, ආගම්වාදය හරහා රට තුළ බෙදීම් ඇති කරලා විනාශයක් ඇති කරන්න. ඒ අයට නොයෙකුත් දේශපාලන අරමුණු ඇති. අපට එවැනි අරමුණු නැහැ. මම නැවත වරක් මේ කාරණය කියනවා. ජනාධිපතිවරයාගේ යුතුකම ඒ සිදුවීම සම්බන්ධයෙන් පොලීසිය භාර අමාත්‍යවරයාගෙන් වාර්තාවක් කැඳවීමම නොවෙයි. ජාතික ඒකාග්‍රතා කමිටුවක් ස්ථාපනය කරලා මේ වාගේ තත්ත්වයන් මතුවට නිර්මාණය වන්නට ඉඩ නොදී කටයුතු කිරීමත්, මේ ප්‍රශ්නයට විධිමත් විසඳුම් ලබා දීමත් ජනාධිපතිවරයාගේ යුතුකමක්.

ඒ යුතුකම ඉෂ්ට කරන්නට ඕනෑ. විශේෂයෙන්ම මම මතක් කරන්නට කැමැතියි, හින්දු ආගමික සිද්ධස්ථානවල, ඉස්ලාමීය ආගමික සිද්ධස්ථානවල,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Sajith Premadasa, you have only two minutes more.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Hon. Chairman, I would ask for a small time extension.

හින්දු ආගමික සිද්ධස්ථානවල, ඉස්ලාමීය ආගමික සිද්ධස්ථානවල, ක්‍රිස්තියානි, කතෝලික සිද්ධස්ථානවල මේ වාගේ අර්බුද නිර්මාණය වෙනකොට අපි හැංගිලා හිටියේ නැහැ. අපි ඒ වෙනුවෙන් කථා කළා. මොකද, අපි මේ රටේ ආගමික සංහිඳියාව, ආගමික එකමුතුභාවය, ජාතීන් අතර සහෝදරත්වය, මිත්‍රශීලීත්වය පවත්වාගෙන යන්නට ඕනෑ. අපේ ප්‍රතිපත්තිය සද් ජාතිකත්වය. ජාතිවාදීත්වය නොවෙයි. මේක සමහරෙකුට තේරෙන්නේ නැහැ. සමහරෙකුට මේවා අවබෝධ කර ගන්නට බැහැ. ඒ නිසා පැහැදිලිවම අපි ඉල්ලීමක් කරනවා මේකට රජය මැදිහත් වෙන්නට ඕනෑ කියලා.

මම අහන්න කැමැතියි, ඔබතුමාගෙන් මේ කාරණයත්. ඒ අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ යුතුකමක්ව තිබුණා නේද, මෙවැනි ප්‍රශ්නයක් නිර්මාණය වෙනකොට, ආරක්ෂක අංශවලට කියලා ඒ අය මහ රෑ ගිහිල්ලා, බුදු පිළිම අරගෙන යන්නයි, වැඩ වරදිනකොට බුදු පිළිම ආපහු ගෙන එන්නයි කටයුතු නොකර පොඩ්ඩක් හොයලා බලන්න? ඒ ප්‍රාදේශීය ලේකම්වරුන්, ඒ යුතුකම ඉෂ්ට කළාද, ඒ දිස්ත්‍රික් ලේකම්වරුන් ඒ යුතුකම ඉෂ්ට කළාද? ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරු ඉන්නවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරු ඉන්නවා. මේ ප්‍රශ්නය විසඳන්නට, නිරාකරණය කරන්නට ඔවුන් කටයුතු කළාද?

ඇත්ත වශයෙන්ම ජනාධිපතිවරයා සතු වගකීම තමයි මේ ජාතික ඒකාග්‍රතා කමිටුව ස්ථාපනය කරලා මේ ප්‍රශ්නවලට මැදිහත් වෙන එක. මේවායින් පැනලා යන්න බැහැ. පොලිස් ඇමතිට වාර්තාවක් දෙන්න කියලා කියන්න බැහැ. අනික් එක අපට අහන්නට ලැබුණා, මේ රටේ ජනමාධ්‍ය ක්ෂේත්‍රයත් දැන් කුඩු ව්‍යාපාරයට සම්බන්ධයි කියලා. ඉතින් මේක ඇතුළේ ඇවිල්ලා ඒක කියන්න ඕනෑ නැහැ නේ. අල්ලන්න. නීතිය ක්‍රියාත්මක කරන්න ඒගොල්ලන්ට. මාධ්‍ය ආයතන කුඩු ව්‍යාපාරයේ නියැළෙනවා නම්, නීතිය ක්‍රියාත්මක කරන්න. දැන් ජනතාව බලාපොරොත්තු වෙන්නේ රජයෙන් විපක්ෂයේ දේශපාලනයක් නොවෙයි. ජනතාව බලාපොරොත්තු වෙන්නේ ප්‍රශ්නවලට උත්තර. ජනතාව බලාපොරොත්තු වෙන්නේ විසඳුම්. ඒ උත්තර දෙන්න බැරිකොට බොරු පොරොන්දු දීලා රවට්ටලා, අන්දවලා රටේ ජනතාව මංමුළා කරලා වැඩ වරදිනකොට මෙතැනට ඇවිල්ලා රහපාලා හරියන්නේ නැහැ. මෙතැනට ඇවිල්ලා, කයිවාරු ගහලා වැඩක් නැහැ. ජනතාව බලාපොරොත්තු වෙන උත්තරය දෙන්න. දැන් දෙන්නකෝ බලන්න, උත්තරේ. මේ පළාත් සභා මැතිවරණය පිළිබඳව විශේෂ කාරක සභා දාන්නේ නැතුව, අපට දෙන්න පළාත් සභා මැතිවරණය. පරණ ක්‍රමයට ගිහිල්ලා, පළාත් සභා මැතිවරණය පවත්වන්න. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න. ජන සම්මතවාදය රැක ගන්න. ජනතා ස්වෛරීත්වය ශක්තිමත් කරන්න.

ඒ වාගේම අපේ ඇමතිතුමා කිව්වා, වාහන 1,750ක් ගෙන්වනවා කියලා. විශේෂයෙන්ම අපේ රටේ රාජ්‍ය අංශයට ඒ රාජකාරි කටයුතු කිරීම සඳහා ඒ දේ කරනවා කියලා. පොඩ්ඩක් හොයලා බලන්න. ඔබතුමන්ලා ලොකුවට කථා කළා, මේ රටේ වාහන විශාල ප්‍රමාණයක් තිබෙනවා කියලා. සමහර ඒවා අබලන් වෙලා තිබෙන්න පුළුවන්. හැබැයි ගුණාත්මකභාවයෙන් ඉහළ ඒවාත් ඒ අතර තිබෙන්නට පුළුවන්. අමතර වියදමක් දරන්නේ නැතුව, ඔය වාහන අතිරික්තයෙන් ගුණාත්මකභාවයෙන් ඉහළ තිබෙන වාහන ටික තෝරාගෙන, ඇයි ඒවා යොදවන්න බැරි ඔය රාජ්‍ය නිලධාරීන්ගේ ඒ ප්‍රවාහන පහසුකම්වලට? ඇයි, අමුතුවෙන් ඇණවුම් කරන්නේ? ඇයි, අමුතුවෙන් හදිසි ටෙන්ඩර් කැඳවන්නේ, ප්‍රසම්පාදන ක්‍රම උල්ලංඝනය කරලා? ඉතින් මම කියන්නේ මේකයි. ඔය වාහන පිළිබඳව ඔබතුමන්ලාට ඕනෑ තරම් කාලයක් තිබුණා, සංගණනයක් කරන්න. මම හිතන හැටියට ගරු ඇමතිතුමාත් ගෝල්ෆේස් එකට ගිහිල්ලා ඒ වාහන ටික ගණන් කළා නේද? අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමාත් ගෝල්ෆේස්- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ උත්තර නොවෙයි. මම මේ යෝජනාවක් කරන්නේ. මේ වාහන 1,750ක් ගෙන්වන්න ඉස්සෙල්ලා දැනට තිබෙන වාහනවලින් හොඳ මට්ටමේ තිබෙන

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

වාහන, යම් repair කිරීමක් කරන්න තිබෙනවා නම්, ඒ සුළු repairs කරලා ගන්න පුළුවන්. එහෙම නැත්නම් හොඳ මට්ටමේ වාහන කොච්චර තිබෙනවාද කියලා සංගණනයක් කරලා, ඒවා ටික බෙදලා මදිපාඩුවකට අදාළ ප්‍රසම්පාදන ක්‍රමය අනුව කටයුතු කිරීමේ ගැටලුවක් නැහැ.

ඇත්ත වශයෙන්ම මම යෝජනාවක් කරන්න කැමැතියි. අද දවසේ, මේ මොහොතේ මම රජයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. Paliamentary Select Committee එකක් අවශ්‍ය නැහැ, ඔය මොන කමිටුවක්වත් අවශ්‍ය නැහැ. මෙය හදිසි කාරණයක් සේ සලකා පනත් කෙටුම්පතක් ගෙනැවිත් සම්මත කර පරණ ක්‍රමයටම පළාත් සභා මැතිවරණය පවත්වන්නට කටයුතු කරන්න. ඒ සඳහා විපක්ෂයේ අපි පූර්ණ සහයෝගය ලබා දෙනවා කියා මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. එසේ ප්‍රකාශ කරමින්, මේ අවස්ථාව ලබා දීම ගැන ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Wasantha Samarasinghe. You have 12 minutes.

[පූ.භා. 10.51]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේත්, කම්කරු අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳව සාකච්ඡා කරන අද දිනයේ, ගරු මන්ත්‍රීවරුන් කරුණු බොහොමයක් ඉදිරිපත් කළා. ඒ අතර අපේ විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ කරුණු පිළිබඳව, විශේෂයෙන්ම එතුමා අවසානයට මතු කළ කරුණු පිළිබඳව කරුණු ටිකක් කියන්න ඕනෑ කියලා මට හිතුණා.

ගරු සභාපතිතුමනි, බොහෝ කරුණු කියන්න තිබෙනවා. එතුමා වාහන ගැන ඇහුවා නේ. ගරු සභාපතිතුමනි, එතුමා වාහන ගැන කියනකොට කිව්වා රජයේ වාහන තිබෙනවා, ඒ අතර හොඳ වාහන තිබෙනවා ඒවා ගන්න පුළුවන් කියලා. අපි එතුමන්ලාට කියන්න ඕනෑ, ඒ තිබුණු වාහනවලින් කොටසක් වෙන්දේසි කළ බව. ඒ වාගේම ඉතුරු ටිකත් මේ දවස්වල වෙන්දේසි කරනවා. ඒ වාහන රජයේ නිලධාරීන්ටවත් පාවිච්චි කරන්න පුළුවන් ඒවා නොවෙයි, ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමන්ලාට බලාගන්න පුළුවන්, මේ දවස්වල වෙන්දේසි කරන වාහන මොනවාද කියලා. ඒ තිබෙන වාහන සාමාන්‍යයෙන් පෙට්‍රල් ලීටරයකින් කිලෝමීටර 3½ක්, 4ක් පමණ දුවන ඒවා. ඒවා තමයි දැන් විකුණන්න දමලා තිබෙන්නේ. එතැන V8, BMW වාහන තිබෙනවා. රජයට වියදම් දරන්න බැරි වාහන තිබෙන්නේ. ඒවා තමයි පසුගිය කාලයේ පාවිච්චි කරලා තිබෙන්නේ. අපේ අමාත්‍යාංශයේ තිබුණු වාහනත් ඊයේ වෙන්දේසි කළා. *[බාධා කිරීමක්]* රජයේ valuation එකට වඩා ඩබල් දීලා තිබෙනවා, අපට වෙන්දේසියෙන්. ඒ කියන්නේ රජය value කරපු ගණනට වඩා දෙගුණයක මිලට විකුණා තිබෙනවා. *[බාධා කිරීමක්]* මට විනාඩි 12යි, තිබෙන්නේ රවී කරුණානායක මන්ත්‍රීතුමා. මගේ වෙලාව මට දෙනවා නම්,- *[බාධා කිරීමක්]*-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Ravi Karunanayake, make it very short.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Thank you, Hon. Chairman.

බලන්න, ඇමතිතුමා, LECO එකේ වාහන 4ක් මිලියන 40කට විකුණලා, Benz එකක් ගන්නවා, මිලියන 80ට LECO එකේ සභාපති.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා ඔය කියන කරුණු,-

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හැබැයි, ගරු කුමාර ජයකොඩි විෂය භාර ඇමතිතුමා ඒ සම්බන්ධව කටයුතු කරනවා කිව්වා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
බලශක්ති අමාත්‍යාංශයේ වැය ශීර්ෂය හෙට විවාදයට ගන්නවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන කාරණය පිළිබඳව අපි හෙට කථා කරමු. *[බාධා කිරීමක්]* හරි. එතුමා මතු කරන්නේ විශේෂ කරුණක් නේ, ගරු සභාපතිතුමනි. මම මතු කරන්නේ පොදුවේ තිබෙන කරුණු. ගරු රවී කරුණානායක මැතිතුමා මතු කරන්නේ විශේෂ කරුණක්. එහෙම තියෙන්න පුළුවන් නේ.

මම සඳහන් කරමින් සිටියේ, රජයේ valuation එකට වඩා දෙගුණයක් විකුණපු ඒ හැම වාහනයකටම ලැබී තිබෙනවා කියන එකයි. දැනුත් වාහන විකිණෙනවා. ඒ සමහර වාහන පාවිච්චි කරන්න බැහැ. ඒවාට ඉතා විශාල තෙල් වියදමක් යනවා. ඒ නිසා වියදම සහ නඩත්තුව කියන කාරණා ගැන හිතලා තමයි මේ සමහර වාහන පරිහරණයෙන් ඉවත් කරන්නේ. ඒවා පරිහරණයෙන් ඉවත් කරලා තමයි, වාහන ගෙන්වන්නේ.

ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමා දැනුත් කිව්වා, ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරනවා කියලා. ඇයි මේ බොරු කියන්නේ? ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරලා නොවෙයි, ප්‍රසම්පාදන කමිටුවේ අවසර සහිතවයි කටයුතු කරන්නේ. ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග තිබෙනවා. ඒ අනුව තමයි දින ප්‍රමාණය අඩු කරගන්න පුළුවන්. ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තිබෙනවා, ක්‍රියාකාරකම්. ඒ අනුව තමයි දේශීයව ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන දින ගණන අඩු කරලා තිබෙන්නේ. ඒ දින ගණන අඩු කරන්න අවසර අරගෙන තිබෙනවා. මේ ටෙන්ඩර් ක්‍රියාවලියේදී 7දෙනෙක් අයදුම් කර තිබෙනවා, ඒවා සැපයුම සඳහා. ඒ නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරලා තිබෙනවාය කියන එක පට්ටපල් බොරුවක්. එහෙම බොරු කියන එක ගැළපෙන්නේ නැහැ විපක්ෂ නායකතුමා වාගේ ගෞරවනීය තනතුරක් දරන කෙනෙක්. ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරලා තිබෙනවා නම් නඩු දමන්න පුළුවන්. නමුත් එහෙම එකක් වෙලා නැහැ. ඒක නිසා ඒ වාගේ බොරු කියනවා වෙනුවට, සිද්ධ වෙලා තිබෙන ක්‍රියාවලිය ගැනයි අපි හරියට කථා කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, වාහන පිළිබඳව කථා කළා ඇති කියා මං හිතනවා. නමුත් වාහන ගෙන්වන එක ගැන අහන නිසා ඒ ගැනත් කියන්න ඕනෑ. ඇයි දැන් මේ වාහන ගෙන්වන්නේ කියලා ඇහුවා නේ. අපේ රටේ 340කට ආසන්න පළාත් පාලන ආයතනවල වාහන පිළිබඳව කිව්වා. අනුරාධපුර දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපතිවරයා හැටියට මම හැම දාම මුහුණ දෙන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 19යේම නගරාධිපතිවරයා ඇතුළු සභාපතිවරු හැම දාම මුහුණ දෙන ප්‍රශ්නයක් තිබෙනවා. කුණු ටික ඇදගන්න විධියක් නැහැ, බැකෝ ටික නැහැ, ඩෝසර් ටික කැඩිලා, සභාපතිවරුන්ට යන්න එන්න වාහන නැහැ.

මේ ප්‍රශ්න හැම දාම තිබෙනවා. හදිස්සියකට ගලි බවුසරයක් නැහැ. නගරයේ ගලි බවුසරය අරගෙන යන්න වෙනවා, අනෙක් තැන්වලට. ඉස්පිරිතාලේ ගලි ටික ශුද්ධ කරගන්න විධියක් නැහැ. මේවා තමයි තිබෙන ප්‍රශ්න.

ගරු විපක්ෂ නායකතුමනි, ඊළඟට අපි ගෙන්වන වාහන බෙදන විධිය මම කියන්නම්. ගෙන්වන වාහනවලින් අත්‍යවශ්‍ය වාහන අපි බෙදනවා. මේ වාහන ඇතුළේ ගලි බවුසර් 100ක් තිබෙනවා, ගරු සභාපතිතුමනි; ට්‍රැක්ටර් 175ක් තිබෙනවා; බැකෝ 100ක් තිබෙනවා; ටිපර් 160ක් තිබෙනවා; motor graders 175ක් තිබෙනවා. මේ ලැයිස්තුවේ තිබෙනවා, වාහන 610ක්. මේවා අතර ත්‍රිවීල් 90ක් තිබෙනවා. එතකොට වාහන 700ක් තිබෙනවා. මේවා ඇතුළු අමාත්‍යාංශවල නිලධාරින්ට ගෙන්වන වාහන තිබෙනවා. සුබෝපභෝගී වාහන පාවිච්චි කරපු නිලධාරින්ට වාහනයක් දෙන්න වෙනවා. ඒක නිසා ඒ අයටත් මේ වාහන දෙන්න ඕනෑ. මේ වාහන ගෙන්වන හේතුව මෙතුමන්ලා අහනවා. ගරු සභාපතිතුමනි, පළාත් පාලන අමාත්‍යාංශය යටතේ වාහන 4,000ක් විතර නඩත්තු කරන්න තිබෙනවා. ගරු විපක්ෂ නායකතුමනි, ඒ සඳහා අවුරුද්දකට මිලියන 3,350ක් යනවා. ගරු සභාපතිතුමනි, කල්පනා කරලා බලන්න. මේක zero වෙන්නේ නැහැ. හැබැයි, පරණ කසිකබල් ලඩ් ටික නඩත්තු කරන කොට මොකක්ද තත්ත්වය? සමහර වාහන කොට උඩ තියෙන්නේ.

අනුරාධපුර පළාත් පාලන ආයතනයක් estimate එකක් දීලා තිබෙනවා. එකක්, නොච්චියාගම. අනෙක් එක තිරප්පනේ. මේවායේ estimates දීලා තිබෙනවා. හැබැයි, වාහනය හදන වියදමට වාහනයක් ගන්න පුළුවන්, ගරු සභාපතිතුමනි. අපි කිව්වේ, හදන්න එපා කියලා. හැදුවාට වැඩක් නැහැ. ඒ වාගේ ගණනක් දීලා හැදුවොත් මිනිස්සු අපෙන් අහයි 'පිස්සුද?' කියලා. විපක්ෂ නායකතුමනි, ඕක තමයි ඇත්ත තත්ත්වය. ගරු ගයන්ත මන්ත්‍රීතුමනි, මේවා හදනවාට වඩා අලුත් වාහන අරගෙන දෙන එක තමයි හොඳ. නැත්නම් මේ ආයතන පවත්වාගෙන යන්න බැහැ. ඒක නිසා තමයි අපි ඒවාට වාහන අලුතින් දෙන්න ඕනෑ කියලා යෝජනා කළේ. ඒක මාලිමාවේ අපේ අයට විතරක් නොවෙයි, හැම පළාත් පාලන ආයතනයකටම දෙනවා. කැබිතිගොල්ලෑවටත් දෙනවා. කැබිතිගොල්ලෑවේ ඉන්නේ ඔබතුමන්ලාගේ සභාපතිවරයෙක් නේ. කැබිතිගොල්ලෑවටත් එකක් දෙනවා. ඒ දෙන්නේ ඇයි දන්නවාද? ඒ හැම කෙනෙකුටම වාහන දෙන්න ඕනෑ නිසා.

කැබිතිගොල්ලෑවේ අපි මන්ත්‍රී ආසන හතක් දිනුවා. ඒ වුණත් අපි දෙනවා. මොකද එකතු වෙලා සභාව හදා ගෙන ඔබතුමන්ලාගේ කෙනෙක් සභාපති වුණා නේ. වැලිගමටත් දෙනවා. අපි වැලිගම මන්ත්‍රී ආසන 22ක් දිනුම්. අපි ඒත් මේවා දෙනවා. ඒ කියන්නේ දිනුවේ කවුද කියන එක නොවෙයි අපි සලකන්නේ. හැම පළාත් පාලන ආයතනයක්ම සේවය කරන්නේ රටේ ජනතාවට. ප්‍රදේශයේ නඩත්තු කටයුතු කරන්න හැම පළාත් පාලන ආයතනයක්ම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ඒක නිසා මේ වාහන ගෙන්වන්නේ ඇයි කියලා කථාවක් තවදුරටත් බොරුවට පතුරු ගහමින් යන එක වැරැදියි. "මේවා JVP කාඩර්වරුන්ට දෙනවා, මාලිමාවේ වැඩ කරන අයට දෙනවා" කියලා කථාවක් යනවා. නැහැ, එහෙම දෙන්නේ නැහැ.

පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට දුන්නත් 300ක් දෙන්න ඕනෑ නේ. හරියටම දුන්නොත් 341කටම දෙන්න එපා යැ. මම 300ක් කිව්වේ, ආයතන කිහිපයක ධාවනය කරගන්න හොඳ මට්ටමේ වාහන තිබෙන නිසා. අනුරාධපුරයේ හොඳින් ධාවනය කරන්න පුළුවන් වාහන දෙකක් විතර තිබෙනවා. මම ඒ වාගේ ඒවා අයින් කරලා තමයි 300ක් කිව්වේ. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලය, ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය, අමාත්‍ය කාර්යාල, සභානායක කාර්යාලය, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය වාගේ කාර්යාල කිහිපයක් තිබෙනවා. කාර්යාල කිහිපයක් ඇරුණාම අනික් ඒවාට වාහන දීලා තිබෙනවා. හැබැයි, සමහර නියෝජ්‍ය ඇමතිවරුන්ට වාහන නැහැ. මගේ නියෝජ්‍ය ඇමතිතුමාගේ කටයුතු කරගන්න වාහනයක් නැහැ. නියෝජ්‍ය ඇමතිගේ වාහනය ගරාජ් එකේ තිබෙන්නේ. වාහන නැහැ. ඒ අයට වාහන දෙන්න ඕනෑ. කැබ් එකක් දීලා තිබෙන්නේ. ඒක නිසා ධාවනය කරගන්න පුළුවන් වාහනයක් දෙන්න ඕනෑ. ඒ වාහනය හැමෝටම දෙනවා කිව්වා.

මන්ත්‍රීවරුන්ට කැබ් එකක් දෙනවා කිව්වා. පාවිච්චි කරලා, අවුරුදු පහ ඉවර වුණාට පස්සේ ඒවා දීලා යන්න කිව්වා. ඒවා දෙන්න හදනකොට නිකම් බොරු කථාවක් කියන එක වැරැදියි. මේ වාහන දෙන්න හදන්නේ මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි. මේ වාහන දෙන්න හදන්නේ පළාත් පාලන ආයතනවලට; රජයේ නිලධාරින්ට; අකර්මණ්‍ය වෙමින් තිබෙන ආයතන පද්ධතියට. රාජ්‍ය සේවයටත් එක්ක තමයි මේ වාහන ගෙනෙන්න හදන්නේ. ඒ වාහන ටික ගෙනැල්ලා එම ආයතන පද්ධතිය සක්‍රිය කරන්නයි අපි හදන්නේ. මේවා අකර්මණ්‍ය වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. ගරු සභාපතිතුමනි, අපි මේ ගැන ජනතාවට කියන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි. අපි මේ වාහන නඩත්තු කරන්න අවුරුද්දකට මිලියන 3,500ක් වියදම් කරනවා. අවුරුදු හතරට මිලියන 14,000ක් මේ පළාත් පාලන ආයතනවල වාහන නඩත්තු කරන්න වියදම් වෙනවා, ගරු විපක්ෂ නායකතුමනි.

අවුරුදු හතරකට රුපියල් මිලියන 14,000ක්. ඉතින් ඒ ආයතනවලට අලුතෙන් වාහන අරගෙන දුන්නාම හොඳයි නේ.

ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමා, අපේ මහාචාර්ය චන්දන අබේරත්න අමාත්‍යතුමාගේ පවුලේ විස්තරත් හොයලා. මොකට හෙව්වාද දන්නේ නැහැ. එතුමාගේ සහෝදරියක් කරපු රස්සාව හොයලා, තාත්තා කරපු රස්සාව හොයලා - *[බාධා කිරීමක්]* කමක් නැහැ, කමක් නැහැ. මම කියන්නේ, - *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඔබතුමා හොයලා බලන්න. කමක් නැහැ ඉතින්. එහෙම තමයි. *[බාධා කිරීමක්]* හරි, හරි. මම කිව්වේ, කමක් නැහැ කියලා.

රෙජිස්ට්‍රාර්වරුන්ගේ වැටුප් වැඩි කිරීම පිළිබඳව, දීමනා වැඩි කිරීම පිළිබඳව දැනට සලකා බලමින් තිබෙනවා. අපි ඉස්සරහට ඒ තීරණය ගන්නවා. ඒ විතරක් නොවෙයි. පළාත් පාලන ආයතන නඩත්තු වියදම් පිළිබඳව ඔබතුමා කිව්වා. Recurrent Expendituresවලට යන මුදල් අඩු කරනවා කියලා කිව්වා. ඒ තීරණය ගත්තේ අපි නොවෙයි. ඒක 2023 Budget එකෙන් ගත්ත තීරණයක්. 2023 අය වැයෙන් ගත්ත තීරණයක් අනුව එදා ඉඳලා සියයට 20ක් කැපුවා. ඒ අනුව 2028 වෙනකොට සියයට 100ම කැපෙනවා, ගරු විපක්ෂ නායකතුමනි. 2028 වෙනකොට සියයට 100ම කැපෙනකොට සමහර පළාත් පාලන ආයතන පවත්වාගෙන යන්න බැහැ; ඒක හරි. ගරු සභාපතිතුමනි, සමහර පළාත් පාලන

[ගරු වසන්ත සමරසිංහ මහතා]

ආයතන පවත්වාගෙන යන්න බැහැ. සමහර පළාත් පාලන ආයතන පවත්වාගෙන යන්න බැරි වෙන නිසා, අන්න අපි තීරණයක් අරගෙන තිබෙනවා. අපේ ඇමතිතුමා කැබිනට් මණ්ඩලයට ඒ යෝජනාව ඉදිරිපත් කළා. පළාත් පාලන ආයතන categories හතරකට කඩලා තිබෙනවා. එහෙම කඩලා, ආදායම අනුව ඒවා වර්ග කර තිබෙනවා. ඒවායේ ආදායම් කොහොමද කියලා බලලා, මේ වෙනකොටත්,- අපි ප්‍රාග්ධන වියදම් සඳහා මේ මුදල වෙන් කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Wasantha Samarasinghe, you have two more minutes.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
හොඳයි, ගරු සභාපතිතුමනි.

ඒ වාගේම අපි ඒ ආයතනවලට වාහන ටික දෙනවා. ඒ වාගේම අපි ඒවායේ ආදායම් උත්පාදන මාර්ග සඳහා යන්ත්‍රෝපකරණ දෙනවා. ඒ අනුව එම ආයතනවල ශක්තිමත් කරන්න ඕනෑ ක්ෂේත්‍ර මොනවාද කියලා අපි ඉස්සරහට බලනවා. ස්වයං ආදායම් උත්පාදන මාර්ග ශක්තිමත් කරන්න පුළුවන් කොහොමද කියලා බලනවා. කොයිම වෙලාවකවත් මේ රජය යටතේ පළාත් පාලන ආයතන අඩපණ වෙන්න දෙන්නේ නැහැ කියන කාරණය අපි බොහොම වගකීමෙන් කියනවා, ගරු විපක්ෂ නායකතුමනි.

ගරු සභාපතිතුමනි, මට තව විනාඩි දෙකයි තිබෙන්නේ කියලා ඔබතුමා කියපු නිසා මම කථාව ඉවර කරන්න ඕනෑ. ඊට කලින් කම්කරු අමාත්‍යාංශය පිළිබඳවත් කථා කරන්න ඕනෑ. අපේ මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා ඊළඟට කථා කරයි. නමුත් මේ විශ්‍රාම වැටුප් ක්‍රමය ගැනත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපේ විපක්ෂ නායකතුමා කිව්වා නේ, මේ විශ්‍රාම වැටුප් ක්‍රමය ගැන. එතුමාට මතක නැහැ, 2016දී එතුමාත් ආණ්ඩුවේ හිටපු කාලයේ තමයි මේ රටේ රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප නැවැත්වුවේ කියලා. විපක්ෂ නායකතුමනි, 2016දී ඔබතුමන්ලා තමයි විශ්‍රාම වැටුප නැවැත්වුවේ. දායක විශ්‍රාම වැටුපක් තමයි ඔබතුමන්ලා දුන්නේ. විපක්ෂ නායකතුමාට මතකද දන්නේ නැහැ, 2016 සිට රාජ්‍ය සේවයට එකතු වෙච්ච සේවකයන්ගේ පත්වීම් ලිපියේ ඔබතුමන්ලා සඳහන් කළා, "ඔබ හිමිකම් ලබන්නේ දායක විශ්‍රාම වැටුපකට" කියලා. 2016.01.01 සිට දායක විශ්‍රාම වැටුපකට තමයි හිමිකම් ලබන්නේ කියලායි ඔබතුමන්ලා පත්වීම් ලිපි දුන්නේ. හැබැයි ඒ අයට ඔබතුමන්ලා දීපු දායක විශ්‍රාම වැටුප කියන්න. දායක කර ගත්ත විධිය කියන්න. දායක කර ගත්ත account එක කොහේද තිබෙන්නේ කියන්න. දායක වෙච්ච ආකාරය කියන්න. සේවකයාගේ වැටුපෙන් අඩු කර ගත්ත විධිය කියන්න. එහෙම එකක් නැහැ. හැබැයි ඓතිහාසික ලෙස, 2016න් පස්සේ රාජ්‍ය සේවයට එකතු වෙච්ච සේවකයන්ට විශ්‍රාම වැටුප ගෙවන්නේ කොහොමද කියලා අද වෙනකල් ඒ සේවකයෝ දන්නේ නැහැ. අන්න ඒ අයගේ විශ්‍රාම වැටුප පිළිබඳව තිබිච්ච අවිනිශ්චිතතාව දුරු කරලා, 2016න් පසුව රාජ්‍ය සේවයට එකතු වෙච්ච සියලුදෙනාගේ විශ්‍රාම වැටුප නිශ්චිත කරලා දුන්නේ මේ මාලිමාවේ ආණ්ඩුව බව අපි බොහොම වගකීමෙන් කියනවා. ඒ විතරක් නොවෙයි. 2020 සිට 2024 දක්වා විශ්‍රාම ගිය සේවකයන්ගේ විශ්‍රාම වැටුප සම්බන්ධයෙනුත් විපක්ෂ නායකතුමා සැකයක් මතු කළා. ගරු ඇමතිතුමා ඒ පිළිබඳව කරුණු පැහැදිලි කරයි. එහෙම සැකයක් නැහැ. අපේ රටේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳ ප්‍රශ්නය අපි බොහොම පැහැදිලිව විසඳා තිබෙනවා. තවදුරටත් විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගැටලු විසඳන්න අපි කොමිසමක් පත් කරලා තිබෙනවා. මේ රටේ ඉතිහාසයේ රාජ්‍ය සේවකයන්ගේ, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ, වතු සේවකයන්ගේ වැටුප් ප්‍රශ්න විසඳන්න යම් රජයක් කටයුතු කළා නම්, ඒ රජයන් අතර වැටුප් ගැටලු විසඳපු හොඳම රජය මාලිමාවේ රජය කියලා මේ රටේ ජනතාව පිළිගෙන ඉවරයි. වතු සේවකයන්ගේ වැටුප් ගැන දැන් කථා කරලා වැඩක් නැහැ. මොකද, ඉතිහාසය තුළ වැටුප් වැඩි කිරීමක් කළා නම්, වතු සේවකයන්ට වැඩිම වැටුප් වැඩි කිරීම කරන්න මැදිහත් වෙච්ච ආණ්ඩුව මාලිමාවේ ආණ්ඩුව කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් දැන් පිළිගෙන ඉවරයි. පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප රුපියල් 9,000කින් වැඩි කළා. 2025 වැටුප් වැඩි වීමේදී රුපියල් 21,000ක්ව තිබිච්ච වැටුප රුපියල් 27,000 දක්වා වැඩි කළා. ලබන අවුරුද්දේදී රුපියල් 27,000 සිට රුපියල් 30,000 දක්වා පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප වැඩි වෙනවා. ඒ අනුව රාජ්‍ය සේවකයන්ගේ, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ, වතු සේවකයන්ගේ - සියලුදෙනාගේ - වැටුප් වැඩි කිරීමට අපි මැදිහත් වුණා.

ඒ විතරක් නොවෙයි. මේ රටේ කම්කරුවන්ට බලපාන නීති සම්බන්ධයෙන් දැවැන්ත සාකච්ඡාවක් අපේ සමාජයේ තිබෙනවා. විශේෂයෙන්ම කාන්තාවන් රාත්‍රි සේවයේ යෙදවීම පිළිබඳව, පැය අටක වැඩ දිනය පිළිබඳව සාකච්ඡා වනවා. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව මේ පිළිබඳ ආණ්ඩුවේ ස්ථාවරය කියන්න ඕනෑ. මේ පැය අටක වැඩ දිනය පිළිබඳව තැන් තැන්වල කථා කරනවා. ලෝකයේ තාක්ෂණය දියුණු වෙලා තිබෙන්නේ. අද බොහෝ දේවල් AIවලින් කරනවා. Data එක්ක තමයි ලෝකයේ මිනිස්සු දැන් වැඩ කරන්නේ. තාක්ෂණය දියුණු වුණාට පස්සේ ලෝකයේ පැය අටක වැඩ දිනය වෙනුවට දැන් පැය හයහමාරේ වැඩ දිනයට ඇවිල්ලා තිබෙන්නේ. පැය හත, පැය හයහමාරට ඇවිල්ලා තිබෙන්නේ. පැය අටට එහා වැඩ දිනයක් දැන් ලෝකයේ නැහැ. පැය අට අපි පැය හතට, පැය හයහමාරට පුළුවන් නම් ගෙනෙන්න ඕනෑ. ලෝකයේ දියුණු වෙමින් පවතින රටක් වෙනුවට දියුණු වෙච්ච රටක් බවටයි අපි පත් වන්න ඕනෑ. ඒ නිසා පැය අටක වැඩ දිනය තමයි අපේ ස්ථාවරය. දිනකට පැය 8යි; සතියට පැය 45යි, උපරිම. ඒ නිසා කම්කරු නීති සංශෝධනයක් පිළිබඳ සාකච්ඡාවකට අපි කමිටුවක් පත් කර තිබෙනවා. ජාත්‍යන්තරව පිළිගත් කම්කරු ප්‍රඥප්ති එක්ක කම්කරු නීති සංශෝධනය සඳහා කම්කරු අණ පනත් සියල්ල සංශෝධනය කරලා, සියලු සාකච්ඡාවල කරුණු එකතු කරලා ගෙනෙන කම්කරු නීති සංශෝධනයක් සඳහා වූ සාකච්ඡාව පටන් ගන්න දැන් කමිටුවක් පත් කර තිබෙනවා. හැම කෙනාටම ඇහුම්කන් දීලා, මහජන අදහස් විමසා, ඒ අදහස් අරගෙන, මේ රටේ කම්කරුවාත්, මේ රටේ ආර්ථිකයත්, මේ රටේ අනාගතයත් ගැන හිතලා වඩා හොඳ කම්කරු නීති සංශෝධනයකට අවශ්‍ය මූලික ආරම්භය ගන්න අපි කමිටුවක් පත් කර තිබෙනවා. ඒ හරහා කම්කරු නීති සංශෝධනයට අපි දැන් මුල පුරලා තිබෙනවා.

මේ කථා බහ අවසන් කරනකොට මම කියන්න ඕනෑ දෙයක් තිබෙනවා. විපක්ෂය තවදුරටත් වතු කම්කරුවාගේ වැටුප පිළිබඳව දෙබිඩි පිළිවෙතක ඉන්නේ නැතිව ඊට සහයෝගය දක්වන්න ඕනෑ. එක වෙලාවක පාර්ලිමේන්තුව ඇතුළේ කියනවා, ඔවුන් මේකට විරුද්ධ නැහැ කියලා. සමහර වැඩසටහන්වලදී, නැත්නම් එළියේ ගිහිල්ලා කියනවා, මේකට විරුද්ධයි කියලා. ඊයේත් මම දැක්කා සමහර මන්ත්‍රීවරුන් කියනවා, ඔවුන් මේකට විරුද්ධයි කියලා. මේ යෝජනාවට විරුද්ධ වන්න එපා. දෙබිඩි අය වෙන්න එපා, එක ස්ථාවරයක ඉන්න. විපක්ෂයේ මන්ත්‍රීවරියක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් පවා කළා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Wasantha Samarasinghe, you have exceeded your time.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

මම කථාව අවසන් කරන්නම්. Sir, give me just 30 seconds, please.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කළ එක ආපහු නිවැරදි කර ගන්න බැරි වන්න පුළුවන්. ඒක එතුමියගේ අදහසක් වන්නත් පුළුවන්. නැත්නම් විපක්ෂයේ අදහසක් වන්නත් පුළුවන්. කෝක වුණත් කමක් නැහැ, දැන් නාලා ඉවරයි. ඒ නිසා දෙබිඩි අය නොවී එක ස්ථාවරයක ඉන්න.

මේ රටේ අවුරුදු 200ක් තිස්සේ වතුවල වැඩ කරන කම්කරු ජනතාවට මේ වැටුප ලබා දෙන්න තීරණය කළේ නිකම් නොවෙයි. රුපියල් 1,750ක් දක්වා වැටුප වැඩි කරද්දි සේවක අර්ථසාධක අරමුදල් ගෙවන, -සේවක අර්ථසාධක අරමුදලට දායක වන- හැම වත්තකම සේවකයන්ට රුපියල් 200ක් හාම්පුතා ගෙව්වාම, රජයෙන් ගෙවන 200ත් ඒ අයට ලබා ගැනීමට ඉඩ තිබෙනවා. හාම්පුතා රුපියල් 200ක් ගෙවලා රජයෙන් ඒක reimburse කර ගන්න පුළුවන්. ඒ නිසා ඒ වැඩේ කර ගන්න සියලුදෙනා දායක කර ගන්න, විපක්ෂයත් මේකට එකතු කර ගන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා දෙබිඩි පිළිවෙතක ඉන්නේ නැතිව දැන්වත් මේකට එකතු වන්න කියලා මම ආරාධනා කරනවා.

මේ රටේ වැඩ කරන ජනතාව වෙනුවෙන් දැවැන්ත කාර්යභාරයක් ඉටු කරපු රජයක් හැටියට, ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න මැදිහත් වෙච්ච ආණ්ඩුවක් හැටියට, රාජ්‍ය සේවකයාගේ අයිතිවාසිකම්, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම්, විශ්‍රාමිකයාගේ අයිතිවාසිකම්, රාජ්‍ය සේවයට අහිමි වෙච්ච අයිතිවාසිකම් ලබා දීම වෙනුවෙන් පෙනී හිටපු රජයක් හැටියට අපි වෙච්ච පොරොන්දු ඉටු කළා. ඒ අනුව, වැඩ කරන ජනතාව වෙනුවෙන්, රාජ්‍ය සේවකයින් වෙනුවෙන් පෙනී හිටපු මාලිමා ආණ්ඩුව කියපු දේ කරපු රජයක් බව මතක් කරමින් මම නිහඬ වෙනවා, ගරු සභාපතිතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Hon. Chairman, -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Yes, Hon. Leader of the Opposition, you may clarify. I will give you a minute.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු සභාපතිතුමනි, මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, යම් කාරණයක් කෙරෙහි. එතුමා කම්කරුවාගේ අයිතිවාසිකම් ගැනත්, ඒ වාගේම online හරහා, AI හරහා කරන ක්‍රියාවලිය ගැනත් විග්‍රහයක් කළා. මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. තක්සේරුවක් කරන්න, මේ සිදු වන තාක්ෂණික දියුණුවත් එක්ක, artificial intelligence විප්ලවයත් එක්ක වර්තමානයේ තිබෙන රැකියා කොයි තරම් ප්‍රමාණයක් අහිමි වෙයිද කියන එක පිළිබඳව. මොකද, ඒ පිළිබඳ තක්සේරුවක් කිරීම ඉතාම වැදගත්. ඒ තක්සේරුව කරලා විශේෂයෙන්ම රැකියා වෙළෙඳ පොළට උචිත, එහි ඉල්ලුමට සරිලන අලුත් රැකියා බිහි කරන්නට අපේ රටේ පෙර පාසලේ ඉඳලා ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික අධ්‍යාපන ක්‍රමවේදය වෙනස් කරමින් ලොකු ගමනක් යන්න අපට සිද්ධ වනවා. මොකද, artificial intelligence revolution එක තුළ සම්ප්‍රදායානුකූල රැකියා ඔක්කෝම තර්ජනයට ලක් වනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු සභාපතිතුමනි, විපක්ෂ නායකතුමා මතු කළ කරුණ පිළිබඳව රජයක් හැටියට අපි අවධානය යොමු කර තිබෙන බව මම අවධාරණය කරන්න ඕනෑ. එතුමා මතු කළේ, මේ ලෝකයේ තාක්ෂණික විප්ලවයක් සිද්ධ වෙමින් තිබෙනවා; කෘත්‍රිම බුද්ධියේ - artificial intelligenceවල - වර්ධනයත් එක්ක ලෝකයේ සාම්ප්‍රදායික රැකියා වේගයෙන් වියැකෙනවා කියන එකයි. ඒක හරි. ඒ වාගේම අලුත් රැකියා අවස්ථා ඇති වනවා. එම නිසා ලෝකයේ මිනිසුන්ගේ අවශ්‍යතා නවීකරණය වනවා. මිනිසුන් අලුත් විධියට වැඩ කරන්න පටන් ගන්නවා. මිනිසුන්ගේ ආහාර රටා, අඳින පළඳින රටා සහ අවශ්‍යතා වෙනස් වනකොට ඒ වෙනස් වන විධියට වෙනස් නොවුණොත් අපත් පිටුපසට යනවා. ඒ අනුව, අලුත් වෙන්න පුළුවන් විධියට අධ්‍යාපන ක්‍රමයේ වාගේම ආර්ථික ක්‍රමවේද වෙනස් කරගෙන ඉස්සරහට යන්න අවශ්‍ය කරන අධ්‍යාපනයේ සහ ක්‍රියාකාරකම්වල වෙනස්කම්වලට යන්න සූදානම් විධියට අපේ ආර්ථිකය හැඩ ගස්වා ගන්න අවශ්‍ය වෙනස්කම්වලට යන්න අපි සූදානම්. ඒ සඳහා වෙනස් වන්න අපි ලැහැස්තියි කියන පණිවුඩයත් අපි ලබා දෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The Hon. Kaveenthiran Kodeeswaran.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய இந்தக் குழுநிலை விவாதத்திலே, விசேடமாக இந்த உயரிய -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Chairman, -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Kodeeswaran, give us a minute. Hon. Ravi Karunanayake, you are on your feet. Could you make it very brief? We have no time.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු සභාපතිතුමනි, ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා දැනුවත්ව කථා කරන නිසා ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

[ගරු රවී කරුණානායක මහතා]

ගරු ඇමතිතුමනි, වතු කම්කරුවන් 83,000ට රුපියල් බිලියන 5ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, තේ, රබර් සහ පොල් ක්ෂේත්‍රයේ ලක්ෂ හතහමාරක් වැඩ කරනවා. ඇයි, ඒ අයටත් පැමිණීමේ දීමනාව ගෙවන්නේ නැත්තේ? ලොකු රුදාවක් තිබෙන්නේ 83,000 ගැන විතරද? ලක්ෂ හතටම එම දීමනාව ගෙවන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Let us not make a debate on this.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, please make it very brief.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ක්ෂේත්‍රයේ ලක්ෂ හතහමාරක් වැඩ කරනවා කියලා අපට වාර්තා වෙලා නැහැ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ලක්ෂ හයක්, හතක් වැඩ කරනවා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
දැන් ඉතා පැහැදිලිව මේ පිළිබඳව මම කිව්වා නේ, ගරු මන්ත්‍රීතුමා. වතුවල වැඩ කරන ඕනෑම කෙනෙකුට EPF, ETF ගෙවලා තමනුත් රුපියල් 200ක් දීලා, රජය දෙන රුපියල් 200ත් ගෙවලා, ඒක reimburse කර ගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, let us move on.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වතු කම්කරුවන්ට විතරද එම දීමනාව දෙන්නේ?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, නැහැ. දැන් ඔබතුමාට තේරෙනවාද? ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාට තේරෙනවා නේ, EPF, ETF ගෙවනවා නම් මෙම දීමනාව ගන්න පුළුවන්. *[බාධා කිරීමක්]* EPF, ETF ගෙවනවා නම් ගන්න පුළුවන්.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ ඉතින්, කොම්පැනිකාරයන්ට නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා දැන් කියන්නේ මොකක්ද? EPF, ETF ගෙවනවාද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හැම කෙනාටම දෙන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
EPF, ETF ගෙවන හැම කෙනාටම දෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
EPF, ETF ගෙවන හැම කෙනාටම - *[බාධා කිරීමක්]*

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා කියන්නේ නීති විරෝධී ඒවා කරන්න කියලා නේ. දවසක් වැඩ කළත් EPF, ETF ගෙවන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Okay. Hon. Kaveenthiran Kodeeswaran, you may start now. - *[Interruption.]* Your time starts now. - *[Interruption.]* Hon. Minister Wasantha Samarasinghe and Hon. Ravi Karunanayake, we will come to that later. Would you please sit down?

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
රවී කරුණානායක මන්ත්‍රීතුමා, එක සේවකයෙක් වැඩ කළත් EPF, ETF ගෙවන්න ඕනෑ. නැත්නම් ඒක නීති විරෝධියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Please listen to the Chair. Hon. Minister Wasantha Samarasinghe and Hon. Ravi Karunanayake, could you please take your seats? We are not going to make it a debate.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தவிசாளர் அவர்களே, எனது time போய்க்கொண்டிருக்கின்றது. தயவுசெய்து - *[இடையீடு]*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, would you please sit down? Hon. Kaveenthiran Kodeeswaran, your time starts now.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
கௌரவ தவிசாளர் அவர்களே, எனது நேரத்தை இப்போதிருந்து ஆரம்பியுங்கள்!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, your time starts now.

[மு.ப. 11.14]

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Thank you, so much, Sir.

கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய குழுநிலை விவாதத்திலே, விசேடமாக கடந்த 30 வருடங்களாக அநீதி இழைக்கப்பட்ட ஒரு சமூகத்திற்கு எதிராக நடைபெறுகின்ற ஒரு நிருவாக அத்துமீறல், அதிகாரக் குறைப்பு போன்ற விடயங்களைக் கருத்திற்கொண்டு இந்த உயரிய சபையின் ஊடாக நீதியை வேண்டிச் சில விடயங்களை முன்வைக்கலாமென்று நான் நினைக்கின்றேன். அதாவது, கல்முனை வடக்கு பிரதேச செயலகத்திற்கு 30 வருட காலமாக அந்தப் பிரதேச செயலகத்திற்குரிய - அந்த மக்களுக்குரிய - அதிகாரம் கொடுக்கப்படாமலிருக்கின்றது; அவர்களுக்குரிய அந்த நிருவாக அதிகாரம் என்பது புறக்கணிக்கப் பட்டிருக்கின்றது. அதற்கு நீங்கள் என்ன பதிலைச் சொல்லப் போகின்றீர்கள் என்பதனை அடிப்படையாகக் கொண்டுதான் இந்த உயரிய சபையின் ஊடாக அதற்கான நீதியை வேண்டி நிற்கின்றேன்.

கடந்த 30 வருட காலமாக இருந்த அரசுகள் கல்முனை வடக்குப் பிரதேச செயலகத்திற்கு - அந்த மக்களுக்கு - நிருவாக ரீதியாகப் பலதரப்பட்ட தடைகளையும் பலதரப்பட்ட அநீதிகளையும் இழைத்திருக்கின்றன. ஆனால், தற்போது ஆட்சிக்கு வந்திருக்கின்ற NPP அரசாங்கமானது, குறிப்பாக சம்பந்தப்பட்ட அமைச்சர் அவர்கள், கல்முனை வடக்கு பிரதேச செயலகத்தின் நிருவாகம் சம்பந்தமாக என்ன விடயங்களை முன்னெடுக்கப் போகின்றார், என்ன நியாயத்தை வழங்கப் போகின்றார் என்பதனை இங்கு கூற வேண்டும். ஏனென்றால், 1993ஆம் ஆண்டு இதற்கான அமைச்சரவை அனுமதி கிடைத்திருந்தும்கூட, அதாவது Cabinet Paper No. 93/600/34 மற்றும் 93/600/34(1) ஆகியவற்றினூடாக கல்முனை வடக்கு உப பிரதேச செயலகம் ஒரு பிரதேச செயலமாகத் தரமுயர்த்தப்பட்டிருந்தும்கூட, இன்றுவரை அந்தப் பிரதேச செலயகத்திற்குரிய அதிகாரங்கள் மறுக்கப்பட்ட நிலையில் இருக்கின்றது. குறித்த இந்தப் பிரதேச செயலகம் 29 கிராம சேவகர் பிரிவுகளை உள்ளடக்கியிருக்கின்றது. அதேபோல், கல்முனை தெற்குப் பிரதேச செயலகமும் 29 கிராம சேவகர் பிரிவுகளை உள்ளடக்கியுள்ளது. இன்றைய தினம் அமைச்சர் மட்டுமல்லாமல், பொது நிருவாக அமைச்சின் செயலாளரும் இங்கே வருகை தந்திருப்பார் என்று நினைக்கின்றேன். ஆகவே, அவர்கள் இதனைக் கருத்திற்கொள்ள வேண்டுமென்று இந்த இடத்திலே குறிப்பாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

விசேடமாக, ஓர் அமைச்சரவை அனுமதி பெற்று உருவாக்கப்பட்ட ஒரு பிரதேச செயலகத்தை என்ன காரணத்திற்காக, என்ன நோக்கத்தின் அடிப்படையில் கல்முனை தெற்கு பிரதேச செயலகத்துடனோ அல்லது வேறு எந்த நிறுவனங்களுடனோ சேர்க்க முடியும்? இதற்கான நீதி, நியாயம் என்ன என்பதனை இந்த இடத்திலே கேட்க விரும்புகின்றேன். ஏனென்றால் ஓர் அமைச்சரவை அனுமதி பெற்ற பிரதேச செயலகத்தை இன்னொரு பிரதேச செயலகத்துடன் இணைக்க முடியாது. அதற்கான அதிகாரம் அமைச்சருக்கோ, அரசாங்க அதிபருக்கோ அல்லது அமைச்சின் செயலாளருக்கோ இல்லை. அப்படிச் செய்ய வேண் டுமென்றால், குறித்த அமைச்சரவை அனுமதிப் பத்திரத்தை இரத்துச் செய்ய வேண்டும். அப்படியிருக்கின்றபோது, அதனை இன்னுமொரு பிரதேச செயலகத்தோடு சேர்த்திருப்பதை, கல்முனை வடக்கு பிரதேச செயலகத்தின் அதிகாரத்தைக் குறைப்பதற்கான ஒரு நடவடிக்கையாகத்தான் நாங்கள் பார்க்கின்றோம்.

குறிப்பாக, இங்கே நடைபெற்ற Public Administration and Home Affairs Ministry மற்றும் அதன் Sectoral Oversight Committee என்பவற்றின் கூட்டங்களில் நான் இந்த விடயங்களைத் தெளிவாகக் கூறியிருந்தேன். அதற்கு, "இது தொடர்பாக Supreme Courtஇலே 3 cases இருக்கிறது" என்று சொன்னார்கள். அவை writ cases; 2018ஆம் ஆண்டில் தாக்கல் செய்யப்பட்டவை. அதிலே, நிருவாகம் சம்பந்தமாகக் கலந்துரையாட வேண்டாம் என்றோ, நிர்வாகம் செயற்படக் கூடாது என்றோ குறிப்பிடப்படவில்லை. 2018ஆம் ஆண்டுக்கு முன் Public Administration and Home Affairs Ministryஇன் இணையத் தளத்திலே அது ஒரு பிரதேச செயலகமாகத்தான் காட்டப்பட்டிருக்கிறது. ஆனால், 2020க்குப் பிறகு அது ஓர் உப பிரதேச செயலகமாகக் காட்டப்பட்டிருக்கின்றது. அவ்விதம் மாற்றுவதற்கான அதிகாரம் எப்படி வந்தது? நீங்கள்தான் சொன்னீர்கள், "courtஇல் case இருக்கின்றது, மாற்ற முடியாது" என்று. ஆனால், அது மாற்றப்பட்டிருக்கிறது.

2018ஆம் ஆண்டுக்குப் பின்னர் பல தரப்பட்ட விடயங்களில் அங்கு மாற்றங்கள் ஏற்பட்டிருக்கிறது. இது என்ன நோக்கத்தின் அடிப்படையில் மாற்றப்பட்டது? அவ்வாறு மாற்றுவதற்கு யார் அந்த அதிகாரத்தைத் தந்தது? ஓர் அமைச்சரவைப் பத்திரத்தின்மூலம் அனுமதி வழங்கப்பட்ட ஒரு பிரதேச சபையின் அதிகாரங்களை எப்படி தெற்குப் பிரதேச செயலகத்துக்குக் கொடுக்க முடியும் அல்லது அதனை GA எப்படி மாற்ற முடியும்? GAக்கு அந்த அதிகாரத்தை யார் கொடுத்தது? சட்டப்படி அவரால் மாற்றம் செய்ய முடியாது. அமைச்சின் செயலாளர் மாற்ற முடியாது. எப்படி மாற்ற முடியும்? அந்த வகையில் நீங்களும் ஒரு சட்டவிரோதச் செயற்பாட்டுக்கு உறுதுணையாக இருந்திருக்கின்றீர்கள்.

கடந்த கால அரசுகள் எப்படி இதனைத் திட்டமிட்டு மோசடி செய்து நிலங்களைக் கொள்ளையடிப்பதற்காக அந்த அதிகாரங்களைக் கொடுப்பதற்குத் தடையாக இருந்து செயற்பட்டதோ, அதேபோன்றுதான் இந்த அரசும் செயற்படுகின்றதா? உங்களிடம் இந்த விடயம் தொடர்பாகப் பல தடவை நாங்கள் கேட்டிருந்தோம். நீங்களும் சொன்னீர்கள், "நாங்கள் அதற்கு ஒரு Committeeஐ நியமிக்கின்றோம்" என்று. அதாவது, "பிரதேச செயலாளர் மற்றும் அரசாங்க அதிபர் உட்பட ஒரு Committeeஐ நியமித்து அது தொடர்பாக ஆராய்ந்து இதற்கான விளக்கத்தைக் கொடுப்போம்" என்று சொன்னீர்கள். ஆனால், நீங்கள் அப்படிச் செய்யவில்லை! நீங்கள் ஏன் செய்யவில்லை? நீங்களும் பழைய அரசாங்கங்கள் போன்று நடந்துகொள்ளப் போகின்றீர்களா? நாங்கள் இந்த அரசிடம் நீதியை வேண்டி நிற்கின்றோம் அல்லவா? பழைய அரசாங்கங்கள் செய்த பிழைகள், மோசடிகளைக் கண்டுபிடித்து இந்த அரசாங்கம்

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

சரியாகச் செயற்படும் என்ற நம்பிக்கையில் இந்த விடயங்களை நாங்கள் உங்களிடம் முன்வைத்து, நீதியைக் கோரி நிற்கின்றோம். நீங்களும் பழைய அரசாங்கங்கள் போன்று, நீதியையும் நியாயத்தையும் மறுக்கக் கூடாது. ஏனென்றால், 2018க்குப் பின்னர் பல விடயங்கள் மாற்றி அமைக்கப் பட்டிருக்கின்றது. இவற்றை எல்லாம் மோசடியானதொரு விடயமாகத்தான் நாங்கள் பார்க்கின்றோம்.

அதுமட்டுமன்றி, அந்தப் பிரதேசத்திலுள்ள மக்களும் அங்குள்ள அமைப்புகளும் என்னிடம் சில விடயங்களை முன்வைத்திருக்கின்றார்கள். அதனை இங்கு வாசிக்கிறேன்:

> " கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவு எல்லைக்குள் 'இஸ்லாமாபாத்'இன் ஊடுருவல் மற்றும் விரிவாக்கத்தைத் தடுத்தல் - கல்முனை வடக்கு பிரதேச செயலக பிரிவுக்குள் 'இஸ்லாமபாத்' - KP/59/A எனும் பெயருடன் சட்டவிரோதமாக உருவாக்கப்பட்டதும் எல்லைகளற்றதும் கற்பனையானதுமான கிராம உத்தியோகத்தர் பிரிவொன்று, கல்முனை தெற்குப் பிரதேச செயலகத்தினால் நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றது. கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவுக்குட்பட்ட கல்முனை 1C கிராம சேவகர் பிரிவில், அமையப்பெற்ற சுனாமி வீட்டுத் திட்டமொன்றுக்காகச் சூட்டப்பட்ட பெயராக 'இஸ்லாமாபாத்' காணப்பட்டபோதிலும், தற்போது அது பல திசைகளிலும் ஊடுருவி விரிவாக்கப்பட்டு வருகின்றது. தற்போது கல்முனை வடக்குப் பிரதேச செயலகப் பிரிவின் கல்முனை 1C, கல்முனை 1, கல்முனை 2, கல்முனை 2A, கல்முனை 3, கல்முனை 3A ஆகிய 6 கிராம சேவகர் பிரிவுகளுக்குள் 'இஸ்லாமபாத்' நடைமுறைப்படுத்தப்பட்டு வருகின்றது. இவ்வாறான சட்டவிரோதச் செயற்பாடுகளைத் தடுத்து நிறுத்துவதற்காக தொடர்புடைய அதிகார மட்டங்களுக்குப் பல்வேறு முறைப்பாடுகளைத் தொடர்ச்சியாகச் செய்கின் றபோதிலும் அவர்களால் எதுவித நடவடிக்கைகளும் எடுக்கப்படுவதில்லை. மாறாக, காணி அடாத்துக் காரர்களுக்கு ஆதரவாகச் செயற்பட்டு வருகின்றனர்."

கல்முனை வடக்குப் பிரதேச செயலகத்தின்கீழ் வருகின்ற கிராம சேவையாளர் பிரிவுகளில் உள்ளடங்குகின்ற காணிகளை அபகரிப்பதற்காகவும் அதில் சட்டவிரோதச் செயற்பாடுகளை முன்னெடுப்பதற்காகவும் அரச காணிகளைக் கையாள்வதற்காகவும் சம்பந்தப்பட்ட அரச அதிகாரிகளும் மேலதிகாரிகளும் திட்டமிட்ட முறையில் கல்முனை தெற்குப் பிரதேச செயலகத்துடன் கல்முனை வடக்குப் பிரதேச செயலகத்தில் உள்ளடங்குகின்ற கிராம சேவகர் பிரிவுகளை இணைத்திருப்பதானது வன்மையாகக் கண்டிக்கத்தக்கதொரு விடயமாக இருக்கின்றது. இது எந்த விதத்திலும் நியாயமில்லை. அவ்வாறு கிராம சேவகர் பிரிவுகளை இணைக்க முடியாது.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Kaveenthiran Kodeeswaran, your time is up.

**ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා**
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveenthiran Kodeeswaran)
Please give me one minute more, Sir.

அதில் மேலும் பின்வருமாறு குறிப்பிடப்பட்டிருக்கிறது:

> " குறிப்பாக, நில அளவைத் திணைக்களத்தின் செயற்பாடுகள் வன்மையாக கண்டிக்கத்தக்கவை. 'இஸ்லாமபாத்' எனும் சட்டவிரோத கிராம உத்தியோகத்தர் பிரிவை நில அளவைத் திணைக்களத்தின் வரைபடத்தினுள் உள்வாங்கியது மாத்திரமல்லாமல், நாளுக்கு நாள் அதன் விஸ்தீரணத்தை அதிகரித்துக் கொண்டு செல்கின்றது. இதன்போது கல்முனை வடக்குப் பிரதேச செயலகத்தின் மேலே சுட்டிக்காட்டப்பட்ட 6 பிரிவுகளின் கிராம உத்தியோகத்தர்களுடனும் கல்முனை வடக்குப் பிரதேச செயலகத்துடனும் கலந்துரையாடாமல், வெளிப்படைத்தன்மை இல்லாமல் திருட்டுத்தனமாக இந்த வேலைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றது. நில அளவைக்குரிய அடிப்படை விதிகளை மீறியதான சட்டவிரோதமான நில அளவை நடவடிக்கைகள் அங்கு இடம்பெற்று வருகின்றது. முன்னர் அம்பாறை மாவட்டத்துக்குப் பொறுப்பாக இருந்தவரும், தற்போது கிழக்கு மாகாணத்துக்குப் பொறுப்பாகச் செயற் படுகின்றவருமான உயர் அதிகாரி ஒருவர் இதற்குப் பின்னால் தீவிரமாகச் செயற்பட்டு வருவதாக நான் அறிகின்றேன்."

இச்சட்டவிரோத நடவடிக்கையை உடனடியாக நிறுத் துமாறும், RDA, விவசாயத் திணைக்களம் மற்றும் உரிய ஏனைய நிறுவனங்களோடு கலந்துரையாடி இதனை மேற்கொள்ளுமாறும் கேட்டுக்கொள்ளுகின்றேன். நன்றி!

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have seven minutes and thirty seconds.

[மு.ப. 11.25]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அரச இயந்திரத்தை இயக்குகின்ற முக்கியமான ஓர் அமைச்சாக இந்த அமைச்சு இருக்கின்றது. காலனித்துவ ஆட்சிக்குப் பின்னரான சுதந்திர இலங்கையில், மத்தியில் அதிகாரங்கள் குவிக்கப்பட்டன. ஒற்றையாட்சி யாப்பில் திருத்தங்கள் மேற்கொள்ளப்பட்டு, பல இன மற்றும் பல மொழி பேசுகின்ற மக்கள் சார்ந்து அதிகாரப்பரவலாக்கல் இடம்பெற்றாலும், அது திறம்பட நடைமுறைப்படுத்தப் படாமல் இருப்பது கசப்பான வரலாற்று உண்மை! ஒரு சமூகத்தை முன்னிறுத்தி உருவாக்கப்படுகின்ற சட்டங்கள் இந்த நாட்டில் என்றும் சாந்தியையும் சமாதானத்தையும் ஏற்படுத்தாது. எங்களுடைய நாட்டில் வேறு எங்குமே இல்லாத சில நிருவாக நடைமுறைகள் வடக்கு மாகாணத்தில் உருவாக்கப்பட்டு இருக்கின்றன. குறிப்பாக, வவுனியா மாவட்டத்தின் வடக்குப் பிரதேசத்தில் மகாவலி 'எல்' வலயம் என்ற பெயரில் வெவ்வேறு பிரதேசங்களில் இருந்து மக்கள் கொண்டுவரப்பட்டு குடியமர்த்தப்பட்டு இருக்கிறார்கள். அவர்களுக்காக மணலாறு பிரதேச செயலாளர் பிரிவு என்ற ஒரு பிரதேச செயலாளர் பிரிவும் உருவாக்கப்பட்டு இருக்கிறது. மணலாறு பிரதேச செயலாளர் பிரிவு 6 வட்டாரங்களாகப்

பிரிக்கப்பட்டுள்ளது. அந்த 6 வட்டாரங்களில் 5 வட்டாரங்கள் வவுனியா வடக்குப் பிரதேச சபையின் வட்டாரங்களாக இருக்க, ஒரு வட்டாரம் மட்டும் கரைதுறைப்பற்று பிரதேச சபையினுடையதாக இருக்கின்றது.

இந்த மணலாறு பிரதேச செயலாளர் பிரிவு நிருவாக ரீதியாக முல்லைத்தீவு மாவட்டத்துடன் இருக்கிறது. ஆனால், அந்தப் பிரதேச செயலாளர் பிரிவில் இருக்கிற 6 வட்டாரங்களில் 5 வட்டாரங்களிலுள்ள மக்கள் வவுனியாவில் வாக்குப் போட்டு உறுப்பினர்களைத் தெரிவு செய்கிறார்கள். ஒரு வட்டாரம் முல்லைத்தீவுக்குக்கீழ் வருகிறது. இப்படியான ஒரு நிருவாக அமைப்பு இலங்கையில் வேறு எந்த இடத்திலும் இல்லை. அதாவது, நிருவாக ரீதியாக ஒரு மாவட்டம்; அரசியல் ரீதியாக - வாக்களிப்பதற்கு - இன்னுமொரு மாவட்டம்!

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இதில் கவனமெடுத்து இந்த நடைமுறையை நிறுத்த வேண்டும். அரசியல்வாதிகள் அரசியல் நோக்கத்துக்காக இவ்வாறான விடயங்களைச் செய்யும்போது, உண்மையிலேயே பாதிக்கப்படுவது அந்தப் பிரதேசத்தில் கொண்டுவந்து குடியமர்த்தப்பட்ட சிங்கள மக்களாகும். அந்த மக்களுக்குச் சேவைகள் முறையாகச் சென்றடைவதில்லை. எனவே, இந்த அரசியல் சித்து விளையாட்டை நிறுத்தி, குடியமர்த்தப்பட்ட அந்த மக்களுக்காக மணலாறு பிரதேசத்துக்கான பிரதேச சபையை நிறுவுங்கள்! அந்தப் பிரதேச சபை அந்த மக்களுக்குரிய சேவையைச் செய்யட்டும்! உங்களுடைய மேலாதிக்க அரசியலுக்காக அந்த மக்களைப் பகடைக்காயாக்க வேண்டாமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். வீடு தருவதாக, காணி தருவதாகப் பல்வேறு பொய்களைக் கூறியே அந்த மக்களைக் கொண்டுவந்து குடியமர்த்தி இருக்கிறார்கள். மகாவலி 'எல்' வலயம் உருவாக்கப்பட்டு 40 ஆண்டுகளாகியும் மகாவலி நீர் ஒரு துளிகூட அந்த இடத்துக்கு வரவில்லை. பொய் சொல்லிக் கொண்டுவந்து குடியேற்றப்பட்ட அந்த மக்களுக்கு வாழ்வாதாரம் தேவைப்படும்போது, அங்கு பூர்வீகமாக வாழ்ந்து வருகின்ற தமிழ் மக்களுடைய வயல் நிலங்களும் குளங்களும் அபகரிக்கப்பட்டு அந்த மக்களுக்குக் கொடுக்கப்படுகின்றது. இதற்குச் சிறந்ததோர் உதாரணம்தான், தமிழ் மக்களுக்குச் சொந்தமான திரிவைத்த குளத்தையும் அதனைச் சூழவுள்ள வயற்காணிகளையும் அங்கு கொண்டுவந்து குடியேற்றப்பட்ட மக்கள் உரிமை கோரிய சம்பவம்.

கௌரவ பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர் அவர்களே, தயவுசெய்து இனமுறுகல் ஏற்படாத வகையில், குழுவொன்றை அமைத்து இந்தப் பிரச்சினைக்குத் தீர்வு காணுங்கள்! கொண்டுவந்து குடியேற்றப்பட்ட மக்களுக்கு வாழ்வாதாரத்தை ஏற்படுத்திக் கொடுப்பதற்காக நீண்ட காலமாகத் திட்டமிடப்பட்டு இருந்த கிவுல் ஓயா திட்டத்துக்கு இந்தப் பாதீட்டில் 2,500 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டு இருக்கிறது. கிவுல் ஓயா திட்டமானது, வவுனியா வடக்கிலுள்ள தமிழ் மக்களின் பூர்வீகக் காணிகளுக்கு ஊடாகவே செல்கின்றது. இந்தத் திட்டத்தை நடைமுறைப்படுத்தும்போது, தமிழ் மக்களுக்குச் சொந்தமான பூர்வீக வயல் நிலங்களும் 10க்கும் மேற்பட்ட குளங்களும் குறித்த நீரேந்துப் பகுதிக்குள் செல்லப் போகின்றன. இந்தத் திட்டத்தால் பயனடையப்போவது யார் என்றால், அங்கு கொண்டுவந்து குடியேற்றப்பட்டுள்ள மக்கள்தான். எனவே, பூர்வீக மக்களுக்குப் பாதிப்பை ஏற்படுத்தி, குடியேற்றவாசிகளுக்கு நன்மையைச் செய்கின்ற ஒரு திட்டமாகத்தான் இந்தத் திட்டம் அமையப் போகின்றது.

இன்று வடக்கில் ஒன்றுக்கும் மேற்பட்ட பிரதேச செயலகங்களைக்கொண்ட பிரதேச சபைகள் காணப்படுகின்றன. கௌரவ அமைச்சர் அவர்களே, உதாரணத்துக்கு புதுக்குடியிருப்பு பிரதேச சபையை எடுத்துக்கொள்வோம். இந்தப் பிரதேச சபையானது இரண்டு பிரதேச செயலகங்களை உள்ளடக்கி இருக்கின்றது. ஒன்று, ஒட்டுசுட்டான் பிரதேச செயலகம். மற்றையது, புதுக்குடியிருப்பு பிரதேச செயலகம். பெரிய நிலப்பரப்பைக்கொண்ட, வருமானம் குறைந்த இந்தச் சபையால் அங்குள்ள மக்களுக்குச் சேவைகளைப் பூரணமாக வழங்க முடியாது. தயவுசெய்து, ஒட்டுசுட்டான் பிரதேச சபையை உருவாக்குங்கள்! அந்த இரண்டு பிரதேச செயலகங்களுக்குமென தனித்தனி பிரதேச சபைகளை உருவாக்குங்கள்!

அடுத்து, எங்களுடைய நாட்டில் இருக்கின்ற பிரதேச சபைகளில் இருக்கின்ற முக்கியமான பிரச்சினை என்னவென்றால், போதியளவு வருமானம் இல்லாமைதான். இதற்குக் காரணம், அவற்றுக்கான ஆதன வரியைப் பெறுவதற்கான கணிப்பீடுகள் செய்யப்படாமை ஆகும். ஏன் கணிப்பீடுகள் செய்யப்படவில்லை? கணிப்பீடுகளைச் செய்வதற்குரிய உத்தியோகத்தர்கள் அங்கு இல்லை. எனவே, அந்தப் பிரதேச சபைகளுக்கு உத்தியோகத்தர்களை நியமித்து, வரி அறவீட்டை ஒழுங்கான முறையில் செய்வதற்கான நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. (Dr.) Pathmanathan Sathiyalingam, your time is up.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
Please give me one more minute, Sir.

அடுத்து, போர் நடந்த, மீள்குடியேற்றம் நடக்கின்ற எமது பகுதிகளிலுள்ள பிரதேச சபைகளில் ஆளணிப் பற்றாக்குறையும் வளப் பற்றாக்குறையும் மிக அதிகமாகக் காணப்படுகின்றது. நீங்கள் பெருமளவு நிதியை ஒதுக்கி இருக்கிறீர்கள். தயவுசெய்து, இந்தப் பிரதேச சபைகளுக்குத் தேவையான கனரக வாகனங்களைப் பெற்றுக் கொடுங்கள்! அந்தப் பிரதேச சபைகள் வினைத்திறனாகச் செயற்படுவதற்கு நீங்கள் செய்யக்கூடிய பாரிய உதவியாக அது இருக்கும். இந்தப் பாதீட்டில் 10 பில்லியன் ரூபாய் மாகாண சபைத் தேர்தலுக்காக ஒதுக்கப்பட்டு இருக்கின்றது. தயவுசெய்து, இந்த நாட்டின் Constitutionஇல் இருக்கின்ற மாகாண சபை சார்ந்த சரத்தை முழுமையாக அமுல்படுத்தி, இந்த நாட்டில் ஜனநாயகத்தை உறுதிப்படுத்துமாறு கேட்டுக் கொள்கின்றேன். இன்னும் பல விடயங்களைச் சொல்லவேண்டி இருக்கின்றது. எனினும், நேரம் போதாமல் உள்ளது. எனவே, எனது உரையின் எஞ்சிய பகுதியை *ஹன்சாட்டில் பதிவுசெய்யுமாறு கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Shantha Pathma Kumara Subasingha. You have 11 minutes.

---

*\ පුස්තකාලයේ තබා ඇත.*
*\ நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*\ Placed in the Library.*

[පූ.භා. 11.33]

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

ගරු සභාපතිතුමනි, මගේ කථාව ආරම්භයට පෙර, විපක්ෂයෙන් පැන නැඟුණු කාරණා ටිකකට උත්තර දීගෙනම යා යුතුයි කියලා මම හිතනවා. අද දවසේ විවාදය ආරම්භයේදීම කියන්න පටන් ගත්තා, 76 වසරක ශාපය ගැන කියන්න එපා කියලා. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ 76 වසරක ශාපය ගැන නොකියා යන්නේ කොහොමද කියන එකයි. ගරු සභාපතිතුමනි, ධම්ම පදයේ මුල් ගාථාවේ සඳහන් වෙනවා, "මනෝ පුබ්බංගමා ධම්මා - මනෝ සෙට්ඨා මනෝමයා" යනුවෙන්. එම ගාථාවෙහි තවත් තැනක කියනවා ගවයා පිටුපස එන කරත්ත රෝදය වාගේ අප කරන කියන දේවල් අප පසුපස එනවා කියලා. අවුරුදු ගණනාවක් හෙවත් අවුරුදු 76ක්, -දශක 7කුත් තව අවුරුදු 6ක්- අපේ රටට කළ විනාශය කියන්න සිදු වෙනවා. හැබැයි මෙතුමන්ලාගේ තහනම් වචනය, "හැත්තෑහය". සංවර්ධනය කථා කරන්න ඕනෑ; තහනම් වචනය, "හැත්තෑහය". එහෙම වෙන්නේ නැහැ, එහෙම වෙන්න බැහැ. නිරන්තරයෙන් 76 වසර ගැන කථා කරන්නම වෙනවා. එකේ ප්‍රතිඵලය හැටියට තමයි 2022 අප්‍රේල් 12වන දා මහ බැංකුවේ අධිපතිතුමාට එළියට ඇවිල්ලා ලෝකයටම කියන්න වුණේ, "අපේ රටට ණය ගෙවා ගන්න බැහැ. මෙය වතුරවත් පෙවෙන්නේ නැති රටක්" කියලා. ගරු සභාපතිතුමනි, ඒ නිසාම තමයි අපට සිදු වෙලා තිබෙන්නේ 76 වසර ගැන කියන්න.

ඊළඟට, සීතාවක ප්‍රාදේශීය සභාව ගැන කිව්වා. ඡන්ද ගැනත් කිව්වා. පළාත් සභා ඡන්දය ගැන කිව්වා. පළාත් පාලන ඡන්දය හරියට කිරීම සඳහා කල් දැම්මේ නැත්තේ ඇයි කියලා ඇහුවා. අපේ විපක්ෂ නායකතුමා ඇතුළු පිරිස ඒවා ගැන කිව්වා. මා ඒවා ගැනත් කියන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මෙතුමන්ලාට ඡන්ද කියන්නේ සෙල්ලමක්. ඒක අද ඊයේ වෙච්ච දෙයක් නොවෙයි. මෙතුමන්ලාගේ මහ කෙනා -ජේ.ආර්. ජයවර්ධන මහත්මයා- 1977 බලයට ඇවිල්ලා 1982දී පවත්වන්න තිබුණු පාර්ලිමේන්තු මැතිවරණයට -මහ ඡන්දයට- මොකක්ද කළේ? මහ ඡන්දය පැවැත්වුයේ නැහැ. "ඡන්දය ඕනෑද, එපාද" කියා අහලා ජනමත විචාරණයක් පැවැත්වූවා. ඒකට කියනවා කුප්‍රකට "ලාම්පු-කළගෙඩි සෙල්ලම" කියලා. ඒක මොන තරම් සෙල්ලමක්ද කිව්වොත් යාපනයේ අතුරුදහන් වෙච්ච ඡන්ද පෙට්ටි 9ක් තවමත් අතුරුදහන්. ගරු සභාපතිතුමනි, ඔන්න ඒ ගොල්ලන්ගේ ඉතිහාසය. ජේ.ආර්. ජයවර්ධනගේ ඉඳන්, සිරිමාවෝ බණ්ඩාරනායකලාගේ ඉඳන්, ප්‍රේමදාසලාගේ ඉඳන්, ආසන්නයේම හිටපු රනිල් වික්‍රමසිංහ දක්වා ඡන්ද කල් දාපු ඉතිහාසයක් තිබෙන්නේ. ගිය වර පළාත් පාලන ඡන්දයට සියල්ල සම්පාදනය කරලා, අපේක්ෂකයනුත් ඉදිරිපත් වෙලා, ඡන්ද campaign එකත් පටන් ගෙන යනකොට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවේදී ආණ්ඩුව පැත්තේම ඉඳගෙන කිව්වා, "ඡන්දත් නැහැ, සල්ලිත් නැහැ" කියලා. එහෙමයි කිව්වේ. එහෙම නම්, ඔබතුමන්ලාට තමයි ඡන්ද කල් දැමීමේ ඉතිහාසයක් තිබෙන්නේ. අපි ඉතා වගකීමෙන් කියනවා, අපි පළාත් සභා ඡන්දය පවත්වන බව. ගරු ජනාධිපතිතුමා මේ සභාවේ ඉඳන් අය වැය කථාව ඉදිරිපත් කරද්දී කිව්වා, ඒ සඳහා මුදල් තිබෙනවා කියලා. කලින් ආණ්ඩුව කිව්වේ මුදල් නැහැ කියලායි. අපේ ජනාධිපතිතුමා කියනවා මුදල් තිබෙන බව. එතුමා අපට කිව්වා, නීතිය හදලා දෙන්න කියලා. ඒ නිසා අපි ඔබතුමන්ලාටත් යෝජනා කරනවා අපි නිවැරැදි නීතියක්, ක්‍රමවේදයක් හදමු කියලා. පළාත් සභා ඡන්දය කල් යන්නේ නැහැ, නියමිත වෙලාවට පවත්වනවා.

ඒ කාලයේ පළාත් පාලන ඡන්දය කල් දැම්මා. ඊට පස්සේ අපිත් ගියා ශ්‍රේෂ්ඨාධිකරණයට, තවත් ප්‍රගතිශීලී කණ්ඩායම් ගියා ශ්‍රේෂ්ඨාධිකරණයට. අන්තිමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් නියෝගය ආවා, හැකි ඉක්මනින් එය පවත්වන්න කියලා. ඔව්, ඊට පස්සේ ආවේ අපේ ආණ්ඩුවක්. අපි දැනගත්තා ඒ පළාත් පාලන ඡන්දය විකෘතියක් බව. මොකද, ජනාධිපතිවරයා තේරී පත් වුණාට පසුව තමයි ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ඡන්දය පැවැත්වුයේ. ඒකේ අපි වැඩි ආසන සංඛ්‍යාවක්, වැඩි කොට්ඨාස ප්‍රමාණයක් දිනුවා. නමුත් බලය පිහිටුවා ගැනීමේදී ප්‍රශ්නයක් මතු වුණා. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, එය ඔබතුමාගේ ආසනය. අපි මේ ගැටලුව දැනගත්තා; අපි ජනාධිපතිතුමාට යෝජනා කළා, "අපි මේක නිවැරැදි කරගෙන යමු" කියලා. ජනාධිපතිතුමාගේ ස්ථාවරය තමයි, "මම ඡන්ද කල් දාන්නේ නැහැ" කියන එක. ඒ විතරක් නොවෙයි ගරු ශ්‍රේෂ්ඨාධිකරණය නියෝගයක් දීලා තිබෙනවා. අපි ඒකට එකඟයි, අපි නීතිගරුක රජයක්. අපට අවාසි වන බව දැන දැන අපි ඒ ඡන්දය පැවැත්වුවා. ඒකේ ප්‍රතිඵලය තමයි මේ අවිත් තිබෙන්නේ. මේක විකෘතියක්. හැබැයි මේ විකෘතිය හැදුවේ කවුද? ඔබතුමන්ලා නේ 2016දී හැදුවේ, ඔය විකෘතිය. පළාත් සභා ඡන්දය තියන්න බැරි විකෘතියත් ඔබතුමන්ලාම තමයි හැදුවේ. ඔබතුමන්ලාට මොළේ තිබුණේ නැද්ද ඒ කාලයේ? "බලය තියෙන කොට මොළය නැහැ" කියලා ඔබතුමන්ලා ඊයේත් කිව්වා. ආං ඒක තමයි වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාම තමයි ඒ විකෘතිය හැදුවේ. දැන් මොකද වෙලා තිබෙන්නේ?

සීතාවක ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීම ගැන ඊයේත් කිව්වා, අදත් කිව්වා. සීතාවක ප්‍රාදේශීය සභාවේ එම ඡන්ද විමසීම ගැන විපක්ෂය කියන්නේ මොකක්ද? අපි සල්ලි දීලා සීතාවක ප්‍රාදේශීය සභාවේ දිලිත් ජයවීර මහත්මයාගේ පක්ෂයේ සභික මන්ත්‍රීවරයෙකු ගත්තා ලු. නැහැ, ඒවා ඔබතුමන්ලා කරන වැඩ. ඔබතුමන්ලාගේ ඉතිහාසය එහෙමයි. ඔබතුමන්ලාගේ ඉතිහාසය එහෙමයි, සල්ලි දීලායි මන්ත්‍රීවරු ගත්තේ. මන්ත්‍රීවරු ඒ විධියට ගත්තා; මන්ත්‍රීවරු බා ගත්තා. මන්ත්‍රීවරු විකිණුණා.

මේ සභාවේත් කියැවුණා, තමන්ගේ පාර්ලිමේන්තු මන්ත්‍රීකම කෝටි 9කට විකුණුවා කියලා. දැන් නඩුවකුත් යනවා. එවැනි තත්ත්වයක් තිබෙන්නේ ඔබතුමන්ලාගේ පක්ෂවලයි. ඒ නිසා ඔබතුමන්ලා මේ කාරණයේදීත් හිතනවා, NPP එකත් සල්ලි දෙන්න ඇති කියලා. එහෙම නොවෙයි මහත්තයෝ. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමන්ලාගේ පැත්තේ සිටින ගරු රාධාක්‍රිෂ්ණන් හිටපු ඇමතිතුමා, ගරු මනෝ ගනේසන් හිටපු ඇමතිතුමා, ගරු පලනි දිගම්බරම් හිටපු ඇමතිතුමා, ගරු ජීවන් තොන්ඩමන් හිටපු ඇමතිතුමා නොවැම්බර් 14වැනි දා අය වැය දෙවැනි වර කියවීමේ ඡන්ද විමසීමේදී අපේ අයවැයට පක්ෂව ඡන්දය දුන්නා. එතකොට, ඒ අය ඡන්ද දුන්නේත්, NPP එක, අපේ ජනාධිපති ගරු අනුර දිසානායක සහෝදරයා සල්ලි දීලාද? කීයක් දුන්නාද? අහලා බලන්නකෝ. එහෙම දුන්නේ නැහැ. අපේ වැඩ පිළිවෙළ හොඳයි; අපේ ප්‍රතිපත්ති හොඳයි; අප යන විධිය හොඳයි; අපේ අය වැය හොඳයි. අන්න, ඒ නිසා විපක්ෂයටත් සිද්ධ වුණා පක්ෂව ඡන්දය දෙන්න. ඒක තමයි ඇත්ත. ඒක තමයි ඊයේ වුණේත්, දිලිත් මන්ත්‍රීතුමනි. දිලිත් මන්ත්‍රීතුමා දැන් මේ ගරු සභාවේ නැහැ. සීතාවක ප්‍රාදේශීය සභාවේ වුණේත් ඒකයි. ඒක තමයි ඇත්ත කාරණය.

ඊළඟට, ගරු විපක්ෂ නායකතුමා කිව්වා, විශ්‍රාම වැටුප් කතන්දරය. ගරු විපක්ෂ නායකතුමනි, ඒකත් ඔබතුමන්ලාම 2019දී ඇති කරපු ප්‍රශ්නයක් තමයි. මොකක්ද ඒ විශ්‍රාම වැටුප් කතන්දරය? 2016-2019 කාලය තුළ එය ආරම්භ කළේ **21/2017** චක්‍රලේඛනය මඟින්. රාජ්‍ය සේවයට බඳවාගන්නා අයගේ විශ්‍රාම වැටුප අහෝසි කළා. ඒ වෙනුවට දායක විශ්‍රාම වැටුපක් ගැන කථා

කළා. ගරු අනුර දිසානායක සහෝදරයා ඉදිරිපත් කරපු මේ අය වැයෙන් අපි මොකද කළේ? දායක විශ්‍රාම වැටුප් කතන්දරය නවත්වා පෙර සේ -සුපුරුදු පරිදි- රාජ්‍ය සේවයේ නිලධාරින්ට විශ්‍රාම වැටුප සහතික කළා, අලුත් අය වැයෙන්. ඊළඟට, 2016-2019 විශ්‍රාම වැටුප් ගැටලුව. අපි ඒක විසඳනවා. ඒක 2025 අය වැයේත් සඳහන් කර තිබෙනවා නේ. අපි එය විසඳන්නේ කොහොමද? 2016 සිට 2019 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය අය 2020 විශ්‍රාම ගියා සේ සලකා ඒ වැටුපට ගළපා විශ්‍රාම වැටුප ගෙවනවා. ඒ ගැටලුව විසඳන්න කියලා අපේ විපක්ෂ නායකතුමා ඉතාම කරුණාවෙන් කිව්වා. එතුමාගේ වචනයෙන් කියනවා නම්, දයානුකම්පාවෙන්, කරුණාවෙන්, අවිහිංසාවෙන් යුතුව 2020-2024 විශ්‍රාම වැටුප් ප්‍රශ්නයත් විසඳන්න ලු. අනේ! ඔච්චර තොදොල් වෙන්න ඕනෑ නැහැ. අපි ඒක විසඳනවා. ඒ ගැන ගරු ජනාධිපතිතුමා මේ අය වැය ප්‍රකාශයෙන් මොකක්ද කියන්නේ? වැටුප් හා විශ්‍රාම වැටුප් කොමිෂන් සභාවක් පිහිටුවනවා කිව්වා. එහි නිර්දේශ අනුව අපි ඒ ගොල්ලන්ට නිවැරැදිව විශ්‍රාම වැටුප ලබා දෙනවා. ඒ කියන්නේ, 2024 විශ්‍රාම ගිය අයට 2027 විශ්‍රාම ගියා සේ සලකා විශ්‍රාම වැටුප හැදෙනවා. එහෙමයි කෙරෙන්නේ.

රාජ්‍ය සේවය ගැනත් කථා කළා. රාජ්‍ය සේවය වැඩියි, වැඩියි කියලා ඔබතුමන්ලාමයි කිව්වේ. හැබැයි, අපි මොකද කරන්නේ? අපි මේ අය වැයෙනුත් කිව්වා, රාජ්‍ය සේවය ශක්තිමත් කරනවා කියලා. අප රට ගෙන යන්නේ විද්‍යාත්මක ක්‍රමයට. අපි එක පැත්තකින් විශ්‍රාමිකයන්ට සලකනවා. ඇයි? මේ දක්වා මෙහෙම හෝ මේ රට ගෙන ආවේ ඒ ගොල්ලන් කරපු දේවල් නිසා. ඒ ගොල්ලන් යම් කැප කිරීමක් කළා. ඒ නිසා විශ්‍රාමිකයන්ට සලකන්න ඕනෑ. වර්තමානයේ රාජ්‍ය නිලධාරින් තමයි දැන් මේ රට ඇදගෙන යන්නේ. අන්න, අපි ඒ ගොල්ලන්ගේ පඩි වැඩි කළා. අපේ පළමු අය වැයෙන්ම ඒ සඳහා රුපියල් මිලියන 110,000ක් වෙන් කළා. ජනවාරි මාසයේ සිට එහි දෙවැනි කොටස ගෙවීමට මේ අය වැයෙනුත් රුපියල් මිලියන 110,000ක් -බිලියන 110ක්- වෙන් කර තිබෙනවා. ඒ වාගේම, 2027දී තුන්වන කොටස ගෙවීමට රුපියල් මිලියන 110,000ක් -බිලියන 110ක්- වැය වනවා. 2027 වර්ෂය වන කොට ඒ සඳහා වැය වන සම්පූර්ණ මුදල රුපියල් බිලියන 330ක් වනවා. දෙවන පියවරට අදාළ වැටුප් කොටස ලබන ජනවාරියේ ලැබෙනවා.

ඒ විතරක් නොවෙයි, රාජ්‍ය සේවයට අලුතින් 76,782ක් බඳවා ගන්න අවශ්‍ය අනුමැතිය ලැබී තිබෙනවා. දැන් ඒ බඳවා ගැනීම් කරනවා. හැබැයි, ගරු විපක්ෂ නායකතුමනි, අපි ඒ අය බඳවා ගන්නේ ඔබතුමා වාගේ අර ෂෝර්ට් එක ගහලා, සියඹලා ගස් යටට ඇවිල්ලා, කකුල් දෙක වන වනා "උස නම් සිකුරුටි - මිටි නම් කම්කරු" විධියට නොවෙයි. අපි හරියාකාරව අයදුම්පත් කැඳවනවා, හරියාකාරව සම්මුඛ පරීක්ෂණ පවත්වනවා, සුදුසුකම් අනුව රාජ්‍ය සේවයට බඳවා ගන්නවා. ඒ අය අතරින් වැඩි කොටස උපාධිධාරින්, ගරු විපක්ෂ නායකතුමනි. ඒ නිසා අපි ඉතාම වගකීමෙන් කියනවා, අපි ඒ ප්‍රශ්නය විසඳනවා කියලා. ඒ විතරක් නොවෙයි, විවිධ ප්‍රශ්න මත තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනමින් සිටියා 9,800ක් පමණ. ඒ සම්බන්ධයෙන් අපට විවිධ ප්‍රශ්න, ගැටලු තිබෙනවා. හැබැයි, ඒ ගොල්ලන්ගේ සේවය ස්ථිර කිරීමට මේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කළා. ඒ විතරක් නොවෙයි, විදුහල්පති දීමනා වැඩි කළා, ගුරුවරුන්ගේ දුෂ්කර දීමනා වැඩි කළා. ඒ විතරක් ද නොවෙයි, පසුගිය අය වැයෙන් වැඩි කළ රාජ්‍ය සේවකයන්ගේ ආපදා ණය අත්තිකාරම් ගෙවීම කාර්යක්ෂම කිරීමට මේ අය වැයෙනුත් රුපියල් මිලියන 10,000ක් වෙන් කළා.

ඒ විතරක් නොවෙයි, රජයේ සේවකයන්ට රුපියල් ලක්ෂ 50ක් ලෙස දෙන දේපොළ ණයේ මුල් රුපියල් ලක්ෂ 30ට රජයෙන් සියයට 4ක පොලී සහනයක් දෙනවා. ඉතිරි ලක්ෂ 20ට සියයට 2ක් දෙනවා. එහෙමයි අපි රාජ්‍ය සේවය ශක්තිමත් කරන්නේ. රට මෙතෙක් ගොඩනහපු විශ්‍රාමිකයන්ටත් අපි සලකනවා. වර්තමානයේ රට වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය සේවකයාටත් සලකනවා. ඒ විතරක් නොවෙයි, අනාගතයේ රාජ්‍ය සේවකයා සුරක්ෂිත කිරීමට හා රට සුරක්ෂිත කිරීමට අලුත් බඳවා ගැනීම් විධිමත් විධියට කරනවා. ඒක තමයි ඇත්ත. ගරු සභාපතිතුමනි,-

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
මට තව විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

මේ නන්නත්තාර වෙච්ච විපක්ෂය, කාරණා නැති විපක්ෂය, සටන් පාඨ නැති විපක්ෂය අන්වීක්ෂ දාලා එහෙට කලතලා, මෙහෙට කලතලා බලනවා මේ අය වැය ගැන මොකක්ද කියන්න තිබෙන්නේ කියලා. ඒ අයට අද කියන්න දෙයක් නැහැ. අය වැය ගැන කථා කරන්නේ නැහැ. වෙනත් මොකක්දෝ එකක් ගැන කථා කරනවා. බුදු පිළිමයක් අල්ලා ගන්නවා. දවස ගෙවා ගන්න තවත් මොනවා හෝ දෙයක් අල්ලා ගන්නවා. හැබැයි, කියන්නේ නම් අපි ජාතිවාදී නැහැ, අපි ආගම්වාදී නැහැ, අපි හරි සුන්දරයි, අපි හරි අහිංසකයි කියලා. හැබැයි, පටන් ගන්නේ ත්‍රිකුණාමලයේ සිද්ධිය ගැන කියලා. ඇත්තටම දුකයි නේද? ලජ්ජයි නේද?

බොහොම ස්තුතියි, මට අවස්ථාව ලබා දුන්නාට ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Chaminda Wijesiri. You have 12 minutes.

[පූ.භා. 11.44]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු සභාපතිතුමනි, අද විවාදයට ගන්න තිබෙන මේ වැය ශීර්ෂය ගැන කථා කරනකොට මට හිතුණා, මේ "රාජ්‍ය" කියන වචනයට එකතු කරන්න "පැලවත්ත" පරිපාලන, "පැලවත්ත" පළාත් සභා හා "පැලවත්ත" පළාත් පාලන අමාත්‍යාංශයත්, "පැලවත්ත" කම්කරු අමාත්‍යාංශයත් කියලා. මොකද, පාලනය වෙන්නේ එහෙන් නේ, නේද? අගමැතිතුමියත් කිව්වා, මේක පැලවත්තෙන් පාලනය වෙනවාය කියන කාරණය. ඒ නිසා රාජ්‍ය කියන කෑල්ල හළමු. සෑම රාජ්‍ය ආයතනයක්ම අද පැලවත්තෙන් පාලනය වෙන්නේ. මම ඒක ඔප්පු කරලා පෙන්වන්නම්. රාජ්‍ය කියන එක අයින් කරලා දැම්මාම හොඳයි නේද? ගරු ඇමතිතුමනි, අපේ මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා කිවුවේ, මහනගර සභාවත් තිබෙන්නේ පැලවත්තේ පාලනයෙන් කියලා. ඒ නිසා රාජ්‍ය කියන එක අයින් වෙනවා, අද. ඔබතුමන්ලා උත්සාහ කරන්න හදන්නේ පැලවත්තෙන් පාලනය වෙන JVP ආණ්ඩුවක් නිර්මාණය කරන්නයි, චීනයේ වාගේ. ඉතින් ඒකට ඉඩ දෙන්නේ නැහැ, මේ රටේ පුරවැසියා.

ගරු සභාපතිතුමනි, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ මම දෙයක් කියන්න ඕනෑ. ඔබතුමා හොඳට වැදගත් විධියට ස්ථාවර නියෝග අනුව හොඳට පාර්ලිමේන්තුව මෙහෙයවන නායකයෙක්. ඔබතුමා තමයි ඇත්තටම මූලසුනේ ඉන්න ඕනෑ.

[ගරු වමින්ද විජේසිරි මහතා]

ගරු සභාපතිතුමනි, බලන්න, මේ තමයි අද උදේ ගරු ඇමතිතුමා සභාගත කරපු පළාත් සභා ඡන්ද විමසීමේ සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ ලියවිල්ල. කථානායකවරයාට ලිඛිතව ඉදිරිපත් නොකර, මේ සභාවේ මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් තිබෙනවා ස්ථාවර නියෝග 28 යටතේ. ඒ කියන්නේ මේ කාරණා හැර අපි වෙනත් සෑම කාරණාවක්ම පාර්ලිමේන්තුවේ කථා කරනවා නම් , ඒ සියලු කාරණාවලට කථානායකවරයාගෙන් පෙර අනුමැතියක් ගන්න ඕනෑ, ගරු සභාපතිතුමනි. එසේ නොවී යන්න පුළුවන් විධියේ කාරණා ස්ථාවර නියෝග 28(අ) සිට (උ) දක්වා සඳහන් වෙනවා. ඒ කියන්නේ ඒවාට අවසර ගත යුතු නැහැ. ඒ අවසරය ගත යුතු නැති නිසා තමයි, මෙන්න මේ කාරණාව පිළිබඳ යෝජනාවක් ගෙන එන්න ස්ථාවර නියෝග 28(උ) යටතේ වමින්ද විජේසිරි මෙතැනදී ඉල්ලුවේ.

චණ්ඩිකම් පෙන්වන්නේ අපි නොවෙයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

සභානායකවරයෙක් අද අපට ඉන්නේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එයාට හොඳයි තියා ගන්න. ගරු සභාපතිතුමනි, එතුමා අපට චණ්ඩි කියනවා. අපි චණ්ඩින්ට චණ්ඩියි. නෝන්ජල් චණ්ඩින්ට අපි චණ්ඩි වන්නේ නැහැ. මම හැම දාම ස්ථාවර නියෝග අනුව කටයුතු කළේ. ගරු අජිත් පී. පෙරේරා මැතිතුමනි, මම හැම දාම අවස්ථාව ගන්නේ ස්ථාවර නියෝග 28 (උ) යටතේ. හැබැයි, මට අවසර දෙන්නේ නැහැ. හැබැයි, කථානායකතුමා සභානායකට මයික් එක දුන්නාම, එයා කියන ඕනෑම දෙයක් පටිගත වෙලා ඒක මාධ්‍යයට ගියාම ඒකෙන්, මාධ්‍යයෙන් අපට අපහාසයක් වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒක නවත්වන්න ඕනෑ. ඔබතුමාට බැරි නම් ඒක කථානායකතුමාට කියන්න. අපි මේ මුලසුනට කවදාවත් අගෞරව කරන්නේ නැහැ. හැබැයි, හැම දාම, නිතරම අපේ භාවිතය තිබුණේ, අපි නැඟිට්ටේ නීතිගරුකව. ඒක නීතිගරුක නොවෙනවා නම් මම කිව්වා, ඒක පැහැදිලි කර දෙන්න කියලා. එහෙමත් බැහැ ගරු කථානායකතුමාට. අපි හැම දාම කියන්නේ කථානායකතුමාට සභානායක වෙන්න කියලා. ඒ නිසා ඒ තක්කඩි වැඩේ මීන් ඉදිරියට කරන්න දෙන්න එපා ගරු සභාපතිතුමනි. මේ සමාජයේ ඔබතුමාට ලොකු පිළිගැනීමක් තිබෙනවා ඔය පුටුවේ හරි මැද වාඩි වෙලා ඉන්නවා කියලා. ඉතිහාසය පුරාම හැම කථානායකම හිටියේ තමන්ගේ පක්ෂයට හැරිලා. එහෙම තමයි වර්තමාන කථානායකත් ඉන්නේ. ඒක එහෙම නොවෙන්න ඕනෑය කියන කාරණය මේ වෙලාවේ මතක් කරනවා, ගරු සභාපතිතුමනි.

එම නිසා "පැලවත්ත" පරිපාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ඇමතිවරයා ඇත්තටම ඉල්ලා අස්වෙන්න ඕනෑ. ඔබේ ජනාධිපති ඔබ අකාර්යක්ෂම ඇමතිවරයෙක් කියලායි කිව්වේ කථාවේදී. එතුමා කිව්වා, විපක්ෂයට නොවෙයි කිව්වේ කියලා. ඒ කියන්නේ, මැතිවරණ නීති හදලා දෙන්න කියලා ආණ්ඩුවට කිව්වේ. ඇමති හැටියට අවුරුද්දක් ගිහිල්ලාත් ඔබ අසාර්ථකයි. ඔබට බැරිවෙලා තිබෙනවා, ඡන්දය තියන්න අවශ්‍ය නීති හදලා දෙන්න. ඉතින් අයින් වෙන්න ඕනෑ නැද්ද? ඔබ අයින් වෙන්න ඕනෑ නැහැ. ඔබ NPP එකෙන් දේශපාලනයට එන්නේ. ඔබ මහාචාර්යවරයෙක්. ඔබට දැන් දැනෙනවා ඇති, තේරෙනවා ඇති, ආණ්ඩුවේ ඉහළ කණ්ඩායමට ඕනෑ විධියට ඔබේ උගත්කම පාවිච්චි කරලා අද කටයුතු කරනවා කියලා. ඔබට අවශ්‍යතාව තිබෙනවා, පළාත් සභා මැතිවරණය තියන්න. ඔබ ඡන්දයට එන්න කලින් දැකපු බොහෝ දේවල් අද ඔබ දකින්නේ නැහැ, ගරු ඇමතිතුමා. ඒක තමයි දේශපාලන යථාර්ථය. ඒ නිසා මේ නියෝජ්‍ය කථානායකතුමා වාගේ මැද හිටගන්න. එතුමා කොයි පැත්තටවත් හැරෙන්නේ නැහැ. එතුමාගේ උගත්කම, දැනුම අවභාවිත කරන්න දෙන්නේ නැහැ, ඒ පාලනයට. එහෙම තමයි අපේ දේශපාලන නියෝජනය අපි හිටපු හැම තැනදීම කළේ. අදත් එහෙමයි. අපි කාටවත් කඬේ යන දේශපාලන නායකයෝ නොවෙයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අද ඉදිරිපත් කළ වාර්තාවේම තිබෙනවා, පළාත් සභා ඡන්දය පවත්වන්න පුළුවන් කියලා. ඒක කරන්නේ කොහොමද කියන කාරණයත් සඳහන් කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, පරණ ක්‍රමයටම පළාත් සභා ඡන්දය පවත්වන්න පුළුවන්. ඒ ඇයි?

> "2022 වර්ෂයේ නව වෙනි පාර්ලිමේන්තුව විසින් පත් කර තිබූ මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ සහ නීති රීතිවල ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී, පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීම පිළිබඳව සිය අදහස් දක්වමින් නීතිපතිවරයා විසින් පෙර පැවති සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට කාරක සභාව එකඟ වන්නේ නම්, 2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත මඟින් ..."

මේ මැතිවරණය පවත්වන්න පුළුවන් කියලා එතුමා කියනවා.

ගරු සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. සීමා නිර්ණය කමිටු වාර්තාව පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. නමුත්, ඒක පාර්ලිමේන්තුවේ අනුමත වෙලා නැහැ. එහෙම නම් තමුන්නාන්සේලා ඒක පාර්ලිමේන්තුවට ගේන්න. ඒක ගෙනැල්ලා ඔය 159දෙනාගෙන් සම්මත කරලා දෙන්න. එතකොට ජනාධිපතිතුමා කියයි, ඔන්න මට නීති හදලා දුන්නා කියලා. ඒකයි කියන්නේ, ඔබ අකාර්යක්ෂමයි කියලා; වැඩ බැහැ කියලා. ගරු ඇමතිතුමනි, ඔබට වැඩ බැහැ නොවෙයි, එයාලගේ නොහැකියාව, එයාලගේ පරාජය, එයාලගේ ජන මතයේ පිරිහීම අද ගරු ඇමතිතුමාගේ කර මතට වැටිලා තිබෙන්නේ. එම නිසා අද ඔබතුමා අපකීර්තිමත් ඇමතිවරයකු හැටියට පත් කරලා තිබෙන්නේ, ජනාධිපතිතුමා. අපි දන්නවා, ඔබතුමාගේ හෘදය සාක්ෂියට අනුව, පළාත් සභා ඡන්දය පවත්වන්න ඕනෑ කියලා ඔබතුමා හිතනවා ඇති. ඒක නිසා තමයි ඔබතුමා අද උදෙන්ම ඇවිල්ලා පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන ඒ වාර්තාව සභාගත කළේ. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා පෞද්ගලිකව ඉල්ලනවා, පළාත් සභා මැතිවරණය පරණ ක්‍රමයට තියන්න කියලා. නීතිපතිවරයාත් කියනවා, තියන්න පුළුවන් කියලා. එහෙම තියන්නේ කොහොමද කියන කාරණයත් ඔබතුමා මේකේ පැහැදිලි සටහන් කරලා තිබෙනවා. අපි ඒක යෝජනාවක් හැටියට ඉදිරිපත් කරනකොට,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

හැසිරෙන සභානායක අපට ඇඟිල්ල දිගු කරලා, "මේ චණ්ඩි බැඳලා තියන්න" කියලා කියනකොට, මේ පාර්ලිමේන්තුවෙන් එළියේදී ඒක අපට හොඳ නැහැ, ගරු සභාපතිතුමනි. එතුමාගේ චණ්ඩි පාට් එතුමා දමන්නේ කොහොමද කියලා අපි කියන්න අවශ්‍ය නැහැ. එතුමා මොනවාද කරන්නේ, කොහොමද ආවේ කියලා කියන්න ඕනෑ නැහැ. ගරු ඇමතිතුමනි, එම නිසා මෙන්න මේ ක්‍රමයට, ඔබතුමා අද උදේ සභාගත කළ මේ ලියවිල්ලේ

තිබෙන නීතිපතිවරයා සඳහන් කළ ක්‍රමයට ඉතා කඩිනමින් ඔබේ ජනාධිපතිතුමාට පළාත් සභා ඡන්දය පවත්වන්න පුළුවන් වැඩ පිළිවෙළ ඔබතුමා හදලා දෙයි කියන විශ්වාසය අපට තිබෙනවා.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේලාගේ වැඩ පිළිවෙළක් සම්බන්ධයෙන් අද ලියවිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා මම දැක්කා. අපි දන්නවා, ගමක හෝ කොහේ හරි කෙනෙක් රාජ්‍ය සේවයට හෝ කොහේ හරි යනකොට ග්‍රාම නිලධාරි සහතිකයක් ඉල්ලන බව. ග්‍රාම නිලධාරිතුමා තමයි ඒක සහතික කරලා දෙන්න ඕනෑ, මොහුගේ කල්ක්‍රියාව හොඳයි, එහෙම නැත්නම් මොහු මෙන්න මේවාට සම්බන්ධවෙලා තිබෙනවා කියලා. ඒක තමයි චරිත සහතිකය. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් ඒක සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපති අත්සන් කරන්න ඕනෑ. කවුද සභාපති හැටියට පත් කරලා යවන්නේ? ඔබතුමන්ලාගේ පැලවත්තේ කාර්යාලයෙන් ඔබතුමන්ලා නම් කරලා යවන JVP මෙහෙයුම් කමිටුවේ cadre එකේ නිලධාරියා අත්සන් කළොත් තමයි අපට ග්‍රාම නිලධාරි සහතිකයක් ගන්න පුළුවන් වෙන්නේ. ඒකයි මම මේ කියන්නේ, පැලවත්තෙන් තමයි පහළටම පාලනය වෙන්නේ. ග්‍රාම නිලධාරි සහතිකය ගන්න එකටත් පැලවත්තේ පරිපාලනය යොදන එක ඔබතුමන්ලාගේ දේශපාලන න්‍යාය පත්‍රයේ තිබුණු දෙයක්ද? ඒක ඔබතුමන්ලා ජන වරම ගන්නකොට ඔබතුමන්ලා කියපු දෙයක්ද? එම නිසා ඔබතුමන්ලාත් අර අසූව් ගොඩේ ලැගගෙන, ඒ අසූව් ගොඩේ තිබුණු දේවල්ම අරගෙන ඇහේ ගාගන්නවා ඇරෙන්න වෙන දෙයක් කරන්නේ නැහැ, ඇමතිතුමා. ඒකයි අපි කියන්නේ, පැලවත්ත පාලනය මේ රාජ්‍ය පරිපාලනයෙන් අයින් කරලා දාලා, ඔබතුමාගේ උගත්කම හා දැනුම අනුව ඔබතුමා හිතේ තියාගෙන ආපු විධියට මේ රාජ්‍ය පරිපාලන වැඩ පිළිවෙළ, රටේ අනාගතය වෙනුවෙන් යොදන්න අවශ්‍ය වැඩ පිළිවෙළ හදන්න කියලා. ඒකට කොන්ද කෙළින් තියාගෙන අමාත්‍යාංශය තුළ වැඩ කරන්න. අපේ සහයෝගය අපි දෙන්නම්. එහෙම නැතුව වැඩ කරන්න එපා.

මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා දැන් ඔබතුමා ළඟ වාඩිවෙලා ඉන්නවා. ඔබතුමා කිව්වා, හැමෝටම සැලකුවා කියලා. පුළුවන් නම් මේ පාර්ලිමේන්තුවේ ප්‍රධාන දොරටුවේ ඉඳලා පොල්දූව හන්දියට පයින් ගිහිල්ලා එන්නකෝ. මමත් එන්නම්, යමු. හොඳට සලකයි.

අන්න කට්ටිය ඉන්නවා. අපි දෙන්නා යමුද බලන්න? ඔබතුමා ආණ්ඩු පක්ෂයෙන් යන්න. මම විපක්ෂයෙන් යන්නම්. ඔබතුමාට යන්න බැහැ. මම ඔබතුමාට අභියෝග කරනවා. අන්න, සංවර්ධන නිලධාරින් ඇතුළු රාජ්‍ය නිලධාරින් ඇවිල්ලා ඉන්නවා. ඔබතුමන්ලා බොරු පොරොන්දු දීපු වෘත්තිකයෝ ටික ඇවිල්ලා ඉන්නවා. අද ආයතන ගණනාවක වැඩ කෙරෙන්නේ නැහැ. අපි කියලා එහෙම කරනවා නොවෙයි. හැබැයි, එදා එහෙම නොවෙයි. එදා, අය වැයක් ගෙනෙනකොට ජනතා විමුක්ති පෙරමුණේ හිටපු තුන්දෙනා ඒක මෙහෙයවලා ඇවිල්ලා, වාඩිවෙලා ඉඳලා තමයි පාර්ලිමේන්තුවේ කථා කළේ. අද, එහෙම විපක්ෂයක් නැහැ. අද ඉන්න විපක්ෂය රාජ්‍ය සේවකයින්ව මෙහෙයවලා මේ අය වැයට විරුද්ධව කථා කරවන්නේ නැහැ. ඔබතුමන්ලා විසින් කියපු දේවල් බොරුවක් කියන එක අද ඉෂ්ට සිද්ධ වෙමින් පවතිනවා.

ගරු සභාපතිතුමනි, තව කාරණයක් තිබෙනවා. එදා ඌව පළාත් සභාවේ ඉහළ නිලධාරින්ව ස්ථාන මාරුවීම් කළේ, ප්‍රධාන ලේකම්ගේ නිර්දේශයත් එක්ක ආණ්ඩුකාරවරයා. දැන්, ඌව පළාත් සභාවේ ඉහළ නිලධාරින්ගේ ස්ථාන මාරු කිරීම් සහ ඉවත් කිරීම් සිද්ධ කරන්නේ කොහොමද? කමිටුවක් දමලා. ඒ කමිටුවේ ඉන්නේ පහළ නිලධාරින්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Chaminda Wijesiri, you have only two more minutes.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ඊට අතිරේකව මට තව විනාඩි 2ක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමාට වැඩිපුර විනාඩි 3ක කාලයක් ලබා දෙන්න.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පහළ නිලධාරින් ඇතුළු කණ්ඩායම තීන්දු අරගෙන පළාත් සභාවේ ලේකම්වරුන්ගේ, අතිරේක ලේකම්වරුන්ගේ ස්ථාන මාරුවීම් සිදු කරනවා. එහෙම වෙන්න දෙන්න බැහැ, ගරු ඇමතිතුමනි. ආණ්ඩුකාරවරයා කියන්නේ ජනාධිපතිවරයාගේ නියෝජිතයා. අද, ඌව පළාත් සභාවේ විතරක් නොවෙයි, සියලු ම පළාත් සභාවල ඉන්න ආණ්ඩුකාරවරු රූකඩ බවට පත්වෙලා තිබෙනවා. පැලවත්තෙන් පත් කරන නිලධාරියා පළාත් සභාවේ නිලධාරින්ගේ ස්ථාන මාරුවීම් සිදු කරනවා නම් -පළාත් සභාවේ නිලධාරින් එහාට මෙහාට කරනවා නම්-, තමන්ගේ අභිමතය පරිදි -තමන් කැමති විධියට- පළාත් සභාව මෙහෙයවන්න හදනවා නම්, ඒකට ඉඩ දිය යුතුද? මම ඔබතුමාගේ උගත්කමෙන් අහන්නේ, ගරු ඇමතිතුමනි. ඒක සාධාරණද, එහෙම කරන්න පුළුවන්ද, ඒක ඔබතුමා අනුමත කරනවාද කියලා ඔබතුමාට තිබෙන මහාචාර්ය කියන තනතුරෙන් මම අහනවා. ආණ්ඩුවේ සිටින නිලධාරින් එහෙම කිව්වාට කමක් නැහැ. නමුත්, ඔබතුමා වාගේ NPP නායකයෙක් ඒක අනුමත කරනවාද? නම කැත කරන්න ඉඩ දෙන්න එපා. ඔබතුමා මේක නිවැරදි කරන්න. ඒක නිවැරදි කරන්න පුළුවන් වැඩ පිළිවෙළ හදන්න.

ගරු සභාපතිතුමනි, ඊළඟට පළාත් පාලන ආයතන ගැනත් කියන්න ඕනෑ. වසන්ත සමරසිංහ ඇමතිතුමා කියපු විධියට කුණු ට්‍රැක්ටර්, බවුසර් ගේනවාට නොවෙයි අපි විරුද්ධ වුණේ. මේ රටේ ජනතාව විරුද්ධ වුණේ. මේ රටේ ජනතාව ප්‍රශ්න කරන්නේ; ජන මතය ප්‍රශ්න කරන්නේ. ඔබතුමන්ලා බස් එකේ යනවා කිව්වා, ඇයි දැන් යන්න බැරි කියලා ජනතාව අහනවා. ඔබතුමන්ලා කෝච්චියේ එනවා කිව්වා, ඇයි දැන් කෝච්චියේ එන්න බැරි කියලා අහනවා. ඔබතුමන්ලා කැන්ටිමෙන් කාලා මේ වැඩේ කරනවා කිව්වා. දැන් එහෙම නොවී, ඔබතුමන්ලා කියපු; දැන් නොකරන දේ ගැන තමයි සමාජය ප්‍රශ්න කරන්නේ, ගරු ඇමතිතුමනි. පසු පෙළ මන්ත්‍රීවරුන්ට කිසිම දිරි දීමනාවක් ලැබෙන්නේ නැහැ කියලා අපි දන්නවා. දෙන එකත් පැලවත්තට යන්නේ. එදා, අපට චෝච දේ තමයි අද ඔබතුමන්ලාටත් වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාට දෙනවාට අපි විරුද්ධ නැහැ. ඔබතුමන්ලාගේ නායකයින් ජන මතය හදාගන්න, එදා හිටපු ආණ්ඩු විවේචනය කරන්න, දේශපාලන වෛරය හදන්න, දේශපාලන වේදිකා තුළ හදපු මාතෘකා අද ඔබතුමන්ලාටම පාරා වළල්ලක් විධියට ගොඩ නැඟිලා තිබෙනවා. අන්න ඒකයි වෙලා තිබෙන්නේ.

ඔබතුමන්ලා බොරු කියලා, රවට්ටලා, වෛරය හදලා, වෛරය වපුරවලා තමයි බලය ගත්තේ. තමුන්නාන්සේලාට අන්න

[ගරු චමින්ද විජේසිරි මහතා]

එතැනයි වැරදිලා තිබෙන්නේ. පළාත් පාලන ආයතනවලට දෙන්න ඕනෑ. ඒවා පුංචි ආයතන, ස්වාධීන ආයතන. ඒවා තුළ ස්වයං උත්පාදන ආදායමක් ගොඩ නඟන්න පුළුවන් වැඩ පිළිවෙළක් හදන්න. පළාත් සභාවෙන්, මධ්‍යම රජයෙන්, ඇමතිවරයාගෙන් යැපෙන්නේ නැති විධියට ඒ වැඩ පිළිවෙළ ව්‍යවස්ථානුකූලව හදලා දෙන්න, ගරු ඇමතිතුමනි. ඒවාට ආදායම එකතු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් තිබෙනවා. අතුරු ව්‍යවස්ථා සම්මත කරලා දෙන්න. ප්‍රාදේශීය සභා සීමාව තුළ, නගර සභා සීමාව තුළ ඔවුන් හොයාගත්ත ස්වයං උත්පාදන ආදායමක් තිබෙනවා. ඒ ආදායම එකතු කර ගන්න නීත්‍යනුකූලව බලය තිබෙන්නේ පළාත් සභාවට. පළාත් සභාවේ අතුරු ව්‍යවස්ථාව සම්මත නොකිරීම හරහා පළාත් සභාවට විශාල ආදායමක් එකතු වෙලා නැහැ. කවුරුත් වාහනයක් දෙනකම් ඉන්න ඕනෑ නැහැ. මම බණ්ඩාරවෙල මහ නගර සභාවේ නගරාධිපති වුණේ 2011දී, උඩුගම් බලා පීනලා. එදා, රාජපක්ෂවරු දිනනකොට රාජපක්ෂවරු අතහැරලා ගිහිල්ලා තමයි මම බණ්ඩාරවෙල මහ නගර සභාව දිනුවේ, ගරු සභාපතිතුමනි. අද බණ්ඩාරවෙල නගර සභාවේ නගරාධිපති යන brand new මොන්ටෙරෝ ජීප් රථය මම ගත්තේ සභා අරමුදලෙන්, ගරු මුජිබුර් මන්ත්‍රීතුමනි. මම බැකෝ යන්ත්‍ර දෙක ගත්තේ සභා අරමුදලෙන්. ත්‍රී රෝද රථ 4ක් ගත්තේ සභා අරමුදලෙන්. මේවා බොරු නොවෙයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා හොයලා බලන්න. පළාත් සභාව බැකෝ යන්ත්‍රයක් ගන්න මිලට වඩා අඩුවෙන් තමයි බණ්ඩාරවෙල හිටපු නගරාධිපති චමින්ද විජේසිරි ඒවා මිලදී ගත්තේ. අපි ආදායම් උත්පාදනය කරන වැඩසටහන් හැදුවා. ඒවාට අපි නීති සම්පාදනය කර ගත්තා. අපි ඒ සියල්ලම පළාත් සභාවෙන් අනුමත කරගෙන ඒ පුංචි ආණ්ඩුව ගෙනයන්න පුළුවන් ස්වයං උත්පාදන වැඩ පිළිවෙළ හැදුවා. අන්න ඒක හදන්න, ගරු ඇමතිතුමනි. ඒක හදලා දෙන්න. මධ්‍යම රජයට බරක් නොවී, පළාත් සභාවට බරක් නොවී, ඡන්ද දායකයින්ට උපතේ සිට මරණය දක්වාම සේවය සලසන ඒ ආයතනය ශක්තිමත් කරන්න පුළුවන් වැඩ පිළිවෙළ හදන්න. එතැනින් රට ගොඩ නඟන්න පුළුවන්. රට සංවර්ධනය කරන්න පුළුවන්. ඒක කවුරුත් දකින්නේ නැහැ. ඒක දකින්න බැහැ. එහෙම නොකර ඔබතුමන්ලා මොකද කරන්නේ? ඔබතුමන්ලා බලය හදාගන්න ඕනෑම තැනක එකතුවක් හදා ගන්නවා, මුදල් දීලා; වරප්‍රසාද දීලා.

ඒක, NPP එකට කැප නැහැ. ඒක, NPP එකට අකැපයි. ඔබතුමන්ලා කිව්වේ කවුරුත් එකතු කර ගන්න ඕනෑ නැහැ කියලා. සර්ව ජන බලය පක්ෂයේ මන්ත්‍රීවරයා සල්ලි දීලා වාහනයේ දාගෙන ගිහිල්ලා NPP එක බලය හදනවා කියන කොට ඔබතුමන්ලාට ඡන්දය දුන්න උදවිය මොනවා හිතයිද? තමුන්නාන්සේලා ඒක අනුමත කරනවාද? ඒක JVP එකේ ඉදිරි කාණ්ඩයට අවුලක් නැහැ. එතුමන්ලා එදාත් කළේ, අදත් කරන්නේ ඒ සුපුරුදු වැඩේ තමයි. හැබැයි, NPP එක කියා ගත්ත තමුන්නාන්සේලාට, බුද්ධිමතුන්ට; උගතුන්ට; වියතුන්ට මීට වඩා කාර්යභාරයක් තිබෙනවා. එහෙම නැත්නම්, මේ නියෝජ්‍ය කථානායකතුමාගෙන් ඉගෙන ගන්න. හෙට, අනිද්දා නියෝජ්‍ය කථානායකතුමාව අස් කරයිද දන්නේත් නැහැ. නැහැ, එතුමා ඒක හරියට කරනවා. හරියට කරන නිසා අපි හරියට කරනවා කියලා කියනවා. ගරු ඇමතිතුමාත්, ඒක කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒකටත් කැමැති නැහැ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ඒකටත් කැමැති නැහැ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔරවලා බලනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
තමුන්නාන්සේලාට ඒ ගෞරවය ලැබේවි, එළියට යද්දි. පසුගිය සැරේ වියත් මහට මොකද වුණේ? හැම දෙයක්ම අනුමත කළා. 'හායි' කිව්වා, 'හේයි' කිව්වා, අනුමත කළා. අවසානයේ මොකද වුණේ? යන්න තිබෙන, ඉන්න තිබෙන ගේ නැති වුණා. දරුවන්ගේ මුහුණ බලා ගෙන ඉන්න බැරි වුණා. දරුවෝ එක්ක ජීවත් වෙන්න බැරි වුණා. පවුලේ හැමෝම කොන් කළා. අන්න, ඒක NPP එකට වෙයි කියන කාරණය මේ වෙලාවේ මතු කරනවා.

ගරු ඇමතිතුමනි, පළාත් සභා ඡන්දය තියන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඔබතුමා සභාගත කරලා තිබෙනවා. සතියක් ඇතුළත, මාසයක් ඇතුළත නීතිපතිවරයාගේ උපදෙස් අනුව කටයුතු කරලා පළාත් සභා ඡන්දය තියන්න පුළුවන් වන වැඩ පිළිවෙළක් ඔබේ ජනාධිපතිතුමාට, ඔබේ කණ්ඩායමට කියලා දෙන්න. ඒ වැඩ පිළිවෙළ හදන්න අවශ්‍ය කරන ශක්තිය, ධෛර්යය ඔබතුමාට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නවතිනවා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. (Dr.) V.S. Radhakrishnan. You have 15 minutes.

[ந.ப. 12.00]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
கௌரவ தவிசாளர் அவர்களே, இன்றைய தினம் பொது நிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் நிதி ஒதுக்கீட்டு விவாதத்தில் சில விடயங்களைப் பேசுவதற்கான சந்தர்ப்பம் எனக்குக் கிடைத்துள்ளமையிட்டு நான் சந்தோஷமடைகின்றேன். அரசியல் இயந்திரம் என்பது வேறு, அரசாங்க இயந்திரம் என்பது வேறு. இந்த அரசாங்க இயந்திரத்தின் ஆரம்பக் கட்டமாக இருப்பது கிராம உத்தியோகத்தரின் சேவைதான். AGA, GA அதேபோன்று, பாராளுமன்றம் மற்றும் சனாதிபதி வரையான தொடர்புகளுக்கு இந்தக் கிராம உத்தியோகத்தரின் சேவை அத்தியாவசியமானதாகவும் மிக முக்கியமானதாகவும் இருக்கின்றது. அவ்வாறானதாக இருக்கின்ற இந்தக் கிராம உத்தியோகத்தர் சேவையுடன் தொடர்பான சில விடயங்களை நாங்கள் இன்று இந்தச் சபையிலே பொது நிர்வாக மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சுடன் சம்பந்தப் பட்டவர்களுக்கு எடுத்துக்கூறுவதற்கான முயற்சிகளை எடுக்கின்றோம்.

நல்லாட்சிக் காலத்தில் நுவரெலியா மாவட்டத்தில் 5 பிரதேச செயலகங்களும் 4 பிரதேச சபைகளும் புதிதாக ஆரம்பிக்கப்பட்டன. அந்த வகையில், ஆரம்பிக்கப்பட்ட பிரதேச செயலகங்களில் இரண்டு இப்பொழுது செயற்பட்டு வருகின்றது. அதிலே ஒன்றுதான் நோர்வூட் பிரதேச செயலகம். அம்பகமுவ பிரதேச சபை இரண்டாகப் பிரிக்கப்பட்டு, நோர்வூட் பிரதேச சபை உருவாக்கப்பட்டது. இந்த நோர்வூட் பிரதேச செயலகம் தொடர்பாக விசேஷமாக உங்களுக்குச் சொல்ல விரும்புகின்றேன். நுவரெலியா மாவட்டத்தின் சனத்தொகை கிட்டத்தட்ட 781,000. அதிலே நோர்வூட் பிரதேச செயலகப் பிரிவில் வாழும் மக்கள் தொகை கிட்டத்தட்ட 225,000. நோர்வூட் பிரதேச செயலகத்தின் மக்கள் செறிவு சதுர கிலோமீற்றருக்கு 510; கிராம உத்தியோகத்தர் பிரிவுகள் 35; வாக்காளர்களின் எண்ணிக்கை 104,656. இங்கு 89% தோட்டப்புற மக்கள் வாழுகின்றார்கள். இங்கு பிரதேச செயலகம் அமைக்கப்பட்டாலும், இன்னும் கட்டிட வசதிகள் முறையாக அமைக்கப்படவில்லை; போதுமான உத்தியோகத் தர்கள் இல்லை. தேவைப்படுகின்ற உத்தியோகத்தர்களின் எண்ணிக்கை கிட்டத்தட்ட 80 பேராக இருக்கின்றபோதிலும், அங்கு பணிபுரிகின்ற உத்தியோகத் தர்களின் எண்ணிக்கை 35 ஆகும். அப்படியென்றால் எப்படி அந்தக் காரியாலயம் இயங்கும்? இதை அமைச்சர் அவர்கள் கருத்திற்கொள்ள வேண்டுமென்பதை நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இந்த விஷயங்கள் தொடர்பாக கடந்த காலங்களில் பாராளுமன்றத்திலும் நுவரெலியா மாவட்ட அபிவிருத்திக் குழுவிலும் பேசப்பட்டது. ஆனாலும், இதற்கான தீர்வுகள் இதுவரைக்கும் கிடைக்கவில்லை என்பதை நான் மனவருத்தத்துடன் இந்த நேரத்தில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

அதேபோல, கிராம சேவகர் எல்லை பிரிப்பு மற்றும் அரச அபிவிருத்திப் பணிகள் தொடர்பான விஷயத்தையும் நான் சொல்ல விரும்புகின்றேன். எங்களுக்குத் தெரியும், இலங் கையில் கதிர்காமம் பகுதியில் கிட்டத்தட்ட 15,000 பேருக்கு ஒரு பிரதேச செயலகம் இருப்பது. அங்கு கிட்டத்தட்ட 12 கிராம உத்தியோகத்தர்கள் இருக்கின்றார்கள். ஆனால், நோர்வூட் பிரதேசத்தின் கெர்கஸ்வோல்ட்டில் 12,000 பேருக்கு ஒரு கிராம சேவகர்தான் இருக்கின்றார். இந்த நாட்டில் எல்லோருக்கும் எல்லாம் சமம் என்று சொல்லுகின்ற நீங்கள் இந்த விடயத்தையும் நீங்கள் கொஞ்சம் பாருங்கள்!

ගරු ඇමතිතුමනි, කතරගම පළාතේ 12,000ක් වූ ජනතාවක් සිටින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තිබෙනවා. ග්‍රාම නිලධාරින් 12දෙනෙක් ඉන්නවා. නුවරඑළිය, නෝර්වුඩ් ප්‍රදේශයේ එක Grama Niladhari Division එකක ජනතාව 12,000ක් ඉන්නවා. මේක අසාධාරණයක්. ඒ, කර්කස්වොල්ඩ් ග්‍රාම නිලධාරි වසමේ. පොඩ්ඩක් මේක ලියා ගන්න. ඔබතුමා මේක පිළිවෙළක් කරන්න. එම නිසා තමයි පසුගිය දවස්වල අපි fight කරලා ඒක බෙදන්න කිව්වේ. ඒක බෙදලා දුන්නාට වැඩක් නැහැ, ග්‍රාම නිලධාරින් වැඩි කළේ නැත්නම්. ග්‍රාම නිලධාරින් වැඩි කළේ නැත්නම් අස්වැසුම හම්බ වෙන්නේ නැහැ, ඒ certificates හම්බ වෙන්නේ නැහැ. සියලු දේටම අපට යන්න වෙන්නේ ග්‍රාම නිලධාරියා ළඟට. නමුත්, ග්‍රාම නිලධාරින්ට මේක කරන්න බැහැ. මොකද, Grama Niladhari Divisionsවලට 80ක් ඉන්න ඕනෑ තැන අපට ඉන්නේ 35යි. ඔබතුමා මේකට මැදිහත් වෙලා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට තිබෙන්නේ තලවාකැලේ. අපි පසුගිය දවස්වල තලවාකැලේ බෙදලා දුන්නා. බෙදලා දුන්නාට වැඩක් නැහැ. ඒ කොට්ඨාසයේ හරියට වැඩ කරන්න බිල්ඩින් නැහැ. එහි Grama Niladhari Divisions 34ක් තිබෙනවා. ජනතාව 104,656ක් ඉන්නවා. ග්‍රාම නිලධාරින් 34යි ඉන්නේ. ග්‍රාම නිලධාරින් 80ක් ඕනෑ.

அரசாங்கத் துறையிலே முகாமைத்துவ உதவியாளர்களின் பங்கு மிகவும் அத்தியாவசியமானது. இவர்களுடைய சம்பளம் MN-02 அளவுத்திட்டத்தின்கீழ் கொடுக்கப்படுகின்றது. ஆகவே, அவர்களுடைய சம்பளத்தை அதிகரிப்பதற்கான நடவடிக்கை யையும் எடுக்க வேண்டும் என்பதை நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். அதேபோல, இப்பொழுது அதிகமான பட்டதாரிகள் இந்த நாட்டிலே வேலையில்லாமல் இருக்கிறார்கள். இவர்களுக்கு Management Assistantஆக, கிராம உத்தியோகத்தர்களாக நியமனங்களைக் கொடுத்து, எங்களுடைய மக்களின் தேவைகளைப் பூர்த்தி செய்வதற்கான நடவடிக்கை எடுக்கப்பட வேண்டும் என்பதை நான் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், வலப்பனையிலே 2 பிரதேச செயலகங்களை உருவாக்க வேண்டும் என்று நாங்கள் நல்லாட்சிக் காலத்திலே தீர்மானித்திருந்தோம். அதிலே ஒன்று வலப்பனைப் பகுதியிலே இருக்கின்ற ராகலையை மையப்படுத்தியதாக இருக்க வேண்டும்; பெரும்பாலும் தோட்டப் பகுதிகளை உள்ளடக்கி யிருக்கின்ற அந்தப் பகுதிக்கு ஒரு பிரதேச செயலகம் கொடுக்கப்பட வேண்டும் என்று நாங்கள் அந்த நேரத்தில் தீர்மானித்தோம். ஆனால், இதுவரைக்கும் அது நடைமுறைக்கு வரவில்லை. அதிலே சில சில பிரச்சினைகள் இருக்கின்றன. அந்தப் பிரதேச சபையை வேறு பிரிவுக்குக் கொண்டு செல்வதற்கான நடவடிக்கை எடுக்கப்படுவதாக நாங்கள் அறிகின்றோம்.

அதேபோல, கொத்மலை பிரதேச சபையைப் பூண்டுலோயாவில் அமைக்க வேண்டும் என்றும் ஹங்குரன் கெத்தையிலே கரந்தகொல்ல என்ற இடத்திலும் பிரதேச சபையை அமைக்க வேண்டும் என்றும் நாங்கள் சொல்லியிருக் கின்றோம். ஆனால், இதையெல்லாம் செய்வதற்கு அங்கிருந்த அரசியல் பிரமுகர்கள் நடவடிக்கை எடுக்கவில்லை. ஏனென்றால், இந்தப் பகுதிகள் யாவும் தோட்டப்புறங்களுக்குச் செல்லக்கூடாது என்பதிலே அவர்கள் மிகவும் அக்கறையாக இருந்திருக்கிறார்கள். ஆனால், இந்த அரசாங்கம் தமிழ், சிங்கள, முஸ்லிம் என்ற எவ்விதமான வேறுபாடும் பாராது மக்களுக்காகச் செயற்பட வேண்டும் என்ற எண்ணத்திலே இருக்கின்ற காரணத்தினால், இதையும் நீங்கள் கருத்திற் கொண்டு செயற்பட வேண்டும் என்பதை நான் தெரிவித்துக் கொள்கின்றேன்.

வலப்பனை பிரதேச சபையின் அதிகார எல்லைக்குள் கிட்டத்தட்ட 120,000 பேர் இருக்கின்றார்கள்; அங்கு ஒரேயொரு பிரதேச செயலகம்தான் இயங்கி வருகின்றது. ஹங்குரன்கெத்தையிலே 98,000 பேர் இருக்கின்றார்கள்; அங்கும் ஒரு பிரதேச செயலகம்தான் இயங்கி வருகின்றது. கொத்மலை பிரதேசத்திலே 105,000 பேர் இருக்கின்றார்கள்; இதுவும் ஒரு பிரதேச செயலகத்துடன்தான் இயங்கி வருகின்றது. ஆகவே, இந்தப் பிரதேச செயலகங்களுக்கு மக்கள் போய் வருகின்றபோது, அதிக தூரம், அவர்களுடைய நேரம் வீணடிக்கப்படுதல் போன்ற பல்வேறு சிக்கல்கள் இருக்கின்ற காரணத்தினால், நீங்கள் மேற்கூறப்பட்ட இடங்களில் புதிய பிரதேச செயலகங்களை உருவாக்கிக் கொடுக்க வேண்டும் என்பதை நான் உங்களிடம் அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோல, தேசிய நீரோட்டத்திலே பெருந்தோட்ட மக்கள் இணைந்துகொள்ளும் வகையில் நீங்கள் செயற்பட வேண்டும் என்பதைத் தெரிவித்துக் கொள்கின்றோம். உதாரணமாக, இன்று பெருந்தோட்டத்தில் இருக்கின்ற மக்கள் தங்களுடைய ஏதாவது தேவைகளை நிறைவேற்றிக்கொள்ள வேண்டுமாக

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

இருந்தால், கிராம உத்தியோகத்தரிடம் செல்ல வேண்டும். கிராம உத்தியோகத்தரிடம் செல்லும்போது அவர் சொல்கிறார், "நீங்கள் இருக்கின்ற பகுதியிலுள்ள தோட்டத் துரையிடம் ஒரு காகிதம் வாங்கி வாருங்கள்" என்று. அதுபோல், தோட்டத்திலே உள்ளவர்கள் மின்சாரப் பட்டியலில் பெயர் மாற்றப்பட வேண்டுமாகவிருந்தால்கூட தோட்டத்துரையின் காகிதம் வேண்டும்; காணிப் பிரச்சினை என்றாலும் தோட்டத்துரையின் காகிதம் வேண்டும். இவ்வாறான தேவைகளுக்காகத் தோட்டத்துரையிடம் போகும்போது, அவர் தனக்குத் தேவையானவர்களுக்குக் கடிதம் கொடுப்பார், தனக்குத் தேவையில்லாதவர்களுக்குக் கொடுக்க மாட்டார். வெள்ளைக்காரன் காலத்திலிருந்து இந்தக் காலம் வரைக்கும் அந்தத் 'தோட்டத்துரை' என்ற பதம் இருப்பதை நாங்கள் விரும்பவில்லை. நாங்களும் மற்றைய மக்களைப்போல் தேசிய நீரோட்டத்திலே இணைந்திருக்க வேண்டும் என்று விரும்புகின்றோம். ஆகவே, இதனைத் தவிர்த்து, கிராம உத்தியோகத்தர் ஊடாக, பிரதேச செயலக அடிப்படையிலே இந்தச் செயற்பாடுகளைச் செய்யக்கூடிய நடைமுறையைக் கொண்டுவருவதற்கு நடவடிக்கை எடுக்கப்பட வேண்டுமென்பது என்னுடைய கருத்தாக இருக்கின்றது. விசேஷமாக, இது தொடர்பில் CEBக்குச் - Ceylon Electricity Board - சுற்றுநிருபமொன்றை அனுப்ப வேண்டும். இலங்கையிலே ஏனைய மக்களுக்கு வழங்கப்படுகின்ற சலுகைகள் தோட்டப்புற மக்களுக்கும் கிடைக்க வேண்டும். அவர்கள் போய் துரைமாரிடம் தலையைச் சொறிந்துகொண்டு நிற்க வேண்டிய அவசியம் இருக்கக் கூடாது என்பதை நான் இந்த நேரத்திலே சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

இன்று நுவரெலியா மாவட்டத்திலே மாநகர சபை, 2 நகர சபைகள் மற்றும் பிரதேச சபைகள் என்ற வகையில் கிட்டத்தட்ட 14 உள்ளூராட்சிச் சபைகள் இருக்கின்றன. ஆனால், நுவரெலியா மாநகர சபையில் மட்டும்தான் தீயணைப்புப் படைப் பிரிவு இருக்கின்றது. 181,000 மக்கள் வசிக்கின்ற பல நகரங்களைக் கொண்ட அந்தப் பகுதியிலே எங்காவது ஒரு தீ விபத்து ஏற்பட்டால் உடனடியாக அந்தத் தீயை அணைப்பதற்கான நடவடிக்கையை எடுக்க முடியாது. காரணம், அங்குள்ள நகர சபைகளுக்கோ, பிரதேச சபைகளுக்கோ தீயணைப்பு இயந்திர வசதி கிடையாது. அதன் காரணமாகத்தான் அங்குள்ள பல தோட்டங்கள் முழுமையாகத் தீயிலே எரிந்து நாசமாகின்றன. ஆகவே, இதனைக் கருத்திற்கொண்டு தீயணைப்பு இயந்திரங்களைப் பிரதேச சபைகளுக்குக் கொடுக்க வேண்டும் என்பதைச் சொல்லிக் கொள்ள விரும்புகின்றோம்.

அதேபோல, அம்பகமுவ பிரதேச சபையில் சம்பளம் வழங்குவது சம்பந்தமான ஒரு பிரச்சினை இருக்கின்றது. அம்பகமுவ பிரதேச சபையானது மூன்றாகப் பிரிக்கப்பட்ட பின்பு, 16 காரியாலய உத்தியோகத்தர்கள் நோர்வூட்டுக்கும், 14 காரியால உத்தியோகத்தர்கள் மஸ்கெலியாவுக்கும் அனுப்பப் பட்டுள்ளனர். அரசாங்கத்தின் தற்போதைய கொள்கையின்படி, அந்த ஊழியர்களின் 20 சதவீதச் சம்பளச் செலவைச் குறித்த சபையே தாங்கிக்கொள்ள வேண்டும் என்று சொல்லப் பட்டுள்ளதால், ஒவ்வொரு மாதமும் அம்பகமுவ பிரதேச சபையானது 3½ இலட்சம் ரூபாயைச் செலுத்த வேண்டி யுள்ளது. ஆகவே, இதற்கான ஒரு தீர்வினை அரசாங்கம் பெற்றுத்தர வேண்டுமென்று கேட்டுக் கொள்கின்றோம்.

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මේක තේරෙනවාද කියලා මම දන්නේ නැහැ. අඹගමුව ප්‍රාදේශීය සභාව කලින් තිබුණේ, "අඹගමුව ප්‍රාදේශීය සභාව" කියලා එක ප්‍රාදේශීය සභාවක් විධියට. ඊට පස්සේ ඒක තුනට බෙදුවා. ඒ, මස්කෙළිය, නෝර්වුඩ්, අඹගමුව කියලා. ඒ වාගේම එතැන හිටපු staff එකත් බෙදා තිබෙනවා, නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවටයි, මස්කෙළිය ප්‍රාදේශීය සභාවටයි. නමුත් පඩි ගෙවන්නේ තවම අඹගමුව ප්‍රාදේශීය සභාවෙන්. ඔබතුමන්ලා චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා, අඹගමුව ප්‍රාදේශීය සභාවට වැටුප් ප්‍රතිපූරණය කරන්න පුළුවන් සියයට 20යි කියලා. ඉතිරි වැටුප් ඔක්කෝම ඒගොල්ලෝ ගෙවන්නේ. එතකොට අර ප්‍රාදේශීය සභාවල වැඩ කරන මිනිස්සුන්ට මේ ප්‍රාදේශීය සභාවෙන් තමයි වැටුප් ගෙවන්නේ; මුදල් ගෙවන්නේ. ඉතින් මේක අසාධාරණයක්. මේකට තීන්දුවක් දෙන්න.

ඊළඟට තිබෙන්නේ පළාත් සභා මැතිවරණය ගැන කියන්න. පළාත් සභා කිව්වාම, විශේෂයෙන්ම උතුර, නැඟෙනහිර ජනතාවට විතරක් නොවෙයි, සියලු ජනතාවට පළාත් සභා ඕනෑ වෙනවා. මොකද, මම තුන් පාරක් පළාත් සභාවේ ඇමති කෙනෙක් වෙලා හිටියා. මම හිතනවා, පාර්ලිමේන්තුවේ කටයුතු කළාට වැඩි කාලයක් මම පළාත් සභාවේ කටයුතු කළා කියලා. එහිදී ජනතාව කිට්ටුවෙන් ආශ්‍රය කරලා ඔවුන්ට වැඩ කරන්න අවස්ථාව තිබුණා. පළාත් සභා අත්‍යවශ්‍යයි. ඒ නිසා පළාත් සභා මැතිවරණය තියන්න. අපේ චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කිව්ව පරිදි මොනවා හරි අඩුපාඩු තිබෙනවා නම්, කාන්තා නියෝජනය ඕනෑ නම් ඒකට සංශෝධනයක් ගේන්න. සංශෝධන ගෙනැල්ලා පරණ ක්‍රමයට පළාත් සභා මැතිවරණය තියන්න කටයුතු කරන්න. එච්චරයි අපට ඕනෑ වෙන්නේ.

උතුර, නැඟෙනහිරට බලය බෙදිලා තිබෙනවා කිව්වා. කවදාවත් එහෙම බෙදිලා නැහැ. ඒකට පොඩි අවස්ථාවක් තිබුණා, පළාත් සභාව තුළ. පළාත් සභා ක්‍රමයත් දැන් නැති වෙලා තිබෙනවා. අනෙක් පළාත්වල සිංහල ජනතාවට බලය බෙදීම ඕනෑ. ඒ ජනතාවටත් ඒක නැහැ. ඒක නිසා කරුණාකරලා පුළුවන් ඉක්මනින් මේ රටේ පළාත් සභා මැතිවරණය තියන්න. කවුරු දිනුවත් කමක් නැහැ. අපට පළාත් සභාවේ වැඩ කරන්න ඕනෑ. එච්චරයි අපට ඕනෑ වෙන්නේ.

ஆகவே, இந்த நாட்டிலே மாகாண சபைத் தேர்தலை நடத்த வேண்டும். மாகாண சபைகள் மூலமாக மக்களுக்கு அதிக வேலைகளைச் செய்யலாம். விசேஷமாக, கல்வி, சுகாதாரம், கமத்தொழில், போக்குவரத்துப் பாதைகள் உட்படப் பல்வேறு விடயங்களில் மக்களுக்குத் தேவையானவற்றைச் செய்வதற்கு ஒரு கருவியாக இருந்ததுதான் இந்த மாகாண சபை முறைமை. அதனால், மாகாண சபைத் தேர்தலை நடாத்த வேண்டும் என்று மீண்டும் கேட்டுக்கொண்டு, ஒரு சிறிய கதை ஒன்றைக் கூறி எனது பேச்சை நிறைவு செய்யலாம் என்று நினைக்கின்றேன்.

ගරු සභාපතිතුමනි, මම උදාහරණයක් කියන්නම්. ගමේ හොඳ තෙල් මුදලාලි කෙනෙක් හිටියා ලු. ඒ තෙල් මුදලාලි හොඳට තෙල් විකුණනවා ලු, ඔහුගේ කඩේ. නමුත් ඒ මුදලාලි විකුණන්නේ ඔක්කෝම බාල තෙල්; කලවම් කරලා තමයි විකුණන්නේ. ඒ මුදලාලි ඒවා විකුණලා, විකුණලා අන්තිමේ ඔහුට අංශභාගේ හැදිලා ඔහු මිය යන අවස්ථාවේදී පුතාට කථා කරලා advise කළා ලු, "පුතා, මම මෙච්චර දවසක් කලවම් කරලා තමයි තෙල් විකුණුවේ. බාල් තෙල් විකුණුවේ. ඔයා මෙහෙම කරන්න එපා. මීට පස්සේ හොඳ තෙල් විකුණන්න. එතකොට ඔයාට මේ වාගේ සිද්ධියක් වෙන්නේ නැහැ" කියලා. ඔහු මිය ගියාට පස්සේ පහුවදා ඉඳලා ඔහුගේ පුතා කලවම් කරන්නේ නැතුව හොඳ තෙල් විකුණුවා ලු. නමුත් පාරිභෝගිකයා ඇවිල්ලා කිව්වා ලු, "ඔයා මොකද බාල තෙල් විකුණන්නේ? ඔයාගේ තාත්තා හොඳ තෙල් විකුණුවා. තාත්තා මෙච්චර දවසක් අපට හොඳ තෙල් දුන්නා, ඔයා බාල තෙල් විකුණනවා නේ" කියලා.

ගරු ඇමතිතුමනි, 'හොඳයි' කියලා ඔයගොල්ලෝ කොච්චර කිව්වත්, ඒක මිනිස්සු පිළිගන්න ඕනෑ. මෙතැන තිබෙන ප්‍රශ්නය මිනිස්සු පිළිගන්නේ නැති එක. මිනිස්සු පිළිගන්නකම් ඒවා market කරන්න බැහැ. මිනිස්සු පිළිගන්න නම් අපි හොඳ අදහසක් කියන්න ඕනෑ, අපි හොඳ කරුණක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒකයි අදහස. ඒක නිසා කරුණාකරලා ඔබතුමන්ලා කරන වැඩ market කරන්න. ඔබතුමන්ලා කරන වැඩ market කරලා නැහැ. ඒ නිසා market කරලා මේක කරන්න බලන්න. එච්චරයි අපට ඕනෑ වන්නේ. වැඩිපුර කථා කරන්න වුවමනාවක් නැහැ, ගිය සුමානේ ඔක්කෝම දිගටම කථා කළේ වතුකරයේ කම්කරුවන්ගේ පඩි ගැන. මම හිතන විධියට, මේ සුමානේ ඒක මාරු වුණා, Trincomalee සිද්ධියට. ඒක නිසා මේ සුමානේ ඒක ගැන කථා කරන්නේ නැහැ. ලබන සුමානේ මොනවා හරි subject එකක් හදමු.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Radhakrishnan, your time is up.

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)
හොඳයි, thank you very much.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Hon. Chairman, -

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Dayasiri Jayasekara?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමාත් සභාවේ ඉන්න මේ වෙලාවේ පොඩි පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Are you raising a point of Order?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාටත් මේ ගැන කිව්වා. ගරු ඇමතිතුමනි, 2020-2024 කාලය තුළ විශ්‍රාම ගිය අය තවමත් පාර දිගේ ඉන්නවා. පළමුවෙනි කාරණය වශයෙන් මම ඔබතුමාගෙන් අහන්න කැමතියි, ඒ සම්බන්ධයෙන් වන වැඩ පිළිවෙළක් මේ Budget එක තුළ තිබෙනවාද කියලා.

දෙවැනි කාරණය මේකයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Dayasiri Jayasekara, that is not a point of Order.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න, ගරු සභාපතිතුමනි.

කළමනාකරණ සහකාරවරුන්ගේ පුරප්පාඩු 5,000කට වඩා තිබෙනවා. සීමිත තරග විභාගයකින් තෝරා ගත් අය සම්බන්ධයෙන් ඔබතුමන්ලා යම්කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවාද? මොකද, එහි විශාල අර්බුදයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Minister, you can answer it during the Debate. Shall we proceed, Hon. Minister, since we have two more speakers before lunch?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු සභාපතිතුමනි, ඒ ප්‍රශ්න දෙකටම මම උත්තර දීලා තිබෙනවා. ඒ ගැන නැවතත් මතක් කරනවා නම්, විශ්‍රාමිකයන්ට අදාළ ගැටලු විසඳීම සඳහා මේ වනවිට අවශ්‍ය කටයුතු අපි කරගෙන යනවා. ඒ වාගේම ඔබතුමා සඳහන් කරපු කළමනාකරණ සේවයට අදාළ ක්‍රියාවලියේ කොටසක් අපි සම්පූර්ණ කර තිබෙනවා. ඉතුරු කොටසට අදාළ සාකච්ඡාවක් මේ වෙනකොට සිදු වෙමින් තිබෙනවා. අපේ උත්සාහය ඒ ප්‍රශ්න විසඳන්න තමයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Next, the Hon. Upali Samarasinghe. You have two minutes.

[අ.භා. 12.17]

**ගරු උපාලි සමරසිංහ මහතා (සමුපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ - கூட்டுறவு அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Upali Samarasingha - Deputy Minister of Co-operative Development)
ගරු සභාපතිතුමනි, මා අදහස් දක්වන මෙම අවස්ථාවේදී විෂයභාර ඇමතිතුමා සිටීමත් විශේෂ කාරණයක්. ඇත්තටම ගත්තොත්, 2026 අය වැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා. මම නියෝජනය කරන්නේ, වන්නි දිස්ත්‍රික්කය.

ගරු සභාපතිතුමනි, දශක ගණනක් තිස්සේ උතුරු පළාතේ පැවතුණේ අවාසනාවන්ත තත්ත්වයක් බව අපි දන්නවා. ඒ නිසා යුද්ධයෙන් පසුව පැවති ආණ්ඩු උතුරු පළාතට කළ සංවර්ධන කටයුතුවලදී, යටිතල පහසුකම් සැපයීම්වලදී සිදු වූ අඩුපාඩුකම් විශාල වශයෙන් තවම තිබෙනවා. ඒ පිළිබඳව මම ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවනවා. උතුරු පළාතේ තිබෙන නගර සභාවලට වාගේම පළාත් පාලන ආයතනවලට අත්‍යවශ්‍ය යන්ත්‍ර සූත්‍රවල ලොකු අඩුපාඩුවක් තිබෙනවා. ඒ වාගේම අදාළ සියලු අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේත් පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ගැන වැඩි අවධානයක් යොමු කරන ලෙස ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

[ගරු උපාලි සමරසිංහ මහතා]

පැරණිම දිසාපති කාර්යාල -කච්චේරි- ගත්තොත්, ලංකාවේම තිබෙන්නේ දෙකයි. එකක් අනුරාධපුරයේ තිබෙන්නේ. අනෙක වවුනියාවේ තිබෙන්නේ. වවුනියාව දිසාපති කාර්යාලය අවුරුදු 80ක් විතර පරණ එකක්. ඉංග්‍රීසින්ගේ ආණ්ඩු කාලයේ තමයි ඒක හදලා තිබෙන්නේ. මේ වනවිට ඇත්තටම එම කාර්යාලයත්, එම කාර්යාලයේ සේවා සැපයීමත් ඉතා බරපතළ තත්ත්වයකට පත්ව තිබෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, ඇමතිතුමාගේ මැදිහත් වීමෙන් ඒ දිස්ත්‍රික් කාර්යාලය සම්බන්ධව වඩා ක්‍රමවත්, ඉක්මන් සැලැස්මක් ලබා දෙන්න කියලා.

අවසාන වශයෙන් මම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. මීට කලින් කථා කරපු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමෙක් අපේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා ගැන අදහස් ටිකක් දැක්වූවා. එතුමා මෑත කාලයේ ආපු උගතෙක්, බුද්ධිමතෙක්; එතුමා පැලවත්තට ඕනෑ විධියට වැඩ කරනවා, හැසිරෙනවා කියලා යම් විග්‍රහයක් කළා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Deputy Minister, your time is up; the two minutes has passed.

**ගරු උපාලි සමරසිංහ මහතා**
(மாண்புமிகு உபாலி சமரசிங்ஹ)
(The Hon. Upali Samarasingha)
මට තත්පරයක් දෙන්න, ගරු සභාපතිතුමනි.

චන්දන අබයරත්න ඇමතිතුමා කියන්නේ, අපේ දේශපාලන ව්‍යාපාරය තුළ 1994 අවුරුද්දේ සිට වැඩ කරන මහත්මයෙක්. පක්ෂයේ ජයග්‍රහණය වෙනුවෙන් වැඩ කළ මහත්මයෙක්. ඒ නිසා ඔබතුමන්ලා හිතන තත්ත්වයක් නොවෙයි ඇත්තටම එතුමාට තිබෙන්නේ. ස්තුතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Yes, Hon. Minister?

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු සභාපතිතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළා වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ ප්‍රශ්නයක්. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගෙන එය ඉදිරිපත් කළොත් ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය කරන කටයුතු සලසා දෙන්න පුළුවන්කම තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. Chandana Sooriyaarachchi, please. You have 19 minutes. I am sorry, you have nine minutes.

[අ.භා. 12.20]

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු සභාපතිතුමනි. මම සන්තෝෂ වුණා, මුලින් කියපු වේලාව ඇහුණාට පසුව.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳව අද දිනයේ විවාදය ආරම්භ කර තිබෙනවා. මම සතුටු වෙනවා, ජාතික ජන බලවේගයේ ආණ්ඩුව -මාලිමා රජය- මේ රටේ වැඩ කරන සමස්ත ජනතාව වෙනුවෙනුත්, රාජ්‍ය සේවයේ දිශානතිය නවීන දියුණු ලෝකයක් කරා ගමන් කරන්න පුළුවන් වන ආකාරයට ගොඩනැඟීමේ අරමුණ සහිතවත් ඉදිරිපත් කරපු මේ අය වැය සම්බන්ධයෙන් අපේ රටේ වැඩ කරන ජනතාව නියෝජනය කරමිනුත්, ඒ වාගේම වෘත්තීය සමිති ව්‍යාපාරයේ නියැළුණු සහ නියැළෙමින් සිටින කෙනෙකු විධියටත් මේ විවාදයට සහභාගි වෙන්න ලැබීම පිළිබඳව.

ගරු සභාපතිතුමනි, ඊට පෙර මම යම් කාරණයක් කියන්න කැමතියි. මේ ගරු සභාවේ ඊයේ සිට වරින්වර සාකච්ඡා වුණා, සීතාවක ප්‍රාදේශීය සභාවේ බලය පිහිටුවීම පිළිබඳව. මම අවිස්සාවේල්ල ආසනයේ සංවිධායකවරයා විධියට කටයුතු කරනවා. 1977න් පසුව එම්.ඩී. ප්‍රේමරත්න මහත්මයා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් අවිස්සාවේල්ල ආසනයෙන් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. ඊට අවුරුදු 47කට පසුව තමයි ජාතික ජන බලවේගය නියෝජනය කරමින් ඒ ඓතිහාසික සීතාවක ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ.

පසුගිය මැයි මාසයේ 06වැනි දා පැවතුණු පළාත් පාලන මැතිවරණයේදී ඒ ඓතිහාසික සීතාවක ජනතාව මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයන්න සීතාවක ප්‍රාදේශීය සභාවේ බහුතර බලය ජාතික ජන බලවේගයට ලබා දුන්නා. ඒ අනුව කොට්ඨාස 26න්, 23ක් ජාතික ජන බලවේගයට දිනා දුන්නා. වෙන වෙනම තරග කරපු ස්වාධීන අයට 3ක්, පොහොට්ටුවට 7ක්, සර්වජනයට 2ක්, ජාතික නිදහස් පෙරමුණට 1ක්, එජාපයට 2ක් යනාදී වශයෙන් තමයි මන්ත්‍රී ධුරවලට පත් වුණේ. නමුත් විපක්ෂයේ ඇතැම් අයගේ නොමනා ක්‍රියාකාරකම් නිසා සෑම අවස්ථාවකදීම ඒ අවශ්‍ය කරන සභා පිහිටුවීම කරන්න බැරි වුණා. නමුත් ඊයේ දවසේ හෘදය සාක්ෂියට එකඟව තවදුරටත් ඒ මහජනතාවගේ ජන වරම මේ ආකාරයෙන් ගැටලු සහගත වෙන තත්ත්වය වළක්වන්න ඒ සභාවේ ඇතැම් මන්ත්‍රීවරු සභාව පිහිටුවීම සඳහා වන තමන්ගේ නියෝජනය ඉදිරිපත් කරලා තිබෙනවා. අද ඒවා වැරදි විධියට අර්ථ කථනය කරමින් තිබෙනවා. මේ රටේ නීතිය අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනතා මතයට හිස නමා සීතාවක ප්‍රාදේශීය සභාවේ බලය ඊයේ දවසේ ජාතික ජන බලවේගයට තහවුරු කර ලබා දීම වෙනුවෙනුත්, ඒ ජන වරම ශක්තිමත් කිරීම වෙනුවෙනුත් ඒ සියලු දෙනාට අපි සුබ පතනවා.

ගරු සභාපතිතුමනි, අද දවසේ මගේ අවධානය රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන්න කැමතියි. අපේ රටේ රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න, කළමනාකරණය කරන්න, රාජ්‍ය සේවය සුමටව පවත්වා ගෙන යන්න අවශ්‍ය කරන ආයතනයක් තමයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව. ස්වාධීන කොමිෂන් සභාවක් විධියට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට විශේෂ කාර්යභාරයක් පැවරී තිබෙනවා. හැබැයි, මෑත කාලයේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව යම් ආන්දෝලනාත්මක තීන්දු තීරණ කිහිපයක් අරගෙන තිබෙන බව අපි දකිනවා.

ඒ අතුරින් ගනු ලැබූ එක තීරණයක් තමයි මෙන්න මේක. දැනට අපේ රටේ රාජ්‍ය සේවයේ ඉන්න සියලුම සේවා නියෝජනය කරන අය තමන්ගේ ශ්‍රේණි උසස්වීම සඳහා ඉදිරිපත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාග තිබෙනවා. ඒ විභාග සඳහා ඉතිහාසයේ සිට මෙතෙක් තිබුණේ අපේ රටේ සම්මත, අනුමත සාමාන්‍ය විභාගවල අවම පරිසාධනීය සමත් වීමේ ලකුණු මට්ටම වන ලකුණු 40යි. අන්න ඒ ලකුණු 40 වෙනස් කරලා දැන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණයක් අරගෙන තිබෙනවා, මෙතැනින් එහාට EB Exam එක ලියන අයට සමත් වීමේ අවම පරිසාධන ලකුණු මට්ටම ලකුණු 50ක් කියලා. මේ තත්ත්වය තුළ රාජ්‍ය සේවයේ යම් ව්‍යාකූලත්වයක් ඇති වෙලා තිබෙනවා.

ඒ වාගේම මෙතෙක් ශ්‍රේණි උසස්වීමට අදාළව වාර හයක් EB Exam එකට ඉදිරිපත් වෙන්න අවස්ථාව තිබුණා. අද වනකොට ඒක වාර තුනට අඩු කිරීම සම්බන්ධයෙන් විවිධ තීන්දු තීරණ අරගෙන තිබෙනවා. ඒ ගැන මේ උත්තරීතර සභාවේ අවධානය යොමු කරවන්න මම කැමතියි. අපට අවශ්‍ය වන්නේ රාජ්‍ය සේවය සුමටව, ව්‍යාකූලත්වයෙන් තොරව සහ ගැටුම්කාරී තත්ත්වයෙන් තොරව පවත්වාගෙන යන්නයි. රාජ්‍ය සේවය තුළ විවිධ ගැටුම් නිර්මාණය වෙන ආකාරයේ ආන්දෝලනාත්මක තීන්දු තීරණ ගැනීමට පෙර අඩුම ගණනේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා, ඒ අදාළ ගරු අමාත්‍යවරයා ඇතුළු විෂය භාර නිලධාරින්ගේ හා අමාත්‍යවරුන්ගේ අවධානයවත් යොමු කරලාද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව එවැනි තීන්දු තීරණ ගත්තේ?

පසුගිය 13වැනි දින පැවති රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අපි මේ පිළිබඳව අවධානය යොමු කළා. ඒ වාගේම සභාපතිතුමා විසින් ලේකම්තුමාට පැහැදිලි කළා, මේ පිළිබඳ අවශ්‍ය මැදිහත්වීම් කරන්න කියලා. ඒ නිසා අපි ඉතාම පැහැදිලිව කියනවා වාගේම ඒ ආයතනවලිනුත් ඉල්ලා සිටිනවා, මේ රටේ රාජ්‍ය සේවකයන් හා වෘත්තීය සමිති අතර ගැටුම් නිර්මාණය නොවන ආකාරයටත්, භුක්ති විඳි අයිතිවාසිකම් කප්පාදු නොවන ආකාරයටත් ඒ කටයුත්ත කරන්න කියලා. මේ තිබෙන තත්ත්වය තුළ අද රාජ්‍ය සේවකයා අවුරුද්ද පුරාම තමන්ගේ EB Exam එක සමත් වීම පිළිබඳ ගැටලුවක, පීඩාවක ඉන්න බව අපි දන්නවා. ඒ අතරේ මේකත් එක්ක සමාන්තර උපකාරක පන්ති ක්‍රියාවලිය ඇතුළේ අද වනකොට රාජ්‍ය සේවකයා අසරණ කර තිබෙනවා. ඒ නිසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මේ ආණ්ඩුව අපහසුතාවට පත් වෙන ආකාරයෙන්, විෂය භාර අමාත්‍යවරයාගේ අවබෝධයකින් තොරව, ලේකම්වරයාගේවත් අවබෝධයකින් තොරව මේ ආකාරයෙන් ප්‍රතිපත්ති වෙනස් කිරීමේ තීන්දු තීරණ ගන්නවා නම්, ඒක ටිකක් බරපතළ තත්ත්වයක් කියන කාරණයටයි මගේ අවධානය යොමු කරන්නේ.

ගරු සභාපතිතුමනි, අපේ රටේ රාජ්‍ය සේවාව තුළ, වෘත්තීන් තුළ, තනතුරු තුළ වාගේම විවිධ බඳවා ගැනීම් පටිපාටි තුළ අනාදිමත් කාලයක සිට ගැටලු ගණනාවක් තිබුණා.

ඒ නිසා ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට අපිට අවශ්‍යතාවක් තිබුණා, සමස්ත රාජ්‍ය සේවාවේ තිබෙන ව්‍යාකූලත්වයන්, විකෘති තත්ත්වයන් වෙනස් කරලා සෑම රාජ්‍ය සේවකයෙකුටම සාධාරණ වැටුප් තලයක්, ඒ වාගේම වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා වූ වටපිටාවක් නිර්මාණය කරලා දෙන්න. ඒ නිසා ජාතික ජන බලවේගය ආණ්ඩුව විධියට, මේ පිළිබඳව උනන්දු වන ආණ්ඩුවක් විධියට, අපි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී මේ පිළිබඳව අවධානය යොමු කළා. ඒ අනුව විශේෂයෙන්ම කිව යුතුව තිබෙනවා, ඒ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අපි වැටුප් හා වෘත්තීයභාවය ඉහළ නැංවීම සඳහා වන පාර්ලිමේන්තු අනුකමිටුවක් පත් කළා. වෘත්තීය සමිති ඒක වැරැදියට තේරුම් ගන්න එපා. ඒක වැටුප් කොමිසමක් නොවෙයි. ඒක මේ සම්බන්ධයෙන් අනාගතයේදී ස්ථාපිත වන කොමිසම සඳහා අවශ්‍ය වන යම් යම් කරුණු කාරණා පිළිබඳව සාකච්ඡා කරන අනු කමිටුවක්. ඒකේ අරමුණ තිබුණේත් ඒ ආකාරයටයි. අපේ රටේ විශ්‍රාමික ප්‍රජාව ගැන කථා කළොත්, අපි දන්නවා, 2016.11.17වැනි දා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර තිබෙන බව. කවුද? එවකට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය, ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා. මම ඒ අමාත්‍ය මණ්ඩල සන්දේශය **සභාගත*** කරනවා.

ඒ අමාත්‍ය මණ්ඩල සන්දේශයෙන් ඉල්ලනවා, විශ්‍රාම වැටුප් ක්‍රමය සංශෝධනය කරන්න කියලා. ඒ අනුව එවකට රාජ්‍ය සේවා කොමිෂන් සභාව 2016 වසරේ හත්වැනි මාසයේ ලිපියක් නිකුත් කරලා තිබෙනවා. එහි සඳහන් වෙනවා, "ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ" කියලා. තිබුණු පූර්ණ විශ්‍රාම වැටුප් ක්‍රමය මේ ආකාරයෙන් ඉවත් කරලා, ඒක වෙනස් කළේ එදා යහ පාලන ආණ්ඩුව. ඒ නිසා අද රාජ්‍ය සේවාවේ එවැනි ගැටලු නිර්මාණය වෙමින් තිබෙනවා. අපේ රටේ විශ්‍රාමික ප්‍රජාව ගැන ගත්තොත්, 2016දී කරපු වැටුප් වැඩිවීම, 2016-2019 කාලසීමාවේ විශ්‍රාම ගිය අයට ලැබුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, your time is up.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Hon. Member, we have another speaker before lunch.

**ගරු චන්දන සූරියආරච්චි මහතා**
(மாண்புமிகு சந்தன சூரியஆரச்சி)
(The Hon. Chandana Sooriyaarachchi)
ඒ ඇති කරපු වැටුප් විෂමතාව පියවර තුනකින් නිවැරැදි කරන්න වත්මන් ආණ්ඩුව විසඳුම් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම, සමස්ත විශ්‍රාමික ප්‍රජාවගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා ජනාධිපතිතුමාගේ අවධානය යොමු කරමින්, ඒ අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා. අද සමස්ත රාජ්‍ය සේවයම ඉදිරියට ගමන් කිරීම සඳහා අවශ්‍ය වන ආකාරයට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ඉදිරිපත් කරමින්, මේ රටේ රාජ්‍ය සේවය ශක්තිමත් කිරීම වෙනුවෙන්, ආණ්ඩුව අවශ්‍ය පියවර ගනිමින් තිබෙනවා කියන එක මම ඉතා ගෞරවයෙන් මතක් කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
The Hon. (Dr.) Nalinda Jayatissa, please. You have two minutes.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 12.28]

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු සභාපතිතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පිළිබඳව විවාද කරන මේ වෙලාවේ, මම වැදගත් කරුණක් පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කරන්න කැමැතියි. අද උදෑසන සිට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු නාමල් රාජපක්ෂ මහතාගේ නීතිඥභාවය පිළිබඳව, ඔහු එංගලන්තයෙන් නීති උපාධිය ලබා ගත් ආකාරය පිළිබඳව, ඒ නීති උපාධි සහතිකය සහ නීති විද්‍යාලයට ඇතුළත්වීම පිළිබඳව, websites ගණනාවක ලිපි පළ කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ රටේ ගවේෂණශීලී මාධ්‍යවේදිනියක් වන නිර්මලා කන්නන්ගර මහත්මිය ඒ තොරතුරු හෙළිදරව් කරලා තිබෙනවා. එකක් තමයි, එතුමා The City University, London කියන ආයතනයෙන් ලබා ගත් උපාධි සහතිකය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට ශාස්ත්‍රපති උපාධියට ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ උපාධි සහතිකය නිකුත් කරලා තිබෙන්නේ, 2009 සැප්තැම්බර් 15 දිනයි. නමුත්, ඒ සහතිකයට අත්සන් කරපු උපකුලපතිවරයා - Vice Chancellor - ජූලි 23වැනි දා ඉල්ලා අස් වෙලා තිබෙනවා. එතකොට ඒ උපකුලපතිවරයා ඉල්ලා අස් වෙලා දින 54කට පස්සේ තමයි, උපාධි සහතිකයේ උපකුලපති ලෙස අත්සන් කරලා තිබෙන්නේ. ඒ නිසා මේ උපාධි සහතිකය පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් ඒ මාධ්‍යවලින් මතු කරලා තිබෙනවා.

දෙවැනි කාරණය මේකයි. මෙතැන නීතිඥවරු ගොඩක් ඉන්නවා, එතුමන්ලා දන්නවා, සාමාන්‍යයෙන් Law Entrance Exam එකෙන් නැතුව ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් වෙන්න නම්, ලෝකයේ පිළිගත් නීති උපාධි ලබා දෙන ආයතනවලින් තමයි, ඒ අයට ඒ අවස්ථාව තිබෙන්නේ කියන එක. නමුත්, මේ City University, London කියන ආයතනය - මේක University of London නොවෙයි - ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ ලියාපදිංචි වෙලා තිබෙන්නේ 2009 ඔක්තෝබර් 15වැනි දා. නමුත්, ඒ ආයතනයෙන් උපාධිය ගත්තා යැයි කියන නාමල් රාජපක්ෂ මන්ත්‍රීවරයා, ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත්වීමට ඉල්ලා තිබෙන්නේ 2009 සැප්තැම්බර් 25වැනි දා. Application එක දාපු දවසේම නීති විද්‍යාලය ඒක භාර ගෙන තිබෙනවා. එතුමා නීති විද්‍යාලයට ඇතුළත්වීම සඳහා 2009 සැප්තැම්බර් 25වන දා application එක භාර ගන්න කොට, මේ කියන City University, London ආයතනය ශ්‍රී ලංකා නීති විද්‍යාලය පිළිඅරගෙන නැහැ. ඒක පිළිඅරගෙන තිබෙන්නේ, ඔක්තෝබර් 15වැනි දා. ඒ ගැනත් මේ වාර්තාවල අවධානය යොමු කරලා තිබෙනවා.

තුන්වැනි කරුණ තමයි, ඔහුම සඳහන් කරන හැටියට, ඒ උපාධි සහතිකයේ තිබෙන හැටියට ඔහුට තිබෙන්නේ Bachelor of Laws with Honours, Class Three උපාධියක්; තුන්වැනි පන්තියේ උපාධියක් තමයි ඔහුට තිබෙන්නේ. ඒ මට්ටමේ - Class Three උපාධියක් - අරගෙන, එක්සත් රාජධානියේ නීතිඥ මණ්ඩලවලට ඇතුළත් වෙන්න බැහැ කියන එකත් වාර්තා වෙලා තිබෙනවා. මීට අදාළව වාර්තා කිහිපයක් තිබෙනවා. "No degree certificate in Namal's Law College file, admission breaches entry rules" යන ශීර්ෂය යටතේ පළ කර ඇති ලේඛනය ඇතුළු ලේඛන ගණනාවක් මා සතුව තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම මේ ලේඛන සියල්ල **සභාගත*** කරනවා.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

මම බලාපොරොත්තු වෙනවා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මැතිතුමා lunch එකෙන් පස්සේ හෝ සුපුරුදු පරිදි මේ සභාවට ඇවිල්ලා මේ ගැන පැහැදිලි කිරීමක් කරයි කියලා.

බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Order, please! The Proceedings of the Committee of the whole Parliament will be suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.00ට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. විශේෂයෙන්ම වැදගත් අමාත්‍යාංශ කිහිපයක් සම්බන්ධව අය වැය කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන මේ වෙලාවේදී, ඒ පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මම බෙහෙවින් සතුටට පත් වෙනවා.

විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය කියන්නේ ඉතාම වැදගත්, ඒ වාගේම රටේ විශාල ආයතන සංඛ්‍යාවක් ආවරණය වන අමාත්‍යාංශයක් කිව්වොත් මා නිවැරැදියි කියලායි මා හිතන්නේ. මට ලැබී තිබෙන කෙටි කාල වේලාව තුළ මම බලාපොරොත්තු වෙනවා, මේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන කිහිපයක සේවය කරන අපේ සේවකයන්ට, නිලධාරින්ට බලපාන කරුණු කිහිපයක් සම්බන්ධව කථා කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රාජ්‍ය ක්ෂේත්‍රයේ, රාජ්‍ය ආයතන අතර බිම් මට්ටමේම ඉන්න නිලධාරියා හැටියට අප හඳුන්වන්නේ අපේ ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන්. විශේෂයෙන්ම ග්‍රාම නිලධාරි වසම් තුළ රජයේ කටයුතු වාගේම පොදුවේ මහ ජනතාවගේ කටයුතු වෙනුවෙනුත් විශාල කැප කිරීමක් කරන නිලධාරි පෙළැන්තියක් තමයි, ග්‍රාම නිලධාරින්. ඒ බව අපි පිළිගන්න ඕනෑ. ඒ අයගේ ප්‍රශ්න දීර්ඝ කාලයක් තිස්සේ ඔබතුමන්ලාටත්, ඒ වාගේම අදාළ අමාත්‍යාංශය වෙතත් යොමු කරන්න ඒ අය කටයුතු කර තිබෙනවා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමන්ලාත් ඒ සම්බන්ධයෙන් වන කරුණු විශේෂයෙන්ම ගරු අමාත්‍යතුමාගේ අවධානය සඳහා යොමු කරන්න කටයුතු කළා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන් ඉන්ධන දීමනාව, සන්නිවේදන දීමනාව, ගමන් වියදම් දීමනාව, නිල ඇඳුම් දීමනාව ඇතුළු දීමනා සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලීම් කළා. නමුත්, අපට දැන ගන්න තිබෙන ආකාරයට විශේෂයෙන්ම පසුගිය අය වැය යෝජනාවලදී ඒ අයට ලබා දෙන්න කටයුතු කර තිබෙන්නේ විශේෂයෙන් නිල ඇඳුම් දීමනාව පමණයි. ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන් බලාපොරොත්තු වෙච්ච ආකාරයට ඉන්ධන දීමනාව, සන්නිවේදන දීමනාව ආදි කිසිවක් මේ වනකල් ලබා ගන්න ඒ අයට හැකියාව ලැබිලා නැහැ. එම නිසා මේ ඉල්ලීම් සම්බන්ධයෙන් ගරු අමාත්‍යතුමාගේත්, රජයේත් විශේෂ අවධානය යොමු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන්ට තමුන්ගේ රාජකාරි ස්වභාවය අනුව ගමන් බිමන් යන්න තිබෙනවා. ඒ සඳහා ඔවුන්ට ඉන්ධන දීමනාවක් අවශ්‍ය වෙනවා. ඒ වාගේම, ඔවුන්ගේ දුරකථන සඳහා සන්නිවේදන දීමනාවකුත් අවශ්‍ය වෙනවා. ඒ දේවල් ලබා දීම සඳහා ඔබතුමන්ලාගේ කාරුණික අවධානය යොමු කරන්න කියන ඉල්ලීමත් මම මේ අවස්ථාවේදී කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අනෙක් පැත්තෙන්, තවත් ඉල්ලීමක් තිබෙනවා. අපි දන්නවා, විශේෂයෙන්ම රජයේ සේවකයන් සාමාන්‍යයෙන් සතියකට වැඩ කරන්නේ දින 5යි කියලා. සෙනසුරාදා සහ ඉරිදා දිනවල ඒ අය වැඩ කරන්න අවශ්‍යතාවක් නැහැ. ඒ වාගේම, රජයේ නිවාඩු දවසක් තිබුණොත් එදාට වැඩ කරන්න අවශ්‍යතාවකුත් නැහැ. නමුත්, ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන්ට එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. චක්‍රලේඛ ප්‍රකාරව ඒ ගොල්ලෝ අනිවාර්යයෙන්ම සෙනසුරාදා වරුවක් වැඩ කරන්න ඕනෑ. ඒ වාගේම, ඔවුන්ට නිවාඩු දිනවලත් සමහර අවස්ථාවලදී නිවාඩු ලබා ගන්න හැකියාවක් නැහැ; සේවා අවශ්‍යතා මත යම් යම් අවස්ථාවලදී රාජකාරි කටයුතුවලට සම්බන්ධ වෙන්න ඔවුන්ට සිදු වෙනවා. ඒ ගොල්ලන් ඉල්ලා සිටින්නේ අඩුම තරමින් ඒ සඳහා දීමනාවක් ලබා දෙන ලෙසයි. අපි දන්නවා, අනෙකුත් රජයේ සේවකයන්ට හදිසි කාරණාවක් මත හෝ වෙනත් යම් අවස්ථාවකදී අමතරව සේවය කරන්න සිදු වුණොත් ඒ අයට යම්කිසි දීමනාවක් ලැබෙන බව. නමුත් ග්‍රාම නිලධාරින්ට එසේ දීමනාවක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා ඒ අය යෝජනා කර තිබෙනවා, ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවලා පුළුවන් නම් මේ අය වැය යෝජනාවලට ඇතුළත් කරලා, නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් යම්කිසි දීමනාවක් ලබා දෙන්න කියලා. මොකද, විශේෂයෙන්ම සෙනසුරාදා වරුවක් වැඩ කරන එකට, රජයේ නිවාඩු දිනවල සහ හදිසි ආපදා තත්ත්වයන් ඇති වන අවස්ථාවලදී, නොයෙක් ආකාරයේ ප්‍රශ්න ඇති වන අවස්ථාවලදී ඒ ගොල්ලන්ට නිවාඩුවක් ගන්න පුළුවන්කමක් නැහැ. ඒ අයට ඉහත කී පරිදි දීමනාවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියා මම මේ අවස්ථාවේ යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊට අමතරව තවත් යෝජනාවක් තිබෙනවා, විශේෂයෙන්ම කළමනාකරණ සේවා නිලධාරින්ගෙන්. කළමනාකරණ සේවා නිලධාරින්ගේ වැටුප් විෂමතාව සම්බන්ධව මීට ඉස්සෙල්ලාත් අපි කථා කර තිබෙනවා. ඒ වාගේම, අපේ ගරු විපක්ෂ නායකතුමාත් ඒ ගැන කථා කර තිබෙනවා. පසු ගිය ආණ්ඩුව පැවැති කාලයේ එවකට සිටි ගරු අමාත්‍යතුමාගේත් අවධානය ඒ සඳහා යොමු කරන්න අපි කටයුතු කෙරුවා. විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව 2021.08.11 වැනි දින ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට ලිපියක් යොමු කර දැනුම් දීමක් කර තිබුණා, ඒ ගොල්ලන්ට අදාළ වැටුප් නිර්දේශය ක්‍රියාත්මක කරන්න කියලා. නමුත් ගරු ඇමතිතුමනි, මේ වනකල් ඒ කටයුත්ත ඒ ආකාරයට සිද්ධ වෙලා නැහැ. ඒ නිසා කළමනාකරණ සේවා නිලධාරින්ගේ වැටුප් විෂමතාව ඉවත් කර ඒ අයට යම්කිසි සහනයක් සලසා දීමේ කටයුත්ත සම්බන්ධව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම කළමනාකරණ සේවා නිලධාරි තනතුරට බඳවා ගැනීමේදී මධ්‍යම රජය තරග විභාගයක් පවත්වනවා. නමුත් පළාත් සභාවලදී ඒක ඒ ආකාරයට ඉෂ්ට වෙන්නේ නැහැ. පළාත් සභාවලදී බඳවා ගැනීමේ පටිපාටිය තුළ තවම තරග විභාග ක්‍රමය අනුගමනය කරන්නේ නැහැ කියන එක ගැනත් යම්කිසි මැසිවිල්ලක් තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමාගේත්, රජයේත් අවධානය ඒ සම්බන්ධව යොමු කරලා, ඒ ගැන සොයා බලා, එහි විෂමතාවක් තිබෙනවා නම්, ගැටලුවක් තිබෙනවා නම් පළාත් සභාවලට උපදෙස් දීලා රජය අනුගමනය කරන ක්‍රියා මාර්ගයම ඒ ආකාරයට අනුගමනය කිරීම සඳහා වන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා තමයි මේ අවස්ථාවේදී කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට කාල වේලාව නැති වුණත්, මේ අවස්ථාවේදී පළාත් පාලන ආයතන සම්බන්ධවත් කථා කළ යුතුයි. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. කාල වේලාව නොමැති නිසා ඒවා එක එක ගැන කථා කරන්න මෙය වෙලාව නොවෙයි. පළාත් පාලන ආයතන ගත්තොත්, ආණ්ඩු පක්ෂයට තමයි වැඩිපුරම ප්‍රශ්න තිබෙන්නේ. මොකද, බහුතර පළාත් පාලන ආයතනවල බලය තිබෙන්නේ ඔබතුමන්ලාටයි. ඒකාබද්ධ විපක්ෂයට හෝ අපේ පක්ෂය වන සමගි ජන බලවේගයට තිබෙන්නේ පළාත් පාලන ආයතන බොහොම සුළු ප්‍රමාණයක -අල්පයක- බලය විතරයි. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. දැන් හුඟක් පළාත් පාලන ආයතනවලට තමන්ගේ ආදායම් මාර්ගවලින්, ඒ කියන්නේ, මුද්දර ගාස්තු, උසාවි දඩ, වරිපනම් බදු ඇතුළු නොයෙකුත් ආකාරයේ බදු ආදියෙන් ලැබෙන ප්‍රමාණය එදිනෙදා කටයුතු කර ගන්නවත්, සංවර්ධන කටයුතු සඳහා ලබා දීමටවත් ප්‍රමාණවත් නැහැ.

ඒ අතරතුර දැන් යෝජනාවක් ඇවිල්ලා තිබෙනවා, රජයෙන් මෙතෙක් කල් ලබා දුන් වැටුප් වියදම් ප්‍රතිපූරණයට පළාත් පාලන ආයතනවලින් සියයට 20ක දායකත්වයක් ලබා දෙන්න කියලා. ලබන අවුරුද්ද වන කොට එම ප්‍රමාණය සියයට 40ක්. මා හිතන්නේ ඔය විධියට ක්‍රමානුකූලව තවත් අවුරුදු 4ක්, 5ක් යනකොට වැටුප් ප්‍රතිපූරණය සියයට 100ම වාගේ පළාත් පාලන ආයතනවලින්ම කරන්න වෙයි. ඒක කිසිසේත් කරන්න පුළුවන්කමක් නැහැ. මා දන්නා තරමින් කෑගල්ල දිස්ත්‍රික්කයට අයත් යටියන්තොට, බුලත්කොහුපිටිය, අරණායක වාගේ ප්‍රාදේශීය සභා ගණනාවකට ආදායමක් නැහැ, වැටුප් වියදම් ප්‍රතිපූරණය සඳහා මුදල් ලබා දෙන්න. ඒ නිසා රජය මේ සම්බන්ධව සොයා බලා අඩුම ගණනේ ආදායම් උපදවා ගන්න බැරි, අඩු ආදයම් තිබෙන ප්‍රාදේශීය සභාවලටවත් යම්කිසි සහනයක් ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලාත් අපි මේ අවස්ථාවේදී රජයට යෝජනා කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඊළඟට මම කම්කරු අමාත්‍යාංශය සම්බන්ධවත් කථා කරන්න බලාපොරොත්තු වෙනවා. මේ රටේ කම්කරුවන්ට නොයෙකුත් ආකාරයේ සහන ලබා දීම සඳහා තිබෙන එකම අමාත්‍යාංශය එයයි. අපි දන්නවා, සේවකයන්ට හුඟක් වෙලාවට තිබෙන ප්‍රශ්නය මොකක්ද කියලා. අපේ කම්කරුවන් ඇතුළු සේවකයන් හැම කෙනා ගැනම කථා කළොත්, ඒ ගොල්ලන් විශ්‍රාම ගියාට පසුව තමන්ගේ පාරිතෝෂිකය ගන්න ගියාම, තමන්ගේ සේවක අර්ථසාධක අරමුදල -EPF එක- ගන්න ගියාම නොයෙකුත් ආකාරයේ ප්‍රශ්නවලට මුහුණ පාන්න සිද්ධ වෙනවා. ඒක අමුතුවෙන් කියන්න අවශ්‍යතාවක් නැහැ. මා හිතන විධියට දහදොළොස් වතාවක් නොවෙයි, සමහර විට පහළොස් වතාවක්, විසි වතාවක් විතර ඒ කම්කරුවන් ඇතුළු සේවකයන්ට තමන්ගේ EPF එක, ETF එක හදා ගන්න යන්න වෙනවා. ඒකට ප්‍රායෝගිකව හේතු වෙලා තිබෙන කාරණා අපි දන්නවා. නමේ වැරැද්දක් තිබුණොත්, එහෙම

[ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා]

නැත්නම් වෙනත් මොකක් හරි පුංචි අඩු පාඩුවක් තිබුණොත් එසේ කිහිප වතාවක් යන්න වෙනවා. සමහර වෙලාවට ආයතනවල තොරතුරු හොයා ගන්න බැරි වීමත් හේතුවක්. මොකද, සමහර ආයතන වසා දමා ගිහින් තිබෙනවා. ඉතින් සේවා ස්ථාන දෙක තුනක වැඩ කරලා තිබෙනවා නම්, ඒ අදාළ තොරතුරු ටික ලබාදීමේදී නොයෙකුත් ආකාරයේ ගැටලුවලට අපේ සේවකයෝ මුහුණ පානවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවුරුදු ගණනාවක් සේවය කරලා මේ අයට මේ මුදල ලබා ගන්න තවත් අවුරුදු ගණනාවක් ගත වෙනවා නම්, අපි ඒ සඳහා මොකක් හරි වැඩපිළිවෙළක් හදන්න ඕනෑ. මොකද, ඔබතුමන්ලා කථා කළ මේ ආණ්ඩුවේ පළමුවෙනි දේ තමයි, ඩිජිටල් ආර්ථිකය. ඩිජිටල් ආර්ථිකය ගැන කථා කරනවා, රට ඩිජිටල් ක්‍රමයට ගේනවා කියනවා. රට දැන් දියුණුයි. ඉතින් ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, ජාතික හැඳුනුම් පත පදනම් කරගෙන මොනවා හරි දෙයක් කරලා මේ කටයුතු ඉක්මන් කරන්න. රජයේ සේවය කරන හැම කෙනාටම ගිණුමක් තිබෙනවා; හැම කෙනාටම ෆයිල් එකක් තිබෙනවා. ඉතින් මේ ෆයිල්වලින් අවශ්‍ය තොරතුරු ටික අරගෙන ඒවා යාවත්කාලීන කරලා, පරිගණක ගත කරලා ඒ තොරතුරු අනෙකුත් ආයතනත් එක්ක සම්බන්ධ කරන්න කටයුතු කෙරුවා නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මීට වඩා ප්‍රායෝගිකව කඩිනමින් මේ අයට සහන සලසන්න පුළුවන්. කම්කරු අමාත්‍යවරයාගෙන් මම ඉල්ලා සිටින්නේ, මේ කටයුතු ඉක්මන් කරලා යාවත්කාලීන කරලා, දැන් තිබෙන තාක්ෂණයත් එක්ක බද්ධ කරලා මේ වැඩ කටයුත්ත කරන්න කියලායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අවසාන වශයෙන් මේකත් කියනවා. මේ දවස්වල විශේෂයෙන් වතු කම්කරුවෝ ගැන කථා කරනවා. වතු කම්කරුවෝ ගැන බොහෝ දුරට කථා කෙරුවා. පසුගිය දවස්වල අපි දැක්කා, මේ අය වැයෙන් වතු කම්කරුවෙකුගේ වැටුප වැඩි කරලා තිබෙනවා. ඉතින් ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. වතු කම්කරුවෙකුගේ වැටුප වැඩි කරන්න ඕනෑ. අපිත් රුපියල් 1,750ක් දෙන්න ඕනෑ කියලා ඉල්លුවා. ඔබතුමන්ලාත් කිව්වා. ඔබතුමන්ලා රුපියල් 2,000ක් දෙනවා කියලා කිව්වා. ඔබතුමන්ලාගේ වෘත්තීය සමිතිය වතු කම්කරු ජනතාවට ගිහිල්ලා කිව්වේ, අපි අනිවාර්යයෙන්ම රුපියල් 2,000ක දීමනාවක් ලබා දෙන්න කටයුතු කරනවා කියලායි. කෙසේ වෙතත්, දැන් වතු කම්කරුවන්ට හම්බ වෙන්නේ රුපියල් 1,550යි. දැන් ඔබතුමන්ලා මොන දේවල් කිව්වා වුණත්, අපි පදනම් කර ගන්නේ ජනාධිපතිතුමා අය වැය ප්‍රකාශය නිකුත් කරනකොට කියපු කථාව. එතුමා කිව්වේ, කම්කරුවන්ට සමාගමෙන් රුපියල් 200ක් දෙනවා, එතකොට රුපියල් 1,550යි. ඊට පස්සේ තමයි තව රුපියල් 200ක් දෙනවා කියලා ජනාධිපතිතුමා ප්‍රකාශ කරන්නේ. ඒ රුපියල් 200 දෙනවා කියන්නේ, පැමිණීමේ දිරි දීමනාවක් විධියට. ඒ කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දින 25ක් වැඩ කෙරුවොත්, ඒක හම්බ වෙනවා කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව තත්ත්පර කිහිපයක් දෙන්න. ඒක වැඩි කරනවා කියලා තිබෙන්නේ එහෙමයි. නමුත් ඒක එහෙම කරන්න අවශ්‍ය දෙයක් නොවෙයි. තමුන්නාන්සේලාට තිබුණා කෙළින්ම රුපියල් 1,750යි කියලා කියන්න. ඇයි, ඒක කියන්න බැරි? රුපියල් 1,550ක් දෙනවා කියලා කියනවා. ඉතින් මේක සම්පූර්ණයෙන්ම වතු කම්කරුවන් මුළාවේ දැමීමක් කියන එක තමයි මට කියන්න තිබෙන්නේ. ඉතින් මේ සම්බන්ධව ඔබතුමන්ලා පැහැදිලි කරලා කියන්න, හරියටම මේ රුපියල් 200 හම්බ වෙන්නේ දින 25ක් වැඩ කෙරුවාමද, නැත්නම් දිනයක් වැඩ කෙරුවත් හම්බ වෙනවාද කියලා. ජනාධිපතිතුමාගේ ප්‍රකාශයේ එහෙම එකක් නැහැ. ඒ නිසා මේ වතු කම්කරුවන් නොමඟ යවන්න එපා කියන එක තමයි මට අවසාන වශයෙන් කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මේ කාලය ලබාදීම වෙනුවෙන් ඔබතුමියට බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.11]

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ විවාද කරන දිනයේ කථාවක් කරන්න අවස්ථාව ලබාදීම වෙනුවෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මගේ කථාව පටන් ගැනීමට පෙර සිහිපත් කරනවා, පසුගිය නොවැම්බර් 12වෙනි දා අප අතරින් වියෝ වුණු ඩාබිඳු සාමූහිකයේ සමන්මලී හෙට්ටිආරච්චි සහෝදරිය. අද වාගේ දවසක ඇය මතක් කරන්න ඕනෑ, කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කථා කරද්දී. 1980 දශකයේ සිටම නිදහස් වෙළඳ කලාපවල කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීමට ස්ත්‍රී මධ්‍යස්ථානය, ඩාබිඳු සාමූහිකය වැනි සංවිධාන සකස් කරමින්, ඒවායේ නායකත්වය ගනිමින් කාන්තාවන්ගේ, වැඩ කරන සේවිකාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීමට සහ නිදහස් වෙළඳ කලාප ආශ්‍රිතව කාන්තා නායකත්වය සහිත වෘත්තීය සමිති සහ වෙනත් සංවිධාන ගොඩනැගීමට පුරෝගාමී කාර්යභාරයක් ඉෂ්ට කරපු කාන්තාවක් තමයි සමන්මලී හෙට්ටිආරච්චි සහෝදරිය. ඇය වැඩ කරන පන්තියේ කාන්තාවක්. මම හිතනවා, එවැනි කාන්තාවන් ගොඩක් ලංකාවේ ඉන්නවා. ඔවුන්ගේ ජීවිත කථාව මේ වාගේ සභාවල කථා වෙන්නේ නැහැ; ඔවුන් මතක් වෙන්නේ නැහැ. ඒ වාගේ ඉඳලා ඔවුන් මිය යනවා. ඉතින් අපි මේ වාගේ සභාවක, අද වාගේ දවසක සමන්මලී හෙට්ටිආරච්චි සහෝදරිය ඒ කරපු පුරෝගාමී කාර්යභාරය මතක් කරමින්, ඒකට ගෞරවය දක්වන්නට අවශ්‍යතාවයක් තිබෙනවා. ඒ හින්දා මම කැමැතියි, මගේ කථාව පටන් ගන්න ඇය මතක් කරමින් සහ ඇයට ගෞරවය පුද කරමින්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඇත්තටම කම්කරු අමාත්‍යාංශය ගැන ගොඩක් වෙලාවට සේවකයන්ගේ පැත්තෙන්, වෘත්තීය සමිති පැත්තෙන් අදහසක් තිබුණා, කම්කරු අමාත්‍යාංශය තුළින් කාර්මික සබඳතා පවත්වා ගැනීමේදී, එහෙම නැත්නම් කාර්මික සාමය නඩත්තු කිරීමේදී සේවකයන්ගේ පැත්තට දෙන බර අඩුයි කියන එක. දීර්ඝ කාලයක් තිස්සේ, විශේෂයෙන් ගිය අවුරුදු තුන හතරක කාලය තුළ මේ අදහස ගොඩක් වර්ධනය වුණා. නමුත් ඒ කාරණය වෙනුවෙන් පසුගිය වර්ෂය තුළ ජාතික ජන බලවේගය, කම්කරු අමාත්‍යාංශය හරහා විශේෂ මැදිහත්වීමක් කරලා තිබෙන එක මම මේ වෙලාවේ අගයීමට ලක් කරන්නට ඕනෑ. විශේෂයෙන්, කම්කරු ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා ඒ වෙනුවෙන් කරලා තිබෙන කාර්යභාරය වෙනුවෙන්.

විශේෂයෙන්ම මම ඒ කියපු සමන්මලී සහෝදරිය මැදිහත් වූ කාරණාවලටම එනවා නම්, කම්කරු අමාත්‍යාංශයට අදාළව තිබෙනවා, ජාතික කම්කරු උපදේශන සභාව - National Labour Advisory Council. ඒක පිහිටුවලා තිබුණේ 1995 වර්ෂයේ. ත්‍රෛපාර්ශ්විකව, ඒ කියන්නේ සේවකයන්ගේ, සේවා යෝජකයන්ගේ සහ රජයේ සහභාගිත්වය සහිතව කර්මාන්ත

සම්බන්ධ, කම්කරුවන් සම්බන්ධ තීරණ ගැනීමේ අවකාශයක් සකස් කිරීමට තමයි NLAC එක පිහිටුවන්නේ. නමුත් 2023 වර්ෂයේ සිට අවුරුදු එකහමාරක් පමණ මේ සභාව අකර්මණ්‍යව තමයි පවතින්නේ. අපි රජය භාර ගන්න කොට මේ සභාව අකර්මණ්‍යව තිබුණේ. විශේෂයෙන් වෘත්තීය සමිතිවල අදහස් විමසීමකින් තොරව කම්කරු නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් කිරීමට යෑමේදී තමයි ජාතික කම්කරු උපදේශන සභාව - NLAC කියන ආයතනය - අකර්මණ්‍ය කරලා දාන්නේ. අපි ආණ්ඩුවට පත් වුණාට පස්සේ දෙසැම්බර් මාසයේ ඉඳලාම ජාතික කම්කරු උපදේශන සභාව නැවතත් සක්‍රිය කරලා මේ වනකොට වාර හයකට වඩා රැස්වෙලා කම්කරු නීති සහ කම්කරුවන් සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීමේදී සේවක පාර්ශ්වයට, එහෙම නැත්නම් වෘත්තීය සමිති පාර්ශ්වයට අදහස් ප්‍රකාශ කිරීමට විශේෂ ඉඩක් ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. ලංකාවේ වතු කම්කරු කාන්තාවන් ඉන්නවා. ඇඟලුම් සේවිකාවන් ඉන්නවා. ලංකාවේ කාන්තාවන් අපේ ආර්ථිකයට විශාල බරක් දෙනවා; විශාල දායකත්වයක් දෙනවා. එහෙම ලබා දුන්නත්, අපේ රටේ කම්කරු ප්‍රතිපත්ති සකස් කිරීමේදී, එහෙම නැත්නම් කාර්මික ප්‍රතිපත්ති සකස් කිරීමේදී කාන්තාවන්ට ලබා දෙන ඉඩ ඉතාම අඩුයි. එහෙම තමයි අතීතයේ සිට තිබුණේ. ඒ නිසා ජාතික කම්කරු උපදේශන සභාව තුළත් කාන්තා නියෝජනය රජයේ ප්‍රතිපත්තියක් ලෙස වැඩි කිරීමේ වුවමනාවක් තිබුණේ නැහැ. නමුත්, අපි ගිය අවුරුද්දේ අපේ ආණ්ඩුව පත් වුණු වහාම ජාතික කම්කරු උපදේශන සභාව තුළ කාන්තා නායකත්වයක් සහිත වෘත්තීය සමිතිවලට ඉඩ ලබා දෙමින්, කාන්තා නායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මැදිහත් වීමක් කරලා තිබෙනවා. ඒ අනුව මේ වනවිට ජාතික කම්කරු උපදේශන සභාව නියෝජනය කරමින් රජය විසින්, කම්කරු ඇමතිතුමා විසින් පත් කරන ලද කාන්තාවන් තුන්දෙනෙක් ඉන්නවා; වෘත්තීය සමිති තුනක් තිබෙනවා. ජාතික කම්කරු උපදේශන සභාවට කාන්තා සහභාගිත්වය ලබා ගැනීම සඳහා වෙළඳ කලාපවල, කාන්තා ව්‍යාපාර තුළ ඉන්න කාන්තාවන් - වෘත්තීය සමිතිවල ඉන්න කාන්තාවන් සහ කාන්තා කම්කරුවන් - කාලයක් තිස්සේ සටන් කළා. ඒක හැම අවුරුද්දකම යෝජනාවක් හැටියටත් ඉදිරිපත් වුණා. නමුත් කිසිම අවස්ථාවක කිසිම රජයක් විසින් ඒ සඳහා ඉඩ ලබා දුන්නේ නැහැ. අපේ රජය ඒකට ඉඩ ලබා දීලා තිබෙනවා. ඒක කම්කරු ව්‍යාපාරය පැත්තෙනුත්, කාන්තා ව්‍යාපාරය පැත්තෙනුත් ලබා ගත් ජයග්‍රහණයක්. එවැනි ජයග්‍රහණ අපි acknowledge කරන්න ඕනෑ. එවැනි දේවල් කිසිම අමාරුවක් නැතුව, ඉතාම ලේසියෙන් සිදු කරන්නට ඉදිරිපත් වෙලා ඉන්න නායකත්වයක් කම්කරු අමාත්‍යාංශයට ලැබීම ගැන අපි සතුටු වෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අනෙක් කාරණය මෙයයි. කාර්මික සම්බන්ධතා පවත්වා ගැනීමේදී, කාර්මික සාමය පවත්වා ගැනීමේදී කම්කරු අමාත්‍යාංශය හරහා විශේෂයෙන්ම සේවකයන්ගේ වැටුප්වලට සිදු කරලා තිබෙන මැදිහත් වීම ගැන කියන්න ඕනෑ. පසුගිය කාලය තුළ අපි සේවක වැටුප් සම්බන්ධයෙන් සුවිශේෂ මැදිහත් වීම් දෙකක් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. පළමුවැනි කාරණය මෙයයි. සේවකයන්ගේ ජාතික අවම වැටුප් වැඩි කිරීම සඳහා අපි පනත් සංශෝධනයක් කළා, ගිය අවුරුද්දේ. ඒ අනුව පසුගිය වර්ෂයේ අප්‍රේල් මාසයේ සිට රුපියල් 27,000ක් දක්වාත්, 2026 ජනවාරි මාසයේ සිට රුපියල් 30,000ක් දක්වාත් ජාතික අවම වැටුප වැඩි කිරීමට රජය මැදිහත් වෙලා සේවා යෝජකයන් එක්ක සාකච්ඡා කරලා, එකඟතාව හදා ගනිමින් මේ පනත් සංශෝධනය කරලා තිබෙනවා. අවුරුදු දෙකක් තුළ, ඒ කියන්නේ 2025 වර්ෂයේදීත් ජාතික අවම වැටුප වැඩි වෙනවා, 2026 වර්ෂයේදීත් ජාතික අවම වැටුප වැඩි වෙනවා. මෙවැනි ආකාරයට වැටුප් වැඩි කිරීමක් කරපු ඉතිහාසයේ පළමුවන අවස්ථාව තමයි මේක. කිසිම රජයක් කම්කරුවන්ගේ පැත්තේ හිටගෙන, කම්කරුවන්ගේ වැටුප වෙනුවෙන් සේවා යෝජකයන් එක්ක සාකච්ඡා කරලා මේ තරම් සාර්ථක ලෙස වැටුප් වැඩි කිරීමක් කරලා නැහැ. අපේ රජය කම්කරුවන්ට සලකන ආකාරය සහ ඔවුන් සමඟ හිට ගන්නා ආකාරය මොකක්ද කියන එක තේරුම් ගැනීමට අපි මේ වෙනස්කම් හඳුනා ගැනීමට අවශ්‍යයි.

දෙවැනි කාරණය තමයි, වතු කම්කරුවන්ගේ වැටුප. මම හිතන විධියට මේ කාරණය පසුගිය සතියක පමණ කාලය තුළ විශාල වශයෙන් විවාදයට ලක් වුණා; ගොඩක් අය අදහස් ප්‍රකාශ කළා. වැදගත්ම කාරණය මේකයි. මේ රජය වතු කම්කරු ජනතාව සමඟ හිටගෙන, ඔවුන්ගේ පැත්තේ සිට කේවල් කරලා, සේවායෝජකයන් එක්ක කථා කරලා, වතු හාම්පුතුන් සමඟ කථා කරලා තමයි මේ වැටුප් වැඩි කිරීමට කටයුතු කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
හොඳයි.

සුජිත් සංජය මන්ත්‍රීතුමා කිව්වා, ඒ දෛනික වැටුප ලබා ගැනීමට දවස් 25ක් වැඩ කරන්න ඕනෑය කියලා. ආණ්ඩු පාර්ශ්වය විසින් ඒ කාරණය නිතර නිතර නිවැරදි කරනවා. නමුත් මම කියන්න ඕනෑ, එහෙම එකක් නැහැ කියලා. වතු කම්කරුවන්ගේ වැටුප දෛනික වැටුපක් හැටියටයි ලබා දෙන්නේ. රුපියල් 1,750 කියන්නේ දෛනිකව ලබා දෙන වැටුපක්. කොහොමටත් එදාට-එදාට වැඩ කරන්න ඕනෑ තමයි. දෛනික වැටුපක් ලබා ගන්නකොට ඒ දවසේ වැඩ කරන්න ඕනෑ, ඒ වැටුප ලබා ගන්න. එහෙම තමයි තිබෙන්නේ. රුපියල් 1,550ට අමතරව පැමිණීමේ දීමනාවක් ලෙස රජය රුපියල් 200ක් ලබා දෙන එකයි කරන්නේ. එතැනදී දවස් 25ක් වැඩ කරන්න ඕනෑය කියලා කිසිම කොන්දේසියක් නැහැ. දවස් 25ක් දක්වා පැමිණීමේ දීමනාව රජය ලබා දෙනවා. දවස් 25ම වැඩ කළේ නැත්නම් එක දවසකටවත් පැමිණීමේ දීමනාව හම්බ වෙන්නේ නැහැ වාගේ කතන්දර හදන එක, එක්කෝ නොදැනුවත්කම නිසා කියන කථාවක්; එහෙම නැත්නම් ඒක කරුණු විකෘති කිරීම සඳහා හිතාමතාම දරන උත්සාහයක් කියලායි මම හිතන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම මුලින්ම කථා කළ කම්කරු නීතිය ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධ කාරණාව කෙරෙහි අවසාන වශයෙන් අවධානය යොමු කරන්නට කැමැතියි. කම්කරු නීතිය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ගැන සමාජයේ ලොකු අනවබෝධයක් තිබෙනවා. මීට වසර දෙක තුනකට ඉස්සර වෙලා කිසිම කෙනෙකුගේ අදහස් හරියට ගන්නේ නැතුව අමාත්‍යාංශය විසින් බලහත්කාරී මැදිහත්වීමක් කරලා, කම්කරු නීතිය ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළා. මම හිතන විධියට බොහෝදෙනා ඒකට විරුද්ධ වුණා; අපි හැමෝමත් ඒකට විරුද්ධ වුණා. නමුත් ලංකාවේ කම්කරු නීතිය ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ අවශ්‍යතාවට අනුව කම්කරුවන්ටත්, සේවායෝජකයන්ටත් සාධාරණ වන ආකාරයට, විශේෂයෙන්ම අපේ මූලික අරමුණක් වන කාන්තාවන් ශ්‍රම බලකායට දායක කර ගැනීමේ අරමුණටත් සාධාරණයක් ඉෂ්ට වන ආකාරයට කම්කරු නීතිය ප්‍රතිසංස්කරණය කළ යුතුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමියනි, කාලය අවසානයි.

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**
(மாண்புமிகு சட்டத்தரணி (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra, Attorney-at-Law)
මට තව තත්පර 30ක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

ඒ නිසා අපි විද්වත් කමිටුවක් පත් කරලා, කෙටුම්පතක් සකස් කරලා, ඉන් පසුව නැවතත් මහජන අදහස්වලට ඒක විවෘත කරලා, සේවක අදහස්වලට එය විවෘත කරලා, වෘත්තීය සමිතිවල අදහස්වලටත් විවෘත කරලා තමයි අර පැරණි ක්‍රියාවලිය වෙනුවට අලුත් ක්‍රියාවලිය ඉස්සරහට ගෙන යන්නේ. ඒ අනුව හැමෝම ඇතුළත් කර ගත්ත - inclusive, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් හරහා තමයි අපි කම්කරු නීතිය ප්‍රතිසංස්කරණය කරන්නේ කියන කාරණය තහවුරු කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.21]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දින විවාදයට ගැනෙන අමාත්‍යාංශ දෙකේ වැය ශීර්ෂ පිළිබඳව කථා කරන්න කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක නලින්ද ජයතිස්ස මැතිතුමා - එතුමා මේ අවස්ථාවේ සභාවේ හිටියා නම් හොඳයි - අපේ පක්ෂයට, එහෙම නැත්නම් අපේ නාමල් රාජපක්ෂ මැතිතුමාට යම් කිසි මඩක් එල්ල කළා. ඒ ගැන කියන්න කලින් මම කියන්න ඕනෑ, මේ කාරණයත්. "කෑමෙන් පස්සේ හරි ඇවිල්ලා උත්තර දෙන්න" කියලා නලින්ද ජයතිස්ස මැතිතුමා එතුමාට කිව්වා, මම දැක්කා. ඒ කියන්නේ, පාර්ලිමේන්තුවේ කෑමට පෙර සහ පසු කියලා දෙකක් තිබෙනවාද? මාලිමාවේ අය උදේට ඇවිල්ලා දවල්ට කෑම කාලා, ඊට පස්සේ 1.00ට ගෙදර යනවාද? මොකද, මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා. ඉස්සර වෙලාම විපක්ෂයේ සමගි ජන බලවේගයට කථා දෙකකට අවස්ථාව දෙනවා. ඊට පස්සේ TNA එකට අවස්ථාව දෙනවා. ඊට පස්සේ සිලින්ඩරය ලකුණ පක්ෂයටත් අවස්ථාව දීලා තමයි පොහොට්ටුවට අවස්ථාව දෙන්නේ. ඉතින් අපි කැමති වුණත්, නැතත් කෑමෙන් පස්සේ තමයි අපට කථා කරන්න වෙන්නේ. නලින්ද ජයතිස්ස ඇමතිතුමනි, ඒ නිසා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා වශයෙන් ඔබතුමා පළමුවෙන් ඒක දැන ගන්න. ඔබතුමන්ලා කාලා ගෙදර යනවා කියලා අපට කරන්න දෙයක් නැහැ.

ඊළඟ කාරණය මේකයි. හැමදාම ආණ්ඩුව ඇන ගන්නවා කියලා දැන ගන්න පුළුවන් ප්‍රධාන කාරණා දෙකක් තිබෙනවා. රටේ ජනතාව දන්නවා, හොඳටම ආණ්ඩුව ඇන ගන්නවා කියලා. අනුර කුමාර දිසානායක මහත්මයා පාර්ලිමේන්තුවට දුවගෙන ඇවිල්ලා පැයක් දෙකක් කථා කරනවා කියන්නේ, අනිවාර්යයෙන් ආණ්ඩුව ඇනගෙන. එහෙම නැත්නම් අලුත් මඩක් හදලා නාමල් රාජපක්ෂ මැතිතුමාට ගහනවා කියන්නේ, ආයෙත් ආණ්ඩුව හොඳටම ඇනගෙන. දැන් ලබන 21වැනි දා පැවැත්වෙන රැස්වීම නිසා අර ගැරඬින්ට බූමිතෙල් වැදිලා වාගේ තමයි ඉන්නේ. මේ ආණ්ඩුව තුනෙන් දෙකක බලයක් අරගෙන පාර්ලිමේන්තුවට ආපු ගමන්ම නාමල් රාජපක්ෂ මැතිතුමාට ඔබතුමන්ලා ඔය කථාව කිව්වා.; ඔය Law Degree එක ගැන කථා කළා නේ. ඒ වෙලාවේ ඔබතුමන්ලා නිකම් හිටියේ නැහැ නේ. ඔබතුමන්ලා උසාවියට ගියා. Magistrate's Court No. 1හි Chief Magistrate යටතේ B42852/01/25 අංක දරන නඩුව ඔබතුමන්ලා දාලා තිබෙනවා, නාමල් රාජපක්ෂ මැතිතුමාගේ උපාධිය පිළිබඳව, නීති උපාධිය පිළිබඳව. අනේ, හරි සරල කාරණයක් නලින්ද ජයතිස්ස මැතිතුමා කියන්නේ. නඩු දමන්න පුළුවන් විධියට හොර websites හදාගෙන ඒවායින් මඩ ගහනවා වෙනුවට, හෙට CID එකට ගිහිල්ලා ඔය කරුණු ටික දෙන්න, නලින්ද ජයතිස්ස මැතිතුමනි. එතකොට උසාවියට වාර්තා කරන්න පුළුවන්. ආපු ගමන් මාධ්‍ය සන්දර්ශන දාලා Magistrate's Court No. 1 එකට ගියා විතරයි. නාමල් රාජපක්ෂ මැතිතුමාගෙන් කට උත්තර ගත්තා විතරයි. අද වනකල් අධිකරණයට කරුණු වාර්තා කරලා නැහැ නේ. හැබැයි, වැටෙන වැටෙන සැරේට පාර්ලිමේන්තුවට ඇවිල්ලා මඩ නම් ගහනවා.

ලන්ඩන් ගියා නේද, පස්දෙනෙක්? අන්න CID එකේ පස්දෙනෙකු ඉන්නවා ලන්ඩන්වල; යන්න City University එකට, ගිහිල්ලා ගන්න තොරතුරු. එහෙට උසාවි නියෝගයක් යැව්වා නම් certificate එකත් ගන්න පුළුවන්. ඔය alumni list එකත් ගන්න පුළුවන්. ඒක සරලවම කරන්න පුළුවන් කාරණයක්. ආණ්ඩුව ෆේල් වෙනකොට මඩ ගහන එක නම් එච්චර හොඳ නැහැ.

පළමුවෙනි කාරණය මේකයි. ආණ්ඩුව කොච්චර ෆේල් ද කියන එකට තොරතුරු මගේ අතේ තිබෙනවා. මේ, පොලීසියේ Senior DIG මහත්මයා ගාල්ලේ - දකුණු පළාතේ - ආණ්ඩුවේ රැස්වීම්වලට සෙනඟ ගෙනෙන හැටි. අපි දැක්කා, ඉල් මහ විරු සමරුව. වෙනදා නම් පෝලිම. - දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත් මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. - වෙනදා වාහන පෝලිම නිසා පාරවල් වැහිලා. වෙනදාට අපි දකිනවා, ඉල් මහ විරු සමරුව තිබෙනවා නම් පාරවල් ඔක්කොම වැහිලා, JVP එකෙන් පිරෙනවා. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ඒක විහාර මහාදේවී උද්‍යානයට විතරක් කොටු වුණා.

21වැනි දා විපක්ෂයේ රැස්වීම තියනකොට, අනුර කුමාර දිසානායක මහත්මයා 20වැනි දාට තංගල්ලේ රැස්වීමක් දමා ගත්තා. තංගල්ලේ රැස්වීම දමා ගත්තාට සෙනඟ ගෙනෙන්න විධියක් නැහැ. මොකද, රටේ ජනතාව ආණ්ඩුවට විරුද්ධයි. මෙන්න, DIG මහත්මයා හම්බන්තොට දිස්ත්‍රික්කයේ Division එකට ලියුමක් ගහලා තිබෙනවා. ඊට පස්සේ මාතර දිස්ත්‍රික්කයේ, ගාල්ල දිස්ත්‍රික්කයේ Divisionsවලට ලියුමක් ගහලා තිබෙනවා, සෙනඟ ගෙනෙන්න ඕනෑ විධිය ගැන. උදාහරණයක් වශයෙන් මම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලියුම කියවන්නම්. දැන් මේ තංගල්ලේ තිබෙන රැස්වීමට තංගල්ල පොලීසියෙන් 397ක්; බෙලිඅත්ත පොලීසියෙන් 420ක්; වලස්මුල්ල පොලීසියෙන් 360ක්; වීරකැටිය පොලීසියෙන් 414ක්; මිද්දෙණිය පොලීසියෙන් 246ක්; අඟුණුකොළපැලැස්ස පොලීසියෙන් 264ක්; කිරින්ද පොලීසියෙන් 36ක්; වරාය පොලීසියෙන් 36ක්; තිස්සමහාරාම පොලීසියෙන් 198ක් ගෙනෙන්න ඕනෑ. මේක අමුතුම විධියක්. හිතන්නකෝ, OIC මහත්මයා තංගල්ලේ, එහෙම නැත්නම් වීරකැටියේ කියලා. ඊට පස්සේ වීරකැටියේ OIC මහත්මයා වසම භාර පොලිස් නිලධාරියාට කියනවා, ඔබතුමා ගමෙන් පස්දෙනෙකු ගෙනෙන්න ඕනෑ කියලා. හැම වසමටම මෙහෙම කියා තිබෙනවා. මාර වැඩක් නේ වෙලා තිබෙන්නේ. මේක නිකම් නොවෙයි, ලිඛිතව එවලා තිබෙන්නේ. අනුර කුමාර දිසානායක මහත්මයා

තංගල්ලේ රැස්වීමක් කරන්න ගියාම පොලීසියට එන්න කියනවා. අද පොලීසියේ නිලධාරින් කලකිරීමෙන් ඉන්නේ. ඇයි? දේශපාලනඥයන්ට කඩේ යන්න, දේශපාලනඥයන්ට සෙනඟ අදින්න ද පොලීසිය ඉන්නේ? මෙකේ හොඳම වැඩේ මෙන්න මේකයි. මහ checkpoints දාලා තිබෙනවා. අර අදාළ නිලධාරියා තමන්ගේ වසමෙන් පස්දෙනෙකු ගෙනාවාද කියලා ලියන්න. ඒකට වෙනම නිලධාරින් දාලා ඉන්නවා. මේ පිළිබඳ සියලු විස්තර සම්පූර්ණ සාක්ෂි සහිතව මා ළඟ තිබෙනවා. මම පොලීසිය භාර ඇමතිතුමාට, නියෝජ්‍ය ඇමතිතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් මේක බොරුවක් කියලා කියන්න. බොරුවක් කියලා කියපු සැනින් මම මේ තොරතුරු එළියට දමනවා. අර DIG මහත්මයාට අපහාසයක් වන නිසා මම මේක එළියට දමන්නේ නැහැ. හැබැයි, මේක බොරුවක් කියලා ඔබතුමන්ලා කිව්වොත්, එහෙම කියලා විනාඩි 5ක් ඇතුළත මම මේ විස්තර එළියට දමනවා. ඒ, දෙවැනි කාරණය.

තුන්වෙනි එක තමයි, කැබ් රථ පිළිබඳ කාරණය. ඔබතුමන්ලා කැබ් රථ දෙනවා නේද? කැබ් ටෙන්ඩරය කොහොම වංචාවක්ද කියලා මම පළමුවෙන්ම පැහැදිලි කළා. මේ කැබ් රථ ලබා දෙන ටෙන්ඩරයෙන් කොහොමද දූෂණයක් වෙන්නේ කියලා මම පැහැදිලි කළා. හැබැයි, එදා මම සමාගමේ නම කිව්වේ නැහැ. මොකද, international tender එකක් කියන්නේ, දවස් 42ක් යන්න ඕනෑ ටෙන්ඩර් එකක්. ඒක එකපාරට දවස් 12ට අඩු කරලා; pre-bid meeting එකක් නැහැ. සාමාන්‍යයෙන් ලක්ෂ 10ක ටෙන්ඩරයකට වුණත් pre-bid meeting එකක් තිබෙනවා. හැබැයි, අද බිලියන 60ක ටෙන්ඩරයකට pre-bid meeting එකක් නැහැ. ඕනෑම ටෙන්ඩරයකට bidersලාට අවස්ථාවක් දෙනවා, ඇවිල්ලා කියන්න, "මෙන්න ප්‍රශ්නය, මේ වාගේ ප්‍රශ්න තිබෙනවා, අපට මෙහෙම extension එකක් දෙන්න. එහෙම නැත්නම්, මේකේ දෙන specification එකේ ප්‍රශ්නයක් තිබෙනවා" කියලා. හැබැයි, එහෙම එකක් නැහැ. කැබ් රථ සම්බන්ධයෙන් ලංකාවේ තිබෙන සමාගම් 30න් එක සමාගමකට විතරක් ටෙන්ඩරය දමන්න පුළුවන් වෙන්න තමයි ඔබතුමන්ලා මේක හැදුවේ. හැබැයි, එහෙම specification එක හදලා තිබෙද්දීත් ලංකාවේ සමාගම් පහක් එනවා, international සමාගම් පහක් එනවා, ටෙන්ඩරයට. ඒ පහෙනුත් ටොයොටා සමාගම ඇරෙන්න අනෙක් හතරම reject වනවා. පළමු සමාගම reject වන්නේ, specification එක 2500-3000 cc අතර නැති නිසා. ඊට පස්සේ දෙවැනි සමාගමත් reject වනවා. ඒ, කැබ් එකේ specification එක 2500-3000 cc අතර නැති නිසා. ඒ වාගේම කොළඹට අමතරව stations පහක් රට වටේ තිබෙන්න ඕනෑය කියලා තිබෙනවා. Stations පහක් තිබෙන්නේත් ටොයොටා සමාගමට විතරයි. එතකොට තුන්වැනි සමාගමත් reject වනවා. හතරවැනි සමාගමත් reject වනවා. ඒ සමාගමටත් specification එක 2500-3000 cc අතර නැහැ. පස්වැනි සමාගමත් reject වනවා. කෙළින්ම කථා කර ගත්ත විධියට ටෙන්ඩර් විවෘත නොකරම ටොයොටා සමාගමට ටෙන්ඩරය දුන්නා නම් හරි. මොකද, ලංකාවේ stations පහක් තිබෙන්නේ අවුරුදු දහයක් පරණ ටොයොටා සමාගමට විතරයි. ඒ cubic capacity එක match කරන්න පුළුවන් සමාගමකට තිබෙන්නේ එම සමාගම විතරයි. ලංකාවේ වෙනත් කිසිම සමාගමකට මේක match කරන්න බැහැ. මේක සම්පූර්ණයෙන් ඩීල් එකක්. ලංකා ඉතිහාසයේ කවදාවත් දවස් 12කින් ටෙන්ඩරයක් වහන්නේ නැහැ. කැබ් රථ ගැනීම emergency දෙයක් වෙන්නේ කොහොමද? ඒකට එච්චර හදිසිද? මේ වාගේ අන්ත දූෂිත ටෙන්ඩර්වලට විරුද්ධව තමයි ජනතාව 21වැනි දා රැලියට එන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම අද එන ගමන් "පත්තරේ විස්තරේ" වැඩසටහන බලමින් ආවා. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම මේ කාරණය දැනගන්න කැමැතියි. පොලිස් වාර්තාවක් ගන්නකොට ග්‍රාම නිලධාරි සහතිකය විතරයි කලින් අවශ්‍යව තිබුණේ. දැන් ග්‍රාම නිලධාරි සහතිකයට අමතරව මහජන ආරක්ෂක කමිටුවේ අනුමැතියක් ඕනෑය කියලා ඔබතුමන්ලා අලුතෙන් චක්‍රලේඛයක් නිකුත් කළාද? ගරු ඇමතිතුමනි, ඔබතුමාගෙන් මම මේ ප්‍රශ්නය අහන්නේ? එහෙම චක්‍රලේඛයක් දැන් නිකුත් කරලා තිබෙනවාද? ඔබතුමා උත්තරයක් දෙන්න, "yes" ද, "no" ද කියලා. මගේ වෙලාව අරගෙන උත්තරයක් දෙන්නකෝ. මොකද අද උදේ මාධ්‍ය තුළින් වාර්තා කළා, පොලිස් සහතිකයක් ගන්න ඕනෑ නම්, මහජන ආරක්ෂක කමිටුවේ අනුමැතිය ගන්න ඕනෑය කියලා. එතැන ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අද මට කථා කළා, දෙහිවල ප්‍රදේශයේ පුද්ගලයෙක්. ඔහු මට කථා කරලා කියනවා, "අපට දැන් ග්‍රාම නිලධාරි සහතිකය නම් ගන්න පුළුවන්. හැබැයි, මහජන ආරක්ෂක කමිටුවේ සභාපතිගේ අනුමැතිය ගන්න විධියක් නැහැ. ඒ සභාපති කුඩුත් එක්ක අහු වෙලා හිරේ" කියලා. මොකද, මාලිමාවේ මන්ත්‍රීවරියකගේ මහත්තයා තමයි මහජන ආරක්ෂක කමිටුවේ සභාපති. පොලිස් වාර්තාව ගන්න විධියක් නැතුව දෙහිවල ප්‍රදේශයේ සිටින ඒ පුද්ගලයා දැන් ලොකු ප්‍රශ්නයක ඉන්නේ. ග්‍රාම නිලධාරි අනුමත කරනවා. හැබැයි, මහජන ආරක්ෂක කමිටුවේ සභාපති හොයාගෙන ගියාම, ඒ පුද්ගලයා හිරේ. මහජන ආරක්ෂක කමිටුව කියන්නේ මොකක්ද? දේශපාලන පත්වීමක්. මන්ත්‍රීවරියකගේ මහත්තයාට පත්වීම දෙනවා. දෙහිවල මහජන ආරක්ෂක කමිටුවේ සභාපති විධියට ඉන්නේ මාලිමාවේ මන්ත්‍රීවරියකගේ මහත්තයා. හැම තැනම ඉන්නේ මාලිමාවේ අපේක්ෂකයන්ගේ ඥාතීන්. එතකොට රටේ මොකක් හරි රැකියාවකට යද්දි පොලිස් සහතිකයක් ගන්න ඕනෑ වුණාම අනුමැතිය ගන්න රාජ්‍ය නිලධාරියාට තිබුණු බලය අයින් කරලා දේශපාලනඥයෙක්ගේ පවුලේ නෝනා හෝ මහත්තයා දා ගන්න ක්‍රමයක් ඔබතුමන්ලා හදලා තිබෙනවා.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය කියන්නේ, ලංකාවේ මුදල් සංසරණය වන ප්‍රධානම තැනක්. මෙම අමාත්‍යාංශය හරහා තමයි ගමට මුදල් යන්නේ; ඒ, ගමට සල්ලි යන තැන. හැබැයි, අද අය වැයේ මොකක්ද වෙලා තිබෙන්නේ? අද ප්‍රාග්ධන වියදම්වලට, එහෙම නැත්නම් මූලධන වියදම්වලට සියයට 13යි වෙන් වෙලා තිබෙන්නේ. සියයට 87ක් වෙන් වෙලා තිබෙන්නේ පුනරාවර්තන වියදම්වලට. පඩිනඩි ගෙවන්න විතරයි මුදල් වෙන් වෙලා තිබෙන්නේ. අද ගමේ පාරක් හදන්න, ගම සංවර්ධනය කරන්න, ගමේ පාලම හදන්න මුදල් වෙන් වෙලා නැහැ. පළමුවැනි වතාවටයි මෙහෙම වෙලා තිබෙන්නේ. සාමාන්‍යයෙන් ඉතිහාසයේ අවම වශයෙන් සියයට 30ක්වත් මූලධන වියදම් සඳහා වෙන් වුණා. අඩුම සියයට 30ක්වත් ඒ සඳහා වෙන් කරනවා. පුනරාවර්තන වියදම් තමයි සියයට 70ක් විතර තිබුණේ. හැබැයි, අද මූලධන වියදම් සියයට 13 දක්වා අඩු කරලා තිබෙනවා. මේ නිසා money circulation අඩු වනවා; එතකොට ආර්ථිකය හැකිළෙනවා. ගමට සල්ලි යන ක්‍රමය සම්පූර්ණයෙන් නැති වනවා. ගමේ ඉන්න පුංචි ව්‍යාපාරිකයාට, කම්කරුවාට රැකියා අවස්ථා නැති වනවා. අපේ construction field එකේ ඉන්නවා, ලක්ෂ 15කට ආසන්න පිරිසක්. ඒ සියලුදෙනාට රැකියා අහිමි වනවා. ඒ නිසා මේ හදන ක්‍රමවේදය තුළ අද ගමට සල්ලි යන්නේ නැහැ. හැබැයි පසුව කියාවි, සල්ලි නොගියාට ප්‍රශ්නයක් නැහැ, අපි රුපියල් ට්‍රිලියනයක fixed deposit එකක් දාලා තිබෙන්නේ කියලා. මොකද, ගමට සල්ලි යන්නේ නැහැ නේ, වැඩක් කරන්නේ නැහැ. ඉතින් ඒ සල්ලි ටික fixed deposit එකක දාලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, දැන් GMOA එකේ strike එකක් යනවා. පිටතින් බෙහෙත් ගෙනෙන්න කියලා දැන් වෛද්‍යවරුන් තුණ්ඩු ලියන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තව තත්පර 20ක කාලයක් ලබා දෙන්න.

අද bypass surgery එකක් කරන්න ගියාම රුපියල් ලක්ෂයක විතර දේවල් පිටතින් ගේන්න ඕනෑ. හැබැයි, දැන් ඒ තුණ්ඩු ලියා දෙන එකත් නවත්වා තිබෙනවා. ඒ නිසා අද bypass surgeries නැවතිලා තිබෙනවා. සමහර රෝහල්වල vitamin C පෙත්තවත් නැහැ. සමහර රෝහල්වල iron tabletsවත් නැහැ. පිටතින් බෙහෙත් ගන්න තුණ්ඩු ලියා දෙන එකත් අද නැවතිලා තිබෙනවා. එම නිසා කඩිනමින් මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ. මෙම ප්‍රශ්නය කඩිනමින් විසඳුවේ නැත්නම් විශාල ගැටලුවක් මතු වෙනවා. දැන් වෛද්‍යවරුන්ට බෙහෙත් තුණ්ඩුවක් ලියන්නත් බැහැ. ඒ සඳහා ඉස්සෙල්ලාම යන්න ඕනෑ, nursing officerට. ඊළඟට යන්න ඕනෑ, consultantට. ඊළඟට යන්න ඕනෑ, directorට. ඊට පස්සේ ආපහු එනවා, doctorට. අද ඒකත් නැවතිලා තිබෙනවා. රටේ ජනතාවට bypass surgery එකක් කර ගන්න බෙහෙත් ටික ගන්න ක්‍රමවේදයත් අද නැති වෙලා තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා මතු කළ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර පොලිස් වාර්තාවක් ගැනීමේදී, සිවිල් ආරක්ෂක කමිටු තිබෙන කාලයේ සිවිල් ආරක්ෂක කමිටුවේ සභාපතිගෙන් වාර්තාවක් අවශ්‍ය වුණා. එම සිවිල් ආරක්ෂක කමිටු මේ වනකොට "මහජන ආරක්ෂක කමිටු" වශයෙන් නම වෙනස් කර තිබෙනවා. කලින් කෙරුණු ක්‍රියාවලියම තමයි දැන් මෙම කමිටුවෙනුත් කෙරෙන්නේ. අලුත් දෙයක් නොවෙයි. නම වෙනස්වීම පමණයි තිබෙන්නේ.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට තත්පර 10ක් දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මේක විවාදයක් කර ගන්න එපා, ගරු මන්ත්‍රීතුමා. තත්පර 15කින් කියලා ඉවර කරන්න.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු අමාත්‍යතුමනි, අපි මේ ප්‍රශ්නය ගැන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින නිලධාරින් ඇතුළු හැම කෙනෙකුගෙන්ම විමසුවා. එතකොට ඔවුන් කිව්වේ ග්‍රාම නිලධාරි සහතිකය පදනම් කරගෙන තමයි පොලීසියෙන් මේ වාර්තාව දිගටම දුන්නේ කියලා. දැන් ඔබතුමන්ලා මහජන ආරක්ෂක කමිටු දේශපාලනීකරණයට ලක් කරලා. තමන්ගේ මන්ත්‍රීවරියන්ගේ මහත්වරු එම කමිටුවලට දාගෙන, ඒ අය හිරේ ගියාම - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 1.34]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අද දවසේ කම්කරු අමාත්‍යාංශයේ සහ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙනවා. ගම්වල කථාවක් තිබෙනවානේ, ගැරඬින්ට හූම් තෙල් ගැහුවා වාගේ කියලා. මීට කලින් කථාව ඇහුවාමත් මට හිතුණේ එහෙමයි, ගැරඬින්ට හූම් තෙල් ගැහුවා වාගේ. අපි මත්ද්‍රව්‍ය උවදුර සම්පූර්ණයෙන්ම රටෙන් තුරන් කරන්න ඕනෑ කරන මෙහෙයුම දියත් කරනකොට ගැරඬින්ට හූම් තෙල් ගහලා වාගේ තමයි, විපක්ෂයේ අය. ඒ, ඇයි? මේගොල්ලන් විවිධ විධියට මත්ද්‍රව්‍ය ජාවාරමත් එක්ක, මත්ද්‍රව්‍ය වෙළෙඳාමත් එක්ක සම්බන්ධයි. ඉතින් ගැරඬින්ට හූම් තෙල් ගහලා වාගේ තමයි.

අපි රට පුරා තිබෙන අපරාධ මර්දනය කරන්න මෙහෙයුම් දියත් කරනකොට, අන්න ගැරඬින්ට හූම් තෙල් ගහලා වාගේ මෙතුමන්ලා කලබල වෙලා තිබෙනවා. අපේ පොලීසිය, හමුදාව ඇතුළු ආරක්ෂක අංශ මැදිහත් කරගෙන සංවිධානාත්මක අපරාධ මර්දනය කරන්න ඕනෑ කරන මෙහෙයුම දියත් කරනකොට, අන්න ගැරඬින්ට හූම් තෙල් ගහලා වාගේ. පාතාලය මර්දනය කරන්න මැදිහත් වනකොට, ගැරඬින්ට හූම් තෙල් ගහලා වාගේ හැසිරෙනවා අපි දැක්කා. කලබල වන්න දෙයක් නැහැ. හෙට දවසේ "රටම එකට" ජාතික මෙහෙයුමේ තවත් එක වැඩසටහනක් තංගල්ලේදී පැවැත්වෙනවා. පසුගිය ඔක්තෝබර් 30වෙනි දා සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී ඒ වැඩසටහන සඳහා මෙහෙයුම, ජාතික ව්‍යාපාරය ආරම්භ කළා. එදාත් අපි මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරුන් කැඳෙව්වා, විශේෂයෙන්ම බස්නාහිර පළාතේ. ඒක මහජන ආරක්ෂක අමාත්‍යාංශයේත්, පොලීසියේත් කටයුත්තක්. ඒ කටයුත්ත හෙට දියත් වනවා, තංගල්ලේ. ඒකට ජනාධිපතිතුමාත් සහභාගි වනවා, මේ මෙහෙයුමේ ප්‍රධානියා විධියට. ඒ හැර වෙන කිසිවක් නැහැ. *[බාධා කිරීමක්]*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
නැහැ, ප්‍රශ්න එපා. මගේ කථාවෙන් පස්සේ අහන්න. නැහැ, මම මොකුත් කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* ඕනෑ නැහැ. තත්පර 10ක්වත් දෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඔයගොල්ලන්ගේ ප්‍රශ්නවලට ඇති තරම් උත්තර දීලා තිබෙනවා. දැන් දුන්නේත් ඒ වාගේ උත්තරයි. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ. දැන් මම කියපු එක ඔබට අදාළද චානක? ඔබට අදාළද? "ගැරඬින්ට හූම් තෙල් ගහලා වාගේ" යනුවෙන් කියපු එක ඔබට අදාළද? ඔබට අදාළද? ඔබට අදාළ නැත්නම් වාඩි වෙන්න. *[බාධා කිරීමක්]* නැහැ, මම ඉඩ දෙන්නේ නැහැ. ඕනෑ නම් මූලාසනයෙන් ඉඩ ගන්න, මම දෙන්නේ නැහැ.

මේ විවාදය දවසේත් මේ විවාදයට අදාළ දේවල් නොවෙයි වෙන වෙන දේවල් තමයි කියන්නේ. හැම දාම මෙහෙමයි. අය වැය විවාදය කියන්නේ ඇත්තටම ආණ්ඩු පක්ෂයේ විවාදයක් නොවෙයි, මේක විපක්ෂයේ විවාදයක්. මේකට කාලය වෙන් කිරීමේදීත් විපක්ෂයට තමයි වැඩි කාලයක් වෙන් කරන්නේ. ඇයි, ඔවුන්ගේ විවාදය නිසා. ඒ නිසා ඔවුන්ට වැඩි අවස්ථාවක් දීලා තිබෙනවා, මේ අය වැය තුළ, විශේෂයෙන්ම අද දවසේ සාකච්ඡා කරන අමාත්‍යාංශ දෙක තුළ අපි කරපු වැඩ මොනවාද, කරන වැඩ මොනවාද, ඒවායේ තිබෙන අඩු පාඩු මොනවාද කියා පෙන්වා දෙන්න, සාධනීය විවේචන කරන්න. නමුත් ඒ මොකක්වත් කෙරෙන්නේ නැහැ. වතු කම්කරු සහෝදරයින්ට රුපියල් 200 වැඩි කරනකොටත් ගැරඬින්ට හූමි තෙල් ගැහුවා වාගේ හැසිරෙනවා, ඒ ඔක්කෝම, විපක්ෂයේ ඔක්කෝම ඒකටත් විරුද්ධයි. එක පක්ෂයක් විතරක් නොවෙයි, හැම පක්ෂයම විරුද්ධයි. අද එහෙම තත්ත්වයක් මතු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම කැමැතියි, මේ විවාදය තුළත්, පසුගිය දින කිහිපයේත් මතු වුණු කරුණු කිහිපයක් සම්බන්ධයෙන් පැහැදිලි කරන්න. එකක් තමයි, විශ්‍රාම වැටුප් ගැටලුව. මම එකක් කියන්න ඕනෑ, විපක්ෂයේ සමහරුන්ට. මේ අය සමහර කරුණු, නොදන්නා දේවල් නොකියා ඉන්නවා නම් හොඳයි. එතකොට තමන්ගේ නොදන්නාකම ප්‍රදර්ශනය වන්නේ නැහැ.

විශේෂයෙන්ම විපක්ෂ නායකතුමා ඇතුළු සැලකිය යුතු පිරිසකට මට කියන්න ඕනෑ කරන්නේ, නොදන්නා දේවල් කථා නොකර හිටියොත් හොඳයි කියන එකයි. ඒ ඇයි? දැන් විශ්‍රාම වැටුප් ප්‍රශ්නය බලන්න.  මොකක්ද මේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය? එකක් තමයි, මෛත්‍රී-රනිල්-සජිත් ආණ්ඩුව 2016දී හදපු ප්‍රශ්නය. 2016.01.01 දින සිට විශ්‍රාම ගිය, 100,000කට ආසන්න විශ්‍රාමිකයෝ පිරිසක් හිටියා. ඔවුන්ට ඒ මොහොතේ ලැබිය යුතු විශ්‍රාම වැටුප ලබා දුන්නේ නැහැ, ඒක කල් දැම්මා 2020 වර්ෂය දක්වා. ඊට පස්සේ මොකද වුණේ? ඊට පස්සේ ජනවාරි මාසයේ 02වෙනි දා ගෝඨාභය රාජපක්ෂගේ ආණ්ඩුවේ කැබිනට් මණ්ඩලයෙන් තීරණය කළා, අන්න අර කල් දාපු විශ්‍රාම වැටුප නොදී ඉන්න. ඊට පස්සේ ප්‍රශ්නයක් මතු වුණා. අවුරුදු 5ක් තිස්සේ ඒ ප්‍රශ්නය විසඳුවේ නැහැ. දැන් ඩී.වී. චානක මන්ත්‍රීතුමා කියනවා, විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ තිබුණු එක දෙන්න ලු. ඒ කියන්නේ අපේ ආණ්ඩුවේ පළමු අය වැය -2025 අය වැය- එතුමා කියවලා නැහැ. එතුමා දන්නේ නැහැ, අපි මොකක්ද කළේ කියලා. විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ සඳහන් කළ ඒ වැටුප අදියර 3කින් -2025දීත්, 2026දීත් සහ 2027 ජූලි මාසදීත්- ලැබෙනවා. එතකොට ඒ ප්‍රශ්නය විසඳෙනවා. එතකොට, දැන් අපේ රටේ සිටින 2024.12.31 දක්වා විශ්‍රාම ගිය සියලුම විශ්‍රාමිකයින් එක් වැටුප් තලයකට ගෙනැල්ලා තිබෙනවා, අපේ ආණ්ඩුව. මේ ප්‍රශ්නය විසඳා තිබෙනවා.

අපට ඊළඟට ප්‍රශ්නයක් ඉතුරු වෙලා තිබෙනවා. ඒ මොකක්ද? 2024.12.31 දක්වා විශ්‍රාම ගිය විශ්‍රාමිකයින් 725,000ක් අපේ රටේ ඉන්නවා. දැන් තිබෙනවා, තව ප්‍රශ්නයක් විසඳන්න. ඒ ප්‍රශ්නය විසඳන්න මේ වතාවේදීත් අපි අය වැය තුළ සාකච්ඡා කළා, වැටුප් සාකච්ඡාවලදී, විශ්‍රාම වැටුප් සාකච්ඡාවලදී. නමුත්, අපට ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට, විශ්‍රාම ගිය අපේ මේ වැඩිහිටි සහෝදරත්වය -වැඩිහිටි සහෝදර, සහෝදරියෝ; ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ- මේ කාරණය තේරුම් ගන්න ඕනෑ. අපි මේ ප්‍රශ්නය ඉතාම පැහැදිලිව විසඳනවා. "2024 විශ්‍රාමික" කියලා විශේෂ කණ්ඩායමක් නැහැ. 2024.12.31 දක්වා විශ්‍රාම ගිය 725,000ක් ඉන්නවා. දැන් ඔවුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. මොකක්ද, ප්‍රශ්නය? 2025 ජනවාරි විශ්‍රාම ගිය අයට සහ එතැනින් පසු විශ්‍රාම යන අයට අපේ වැටුප් වැඩිවීමත් එක්ක විශාල වැටුප් වැඩිවීමක් සිදු වුණා. සමහරුන්ට රුපියල් 40,000ක, 50,000ක, 60,000ක වාගේ වැටුප් වැඩිවීමක් ලැබුණා. හැබැයි, 2024.12.31 දක්වා විශ්‍රාම ගිය අයට ඒ වැඩිවීම ලැබෙන්නේ නැහැ. ඔන්න, තිබෙන ප්‍රශ්නය. දැන් අපට ඉතුරු වෙලා තිබෙනවා, ඒ ප්‍රශ්නය. ඒ ප්‍රශ්නය අපි විසඳනවා. ඒ ප්‍රශ්නය විසඳන දින වකවානු අපි ඉස්සරහට බලමු. ඒ නිසා අපි මේ වැඩිහිටි සහෝදරවරුන්ට මේ කාරණය කියනවා. ඔවුන් උද්ඝෝෂණ කරනවා. මම දන්නේ නැහැ, අදත් ඔවුන් පොල්දූවට ආවාය කියලා විපක්ෂ නායකතුමාගේ පැත්තෙන් කිව්වා. එම නිසා අපි ඒ අයට කියන්න ඕනෑ, කාගේ කාගේ හෝ ලණු කාලා මේ වැඩේ කරන්න එපා, අපි මේ ප්‍රශ්නය විසඳනවාය කියන එක. අපට ඔවුන්ගේ දුක, වේදනාව, ගැටලු ඉතාම හොඳින් තේරෙනවා, මේ මහත්වරුන්ට වඩා. මේ මහත්වරු විසඳපු නැති ප්‍රශ්නය තමයි අපි විසඳුවේ. ඒ නිසා අපි අනිවාර්යය ලෙසම මේ ප්‍රශ්නය විසඳනවා. ඒ සඳහා අපට කාලය අවශ්‍යයි. කාලය පිළිබඳව ප්‍රශ්නයක් විතරයි තිබෙන්නේ.

ඒ වාගේම, **1**997 සිට 2021.12.31 දක්වා විශ්‍රාම ගිය 85,000කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා, අපේ ගුරු, විදුහල්පතිවරු. ඔවුන්ගේ ප්‍රශ්නයත්, මේ මම කියපු ප්‍රශ්නය විසඳෙනකොට විසඳෙනවා. 2024.12.31 දක්වා විශ්‍රාම ගිය හැමෝම 2025 විශ්‍රාම වැටුපට පිහිටුවනකොට ඔවුන්ගේ ප්‍රශ්නයත් විසඳෙනවා. ඒ නිසා මේ ප්‍රශ්න දෙකම ගැන අපට මනා අවබෝධයක් තිබෙනවා. මේ ගැන අපට කවුරුවත් පාඩම් කියා දෙන්න ඕනෑ නැහැ. අපි වෘත්තීය සමිති නායකයෝ. අපි මේ ප්‍රශ්නය හොඳින් හඳුනන, හොඳින් දන්නා පිරිසක්. ඒ නිසා අනිවාර්යය ලෙසම අපි මේ ප්‍රශ්නය විසඳනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කිසිදු අරගළයක්, ඉල්ලීමක්, උද්ඝෝෂණයක්, අඩුම ගණනේ පෝස්ටරයක්, පත්‍රිකාවක් බෙදන්නේ නැතුව මේ අය වැය තුළ මේ වැටුප් වැඩි කිරීම අපි කර තිබෙනවා. අපට මතකයි, ඉතිහාසයේ අපි අය වැය තුළින් වැටුප් දිනාගන්න, දීමනා දිනාගන්න මොන තරම් අරගළ කළාද කියලා. සොච්චමක් දිනාගන්න අපි මොන තරම් අරගළ කළාද? ඉතින්, අපේ පළමු අය වැයෙන් සියයට 60ත්, 80ත් අතර වැටුප් වැඩිවීමක් කළා. වැටුප් වර්ධකය සියයට 80කින් වැඩි කළා. පසුගිය අය වැයෙන් ආපදා ණය සීමාව රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා වැඩි කළා. මෙවර අය වැයෙන් ආපදා ණය ගෙවන්න රුපියල් මිලියන 10,000ක් වෙන් කළා. ඒ වාගේම, උත්සව අත්තිකාරම් දීමනා රුපියල් 10,000 සිට රුපියල් 15,000 දක්වා වැඩි කළා. ඉතිහාසයේ ඉල්ලීම් තිබුණා තමයි. හැබැයි, මේ අය වැය පදනම් කරගෙන සටන් මොකුත් තිබුණේ නැහැ. එවැනි වටපිටාවක් ඇතුළේ අපි විශේෂයෙන්ම රාජ්‍ය සේවකයින් ඉලක්ක කරගත් සහන රැසක් දීලා තිබෙනවා. ඒ වාගේම, දේපළ ණය ලබා ගන්නා අයට මුල් රුපියල් ලක්ෂ 30 දක්වා සියයට 4ක පොලී සහනයක් ද, රුපියල් ලක්ෂ 30 සිට රුපියල් ලක්ෂ 50 දක්වා සියයට 2ක පොලී සහනයක් ද ලබා දී තිබෙනවා.

ඊළඟට, 9,800කට ආසන්න තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ සහන පදනම මත බඳවාගෙන සිටින සේවකයින් ස්ථිර කරන්න කටයුතු කරනවා. ඒ වාගේම, අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවල ගේට්ටු මුරකරුවන්ට ලබා දෙන දීමනාව රුපියල් 7,500 සිට රුපියල් 15,000 දක්වා දෙගුණයකින් වැඩි කර තිබෙනවා. අපි කියන්නේ නැහැ, ජීවත් වෙන්න ඔවුන්ට මේ මුදල ප්‍රමාණවත් කියලා. හැබැයි, මතක තබා ගන්න, සියයට සියයකින් ඔවුන්ගේ දීමනා වැඩි කර තිබෙනවාය කියන එක. මේ විධියට රාජ්‍ය සේවකයින්ට ඉතාම හොඳ වටිනාකම් දීපු අය වැයක් ලෙස මේ අය වැය අපට හඳුන්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට කියන්න ඕනෑකම තිබෙනවා, මේ කාරණයත්. විශේෂයෙන්ම අපේ කම්කරු අමාත්‍යාංශය පදනම් කරගෙන පසුගිය කාලය තිස්සේ අපි

[ගරු මහින්ද ජයසිංහ මහතා]

වැඩසටහන් රැසක් දියත් කළා. දැන් වාහන ගැන කථා වෙනවා නේ; විශේෂයෙන් කැබ් රථ ගන්නා එක ගැන. මා ළඟ තිබෙනවා, අපේ කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු කාර්යාලවල තිබෙන වාහන කිහිපයක් ගැන විස්තරයක්. හැම වාහනයකම විස්තර තිබෙනවා. කොළඹ අවුරුදු 40ක්, ගම්පහ අවුරුදු 25ක්, කළුතර අවුරුදු 25ක්, මහනුවර අවුරුදු 40ක්, ගාල්ලේ අවුරුදු 30ක්, යාපනයේ අවුරුදු 28ක්, කුරුණෑගල අවුරුදු 32ක්, බදුල්ලේ අවුරුදු 29ක් පරණ වාහන තිබෙනවා. අවුරුදු 25කට වැඩි හැම වාහනයක්ම ඉංජිනේරු කාර්යාලයේ තිබෙන්නේ. ඉතින් කොහොමද මේවායින් වැඩ කරන්නේ? දැන් වාහන 2,000ක් ගන්න තීරණය කරලා තිබෙනවා. ඒකෙන් වාහන 1,775ක්ම රාජ්‍ය නිලධාරින්ට වෙන් කරපු කැබ් රථ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, කරුණු ගණනාවක් කියන්න තිබෙන නිසා මට ආණ්ඩු පක්ෂයේ කාලයෙන් පොඩි වෙලාවක් දෙන්න. මම සංවිධායකයින් එක්ක කථා කරලා වෙලාව වෙනස් කර ගන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
තවත් වැඩිපුර විනාඩි දෙකක කාලයක් ඔබතුමාට ලැබෙනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
හොඳයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

අපි විශේෂයෙන්ම අවධානය යොමු කරලා තිබෙනවා, කම්කරු දෙපාර්තමේන්තුවේ නීති, අණපනත් වෙනස් කිරීමට. විශේෂයෙන්ම අපි තීරණය කරලා තිබෙනවා, මේ වනවිට තිබෙන කම්කරු පනත් 14ක් කොටස් 4කට වෙන් කරලා සංශෝධනය කරන්න. ඒකටත් කියනවා, පරණ එක ලූ. නැහැ, පරණ එක නොවෙයි, අලුත් පනත් හතරක් හදන්න කටයුතු කරනවා. ඒ, කාර්මික සබඳතා පැත්තෙන් පනතක්, ශ්‍රම ප්‍රමිතිය පැත්තෙන් පනතක්, වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පැත්තෙන් පනතක්, වෘත්තීය සමිති පැත්තෙන් පනතක් ආදී වශයෙනුයි. දැනට තිබෙන පනත්, පනත් කෙටුම්පත් හතරක් විධියට සංශෝධනය කරන්න අපි තීරණය කරලා තිබෙනවා. මේ කමිටුව දැනටමත් අවස්ථා හතරක් රැස් වෙලා තිබෙනවා. අපි පත් කරලා තිබෙන විද්වත් කමිටුව කැබිනට් අනුමැතියෙන් අවස්ථා හතරක් රැස් වෙලා මේ පනත් සංශෝධනය කරන්න ඕනෑ කරන කටයුතු දියත් කරමින් තිබෙනවා. ඒ වාගේම කාලයක් තිස්සේ කම්කරු දෙපාර්තමේන්තුවේ, අපේ අමාත්‍යාංශයේ නිලධාරින්ට පුහුණු සැසි තිබුණේ නැහැ; පුහුණු වැඩසටහන් තිබුණේ නැහැ. ඒක විශාල ගැටලුවක් වෙලා තිබුණා. ඒ නිසා පසුගිය කාලයක් තිස්සේ පුහුණු වැඩසටහන් 387ක් දියත් කරලා තිබුණා. 39,420ක් ඒ සඳහා සහභාගි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ විතරක් නොවෙයි. අපි පසුගිය කාලය තිස්සේම තවත් වැඩසටහන් රැසක් දියත් කළා. විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශය යටතේ තිබෙනවා, තවත් ආයතන ගණනාවක්. අපේ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය සම්බන්ධ කරගෙන රට පුරා වැඩසටහන් රැසක් දියත් කළා. අනික් එක තමයි, මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව. මේ ආයතන පදනම් කරගෙන අපි වැඩසටහන් රැසක් දියත් කළා. ඒ වාගේම අපි විශේෂයෙන්ම මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පදනම් කරගෙන ප්‍රාදේශීය රැකියා පොළවල්, දිස්ත්‍රික් මට්ටමින් රැකියා පොළවල් 24ක් දියත් කරලා තිබෙනවා. 9,968 දෙනෙක් ඒ සඳහා සහභාගි වෙලා තිබෙනවා. ඔවුන්ගෙන් සැලකිය යුතු පිරිසක් ප්‍රතිලාභ ලබා තිබෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය රැකියා පොළවල්, වෘත්තීය පොළවල් 220ක් අපි දියත් කරලා තිබෙනවා. ඒ හරහා 27,932කට ප්‍රතිලාභ ලැබිලා තිබෙනවා. මේ විධියට වැඩසටහන් රැසක් අපි දියත් කළා.

විශේෂයෙන්ම යම් යම් ආයතන තුළ තිබෙන අනාරක්ෂිත බව නිසා, සෞඛ්‍ය ප්‍රශ්න නිසා අපේ රට තුළත්, ජාත්‍යන්තර වශයෙනුත් විශාල පිරිසක් මියැදෙමින් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, අපේ රටේ පසුගිය අවුරුදු ගණනාව තිස්සේ මෙවැනි දේවල් සිදු වෙලා තිබෙනවා. මෙහිදී 160ත්, 180ත් අතර ප්‍රමාණයක් මිය යනවා. තවත් පිරිසක් මාරාන්තික නොවන අනතුරුවලට ලක් වෙනවා. මේ නිසා ඔබතුමන්ලා දන්නවාද, රටේ ජාතික ආර්ථිකයට සිදු වෙන හානිය? මේ නිසා ජාතික ආර්ථිකයට සියයට 4ක හානියක් සිදු වෙනවා. අපේ රටේ නම් ඒක ආසන්න වශයෙන් ඩොලර් බිලියන 4ක්. එවැනි විනාශයක් සිදු වෙනවා. විශේෂයෙන්ම කම්කරු දෙපාර්තමේන්තුවේ තිබෙන එම ආයතනයත්, එම අංශයත්, සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ ආයතනත් ඒකාබද්ධව වැඩසටහන් රැසක් දියත් කරලා තිබෙනවා; මේ රටේ වැඩ කරන පන්තියේ සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙනුත්, ඔවුන්ගේ ආරක්ෂාව වෙනුවෙනුත් වැඩසටහන් රැසක් දියත් කරලා තිබෙනවා. මේ වසරේ මේ දක්වා පමණක් මරණීය අනතුරු 39ක් සිදු වෙලා තිබෙනවා. 1,136ක් මාරාන්තික නොවන අනතුරුවලට ලක් වෙලා තිබෙනවා. මේ ආයතනවලින් හානි සිදු වෙනකොට මේවාට අදාළව පසුගිය කාලයට වඩා කාර්යක්ෂම වෙමින්, ක්ෂණිකව මැදිහත් වෙමින් කම්කරු දෙපාර්තමේන්තුව කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙනුත් ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ සඳහා අපි වැඩසටහන් රැසක් දියත් කරන්න අවශ්‍ය කරන මැදිහත්වීම් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මම මේ කාරණයත් කියා කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයින්ට තමන්ගේ ගිණුමේ ශේෂය නිවසේ සිට බලා ගන්න පුළුවන් වෙන විධියට, කම්කරු දෙපාර්තමේන්තුව සහ මහ බැංකුව එකම ඩිජිටල් වේදිකාවකට ගෙනෙන්න අවශ්‍යයි. මොකද, මේවා දෙපැත්තක තිබෙන්නේ. එක පැත්තකින් කම්කරු දෙපාර්තමේන්තුවේ, අනෙක් පැත්තෙන් මහ බැංකුවේ. එම නිසා අපි මේවා එකම ඩිජිටල් වේදිකාවකට ගේන්න ඕනෑ කරන මෙහෙයුම් දියත් කරලා තිබෙනවා. අපි කියන්න ඕනෑ, මීට කලින් කථා කරපු අපේ කථික මන්ත්‍රීවරුත් සඳහන් කළා වාගේ විශේෂයෙන්ම අපි ඇවිල්ලා

ගෙවුණු පසුගිය අවුරුද්දක කාලය තුළ අපේ අමාත්‍යාංශය ජාතික කම්කරු උපදේශක සභාව - NLAC එක - හයවතාවක් කැඳවා තිබෙන බව. පසුගිය ආණ්ඩු එම උපදේශක සභාව අවුරුදු එකහමාරක් තිස්සේ කැඳවන්නේ නැතුවයි තිබුණේ. සේව්‍ය, සේවක පාර්ශ්ව ඒකාබද්ධ කර ගනිමින්, ආණ්ඩුව ලෙස අපිත් මැදිහත් වෙමින් මේ ප්‍රශ්න නිරාකරණය කරගෙන කාර්මික සාමය පවත්වාගෙන යමින්, කාර්යක්ෂමතාවයෙන් රටේ නිෂ්පාදනය ඉහළ දමන්න ඕනෑ කරන මැදිහත් වීම් සිදු කරලා තිබෙනවා. *[බාධා කිරීමක්]* මට තව තත්පර 30ක කාලයක් දෙන්න, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

පසුගිය කාලය තිස්සේ ආයතනවල ප්‍රශ්න මතු වෙනකොට, ගැටලු මතු වෙනකොට ක්ෂණිකව මැදිහත් වෙමින් අපි ඒවා නිරාකරණය කරන්න අවශ්‍ය මැදිහත් වීම් සිදු කළා. එම නිසා කම්කරු අමාත්‍යාංශයේත්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේ රාජ්‍ය අංශයේ, පෞද්ගලික අංශයේ, වතු ක්ෂේත්‍රයේ, අර්ධ රාජ්‍ය අංශයේ වැඩ කරන සමස්ත ජනතාවගෙන්ම ඉල්ලනවා, අපි මේ රට පොහොසත් රටක් බවට පරිවර්තනය කරමු, අපි මේ රට හැමෝටම ජීවත් වෙන්න පුළුවන් ලස්සන රටක් බවට පරිවර්තනය කරමු කියලා. ඒ වෙනුවෙන් අපේ අමාත්‍යාංශ දෙකටම සුවිශේෂී හා විශාල කාර්යභාරයක් තිබෙනවා. එම නිසා වැඩ කරන සමස්ත ජනතාවගෙන් අපි ඉල්ලනවා, අන්න ඒ වෙනුවෙන් ඔබ සියලුදෙනා අපේ ආණ්ඩුවත් එක්ක අත්වැල් බැඳගෙන ඉදිරියට යන්න සූදානම් වෙන්න කියලා. අපිත් එක්ක අත්වැල් බැඳගෙන ඉදිරියට යමුයි කියන ආරාධනය කරමින් මා නිහඬ වෙනවා. මට කථා කරන්න වැඩිපුර කාලය ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.50]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, විශේෂයෙන්ම රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට අදාළව ඉතාම වටිනා කරුණු කිහිපයක් මේ විවාදයට එකතු කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, නොවැම්බර් මාසයේ 14වැනි දින ඇමෙරිකාව සහ ශ්‍රී ලංකාව අතර ආරක්ෂක ගිවිසුමක් අත්සන් කළා. නොවැම්බර් මාසයේ 14වැනිදා Ministry of Defence එකත්, ඇමෙරිකාවේ Montana National Guard එකත් අතර ගිවිසුමක් අත්සන් කළා. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා තමයි ඒ සඳහා මේ පැත්තෙන් අත්සන් කළේ. ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපති ජූලි චන්ග් මහත්මිය ඊයේ "X" පණිවුඩයක් නිකුත් කරමින් කියනවා, "The State Partnership Programme MoU between the Montana National Guard and Sri Lanka's Ministry of Defence was signed on 14 November and tabled today in Parliament" කියලා. ඒ කියන්නේ, ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු තානාපතිතුමිය කියලා තිබෙනවා, අත්සන් කරපු මේ ගිවිසුම ඊයේ පාර්ලිමේන්තුවේ සභාගත කළා කියලා. නමුත්, ඊයේ සභාගත කළේ නැහැ. අද සභාගත කළේත් නැහැ. මම දන්නේ නැහැ, ආණ්ඩුව ජූලි චන්ග් මහත්මියට කිව්වාද කියලා, මේක පාර්ලිමේන්තුවේ සභාගත කරනවා කියලා. ජූලි චන්ග්ට ආණ්ඩුව කියන්න ඇති. නමුත්, ජූලි චන්ග් මහත්මිය එතුමියගේ "X" පණිවුඩයේ කියනවා, පාර්ලිමේන්තුවේ සභාගත කරනවා කියලා ආණ්ඩුව දන්වලා තිබෙනවා කියලා. එහෙම එකක් වුණේ නැහැ. ඒ හින්දා අපි ආණ්ඩුවට කියනවා, බොරු කියන්න එපා කියලා. මම දන්නේ නැහැ, මේ යන විධියට ඇමෙරිකානු තානාපතිතුමියට එකක් කියනවා, අපට තව එකක් කියනවා. එතුමියට කියනවා, සභාගත කරනවා කියලා. නමුත්, මෙතැන සභාගත කරන්නේ නැහැ. ඒ හින්දා අපි ආණ්ඩුවට කියනවා, ඒ ගිවිසුම සභාගත කරන්න කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මම ඉතා ඉක්මනින් කරුණු කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. ජනාධිපතිතුමා ඊයේ කථාවේදී නොකියපු කරුණු කිහිපයක් තිබෙනවා. එතුමා ඊයේ ප්‍රධාන වශයෙන්ම කිව්වා, රවීට සහ ශානිට අපි භයවෙලා කියලා. රවීට සහ ශානිට අපි භයවෙලා නැහැ. ජනාධිපතිතුමා 2005දී වේදිකාවට නැඟලා කට්ටියක් බලයට ගෙනාවා නේ, ඒ කට්ටිය තමයි රවීටයි, ශානිටයි භයවෙලා තිබෙන්නේ. අපට භයවෙන්න අවශ්‍යතාවක් නැහැ. මොකද, රවී සහ ශානි 2015 ඉඳලා 2019 වෙනකල් අපිත් එක්ක වැඩ කළා. ඒ හින්දා අපිට එතුමන්ලාට භයවෙන්න අවශ්‍යතාවක් නැහැ. එතුමන්ලා ගැන අපට ගෞරවයකුත් තිබෙනවා.

ඒ වාගේම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රවීගෙනුයි, ශානිගෙනුයි පළි ගන්නකොට සජබයේ මන්ත්‍රීවරු තමයි මේ පාර්ලිමේන්තුව ඇතුළේ හඬ නැඟුවේ. ජනාධිපතිතුමා එදාත් මේ පාර්ලිමේන්තුවේ සිටියා. නමුත්, රවීයි, ශානියි ගැන වචනයක්වත් කථා කළේ නැහැ. ඊයේ කථා කළාට එදා නිශ්ශබ්දවයි සිටියේ. එතුමා එදා කථා කළේ නැහැ. ගෝඨාභය ආණ්ඩුව ඇවිල්ලා රවීගෙනුයි, ශානිගෙනුයි පළි ගන්නකොට විපක්ෂ නායකතුමා ඇතුළුව මේ සජබයේ මන්ත්‍රීවරු තමයි එදා වාගේම හැමදාම කථා කළේ. ඒ විතරක් නොවෙයි, ඊට පස්සේ එතුමා කථාව වෙන පැත්තකට හැරෙව්වා. මොකද, රවීයි, ශානියි දැන් ඉන්නේ කලකිරීමෙන්. ඇයි කලකිරුණේ? රවීයි, ශානියි වැරදිකාරයින් කරපු මහින්ද දිසානායකට DIG තනතුර දුන්නා. රවීයි, ශානියි CID එකේ ඉන්නකොට තාජුඩීන් පිළිබඳ පරීක්ෂණ ගෙන යන්න ඉඩ නොදීපු රණවීරව පොලීසිය භාර අමාත්‍යාංශයේ උපදේශක කරලා තිබෙනවා. ඒවා ගැන රවීයි, ශානියි කලකිරිලා ඉන්නවා. ඒක ඇත්ත. ඒ කලකිරීම උඩ දැන් ජනාධිපතිතුමා ඒක අපේ පැත්තට හරවන්න බලනවා. පොලිස්පතිතුමායි, පොලීසිය භාර ඇමතිවරයායි ඒ ගොල්ලන්ට වැඩ කරන්න දෙන්නේ නැති නිසා තමයි ඒ කලකිරීම ඇතිවෙලා තිබෙන්නේ. රවී සෙනෙවිරත්නයි, ශානි අබේසේකරයි ඉන්නේ පොලිස් ඇමතිතුමා යටතේ නේ. පොලිස් ඇමතිතුමා කවදාවත් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියලා තිබෙනවාද, මේ නිලධාරීන් දෙදෙනා හොඳට වැඩ කරනවා කියලා. කවදාවත් එහෙම කියලා නැහැ. ජනාධිපතිතුමා ඇවිල්ලා තමයි කිව්වේ. ඇයි, ඒ? රවීටයි, ශානිටයි පොලිස් ඇමතිතුමා වැඩ කරන්න දෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට තව විනාඩි දෙකක් තිබෙනවා. මම වෙලාව බලාගෙන ඉන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ඒ නිසා ඒගොල්ලන් ඉන්නේ කලකිරීමකින්. ඊයේ ජනාධිපතිතුමා බැලුවා ඒ කලකිරීම අපේ ඇඟට දමන්න. ඒවා අපේ ඇඟට දමන්න එපා. ඒ ඇතුළේ ප්‍රශ්න විසඳා ගන්න. රවීටයි, ශානිටයි අපි කිසිම හානියක් කරලා නැහැ. රවීයි, ශානියි තමයි 2019දී බෝම්බ පිපිරුණු වෙලාවේ, CID එකේ ඉදිමින් ඔක්කෝම වැඩ ටික කළේ. ජනාධිපතිතුමා අහනවා, 2019 අප්‍රේල් මාසයේ ඉඳන් නොවැම්බර් මාසය වෙනකම් මොනවාද කළේ කියලා. ශානියි, රවීයි තමයි ඔක්කෝම අය arrest කළේ. ඊට පස්සේ අද වෙනකම් කිසිම කිසිම වැදගත් වන පුද්ගලයෙකු arrest කළේ නැහැ.

ඊළඟට ජනාධිපතිතුමා කිව්වා, පාස්කු බෝම්බ ප්‍රහාරය පිළිබඳ වාර්තාවේ පිටු ගලවලා තිබෙනවා කියලා. මම ජනාධිපතිතුමාට කියන්න කැමැතියි, ගෝඨාභය හංගපු පොත් ටිකක් තිබෙනවා කියලා. ඒ පොත් ටික වහාම පාර්ලිමේන්තුවේ Library එකට එවන්න, අඩුම ගණනේ මන්ත්‍රීවරුන්ටවත් බලන්න. පාර්ලිමේන්තුවට ලබා දී තිබෙන ජනාධිපති කොමිසමේ වාර්තාවේ කාදිනල් හිමිපාණන් දුන් සාක්ෂියවත් නැහැ. සාක්ෂිකරුවන් 11,000ක් විතර සාක්ෂි දීලා තිබෙනවා. ඒ සාක්ෂි සටහන් වෙලා තිබෙන සමහර පොත් ගෝඨාභය රාජපක්ෂ දුන්නේ නැහැ; ජනාධිපති කාර්යාලයේ තබාගෙන හිටියා. ඒ නිසා අපි ජනාධිපතිතුමාට කියනවා, ඒ පොත් ටික වහාම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට කියවන්න දෙන්න කියලා. ඒවා හංගන්න එපා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම ඉක්මනින් අවසන් කරනවා.

ඊළඟට, ජනාධිපතිතුමා කිව්වා, මාධ්‍ය කුඩු විකුණනවා, මාධ්‍යවල කුඩු තිබෙනවා කියලා. එතුමා ජනාධිපතිවරයෙක්. එතුමාට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා නිකම් කථා කරලා යන්න බැහැ. ඒ කියන දේවල් ගැන සාක්ෂි තිබෙනවා නම්, තොරතුරු තිබෙනවා නම් ඒවා එළියට දමන්න ඕනෑ. එතුමා මේ රටේ ජනාධිපති කියලා මතක තබා ගන්න ඕනෑ. එතුමා තවදුරටත් විපක්ෂයේ හෝ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් නොවෙයි; පසු පෙළ මන්ත්‍රීවරයෙක් නොවෙයි. එතුමා මේ රටේ විධායක ජනාධිපතිවරයා. විධායක ජනාධිපතිවරයා වගකීමකින් කථා කරන්න ඕනෑ, වගකීමකින් කියන්න ඕනෑ. එහෙම නැතිව නිකම් මෙතැනට ඇවිල්ලා අරයා කුඩු විකුණනවා, මෙයා කුඩු විකුණනවා කියලා මඩ ගහලා, අපි ළඟ තොරතුරු තිබෙනවා කියලා හරියන්නේ නැහැ. එහෙම කියනවා නම්, ඒ තොරතුරු එළියට දමන්න කියලා අපි ජනාධිපතිතුමාට කියනවා. එහෙම නැතිව මාලිමාව ආණ්ඩුව කරන දේවල් සමහර මාධ්‍ය විසින් හෙළි කරන එකට එරෙහිව, ඒක ඉවසා ගන්න බැරිව එක එක මාධ්‍යවලට චෝදනා කරන්න එපා කියලා අපි ජනාධිපතිතුමාට කියන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ස්ථාවර නියෝගවල 86 (අ) හි සඳහන් වෙනවා, කිසිම මන්ත්‍රීවරයකු විසින් සිය කථාවේ වරදවා තේරුම් ගෙන තිබෙන යම් කොටසක්, එම කොටසට වෙනත් අලුත් කාරණා ඇතුළත් නොකර ඒක පැහැදිලි කරලා දෙන්න පුළුවන් කියලා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, පොලීසියේ චක්‍රලේඛය ගැන කියද්දී මහජන ආරක්ෂක කමිටුවල සභාපතිවරු විතරයි ගෙන්වන්නේ කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරදියි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහජන ආරක්ෂක කමිටු 570යි තිබෙන්නේ. හැබැයි, 3,500ක් ගේන්න කියලා පොලීසියට චක්‍රලේඛය ගහලා තිබෙනවා වාගේම කෑම දෙන්න කියලාත් තිබෙනවා. රජයේ බදු මුදලින්, ඔබතුමන්ලාගේ අනුර කුමාර දිසානායක මහත්මයාගේ රැස්වීම්වලට එන අයට කෑම දෙන්න පුළුවන්ද? රැස්වීම්වලට පොලීසිය ගේන්න පුළුවන්ද? සභාපතිවරු, ඒ කිසිම දෙයක් මේකේ නැහැ, මාලිමාවට දැන් සෙනඟ නැති නිසා පොලීසියට තමයි රැස්වීම්වලට සෙනඟ අදින්න තිබෙන්නේ. එම කාරණයට අදාළ මේ ලේඛනය මා **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.56]

**ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා**
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් විවාද කරන මේ අවස්ථාවේ ඒ ගැන අදහස් ස්වල්පයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අප සියලු දෙනාටම දැන ගන්න ලැබුණු කාරණය තමයි, මේ මැතිවරණ ක්‍රමය ඉතාම අසීරු, නොගැළපෙන මැතිවරණ ක්‍රමයක් කියන එක. විශේෂයෙන් රජයටත් පසුගිය පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ සභාපතිවරු පත් කිරීමේදී, සභා පිහිටුවන අවස්ථාවේ නොයෙකුත් ගැටලු ඇති වුණා. ඒ වාගේම විපක්ෂයේ අපටත් ඒ ගැටලු ඒ ආකාරයටම ඇති වුණු නිසා මම ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, පළාත් පාලන මැතිවරණ ක්‍රමය නැවත පෙර තිබුණු ආකාරයට, මනාප ක්‍රමයට අරගෙන එන්න කියලා.

අද අපේ රටේ පළාත් පාලන ආයතන 341ක් තිබෙනවා. ඒ 341, තම තමන්ම ආදායම් උත්පාදනය කරගෙන ප්‍රදේශය සංවර්ධනය කරන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යනකොට සභාව ඉතාම

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපහසුතාවකට පත්වෙනවා. මොකද, රාජ්‍ය නිලධාරින්ගේ වැටුපෙන් සියයට 20ක් අදාළ පළාත් පාලන ආයතනවලට ගෙවන්න සිද්ධ වෙලා තිබෙන නිසා. ඒක කිසිසේත්ම ගෙවන්න බැරි පළාත් පාලන ආයතන තිබෙනවා. ඒ වාගේම පළාත් පාලන ආයතනවලට cadre එක - සේවක ලැයිස්තුව - අනුව නිලධාරින් පත් කරලාත් නැහැ. මේ වනකොට බුත්තල ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරින් 11දෙනෙක් වැඩිපුර ඉන්නවා. ඒ වාගේම ඒ සෑම ආයතනයකම වාගේ කාර්මික නිලධාරින්ගේ අඩුපාඩු තිබෙනවා කියලා කථා වෙනවා. අපේ සේවක ලැයිස්තුවේ - cadre එකේ - කාර්මික නිලධාරින් දෙදෙනායි සිටින්නේ. බුත්තල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරින් තුන් දෙනෙක් ඉන්නවා. දැනට ඉන්න සේවකයන්ගේ වැටුප්වලට අදාළව සියයට 20 ගෙවන්න ප්‍රාදේශීය සභාවට බැරි වෙලාවක ඒ ආයතනවලට දමපු වැඩිපුර සේවකයන්ටත් සියයට 20ක් ගෙවන කොට සභාවට තම වැඩ පිළිවෙළ කර ගෙන යන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ. අන්න ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, වැඩිපුර ඉන්න සේවකයන් අවශ්‍ය ස්ථානවල ස්ථානගත කරලා පළාත් පාලන ආයතනවල වැඩ කරන සේවකයන්ගේ වැටුප සියයට 80ක් ප්‍රතිපූරණය කරන එක සියයට 100ම ප්‍රතිපූරණය කරන්න කියලා. මමත් ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම, මම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙක්. මේ අමාරුකම ගැන අපි පැහැදිලිවම දන්නවා. අන්න ඒ නිසා මේ කටයුත්ත; සියයට 80ක් වැටුප් ප්‍රතිපූරණය කිරීම, සියයට 100ම කර දෙන්න කියන ඉල්ලීම ගෞරවයෙන් කරනවා.

පළාත් පාලන ආයතන සම්බන්ධව කථා කරන ගමන් මට ලැබී තිබෙන කාලය තුළ මට විශේෂයෙන්ම කථා කරන්න අවශ්‍යයි, ග්‍රාම නිලධාරින් පිළිබඳවත්. අපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල, ග්‍රාම නිලධාරි කොට්ඨාසවල නිලධාරින් රාශියක් හිටියත් ග්‍රාම නිලධාරිවරයා රෑ දවල් නැතිව තමන්ගේ කොට්ඨාසයේ රාජකාරි කරන අවස්ථා තිබෙනවා. ඔවුන්ට එහෙම කරන්න සිද්ධ වෙනවා. එහෙම රාජකාරි කරන ග්‍රාම නිලධාරියාට හරිහමන් විධියට තමන්ගේ කාර්යාලය පවත්වා ගෙන යන්න පුළුවන් විධියේ කුලියක් ලබා දෙන්නේ නැහැ. නාගරික ප්‍රදේශයක නම් රුපියල් 3,000යි කාර්යාල කුලිය වශයෙන් ගෙවන්නේ. අපේ ග්‍රාමීය ප්‍රදේශයක නම් රුපියල් 2,000යි කාර්යාල කුලිය වශයෙන් ගෙවන්නේ. ඒ වාගේම ගමන් වියදම් හැටියට මාසයටම ගෙවන්නේ රුපියල් 600යි. ගම්මානවල දුෂ්කර විධියට රාජකාරි කරන අපේ නිලධාරින්ට කරන මේ ගෙවීම් සාධාරණ නැහැ. අන්න ඒ නිසා නාගරික ප්‍රදේශවල කාර්යාල කුලිය රුපියල් 15,000ක් කරලා, ග්‍රාමීය ප්‍රදේශවල රුපියල් 10,000ක්වත් කරන්න කියලා මම අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම තමයි සමහර ග්‍රාමීය ප්‍රදේශවල කාර්යාලය පවත්වා ගෙන යනකොට ගමේ ඉන්න සියලු නිලධාරින් රාජකාරි කරන සේවා පියසේ විදුලි බිල ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ ග්‍රාම නිලධාරිවරයාටයි. එම නිසා එම සේවා පියසවල විදුලි බිල් රජය විසින් ගෙවන ක්‍රමයක් ඇති කරන්න කියන ඉල්ලීම ද කරනවා.

මොනරාගල, අනුරාධපුරය, පොළොන්නරුව වාගේ දුෂ්කර ප්‍රදේශවල රාජකාරි කරන ග්‍රාම නිලධාරින් ගත්තොත්, විශේෂයෙන් කාන්තා ග්‍රාම නිලධාරින්ට රාජකාරි කරන්න බැරි ග්‍රාම නිලධාරි වසම් තිබෙනවා. එම නිසා ඒ ග්‍රාම නිලධාරි වසම්වලට පිරිමි ග්‍රාම නිලධාරින් පත් කරන්න බලන කොට අද පිරිමි ග්‍රාම නිලධාරින් නැති තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. එම නිසා ග්‍රාම නිලධාරින් බඳවා ගැනීමේදී අඩු තරමින් සියයට 30ක්, 40ක්වත් පිරිමි ග්‍රාම නිලධාරින් අනිවාර්යයෙන් පත් කරන්න කියන ඉල්ලීම මා කරනවා. ඒක වටිනා දෙයක් වෙයි කියලා හිතෙනවා. අපේ ප්‍රදේශවල අලි මිනිස් ගැටුම වැඩියි. නමුත්, ග්‍රාම නිලධාරිතුමන්ලාට, ග්‍රාම නිලධාරිතුමියලාට රාත්‍රි කාලයේ රාජකාරිවලට යන්න සිද්ධ වෙනවා. එම නිසා පිරිමි නිලධාරින් බඳවා ගන්න කියන ඉල්ලීමත් මා කරනවා.

අපේ මොනරාගල දිස්ත්‍රික්කයේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දුෂ්කරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්. මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අතිදුෂ්කර ග්‍රාම නිලධාරි වසම් 4ක් තිබෙනවා. ගල්ගමුව, නෙල්ලියද්ද, මුල්ලේගම, ඉඟිණියාගල කියන ග්‍රාම නිලධාරි වසම් 4 අතිදුෂ්කරයි. අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට කිලෝමීටර 70ක් ඈතින් තමයි ඒ ග්‍රාම නිලධාරි වසම් 4 පිහිටා තිබෙන්නේ. ඒ ප්‍රදේශවලට ගමන් පහසුකම් ඉතාම අඩුයි. සේවාවක් ලබා ගන්න එන සේවා දායකයාට කිලෝමීටර 70ක් ගෙවමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් පසු කරමින් තමයි තමන්ට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ වාගේම තමයි නිලධාරින්ටත්. නිලධාරින්ටත් ඒ කිලෝමීටර 70 පසු කර ගෙන තමයි අදාළ ග්‍රාම නිලධාරි වසම් 4ට රාජකාරි කරන්න යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ ග්‍රාම නිලධාරි වසම් 4 අද පවතින්නේ මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ. එම නිසා ආසන්නම ස්ථානය වන බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මේ ග්‍රාම නිලධාරි වසම් 4 එකතු කරලා දෙන්න කියන ඉල්ලීම මා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඒ වාගේම තමයි මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මා කියපු ග්‍රාම නිලධාරි වසම් 4 මේ වන කොටත් කිසිම අධිකරණ කලාපයකට ගැසට් කරලා නැහැ. ඒ නිසා යම් යම් නඩු කටයුතුවලදී රාජ්‍ය නිලධාරින් - පොලීසියත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරිනුත්- අපහසුතාවට පත් වෙනවා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්තුමාට ඉඩම් සන්තකය පවරා ගැනීමට වරින් වර නඩු දමන්න සිද්ධ වෙනවා.

හැබැයි ඒ නඩු පවත්වාගෙන යන්න පුළුවන්කමක් නැහැ, ගැසට් කරපු නිශ්චිත, අධිකරණ කලාපයක්, අධිකරණයක් නැති නිසා. ඒ නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඉඟිනියාගල අම්පාර ප්‍රදේශය ආසන්නයේම පිහිටා තිබෙන නිසා ඉඟිනියාගල ග්‍රාම නිලධාරි වසම අම්පාර අධිකරණ කලාපයටත්, මුල්ලේගම, නෙල්ලියද්ද, ගල්ගමුව යන ග්‍රාම නිලධාරි වසම් තුන බිබිල අධිකරණ කලාපයටත් ගැසට් කරන්න කියලා. ඒ ගම්වල එම සේවාවන් ලබා ගන්නා අයටත්, ඒ වාගේම ඒ නිලධාරින්ටත් පහසුවෙන් එම සේවාවන් ඉටු කර ගන්න අවස්ථාව ලබා ගන්න හැකි වන පරිදි එකී අධිකරණ කලාපවලට අදාළව ඒවා ගැසට් නොකළොත් ඉදිරියේදී පවතින නඩුවලටත්, වර්තමානයේ පවතින නඩුවලටත් යම් යම් බලපෑම් සිද්ධ වෙන්න ඉඩ තිබෙනවා. මොකද, මේ නඩුවක් විභාග වන වෙලාවක "මේ පොලීසිය, මේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ අධිකරණ කලාපයට අයත් නැහැ, මේ අය නඩු දැම්මේ කොහොමද?" කියලා කවුරු හරි කෙනෙකු; නීතිඥ මහත්මයකු විරෝධතාවක් ගෙනාවොත්, ඒ නඩුවෙනුත් පලක් වෙන්නේ නැහැ කියන විශ්වාසය තිබෙනවා. අන්න ඒ නිසා මා මේ කියපු කාරණා ටික ගැන සලකා බලා මිනිසුන්ගේ පහසුව තකා මේ ඵලදායී වැඩ කොටස් ඉටු කර දෙන්න කියලා මම අතිගරු ජනාධිපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
මීළඟට, ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔව්, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, මීට කලින් ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා මතු කළා, රීති ප්‍රශ්නයක්. එතැන කිසිදු රීති ප්‍රශ්නයක් නැහැ. ඒ නිසා මම මේ ගරු මූලාසනයෙන් ඉල්ලනවා, මේ ගැන හරියට අවධානය යොමු කරන්න කියලා. එතුමා මතු කළ ස්ථාවර නියෝගයෙහි මෙසේ සඳහන් වෙනවා:

"86. කිසි ම මන්ත්‍රීවරයකු විසින්-

(අ) සිය කථාවේ වරදවා තේරුම් ගෙන තිබෙන යම් වැදගත් කොටසක්, එම කොටසට වෙනත් අලුත් කාරණා ඇතුළත් නොකර එම කොටස පහදා දීමේ කාර්යය පිණිස; හෝ..."

මේ අනුව කරන්න ඕනෑ, එතුමාගේ කථාවේ වරදවා තේරුම් ගෙන තිබෙන යම් වැදගත් කොටසක් තිබෙනවා නම් ඒ කොටසට අලුත් කාරණා ඇතුළත් නොකර එම කොටස පහදා දෙන එක. දැන් මා අලුතින් මොකවත් ඇතුළත් කළේ නැහැ. මම එතුමා කරපු කථාවට අදාළව පහදා දීමක් කළා. ඉතින් මොකක්ද මෙතැන තිබෙන රීති ප්‍රශ්නය? මන්ත්‍රීවරුන් මේ ගරු සභාවේ විටින් විට, විටින් විට නැඟිටලා බොරු රීති ප්‍රශ්න මතු කරමින් මේ ගරු සභාව-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒක හින්දා තමයි ඒ කාරණාව මතු කරන කොට එය එතැනින් නතර කළේ.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මා කියන්නේ මේ මන්ත්‍රීතුමා මතු කරන රීති ප්‍රශ්නයක් මෙතැන නැහැ කියලායි. *[බාධා කිරීමක්]*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
විවාදයකට යන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා. කරුණාකර නිහඬ වෙන්න. *[බාධා කිරීමක්]*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මෙතුමා මගේ නම mention කළා; he mentioned my name. - *[Interruption.]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
ඔබතුමන්ලාට තත්පර 15, 15 විතර තමයි දෙන්න පුළුවන්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු මහින්ද ජයසිංහ මැතිතුමනි, ඔය කාරණය සිංහලෙන් හරියට කියවා ගන්න. Standing Orders අනුව තත්පර 15ක් නොවෙයි, විනාඩියක කාලයක් තිබෙනවා, නම සඳහන් කළාම කථා කරන්න. ඒ නිසා Standing Orders අනුව කටයුතු කරන්න. ඔබතුමිය මාලිමාවේ කථානායක වෙන්න එපා, ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි. ස්ථාවර නියෝග 86 (අ)හි පැහැදිලිව සඳහන් වෙලා තිබෙන ආකාරයට, මා කියපු යම්කිසි කරුණක දත්ත මෙතුමා වරද්දලා කිව්වොත් අලුත් කරුණක් කියන්නේ නැතුව ඒක පැහැදිලි කරන්න මට පුළුවන්. ඒක පැහැදිලිව සඳහන්ව තිබෙනවා. මොකක්ද ඒකේ වරද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි,-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
තත්පර 15යි ලබා දෙන්නේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමියනි, ඉතාම පැහැදිලියි, මේ රීති ප්‍රශ්නය කිසිසේත් අදාළ නැහැ කියලා. ඒ නිසා මම එතුමාට යෝජනාවක් කරනවා. ඊයේ පාර්ලිමේන්තුවේ ආරම්භ කළා, සිංහල සහ දෙමළ භාෂා උගන්වන පාඨමාලාවක්. ඒ පාඨමාලාවට සම්බන්ධ වෙන්න කියලා මම ඔබතුමාටත් ආරාධනා කරනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම, ඔබතුමාගේ තාත්තාගේ වීඩියෝ එකකුත් මා ළඟ තිබෙනවා. මට ඕනෑ නම් තිබුණා- *[බාධා කිරීමක්]* තාත්තලා කොහොමද- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමිය**
(மாண்புமிகு பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson)
අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

මීළඟට, ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමනි, ඔබතුමාට මූලසුන භාර කරනවා.

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඒ කාරණය විවාදයක් කර ගන්න එපා. කථා කරන්න තවත් කථිකයෝ ඉන්නවා. ඔබතුමාට මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්,- *[බාධා කිරීමක්]*

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order. -*[Interruption.]*

[අ.භා. 2.09]

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அஸ்ஸலாமு அலைக்கும்! ආයුබෝවන්! வணக்கம்!

මුලින්ම මම එකක් කියන්න කැමතියි. අපේ අතිගරු ජනාධිපතිතුමාට මුදල් අමාත්‍යවරයා විධියට, ආරක්ෂක අමාත්‍යවරයා විධියට මේ පාර්ලිමේන්තුවට එන්න පුළුවන්. මේ විපක්ෂය දහලනවා, ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට එන එකට. ඒකට මෙතුමන්ලා බයයි ද කියලා දන්නේ නැහැ. මේ අය ඒකට බය වෙලා ඇති.

මාස තුනෙන් ආණ්ඩුව පෙරළෙනවා කිව්වා; මාස හයෙන් ආණ්ඩුව පෙරළෙනවා කිව්වා; අවුරුද්දකින් පෙරළෙනවා කිව්වා. තවමත් කිය කියා ඉන්නවා. විපක්ෂයේ ඔක්කෝටම පාරේ තමයි පෙරළෙන්න වෙන්නේ.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற பாதுகாப்பு அமைச்சு, பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சு ஆகியவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் எனக்கும் கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கடந்த காலங்களில் இருந்த அரசாங்கங்கள் தேர்தல்களை உரிய காலத்தில் நடத்தவில்லை. அது பிரதேச சபை தேர்தலாக இருக்கலாம், மாகாண சபைத் தேர்தலாக இருக்கலாம். 2018க்குப் பின்னர், பிரதேச சபைத் தேர்தலை நடாத்தாமல் நேரடியாக சனாதிபதித் தேர்தலை நடத்தினார்கள். அவர்களுடைய 'நல்லாட்சி' மக்களுக்கு நல்லாட்சியாக இருக்கவில்லை. அவர்கள் கொண்டுவந்த தேர்தல் முறைமையிலேயே பிரதேச சபைத் தேர்தலை நடாத்தினால் தாங்கள் தோல்வியடைந்து தேசிய மக்கள் சக்தி வெற்றி பெற்றுவிடும் என்றும் நினைத்து அந்தத் தேர்தலை நடத்தாமல் "தேர்தலும் இல்லை; நிதியும் இல்லை" என்று சொன்னார்கள். ஆனால், கடந்த சனாதிபதித் தேர்தலில் தேசிய மக்கள் சக்தி பாரிய வெற்றி பெற்றதோடு, பாராளுமன்றத் தேர்தலிலும் வெற்றியைப் பெற்றது. அதுமாத்திரமன்றி, அவர்கள் கொண்டுவந்த தேர்தல் முறைமைமூலம் நடத்தப்பட்ட பிரதேச சபைத் தேர்தலிலும் தேசிய மக்கள் சக்தியே வெற்றி பெற்றது. அது மட்டுமல்லாமல், 2017-2019 காலப்பகுதியில் அனைத்து மாகாண சபைகளும் கலைக்கப்பட்ட நிலையில் இருந்தாலும், மாகாண சபைத் தேர்தலை நடாத்தாமல், 'நல்லாட்சி' அரசாங்கத்தில் இருந்தவர்கள் தங்களுடைய வெற்றியை உறுதிப்படுத்தும் வகையிலான தேர்தல் முறைமையை பாராளுமன்றத்தில் முன்வைத்தார்கள். அதுகூட தோல்வியில் முடிவடைந்தது; மாகாண சபைத் தேர்தலை நடாத்த முடியாமல் போனது.

இன்று அவர்கள் இங்குவந்து மாகாண சபைத் தேர்தலை நடத்துமாறும் மாகாண சபைத் தேர்தலை நடாத்தாமல் அரசாங்கமானது பொய் சொல்வதாகவும் கூறுகின்றார்கள். அன்று "தேர்தலும் இல்லை; தேர்தலை நடத்துவதற்குப் பணமும் இல்லை" என்று சொன்னவர்களுக்கு இன்று நாங்கள் சொல்கின்றோம், தேசிய மக்கள் சக்தி அரசாங்கம் மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்கு இந்த வரவு செலவுத்திட்டத்தில் நிதி ஒதுக்கியுள்ளது என்று. நாங்கள் மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்குத் தயாராக இருக்கின்றோம். மாகாண சபைத் தேர்தலில் தேசிய மக்கள் சக்தி நாடு பூராவும் அமோக வெற்றி பெறும் என்பதை நான் இங்கு உறுதியாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

தற்போதைய சனாதிபதி அவர்கள் 2023.08.10ஆம் திகதி இந்தப் பாராளுமன்றத்தில் தோட்டத் தொழிலாளர்கள் சம்பந்தமாக கருத்துக் கூறியிருக்கிறார். அந்தநேரம் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வு கொடுப்பதற்கான எல்லாப் பேச்சுவார்த்தைகளும் நடைபெற்றிருந்தாலும், அவர்களுக்குச் சம்பள உயர்வு கொடுக்கப்படவில்லை. இன்று எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பள உயர்வை வழங்கி இருக்கின்றது. அந்தப் பகுதியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர்கள் எமது வரவு செலவுத்திட்டத்துக்கு ஆதரவாக வாக்களித்து இருக்கிறார்கள். இல்லையென்றால், அவர்களால் அங்கு போக முடியாமல் போயிருக்கும்.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා, මොකක්ද, ඔබතුමාගේ point of Order එක?

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 91 (ඌ) යටතේ මෙසේ සඳහන් වෙනවා:

> "කිසිම මන්ත්‍රීවරයකු වෙනත් මන්ත්‍රීවරයකුට අයුතු ආරෝපිත චෝදනාවක් කිරීම හෝ වෙනත් මන්ත්‍රීවරයකුගේ පෞද්ගලික කටයුතු සම්බන්ධයෙන් සඳහන් කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය;"

[ගරු ඩී.වී. චානක මහතා]

දැන් ටිකකට කලින් කිව්වා මගේ තාත්තාගේ වීඩියෝ එකක් තිබෙනවාය කියලා. මම එතුමාට කියන්න කැමැතියි, මේකත්. අනේ, ඔබතුමා ඒ වීඩියෝ එක දමන්න. *[බාධා කිරීමක්]* හැබැයි, ඔබතුමන්ලාට වාගේ හොරකම් කරලා උසාවිවල නඩු නම් අපට නැහැ. මටත් නැහැ, තාත්තාටත් නැහැ. ඒ කරපු අයට තමයි නඩු තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කරගෙන යන්න.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று எதிர்க்கட்சியில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் புத்தளம் பற்றி அதிகமான விமர்சனங்களைச் செய்துகொண்டு இருக்கிறார்கள். எந்தளவுக்கு என்றால், தேசிய மக்கள் சக்தி அரசாங்கம் பொய்சொல்லி, புத்தளம் மக்களை ஏமாற்றி வாக்குகளைப் பெற்றதாகக் கூறுகின்றார்கள். ஆனால், இவர்கள்தான் சென்ற காலங்களில் பொய் சொல்லியும் ஏமாற்றியும் புத்தளம் மக்களின் வாக்குகளைப் பெற்றார்கள். அதற்கு உதாரணமாக, புத்தளம் வைத்தியசாலை தொடர்பில் வழங்கிய வாக்குறுதியைக் குறிப்பிடலாம். புத்தளம் வைத்தியசாலையைத் தரமுயர்த்தித் தருவதாகச் சொல்லி, அந்த மக்களிடம் வாக்குகளைப் பெற்றுவிட்டு, அவர்கள் அதனைச் செய்துகொடுக்கவில்லை. ஆனால், எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் இன்று அதனைச் செய்கின்றது.

கடந்த சனாதிபதித் தேர்தலின்போதும் பாராளுமன்றத் தேர்தலின்போதும் மாண்புமிகு சனாதிபதி அவர்கள் இந்த வைத்தியசாலையைத் தரமுயர்த்தித் தருவதாகக் கூறியிருந்தார். இந்த வைத்தியசாலையைத் தரமுயர்த்துவது சம்பந்தமாக இந்த வரவு செலவுத்திட்டத்தில் எதுவும் கூறப்படாவிட்டாலும், நான் தனிப்பட்ட முறையில் சனாதிபதி அவர்களைச் சந்தித்து, "நீங்கள் எமது புத்தளம் வைத்தியசாலையைத் தரமுயர்த்தித் தருவதாகக் கூறியிருக்கிறீர்கள். அதனைச் செய்து தாருங்கள்!" என்று வேண்டுகோள் விடுத்தபோது, உடனடியாக அவர் சுகாதார அமைச்சுக்கு அதனைத் தெரிவித்து, அந்த வைத்தியசாலையைத் தரமுயர்த்திக் கொடுப்பதற்கான எல்லா நடவடிக்கைகளையும் எடுக்குமாறு கூறினார். அதற்கு நான் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு புத்தளத்தில் இருக்கின்ற அனைத்து இன மக்கள் சார்பாகவும் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மாண்புமிகு சுகாதார அமைச்சர் அவர்கள் இது தொடர்பில் நேற்று குறிப்பிட்ட விடயத்துக்காக அம்மக்கள் சார்பாக அவருக்கும் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

எமது மாண்புமிகு சனாதிபதியின் உள்ளத்தில் புத்தளம் மக்கள் இருக்கிறார்கள். அதனால்தான் அவர் புத்தளம் வைத்தியசாலையைத் தரமுயர்த்துவதற்குரிய நடவடிக்கைகளை எடுக்கும்படி சொல்லியிருக்கிறார். எதிர்க்கட்சியில் இருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்களுக்கு புத்தளம் தொடர்பில் என்னதான் அக்கறை இருக்கிறதோ தெரியவில்லை! அவர்கள் புத்தளம் பற்றி அதிகமாகப் பேசுகிறார்கள். சுமார் 37 வருடங்களுக்குப் பிறகு புத்தளத்தில் வாழுகின்ற அனைத்து இன மக்களின் வாக்குகள் ஊடாகத் தெரிவுசெய்யப்பட்டே நான் இங்கு வந்திருக்கிறேன். இவர்கள் இவ்வாறு பேசி, அநியாயமாகப் புத்தளத்தில் இனவாதத்தை உருவாக்குவதற்கு முற்படுகின்றார்கள். நேற்றைய சனாதிபதியின் உரையில்கூட, இந்த நாட்டில் இனவாதத்தை அழித்தொழிப்பதாகச் சொன்னார். *இன்ஷா அல்லாஹ்!* நான் புத்தளத்தில் இருக்கும்வரை அங்கு இனவாதத்தை ஏற்படுத்துவதற்கு யாருக்கும் இடமளிக்க மாட்டேன் என்பதை இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன். எமது தேசிய மக்கள் சக்தி அரசாங்கத்தின் "வளமான நாடு - அழகான வாழ்க்கை" என்ற கொள்கைப் பிரகடனத்துக்கு அமைய, புத்தளத்தில் இருக்கிற மக்களுக்கு அழகான வாழ்க்கையை ஏற்படுத்திக் கொடுப்பதற்கான எல்லா வேலைத்திட்டங்களையும் நாங்கள் செய்வோம். புத்தளத்தில் என்ன பிரச்சினை இருந்தாலும், அது தொடர்பில் மாண்புமிகு சனாதிபதியோடும் சம்பந்தப்பட்ட அமைச்சர்களுடனும் பேசி, நல்லதொரு தீர்வை அந்த மக்களுக்கு நாங்கள் பெற்றுக் கொடுப்போம் என்பதைக் கூறிக்கொள்கின்றோம். தமிழர்களாக இருக்கலாம், முஸ்லிம்களாக இருக்கலாம், சிங்களர்களாக இருக்கலாம், அனைத்து இன மக்களும் ஒன்றாகச் சேர்ந்து வாழுகின்ற இடம்தான் புத்தளம். அதனால் அங்கு இனவாதத்தை ஏற்படுத்துவதற்கு நான் எவருக்கும் ஒருபோதும் இடமளிக்க மாட்டேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுடைய நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
தயவுசெய்து, எனக்கு இன்னும் 30 செக்கன்கள் தாருங்கள்!

பொது நிருவாகச் சுற்றறிக்கை 06/2006 (iv)இன்மூலம் அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவைக்குப் பாரிய அநீதி இழைக்கப்பட்டுள்ளதாக அறிய முடிகின்றது. இந்தச் சுற்றறிக்கைக்கு முன்னர், அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையின் விசேட தரம் TB 5-5-1 சம்பள அளவுத்திட்டத்தில் இருந்தது. இது அப்போது All-Island Service ஆரம்ப சம்பளத்தைவிடவும் அதிகமாக இருந்தது. அவ்வாறே, இந்தச் சேவையின் தரம் I TB 3-8-2 என்ற சம்பள அளவுத்திட்டத்தில் இருந்தது. இது அப்போது நிருவாக உத்தியோகத்தருக்கான சம்பள அளவுத்திட்டத்தில் இருந்தது. எனினும், 06/2006 (iv) சுற்றறிக்கைமூலம் இது MN 6 சம்பள அளவுத்திட்டத்தில் வைக்கப்பட்டுள்ளது. இதன்மூலம் இச்சேவைக்குப் பாரிய அநீதி இழைக்கப்பட்டுள்ளமையை அறிய முடிகின்றது. கௌரவ அமைச்சர் அவர்களே, அரசாங்க மொழிபெயர்ப்பாளர் சேவையின் விசேட தரத்தைச் சேர்ந்தவர்கள் ஓய்வுபெறும்போது, அவர்களது ஓய்வூதியத்தைச் செய்ய முடியாத நிலைக்கு இந்தச் சேவை தள்ளப்பட்டுள்ளது. எனவே, இச்சேவைக்கு சுற்றறிக்கை 06/2006 (iv)க்கு முன்பிருந்த நிலையைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி! ගරු ආරියවංශ බාලසූරිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.18]

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් විවාද කරනවා. අය වැයට අදාළව කථා කරනකොට මෙය වැදගත්ම අමාත්‍යාංශයක් කියලා කියන්න පුළුවන්. රට සංවර්ධනය කරා ඉදිරියට ගෙනයනකොට රාජ්‍ය පරිපාලනයත්, පළාත් සභාත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පළාත් පාලන ආයතන විශේෂයෙන් වැදගත් වෙනවා. මේ වනවිට ඔබතුමන්ලාගේ ආණ්ඩුව බලයට පත් වෙලා වසරක් සම්පූර්ණ වෙලා තිබෙනවා. පසුගිය කාලය තුළ රාජ්‍ය නිලධාරින් සතුටින් රාජ්‍ය සේවය කළාද කියලා අපට ලොකු සැකයක් තිබෙනවා. ඒකට හේතුව තමයි, පසුගිය අය වැය ලේඛනය. ඔබතුමන්ලා ඉදිරිපත් කළ පසුගිය අය වැය ලේඛනය තුළින් මේ වෙනකොට රටේ සංවර්ධන ඉලක්ක කරා ගිහින් තිබෙන්නේ සියයට 25ක් වාගේ ප්‍රමාණයක්. සියයට 25ක ප්‍රමාණයක් කරා යන්න සිද්ධ වුණේ මේ රජය ක්‍රියාත්මක කරන රාජ්‍ය යන්ත්‍රණය තුළ යම් කිසි ප්‍රශ්නයක් පැන නැඟුණ නිසාය කියන කාරණාව අපි මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. පරිපාලන ව්‍යුහය තුළ පළාත් මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින්, ප්‍රාදේශීය සභා මට්ටමින් අද ගැටලු රැසක් ඇති වෙලා තිබෙනවා. පහුගිය දවස්වල පළාත් පාලන මැතිවරණය පවත්වලා එයින් ජයග්‍රහණය කරපු සභාපතිවරු ඇතුළු මන්ත්‍රී කණ්ඩායම වැඩ කරගෙන යන්න පටන් ගන්නකොටම, රජය විසින් ලබා දෙන වැටුප් ප්‍රතිපූරණය සියයට 20කින් අඩු කරලා තිබෙනවා. ලබන වසර වෙනකොට ඒක සියයට 40කින් අඩු කරනවා. පළාත් පාලන ආයතන 341 තුළ අඩු ආදායම්ලාභී ප්‍රාදේශීය සභා විශාල ප්‍රමාණයක් තිබෙනවා. මම නියෝජනය කරන්නේ රත්නපුර දිස්ත්‍රික්කය. කොලොන්න, වැලිගෙපොළ, අයගම වැනි ප්‍රාදේශීය සභා ඉතාම අඩු ආදායම් තිබෙන ප්‍රාදේශීය සභා. ඉතින්, ආණ්ඩුවෙන් කරන්න තිබෙන්නේ ඒවායේ ආදායම් මට්ටම දියුණු කරන වැඩ පිළිවෙළක් සකස් කරලා, ඒ මුදල් කප්පාදු කරන එකයි. ඒක තමයි වඩා හොඳ. මේ තත්ත්වයම මීට පෙර ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවෙනුත් සිදුවුණු බව ඔබට මතක ඇති. එක්වරම රසායනික පොහොර ගෙන්වීම නවත්වලා කාබනික පොහොර සඳහා යොමු වුණා. ඒ තුළ රට විශාල වශයෙන් පහළට වැටුණා. එවැනි තත්ත්වයක් ඇති නොකර, පළාත් පාලන ආයතන දියුණු කරන වැඩ පිළිවෙළක් සකස් කරලා, ඒවා දියුණු වුණාට පසුව ඒ වැටුප් ගෙවීම සඳහා ලබා දෙන මුදල් කප්පාදු කරනවා නම් හොඳයි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා තමයි, ඒ සභාපතිවරයා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට වැඩ කරන්න බලය ලබා දුන්නේ. මාත් 2001දී ප්‍රාදේශීය සභා සභාපතිවරයකු වශයෙන් අතිවිශාල වැඩ කොටසක් කළා. ඒ තිබුණු බලතල මේ ක්‍රමය තුළ නැති වෙලා තිබෙනවා. පළාත් සභාව තුළ සිටින ආණ්ඩුකාරවරයා සහ පළාත් පාලන කොමසාරිස්වරයා තමයි අද ප්‍රාදේශීය සභාව පාලනය කරන්නේ. සභාපතිවරයා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට ඒ බලය අඩුවෙන් තමයි ලබා දී තිබෙන්නේ. ප්‍රදේශයේ ජනතාවට වැඩ කරන්න නම් අනිවාර්යයෙන් සභාපතිවරයා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට බලය ලබා දිය යුතුයි. ඒ අයට ලැබෙන මුදල් කප්පාදු නොකර, මේක මාලිමාවේ ප්‍රාදේශීය සභාවක්ද, එහෙම නැත්නම් විපක්ෂයේ සභාපතිවරයෙක් ඉන්න ප්‍රාදේශීය සභාවක්ද කියලා හිතන්නේ නැතුව සමානව ප්‍රතිපාදන වෙන් කිරීම තමයි කරන්න ඕනෑ. නමුත්, අද අපි ඒක දකින්නේ නැහැ. දැනට පළාත් සභාවල බලය නැහැ. කඩිනමින් පළාත් සභා මැතිවරණය පවත්වන්න කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. 2017 ඉඳලා මේ වෙනකම් පළාත් සභාවක් යටතේ පාලනය වීමක් වෙන්නේ නැහැ. ස්වාධීනව තමයි පළාත් පාලනය වෙන්නේ. ආණ්ඩුකාරවරයෙකු යටතේ, එහෙම නැත්නම් සභාපතිවරයෙකු යටතේ, ලේකම්වරු යටතේ තමයි ඒවා පාලනය වෙන්නේ. ඒ පාලනය තුළ පළාත් සභා තුළින් ගමේ සංවර්ධනයක් ඉටු වෙනවා අපි දැක්කේ නැහැ. මමත් පළාත් සභාවක මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කළා. ඒ කාලය තුළ විශාල වැඩ කොටසක් ගම්වලට සිදු වුණා. ඒක අද නතර වෙලා තිබෙනවා. ඒ තුළින් අද පළාත් පාලන ආයතනවල සංවර්ධනයත් නතර වෙලා තිබෙනවා. මම ඉල්ලා සිටිනවා, කඩිනමින් පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා. එතකොට ඔබ අවුරුද්දක් -වසරක්- තුළ මේ රටට කරපු සංවර්ධනය පිළිබඳව රටේ ජනතාව සෑහීමකට පත් වුණා නම්, ඒ මැතිවරණයේදී ප්‍රතිඵලය ලබා දෙයි.

මේ කාරණයත් මම විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ. රාජ්‍ය සේවා කළමනාකරණ නිලධාරින්ට මේ වෙනකොට ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්නට සිදු වෙලා තිබෙනවා. මේ වෙනකොට අපේ රාජ්‍ය සේවයේ රාජ්‍ය සේවා කළමනාකරණ නිලධාරින් 50,000ක් පමණ ඉන්නවා. ඔවුන් ඉටු කරන මෙහෙය අනුව ඔවුන්ගේ වැටුප දැනට ලබන වැටුපට වඩා වැඩි විය යුතුය කියන කාරණය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මීට වසර 4කට පමණ පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හා එවක පැවැති ජාතික වැටුප් කොමිෂන් සභාව වෙත යොමු කර තිබෙනවා. එම නිර්දේශ ක්‍රියාත්මක කරන්න කියලා අපි මේ රජයෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඒ සම්බන්ධයෙන් ඔවුන්ට ප්‍රශ්න රාශියක් තිබෙනවා.

එපමණක් නොවෙයි. පළාත් රාජ්‍ය සේවයේ පවතින 2,000ක් පමණ වූ කළමනාකරණ සේවා නිලධාරි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් විවෘත හා සීමිත තරග විභාගයකින් මඟින් කරන්න කියලාත් ඉල්ලීම් කර තිබෙනවා. ඒ වාගේම කළමනාකරණ සේවා නිලධාරි තනතුරට බඳවා ගැනීමේදී අවම සුදුසුකම් උපාධි මට්ටමට ගෙන ඒම සහ දැනට සේවයේ සිටින නිලධාරින්හට උපාධි මට්ටම දක්වා යැමට අවස්ථාව සැපයීම, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධි පන්තියේ නිලධාරින්ට පැවැති විධායක තත්ත්වය නැවත ලබා දීම සහ උසස්වීම් ක්‍රමය ඇති කරන්න කියලාත් ඔවුන් ඉල්ලා තිබෙනවා. ඒ වාගේම විවිධ ප්‍රශ්න රාශියකට මුහුණ දෙන ඒ අයට සාධාරණය ඉටු කරන්න කියලා ගරු ඇමතිතුමාගෙන් මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා. මේ වැටුප් වැඩි කිරීම සුදුසුයි කියලා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත 2011.08.11 වන දින අනුමැතිය ලබා දී තිබෙනවා. ඒ, මීට වසර 4කට කලින්. ඔබතුමන්ලා පසුගිය කාලයේ කථා කරපු දේවල් අනුව බැලුවාම, භාණ්ඩාගාරය පිරිලා නේ තිබෙන්නේ. භාණ්ඩාගාරයේ මුදල් තිබෙනවා. ඒ නිසා ඒ අයට සාධාරණයක් ඉටු කර දෙන්න කියන ඉල්ලීම මම කරනවා. ගරු ඇමතිතුමනි, එදා ඒ යෝජනාව ඉදිරිපත් කරපු ලිපිය මම **සභාගත*** කරනවා.

ඒ වාගේම, ඒ අයට සාධාරණයක් ඉටු කර දෙන්න කියලාත් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බී. ආරියවංශ මහතා]

ඒ වාගේම පළාත් සභා ගැන කථා කළොත්, අද මෙතැන ඉන්න ගරු මන්ත්‍රීතුමන්ලා විශාල ප්‍රමාණයක් පළාත් සභා තුළින් තමයි පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. මමත් ප්‍රාදේශීය සභාවෙන් පළාත් සභාවට ගිහිල්ලා, පළාත් සභාව නියෝජනය කරලා, අද පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට සේවය කිරීම සඳහා අවස්ථාව උදා කරගෙන තිබෙනවා.

2017 වර්ෂයේ සිට මේ දක්වා වසර 8කට වැඩි කාලයක් පළාත් සභා මැතිවරණය පැවැත්වූයේ නැහැ. පැවති රජයන් විසින් යම් යම් කාරණා හේතු කොටගෙන, පළාත් සභා මැතිවරණය නවත්වා, පළාත් සභාව අකර්මණ්‍ය කරලා තිබෙනවා. ඒ තුළ මේ රටේ ජනතාවට පළාත් සභාව තුළින් ඉටු විය යුතු විශාල සේවාවක් අද ඉටු වෙන්නේ නැහැ. අපි දන්නවා, පළාත් සභා මැතිවරණය පවත්වන්න කටයුතු කිරීමේදී විවිධ නීතිමය ප්‍රශ්න තිබෙනවා කියලා පසුගිය දවස්වල කථා වුණු බව. මීට කලින් මනාප ක්‍රමය අනුව තමයි පළාත් සභා මැතිවරණය පැවැත්වුණේ. කොට්ඨාස ක්‍රමය හරහා පළාත් සභා මැතිවරණය පවත්වන්න පසුගිය දවස්වල සීමා නිර්ණය සකස් කිරීමේ කටයුතු කරගෙන ගියා. ආණ්ඩුවට අද මන්ත්‍රීවරුන් 159ක්, ඒ කියන්නේ තුනෙන් දෙකකට වැඩි බලයක් තිබෙනවා. ඒ නිසා මේ ක්‍රම දෙක තුළ ඒ නීති ගෙනැල්ලා, ඒ පනත් කෙටුම්පත් සම්මත කරලා, කඩිනමින් පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

පළාත් සභා තුළින් ඉමහත් සේවාවක් ඉටු වෙනවා. ඒ සේවාව මේ රටේ පළාත් නවය තුළ ජීවත් වන ජනතාවට ඉටු කර දීම සඳහා කටයුතු කරන්න. මොකද, අපි මන්ත්‍රීවරුන් වශයෙන් අද පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. අපි අවුරුද්දක් පාර්ලිමේන්තුව තුළ කටයුතු කළත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් වශයෙන් තවම අපිට රුපියලක වැඩක්වත් කර ගන්න බැරි වුණා. මොකද, පසුගිය කාලය තුළ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන ලබා දුන්නා; හැම ආණ්ඩුවකින්ම විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දුන්නා. හැබැයි, පසුගිය අවුරුද්දක කාලය තුළ කිසිම මන්ත්‍රීවරයෙකුට විමධ්‍යගත ප්‍රතිපාදන ලබා දුන්නේ නැහැ. අපි පළාත් සභාවේ සිටි කාලය තුළ විපක්ෂයේ සිටියත්, පළාත් සභා තුළින් ගම්වලට විශාල වැඩ කොටසක් ඉටු කළා. පළාත් සභා අමාත්‍යාංශ තුළින් ඒ සේවාව ඉටු කළා. නමුත්, පළාත් සභා මන්ත්‍රීවරයෙකු වශයෙන් ඉටු කළ සේවාව, අද අපිට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වශයෙන් ඉටු කරන්න අවස්ථාව ලැබිලා නැහැ. ඒ සඳහාත් අවස්ථාව ලබා දෙන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
**(The Hon. Presiding Member)**
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.29]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
**(மாண்புமிகு திலீப் வெதஆரச்சி)**
**(The Hon. Dilip Wedaarachchi)**
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නැඟෙනහිර පළාතේ විහාරස්ථානයක වූ සිදුවීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම කථා කරන්න කැමැතියි. උතුරු-නැඟෙනහිර බුද්ධ ශාසනය රැක ගන්නා අපේ බුද්ධ පුත්‍රයන්ට එළවා එළවා මේ රජයෙන් පහර දුන්නා. ඒක අපි හෙළා දකිනවා. ඒක කැත, නින්දිත ක්‍රියාවක් බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ හා කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදයේදී අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා. පළාත් පාලන ආයතන තුන්සිය ගණනක, ඒ වාගේම පළාත් සභා දිස්ත්‍රික් කාර්යාලවල රජයේ නිලධාරින් රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක කරන්නේ මේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හරහායි. ඒ රජයේ නිලධාරින්ගේ රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න අද මේ ආණ්ඩුවට හැකියාවක් නැති වෙලා තිබෙනවා. 2025 වර්ෂයේ රජයෙන් වෙන් කරපු මුදල් ප්‍රතිපාදනවලින් ගමේ සංවර්ධනයට, ගමේ දුප්පත්, අහිංසක ජනතාවගේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට අද හැකියාවක් නැති වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම අපේ හම්බන්තොට දිස්ත්‍රික්කය ගැන කථා කරන්න ඕනෑ. හම්බන්තොට දිස්ත්‍රික්කයට වෙන් වුණු ප්‍රතිපාදන හරියාකාරව වියදම් කරලා නැහැ. විශේෂයෙන්ම "නිල සෙවන" කාර්යාල සංවර්ධනයට රුපියල් මිලියන 95ක් වෙන් කර තිබුණා. නමුත්, වැඩ කර තිබෙන්නේ සියයට 14යි. විමධ්‍යගත ප්‍රතිපාදන මුදල් රුපියල් මිලියන 183කින්, වැඩ කර තිබෙන්නේ සියයට 38යි. ග්‍රාමීය පාරවල් සංවර්ධනය සඳහා වෙන් කළ රුපියල් මිලියන 79කින්, වැඩ කර තිබෙන්නේ සියයට 54යි. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන් කළ රුපියල් මිලියන 53කින්, වැඩ කර තිබෙන්නේ සියයට 40යි. දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති 51කින් නිම කර තිබෙන්නේ 11යි.

ඔබතුමන්ලා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් අරගෙන, රටේ තිබෙන බොහෝ පළාත් පාලන ආයතනවලත් බලය අරගෙන තිබෙනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මහ නගර සභාව හැරෙන්න අනෙක් සභාවලත් බලය අරගෙන ක්‍රියා කරන ඔබතුමන්ලාට බිම් මට්ටමේත් සභාපතිවරුන්, මන්ත්‍රීවරුන් ඉන්නවා. ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පස්දෙනෙක් ඉන්නවා. මේ සියලුදෙනාම ඉඳලාත් අද වන විට සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කර ගැනීමේ හැකියාව ඔබට නැතිවෙලා තිබෙනවා. අපි යහ පාලන ආණ්ඩුව කාලයේ "ගම්පෙරළිය" කියලා වැඩසටහනක් ආරම්භ කළා. ඒ සඳහා අපේ නායකතුමා අපට සල්ලි දුන්නා. ආසනයකට රුපියල් කෝටි 30ක් දුන්නා. අපි එක ශතයක් ආපහු භාණ්ඩාගාරයට යන්න නොදී ආසනයෙන් ආසනය අපි ගමේ -බිම් මට්ටමේ- ඒ සංවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කළා. පසුගිය ආණ්ඩුව කාලයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ මන්ත්‍රීවරුන්ට රුපියල් කෝටි 5ක් දුන්නා. අපට වැඩ කරන්න ඒ රුපියල් කෝටි 5ත් මදි වුණා. එම රුපියල් කෝටි 5න්, අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ මැතිවරණ කොට්ඨාස 152ක සිටින සියලුම මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ දෙක බැගින් දීලා, සෑම ග්‍රාම සේවා වසමකම සංවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කළා. අපි භාණ්ඩාගාරයට ආපහු ශතයක්වත් යන්න දුන්නේ නැහැ. අද මේ රජයට මෙහෙම වෙන්නේ ඇයි? මේ අයට ඒ සඳහා හැකියාව නැහැ; දක්ෂතාව නැහැ; උනන්දුව නැහැ; පළපුරුද්ද නැහැ; ඕනෑකම නැහැ. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී සිද්ධ වෙලා තිබෙන්නේ හැකියාව නැතිකමයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන 12ක් තිබෙනවා. සජබයට තිබෙන්නේ හම්බන්තොට මහ නගර සභාව පමණයි. ඩී.ඒ. ගාමිණී නගරාධිපතිවරයාට ලැබිච්ච ප්‍රතිපාදන ක්‍රමානුකූලව හම්බන්තොට මහ නගර සභා සංවර්ධන කටයුතුවලට යොදවලා, අද ඒ හරහා වැඩ කටයුතු ක්‍රියාත්මක කර තිබෙනවා කියලා මම සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා.

ජනාධිපතිතුමා හෙට දිනයේදී අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයට එනවා. මට ආරංචියක් ලැබුණා, සෑම පොලිස් බල ප්‍රදේශයකින්ම මිනිස්සු 400 බැගින් තංගල්ල මහජන ක්‍රීඩාංගණයට කැඳවන්න කියලා දැනුම් දී තිබෙන බව. ඒ, කුඩු මර්දනය කිරීම වෙනුවෙන් සහ පාතාලය මැඩලීම වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සඳහා. මම හිතන විධියට ජනාධිපතිතුමා එන්නේ ඒවා සම්බන්ධයෙන් දැනුවත් කරන්න. ඒ වාගේම එතුමාට ඒවායේ ප්‍රගතිය සමාලෝචනය කරන්නත් වෙනවා. රජය ගාණේ අපේ දිස්ත්‍රික්කයට කුඩු කන්ටේනර් කිහිපයක් ආවා නේ. ඒවායේ ප්‍රගතිය සමාලෝචනය කරන්නත් එක්ක වෙන්න ඇති. එතුමා එන්නේ. හෙට දවසේ ජනාධිපතිතුමා තංගල්ලට ආවාට පස්සේ පසුගිය කාලයේ ජනාධිපතිවරණයට කලින් තංගල්ලට ඇවිල්ලා කාලා බීලා ගිය තැන්වලට නැවත ගිහිල්ලා ඒ මිනිස්සුත් හම්බ වෙලා, ඒ අයගේත් දුක සැප සොයා බලා යන්න කියලාත් මම ජනාධිපතිතුමාට කියනවා.

"දවසේ වෙඩිල්ල" ඊයේ තංගල්ලේදී පත්තු වුණා. ඊයේ රාත්‍රියේදී වෙඩි තබා දෙදෙනෙක් -ජෝඩුවක්- මැරුවා. "දවසේ වෙඩිල්ල" විධියට ඊයේ පත්තු කළේ 109වැනි වෙඩිල්ල. මේ ආණ්ඩුව පත්වූ දවසේ ඉඳන් මේ වෙනකම් අපේ රටේ වෙඩි තැබීම් 103ක් සිදුවෙලා තිබෙනවා; 60 ගණනක් මැරිලා තිබෙනවා; 54ක් තුවාල වෙලා තිබෙනවා. ඒ නිසා මම ප්‍රකාශ කරනවා, මේ ආණ්ඩුවට පාතාලය මඩින්නත් බැහැ, කුඩු වසංගතය නැති කරන්නත් බැහැ කියලා. මහ මුහුදේ හැමදාම වාගේ කුඩු පාවෙනවා. මේවා සම්බන්ධයෙන් සොයන්න නිසියාකාරයෙන් කමිටු පිහිටුවා, අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන්න. ඔබතුමන්ලා දේශපාලනය කරන්න. නමුත්, හෙට දවසේදී තංගල්ල මහජන ක්‍රීඩාංගණයට ඔබ පක්ෂයේ කණ්ඩායම් විතරක් ගෙන්වන්න එපා. සෑම පක්ෂයකින්ම ගෙන්වා කුඩු ඇතුළු මේ මත් ද්‍රව්‍ය උවදුර මර්දනය කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම මේ ආණ්ඩුව පළාත් පාලන ආයතනවල බලය ගන්න රාජ්‍ය බලය පාවිච්චි කළා. මේ උදවිය රාජ්‍ය බලය පාවිච්චි කරලා, පළාත් පාලන කොමසාරිස්වරයා අතකොළුවක් හැටියට තියාගෙන පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් කළේ මන්ත්‍රීවරුන් බියවද්දලායි. මේ අය පළාත් පාලන ආයතනවල බලය ලබා ගත්තේ අල්ලස් දීලා, තර්ජනය කරලා. විශේෂයෙන්ම මම තංගල්ල නගර සභාව ගැනත් කියන්න ඕනෑ. තංගල්ල නගර සභාවට මන්ත්‍රීවරුන් පත්වුණේ, විපක්ෂයට මන්ත්‍රීවරුන් 10කුත්, මාලිමාවට මන්ත්‍රීවරුන් 9කුත් විධියටයි. අවසාන දවසේ උදේ පාන්දර රුපියල් ලක්ෂ 25 බැගින් දීලා මන්ත්‍රීවරුන් දෙදෙනෙක් ඒ අයගේ පැත්තට ගත්තා; රුපියල් ලක්ෂ 25 බැගින් අල්ලස් දීලා මන්ත්‍රීවරුන් දෙදෙනෙක් අරගත්තා, තංගල්ල නගර සභාවේ වෙදආරච්චිලාගේ හයිය නැති කරන්න ඕනෑය කියලා. නගර සභාවේ බලය ගත්තා කියලා අපේ හයිය නැති වෙන්නේ නැහැ කියන එක හොඳට මතක තබා ගන්න.

ඒ විතරක් නොවෙයි. ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන් අද ලස්සන මන්ත්‍රීතුමියලා දැක්කාම අඬ ගහලා තර්ජනය කරනවා, බණිනවා. ඒ වාගේ සිද්ධියක් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාවේත් සිද්ධ වුණා. ඒ මන්ත්‍රීතුමිය ඉල්ලා අස් වුණා. ඊයේ සීතාවක ප්‍රාදේශීය සභාවේ මොකක්ද වුණේ? අපේ දිලිත් ජයවීර මැතිතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරයාට අල්ලස් දීලා ඒ මන්ත්‍රීතුමාව අරගෙන සභාව පිහිටෙව්වා. ඔන්න ඔය ආකාරයට තමයි අද ඒ සභා පිහිටුවන්නේ.

විශේෂයෙන්ම අපේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන පළාත් පාලන ආයතනවල සිටින විපක්ෂය නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ට මම එක කාරණයක් කියනවා. ඒ සෑම පළාත් පාලන ආයතනයකම විපක්ෂය සැකසී තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂය, සමගි ජන බලවේගය, සර්වජන බලය හා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන පක්ෂ හතරේම එකතුවෙන්. මම ඒ සියලුම මන්ත්‍රීවරුන්ට කියනවා, සෑම අය වැයකදීම අත ඔසවා ඒ අය වැයට විරුද්ධව ඡන්දය පාවිච්චි කරන්න කියලා. බය වෙන්න එපා. එසේ ඡන්දය පාවිච්චි කරලා එම සභාවල කරන දූෂිත පාලනයට විරුද්ධව අපි කටයුතු කරන්න ඕනෑ බව මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අම්බලන්තොට ප්‍රාදේශීය සභාව ගැනත් මම සඳහන් කරන්න ඕනෑ. 10වැනි මාසයේ 9වැනි දා අම්බලන්තොට ප්‍රාදේශීය සභාව තිබුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩි 3ක් ලබා දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමාට තව විනාඩි 2ක කාලයක් ලබා දෙන්න.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
විනාඩි 2ක් නොවෙයි, විනාඩි 3ක්වත් මට ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාගෙන්ද එම වෙලාව අඩු කරන්නේ?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඒ සභාවේ උපසභාපතිවරයා හවස නිල රථය අරගෙන ගිහිල්ලා පාන්දර 3.45ට තමයි ආපසු ගෙනැවිත් භාර දීලා තිබෙන්නේ. ඒක ගැන සභාවේදී ප්‍රශ්න කළාය කියලා සභාපතිවරයා සභාවෙන් බැහැලා ගිහිල්ලා. ඒ අවස්ථාවේ සුනිල් රත්නවීර කියන බැමිණියන්විල නියෝජනය කරන මන්ත්‍රීවරයා සභාවේ Table එකට උඩින් පැනලා විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉන්න තැනට ඇවිල්ලා අපේ මන්ත්‍රීවරුන්ට තර්ජනය කර තිබෙනවා, "88-89 කාලයේ පාලනය කළේත් අපි, හැඳුනුම්පත් එක්කහු කළේත් අපි, අන්න ඒ පාලනය අපට දැන් ගෙනියන්නත් පුළුවන්" කියලා. මම අපේ මන්ත්‍රීවරුන්ට කියනවා, ලයිසන් ගණන්කාරයන්ට බය වෙන්න එපා කියලා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ නොවෙයි, ලංකාවේම පළාත් පාලන ආයතනවල සිටින අපේ සමගි ජන බලවේගය ප්‍රමුඛ විපක්ෂය නියෝජනය කරන සියලුම මන්ත්‍රීවරුන්ට මම කියන්නේ කිසිම කෙනෙකුට බය වෙන්න එපා කියලායි තමුන්නාන්සේලාගේ වටිනා කියන ඡන්දය පාවිච්චි කරන්න, එම සභාවල සිද්ධ වන මේ වාගේ දේවල්වලට විරුද්ධව. අපේ පක්ෂ 4ම තීරණය කර තිබෙනවා, ඒවාට සහයෝගය ලබා දෙන සෑම මන්ත්‍රීවරයෙක්ම අපේ පක්ෂවලින් ඉවත් කරන්න. එහෙම නේද, ලේකම්තුමා?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ඔව්.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
අනිවාර්යයෙන්ම ඒ අය පක්ෂවලින් ඉවත් කරන්න තීරණය කර තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණට තුනෙන් දෙකකට වඩා බලය තිබෙන විධියට ඔළු ගෙඩි තිබුණාට, ජනතා බලයක් නැතුව රටේ පරාද වෙච්ච පක්ෂයක් හැටියට අද කටයුතු කරනවා.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, පළාත් සභා මැතිවරණය ගැනත්. අපේ ජනතාව ඉල්ලන්නේ පසුගිය පළාත් සභා මැතිවරණය පැවැත් වූ ආකාරයටම මෙවර පළාත් සභා මැතිවරණයත් පවත්වන්න කියලායි. පළාත් සභා මැතිවරණයට මේගොල්ලන් කොහොමත් විරුද්ධයි. මට මතක් වෙනවා, 1988-89 කාලයේ පළාත් සභා මැතිවරණය පැවැත්වුණු වෙලාවේදී ලංකාවේ පාසල්වල දරුවන්ව ගේට්ටු ළඟට ගෙනැල්ලා "පලා බබා අපිට එපා, පලා බබා අපිට එපා" කියලා කියන්න මේ පක්ෂයේ හිටපු නායකයන් ඒ දරුවන්ට ඉගැන්වූ ආකාරය. ඒ එක්කම මට මතක් වෙනවා, තංගල්ල මහ විද්‍යාලයේ 13 වසරේ ඉගෙන ගත් වසන්තට සහ ප්‍රසන්තට තුන් මං හන්දියකදී වෙච්ච දේ. අපේ නිහාල් ගලප්පත්ති මහත්තයා නම් ඒ ගැන දන්නවා. එදා ඒ කොල්ලො දෙන්නා ඉස්කෝලෙන් එළියට එක්ක ගෙන ආවා. ඒගොල්ලන් සෑම ඉස්කෝලයකටම ගිහිල්ලා එහෙම කටයුතු කරනකොට ඒක පාලනය කරන්න බැරිව හමුදාවෙන් වෙඩි තිබ්බා. ඒකෙන් අර තරුණයෝ දෙදෙනා මැරුණා. අර පක්ෂ නායකයෝ පැන ගිහින් හැංගුණා. පොඩි අය ඉස්සරහට දමා නායකයෝ හැංගුණා. එහෙම තමයි ඒ කාලයේ කටයුතු කළේ. වසන්ත සහ ප්‍රසන්ත මැරුණා, තංගල්ල තුන් මං හන්දියකදී. ඒ අම්මලා, තාත්තලා අදටත් දුක් වෙනවා. මේ පක්ෂය ගොඩගන්න "පළාත් සභා අපට එපා" කියන සටන් පාඨය කියන්නය කියලා පාසල්වලට ගිහිල්ලා කියපු ඒ අහිංසක තරුණයන් දෙදෙනා එදා මරා දැම්මා. මේගොල්ලන් පළාත් සභාවලට බයයි. නමුත් අපි අනිවාර්යයෙන්ම කියනවා, පළාත් සභා මැතිවරණය තියන්න කියලා. පළාත් සභා මැතිවරණයේදී අපි තමුන්නාන්සේලාට අපේ බලය පෙන්වනවාය කියන එකත් මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

විශේෂයෙන්ම තංගල්ල නගර සභාව සම්බන්ධයෙන් පවතින ප්‍රශ්නයක් ගැනත් මම කථා කරන්න ඕනෑ. ඒ තමයි, ඇල්ල ප්‍රදේශයේ සිදු වුණු බස් අනතුර. සභාපතිවරයා පත් වෙලා මාසයයි, අපේ ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ 22කට සංචාරයක යන්න අවසර දුන්නා. ලේකම්තුමා ප්‍රමුඛ සියලු කාර්ය මණ්ඩලය - පරිපාලන නිලධාරි, සංවර්ධන නිලධාරි, කාර්යාල කාර්ය සහායක, කළමනාකරණ සහකාර, සෞඛ්‍ය කම්කරු, වැඩබලන කම්කරු - ඒ අතරේ හිටියා. නගරයක පරිපාලනයක් කරන මේ නිලධාරින්ට එක වතාවට නිවාඩු දෙන්න බැහැ. සභාපතිවරයා නොදැනුවත්කමට මේ දේ කරලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
මට තව විනාඩියක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කලින් ඔබතුමාට විනාඩි දෙකක් දීලා තිබෙන්නේ. ඒ නිසා දැන් කථාව අවසන් කරන්න.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ඇල්ල ප්‍රදේශයේ සිදු වුණු බස් අනතුරින් 15දෙනෙක් මැරුණා. 9දෙනෙක් එක්තැන් වුණා. මේවාට වග කියන්න ඕනෑ, මේ සභාව. මොළයක් නැතුව, තේරුමක් නැතුව වැඩ කරලා අහිංසක ජීවිත කීපයක් තමයි නැති වුණේ. මේ ජීවිතවලට ඔවුන් වග කියන්න ඕනෑ. ඒ නිසා ඇල්ල ප්‍රදේශයේ වුණු සිද්ධිය ගැන මේ සභාපතිවරයාට විරුද්ධව විනය පරීක්ෂණයක් කරන්න. මේ අයට කොහොමද නිවාඩු ලබා දුන්නේ කියන එක ගැනත් පරීක්ෂණයක් කරන්න කියා මම ඉල්ලීමක් කරනවා. මට ලැබී ඇති කාල වේලාව අවසාන බව දන්වන නිසා මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පද්මසිරි බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.42]

**ගරු පද්මසිරි බණ්ඩාර මහතා**
(மாண்புமிகு பத்மசிறி பண்டார)
(The Hon. Padmasiri Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම මම ඉතා අගයකොට සලකනවා. විශේෂයෙන්ම මෙහිදී මම මතක් කරන්න ඕනෑ, විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිප දෙනෙකු තමන්ගේ අදහස් දැක්වීමේදී බොරු තර්ක කිහිපයක් මේ සභාවට ඉදිරිපත් කරලා, සභාව වාගේම රට නොමඟ යැවීම සඳහා කටයුතු කරපු අවස්ථා කිහිපයක් මා දැක්කා කියන කාරණය. මෙහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ රුපියල් බිලියන 456කට ආසන්න මුදලින් පුනරාවර්තන වියදම සඳහා රුපියල් බිලියන 52.5ක මුදලකුත්, ප්‍රාග්ධන වියදම සඳහා රුපියල් බිලියන 403කුත් වෙන් කරලා තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කිව්වේ, මේ අය වැයේ වෙන් කරලා තිබෙන මුදල්වලින් සියයට 13ක් තමයි ප්‍රාග්ධන වියදම් හැටියට වෙන් කරලා තිබෙන්නේ කියායි. කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා වෙන් කරපු මුදල රුපියල් බිලියන 257යි. මේ මුදල පුනරාවර්තන වියදම සඳහා රුපියල් බිලියන 102.6කුත්, ප්‍රාග්ධන වියදම සඳහා රුපියල් බිලියන 164කුත් වශයෙන් තමයි වෙන් කරලා තිබෙන්නේ. එහෙම නම්, ඒකෙනුත් ඒ විපක්ෂයේ මන්ත්‍රීවරයා කියන අදහස සම්පූර්ණයෙන් බොරුවක් කියන එක පැහැදිලි වෙනවා. ඒ වාගේම ග්‍රාමීය හා යටිතල පහසුකම් විෂය භාර අමාත්‍යාංශයට මෙවර අය වැයෙන් රුපියල් බිලියන 169ක් වෙන් කරනවා. ඒ අනුව පුනරාවර්තන වියදම රුපියල් බිලියන 11.4යි. ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 157.6යි. ඒ අනුව, මේ සාධකවලින් පෙන්වා තිබෙනවා, මේ අය වැය විපක්ෂය හිතන විධියේ අය වැයක් නොවෙයි, මේක අපි ඉතාම තාර්කිකව සමාජයේ වුවමනාව තේරුම් අරගෙන, රටේ අනාගතය ගැන හිතලා, ඒ අනාගතය වෙනුවෙන් අවශ්‍ය කරන ප්‍රාග්ධන වැය ශීර්ෂයට සියයට 50කටත් වැඩි මුදලක් වෙන් කරමින් තමයි අපි මේ අය වැය සකස් කර තිබෙන්නේ කියන එක.

ඒ වාගේම මෙතෙක් ඉතිහාසයේ සිදු නොවුණු විශේෂ සිදුවීමක් මේ අය වැයේ සටහන් වෙනවා. රාජ්‍ය සේවයේ සියයට 3ක ප්‍රතිශතයක් ආබාධ සහිත ප්‍රජාව සඳහා වෙන් කර ඇති බව නිල වශයෙන් ප්‍රකාශ කර ඇති නමුත් එය නිසියාකාරව ක්‍රියාත්මක වුණේ නැහැ. නමුත් මෙම වසරේ රජයේ සේවය සඳහා එම සියයට 3ක ප්‍රතිශතය බඳවා ගැනීමට ඉදිරි සියලු රාජ්‍ය සේවයේ බඳවා ගැනීම්වලදී කටයුතු කරනවා කියලා අපේ ගරු ජනාධිපතිතුමා තමන්ගේ අය වැය කථාවේදී ඉදිරිපත් කළා. ඒ වාගේම ආබාධ සහිත ප්‍රජාව ජාතික ආර්ථිකයට දායක කර ගැනීම මූලික කරගෙන පෞද්ගලික සේවා යෝජකයන් දිරිගැන්වීම හා සේවා නියුක්තිය වර්ධනය කිරීමේ අරමුණින් රැකියාවක නියැළිය හැකි මට්ටමක සිටින ආබාධ සහිත තැනැත්තන් පෞද්ගලික අංශයේ රැකියාවක් සඳහා බඳවා ගන්නේ නම් එම සේවකයාට රුපියල් 15,000ක උපරිමයකට යටත්ව ඒ සේවකයන්ගේ වැටුපෙන් සියයට 50ක වැටුප් සහනාධාරයක් මාස 24ක් දක්වා රජය මඟින් ගෙවීමට යෝජනා කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. ඉතිහාසයේ කිසිදු අය වැය වාර්තාවක මෙවැනි රාජ්‍ය මුදල් වෙන් කිරීමක් කරලා නැහැ. මෙවැනි මුදල් වෙන් කිරීමක් සිදු කළ නිසා අපේ මෙවර 2026 අය වැය ඓතිහාසික තත්ත්වයක් නිර්මාණය කරමින් තිබෙනවා.

පළාත් පාලන ආයතනවල ගැටලු පිළිබඳව විපක්ෂයේ හඬක් ඇහුණා. ඇත්තටම අපි ගැටලු වර්ග දෙකක් හඳුනාගෙන තිබෙනවා. එක ගැටලුවක් තමයි, ඒ ආයතනවල නිලධාරින්ගේ හිඟය. අනෙක් එක තමයි, ඒ වැඩ කරන්න, සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය කරන උපකරණවල හිඟය. ඒක නිසා තමයි අපි මෙවර අය වැයෙන් රැකියාවන් සඳහා 75,000කට වැඩි පිරිසක් බඳවා ගැනීමට යෝජනා කර තිබෙන්නේ. ඒ සඳහා කැබිනට් මණ්ඩලයෙන් අනුමැතියක් දීලා තිබෙනවා. ඒ ආයතනවල පුරප්පාඩු වී ඇති නිලධාරි තනතුරු සම්පූර්ණ කර ගත්තත් වැඩක් නැහැ, ඒ ආයතනවලට අවශ්‍ය කරන උපකරණ නැත්නම්. ඒ පළාත් පාලන ආයතනවලට අවශ්‍ය කරන උපකරණ මිලදී ගැනීම සඳහා තමයි අපි මෙවර අය වැයෙන් රුපියල් මිලියන 12,500ක් වෙන් කරලා තිබෙන්නේ. ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ එක් පළාත් පාලන ආයතනයක් පමණක් සංවර්ධනය කරන්න නොවෙයි. පළාත් පාලන ආයතන එකක් නොවෙයි, ආසන්නයේ තිබෙන කිහිපයක් එකට එකතු කරලා පොකුරු ප්‍රාදේශීය සභාවක් නිර්මාණය කරනවා. ඒ තුළින් සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන උපකරණ මිලදී ගෙන ඵලදායී ලෙස ඒවා භාවිත කිරීම සඳහා තමයි එතරම් දැවැන්ත මුදලක් වෙන් කරලා තිබෙන්නේ.

මොකද, විපක්ෂයේ හඬ තිබෙන්නේ මේ මුදල මන්ත්‍රීවරුන්ගේ වාහන මිලදී ගැනීම සඳහා වෙන් කළාය කියන එකයි. ඒ හඬ තමයි සමාජයට යවමින් තිබෙන්නේ. ඒක ඉතාම බරපතළ වැරැද්දක් වාගේම බොරුවක් හැටියට සමාජයේ මිනිසුන් අනාගතයේදී හඳුනා ගනීවි. පසුගිය දවස් ටිකේ ගෙදර ඉන්නකොට මම දැන ගත්තා, මේ විවාදය පිළිබඳව ග්‍රාමීය ජනතාව තුළ තිබෙන්නේ වැරැදි මතයක් කියලා. ඒක මට හොඳටම දැනුණා. මොකද, මේ නයි නාළිකාවලින් හැම වෙලාවේදීම කරන්නේ වැරැදි ප්‍රවෘත්ති සමාජයට එළිදැක්වීමක්. මේ අය වැයෙන් ග්‍රාමීය සංවර්ධනයට, ඔවුන්ගේ ජන ජීවිතය ගොඩනැඟීමට, අධ්‍යාපන සංවර්ධනයට, පළාත් පාලන ආයතන දියුණු කිරීමට අවශ්‍ය කරන මුදල් කොච්චර ප්‍රමාණයක් වෙන් කළාද, ඒ මුදල්වල තිබෙන ක්‍රියාකාරිත්වයන් සඳහා පළාත් පාලන ආයතන කොහොමද මෙහෙයවන්නේ කියන පණිවුඩය සමාජයට ගිහිල්ලා නැහැ. සමාජයට ගිහිල්ලා තිබෙන්නේ වැරැදි මතයක්. මොකද, සමාජයේ වැඩිම පිරිසක් නරඹන නාළිකා දෙක තුනක් තිබෙනවා. ඒවායින් පොම්ප කරන්නේ ඒ වැරැදි මතය. මේ වාගේ විධිමත් දැක්මක් සහිත, දර්ශනයක් සහිත පදනමක් මත ඉඳගෙන මේ රටේ මෑත ඉතිහාසයේ ඉදිරිපත් කරපු අය වැය අතුරින් අපේ ආණ්ඩුවේ දෙවැනි අය වැය ඉතාම විනිවිදභාවයෙන් යුතු අය වැයක් වාගේම සංවර්ධනාත්මක අය වැයක් කියන එක මා මේ අවස්ථාවේදී මේ සභාවට සහ ලාංකීය ජනතාවට ප්‍රකාශ කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අපේ රටේ රාජ්‍ය සේවකයා ගැන ගත්තොත්, රාජ්‍ය සේවකයාට මෑත ඉතිහාසයේ නොලැබුණු වරප්‍රසාද ගණනාවක් මෙවර අය වැය තුළින් ලැබිලා තිබෙනවා. එක වරප්‍රසාදයක් හැටියට, රාජ්‍ය සේවකයින්ට ලබා දෙන පොලී රහිත උත්සව අත්තිකාරම් මුදල රුපියල් 10,000 ඉඳලා රුපියල් 15,000 දක්වා වැඩි කිරීම ගන්න පුළුවන්. ආපදා ණය අත්තිකාරම් මුදල රුපියල් 250,000 සිට රුපියල් 400,000 දක්වා වැඩි කර තිබෙනවා. ගුරුවරුන්ට දුෂ්කර දීමනාව වශයෙන් මෙතෙක් කල් දුන්නේ රුපියල් 1,500යි. එම දීමනාව දැන් රුපියල් 3,000 දක්වා වැඩි කරලා තිබෙනවා. එලෙස වැඩි කළේ වසර 20ක් වැනි දීර්ඝ කාලයකින්. ඒක නිසා මෙම අය වැය ඉතාම විනිවිදභාවයකින් යුතු, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායක වන අය වැයක් බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.50]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ රාජ්‍ය යන්ත්‍රණයේ ඉතා වැදගත්ම අමාත්‍යාංශයක් වන රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේත් වැය ශීර්ෂවලට අදාළව කාරක සභා අවස්ථාවේ විවාදය අද දවසේ පැවැත්වෙනවා. මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක වෙන්නේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හරහා. අද වනවිට මේ රටේ රාජ්‍ය නිලධාරින්ට තීරණ ගනිද්දී පොඩි සැකයක්, භයක් තිබෙනවා, "මටත් හිරේ යන්න වේවිද?" කියලා. රාජ්‍ය නිලධාරියෙක් වුණාම ඒකට ලජ්ජයි. චෝදනාවක් ඉදිරිපත් කළාට සමහර විට ඒ චෝදනාව ඔප්පු නොවෙන්න පුළුවන්. නමුත් ඒ රාජ්‍ය නිලධාරියා දවස් කිහිපයකට හරි රිමාන්ඩ් බන්ධනාගාරගත කළොත්, ඒක එයාගේ ජීවිතයටම කළු පැල්ලමක් වෙනවා. ඒ නිසා රාජ්‍ය යන්ත්‍රණය අද ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා තමයි තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ සංවර්ධන වැඩවලට ප්‍රාග්ධන වියදම් විධියට වෙන් කරපු මුදලෙන් පසුගිය ඔක්තෝබර් මාසයේ 30වැනි දා වෙනකලුත් සියයට 30කට අඩු ගණනක් වියදම් කරලා තිබෙන්නේ. මේ රටේ අවුරුදු 77ක ඉතිහාසයේ අඩුවෙන්ම සංවර්ධන වැඩ කරපු ආණ්ඩුව විධියට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ඉතිහාසගත වෙනවා. මට ආරංචියි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට අදාළව කැබිනට් මණ්ඩලය හරි ආණ්ඩුව හරි තීන්දුවක් අරගෙන චක්‍රලේඛයක් නිකුත් කරනකොට ඒක යවන්න ඕනෑ ලු පැල්වත්තට, හරිද කියලා බලන්න. මම දන්නේ නැහැ, ඇමතිතුමාගෙන් මම අහනවා. සමහර ඒවා පැල්වත්තට ගියාම මාස ගණන් පරක්කු වෙනවා ලු.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
පැලවත්තට.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ඔව්, පැලවත්තට. පැල්වත්තට නොවෙයි, පැලවත්තට. *[බාධා කිරීමක්]* පැලවත්තට, පැලවත්තට. *[බාධා කිරීමක්]* පැලවත්තට, පැලවත්තට. *[බාධා කිරීමක්]* ඔව්. මට මතක් වෙන්නේ මගේ ගමේ තිබෙන පැල්වත්ත. *[බාධා කිරීමක්]* තමුන්නාන්සේලාට මතක් වෙන්නේ මෙහේ පැලවත්ත. *[බාධා කිරීමක්]* රට හීනෙනුත් බය වෙන්නේ, පැලවත්ත ගැන හිතලා. එතැනින් නේ පාලනය වෙන්නේ. *[බාධා කිරීමක්]*

තමුන්නාන්සේලා කිව්වා, මේ රටේ රාජ්‍ය සේවකයන්ට මාස හයෙන් හයට පඩි වැඩි කරනවාය කියලා. අපි නම් අපේ යහපාලන ආණ්ඩුවෙන් සියයට 107කින් පඩි වැඩි කළා. බැලින්නම්, මේ රටේ පහළම ශ්‍රේණියේ සේවකයාට ගිය අවුරුද්දේ පඩි වැඩි කරලා තිබෙන්නේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව, රුපියල් 6,800කින්. ඒකෙනුත් රනිල් වික්‍රමසිංහ මහත්මයා රුපියල් 5,000ක advance එකක් දීලා තිබුණා. ඒ කියන්නේ රුපියල් 1,800යි. තමුන්නාන්සේලා මොකක්ද කළේ, රජයේ සේවකයන්ගේ පඩි වැඩි කරනවාය කියලා? තිබුණු දීමනා ඔක්කෝම මූලික පඩියට එක්කාසු කළා. මූලික පඩියට එක්කාසු කරන එකේ වාසිය ලැබෙන්නේ විශ්‍රාම ගියාම. විශ්‍රාම වැටුප වැඩි වෙනවා. අවුරුද්දකට විශ්‍රාම යන්නේ 25,000යි. තමුන්නාන්සේලාගේ අවුරුදු 5ටම විශ්‍රාම යන්නේ, 125,000යි. ඉතින්, ඊළඟට බලය ගන්න අපටම තමයි තමුන්නාන්සේලා වැඩි කරපු ඒ ගණන ගෙවන්න වෙන්නේ. එහෙම තමයි වෙන්නේ. මම හිතන විධියට, තමුන්නාන්සේලා රජයේ සේවකයා රැවැට්ටුවා.

ඒ වාගේම ජනාධිපතිවරයා ඇවිල්ලා මේ පාර්ලිමේන්තුවේ අය වැය කථාව කරද්දී කිව්වා, 2016 අපේ ආණ්ඩුව කාලයේදී විශ්‍රාම වැටුප අහෝසි කළා, ඒ විශ්‍රාම වැටුප නැවත ලබා දෙන්න කටයුතු කරනවාය කියලා. ගරු රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමනි, 21/2017 දරන චක්‍රලේඛයේ පැහැදිලිව තිබෙනවා, රජයේ නිලධාරින් සඳහා වන විශ්‍රාම වැටුප් ක්‍රමය ගැන. අපේ අමාත්‍යාංශයේ එදා හිටපු ලේකම්වරයා එය නිකුත් කරලා තිබෙන්නේ. ඒකේ පැහැදිලිව තිබෙනවා, 2016න් පසු රාජ්‍ය සේවයට බඳවා ගැනීම සම්බන්ධව. එහි තිබෙනවා, "මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. -නැති කරලා නැහැ එතකොට- ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. - ඒකත් හරි- තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ දායක මුදල් ගෙවිය යුතු ය" යනුවෙන්.

මට මතකයි, එදා අපේ රජය වෘත්තීය සමිති නායකයන් ගෙන්වලා සාකච්ඡා කළා. ඒගොල්ලන් කිව්වා, මේ විශ්‍රාම වැටුප් ක්‍රමය තියන්න කියලා. අපි ඒක වෙනස් කළේ නැහැ. මේ චක්‍රලේඛය අනුව ඒගොල්ලන්ට විශ්‍රාම වැටුප් හිමිකම තිබුණා. W&OP එකට කැපුවා. මම හිතන විධියට, රජයේ සේවකයන්ට මොකුත් කරන්න බැරිකමට ජනාධිපතිතුමා ඇවිල්ලා, විශ්‍රාම වැටුප් නැවත ලබා දෙනවාය කිව්වා. ඒක අහෝසි කරලා නැහැ. දැන් විශ්‍රාමිකයන්ට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. මට මතකයි, 2016 ඉඳලා 2020 වෙනකල් විශ්‍රාම ලබපු අයට අපි කිව්වා, 2020 වැටුපට සරිලන විධියට විශ්‍රාම වැටුප සංශෝධනය කරලා හිඟ මුදල් ගෙවනවාය කියලා. එදා මට මතකයි, රුපියල් බිලියන 19ක් ඒකට ඕනෑ වෙලා තිබුණා. අපි ඒ මුදල වෙන් කරලා තිබුණා, අය වැයෙන්. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඒක නැවැත්තුවා. නමුත්, තමුන්නාන්සේලා බලයට ආවේ ඒ නවත්තපු එක වහාම ලබා දෙනවා කියලායි. මම හිතන විධියට, ඒ අයට 2027, 2028 වනකල් ඉන්න වෙනවා, ඒක ලබා ගන්න. මම දන්නේ නැහැ, එදාටවත් ඒක ලැබෙයිද කියලා.

අද බෙහෙත් මිල වැඩි වෙලා, බඩු මිල වැඩි වෙලා නිසා විශ්‍රාමිකයන් බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ. අපි එදා පැහැදිලිව ඒගොල්ලන්ගේ තැන්පතුවලට සියයට 15ක පොලියක් ලබා දුන්නා. ඒක පසුගිය ආණ්ඩුවෙන් අඩු කළා. හැබැයි, තමුන්නාන්සේලා පොරොන්දුවක් ලබා දුන්නා, ඒ පොලිය නැවත ලබා දෙනවා කියලා. අපි තමුන්නාන්සේලාගෙන් අහනවා, භාණ්ඩාගාරයේ මුදල් තිබෙනවා නම්, ප්‍රාථමික ගිණුමේ balance එක ලොකුවට තිබෙනවා නම්, ට්‍රිලියනයක් වැඩිපුර තිබෙනවා නම්, මේ පොලිය වැඩි කරන්නේ නැත්තේ ඇයි කියලා. අපි ඉල්ලීමක් කළා, ඒ පොලිය වැඩි කරලා විශ්‍රාමිකයන්ට අවශ්‍ය පහසුකම් ලබා දෙන්න කියලා.

ඒ එක්කම මේ අය වැයේ තිබෙනවා, රජයේ සේවකයන්ට නිවාස ණය සඳහා තමුන්නාන්සේලා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා කියලා. රජයේ සේවකයන් 14ලක්ෂයක් ඉන්නවා. රුපියල් ලක්ෂ 50 දක්වා තමයි ණය ලබා දෙන්නේ. මේ ලක්ෂ 14න් 100කට, නැත්නම් 200කට විතරයි නිවාස ණය දෙන්න පුළුවන්කම තිබෙන්නේ. ඇයි, රජයේ සේවකයෝ මේ විධියට රවට්ටන්නේ? පසුගිය කාලයේ ඕනෑම රජයේ සේවකයකුට පුළුවන්කම තිබුණා, ආපදා ණය -මාස 10 ණය- ගන්න. තමුන්නාන්සේලා ඒකත් limit කර තිබෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 10,000යි වෙන් කර තිබෙන්නේ. රජයේ සේවකයන් ලක්ෂ 14ක ප්‍රමාණයක් ඉන්නවා. තමුන්නාන්සේලා මේ ඔක්කොම මුදල දුන්නත් ලක්ෂ 4කට තමයි දෙන්න පුළුවන්. ඉතුරු ලක්ෂ 10ටම ආපදා ණය ගන්න බැහැ.

ඊළඟට මම කියන්නම්, පළාත් පාලන ආයතන ගැන. මට මතකයි, පළාත් පාලන ඡන්දයේදී ජනාධිපතිවරයා ඒකාධිපති කථාවක් කළ ආකාරය. එතුමා මොනවාද කිව්වේ? මාලිමාවට බලය නොදෙන පළාත් පාලන ආයතනවලට මුදල් දෙන්නේ නැහැ කිව්වා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධ කථාවක් ඒ කරලා තිබෙන්නේ. එදා මේ රටේ ඡන්දදායකයාට බලපෑමක් කළා. අද වන විට පළාත් පාලන ආයතන 337න් එකසිය ගණනක බලය විපක්ෂයට ඇවිල්ලා තිබෙනවා. පළාත් සභාවේ ඉන්නේ ආණ්ඩුව පත් කරපු දේශපාලන පත්වීමක්; ආණ්ඩුකාරවරයෙක්. අපේ බලය තිබෙන පළාත් පාලන ආයතනවලට අවශ්‍ය මුදල් නිසි වෙලාවට දෙන්නෙත් නැහැ, නිලධාරින් පත් කරන්නෙත් නැහැ. අපි ජනාධිපතිවරයාගෙන්, ඇමතිවරයාගෙන් ඉල්ලා සිටිනවා, මේ රටේ ජනතාවගේ ඡන්දයෙන් පත් වෙච්ච ඒ ආයතනවලට සමානව සලකන්න, ඒකට ඕනෑ මුදල් ටික දෙන්න, ඒකට ඕනෑ නිලධාරින් පත් කරන්න කියලා. තමුන්නාන්සේලා පළාත් පාලන ආයතන එවැනි තත්ත්වයකට පත් කර තිබෙනවා.

ඒ වාගේම තමයි පළාත් සභා. මේ රටේ පළාත් සභා ක්‍රමය එනකොටත් තමුන්නාන්සේලා විරුද්ධ වුණා. 10,000ක් විතර මැරුවා. හැබැයි, ආපහු ගිහිල්ලා පළාත් සභාවල මන්ත්‍රී ධුර ගත්තා. මම හිතන විධියට, අද පාසල්වලින් සියයට 95ක් තිබෙන්නේ පළාත් සභා පාසල්. සෞඛ්‍ය සේවාවෙන් සියයට 90ක් තිබෙන්නේ පළාත් සභාව යටතේ. කෘෂිකර්මයේ වැඩි කොටසක් තිබෙන්නේ පළාත් සභාව යටතේ. ඒ පළාත් සභා අද පාලනය වෙන්නේ ආණ්ඩුකාරවරයා යටතේ. ඒ මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව දෙන්නේ නැහැ.

තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා, පළමුවෙනි අවුරුද්දේ පළාත් සභා සහ පළාත් පාලන ඡන්දය පවත්වනවා කියලා. පළාත් පාලන ආයතන මැතිවරණය තිබ්බා. ඒකෙන් මාලිමාවට මහ මැතිවරණයට වඩා ලක්ෂ 23ක් ඡන්ද අඩු වුණා. ඒ නිසා පළාත් සභා ඡන්දය තියන්න භය වුණා. ජනාධිපතිවරයා මෙතැනට ඇවිල්ලා කියනවා, විපක්ෂය තමයි මේක කළේ, ඒ නිසා විපක්ෂයෙන් මේක හදන්න ලූ. පනත

සංශෝධනය කරන්න ලු. පනත් සංශෝධනය කරන්න තමයි ජනතාව මන්ත්‍රීවරු 159දෙනෙකු පත් කර තිබෙන්නේ. ඒ කියන්නේ, ජනාධිපතිවරයා කෙරෙන්නේ නැති වැඩක් ද මේ කිව්වේ? අපි කියනවා, පළාත් සභා ඡන්දය තියන්න කියලා. ආණ්ඩුව හයයි, තව ඡන්ද ලක්ෂ 23ක් අඩු වෙයි කියලා. අපි දෙනවා, ඡන්දය. පොඩි, සරල සංශෝධනයක් ඕනෑ. සරල බහුතරයකින් කරුණාකරලා පරණ ක්‍රමයට පළාත් සභා මැතිවරණය තියන්න කියලා තමුන්නාන්සේලාගෙන් අපි ඉල්ලා සිටිනවා. මේ රටේ මහජන මුදල් වැඩිපුර යන අමාත්‍යාංශය තමයි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය. අද ඒ සියලු මුදල් වෙන් කරන්නේ ජනාධිපතිවරයාගේ නියෝජිතයෙක් වන ආණ්ඩුකාරවරයා යටතේ. මේකද තමුන්නාන්සේලාගේ ප්‍රජාතන්ත්‍රවාදය කියලා අපි අහනවා. මේකද තමුන්නාන්සේලා ජනතාවට කියූ සැබෑ වෙනස කියලා අපි අහනවා.

ඊළඟට, මේ රටේ රාජ්‍ය සේවය ගනිමු. රජයේ විධායක ශ්‍රේණියේ නිලධාරින්ට දිරි දීමනාවක් විධියට හොඳ වාහනයක යෑම සඳහා වාහන බලපත්‍රයක් ලබා දෙන්න අපි එදා තීරණය කළා. දැනට වාහන බලපත්‍ර 19,000ක් පමණ නිකුත් කර තිබෙනවා. තමුන්නාන්සේලාගේ ජනාධිපතිවරයා එදා ජනාධිපතිවරණයේදී කිව්වා මට මතකයි, "අපි මන්ත්‍රීවරුන්ගේ පහසුකම් ඔක්කෝම නවත්වනවා. රජයේ සේවකයන්ගේ වරප්‍රසාද මොකවත් අඩු කරන්නේ නැහැ" කියලා. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? මන්ත්‍රීවරුන්ට කැබ් රථ දෙන්න යනවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
බිමල් රත්නායක ඇමතිතුමා, ඒක නතර කරලා දමන්නකෝ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
රජයේ සේවකයන්ගේ වාහන බලපත්‍රය දෙන්නේ නැහැ. අපි කැබ් රථ ඉල්ලුවේ නැහැ.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
ඒක නතර කරලා දමන්නකෝ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි කැබ් රථ ඉල්ලුවේ නැහැ. හැබැයි, අපේ ආණ්ඩුව වාහන බලපත්‍රය දෙන කොට තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුන් සියලුදෙනාම ඒවා ගත්තා: 39දෙනාත් ගත්තා, 16දෙනාත් ගත්තා, 10දෙනාත් ගත්තා, 3දෙනාත් ගත්තා. ගරු බිමල් රත්නායක ඇමතිතුමනි, තමුන්නාන්සේත් වාහන බලපත්‍රයක් ගත්තා. දැන් කියනවා, රජයේ නිලධාරින්ට වාහන බලපත්‍ර දෙන්න එපා කියලා. අපි ඉල්ලා සිටිනවා රජයේ නිලධාරින්ගේ වාහන බලපත්‍රය ලබා දෙන්න කියලා. මොකද, විශ්‍රාම යෑමට ආසන්න විධායක ශ්‍රේණියේ රජයේ නිලධාරින් සමහර විට භාගෙට හදාගෙන තිබෙන ගෙය හදා ගන්නේ ඒකෙන්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
සමගි ජන බලවේගයේ සිටින කැබ් රථ හෝ වෙනත් මොනවා හරි වාහනයක් අවශ්‍ය නැති මන්ත්‍රීවරයන්ගේ අත්සන් ලේඛනයක් අපට දෙන්න, ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමනි. අපි ඒ අනුව කටයුතු කරන්නම්.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
තමුන්නාන්සේට ඒකද ඕනෑ වෙලා තිබෙන්නේ දැන්? මම කිව්වේ ඒක නොවෙයි. රජයේ නිලධාරින්ගේ වාහන බලපත්‍ර ටික දෙන්න කියලායි. තමුන්නාන්සේ පිළිගන්නවාද, තමුන්නාන්සේ වාහන බලපත්‍ර ගත්තා කියලා? පිළිගන්නවාද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මට ලැබුණු වාහන බලපත්‍ර ලබාගෙන තිබෙනවා. ඒවාට ඒ මොහොතේ ගන්න තිබුණු අඩුම මුදලට -මා හිතන්නේ ඩොලර් 11,000 හෝ 15,000ක මුදලට - අපි වාහන අරගෙන තිබෙනවා. මම කවදාවත් වාහන පර්මිට් විකුණලා නැහැ. ඒ වාගේම අපි එක් වාහන බලපත්‍රයක් ප්‍රතික්ෂේප කරලාත් තිබෙනවා. 2001දී ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ රනිල් වික්‍රමසිංහ මහත්මයා බොලෙරෝ කැබ් රථ ගෙන ආ වෙලාවේ දුන්නු ඒ වාහන බලපත්‍රය අපි ප්‍රතික්ෂේප කළා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මා හිතන විධියට, තමුන්නාන්සේලා ඒ වන කොට හිටියේ ඉන්දියානු ව්‍යාප්තවාදයට විරුද්ධව නේ. ඉන්දියාවේ පරිප්පු කන්න එපා කිව්වා. ඉන්දියාවේ වාහනයත් එපා කිව්වා. ඉන්දියාවේ අනෙක් දේවලුත් එපා කිව්වා. නමුත්, දැන් ඉන්දියාවත් එක්ක ගිවිසුම් 7ක් අත්සන් කරලා තිබෙනවා; රටට කියන්නේත් නැහැ. මොනවාද ඒ ගිවිසුම් කියලා අපි අහනවා. ඉස්සර නම් ඕනෑම රජයක් ගිවිසුමක් අත්සන් කළාම කියනවා.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
එතුමා නම් ඒ ප්‍රතිපත්තියේ ඉන්නවා තවම.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මම දන්නවා, එතුමා ඒ ප්‍රතිපත්තියේ ඉන්නවා කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
එතුමා ඉන්දියාවත් එක්ක නැහැ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
එතුමා ඉන්දියාවත් එක්ක නැහැ. NPP එකයි, අනෙක් කට්ටියයි ඉන්නවා. එච්චරයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් විනාඩියක කාලයක් දෙන්න.

ග්‍රාම නිලධාරින් තමයි වැඩියෙන්ම වැඩ කරන්නේ. කොට්ඨාසයේ වැඩියෙන් වැඩ කරන්නේ ග්‍රාම නිලධාරින්. 2024 මාර්තු මාසයේ කැබිනට් මණ්ඩලය තීන්දුවක් අරගෙන තිබෙනවා, ග්‍රාම නිලධාරින්ට රුපියල් 15,000ක නිල ඇඳුම් දීමනාවකුත්, ගමන් වියදම් ලෙස ඉන්ධන ලීටර් 20ක් හෝ ඊට සරිලන දීමනාවකුත්, රුපියල් 1,500ක දුරකථන දීමනාවකුත් ලබා දෙන්න. එම තීන්දුව ක්‍රියාත්මක කරන්න කියලා අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, මට තවත් පොඩි කාලයක් දෙන්න.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාට තවත් විනාඩි දෙකතුනක් දෙන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
කළමනාකරණ සේවා නිලධාරින්ගේ සංගමය ඉල්ලා සිටිනවා, "පොරොන්දු වූ පරිදි වැටුප් සංශෝධනය මඟින් කළමනාකරණ සේවා නිලධාරින්ගේ වැටුප් විෂමතාව අවසන් කරන්න" කියලා. ඡන්දයට ඉස්සෙල්ලා කළමනාකරණ සේවා නිලධාරින්ට කියලා තිබෙනවා, ඒගොල්ලන්ගේ වැටුප් විෂමතාව අවසන් කරනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවම එය අවසන් කරලා නැහැ. ඒ වාගේම ඔවුන් තවත් විෂමතාවක් ගැන කියා තිබෙනවා. මධ්‍යම රජයට බඳවා ගැනීමේදී විභාග පවත්වනවා. පළාත් සභාවට බඳවා ගැනීමේදී විභාග නැහැ. ඒ අය ඉල්ලා සිටිනවා ඒ දෙකටම විභාග තියන්න කියලා.

අනෙක් කාරණය තමයි, අග්‍රහාර රක්ෂණ ක්‍රමය. අසනීපයක් වුණාම රජයේ සේවකයෙකුට තිබෙන එකම පිහිට තමයි අග්‍රහාර රක්ෂණ ක්‍රමය. දැන් තමුන්නාන්සේලා එහි දායක මුදල වැඩි කරලා තිබෙනවා. අද ගමන් ගාස්තුව වැඩියි; බෙහෙත් වියදම වැඩියි; බඩු මිල වැඩියි. රජයේ සේවකයන්ගේ අග්‍රහාර සාමාන්‍ය රක්ෂණය ක්‍රමයට අදාළව තිබුණු රුපියල් 125ක මාසික දායක මුදල ඔබතුමන්ලා රුපියල් 200 කරලා තිබෙනවා. අග්‍රහාර රිදී - Silver - රක්ෂණ ක්‍රමයේ දායක මුදල රුපියල් 300 රුපියල් 450ක් කරලා තිබෙනවා. අග්‍රහාර රන් රක්ෂණ ක්‍රමයට අදාළව තිබුණු රුපියල් 600 මාසික දායක මුදල රුපියල් 750ක් කරලා තිබෙනවා. අප ඉල්ලා සිටින්නේ රජයේ සේවකයන්ගේ අග්‍රහාර රක්ෂණ ක්‍රමයට අදාළව පරණ ගණනම තියන්න කියලායි. මොකද, දැනටමත් රජයේ සේවකයෝ තමුන්නාන්සේලාට විශාල බදු මුදලක් ගෙවනවා, පඩියෙන්. එසේ තිබියදී මේ දේවලුත් ගන්න එපා කියා ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ 2016.01.01 දින සිට විශ්‍රාම වැටුප ඉතාම පැහැදිලිව අහෝසි කළා. රාජ්‍ය සේවකයන්ට ඊට පෙර විශ්‍රාම වැටුපයි තිබුණේ. ඒ වෙනුවට දායක විශ්‍රාම වැටුපක් තමයි ඔබතුමන්ලා ගෙන ආවේ. ඒ බව පත්වීම් ලිපිවල සඳහන්ව තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමා නියෝජ්‍ය ඇමතිවරයා නේ. එතුමාට අවස්ථාව දෙන්න- *[බාධා කිරීමක්]*

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ගරු මන්ත්‍රීතුමා, මම පොඩි පැහැදිලි කිරීමක් විතරයි කරන්නේ. මා debate එකකට යනවා නොවෙයි. *[බාධා කිරීමක්]*

ගරු මන්ත්‍රීතුමා, අද දක්වාම ඒ අයට ඔය කියන දායක විශ්‍රාම වැටුප හැදුවේ නැහැ, පැවතුණු ඔබතුමන්ලාගේ ආණ්ඩුවවත්, ඊට පසුව පැවැති ගෝඨාභය ආණ්ඩුව සහ රනිල්-රාජපක්ෂ ආණ්ඩුවවත්. ඒ නිසා තමයි අපට සිදු වුණේ මෙවර අය වැයෙන් 2016.01.01ට හෝ ඉන් පසුව පත්වීම් ගත්තු සියලුදෙනාට පැරණි රාජ්‍ය සේවකයන්ට හිමි පූර්ණ විශ්‍රාම වැටුප දෙනවා කියන ප්‍රකාශය කරන්න. මම ඒ නිවැරැදි කිරීමයි කළේ.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි පැහැදිලි කිරීමකට මට අවස්ථාව දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

රාජ්‍ය සේවකයන්ගේ පත්වීම් ලිපිවල පැහැදිලිව තිබෙනවා, "මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතයි" කියලා. ඊළඟට තිබෙනවා, "ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය" කියලා. අපි එහෙම තීරණයක් අරගෙන නැහැ. විශ්‍රාම වැටුප් සහිතයි කියලා මෙහි සඳහන්ව තිබෙනවා. මම මේක ඔබතුමාට එවන්නම්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. අපි සාකච්ඡා කළා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

ගරු මන්ත්‍රීතුමා, ඕක තමයි මෙතැන තිබෙන ප්‍රශ්නය. "මෙය විශ්‍රාම වැටුප් සහිතයි" කියලා සඳහන් කර තිබෙනවා. ඔබතුමා 2016.01.01ට කලින් රාජ්‍ය සේවකයකුගේ පත්වීම් ලිපියකුත් අරගෙන කියවා බලන්න. ඒවායේ දෙවෙනි වාක්‍යයක් නැහැ. ඒ කියන්නේ "රජය මඟින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් වේ" කියන එක කලින් රාජ්‍ය සේවකයන්ගේ පත්වීම් ලිපිවල නැහැ. 2016.01.01න් පසුව පත්වීම් ලද රාජ්‍ය සේවකයන්ට අදාළව තමයි ඒක දාලා තිබෙන්නේ. රජය මඟින් ඒ කියන දායක විශ්‍රාම වැටුප මේ දක්වා හැදුවේ නැහැ; වසර 9ක් තිස්සේ හැදුවේ නැහැ. ඒ නිසා තමයි අපි මෙවර අය වැයෙන් ඒක අහෝසි කරන්න තීරණය කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

[பி.ப. 3.10]

**ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා**
(மாண்புமிகு இஸ்மாயில் முத்து மொஹம்மட்)
(The Hon. Ismail Muththu Mohamed)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

என்னுடைய பெயர் எப்பொழுதும் இங்கு பிழையாகவே உச்சரிக்கப்படுகின்றது. என்னுடைய சரியான பெயர் மொஹம்மட் இஸ்மாயில் முத்து மொஹம்மட்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு அத்துடன் தொழில் அமைச்சு ஆகியவற்றின் இன்றைய விவாதத்திலே கலந்துகொள்வதில் மகிழ்ச்சியடைகின்றேன். பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சை அரச நிருவாகத்திலே கூடுதலாகப் பங்கெடுக்கின்ற ஓர் அமைச்சாகக் காணுகின்றோம். இந்த அமைச்சு அரச நிருவாகத்தின் முதுகெலும்பாக இருக்கின்றது. மாவட்ட அரசாங்க அதிபர்கள் தொடக்கம் சாதாரண உதவியாளர்கள் வரை சகல அரச அதிகாரிகளும் இந்த அமைச்சின்கீழ் இயங்குகின்றார்கள். பொதுமக்களின் பல பிரச்சினைகளைத் தீர்க்கவேண்டிய பொறுப்பு இந்த அமைச்சுக்குக் கொடுக்கப்பட்டிருக்கின்றது. ஆனால், இந்த அமைச்சில் உள்ள சில அதிகாரிகளின் அசமந்தப் போக்குக் காரணமாக மக்கள் சேவைகளைப் பெறுவதிலே காலதாமதமும் நேர விரயமும் ஏற்படுகின்றது.

அண்மையிலே எங்களுடைய பிரதேசங்களிலே உள்ள ஒருசிலர் எங்களிடம் முறையிட்டார்கள், தங்களுடைய தேவைகளுக்காக அரச அலுவலகங்களுக்குச் செல்லுகின்ற போது அங்கிருக்கின்ற அதிகாரிகள், "நீங்கள் எந்தப் பிரதேசத்தைச் சேர்ந்தவர்கள், உங்களுடைய கிராமம் எது?" என்றெல்லாம் விசாரிக்கின்றார்கள் என்று. அவ்வாறு விசாரிப்பதன் நோக்கம், அங்கு இரண்டு வகையான சேவைகள் வழங்கப்படுவதனாலாகும். அரசாங்க ஆதரவாளர்களுக்கு மிக விரைவாகவும் ஏனைய கட்சிகாரர்களுக்குப் பின்னடித்தும் சற்றுத் தாமதமாகவும் சேவைகள் வழங்கப்படுகின்றன. இதனால் மக்கள் அலைகிறார்கள். நீண்ட தூரம் பிரயாணம் செய்து, செலவுகளைச் செய்து, காலத்தை வீணடித்துத் தேவைக்காக அலுவலகங்களுக்கு வரும் வேளையிலே இவ்வாறு நடக்கின்றது. ஆகவே, பொது நிருவாக அமைச்சின்கீழ் இருக்கின்ற அதிகாரிகள் அரசியலுக்குப் பயந்து அல்லது அமைச்சர்களுக்குப் பயந்து அல்லது பாராளுமன்ற உறுப்பினர்களுக்குப் பயந்து அல்லது அவர்களுக்குச் சார்பாகச் சேவையாற்றுவதை முற்றாகத் தவிர்க்க வேண்டும். இந்த நிலைமை மாற்றப்பட வேண்டும்.

அங்கிருக்கின்ற நிருவாகத் துறையிலே காணப்படுகின்ற ஆளணிப் பற்றாக்குறை அவர்களுக்குப் பாரிய பிரச்சினையாகக் காணப்படுகின்றது. உதாரணமாக, சில கிராம சேவையாளர்கள் அல்லது சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள் 2-3 divisionsஇல் கடமையாற்றுகின்ற காரணத்தால் அவர்கள் முழுமையான சேவையை வழங்க முடியாத நிலைக்குத் தள்ளப்படுகின்றார்கள். அதனால் அங்கு வருகின்ற பொதுமக்கள் ஏமாற்றப்படுகின்றார்கள். இதற்கு நாங்கள் அந்தக் கிராம சேவையாளர்களையோ அல்லது சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களையோ குறை கூற முடியாது. அவர்கள் மிக நீண்ட தூரம் பிரயாணம் செய்ய வேண்டியிருப்பது பாரிய பிரச்சினையாக இருக்கின்றது. வவுனியா மாவட்டத்திலே உள்ள வவுனியா பிரதேச செயலகத்திலே 42 கிராம சேவையாளர் பிரிவுகள் இருக்கின்றன. சில கிராம சேவையாளர்கள் பிரதேச செயலகத்துக்கு வருவதற்கு 18-20 மைல் தூரம் பிரயாணம் செய்ய வேண்டிய நிலைமை ஏற்படுகின்றது. இரண்டு divisionsஇலே கடமையாற்றுகின்ற காரணத்தால் அவர்களால் முழுமையான சேவையை வழங்க முடியாதிருக்கின்றது. ஆகவே, அவர்களுக்கு பிரயாணச் செலவுப் படியை அதிகரித்து வழங்க வேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது.

1987ஆம் ஆண்டு இந்திய - இலங்கை ஒப்பந்தத்தின்மூலம் கொண்டுவரப்பட்ட பதின்மூன்றாவது திருத்தத்தினூடாக அரசியல் யாப்பில் சேர்க்கப்பட்ட மாகாண சபையை அமைக்கும் பொறுப்பை அரசாங்கம் சட்டபூர்வமாக அங்கீகரித்தது. ஆனால், அந்த மாகாண சபைகள் இயங்குவதை 7-8 வருடங்களாக நிறுத்தி, அதன் அதிகாரங்களை இல்லாமல் செய்திருப்பதனால் அந்தச் சபையினால் மக்களுக்கு எந்தவிதமான அபிவிருத்தி வேலைகளையும் செய்ய முடியாமல் இருக்கின்றது. எமது

[ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා]

பகுதியிலே இருக்கின்ற மாகாண சபை அதிகாரிகள்தான் இப்பொழுது அமைச்சர்கள் போன்றும் அதிகாரமுள்ளவர் களாகவும் செயற்படுகிறார்கள். அந்த நிலைமை மாற்றப்பட வேண்டும்.

அண்மையிலே மாகாணக் கல்வித் திணைக்களத்திலே உள்ள காவலாளி 13 வருடங்கள் சேவையாற்றிய பின்பு அங்கு சென்று இடமாற்றத்தைக் கோரியபோது, "நீங்கள் மாற்றீடாக ஓர் ஊழியரைத் தந்துவிட்டு வேறு இடத்துக்கு மாறலாம்" என அவருக்குப் பதில் கிடைத்திருக்கின்றது. அதனை அவர் மிகவும் பரிதாபப்பட்ட நிலையிலே எங்களிடம் முறையிட்டார். அவ்வாறான நிலைமை மாற்றப்பட வேண்டும். ஒரு சாதாரண ஊழியரிடம் அவ்வாறான கேள்விகளைக் கேட்கின்றபோது அல்லது விடைகளை வழங்குகின்றபோது, அவரது மனநிலை பாதிக்கப்படுவதனால் அவரை அந்தத் தொழிலிலிருந்து விடுவிக்க வேண்டிய நிலைகூட ஏற்படுகின்றது. எனவே, இவ்வாறான விடயங்களைக் கவனத்தில் எடுக்க வேண்டும். விசேடமாக, மாகாண சபைமூலம் வழங்கப்பட்டுள்ள சிறுபான்மை மக்களுடைய உரிமைகள், தேவைகளை நிறைவேற்றும் வகையில் அந்தப் பிரதேசங்களை அவர்களே ஆட்சி செய்யக்கூடிய அதிகாரத்தை வழங்க வேண்டிய பொறுப்பு இருக்கின்றது. எனவே, மேலும் காலம் தாழ்த்தப்படாமல் விரைவில் மாகாண சபைத் தேர்தல் நடாத்தப்பட வேண்டுமென வேண்டிக் கொள்கின்றேன்.

உள்ளூராட்சிச் சபைகளைப் பொறுத்தவரையில், இலங்கையில் தேர்தல்மூலம் தெரிவுசெய்யப்பட்ட சுமார் 341 சபைகள் இப்போது நடைமுறையில் இருக்கின்றன. இந்தச் சபைகள் அமைக்கப்பட்டாலும் அவற்றுக்கான வசதிகள் இன்னும் வழங்கப்படவில்லை. வட மாகாணத்தில் உள்ள பிரதேச சபைகள் வாகன வசதிகள் மற்றும் கட்டிட வசதிகள் எதுவுமற்ற நிலையில் காணப்படுகின்றன. அண்மையிலே செட்டிகுளம் பிரதேச சபையில் உப தவிசாளருக்குரிய ஒரு காரியாலயத்தைக்கூட அமைக்க முடியாத நிலையில் தலைவருக்கும், உப தவிசாளருக்கும் இடையில் சிறிய பிரச்சினை ஏற்பட்டுள்ளது. ஆகவே, இவ்வாறான வசதி குறைந்த பிரதேசங்களில் அதற்கான வளங்களை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அந்த உள்ளூராட்சிச் சபைகள் தொழில்நுட்ப உத்தியோகத்தர்கள், இயந்திர வசதிகள் எதுவுமே அற்ற நிலையில் இருக்கின்றன. இந்த நிலை, உள்ளூராட்சிச் சபையின் தேவைகளை நிறைவுசெய்ய அரசாங்கம் தயாரில்லையோ? என்ற சந்தேகத்தை எங்களுக்கு ஏற்படுத்துகின்றது. ஆகவே, இந்தச் சபைகளின் வருமானங்களை அதிகரிக்கத் திட்டங்களை வகுத்துக் கொடுக்க வேண்டும்.

அதுமாத்திரமன்றி, சில பிரதேசங்களில் உள்ள உள்ளூராட்சிச் சபை உறுப்பினர்கள் அபிவிருத்திச் சபைக் கூட்டங்களில் கலந்துகொள்ள முடியாத நிலை ஏற்படுகின்றது. அதற்குரிய சந்தர்ப்பத்தை அவர்களுக்கு வழங்க வேண்டும். அத்துடன், சில பிரதேச சபை, நகர சபை உறுப்பினர்கள் எதிர்க்கட்சியில் இருந்தாலும், ஆளும்கட்சியில் இருந்தாலும் மக்களோடு தொடர்புள்ளவர்களாகவும் அவர்களுக்கு 24 மணித்தியாலமும் சேவை செய்யக்கூடியவர்களாகவும் இருக்கின்றார்கள். அந்த உறுப்பினர்களுக்கு வழங்கப்படுகின்ற சம்பளம் அல்லது படி 25,000 ரூபாய், 15,000 ரூபாய் என மிகக் குறைந்த அளவிலேயே காணப்படுகின்றது. இந்த நிலைமை மாற்றப்பட்டு, மக்களோடு தொடர்புகொள்வதற்கும், அவர்களின் நன்மை தீமைகளில் கலந்துகொள்வதற்கும் தேவையான பிரயாண வசதிகளை ஏற்படுத்திக் கொடுக்க வேண்டும். அவர்களுக்கு மோட்டார் சைக்கிள் வழங்கினால் அவர்கள் தமது சேவையை மேலும் திறமையாகச் செய்ய வாய்ப்பாக இருக்குமென்று நான் நினைக்கின்றேன். மேலும், அவர்களின் சேவைக்காலம் நிறைவடைந்த பின்னர் அதனை மீளப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்பும் உள்ளது என்பதை எனது ஆலோசனையாக இங்கு முன்வைக்கின்றேன். ஒருவேளை அந்தப் பிரதேசங்களில் தங்களின் அரசியல் செல்வாக்கு குறைந்துவிடுமோ என்ற அச்சத்தில் உதவி செய்யாமல் இருக்கின்றார்களா என்ற கேள்வி எங்கள் மத்தியில் எழுகின்றது.

அண்மையில், நீர்ப்பாசனத் திணைக்களத்தால் உதவி யாளர்கள், காவலாளிகளுக்கான நேர்முகப்பரீட்சைக்கான கடிதங்கள் அனுப்பப்பட்டுள்ளன. அந்தக் கடிதங்கள் வட மாகாணத்தில் விசேடமாக, வவுனியாவில் 12.11.2025ஆம் திகதி வழங்கப்பட்டுள்ளது. அந்தக் கடிதத்தில் வாக்காளர் இடாப்பு, கிராம சேவையாளருடைய அத்தாட்சிப்பத்திரம், பிறப்புச் சான்றிதழ் உள்ளடங்கலாக 11 விடயங்கள் சமர்ப்பிக்கப்படவேண்டுமெனக் கோரப்பட்டுள்ளது. அது தனிச் சிங்கள மொழியில் வழங்கப்பட்டுள்ள காரணத்தினால் மொழி தெரியாத விண்ணப்பதாரிகள் பெரிதும் அசௌகரியத் திற்கு உள்ளாகியுள்ளார்கள். ஆகவே, எதிர்காலத்தில் இந்த விடயங்களைக் கருத்தில் கொள்வதுடன், அவர்களுடைய நேர்முகப் பரீட்சையையாவது தமிழ்மொழியில் நடத்த வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

இறுதியாக, தென் மாகாண ஆளுநராகக் கடமையாற்றிய முன்னாள் வவுனியா மாவட்ட அரசாங்க அதிபர் கௌரவ பந்துல ஹரிச்சந்திர அவர்களின் மறைவுக்கு வவுனியா மாவட்ட மக்களின் சார்பாக எனது அனுதாபத்தைத் தெரிவித்து, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.18]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் தொழில் அமைச்சு மற்றும் பொது நிருவாக மாகாண சபைகள், உள்ளூராட்சி அமைச்சின் குழுநிலை விவாதத்தில் உரையாற்றுவதையிட்டு உண்மையிலே நான் சந்தோஷப்படுகின்றேன். இங்கு இந்த நாட்டின் முக்கியஸ்தர்களான தொழிலாளர்களது தேவைகள், அவர்களது கொடுப்பனவுகள் மற்றும் நிவாரணங்கள் தொடர்பாக எமது உறுப்பினர்கள் பலர் விவாதித்துக்கொண்டிருக்கும்போது, விசேடமாக, தோட்டத் தொழிலாளர்களை முதன்மைப்படுத்தி நான் சில விடயங்களைக் கூற எண்ணுகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டு வரவு செலவுத்திட்டமானது உண்மையிலேயே மலையகத்தில் வாழும் தொழிலாளர்களுக்கு மிகவும் சந்தோஷமான ஒரு வரவு செலவுத்திட்டமாகும். ஏனென்றால், வரலாற்று ரீதியான ஒரு வெற்றியை அதன்மூலம் மலையக மக்கள் பெற்றுள்ளார்கள். அதாவது,

வரவு செலவுத்திட்டத்தில் 200 ரூபாய் சம்பள அதிகரிப்பு பெற்றுக்கொடுக்கப்பட்டுள்ளது. மாண்புமிகு ஜனாதிபதி அவர்கள் தனது வரவு செலவுத்திட்ட உரையிலே மலையக மக்களின் சம்பள அதிகரிப்பு எப்படி அமையப் போகின்றது என்பதுபற்றி இந்தச் சபையிலே குறிப்பிட்டிருந்தார். அதாவது, மலையக மக்கள் தற்போது பெற்றுக்கொள்வது 1,350 ரூபாய் சம்பளம். அந்த 1,350 ரூபாயுடன் கம்பனிகளுடன் பேசி கிடைக்கப்பெறுவது 200 ரூபாய்; அதனுடன் ஊக்குவிப்புக் கொடுப்பனவாக அரசாங்கத்தினால் பெற்றுக்கொடுக்கப் படுவது 200 ரூபாய். அந்த அடிப்படையில் மலையகத் தோட்டத் தொழிலாளர்களின் சம்பளம் 1,750 ரூபாயாக அதிகரிக்கப்படும் என்று கூறியிருந்தார். அன்றிலிருந்து இன்றுவரை - இரண்டு கிழமையும் - ஒவ்வொரு நாளும் எதிர்க்கட்சி உறுப்பினர்கள் மலையகத் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை 200 ரூபாயால் அதிகரித்ததற்கு எதிராகப் பலவிதமான செயற்றிட்டங்களை முன்னெடுத்துக் கொண்டிருப்பதை சபையில் இடம்பெறும் விவாதங்களின் மூலம் நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. இது உண்மையிலே வெட்கமாக இருக்கின்றது!

உங்களுக்குத் தெரியும், இந்த மலையகத் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை உயர்த்துவதற்கு எதிராக எதிர்க்கட்சித் தலைவர் சஜித் பிரேமதாஸ உட்பட அவரது குழுவினர் - அவரது அணியினர் - பலவிதமான சவால்களை முன்வைத்துக் கொண்டிருக்கிறார்கள் என்பது. இன்று காலையிலும்கூட இதுசம்பந்தமாகக் கேள்வி எழுப்பப்பட்டது. அதாவது, நாங்கள் ஒவ்வொரு நாளும் காலையில் எழும்பியவுடன் கடவுளை வணங்குவதுபோல், இந்தச் சபையில் ஒவ்வொரு நாளும் மலையகத் தோட்டத் தொழிலாளர்களின் 200 ரூபாய் சம்பள அதிகரிப்புக்கு எதிராகப் பேசிக்கொண்டிருக்கிறார்கள். அந்த அணியினரின் ஊடகப் பேச்சாளர் சென்ற விவாதத்தின்போது "200 ரூபாயை எப்படி உங்களால் உயர்த்த முடியும்? அவ்வாறு உயர்த்தப்படுமாக இருந்தால் கட்டாயம் சம்பந்தப்பட்ட அதிகாரிகள் நீதிமன்றத் திற்குச் செல்லவேண்டி வரும்" என்று ஆளுங்கட்சியின் 159 உறுப்பினர்களுக்கும் சவால் விடுக்கின்றார். இவர்கள் ஏன் எதிர்க்கின்றார்கள் என்று எனக்குத் தெரியவில்லை.

மலையகத் தோட்டத் தொழிலாளர்கள் மிகவும் சுமுகமான நிலைமையில் வேலை செய்பவர்கள் அல்லர்; அவர்கள் மிகவும் கஷ்டத்தின் மத்தியில் வேலை செய்பவர்கள். இப்போது இங்கு நான் உரையாற்றிக் கொண்டிருக்கும்போதும்கூட கொட்டகலை பிரதேசத்திலே ஒரு தோட்டத்தில் குளவி கொட்டி பல பெண்களை வைத்தியசாலைக்குக் கொண்டுசென்று கொண்டிருக்கிறார்கள். இந்தளவு கஷ்டமான நிலையில் வாழ்ந்துகொண்டிருக்கும் தோட்டத் தொழிலாளர்களுக்குச் சம்பளத்தை உயர்த்தும்போது, மலையக மக்களின் - தோட்டத் தொழிலாளர்களின் - பெருமளவு வாக்குகளால் இந்தப் பாராளுமன்றத்திற்கு வந்த எதிர்க்கட்சி உறுப்பினர் ஒருவர், மலையகத் தோட்டத் தொழிலாளர்களின் சம்பளத்தை 200 ரூபாயாக அதிகரிப்பதற்கு எதிராக இலஞ்சம் அல்லது ஊழல்கள் பற்றிய விசாரணை ஆணைக் குழுவில் முறைப்பாடு செய்துள்ளார். இதைப் பார்க்கும்போது இவர்கள் என்ன மனிதர்கள்? என்ற கேள்வி எனக்கு எழுகின்றது.

இந்த எதிர்க்கட்சி உறுப்பினர்கள் காலையில் சபைக்கு வருகிறார்கள்; தமக்குத் தெரிந்த எதனையோ சொல்கிறார்கள்; மீண்டும் சென்று விடுகின்றார்கள். மலையகத் தோட்டத் தொழிலாளர்களின் பிரச்சினை தொடர்பாக கட்டாயம் இவர்கள் செவிமடுக்க வேண்டும். ஆனால், இவர்கள் எதிர்ப்பதற்கு ஒரு காரணம் இருக்கின்றது. இவர்களது எதிர்கால அரசியல் தங்கியிருப்பது மலையகத் தோட்டத் தொழிலாளர்களின் கையில். இவர்கள் இங்கு கூறுகின்றார்கள், "அரசாங்கத்துக்கு எதிராக மலையக மக்கள் போர்க்கொடி தூக்குகின்றார்கள்" என்று. ஆனால், ஒவ்வொரு தோட்டப் புறத்துக்கும் சென்று பார்க்கின்றபோது, அவ்வாறில்லை! மாறாக, எதிர்க்கட்சியினரின் செயற்பாடுகளுக்கு எதிராக மலையக மக்கள் வீதியில் இறங்கி, அவர்களுக்குச் சாபமிட்டுக் கொண்டிருக்கின்றார்கள். "எங்களுக்குக் கிடைக்கும் இந்த 200 ரூபாய்க்குகூட நீங்கள் தடையாக இருக்க வேண்டாம்; நாங்கள் எதிர்காலத்திலும் அநுர அரசாங்கத்துடன்தான் இருப்போம்" என்று குரல் கொடுத்துக்கொண்டு இருக்கின்றார்கள். அதனால் நான் மிகவும் தெளிவாக எதிர்க்கட்சி உறுப்பினர்களுக்குக் கூறுகின்றேன், பொதுநிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சுத் தொடர்பாக நடைபெறுகின்ற இன்றைய விவாதத்தில் விசேடமாக நான் அரச மற்றும் தனியார்துறைத் தோட்டத் தொழிலாளர்களின் பிரச்சினை தொடர்பாகப் பேசுவதற்கு முக்கியமான காரணமாக அமைந்தது அந்த விடயம்தான் என்று.

அதுமாத்திரமன்றி, இந்தத் தோட்டத் தொழிலாளர்களின் சம்பள உயர்வு தொடர்பாக எங்களுடைய அமைச்சர்கள் தெட்டத்தெளிவாகக் கூறியிருக்கின்றார்கள், எவ்வாறு தோட்டத் தொழிலாளர்களின் சம்பளம் அதிகரிக்கப்படுகின்றது என்று. எதிர்க்கட்சியினர், இது தொடர்பாக ஒவ்வொரு நாளும் இந்தச் சபையில் கேள்வியெழுப்பி, அதற்கு எதிரான கருத்துகளைத் தெரிவித்து, மலையகத் தோட்டப்புற மக்களின் ஆதரவைப் பெற்றுக் கொள்வதற்காகச் செயற்பட்டுக் கொண்டிருந்தாலும், இன்று எதிர்க்கட்சித் தலைவர் முதல் எதிர்க்கட்சி உறுப்பினர்கள் மற்றும் எதிர்க்கட்சி அணிக்குள் புகுந்துகொண்டிருக்கும் எமது மலையகத்தைப் பிரதிநிதித்துவப் படுத்தும் உறுப்பினர்கள் அனைவருக்கும் மலையகத்தில் வாழும் இளைஞர்கள், அரச ஊழியர்கள், தோட்டத் தொழிலாளர்கள் அனைவரும் ஒன்றிணைந்து சரியான பதிலை வழங்கிச் சரியான பாடத்தைக் கற்பித்துக்கொண்டிருக் கின்றார்கள் என்பதை மிகவும் தெளிவாக நான் கூறிக்கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ෆයිසර් මුස්තාපා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

මට විනාඩි 15ක කාලයක් තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහ කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථා විවාදයේදී කථා කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පළාත් සභා වැය ශීර්ෂය ගැන කථා කරනකොට අපි දැන ගත යුතු කාරණයක් තිබෙනවා. අවුරුදු 11කට අපි පළාත් සභා ඡන්දය පවත්වා නැහැ. අපි දන්නවා, පළාත් සභා ක්‍රමයේ පසුබිම ඉන්දු-ලංකා ගිවිසුමයි කියන එක. මෙය ලංකාවේ ජන වාර්ගික ප්‍රශ්නයකට විසඳුමක් හැටියට තමයි ලැබුණේ. අපි ඉල්ලපු දෙයක් නොවුණත්, ඉන්දු-ලංකා ගිවිසුමෙන් පස්සේ අපේ ස්වෛරීභාවය රැකගෙන, ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට අනුකූලව අපට පළාත් සභා ක්‍රමය හඳුන්වා දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළාත් සභා ඡන්දය නොපැවැත්වීම සම්බන්ධව නොයෙක් කථා තිබෙනවා. නොයෙක් රජයන් මාව ඒ සම්බන්ධව චූදිතයා කරලා තිබෙනවා. හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කාලයේ පළාත් සභා අලුත් ඡන්ද ක්‍රමයකට පැවැත්වූවා. එතුමාගෙන් පසුව හිටපු ජනාධිපතිවරු වන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා යන කිසිම ජනාධිපති කෙනෙක් පළාත් සභා ඡන්දය පැවැත්වූයේ නැහැ. වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේ කාලයේ පළාත් සභා ඡන්දය පැවැත්විය යුතුයි කියලා මම හිතනවා. අපට මේ පළාත් සභා ඡන්දය පැවැත්වීමට නොහැකි වුණේ ඇයි කියන එක ගැන මම මේ ගරු සභාවට කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි.

අපි දන්නවා, 2017 අංක 17 දරන පළාත් සභා සහ ඡන්ද විමසීම් (සංශෝධන) පනත මඟින් මේ රටට අලුත් ඡන්ද ක්‍රමයක් ගෙනාපු බව. නීතිපතිතුමා කිව්වා, ඒ ක්‍රමයට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක අනුමැතියක් අවශ්‍යයි කියලා. පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු හුඟ දෙනෙක් ඒ ක්‍රමය අනුමත කළා. වත්මන් ජනාධිපතිතුමාත් ඡන්දය දුන්නේ ඒ ඡන්ද ක්‍රමයටයි කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමැතියි. මේ ක්‍රමය තුළින් මොනවාද බිහි වුණේ? දූෂිත මනාප ක්‍රමය නැති කළා. ඒ වාගේම ගමට වගකියන මන්ත්‍රීවරයෙක් බිහි කළා. අපි දන්නවා, 1978දී ගෙනා මේ සමානුපාතික ක්‍රමයත් එක්කම දූෂිත මනාප ක්‍රමයක් ලංකාවේ ඇති වුණා කියන එක. එය සල්ලි මත යැපුණු ඡන්ද ක්‍රමයක්. හේතුව, දිස්ත්‍රික්ක වටේ සල්ලි බෙදපු මුදලාලිවරුන් පාර්ලිමේන්තුවට ආවා. ඒ තුළින් උගත්, බුද්ධිමත් උදවියට පාර්ලිමේන්තුවට ඒමේ වරම නැති වුණා. ඒ නිසා කතිකාවක් බිහි වුණා, මේ දූෂිත මනාප ක්‍රමය නැති කරන්න ඕනෑ කියලා. ඒ නිසා තමයි පළාත් සභා මැතිවරණයේ දී අද මනාප ක්‍රමයක් නැත්තේ. ඒ වාගේම සියයට 50ක් කොට්ඨාස, සියයට 50ක් සමානුපාතික ක්‍රමයට. හැබැයි මනාප නැහැ.

අපි දන්නවා, මේ රටේ කාන්තාවක් දේශපාලනයට එක් කර ගන්න හුඟක් අමාරු බව. හැබැයි, මේ ක්‍රමය තුළින් සියයට 25ක් පළාත් පාලන ආයතනවලත් - මගේ සමයේ තමයි ඒකත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ - ඒ වාගේම සියයට 25ක් පළාත් සභාවේත් කාන්තා නියෝජනයක් නිශ්චිත වශයෙන් තිබිය යුතුයි. මෙම පනත යටතේ සීමා නිර්ණය කමිටුවක් පත් කළා. ඒ කමිටුව පත් කළේ මම නොවෙයි, අතිගරු ජනාධිපතිතුමා. ඒ පනතට අනුකූලව මගේ වගකීම ජනාධිපති විසින් පත් කළ කමිටුවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒකට අනුමැතිය ලබා ගැනීමයි.

ඒ නිසා ඒ සීමා නිර්ණය කමිටුවේ මගේ වගකීම වුයේ, ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම. එය ස්වාධීන කමිටුවක්. දැන් හුඟක් අය කියනවා, එම වාර්තාව ඉදිරිපත් කරපු ඇමතිම එම වාර්තාවට විරුද්ධව ඡන්දය දුන්නා කියලා. හැබැයි මම මේ සභාවට මතක් කරන්න කැමැතියි, එම සීමා නිර්ණයට සහයෝගය දක්වන ඕනෑම කෙනෙකුට ඒකට පක්ෂව අත ඔසවන්න පුළුවන්, විරුද්ධ නම් ඒකට විරුද්ධත්වයත් ප්‍රකාශ කරන්න පුළුවන් බව. ඒ නිසා මන්ත්‍රීවරයෙකු හැටියට මටත් වරම තිබෙනවා, එක්කෝ ඡන්දය දෙන්න, එක්කෝ විරුද්ධ වෙන්න. ඒ වාගේම මේ රටේ සුළු පක්ෂ, සුළු ජාතීන් ආරක්ෂා කිරීමට එම සීමා නිර්ණය වාර්තාව අනුමත වීමට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක සහායක් අවශ්‍යයි. ඒ තුනෙන් දෙකට එදින පාර්ලිමේන්තුවට නොපැමිණි අයත් ඇතුළත් විය යුතුයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඒ අවස්ථාවේදී මම කළේ ministerial act එකක්. ඒ සීමා නිර්ණය වාර්තාව ප්‍රතික්ෂේප වුණාට පස්සේ එම පනතේ ප්‍රතිපාදන අනුව කථානායකතුමාට වගකීමක් තිබෙනවා, අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සමාලෝචන කමිටුවක් පත් කරන්න. ඒ සමාලෝචන කමිටුව මාස 2කින් එහි වාර්තාව ජනාධිපතිතුමාට භාර දුන්නායින් පස්සේ එම පනත අනුව මැතිවරණයක් පැවැත්වීමේ පසුබිම තිබෙනවා. හැබැයි, ඒ ක්‍රියාදාමය මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා කළේත් නැහැ, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා කළේත් නැහැ, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා කළේත් නැහැ. දැන් කථානායකතුමාට තිබෙන්නේ, එම සමාලෝචන කමිටුව අගමැතිතුමියගේ ප්‍රධානත්වයෙන් පත් කරන්න. එහි වාර්තාව ජනාධිපතිතුමාට භාර දීමෙන් පසුව මැතිවරණය පැවැත්වීමේ පසුබිම තිබෙනවා. ඒ නිසා අපට මෙම මැතිවරණය පැවැත්වීම සම්බන්ධව දැන් කරන්න තිබෙන්නේ, සමාලෝචන කමිටුවක් පත් කරලා, ප්‍රතික්ෂේප වුණු සීමා නිර්ණයන් හදලා ඉස්සරහට යන එක මිසක් පස්සට යන එක නොවෙයි කියන එක මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි.

අපි දන්නවා, මේ කොට්ඨාස බෙදීමේදී ලොකු අඩුපාඩු තිබෙන බව. ඒ අඩුපාඩු හදන්න වෙනවා. ඒ නිසා ඒ ක්‍රියාදාමයට යා යුතුයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. මාස 2ක කාර්යයකට දැන් අවුරුදු 11ක් අරගෙන තිබෙනවා. හැම ජනාධිපතිවරයෙකුම නොයෙක් හේතු මත ඒ ක්‍රියාදාමය කළේ නැහැ. මැතිවරණය කල් දැමීම සම්බන්ධව අන්තිමට මාව චූදිතයා කරන්න තමයි හුඟක් අය ලැහැස්ති වෙලා සිටියේ.

අපි දන්නවා, එම සීමා නිර්ණය කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කළේ තවලිංගම් මහත්මයා බව. එතුමා කරු ජයසූරිය මැතිතුමාව ලිඛිතව දැනුවත් කර තිබෙනවා, මේ සීමා නිර්ණයේ අඩුපාඩු තිබෙනවා, සුළු ජාතීන්ට, සුළු පක්ෂවලට අවාසියක් සිදු වෙනවා, ඒ වාගේම සමහර අවස්ථාවලදී සුළු ජාතික නියෝජනය කලින් තිබුණු නියෝජනයට වඩා අඩු වන නිසා සෑම දිස්ත්‍රික්කයකටම බෝනස් මන්ත්‍රී ධුර 5ක් දෙන්න කියන සංශෝධනය ගෙනෙන්න කියලාත්. ඒ නිසා ගරු ඇමතිතුමාට මම කියනවා, මේකත් බලන්න කියලා. මේ සංශෝධන කරලා අපට ඉස්සරහට යන්න පුළුවන් කියන එක තමයි මගේ විශ්වාසය. හේතුව, අපි සුළු පක්ෂ ආරක්ෂා කරන්නත් ඕනෑ, සුළු ජාතීන් ආරක්ෂා කරන්නත් ඕනෑ. ඒක සමාලෝචන කමිටුවෙනුත් කියා තිබෙනවා. සියලුම ජාතීන් නියෝජනය වන විධියට තමයි සමාලෝචන කමිටුව පත් කරන්න ඕනෑ කියලා පනතේ ප්‍රතිපාදන අනුවත් සඳහන් කර තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම අද ජනාධිපතිගේ බලය ක්‍රියාත්මක කරන්නේ ලේකම් හරහා. ඔබතුමාගේ බලය ක්‍රියාත්මක කරන්නේත් ලේකම් හරහා. සෘජු විධායක බලයක් නැහැ. හැබැයි, පළාත් පාලන ආයතනවල tender boardවල වාඩි වෙන්නේ එක්කෝ නගරාධිපති, නැත්නම් ප්‍රාදේශීය සභාවේ සභාපති. ඒ නිසා සාලිය පීරිස් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මම කමිටුවක් පත් කළා, එතුමාගේ නිර්දේශ අනුව ඒ බලය අයින් කරන්න. පළාත් පාලන ආයතනවලදී සභාපතිට හෝ නගරාධිපතිට සෘජු විධායක බලය අනුව ක්‍රියා කිරීමේ හැකියාව නැති වන විධියට කටයුතු කළා නම් අපට මේ රටේ දූෂණය, නාස්තිය නැති කරන්න පුළුවන්. ඒ වාගේම මට තව දෙයක් ගැන

කියන්න තිබෙනවා. අපි දැන් digitalizationවලට යනවා. Plan එකක් අනුමත කරන්නේ, පස් පර්මිට් එකක් අනුමත කරන්නේ ගමේ ආණ්ඩුව, පළාත් පාලන ආයතනය. ඒ නිසා අපට පළාත් පාලන ආයතනවලින් digitalization පටන්ගන්න පුළුවන් නම්, දූෂණයට විරුද්ධව අපට ලොකු සටනක් ගෙනයන්න පුළුවන් කියන එක මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට මතක් කරන්න කැමැතියි.

තව ප්‍රශ්නයක් තිබෙනවා. මේ රට බහුතර සිංහල-බෞද්ධ රටක්. වීදි සුනඛයන් සම්බන්ධයෙන් මේ රටේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. අපි දන්නවා, ජලභීතිකාව නිසා නොයෙක් අය නොයෙක් ප්‍රශ්නවලට මුහුණ දෙන බව. ඔබතුමන්ලා මේ Budget එකෙන් ඒ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. එම නිසා මම ඉල්ලා සිටිනවා, මේ ගැන සලකා බලන්න කියලා. ඒ වාගේම, we have to find out a human solution, including sterilization. වීදි සුනඛයින් මේ රටට ලොකු සමාජ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒකට විසඳුමක් සෙවිය යුතුයි. හැබැයි, වීදි සුනඛයින් මරන එක නොවෙයි අපි කළ යුත්තේ කියන එකත් මම මේ අවස්ථාවේ ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

ඊට අමතරව, රාජ්‍ය-පළාත් කළමනාකරණ සේවා නිලධාරි සංගමය විසින් මට ඔවුන්ගේ ගැටලුවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඔවුන්ගෙන් සියයට 40ක් උපාධිධාරීන්, ඒ වාගේම සියයට 60ක් උපාධිධාරීන් නොවන පිරිස කියලා ඔවුන් මට කියනවා. ඒ අයගේ වැටුප් සම්බන්ධයෙන් සහ career guidance සම්බන්ධයෙන් නොයෙකුත් ප්‍රශ්න තිබෙනවා. ඒ ගැන විශේෂයෙන් සොයා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වාගේම මූලික විමර්ශන නිලධාරීන්ට ලැබෙන වරප්‍රසාද ගැන තවදුරටත් සොයා බලන්න කියලාත් මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකයේ පළමු අග්‍රාමාත්‍යවරිය අපේ රටෙන් බිහි වුණා කියලා අපි ආඩම්බර වනවා. හැබැයි, ඒ ජයග්‍රහණයෙන් පස්සේ වුණත්, අපේ ප්‍රාදේශීය සභාවල, පළාත් සභාවල සහ පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය බොහොම අඩුයි. දේශපාලන පසුබිමක් තිබුණේ නැත්නම් කාන්තාවකට පාර්ලිමේන්තුවට ඇතුළත් වීමේ වරම අඩුයි. හැබැයි මම විශ්වාස කරනවා, මම මේ සභාවට ඉදිරිපත් කළ සංශෝධන නිසා පළාත් පාලන ආයතනවල සියයට 25ක කාන්තා නියෝජනයක් තිබෙනවා කියලා. ඒ නිසා දැන් කාන්තාවන් දේශපාලන භූමිකාවට ඇදී එනවා.

ඒ වාගේම අපි දැකලා තිබෙනවා, ලජ්ජා භය නාඩිය පිරිමි පාර්ශ්වයට වඩා කාන්තා පාර්ශ්වයට තිබෙන බව. ඉන්දියාවේ කළ සමීක්ෂණයකින් ඔප්පු වෙලා තිබෙනවා, දූෂණය නැති පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය වැඩියි කියලා. කාන්තා නියෝජනය තිබෙන පළාත් පාලන ආයතනවල දූෂණයේ අඩුවක් දකින්න තිබෙනවා. දූෂණයට විරුද්ධ සටනේදී පුළුවන් තරම් කාන්තාවන් දේශපාලන භූමිකාවට ඇතුළත් කරන්න පුළුවන් නම්, අපට විශාල ජයග්‍රහණයක් ලබා ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැනත් මම කියන්න ඕනෑ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවලට පොලිස් හා ඉඩම් බලතල දීලා තිබෙනවා. හැබැයි, හැම ආණ්ඩුවක්ම ඒ සම්බන්ධයෙන් නොයෙක් හේතු දක්වලා එම බලතල නොදීමට කටයුතු කළා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් සභාවලට යම් බලයක් දීලා තිබෙනවා නම්, රටක් හැටියට අපි ඒ බලය ඔවුන්ට දිය යුතුයි. ඒ බලය දෙන්නේ නැත්නම් ඒ සඳහා නිසි සංශෝධනයක් ගෙන ආ යුතුයි කියන එක තමයි මගේ මතය. එහෙම නැත්නම් අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෞරව නොකරන අය වනවා. ගරු කරන්නේ නැත්නම් අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තිබිලා වැඩක් නැහැ. හැම කෙනාම කියනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පළාත් සභාවලට පොලිස් හා ඉඩම් බලතල තිබෙනවා, හැබැයි මේ මේ හේතු නිසා අපි ඒ බලතල දෙන්නේ නැහැ කියලා. නමුත්, එම දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුනෙන් දෙකක වැඩි ඡන්දයකින් සම්මත වෙලා තිබෙනවා. එම නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියලා මම මේ අවස්ථාවේ ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. පළාත් සභා ක්‍රමය සුදු අලියෙක්ද කියන කාරණය ගැන අපි සොයා බලන්න ඕනෑ. මීට අවුරුදු 11කට පෙර තමයි අවසන් වරට පළාත් සභා මැතිවරණයක් පවත්වා තිබෙන්නේ. ඒ තුළින් ජනවාර්ගික ප්‍රශ්නය වැඩිවෙලා තිබෙනවාද, ඒ ඒ පළාත්වල ඌන සංවර්ධනයක් සිදුවෙලා තිබෙනවාද යන්න සොයා බලා, පළාත් සභා ක්‍රමය සම්බන්ධයෙන් අපි සමාලෝචනයක් කළ යුතුයි. ඒ කියන්නේ, මැතිවරණ කල් දමන්න කියන එක නොවෙයි. ඒ ක්‍රමය සාර්ථකද, නැද්ද කියන එක අප සියලුදෙනා එකතු වෙලා සොයා බලන්න ඕනෑ. හේතුව, අවුරුදු 11ක් කියන්නේ වාර දෙකක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)
මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

පළාත් සභාවක ධුර කාලය අවුරුදු 5යි. හැබැයි, අපි රටක් හැටියට අවුරුදු 11කින් පළාත් සභා මැතිවරණයක් පවත්වා නැහැ. ඒ සඳහා නොයෙක් හේතු කියනවා. මම "බිලී බෝයි" හැටියට පාවිච්චි කරලා, ෆයිසර් මුස්තාපා නිසා තමයි අපට මැතිවරණය තියන්න බැරි වුණේ කියලා මම ඉස්සරහට දමනවා. ඒක හරි අසාධාරණයි කියලා මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. ඒ වාගේම පළාත් සභා ක්‍රමය තුළින් රටේ මුදල් නාස්තියක් වෙනවාද කියලා සොයා බැලිය යුතුයි. මගේ අදහස නම්, අපි පළාත් පාලන ආයතන තවතවත් ශක්තිමත් කළ යුතුයි කියන එකයි. ගමේ ආණ්ඩුව තමයි, පළාත් පාලන ආයතන. ඒ තුළින් අපට සංවර්ධනයක් ඇති කරන්න පුළුවන්.

ඒ වාගේම මම තව දෙයක් මතක් කරන්න කැමැතියි. පළාත් සභා ක්‍රමය නිසා අපි මහ ආණ්ඩුවේ පාසල්, පළාත් සභා පාසල් කියලා බෙදලා තිබෙනවා. මහ ආණ්ඩුවේ රෝහල්, පළාත් සභා රෝහල් කියලා බෙදලා තිබෙනවා. ඒ නිසා සෑම විටකම පළාත් සභා පාසලකට හෝ පළාත් සභා රෝහලකට ලැබෙන්නේ කුඩම්මාගේ සැලකිල්ලක්. මේ බෙදීම තුළින් අපට නිසි සංවර්ධනයක් ලබා ගන්න බැහැ කියන කාරණයත් මේ අවස්ථාවේ මතක් කරමින්, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.42]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறுகின்ற பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு, தொழில் அமைச்சு ஆகியவற்றின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு, எங்களது மாவட்டத்தில் காணப்படுகின்ற சில பிரச்சினைகளை கௌரவ அமைச்சர் அவர்களின் கவனத்துக்குக் கொண்டு வரலாமென நினைக்கின்றேன்.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற திருகோணமலை மாவட்டத்தில் 13 உள்ளூராட்சிச் சபைகள் காணப்படுகின்றன. அதில் ஒரு மாநகர சபையும் ஒரு நகர சபையும் 11 பிரதேச சபைகளும் உள்ளடங்குகின்றன. அதில் அநேகமான சபைகள் குறைந்த வருமானத்தை ஈட்டுகின்றவையாகக் காணப்படுகின்றன. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையில் நிரந்தரம் செய்யப்பட்ட சிற்றூழியர்களுடைய சம்பளத்தை அந்தந்தச் சபையினூடாக வழங்க வேண்டும் என்ற அடிப்படையில் அமைச்சினால் புதிய சுற்றுநிருபம் ஒன்று அனுப்பப்பட்டுள்ளது. அதன்படி, அந்தந்தச் சபைகளில் கடமையாற்றும் ஊழியர்களுக்கு 2025ஆம் ஆண்டில் அவர்களது சம்பளத்தில் 20 சதவீதத்தையும் 2026ஆம் ஆண்டில் 40 சதவீதத்தையும் 2027ஆம் ஆண்டில் 60 சதவீதத்தையும் 2028ஆம் ஆண்டில் 80 சதவீதத்தையும் 2029ஆம் ஆண்டு 100 சதவீதத்தையும் - முழுச் சம்பளத்தையும் - அச்சபைகளே வழங்க வேண்டும்.

எங்களுடைய மாவட்டத்தில் காணப்படுகின்ற உள்ளூராட்சிச் சபைகள் வருமானத்தை ஈட்டமுடியாத சபைகளாகக் காணப்படுகின்றன. மேற்குறித்த சம்பளத்தை அந்தச் சபைகளால் வழங்கும்போது, அவற்றினால் அபிவிருத்திச் செயற்பாடுகளை முன்னெடுக்க முடியாத ஒரு சூழல் காணப்படுகின்றது. எதிர்காலத்தில் ஊழியர்களின் சம்பளத்தில் கூடுதலான சதவீதத்தை அந்தச் சபைகள் வழங்கும்போது, வரிகள் மற்றும் ஏனைய கட்டணங்களை அதிகரிக்கவேண்டி ஏற்படும். இது மக்களுக்கு மேலும் சுமையை ஏற்படுத்துகின்ற விடயமாக அமைந்துவிடும். இதைக் கருத்திற்கொண்டு உள்ளூராட்சிச் சபைகளுக்கு வருமானத்தை ஏற்படுத்திக் கொடுக்க வேண்டிய அல்லது குறித்த சுற்றுநிருபத்தில் திருத்தங்களை மேற்கொள்ள வேண்டிய பொறுப்பு அரசாங்கத்துக்குக் காணப்படுகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருகோணமலை மாவட்டத்தில் குறிப்பாக, திருகோணமலை நகர சபையில் மாத்திரம்தான் தீயணைப்புப் பிரிவு காணப்படுகின்றது. ஏனைய சபைகளில் அந்த வசதி இல்லாத காரணத்தால், கிண்ணியா, மூதூர், தம்பலகாமம், கந்தளாய் போன்ற பிரதேசங்களில் தீ விபத்துகள் ஏற்பட்டால் திருகோணமலை மாநகர சபையிலிருந்தே தீயணைப்புப் படையினர் வரவேண்டும். அவர்கள் அங்கு வருவதற்குள் அந்தத் தீயால் கூடுதலான அழிவுகள் ஏற்பட்டுவிடும். குறிப்பாக, கட்டிடங்கள் எரிந்து போகின்ற, உயிர்ச் சேதங்கள் ஏற்படுகின்ற, சொத்துக்கள் அழிவடைகின்ற நிலை ஏற்படும்.

அண்மையில் மூதூர் மத்திய கல்லூரியில் இயங்கிக் கொண்டு இருக்கின்ற **பாலர்** பாடசாலைக் கட்டிடம்கூட, தீ விபத்தால் அனர்த்தத்துக்கு உள்ளானது. எனவே, நாங்கள் கேட்கின்ற விடயம் என்னவென்றால், இந்தப் பிரதேசங்களை மையப்படுத்தி, திருகோணமலையில் காணப்படுகின்ற ஒரு நகரசபை என்ற அடிப்படையில், கிண்ணியா நகர சபையில் தீயணைப்புப் பிரிவொன்றை அமைப்பதற்கான நடவடிக்கைகளை கௌரவ அமைச்சர் அவர்கள் எடுக்க வேண்டும் என்றுதான். இது சம்பந்தமாக நாங்கள் சென்ற காலங்களில் DCCsஇல் பேசி, அதற்கான அனுமதியையும் பெற்றிருக்கிறோம். இவ்விடயம் தொடர்பில் மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டம் மூலமாகக்கூட பல தீர்மானங்கள் எடுக்கப்பட்டு இருக்கின்றன. எனவே, இந்த விடயத்தில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று உள்ளூராட்சி மன்றங்களில் குறிப்பாக பிரதேச சபை, நகர சபைகளில் போதியளவு வாகனங்கள் இல்லை. JCBs, கழிவகற்றல் வாகனங்கள் - gully bowsers - குறைவாகக் காணப்படுகின்ற காரணத்தால், எங்களுடைய பிரதேசத்தில் காணப்படுகின்ற சபைகள் பெரும் கஷ்டங்களை எதிர்நோக்குகின்றன. குறிப்பாக, நவம்பர், டிசம்பர் காலப்பகுதியில் எங்களுடைய பிரதேசங்களில் வெள்ள நிலைமை ஏற்படும்பொழுது, அந்தப் பிரதேச மக்களுக்கான சேவைகளைச் செய்வதற்கு ஏனைய பிரதேச சபைகளிடமிருந்து அத்தகைய வாகனங்களைப் பெறவேண்டிய நிலை இருக்கின்றது. அவ்வாறு பெறும்பொழுதுகூட, அச்சபைகளும் கஷ்டங்களை எதிர்நோக்குகின்றன. எனவே, JCB மற்றும் கழிவகற்றலுக்குப் பயன்படுத்துகின்ற gully bowserஇன் தேவைப்பாட்டைக் கருத்திற்கொண்டு, அந்தச் சபைகளுக்கு அவற்றைப் பெற்றுக்கொடுத்தால், அவற்றினூடாக எங்களுடைய பிரதேசம் கூடுதலான நன்மைகளைப் பெறக்கூடியதாக இருக்கும்.

இன்று திருகோணமலை மாவட்டத்தில் பல பிரதேச செயலகங்களில் உதவிப் பிரதேச செயலாளர் - ADS, பிரதித் திட்டமிடல் பணிப்பாளர் - DDP, கணக்காளர் - accountant போன்றோர் பற்றாக்குறையாக உள்ளனர். குறிப்பாக, கிண்ணியா பிரதேச செயலகத்தில் கடமையாற்றுகின்ற பிரதித் திட்டமிடல் பணிப்பாளர் – DDP - அவர்கள், இன்று மூதூர் பிரதேச செயலகத்திலும் தம்பலகாமம் பிரதேச செயலகத்திலும் பதிற்கடமை ஆற்றுகின்றார். இதனால் அவருக்கு 5 நாட்களுக்குள் இந்த 3 செயலகங்களுடைய வேலைகளையும் செய்யவேண்டிய பொறுப்புக் காணப்படுகின்றது. நான் மேற்சொன்ன பிரதேச செயலகங்கள், கூடுதலான மக்கள் சேவை பெறுவதற்கு வருகின்ற இடமாகக் காணப்படுகின்றன. அத்துடன், கூடுதலான மக்கள் வாழுகின்ற பிரதேசத்திலே அமை அமைந்து உள்ளன. இதனால் அப்பிரதேசத்திலுள்ள மக்கள் பல்வேறு அசௌகரியங்களை எதிர்நோக்குகிறார்கள். மேலும், பல பிரதேச செயலகங்களில் இவ்வாறான அதிகாரிகளின் பற்றாக்குறை காரணமாக அந்தந்தப் பிரதேச செயலகங்கள் ஊடாக மக்களுக்கு வழங்கப்படுகின்ற சேவைகளில் மந்தநிலை காணப்படுகின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்கள் இந்த விடயத்தைக் கருத்திலெடுத்து உரிய தீர்வை வழங்க வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று திருகோணமலை மாவட்டத்தில் பல பிரதேச செயலகங்களின் நிருவாக எல்லைகள் வர்த்தமானிமூலம் பிரசுரிக்கப்பட்டு இருந்தாலும், எல்லைப் பிரச்சினைகள் காணப்படுகின்றன. இந்த எல்லைப் பிரச்சினை இனங்களுக்கு இடையில் முறுகல் நிலையையும் ஏற்படுத்தி விடுகின்றது. ஆகையால், இந்தப் பிரச்சினை உண்மையிலேயே தீர்க்கப்படவேண்டிய ஒன்றாகக்

காணப்படுகின்றது. எனவே, கிண்ணியா- கந்தளாய், கிண்ணியா-தம்பலகாமம், மூதூர்-வெருகல், வெருகல்-சேருவில, குச்சவெளி-கோமரங்கடவல, குச்சவெளி-பதவிசிறிபுர எல்லைகளை வர்த்தமானியில் உள்ளபடி நில அளவை செய்து அடையாளப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். திருகோணமலை மாவட்டம் என்பது மூவின மக்களும் வாழுகின்ற ஒரு மாவட்டமாகும். இன்று அந்த மாவட்டத்தில் இனவாதத்தை ஏற்படுத்துவதற்கான பல முயற்சிகள் முன்னெடுக்கப்படுகின்றன. எதிர்காலத்தில் இந்த எல்லைப் பிரச்சினை அதற்கு ஒரு காரணமாக அமைந்துவிடக் கூடாது என்ற அடிப்படையில்தான் நாங்கள் சொல்கின்றோம், தயவுசெய்து நீங்கள் இந்த விடயத்தில் கவனம் செலுத்த வேண்டும் என்று.

எமது மாவட்டத்திலுள்ள பல பிரதேச செயலகங்கள் அதிக சனத்தொகையைக் கொண்டவையாகக் காணப்படுகின்றன. அந்தப் பிரதேச செயலகங்களின் எல்லைக்குட்பட்ட பிரதேசத்தில் வாழுகின்ற மக்களுக்குச் சேவைகளைச் சிறந்த முறையில் வழங்குவதற்கு, அங்கு பிரதேச செயலகங்களின் எண்ணிக்கையை அதிகரிக்க வேண்டிய தேவைப்பாடு காணப்படுகின்றது. இன்று கிண்ணியா பிரதேசத்தில் மக்கள் தொகை அதிகமாகக் காணப்படுகின்றது. அங்குள்ள மக்களுடைய தேவைப்பாடுகளை ஒரு பிரதேச செயலகத்தால் பூர்த்திசெய்ய முடியுமா? என்ற கேள்வி எழுகின்றது. எனவே, கிண்ணியா பிரதேசத்தில் இரண்டு பிரதேச செயலகப் பிரிவுகள் உருவாக்கப்பட்டு, அங்குள்ள மக்கள் இலகுவாக சேவையைப் பெற்றுக்கொள்ளக்கூடிய வகையில் நடவடிக்கை எடுக்கப்படல் வேண்டும். இது தொடர்பில் எங்களுடைய DCC கூட்டங்களில் கலந்துரையாடப்பட்டு, தீர்மானங்களும் எடுக்கப்பட்டு இருக்கின்றன. எனவே, நீங்கள் இந்த விடயத்தையும் கருத்திற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ඔව්, මට තව විනාඩි 2ක් තිබෙනවා නේ.

அடுத்து, மூதூர் பிரதேச செயலகப் பிரிவில் காணப்படுகின்ற தோப்பூர் உப பிரதேச செயலகம் பற்றி கூற வேண்டும். சென்ற அரசாங்க காலத்தில் எங்களுடைய முயற்சிமூலம் இதற்கான கட்டிட வசதிகள் ஏற்படுத்திக் கொடுக்கப்பட்டு, வாரத்தில் 3 நாட்கள் இயங்குவதற்கான நடவடிக்கைகளும் எடுக்கப்பட்டன. இன்று அந்த உப பிரதேச செயலகம் இயங்கிக்கொண்டு இருக்கின்றது. இதை ஒரு பிரதேச செயலகமாகத் தரமுயர்த்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்பதுடன், அங்கு காணப்படுகின்ற ஆளணி - cadre - பிரச்சினை தொடர்பிலும் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், மூதூர் பிரதேச செயலகமும் கூடுதலான மக்களுக்குச் சேவை செய்யக்கூடிய ஒரு பிரதேச செயலகமாகக் காணப்படுகின்றது. இவ்வாறான பிரதேசங்களில் புதிய பிரதேச செயலகங்களை ஏற்படுத்துவதன் மூலம் மக்களால் இலகுவாக சேவைகளைப் பெற்றுக்கொள்ள முடியும். இன்னும் 'தோப்பூர் உப பிரதேச செயலகம்' என்றே gazetteஇல் வெளியிடப்பட்டு இருக்கின்றது. மாணவர்களுக்கு பரீட்சை அனுமதி அட்டை வழங்குகின்றபோதுகூட, அவ்வாறே குறிப்பிடப்படுகின்றது. எனவே, இந்த விடயத்தில் கௌரவ அமைச்சர் அவர்கள் கவனம் செலுத்தி, உரிய தீர்வை வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எங்களுடைய மாவட்டத்தில் விறகு வெட்டி தொழில் செய்கின்ற தொழிலாளர்கள் இருக்கிறார்கள். இன்று அவர்கள் பல பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். அவர்களுக் கென சரியானதொரு செயல்முறை இல்லாத காரணத்தால், அவர்கள் கைதுகளுக்கு உள்ளாகும் நிலை காணப்படுகின்றது. அத்தகைய சந்தர்ப்பங்களில் போதைப்பொருள் குற்றச்சாட்டின் கீழே பொலிஸார் அவர்களைக் கைது செய்கின்றார்கள். இதனால் அவர்கள் 50,000 ரூபாய் அல்லது 100,000 ரூபாய் செலுத்தவேண்டிய நிலைக்குத் தள்ளப்படுகின்றார்கள். விறகு வெட்டும் தொழிலை நம்பி வாழுகின்றவர்கள் எப்படி 50,000 ரூபாய் அல்லது 100,000 ரூபாயைச் செலுத்த முடியும் என்பதை நாங்கள் சற்று சிந்தித்துப் பார்க்க வேண்டும். எனவே, இதற்கென ஒரு வழிமுறையை நாங்கள் ஏற்படுத்த வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

பிரதேச செயலகம், பொலிஸ் திணைக்களம், வனசீவராசிகள் திணைக்களம், தொல்பொருள் திணைக்களம் என்பவற்றைத் தொடர்புபடுத்தி, அவர்களுக்கு விறகு வெட்டுவதற்கு licenceஐ வழங்குவதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது. இந்த விடயத்தையும் கௌரவ அமைச்சர் அவர்கள் முன்னெடுக்க வேண்டுமெனக் கூறி, எனது உரையை முடித்துக்கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.53]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවය සම්බන්ධව විශේෂ වගකීමක් සහිත අමාත්‍යාංශයක වැය ශීර්ෂ පිළිබඳ විවාදයටයි අපි අද එකතු වෙලා ඉන්නේ. පසුගිය කාලයේ රාජ්‍ය සේවය කාර්යක්ෂම කරනවා වෙනුවට සිද්ධ වුණේ කුමක්ද කියා අපි දන්නවා. කවුරු හරි විශ්‍රාම ගියා නම්, පුරප්පාඩු තිබුණා නම් ඒ මේසය, පුටුව අයින් කරලා රාජ්‍ය සේවය අක්‍රිය කරපු ඉතිහාසයක් තමයි තිබුණේ. අද රාජ්‍ය සේවය ශක්තිමත් කරන්න ඕනෑය කියලා සමහරු කථා කළාට එහෙම පාලන ඉතිහාසයක් තමයි තිබුණේ.

මේ අමාත්‍යාංශය යටතේ තමයි මේ රට සංවර්ධනය කිරීමට අවශ්‍ය මානව සම්පත කටයුතු කරන්නේ. මේකට පළාත් සභා

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

අයිතියි, මධ්‍යම ආණ්ඩුව අයිතියි. ඒ වාගේම පළාත් පාලන ආයතන අයිතියි. මේ හැම ආයතනයකම අර මම කියපු ඉතිහාස ක්‍රියාවලිය තුළ දැන් අවශ්‍ය නිලධාරීන් නැහැ. උදාහරණයක් ගත්තොත්, ගොඩක් පළාත් පාලන ආයතනවල තාක්ෂණ නිලධාරීන් නැහැ, වැඩ අධිකාරිවරු නැහැ, කාර්මික නිලධාරීන් නැහැ, ගණකාධිකාරිවරු නැහැ. ඒ විධියට රාජ්‍ය සේවයක් පවත්වාගෙන යන්න බැහැ. ඒ නිසා තමයි මේ අය වැයෙන් අලුතෙන් රාජ්‍ය සේවයට බඳවා ගැනීමට කටයුතු කර තිබෙන්නේ. එය ලොකු පිටුබලයක් වෙලා තිබෙනවා. අද උදේ අමාත්‍යතුමා ප්‍රකාශ කළ පරිදි -සංඛ්‍යාලේඛනත් ඉදිරිපත් කළා- රාජ්‍ය සේවයට අලුතින් බඳවා ගැනීම හරහා බොහෝ ගැටලුවලට උත්තර සැපයෙනවා.

විශේෂයෙන් අද උදේ කථා කළා බහුතරයක් අරගෙනත් ඇතැම් පළාත් පාලන ආයතනවල බලය පිහිටුවන්න මාලිමාවට බැරි වීම ගැන. එහිදී ඇමතිතුමා ගැන සඳහන් කරලා, ආණ්ඩුව සම්බන්ධයෙන් චෝදනා කළා, හරි නම් මේ ඇමතිතුමා තමන්ගේ ආසනයේ ප්‍රාදේශීය සභාව තමන් හදා ගන්න ඕනෑ වාගේ කථාවක් කියමින්. මම දන්නේ නැහැ, මොනවා හිතලා එහෙම කිව්වාද කියලා. සමහර විට ඒ අය විශ්වාස කරනවාද දන්නේ නැහැ, පළාත් සභා සහ පළාත් පාලන ඇමති වෙච්ච පළියට තමන්ගේ ආසනයේ ප්‍රාදේශීය සභාව තමන්ට පිහිටුවා ගන්න තමන්ට නිෂේධ බලයක් තිබෙනවා කියලා. ඒ විධියට තමයි විග්‍රහ වුණේ. සමහර විට එහෙම හිතන්නත් ඇති. මොකද, අපේ ඇමතිතුමා දිහා බැලුවාම එතුමා ටිකක් වැඩිපුර තැන්පත් කෙනෙක් වාගේ පෙනෙනවා. ඒ නිසා එතුමා දිහා බලලා චෝදනාවක් එල්ල කරන්න ඇති. මොකද, ආණ්ඩුවේ ඉතිහාසය ගත්තොත්, ආණ්ඩුවේ හිටපු ඇමතිවරුන්ගේ නම් ඇහෙනකොට මිනිස්සු දුවන තත්ත්වයක් තිබුණේ. ආණ්ඩුවේ හිටපු ඇමතිවරු ගැන තිබෙන්නේ එහෙම ඉතිහාසයක්. අපේ ඇමතිතුමා එහෙම නොවීම නිසාද දන්නේ නැහැ, බොහෝ වෙලාවට එතුමාව quote කරලා, අදක්ෂයි, බැහැ වාගේ අදහසක් ආවා. නමුත් ඒක එහෙම නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඇත්තටම මේ නීති රීති ඇතුළේ තමයි සියලු කටයුතු සිදු වෙලා තිබෙන්නේ. පළාත් පාලන ආයතනවල බලය වැඩිපුර ලැබිලත් අපට ඒ බලය පිහිටුවන්න බැරිවෙලා තිබෙන්නේ, ප්‍රජාතාන්ත්‍රිකව මැතිවරණ ක්‍රමය ඇතුළේ සිද්ධ වෙච්ච ප්‍රශ්නයක් මතයි. සමහර තැන්වල ආසන වැඩිපුර ඇවිල්ලාත්, ඡන්ද වැඩි ප්‍රමාණයක් ලැබිලත් -සමහර විට 12,000ක්, 13,000ක් ලැබිලත්- මාලිමාවට බලය පිහිටුවන්න බැහැ. ඉන්නේ වෙන සභාපති කෙනෙක්; ඡන්ද එක්දහස් ගණනක් ගත්ත කෙනෙක්. ඒ නිසා එතැන විකෘතියක් තිබෙන බව ඇත්ත. ඒ විකෘතිය නිවැරදි කිරීමත් කළ යුතුව තිබෙනවා. ඒක, ඒ මැතිවරණ ක්‍රමය තුළ තිබෙන විකෘතියක්.

ඒ වාගේම විශ්‍රාමිකයින් මේ විෂයට අයිති වෙන නිසා, අද පාර්ලිමේන්තුව ඉස්සරහට විශ්‍රාමිකයින් ගෙන්වා තිබුණා. අපි දන්නවා විපක්ෂ නායකතුමාට වචන පෙට්ටියක් තිබෙන බව. මම මේ කියන්නේ, මට දැනුණු දෙය. එතුමා, ඕනෑම කෙනෙකුගේ ප්‍රශ්නයක්, ඕනෑම ප්‍රශ්නයක් සම්බන්ධව කථා කරන කොට කියන්නේ, "අන්ත අසරණභාවයට පත්වෙලා තිබෙනවා" කියලායි. ඒ වාගේම අදත් කිව්වා, ඒ විශ්‍රාමිකයන් "අන්ත අසරණභාවයට පත් වෙලා" කියලා. ඒ වචන සෙට් එක එතුමාගේ වචන පෙට්ටියේ තිබෙනවා. එහෙම තත්ත්වයක් නැතත් එහෙම කියනවා. මා හිතන විධියට, එතුමා ඒක කියන්නේ අතිශයෝක්තියකින් නොවෙයි. මොකද, අර කියපු වචන පෙට්ටියේ තිබෙනවා "අන්ත අසරණභාවයට පත් වෙලා" කියන වචන ටික. ඇත්තටම මේ රටේ විශ්‍රාමිකයන් අන්ත අසරණභාවයට පත් වුණේ අද නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, 2001 වසරේ ඉඳන්ම එක්සත් ජාතික පක්ෂය බලයේ ඉන්න කොට තමයි විශ්‍රාමිකයන්ට තිබුණු අයිතිවාසිකම් නැති කළේ කියා. ඔවුන් අන්ත අසරණභාවයට පත් වුණේ එදා මිස අද නොවෙයි. ඒ තත්ත්වය ඇතුළේ තමයි ඒක සිද්ධ වුණේ. ඒ අය අන්ත අසරණභාවයට පත් වුණා කියා එතුමා කියපු හින්දායි මම මේ කියන්නේ. ඇත්තටම රාජ්‍ය සේවය අන්ත අසරණභාවයට පත් වුණේ එක්සත් ජාතික පක්ෂයේ පාලනය යටතේයි. ඒ, එක්දහස්නවසිය අසූ ගණන්වලයි. එක්දහස්නවසිය අසූ ගණන්වල එක්සත් ජාතික පක්ෂයේ උපනායකයා ලෙස හිටියේ සජිත් ප්‍රේමදාස මහත්මයාගේ තාත්තා. මම මේක කෙලින්ම කියන්නේ එතුමා අපේ ගරු ඇමතිතුමාගේ තාත්තා ගැන quote කරලා කියපු නිසා. ඇත්තටම කිව්වොත්, රාජ්‍ය සේවකයා අන්ත අසරණභාවයට පත් කළේ එදායි. 1977න් පසුව තමන්ගේ පැත්තේ නැති රාජ්‍ය සේවකයාගේ පස්සෙන් පැන්නුවා. ඔවුන් එදා තමයි අන්ත අසරණභාවයට පත් වුණේ. ඒ, යූඑන්පී ආණ්ඩුව කාලයේ. එතුමා අද කියයිද දන්නේ නැහැ, "තාත්තා යූඑන්පී වුණාට මම සජබයේ" කියලා. එතුමා එහෙම කියයිද දන්නේත් නැහැ. මම මෙහෙම කියන්නේ එතුමා අතිශයෝක්තියෙන් මේවා කියන නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයෙන් තමයි විශ්‍රාම වැටුප් හිමි අයට අවශ්‍ය විශ්‍රාම වැටුප ලබා දීම සඳහා කටයුතු කර තිබෙන්නේ; ගෙවලා තිබුණේ නැති පාරිතෝෂික ගෙවන්න කටයුතු කර තිබෙන්නේ. මේ අය වැය තුළයි, රාජ්‍ය සේවකයා ඇතුළුව විශේෂයෙන්ම මානව සම්පත සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබෙන්නේ. මේ අය වැයෙහි ඒවා තිබෙන නිසා විපක්ෂ නායකතුමා හැටියට එතුමා ඒ සාධනීය දේවල් ගැනත් කල්පනා කරන්න එපා යැ. ප්‍රශ්න තිබෙන්න පුළුවන්. ප්‍රශ්න 100ක් තිබෙනවා නම් ඒ ප්‍රශ්න 100න් 75ක් විසඳලා 25ක් ඉතිරි වෙලා තිබෙනවා කියලා හිතමු. විපක්ෂය මේ මොකක්ද කරන්නේ? අර 75 ගැන කථා කරන්නේ නැතිව 25 ගැනයි කියන්නේ. අර 75 ගැන, ඒ සාධනීය තත්ත්වය ගැන කථා කරලා "තව 25ක් ඉතිරි වෙලා තිබෙනවා, එම නිසා ඒ 25ත් කරන එක ආණ්ඩුවේ වගකීමක්" කියලා කියනවා නම් ඒකේ ගැටලුවක් නැහැ. හැබැයි, ගැටලුව වෙලා තිබෙන්නේ ඊට වඩා වෙනස් විධියකට මේ ප්‍රශ්නය දකින එකයි. ඇත්තටම විපක්ෂය පොදුවේ මේ හැම කාරණයක්ම දැක්කේ ඒ විධියටයි.

ඒ වාගේම අපි දන්නවා, පළාත් පාලන ආයතන කාර්යක්ෂම කරන්න ඕනෑ කියලා. මොකද, බිම් මට්ටමේ තමයි සංවර්ධනය තිබෙන්නේ. ජාතික ජන බලවේගය ආණ්ඩුව හැටියට අපි හදලා තිබෙන වැඩ පිළිවෙළ අනුව බිම් මට්ටමේ ඉඳන් උඩට සංවර්ධනය අරගෙන යෑම සඳහා තමයි කටයුතු කරමින් තිබෙන්නේ. ඒ හදලා තිබෙන වැඩ පිළිවෙළ ඇතුළේ විශේෂයෙන්ම මේ අමාත්‍යාංශයට අතිවිශාල කාර්යභාරයක් පැවරී තිබෙනවා. අපි විශ්වාස කරනවා, මේ අමාත්‍යාංශයට ලොකු වගකීමක් තිබෙනවා කියලා. ඒ ලොකු වගකීම ඉෂ්ට කිරීමේදී ගරු ඇමතිතුමාටත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත් ඒ සඳහා ලොකු කාර්යභාරයක් පැවරී තිබෙනවා. ඒ සඳහා අපේ ආණ්ඩුවේ සහයෝගයත්, විශේෂයෙන්ම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අපේ සහයෝගයත් ලබා දීම සඳහා අපි කටයුතු කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**

(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)

(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

2025.11.19 දින පළ වූ "අරුණ" පුවත් පතේ ප්‍රධාන සිරස්තලය විධියට තිබෙනවා, "ග්‍රාම නිලධාරි සහතිකය මදි. පොලිස් වාර්තා ගන්න මහජන කමිටු ප්‍රධානිගේ අනුමැතියත් ඕනෑ" කියලා. මේක "අරුණ" පුවත් පතේ ප්‍රධාන සිරස්තලයක් හැටියට ප්‍රකාශයට පත් වෙලා තිබුණා. පොලිස් වාර්තා ලබා ගැනීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකයට අමතරව අදාළ ග්‍රාම නිලධාරි වසමේ මහජන ආරක්ෂක කමිටු සභාපතිවරයාගේ සහතිකයක් අවශ්‍යයි, ඒ සඳහා ග්‍රාම නිලධාරි සහතිකය ප්‍රමාණවත් නැහැ කියලා එම පුවත් පතේ සඳහන් වෙනවා. මේක අසත්‍ය ප්‍රකාශයක්.

මෙහෙම උපදෙසක්වත්, චක්‍රලේඛයක්වත් පොලීසියවත්, මහජන ආරක්ෂක අමාත්‍යාංශයවත් නිකුත් කරලා නැහැ. එම ප්‍රවෘත්තිය තුළ සඳහන් වෙනවා, මෙම ප්‍රවෘත්තියේ සඳහන් තොරතුරු ග්‍රාම නිලධාරි පැවසුවා කියලා. ඔවුන් තොරතුරු ලබා ගත්තු මූලාශ්‍රය නිශ්චිතව කියන්නේ නැහැ. එහෙම තහවුරු කර නොගත් තොරතුරු ප්‍රවෘත්තියක් විධියට පළ කරනවා නම් එයින් බලපෑමට ලක් වන පාර්ශ්වයන්ගෙනුත් තොරතුරු සොයා බලා තමයි ඒ ප්‍රවෘත්තිය පළ කරන්න ඕනෑ. එහෙම මාධ්‍ය සදාචාරයක් නැතුව තමයි මේ මාධ්‍ය මේ ප්‍රවෘත්තිය පළ කරලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි, ඒ පුවත් පතේ හිමිකාරිත්වය දරන අයිතිකරුගේම ආයතනයක් වන "දෙරණ" TV නාළිකාවේ "දෙරණ අරුණ" නම් TV වැඩසටහන තුළින් මේ අසත්‍ය ප්‍රවෘත්තිය නැවත නැවතත් හුවා දක්වා තිබෙනවා, සත්‍ය ප්‍රවෘත්තියක් හැටියට. මේක වැරදි ප්‍රවෘත්තියක්, අසත්‍ය ප්‍රවෘත්තියක්, රටම නොමඟ යවන විධියේ ප්‍රවෘත්තියක්. මෙහෙම සහතිකයක් අවශ්‍ය නැහැ, මෙහෙම චක්‍රලේඛයක් නිකුත් කරලා නැහැ. ඒ හින්දා මේක මහජනයා නොමඟ යවන, රජය කෙරෙහි අප්‍රසාදය පළ කරවන ප්‍රවෘත්තියක්. මේ පුවත් පතට විරුද්ධව මමත් මීට පෙර CID එකට පැමිණිල්ලක් කරලා තිබෙනවා, මීට පෙර කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන්. මම හෙට දිනයේ මේ පිළිබඳව ආචාර ධර්ම සහ වරප්‍රසාද කමිටුවට පැමිණිල්ලක් කරන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.05]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්න78ාට ස්තුතියි. මම හිතනවා, මේ පාර්ලිමේන්තුව තරම් උපාධිය අභියෝගයට ලක් වෙච්ච පාර්ලිමේන්තුවක් මේ ඉතිහාසයේ නැහැ කියලා. නාමල් රාජපක්ෂ මහත්මයාගේ උපාධිය ගැන හොයන ගමන්ම හිටපු කථානායකතුමාටත් පොඩි සාධාරණයක් කරන්න කියලා මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා.

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. මොකද, මට එතුමාගෙන් පොඩි පැහැදිලි කරගැනීම් කිහිපයක් කරවාගන්න තිබෙනවා. මොකද, එතුමාගේ කථාවේදී, 2020-2024 වර්ෂවල විශ්‍රාම ගිය අයට සාධාරණයක් කරන්නට අවශ්‍ය තත්ත්වය මේ අය වැය තුළ සකස් කරලා තිබෙනවා වාගේ අදහසක් කියැවුණා. මම ජනාධිපතිතුමාගේ කථාවත් මුල ඉඳන් අගට ආපසු සැරයක් කියෙව්වා. නමුත් 2020-2024 වර්ෂවල විශ්‍රාම ගිය අයට වෙලා තිබෙන අසාධාරණය සම්බන්ධයෙන් -එතුමා ඒ අසාධාරණය මොකක්ද කියන එකත් පැහැදිලි කළා- කිසිම සඳහන් කිරීමක් ගිය අවුරුද්දේ අය වැයේ හෝ මේ අවුරුද්දේ අය වැයේ හෝ මම දැක්කේ නැහැ. ඒගොල්ලෝ කොවිඩ් වසංගත සමයේදී වැටුප් සංශෝධනයටවත් අහු වෙච්ච නැති කණ්ඩායමක්. අන්න ඒකයි ඒ අයට වැඩිපුරම එතැනදී අසාධාරණයක් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2016-2022 කාල සීමාවට අදාළ විශ්‍රාමිකයන්ට ලැබෙන්න තිබුණු විශ්‍රාම වැටුප 2027 වනකල් කල් දැමීම තමයි මෙතැන තිබෙන ගැටලුව. 2016දී දීපු නැති එක 2020දී දෙන්න කථා කරලා තියෙද්දි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ ඒක නැවත වතාවක් ඉවත් කළා. හැබැයි මෙතුමන්ලා කියන පරිදි 2027 වනකල් බලන් ඉන්නවා කියන්නේ, ඒ අයට වයස අවුරුදු 71ක්, 72ක් වාගේ වෙනවා. ඒ වනකොට ඒ විශ්‍රාම ගිය අයගෙන් කී දෙනෙකු මේ කියන විශ්‍රාම වැටුප ගන්න ඉතුරු වෙයිද කියන එක පිළිබඳව ගැටලුවක් තිබෙනවා. ඒ නිසා හැකියාව තිබෙනවා නම් 2027 ජූලි මාසයේ දෙනවා කියපු එක ලබන අවුරුද්දේ ජනවාරි මාසයේවත් දෙන්න අවශ්‍ය කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

අද "Daily Mirror" e-paper එකේ තිබෙනවා මම දැක්කා, "Govt. exempts Lanka Sugar Company from statutory payments: Minister" කියලා. ගරු ඇමතිතුමා කියනවා,"ලංකා සීනි සමාගම ගෙවීමට ඇති ව්‍යවස්ථාපිත ගෙවීම්වලින් ඉවත් වෙනවා" කියලා. ව්‍යවස්ථාපිත ගෙවීම් කියන්නේ මොනවාද? EPF, ETF, එහෙම නැත්නම් gratuity එක. ගරු ධර්මසේන මන්ත්‍රීතුමා දැන් මෙතැන සිටියා නම් කියයි, සෙවනගල සහ පැල්වත්ත සීනි සමාගම්වල සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට කැපිලා යන්න ඕනෑ මුදල් ප්‍රමාණය කැපිලා යනවාද කියලා. එතුමා මා එක්ක කිව්වා, "අර්ධ වාර්ෂික වාර්තා එනවා. ඒ වාර්තාවල පැල්වත්ත සීනි සමාගමේ සේවකයන්ගේ EPF එක කපලා නැහැ කියලා. ඒක එහෙම කරන්න පුළුවන්ද? මේ කම්කරු නීතිය අනුව ඒක එහෙම කරන්න පුළුවන්ද? මෙන්න මේ වාගේ ගැටලු තිබෙනවා. ඒක එහෙම කරන්න කොහෙත්ම බැහැ. ඒ අයට හිමි ඒ අර්ථසාධක අරමුදල් ඒ අයට ලැබෙන්න ඕනෑ. අර්ථසාධක අරමුදල් නොගෙවන සමාගම් කිහිපයකුත් තිබෙනවා. ඒවා අතරින් එකක් තමයි මේ කියන සීනි සමාගම. සමහර විට මේ රාජ්‍ය නිලධාරි මැදිරියේ ඇති, ඒ සමාගමේ සභාපතිතුමිය, ඒ වාගේම දක්ෂ පරිපාලන නිලධාරිනියක වන විධායක නිලධාරිතුමිය. තත්ත්වාර්ථ ක්‍රමයෙන් ආණ්ඩුකරණය ඉගෙන ගන්න මේ ආණ්ඩුවට ඔබතුමියලා දෙන්නා පැහැදිලි කර දෙන්න, මේවා මේ අයට ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ, වටපිටාව සකස් කර නොදුන්නොත් අධ්‍යක්ෂ මණ්ඩලයට නීතියට යන්න වෙයිද කියන එක. ඇමතිතුමා නම් බේරෙයි. එහෙම වෙච්ච තැන් අපි දැකලා තිබෙනවා. ඒ නිසා නිලධාරින් අමාරුවේ නොදා මේ කටයුතු කරන්න ඕනෑ. මම කියනවා, එහෙම EPF, ETF නොගෙවා, gratuity නොගෙවා ආයතන පවත්වා ගෙන යෑම නීතිවිරෝධියි කියලා. එතකොට, මේ සීනි සමාගමේ කියන EPF එක, ETF එක, gratuity එක ගෙවන්නේ කවුද? ඒ සමාගමෙන් ගෙවෙන්නේ නැත්නම් ඒක ගෙවන්නේ කවුද? අපි මේවා ගැන ප්‍රශ්න කළාම වීරප්පන්ට ඇඳපු නිලුපුල් අපේ FB pagesවලට ගිහින් කුණුහරුප ලියනවා. අපි මේ කථා කරන්නේ, රටේ තිබෙන ප්‍රශ්න. ඒකට තමයි මේ සභාව අපි පාවිච්චි කරන්න ඕනෑ. ඒවා ගැන තමයි අපි

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

සංවාද කරන්න ඕනෑ. මේවා කථා කළාම අන්න අර විධියට රැවුල කරකවා ගෙන වීරප්පන්ට ඇඳගෙන ඉන්න නිලුපුල්, එයාගේ මඩ බලකාය දාලා අපට මඩ ගහනවා. එහෙම නොවෙයි, මේවා නිවැරදි වෙන්න ඕනෑ.

මේ අය වැයෙන් අපේ රටේ ඉන්න ඉහළම නිලධාරින්ට හොඳ සවල් පාරක් දීලා තිබෙනවා, ආයෙත් වාහන බලපත්‍ර දෙන්නේ නැහැ කියලා. මේ වෙනකොට, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ කාලයේ, පසුගිය වසරේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ කාලයේ නිකුත් කරපු බලපත්‍ර 21,000ක් පමණ තිබෙනවා. වෛද්‍යවරුන්ට, ඉංජිනේරුවන්ට, දිසාපතිවරුන්ට, පරිපාලන නිලධාරින්ට, විශේෂඥයන්ට නිකුත් කරපු බලපත්‍ර තිබෙනවා. දැන් මේවාට මොකද කරන්නේ? දැන් මේ බලපත්‍ර ටික පුච්චලා නළලේ අළු ගා ගන්න තමයි වෙන්නේ. මොකද, මේවා පාවිච්චි කරන්න බැරිව යනවා. ඒ වාගේම විනිශ්චයකරුවන්ට දුන්නු පර්මිට් එකත් නැහැ. හමුදා නිලධාරින්ට, නියෝජ්‍ය පොලිස්පතිවරුන්ට, ජ්‍යෙෂ්ඨ පොලිස්පතිවරුන්ට විශ්‍රාම ගිහිල්ලා බස් එකේ, කෝච්චියේ යන්න වෙලා තිබෙනවා. ඒ අය, ඒගොල්ලන්ගේ සේවා කාලය ඇතුළත ත්‍රස්තවාදීන් එක්ක, කුඩු-පාතාලයත් එක්ක කටයුතු කරපු අය. එතකොට ඒ අයගේ ආරක්ෂාව ගැනත් අපි මීට වඩා හිතන්න ඕනෑ. රටට වැඩ කරපු, හොරකම් නොකරපු මිනිස්සුන්ට සලකන විධිය ගැන ඇත්තටම අපි කනගාටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, doctorsලා 20,000ක් ඉන්නවා. ඒ අයට පර්මිට් එක දෙන්න. ඒක දෙන්න බැරි නම් වාහනයක්, driver කෙනෙක්, ඉන්ධන දීමනාවක් එක්ක ලබා දීලා ඒගොල්ලන්ගේ කටයුතු කරන්න දෙන්න. මොකද, ඒ හැමෝම private practice කරන්නේ නැහැ. එහෙම නොවුණොත් මේ වෛද්‍යවරුන්ගේ අපේක්ෂා ඉෂ්ට කරගන්න වෙහෙසෙනවා. "මාස්ලෝගේ අවශ්‍යතා පිරමීඩය" අනුව මිනිස්සු අවශ්‍යතා හොයාගෙන යනවා. ඒක තමයි මනුස්ස ස්වභාවය. ඒ නිසා මම කියනවා, මෙන්න මේ කාරණයට අවධානය යොමු කරලා ඒ වෛද්‍යවරුන්ට අවශ්‍ය දේ දෙන්න කියලා. එහෙම නැත්නම් අන්තිමට වෙන්නේ මොකක්ද? සේවය කරලා අමාත්‍යාංශ ලේකම් පයින් යනවා, JVP cadre එක cab එකේ යනවා බලාගෙන ඉන්න වෙනවා. 2016දී අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාගේ කාලයේ දීලා තිබුණා, නිල වාහනය වෙනුවට මාසික ගෙවීම හැටියට රුපියල් 50,000ක්. ඇත්තටම, ඒ රුපියල් 50,0000 දැන් මදි. ඒ නිසා මම යෝජනා කරනවා, ඒක රුපියල් ලක්ෂයක්වත් කරලා දෙන්න කියලා.

අද පළාත් සභා ඡන්දය ගැනත් කිව්වා. 2021, 2022 කාලයේ තිබුණු විශේෂ කාරක සභාවේදී විපක්ෂයේ ඉන්නකොට අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, පරණ සමානුපාතික ක්‍රමයටම ඒක තියමු කියලා. එහෙම යෝජනා කරපු එතුමාට ඇයි දැන් ඒක කරන්න බැරි කියලා අපි අහනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමුපකාර ඡන්ද පරදිනකොට පළාත් සභා ඡන්දය තියන්න බයක් තිබෙනවාද කියලා මම අහනවා. වත්මන් ඇමතිතුමා සීමා නිර්ණය ගැන කියනකොට, කියනකොට අපට හිතෙනවා, මේ පළාත් සභා ඡන්දය කල් දමන්නම තමයි හදන්නේ කියලා. හැබැයි මම කියනවා, පළාත් සභා ඡන්දය කල් දමන්න හිතනවා නම්, 2018 පළාත් පාලන ඡන්දය කල් දමපු ඒ ආණ්ඩුවලට මොකක්ද වුණේ කියලා මෙතැන හිටපු ෆයිසර් මුස්තාපා හිටපු ඇමතිතුමාගෙන් ඇහුවොත් කියයි කියලා.

අවසාන වශයෙන් මම මෙන්න මේ යෝජනාව කරනවා. ඩිජිටල්කරණය වාගේම තොරතුරු තාක්ෂණය ගැන අය වැය තුළ කථා කළා. ඒක හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ තිබෙනවා, ඒකාබද්ධ සේවය කියලා එකක්. ඒක ඇතුළේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ අය ඉන්නවා. රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ මෙවලමක් වන නිසා,- ඔබතුමන්ලා ඩිජිටල් අමාත්‍යාංශයේ දැක්ම කියවලා බලන්න. කාලය නැති නිසා මම ඒක ගැන කියන්නේ නැහැ. මේ කියන වැඩසටහන්, සැලසුම් සහ උපාය මාර්ග සකස් කරන්න නම් මේ ටික කරන්න කියලා මම කියනවා. තොරතුරු තාක්ෂණ සේවය රජයේ පරිපාලන සේවයේ තියාගෙන වැඩක් නැහැ. ඩිජිටල් අමාත්‍යාංශය යටතට මේ අය යවන්න, අර සංවර්ධන නිලධාරින් සෘජුවම සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයට යැව්වා වාගේ. ඒ අය පාවිච්චි කරලා හොඳ දේවල් කරපු අපේ ඇමතිවරු ඉන්නවා. තුන්කල් දැකපු ගාමිණී දිසානායක හිටපු ඇමතිතුමා ගැන කියලා මගේ කථාව අවසන් කරන්නම්. මහවැලියේ සැලසුම් හදන්නට සැලසුම් සේවය ගත්තා වාගේ, ඩිජිටල් යුගයක තොරතුරු තාක්ෂණය ඉදිරියට යන්න නම් මෙන්න මේ කිච්ච කණ්ඩායම ඩිජිටල් අමාත්‍යංශය යටතට ගන්න කියලා මම යෝජනා කරනවා. ඒ තොරතුරු තාක්ෂණ සේවයේ නිලධාරින් ටික ඒ සඳහා ගන්න කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, ප්‍රාදේශීය ලේකම්වරු රජය සහ මහජනතාව එකට සම්බන්ධ කරන දොරටු 341ක් හැටියට මම දකිනවා. මෙතැනින් තමයි ජනතාව සේවා ඉටු කරගන්නේ. එතකොට මෙතැනින් පුංචි හෝ අඩුපාඩුවක් වුණොත් ඒවා රජයේ අඩුපාඩු හැටියට පේනවා. ඒ නිසා මේ වෙනකොට ප්‍රාදේශීය ලේකම්වරුන්ට තිබෙන භෞතික සහ මානව සම්පත්වල ගැටලු ටික විසඳලා දෙන්න. ඒ වාගේම ඒ අයට තිබෙන පහසුකම් ඉතාම අඩුයි. ඒ අයට අවශ්‍ය පහසුකම් ටික දෙන්න. ඒ වාගේම පුහුණුවක් සහ මඟපෙන්වීමක් ලබා දෙන්න. මම මේ කියන්නේ ඒගොල්ලන්ට වැඩ බැහැ කියලා නොවෙයි. 1992 අංක 58 දරන පනතින් තමයි ප්‍රාදේශීය ලේකම්වරු පත් කරන්නේ. ඒ අවස්ථාවේ මාසයක පුහුණුවක් දුන්නා. එහෙම වුණාම රටේ හැමෝම එක විධියකට වැඩ කරනවා. ඒ විධියට මේ අයටත් ඒ අවස්ථාව ලබා දෙන්න. එහෙම නොවුණොත් එකම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල එකම කාරණාව සඳහා වෙනස් තීන්දු එනවා. එහෙම වුණාම මොකද වෙන්නේ? ඒ අයට විරුද්ධව මූලික විමර්ශනයක් කරනවා; charge sheet එකක් දෙනවා. නිදහසට කරුණු ගන්නවා; ඒකත් පිළිගත්තේ නැත්නම් විනය පරීක්ෂණයක් කරනවා. ඒවාට වෙලාවට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් උත්තර, නිරීක්ෂණ ආවේ නැත්නම් මොකක්ද වෙන්නේ? අර නිලධාරියාට උසස්වීම් නැහැ, විදේශ සංචාර නැහැ, ආර්ථික ගැටලු එනවා. ඉතිරි වෙන්නේ අවමානය විතරයි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්කතුමා මේ ගරු සභාවේ රාජ්‍ය නිලධාරි මැදිරියේ ඇති. ඔබගේ පැත්තෙන් ප්‍රාදේශීය ලේකම්වරුන්ට ලබා දිය යුතු දේවල් පමා නොවී ලබා දෙන්න කියා ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ සභාවේ නැති වෙලාවේ මගේ නම සඳහන් කරමින් යම් ප්‍රකාශයක් කරලා තිබෙනවා. මේ විපක්ෂයේ බහුතරයකට අපි මේ කියන දේවල් තේරුම් ගැනීමේ දෝෂයක් තිබෙනවා. මම හිතුවා, විශේෂයෙන් ගරු කවිරත්න මන්ත්‍රීතුමිය යමක් කමක් තේරුම් ගන්න පුළුවන් කෙනෙක් කියලා. *[බාධා කිරීමක්]* ඇහිච්ච දේම නම්,- සාමාන්‍යයෙන් ඔබතුමිය මාත් එක්ක ලොබියේදී කථා කරලා, හමුවුණු වෙලාවට කථා කරලා යම් යම් කරුණු පැහැදිලි කර ගන්නවා. එහෙම නම් ඔබතුමියට මේකත් විමසා පැහැදිලි කරගන්න තිබුණා නේ. මම පැහැදිලි කරපු එක ඔබතුමිය තේරුම් අරගෙන ඉතාම පැහැදිලිව,- *[බාධා කිරීමක්]* මම පැහැදිලි කළේ

2016-2019 දක්වා වන විශ්‍රාමිකයන්ට තිබුණු ප්‍රශ්නය අදියර තුනකින් අපි දැන් විසඳලා තිබෙනවා කියන එක. එතකොට දැන් 2024.12.31 දක්වා 2020-2024 කියලා කණ්ඩායමක් නැහැ. ඉන්නේ, 2024.12.31 දක්වා විශ්‍රාම ගත්ත සියලුදෙනා. අන්න ඒ සියලුදෙනාගේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය අපි ඉදිරියේදී විසඳනවා කියන එක තමයි මම පැහැදිලි කළේ. එතුමියට තේරුම් ගත්තේ ඇහුණු විධියට කියලා කිව්වා නේ. ඒක නිසා අපි ඒක වෙනම පැහැදිලි කර ගනිමු.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) අනුව කවුරු හරි point of Order එකක් ගන්නවා නම්, කාලය දෙන්න පුළුවන් විනාඩියක් දක්වා පමණයි. දැන් බලන්නකෝ, කොච්චර වෙලාවක් දීලා තිබෙනවාද කියලා. ඔය පුටුවේ වාඩි වෙනකොට කරුණාකරලා ඒ ගරුත්වය තියා ගන්න. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! நான் நினைக்கின்றேன், இன்றைய தினம் எனக்குப் பேசுவதற்கு கிடைத்திருக்கின்ற இந்த நேரம் கௌரவ உறுப்பினர் மனோ கணேசன் அவர்களுக்கு ஒதுக்கப்பட்டதென்று. அவருக்கு ஒதுக்கப்பட்டது 15 நிமிடங்கள்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු සුජීව දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair, and THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA took the Chair.*

[பி.ப. 4.18]

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! எனக்குத் தரப்பட்ட இந்த நேரம், கௌரவ மனோ கணேசன் அவர்களுக்கு ஒதுக்கப்பட்ட 15 நிமிடங்கள்! ஏற்கெனவே நான் கேட்டபோது எனக்கு 8 நிமிடம் என்று சொல்லப்பட்டது. இப்பொழுது 6 நிமிடம்தான் ஒதுக்கப்பட்டுள்ளது. ஆகவே, நீங்கள் குறைந்தது 10 நிமிடமாவது எனக்குத் தரவேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

குறிப்பாக, நாட்டில் இப்பொழுது பரவலாகத் தமிழ் மக்களுக்குப் பல்வேறுபட்ட முக்கியமான பிரச்சினைகள் இருந்தாலும், திருகோணமலையில் வைக்கப்பட்ட புத்தர் சிலை தொடர்பாகத் தமிழ் மக்கள் மிகப் பெரியளவான ஆத்திரத்திலும் கோபத்திலும் இருக்கின்றார்கள் என்பதை நீங்கள் கடந்த இரண்டு - மூன்று நாட்களிலும் மிகத் தெளிவாக உணர்ந்திருப்பீர்கள். நீங்கள் ஒன்றைப் புரிந்துகொள்ள வேண்டும், வரலாற்றில் தமிழர்கள் யாரும் திருகோணமலை மாவட்டத்தில் அரசாங்க அதிபராக இருந்ததில்லை; அவ்வாறு தமிழர்கள் யாரும் நியமிக்கப்பட்டதும் இல்லை. அதேநேரம் திருகோணமலை மாவட்டத்தில் அடிப்படையில் முழுக்க முழுக்கத் தமிழர்கள் இருந்த வரலாற்றை மாற்றுவதற்காக அடிக்கடி அங்கு பௌத்த விகாரைகளை அமைத்தல், பௌத்தத்தை மேலோங்கச் செய்தல் போன்ற விடயங்கள் முன்னெடுக்கப்பட்டு இருக்கின்றன. அதில் ஒரு கட்டம்தான் திருகோணமலைக்கு புத்தர்சிலை கொண்டுவரப்பட்ட விடயம். இன்று அது மிகப் பெரியதோர் இனவாதப் பூதமாக வெளிவந்திருக்கின்றது. குறிப்பாக, ஜே.ஆர். ஜயவர்தன அவர்கள் காலத்திலும் இதே பிக்குமாரை வைத்து அவர் செய்த அரசியல், இப்பொழுது இந்த அரசாங்கம் செய்கின்ற அரசியல் எல்லாமே தமிழ் மக்களுக்கு எதிரானவை என்பதை வெளிப்படுத்துகின்றன.

இன்று நாங்கள் விநோதமான விஷயம் ஒன்றையும் பார்க்க முடிந்தது. குறிப்பாக, இந்த அரசாங்கத்தின் ஆதரவோடு, பொலிசாரின் பாதுகாப்புடன் எடுத்துச் செல்லப்பட்ட புத்தர் சிலை திரும்பவும் அதே இடத்தில் வைக்கப்பட்டுள்ள நிலையில் இன்று இந்தச் சபையில் எதிர்க்கட்சித் தலைவர் சஜித் பிரேமதாஸ அவர்கள், "அந்தப் புத்தர் சிலையை அதே இடத்திலேயே வைக்க வேண்டும்; இது ஒரு தேசியப் பிரச்சினை" என்றும் ஆக்ரோசித்ததுதான் மிகப் பெரிய அதிசயம். கடந்த சனாதிபதித் தேர்தலின்போது தமிழ் மக்கள் அவருக்கு வாக்களித்திருந்தார்கள்; அவர் சனாதிபதியாக வந்தால் எல்லாம் நன்றாக நடக்குமென்று நினைத்தார்கள். ஆகவே, சஜித் பிரேமதாஸ அவர்களுடைய அந்தக் கருத்தை அவர் மீளப்பெற வேண்டும்; அவர் தமிழ் மக்களிடம் மன்னிப்புக் கோர வேண்டும். எந்த மக்கள் அவர் சனாதிபதியாக வரவேண்டுமென வாக்குகளை அளித்தார்களோ, அந்த மக்களுக்குச் செய்த துரோகத்துக்காக சஜித் பிரேமதாஸ அவர்கள் தமிழ் மக்களிடம் பகிரங்க மன்னிப்பைக் கோரும்போதுதான் அது நீதியானதாக இருக்கும் என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்ய விரும்புகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிகவும் முக்கியமாக மதங்களை மையமாக வைத்துத்தான் காலங்காலமாக இங்கு பிரச்சினைகள் முன்னெடுக்கப்பட்டு இருக்கின்றன. குறிப்பாக, திருகோணமலை மாவட்டத்தின் குச்சவெளி பிரதேச செயலாளர் பிரிவில் 30 விகாரைகள் இராணுவத்தின் உதவியோடு இப்பொழுதும் கட்டப்பட்டு வருவதை நீங்கள் மிக நிதானமாக அவதானிக்கலாம். அதிலும்

[ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා]

திரியாய் பகுதியில் இரண்டே இரண்டு சிங்களவர் இருக்கின்றார்கள் என்பதற்காக ஒரு விகாரை கட்டப் படுகின்றது. பல இடங்களில் இவ்வாறு நிலங்களைக் கைப்பற்றி விகாரைகளை அமைக்கின்ற முயற்சிகள் முழுமூச்சாக நடைபெறுகின்றது. இவற்றை இந்த அரசாங்கம் தடுப்பதற்குத் தவறினால், இந்த நாட்டில் இருக்கின்ற இனங்களுக்கு இடையில் ஒற்றுமை அல்லது நல்லிணக்கம் என்பது இல்லாமலே போய்விடும்! இது மிகப் பெரிய அபாயகரமான சூழல் என்பதை நான் இந்த இடத்தில் பதிவுசெய்கின்றேன்.

குறிப்பாக, திருகோணமலையில் காணப்படுகின்ற பதற்றநிலை தொடர்பில் இன்றும் நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்திருந்தபொழுது பேசப்பட்டது. அது ஒரு சுமுகமான சந்திப்பாக இருந்தாலும்கூட, மாண்புமிகு சனாதிபதியும் சில விடயங்களை ஏற்றுக்கொண்டார். அவர் நேற்றுமுன் தினம் பாராளுமன்றத்தில் ஆற்றிய உரை எமக்குச் சில நம்பிக்கைகளைத் தந்திருக்கின்றது. என்றாலும், நாங்கள் தொடர்ந்தும் காத்திருக்கின்றோம்; அவர் பேசுகின்ற விடயங்கள் எல்லாம் சரியாக நடைபெறுமா? நீதி, சட்டம் என்ற அடிப்படையில் இந்த நாட்டில் நியாயம் கிடைக்குமா? என்பதைப் பார்த்துக் கொண்டிருக்கின்றோம். அதேநேரம், இந்த விகாரை தொடர்பாகச் சட்டங்களை எடுத்துச் சொல்லுகின்ற நீதிபதிகள் அல்லது சனாதிபதி அவர்கள், தையிட்டியில் கட்டப்பட்ட விகாரை தொடர்பாக நீதியையும் சட்டத்தையும் இன்னும் சொல்லவில்லை என்பதையும் நான் இந்த இடத்தில் பதிவுசெய்து கொள்கின்றேன்.

இன்று நடைபெறுகின்ற பொதுநிர்வாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சுத் தொடர்பான விவாதத்தில், குறிப்பாக, யாழ்ப்பாணம் மாவட்டத்தில் சாவகச்சேரி பிரதேச செயலாளர் பிரிவிலுள்ள கொடிகாமம் பகுதியைத் தனியான ஒரு பிரதேச செயலகமாக உருவாக்க வேண்டுமென நீண்டகாலமாகக் கோரிக்கை முன்வைக்கப்பட்டு வருவதை ஞாபகமூட்ட விரும்புகின்றேன். இது தொடர்பாக கிட்டத்தட்ட 20 ஆண்டுகளுக்கு மேலாகப் பல்வேறுபட்ட திட்டங்கள் தயாரிக்கப்பட்டு, மாறி மாறி வந்த அரசாங்கங்களிடம் கையளிக்கப்பட்டிருக்கின்றது. 72 கிராம அலுவலர் பிரிவுகளைக் கொண்டதும், நாவற்குழியிலிருந்து எழுது மட்டுவாள் வரையான மிகநீண்ட நிலப் பரப்பைக் கொண்டதுமான மிகப் பெரியதொரு பிரதேச செயலகமாக வுள்ள சாவகச்சேரி பிரதேச செயலகத்தில் உள்ளடங்குகின்ற கொடிகாமம் பகுதியைத் தனியான பிரதேச செயலகமாக மாற்ற வேண்டும் என்ற கோரிக்கை நீண்டகாலமாக முன்வைக்கப்பட்டு இருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் நினைக்கிறேன், இது தொடர்பான கடிதங்கள் ஏற்கனவே இருந்த சனாதிபதிகளுக்கும் தொடர்புடைய அமைச்சர்களுக்கும் எழுதப்பட்டிருக்கின்ற தென்று. இந்த அரசாங்கம் வந்ததன் பின்னரும் சொல்லப் பட்டிருக்கிறது. ஆனாலும், இதுவரை எந்த முன்னேற்றகரமான நடவடிக்கைகளும் இல்லை என்பதை நான் குறிப்பிட விரும்புகின்றேன்.

அதேபோன்றுதான் யாழ்ப்பாணம் மாவட்டத்தில் கோப்பாய் பிரதேச செயலகப் பிரிவில் உள்ளடங்குகின்ற அச்சுவேலி பகுதியும். அச்சுவேலி, இடைக்காடு போன்ற பேரூர்களைக் கொண்ட ஒரு தனியான பிரதேச செயலகத்துக்கான முன்மொழிவுகளும் யாழ்ப்பாணம் மாவட்ட அரசாங்க அதிபரால் முன்வைக்கப்பட்டுள்ளது. அது தொடர்பாகவும் இதுவரை முன்னேற்றகரமான விடயங்கள் நடைபெறவில்லை.

மேலும், கிளிநொச்சி மாவட்டத்தில் அமைந்துள்ள கரைச்சி பிரதேச செயலாளர் பிரிவிலிருந்து, அக்கராயன் பிரதேச செயலாளர் பிரிவை உருவாக்குவதற்கான முன்மொழிவுகள் அமரர் இராசநாயகம் அவர்கள் அரசாங்க அதிபராக இருந்த காலத்தில் அவரால் சமர்ப்பிக்கப்பட்டிருந்ததுடன், பல்வேறு சந்தர்ப்பங்களில் எங்களாலும்கூட அதற்கான கோரிக்கைகள் முன்வைக்கப்பட்டிருந்தது. ஆனால், இதுவரை எந்த முன்னேற்றகரமான செயற்பாடுகளும் நடைபெறவில்லை என்பதை நான் குறிப்பிட விரும்புகின்றேன். ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, வெறுமனே இது ஒரு பேசுபொருளாக மட்டுமல்லாமல், நிருவாகங்களை இலகுபடுத்தவும் அந்தப் பிரதேச மக்களுடைய அபிவிருத்தி நடவடிக்கைகளை முன்னெடுப்பதற்கும் இலகுவாக கொடிகாமம் பிரதேச செயலாளர் பிரிவு, அச்சுவேலி பிரதேச செயலாளர் பிரிவு, அக்கராயன் பிரதேச செயலாளர் பிரிவு என்பன உருவாக்கப்படவேண்டியது மிகமிக முக்கியத்துவம் வாய்ந்த தென்பதை நான் மிகவும் தெளிவாகவும் பொறுப்புடனும் சொல்லிக்கொள்ள விரும்புவதுடன், இவற்றுக்கான முன்னாயத்த நடவடிக்கைகளை அமைச்சர் எடுக்க வேண்டு மென்பதையும் இந்த இடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

அதேபோல, வடக்கு மாகாணத்திலே ஏற்கனவே பிரதேச செயலாளர் பிரிவுகளாக இயங்குகின்ற ஒட்டுசுட்டான், மடு, கண்டாவளை, மருதங்கேணி போன்றவற்றுக்குத் தனியான உள்ளூராட்சிச் சபைகள் இல்லை. இவை பிரதேச செயலாளர் பிரிவுகளாக 25 ஆண்டுகளுக்கும் மேலாக இயங்கிக் கொண்டிருக்கின்றன. ஆனால், அண்மைக்காலத்தில் உருவாக்கப்பட்டவை எல்லாம் பிரதேச சபைகளாக மாற்றப் பட்டுச் சபை நடவடிக்கைகளும் இடம்பெறுகின்றன. மடு, ஒட்டுசுட்டான், கண்டாவளை, மருதங்கேணி போன்ற இடங்களில் உள்ளூராட்சிச் சபைகளை நிறுவுவதற்கான அனைத்து ஏற்பாடுகளும் முயற்சிகளும் மேற்கொள்ளப்பட்டும், பல குழுக்கூட்டங்கள் நடத்தப்பட்டும் இதுவரை அவை நிறுவப்படவில்லை. அதேபோலத்தான் கிளிநொச்சிக்கான நகர சபை, முல்லைத்தீவுக்கான நகர சபை -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
ஒரு நிமிடம் தாருங்கள்!

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் நினைக்கிறேன், இலங்கையிலேயே பொலன்னறுவை, முல்லைத்தீவு, கிளிநொச்சி மாவட்டங்கள்தான் பிரதேச சபையுடன் இயங்குகின்ற, நகர சபை இல்லாத மாவட்டங்களென்று. அதேபோல், மன்னாருக்கான மாநகர சபை முன்மொழியப்பட்டிருக்கிறது; இன்னும் அது வர்த்தமானி அறிவித்தலாக வெளிவரவில்லை. ஆகவே, முல்லைத்தீவு, கிளிநொச்சிக்கான நகர சபைகள் தொடர்பில் ஏற்கனவே முன்மொழிவுகள் அங்கீகரிக்கப்பட்ட நிலையில், வர்த்தமானி அறிவித்தல் வெளிவருவதற்கான காலம்தான் இனி உள்ளதால் நீங்கள் தயவுசெய்து இவற்றை விரைவில் உருவாக்கித் தர நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, නියමිත කාලය අවසන්.

**ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சிவஞானம் சிறீதரன்)
(The Hon. Sivagnanam Shritharan)
முடிக்கிறேன்!

கௌரவ அமைச்சர் அவர்களே, இந்த உள்ளூராட்சி மன்றப் பிரிப்புகள், அவற்றின் சேவைகள் அந்தப் பிரதேச மக்களுக்குத் தேவை. ஆகவே, முல்லைத்தீவு, கிளிநொச்சி என்பவற்றுக்கான நகர சபைகள், மடு, ஒட்டுசுட்டான், மருதங்கேணி மற்றும் கண்டாவளைக்கான உள்ளூராட்சிச் சபைகள் என்பவற்றின் உருவாக்கத்திற்கான நடவடிக்கைகளை விரைவாக - அடுத்த வரவு செலவுத்திட்ட விவாதத்திற்கு முன்னராவது - நீங்கள் செய்வீர்கள் என்ற நம்பிக்கையோடு நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.26]

**ගරු ධර්මප්‍රිය දිසානායක මහතා**
(மாண்புமிகு தர்மப்பிரிய திசாநாயக்க)
(The Hon. Dharmapriya Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳවත් කථා කරන මේ අවස්ථාවේදී කිව යුතු වැදගත් කාරණයක් තිබෙනවා. 2026 අය වැය පිළිබඳව කථා කරද්දී කියන්න ඕනෑ, අපි රජයක් විධියට පසුගිය වසරේ මේ රටේ රාජ්‍ය සේවකයා වෙනුවෙන්, රාජ්‍ය සේවකයා තෘප්තියට පත් වන පරිදි දැවැන්ත වැටුප් වැඩි කිරීමක්; සියයට 66ක වැටුප් වැඩි කිරීමක් සිදු කළ බව. රාජ්‍ය සේවකයන්ගේ මූලික වැටුපට ලැබෙන විධියට එම වැටුප් වැඩිවීම ප්‍රකාශයට පත් කළා. එම වැටුප් වැඩිවීමෙන් සියයට 30ක් 2025 වසරේදී රාජ්‍ය සේවකයාට ලබා දීමටත්, ඒ වාගේම එම මුදලින් තවත් සියයට 35ක් 2026 ජනවාරි මාසයේ සිට රාජ්‍ය සේවකයාට ලබා දීමටත්, ඒ වාගේම එම මුදලින් තවත් සියයට 35ක් 2027දී රාජ්‍ය සේවකයාට ලබා දීමටත් කටයුතු කර තිබෙනවා. රාජ්‍ය නිලධාරින්ට රාජ්‍ය සේවයේ යෙදීමේදී ඉතා තෘප්තිමත්ව තමන්ගේ කටයුතු කරන්න පුළුවන් තත්ත්වයක් පසුගිය කාලසීමාවේදී අප නිර්මාණය කර දීලා තිබෙනවා.

මේ රටේ රාජ්‍ය සේවකයා තමන්ගේ ඉල්ලීම් ලබා ගැනීම වෙනුවෙන් මහා දැවැන්ත අරගළයක යෙදුණු කාලයක් තිබුණා. ඔවුන් තමන්ගේ වැටුප වර්ධනය කර ගන්න මහා දැවැන්ත අරගළ කළා. හැබැයි, අපේ රජය බලයට පත් වෙලා ලැබුණු පළමුවැනි අවස්ථාවේදීම අපි මේ රටේ රාජ්‍ය සේවකයාට තෘප්තිමත් වැටුපක් මේ වෙනකොට ලබා දීලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ අයගේ වැටුප් වර්ධකත් සියයට 100කින් වැඩි වෙන තත්ත්වයකට පත් කරලා තිබෙනවා. ඒ නිසා රාජ්‍ය සේවයේ යෙදෙන ලක්ෂ 13ක් වන රාජ්‍ය සේවකයින්ට, තමන්ගේ කටයුතු ඉතා හොඳින් කරගෙන යන්න පුළුවන් පසුබිමක් වර්තමානය තුළ නිර්මාණය කරලා දීපු රජයක් තමයි මේ රජය.

ඒ වාගේම, අපි මතක් කරන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. පසුගිය කාලසීමාව තුළ ඇති වූ තත්ත්වය තවත් පැත්තකට යොමු කරනවා නම්, අපේ රටේ විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් කථා කරනකොට, විශ්‍රාමිකයන්ටත් මේ ප්‍රමාණයටම වැටුප් වැඩි වෙනවා. මොකද, පසුගිය කාලසීමාවේ විශ්‍රාමිකයින්ට වැටුප් ගෙවීමේදී වැටුප් වැඩිවීම් විශ්‍රාම වැටුපට එල්ලා තිබුණේ. ඒ එල්ලන ලද වැටුප මූලික වැටුපට එකතු කළා. ඒ මූලික වැටුපට එල්ලන ලද වැටුප එකතු වුණාම, ලොකු විශ්‍රාම වැටුපක් ඒ විශ්‍රාම වැටුප් ලබන පුද්ගලයින්ට ලැබෙනවා. විපක්ෂයේ මහත්වරුන් රාජ්‍ය සේවකයන්ගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් කියනවා, මම අහගෙන හිටියා. 2001දී ඔබතුමන්ලා ඒ විශ්‍රාම වැටුප නවත්වන්න මහා දැවැන්ත උත්සාහයක් ගත්තා. ඔබතුමන්ලාට ඒක මතක නැහැ. ඒ වාගේම ආපහු 2016දීත් මේ විශ්‍රාම වැටුප නවත්වන්න උත්සාහ කළා. විශ්‍රාම වැටුප කප්පාදු කරන්න හදපු උදවිය දැන් උත්සාහ කරමින් ඉන්නවා, විශ්‍රාම වැටුපේ ආදීනව සම්බන්ධයෙන් මෙතැන කථා කරන්න. මම විශේෂයෙන්ම මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. එදා සමස්ත ලංකා වෘත්තීය සමිති සම්මේලනයේ හිටපු මහින්ද ජයසිංහ සහෝදරයා ඇතුළු පිරිස එකතු වෙලා තමයි මේ සම්බන්ධයෙන් නඩුවක් දාලා මේ වැඩේ අනෙක් පැත්තට හැරෙව්වේ. එදා ඒ කටයුත්ත ඒ තත්ත්වයට පත් වුණා. එම නිසා විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් අද විපක්ෂයට කථා කරන්න අවස්ථාවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම 2020 වසරේ ඉඳලා අපේ රටේ කිසිදු රාජ්‍ය ආයතනයකට සේවකයින් බඳවා ගැනීමක් සිද්ධ වෙලා නැහැ. අපේ රටේ අත්‍යවශ්‍ය සේවාවල පුරප්පාඩු අතිවිශාල ප්‍රමාණයක් තිබෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ 50,000කට වැඩි ගුරු පුරප්පාඩු සංඛ්‍යාවක් තිබෙනවා. ඒ වාගේම පොලිස් දෙපාර්තමේන්තුවට පොලිස් නිලධාරින් විශාල පිරිසක් අවශ්‍ය වෙලා තිබෙනවා. සමහර පොලිස් ස්ථානවල සිටිය යුතු පොලිස් නිලධාරින්ගේ සංඛ්‍යාවෙන් දෙකෙන් පංගුවයි ඉන්නේ. ඒ වාගේම සමහර පාසල්වල අත්‍යවශ්‍ය විෂයයන් උගන්වන්නවත් ගුරුවරුන් නැහැ. ඒ වාගේම රාජ්‍ය සේවයේ බොහෝ තැන්වල රාජ්‍ය නිලධාරින් විශාල සංඛ්‍යාවක් අඩු වෙච්ච තත්ත්වයක් තුළ තමයි මේ රජයට ඉදිරියට යන්න වෙලා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් පසුගිය කාලයේ අපේ රට පාලනය කරපු ඒ පාලක කණ්ඩායම් වග කියන්න ඕනෑ කියලා අපි විශ්වාස කරනවා. හැබැයි අපි රජයක් විධියට දැන් තීරණය කර තිබෙනවා, විශාල පිරිසක් රාජ්‍ය සේවයට එකතු කරගෙන -අපේ අමාත්‍යාංශය යටතේත් විශාල පිරිසක් රාජ්‍ය සේවයට එකතු කරගෙන- රාජ්‍ය සේවය ශක්තිමත් කරගෙන ඉදිරියට යන්න. මේ වනකොට අපට ප්‍රමාණවත් තාක්ෂණ නිලධාරින් නැහැ. ඒ වාගේම සමහර ආයතනවලට අත්‍යවශ්‍ය නිලධාරින් නැහැ. තව අවුරුදු කිහිපයක් තුළ රාජ්‍ය සේවයේ විශාල පිරිසක් විශ්‍රාම යෑමට නියමිතයි. ඒ නිසා අවුරුදු 5කට පසුව විශාල පිරිසක් රාජ්‍ය සේවයට එකතු කරන අය වැයක් බවට මේ අය වැය අපි පත් කර තිබෙනවා.

විශේෂයෙන්ම මම මතක් කරන්නට ඕනෑ, පසුගිය කාල සීමාවේදී රාජ්‍ය අංශයට වැටුප් වැඩි කිරීම් කළා වාගේම පෞද්ගලික අංශයත් ඒ හා සමගාමීව වැටුප් වැඩිවීමකට ලක්වෙලා තිබෙන බව. පෞද්ගලික අංශයේ සමහර ආයතනවල මේ වැටුප් වැඩි කිරීම රජයට සමගාමීව සිදු කරනවා. මේ තත්ත්වය තුළ රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමට සමගාමීව පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමටත් නියමිත වෙලා තිබෙනවා. ඒ වාගේම අපි විශ්වාස කරනවා, වැටුප් වැඩි කිරීමත් එක්ක තෘප්තිමත් රාජ්‍ය සේවයක් අද මේ රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා කියලා. අපේ රටේ රාජ්‍ය සේවයත්, පෞද්ගලික අංශයත් මේ තත්ත්වයට ගේන්න අපේ රජයට හරියටම වසරයි ගත වුණේ. මේ ආණ්ඩුව පත්වෙලා වසරක් ගෙවෙද්දි අපට පුළුවන් වෙලා තිබෙනවා, මේ රටේ රාජ්‍ය සේවකයාට තෘප්තිමත් වැටුපක් ලබා දෙන්න. ඒ වාගේම අලුතෙන් රාජ්‍ය සේවයට එකතු

[ගරු ධර්මප්‍රිය දිසානායක මහතා]

කර ගන්නත්, අලුත් රැකියා අවස්ථා සපයා දෙන්නත් අපේ ආණ්ඩුවට හැකි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙහෙම වෙන්න බලපෑ කාරණයක් තිබෙනවා. අපි භාර ගත්තේ ඉතාම දූෂිත, කඩා වැටුණු, ඒ වාගේම විනාශයට පත් වූ රටක්. මේ රටේ කිසිම කෙනෙක් විශ්වාස කළේ නැහැ, වසරක් තුළ මේ තත්ත්වයට අපේ රට පත් කරන්න පුළුවන් වෙයි කියලා. හැබැයි, මේ වනකොට අපි අපේ රට ඒ තත්ත්වයට පත් කර තිබෙනවා. ඒ වෙනුවෙන් අපේ රටේ රාජ්‍ය නායකයා වන ජනාධිපතිතුමාගේ සිට මේ ආණ්ඩුව විශාල කැප කිරීමක් කර තිබෙනවා.

අද විපක්ෂයේ සමහර මහත්වරුන් බොහොම තෘප්තියෙන් කථා කරනවා, "අපි හිතුවේ නැහැ, රට මේ තත්ත්වයට පත් වෙයි කියලා, රට ඉතාම දියුණු තත්ත්වයට පත් වෙලා තිබෙනවා" යනුවෙන්. ඔව්, අපි රට දියුණු තත්ත්වයකට පත් කර තිබෙනවා. තෘප්තිමත් රාජ්‍ය සේවයක්, තෘප්තිමත් පෞද්ගලික සේවයක්, ඒ වාගේම රටේ අනාගතය සම්බන්ධයෙන් හිතන්න පුළුවන්, අනාගතය සම්බන්ධයෙන් වැඩ කටයුතු කරන්න පුළුවන් රටක් අපි නිර්මාණය කරමින් තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, 2026 අය වැය එක්ක හොඳ අනාගතයක් තිබෙන රටක් නිර්මාණය වනවා කියලා. ඒ වෙනුවෙන් සහයෝගය දක්වන සියලුදෙනාටම ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. M.S. Uthumalebbe. You have eight minutes.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩි 10ක කාලයක් තිබුණා නේ. මගේ කාලය අඩු කර තිබෙන්නේ ඇයි?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය සීමා කර තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

[பி.ப. 4.35]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2026ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டத்திலே நமது நாட்டிலே முக்கியமான பல துறைகளை உள்ளடக்குகின்ற ஓர் அமைச்சான பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சினுடைய குழுநிலை விவாதத்திலே கலந்துகொள்வதிலே நான் மகிழ்ச்சியடைகின்றேன். இந்த அமைச்சு இந்த நாட்டிலே நீதியை, நியாயத்தை, நிருவாகத்தை, இனங்களுக்கிடையே ஐக்கியத்தை ஏற்படுத்துகின்ற செயற்பாடுகளுடன் மாத்திரமல்லாமல், ஒரு மனிதன் பிறந்து, அவன் திருமணம் முடித்து வாழ்ந்து, பின்னர் இறந்த பின் மரணச் சான்றிதழ் கொடுக்கின்ற வரைக்குமான செயற்பாடுகளுடன் தொடர்புடைய ஓர் அமைச்சாகவும் இருந்து கொண்டிருக்கின்றது. இந்த அமைச்சினுடைய அமைச்சர் அவர்கள் உண்மையிலே நியாயமானவர். அதேபோன்று, பிரதியமைச்சர், செயலாளர் மற்றும் இந்த அமைச்சிலே இருக்கின்ற அதிகாரிகள் எல்லோருக்கும் நான் மக்கள் சார்பிலே நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கின்றேன். ஏனென்றால், அவர்கள் இந்த நாட்டினுடைய நிருவாகத்தை நடத்துவதற்கு பாரிய பங்களிப்பைச் செய்து வருகிறார்கள். குறிப்பாக, வட, கிழக்கு மாகாணத்திலே யுத்த நிலைமை இருந்த காலத்திலும் இவ்வமைச்சைச் சார்ந்தவர்கள் பெரும் அர்ப்பணிப்போடு தங்களுடைய கடமைகளைச் செய்திருக்கின்றார்கள். அதற்காக அவர்களுக்கும் நான் நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கின்றேன்.

பொது நிருவாகத்துக்குப் பொறுப்பான இந்த அமைச்சினூடாக இன ஒற்றுமையை ஏற்படுத்தக்கூடிய சில நடவடிக்கைகளைச் செய்ய வேண்டும் என்று நான் அமைச்சினுடைய ஆலோசனைக் குழுக் கூட்டத்திலே கோரிக்கை முன்வைத்திருந்தேன். அதில் ஒன்றுதான், பிரதேச செயலகங்கள் ஊடாக இன ஐக்கியத்தை ஏற்படுத்தக்கூடிய வகையிலான நியமனங்களை இந்த அமைச்சு செய்யவேண்டுமென்பது. குறிப்பாக, கிழக்கு மாகாணத்திலே கடந்த 30 வருட காலமாக இன ஐக்கியம் இல்லாத ஒரு சூழ்நிலை நிலவியபோதும், இப்போது நல்ல சூழ்நிலை உருவாகியிருக்கின்றது. உதாரணத்துக்கு, கிழக்கு மாகாணத்திலே பெரும்பான்மையாகச் சிங்கள மக்கள் இருக்கின்ற ஒரு பிரதேச செயலகப் பிரிவிலே 2ஆவது பெரும்பான்மை இனமாக முஸ்லிம் மக்கள் இருப்பார்கள் என்றால், ஓரினத்தைச் சார்ந்தவரைப் பிரதேச செயலாளர் ஆகவும் இன்னோர் இனத்தவரை உதவிப் பிரதேச செயலாளராகவும் நியமிக்கவேண்டிய பாரிய பொறுப்பு இந்த அமைச்சுக்கு இருக்கிறது. எனவே, புதிய நியமனங்களை வழங்குகின்றபோது, குறிப்பாகக் கிழக்கு மாகாணத்திலே, அந்தப் பிரதேசத்திலுள்ள சனத்தொகையைக் கணிப்பிட்டு, நீங்கள் நியமனங்களைச் செய்கின்றபோதுதான் இன ஒற்றுமை ஏற்படும். என்னுடைய ஊரான அட்டாளைச்சேனைப் பிரதேசத்திலுள்ள பிரதேச செயலகப் பிரிவிலே தீகவாபி மற்றும் திராய்க்கேணி ஆகிய கிராமங்கள் இருக்கின்றன. என்னுடைய ஊரில் ஒரு முஸ்லிம் பிரதேச செயலாளர் இருந்தால், தீகவாபியில் 2ஆவது பெரும்பான்மை இனத்தைச் சேர்ந்த ஒரு சிங்கள மகனை நாங்கள் உதவிப் பிரதேச செயலாளராக நியமிக்கின்றபோது, இனங்களுக்கிடையே ஓர் ஐக்கியம் ஏற்படும். எனவே, அதனை இந்த அமைச்சு முன்னெடுக்கும் என்று நான் நினைக்கின்றேன்.

ஓய்வூதியதாரர்கள் தொடர்பாகச் சமீபத்தில் வெளியிடப் பட்ட சுற்றறிக்கையில் 2018.01.01, 2019.01.01 மற்றும் 2020.01.01 ஆகிய திகதிகளில் நிலுவையில் உள்ள ஓய்வூதியம் 2025ஆம் ஆண்டின் வரவு செலவுத்திட்டத்தின்படி திருத்தப்படும் என்று கூறப்பட்டுள்ளது. இது பொதுநிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் செயலாளர் திரு.எஸ். ஆலோக பண்டார அவர்களால் பொதுநிருவாக சுற்றறிக்கை எண் 15/2015 மூலம் 01.07.2025ஆம் திகதி வெளியிடப்பட்டிருக்கிறது. 2020-2024க்கு இடையில் பொதுப்பணியில் இருந்து ஓய்வுபெற்ற அதிகாரிகள் தங்களைப்பற்றி எதுவும் குறிப்பிடப்படவில்லை என்பதனால் தற்போது இந்தச் சுற்றறிக்கைக்கு எதிர்ப்பு தெரிவித்து வருகின்றனர். இந்தச் சுற்றறிக்கை, வரலாற்றில் இதுவரை இல்லாத அளவுக்குப் பெரிய அளவிலான ஓய்வூதிய முரண்பாட்டை உருவாக்கியுள்ளது எனவும் தெரிவிக்கின்றனர். சனவரி 1, 2020 முதல் டிசம்பர் 31, 2024 வரை ஓய்வு பெற்றவர்கள் வரவு செலவுத்திட்டத்திலிருந்து

விடப்பட்டுள்ளதாகவும், 2020க்கு முன் ஓய்வுபெற்றவர்களின் சம்பள இடைவெளியை நிவர்த்தி செய்ய மட்டுமே வரவு செலவுத்திட்டம் முன்மொழிகிறது எனவும் 2020-2024க்கு இடையில் பொதுப்பணியிலிருந்து ஓய்வுபெற்ற அதிகாரிகள் கூறுகின்றனர். இவர்கள் நாடு முழுவதும் உள்ள ஓய்வூதிய அமைப்புகள்மூலம் மாவட்டங்கள் தோறும் தற்போது போராட்டங்களை ஏற்பாடு செய்து வருகின்றனர். 2020-2024இற்கு இடைப்பட்ட ஆண்டுகளில் ஓய்வுபெற்ற முன்னாள் இராணுவத் தளபதிகள் உட்பட 154,000 பேர் இவ்வாறு புறக்கணிக்கப்பட்டுள்ளனர்.

இன்னுமொரு விடயத்தைக் குறிப்பிட வேண்டும். இலங்கையிலுள்ள மாகாண மற்றும் மத்திய அரச சேவையிலுள்ள அனைத்து உத்தியோகத்தர்களுக்கும் வினைத்திறமைகாண் தடைதாண்டல் பரீட்சைக்கான சந்தர்ப்பங்கள் 6 வழங்கப்பட்டுள்ளன. அவ்வாறு வழங்கப்பட்டுள்ள 6 சந்தர்ப்பங்களுக்குள் குறித்த உத்தியோகத்தர்கள் வினைத்திறமைகாண் தடைதாண்டல் பரீட்சையில் கட்டாயம் சித்தியடைய வேண்டும் என ஏற்கனவேயுள்ள சுற்றறிக்கையில் கூறப்பட்டிருக்கிறது. அரசாங்க சேவை ஆணைக்குழுவின் 1/2023 மற்றும் 1/2023(1) இலக்கச் சுற்றிக்கைகளின் பிரகாரம் 2024.06.30க்கு முன்னர் நியமனம் பெற்றவர்களுக்கு வினைத்திறமைகாண் தடைதாண்டல் பரீட்சைக்கான 3 சந்தர்ப்பங்கள் மேலதிகமாக வழங்கப்பட்டு, மொத்தமாக 9 சந்தர்ப்பங்கள் வழங்கப்படும் நடைமுறை தற்போது உள்ளது. இந்த நிலையில் வினைத்திறமைகாண் தடைதாண்டல் பரீட்சையின் 9 சந்தர்ப்பங்களையும் பூர்த்திசெய்வதற்கு முன்னர் சேவையிலிருந்து ஓய்வுபெறுபவர்களுக்கான நிவாரணங்கள் அல்லது விமோசனங்கள் சம்பந்தமான எந்தவித ஏற்பாடுகளும் அரசாங்க சேவை ஆணைக்குழுவின் 01/2023 மற்றும் 01/2023 (1) இலக்கச் சுற்றறிக்கைகளில் குறிப்பிடப்பட்டிருக்கவில்லை. இது மிகவும் கவலைக்குரிய விடயமாகக் காணப்படுவதுடன், இலங்கையின் பல பாகங்களிலுமுள்ள அனைத்து மாகாண மற்றும் மத்திய அரச சேவை உத்தியோகத்தர்களும் ஊழியர்களும் இதனால் வெகுவாகப் பாதிக்கப்பட்டுள்ளனர். எனவே, வினைத்திறன்காண் தடைதாண்டல் பரீட்சைச் சந்தர்ப்பங்களை முழுமையாகப் பயன்படுத்தாத நிலையில் சேவையிலிருந்து ஓய்வுபெறுகின்ற மாகாண மற்றும் மத்திய அரச சேவையின் உத்தியோகத்தர்களுக்கும் ஊழியர்களுக்கும் பாதிப்பு ஏற்படாத வகையில் நிவாரணம் வழங்கும்பொருட்டு அரசாங்க சேவை ஆணைக்குழுவின் 01/2023ஆம் இலக்கச் சுற்றறிக்கையில் மாற்றத்தினை ஏற்படுத்துவதன்மூலம் அதிலிருந்து விலக்களிப்பு வழங்குவதற்கான ஏற்பாடுகளை பொதுநிருவாக அமைச்சு அரசாங்க சேவை ஆணைக்குழு ஊடாக மேற்கொள்ள வேண்டும் என மத்திய, மாகாண அரச உத்தியோகத்தர்கள் சார்பில் வேண்டிக் கொள்கின்றேன்.

மாகாண சபைத் தேர்தலைப் பற்றி இங்கே குறிப்பிட்டார்கள். உண்மையில், மாகாண சபைத் தேர்தல் சம்பந்தமாக எமது கௌரவ அமைச்சர் பிமல் ரத்நாயக்க அவர்கள், "ஒரு தெரிவுக்குழுவை நியமித்து நாங்கள் தேர்தலுக்கு ஏற்பாடு செய்வோம்" என்று சொல்லியிருக்கிறார். கௌரவ பொது நிருவாக அமைச்சரின் தலையில்தான் அந்தப் பொறுப்பும் வந்து விழுந்திருக்கிறது. எனவே, விரைவாக மாகாண சபைத் தேர்தலை நடாத்துவதற்குரிய ஏற்பாடுகளைச் செய்யுங்கள்! ஏற்கனவே தெரிவுசெய்யப்பட்டிருந்த பாராளுமன்றத் தெரிவுக்குழுவின் அறிக்கையில் கூறப்பட்டிருந்த தேர்தல் முறைக்கு ஆதரவாக கௌரவ நிமல் சிறிபால த சில்வா, கௌரவ தினேஷ் குணவர்தன, கௌரவ பேராசிரியர் ஜீ.எல்.பீரிஸ், கௌரவ பவித்ராதேவி வன்னியாரச்சி, கௌரவ டக்ளஸ் தேவானந்தா, கௌரவ எம்.யூ.எம். அலி சப்ரி, கௌரவ மதுர விதானகே, கௌரவ சாகர காரியவசம் ஆகிய 8 பேர் ஒப்பமிட்டிருந்தார்கள். ஆனால், தற்போதைய சனாதிபதி கௌரவ அநுர குமார திஸாநாயக்க உட்பட அந்தத் தெரிவுக்குழுவில் இருந்த ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் கட்சியின் தலைவர் சகோதரர் கௌரவ ரஊப் ஹகீம், கௌரவ ஜீவன் தொண்டமான், கௌரவ கபீர் ஹாஷீம், கௌரவ ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார, கௌரவ மனோ கணேசன், கௌரவ எம்.ஏ. சுமந்திரன், கௌரவ விமல் வீரவன்ச, கௌரவ பஷில் ராஜபக்ஷ ஆகியோர் அதில் கையொப்பமிடவில்லை. குறிப்பாக, இன்றைய ஜனாதிபதி கௌரவ அநுர குமார திஸாநாயக்க அவர்களும் அந்தத் தேர்தல் முறைக்கு ஆதரவாக ஒப்பமிடாமல் எதிர்ப்புத் தெரிவித்திருந்தார். எனவே, நீங்கள் மாகாண சபைத் தேர்தலை நடத்துவதற்குரிய ஏற்பாட்டைச் செய்ய வேண்டும்.

இன்று காலையிலே கல்முனை பிரதேச சபை சம்பந்தமாக எங்களுடைய அன்புக்குரிய சகோதரர், பாராளுமன்ற உறுப்பினர் பேசினார். தமிழ், முஸ்லிம், சிங்கள மக்கள் மத்தியில் கடந்த 30 வருட காலமாக இனப் பிரச்சினைகள், யுத்தம் நடந்த பிரதேசங்களில் காணிப் பிரச்சினைகள், எல்லைப் பிரச்சினைகள், பிரதேச செயலகங்கள் என நிறையப் பிரச்சினைகள் இருக்கின்றன என்பதை நாங்கள் ஆரம்பத்திலிருந்து சொல்லிக் கொண்டிருக்கின்றோம். இந்தப் பிரச்சினைகளை இப்போது நாம் படிப்படியாகப் பேச்சுவார்த்தைகளின்மூலம் நல்லமுறையில் தீர்த்துக்கொண்டு வருகின்றோம். நாங்கள் அரசியலுக்காக ஒருபோதும் இனவாதம் பேசமாட்டோம் என்பதை இங்கேயுள்ள தமிழ் கட்சிகளின் தலைவர்களுக்கு நாங்கள் சொல்லி யிருக்கின்றோம். எல்லா இனங்களும் சந்தோஷமாக வாழ வேண்டும்; அவர்களின் உரிமைகள் வழங்கப்பட வேண்டும்; அவர்களை மதிக்க வேண்டும். இதனைத் தமிழ்த் தலைவர்களும் முஸ்லிம் தலைவர்களும் ஏற்றுக்கொண்டு ஓர் உடன்பாட்டுக்கு வரும்வரையில் பொறுத்திருக்குமாறு பொது நிர்வாக அமைச்சிடம் நாங்கள் சொல்லியிருக்கின்றோம். எனவே, தேர்தலுக்காக மக்களைச் சூடேற்றி, இனவாதத்துக்கு இடமளிக்கும்வகையில் தயவுசெய்து பேச வேண்டாம் என்று எமது பாராளுமன்ற உறுப்பிர்களிடம் நான் இந்த நாட்டுக்காகக் கேட்டுக் கொள்கின்றேன். ஏனென்றால், நாங்கள் நிறையப் பிரச்சினைகளுக்குத் தீர்வுகாண வேண்டும். மாகாண சபை electionஐ நடத்த வேண்டும்; இனப்பிரச்சினைக்குத் தீர்வு காண வேண்டும். இவ்வாறு இந்த நாட்டில் நிறையப் பிரச்சினைகளைத் தீர்க்க வேண்டியிருப்பதனால், எங்களுக்குள் நாங்கள் முரண்படத் தேவையில்லை. ஏதாவது பிரச்சினை என்றால், பேசுவோம்! உதாரணத்துக்கு, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே,

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ஒரு நிமிடம் எனக்குத் தாருங்கள்!

මම කියන්නම්, අම්පාර දිස්ත්‍රික්කයේත් අවුරුදු 15කට පසුව ගැටලු විසඳා ගත් ඉඩමක් ගැන. නාවලඩිවට්ටෙයි කියන මුස්ලිම්

[ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා]

අයගේ ඉඩමක් අත්හැරලා ආවා. එතැන හිටපු දමිළ කට්ටිය ඒක අල්ලා ගත්තා. අපි අවුරුදු 15කට පස්සේ දිසාපතිතුමාගේ නායකත්වයෙන් ගිහිල්ලා, ඒ සඳහා විසඳුම ලබා දුන්නා. ඒගොල්ලන්ටත් භාගයක් දීලා, මුස්ලිම් කට්ටියටත් භාගයක් දීලා කථා කරලා සුහදව ඒ ප්‍රශ්නයට විසඳුම ලබා ගත්තා. ඒ වාගේ තමයි අපි මේ රටේ ඉන්න ඕනෑ කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.44]

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ අංක තුනක් සඳහා රුපියල් මිලියන 6,400ක මුදල් ප්‍රතිපාදන 2026 වසරට වෙන් කිරීම සම්බන්ධයෙන් අද දවසේ විවාද කරමින් ඉන්නවා. විශේෂයෙන්ම අපේ රටේ වැඩ කරන ජනතාවගේ මූලික ආයතනය බවට පත් වෙච්ච, මූලික අමාත්‍යාංශය බවට පත් වෙච්ච කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් පිළිබඳව අවධානය යොමු කරන්න මම බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම කම්කරු අමාත්‍යාංශයට මේ රුපියල් මිලියන 6,400ක මුදල් ප්‍රතිපාදනය වෙන් වෙන්නේ අමාත්‍යාංශය සතු ධාරාවන් 6කට. විශේෂයෙන්ම ඒ ධාරාවන් 6 තමයි, කම්කරු හා කම්කරු සුබසාධනය, මිනිස්බල සහ රැකීරක්ෂා සංවර්ධනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය සහ ශ්‍රම වාසනා අරමුදල. එම අංශ 6 යටතේ මේ රුපියල් මිලියන 6,400ක ප්‍රතිපාදනය ලබන වසර වෙනුවෙන් වෙන් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රතිපාදන ලබන වසරට වෙන් වෙනකොට කම්කරු අමාත්‍යාංශය ලබන වසරට සැලසුම් කරලා තිබෙන පුනරාවර්තන වියදම්වලට අමතරව අවධානය යොමු කළ යුතු විශේෂ කාරණා කිහිපයක් පිළිබඳව මම මේ මොහොතේදී අවධානය යොමු කරන්න බලාපොරොත්තු වෙනවා. අමාත්‍යාංශය සතුව තිබෙන සංවර්ධන වැඩසටහන් එක්ක ගත්තොත්, ලබන වසරේ විශේෂයෙන් කම්කරු සබඳතා සහ කම්කරු නීති ක්‍රියාවේ යෙදවීම සඳහා රුපියල් මිලියන 182ක් වෙන් කරලා තිබෙනවා. අමාත්‍යාංශය සතු ප්‍රධාන කාර්යභාරය, ප්‍රධාන වගකීම තමයි, අපේ රටේ කම්කරු සබඳතා වඩා ශක්තිමත් කිරීම. ඒ වාගේම රටේ වැඩ කරන ජනතාවට කම්කරු නීතිය බලාත්මක කිරීම. ඒ සඳහා අවශ්‍ය කරන මහ පෙන්වීම සඳහා මැදිහත්වීමට සැලකිය යුතු මුදල් ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම අනික් පැත්තෙන් මේ රටේ වැඩ කරන ජනතාව අතර ලක්ෂ 45කට ආසන්න පෞද්ගලික අංශය නියෝජනය කරන සේවකයා වෙනුවෙන්, කම්කරුවන්ගේ ආරක්ෂාව, සෞඛ්‍ය හා සුබසාධනය වෙනුවෙන් මෙවර අය වැය ලේඛනය තුළින් රුපියල් මිලියන 197ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම සේවක අර්ථසාධක අරමුදල කම්කරු අමාත්‍යාංශය සතු, කම්කරු දෙපාර්තමේන්තුව සතු, රටේ වැඩ කරන ජනතාව සතු දකුණු ආසියාවේ විශාලම අරමුදලයි. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සහ සේවක අර්ථසාධක අරමුදල සේවකයන් සතුයි; මේ රටේ වැඩ කරන ජනතාව සතුයි. නමුත් මීට කලින් ඉතිහාසය තුළ අපි දැක්කා, දේශපාලන අධිකාරිය මැදිහත් වෙලා සේවකයන් සතු ඒ සේවක අර්ථසාධක අරමුදල කොල්ල කනවා, ඒවා කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරනවා. මට මතකයි, එක අවස්ථාවක එක්තරා ආණ්ඩුවක් සේවකයන්ගේ සේවක අර්ථසාධක අරමුදලේ සල්ලි ලුණු සංස්ථාව මිලදී ගන්න යොදවපු ආකාරය. එහෙම ගත්ත ලුණු සංස්ථාවේ කොටස් ටික කොටස් වෙළෙඳ පොළට දැම්මා. අන්තිමට ලුණු සංස්ථාවත් නැහැ, සේවකයන්ගේ අර්ථසාධක අරමුදලත් නැහැ. එහෙම තත්ත්වයක් තමයි තිබුණේ. සේවකයන්ට මේ සේවක අර්ථ සාධක අරමුදලේ අයිතිය, හිමිකම ගන්න දැනට බාධා ප්‍රමාණයක් තිබෙනවා. එය මහ බැංකුව විසින් සහ කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් පරිපාලනය සහ නියාමනය කරනු ලබනවා. දත්ත පද්ධති දෙකක් හරහා තමයි සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ගන්න හැකියාව ලැබෙන්නේ. හැබැයි, ඒ දත්ත පද්ධති දෙක, එකක් බවට පත් කිරීම හරහා මේ රටේ වැඩ කරන ජනතාවට සේවක අර්ථසාධක අරමුදල ලබා ගැනීමේ පහසුකම, ඒ අවස්ථාව, ඉඩකඩ විවර වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය මූලාසනයේ ඉන්නා වෙලාවේ මතක් කළ යුතු කාරණයක් තිබෙනවා. ඔබතුමියගේ පැත්තෙන් මතු වෙච්ච කාරණයක් සම්බන්ධයෙන් මේ අවස්ථාවේ පැහැදිලි කිරීමක් කරන්න වෙනවා. ඔබතුමිය මූලාසනයේ තබාගෙන මේ පැහැදිලි කිරීම කරන එක සුදුසු යැයි මම විශ්වාස කරනවා. ඒ වෙන කිසිවක් නොවෙයි, ඔබතුමියගේ පැත්තෙන් ඔබතුමිය මතු කළා, මීට කලින් මේ රටේ පාඩු ලබන රාජ්‍ය ආයතනවල සේවකයන්ට අර්ථසාධක අරමුදල ගෙවා නැහැ, මේ රටේ පාඩු ලබන පිහන් සංස්ථාවේ සේවකයන්ට අර්ථසාධකය දීලා නැහැ, මේ රටේ පාඩු ලබන වැවිලි සමාගම්වල සේවකයන්ගේ අර්ථසාධකය ගෙවා නැහැ, ඒවා ගෙවන්න කෙනෙක් නැහැ, ඒවා ගෙවන්නේ කවුද කියලා. නමුත් සිහි බුද්ධියක් සහිතව හොඳ කල්පනාවෙන් අය වැය ලේඛනය කියෙව්වා නම්, අය වැය කථාව ඇහුවා නම්, ඊට පිළිතුර සොයා ගන්න තිබුණා.

අපේ රටේ මීට කලින් පැවැති ආණ්ඩු කරපු එකම දේ තමයි සේවකයන්ගේ අයිතිවාසිකම් සියල්ල පසෙක තබා පාඩු ලබන රාජ්‍ය ආයතන සියල්ල අය වැය ලේඛනය තුළ ඇවර කරලා, ඇවර කරලා, වෙන්දේසි කරලා විකුණා දැමීම. එවැනි අත්දැකීමක් තමයි අපට තිබුණේ. නමුත් එවැනි ආයතන එසේ විකුණා දැමීම වෙනුවට මෙවර අය වැය ලේඛනය තුළින් ගෙන තිබෙන පියවර මොකක්ද? ලංකා පිහන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, ජනවසම, සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව, ලංකා ධීවර සංස්ථාව, සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව, නෝර්ත් සී සමාගම සහ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය කියන පාඩු ලබන රාජ්‍ය ආයතන 10ක වැඩ කරන ජනතාවට අවුරුදු 10ක් තිස්සේ EPF ගෙවා නැහැ, ETF ගෙවා නැහැ, පාරිතෝෂිකය ගෙවා නැහැ. මීට කලින් පැවැති ආණ්ඩු කාලවලත්, අවුරුදු 10ක පමණ ඔබතුමියලාගේ පාලනයක් තිබුණා; ඒ කාලය තුළත් EPF ගෙවා නැහැ, ETFගෙවා නැහැ. නමුත් මෙම අය වැය ලේඛනය ඉදිරිපත් කරද්දී, ගරු ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව කිව්වා, ඒ පාඩු ලබන රාජ්‍ය ආයතනවල සේවකයන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් EPF එක වෙනුවෙන්, ETF එක වෙනුවෙන් ඒ වාගේම පාරිතෝෂික අරමුදල වෙනුවෙන් රුපියල් මිලියන 5,000ක් මෙම අය වැයෙන් වෙන් කරනවා කියලා. ඔබතුමියලාගේ ආණ්ඩුවක් තිබුණා නම්, මේවා ඇවර කරලා, විකුණලා, ඒ සේවකයන්ට මහ පාරට වැටෙන්න සිද්ධ වෙනවා.

අවසාන වශයෙන් මම බලාපොරොත්තු වෙනවා, අපේ රටේ මිලියන 2.8කට ආසන්න සේවක අර්ථසාධක අරමුදලේ හිමිකම තිබෙන සේවකයන්ට මුහුණ පාන්න සිද්ධ වෙන යම් කාරණයක් පිළිබඳව අවධාරණය කරන්න. ඒ තමයි, මෙතෙක් කාලයක් අපේ රටේ -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න. කාලය අවසානයි.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. 2002-2003 වසරවල සිට ඇතැම් ආයතන විසින් සේවක අර්ථසාධක අරමුදලේ හිඟ මුදල් ගෙවා නැහැ. ඒ හිඟ මුදල් නොගෙවා තිබෙන තත්ත්වයක් තුළ හිඟ මුදල් අය කර ගැනීමට අධිභාර පනවන්න සූදානම් කර තිබෙනවා. එම අධිභාර අය කරගන්න අවශ්‍ය කටයුතු කළ යුතු වෙනවා. ඒක සේවකයන්ගේ අයිතියක්. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කර එම කටයුත්තට මැදිහත් වෙන්න කියන ඉල්ලීම කරමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.53]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் நடைபெறுகின்ற பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் நிதி ஒதுக்கீடு மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மிகவும் சந்தோஷம் அடைகின்றேன்.

இந்த அமைச்சைத் தலைமைதாங்கி நடத்துகின்ற கௌரவ அமைச்சர் (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன அவர்களுக்கும் இதன் பிரதி அமைச்சரான கௌரவ பீ. ருவன் செனரத் அவர்களுக்கும் அமைச்சின் செயலாளர் உட்பட உத்தியோகத்தர்களுக்கும் கிழக்கு மாகாண ஆளுநர் (பேராசிரியர்) ஜயந்த லால் ரத்னசேகர உட்பட பிரதம செயலாளர் அவர்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். உண்மையிலேயே கௌரவ அமைச்சர் அவர்கள் இந்த அமைச்சை நீதியான முறையிலும் நேர்மையான முறையிலும் நடத்திச் செல்கின்ற ஒருவர். அதுமாத்திரமன்றி, இன வேறுபாடுகளுக்கு அப்பால் இந்த நாட்டில் இருக்கின்ற பிரச்சினைகளைத் தீர்த்துவைக்க வேண்டும் என்பதற்காகப் பணியாற்றி வருகின்ற ஒருவரும்கூட. அதற்காக அவருக்கு எனது பாராட்டுக்களையும் நன்றிகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மட்டக்களப்பு மாவட்டத்தில் பல்வேறு பிரச்சினைகள் இருக்கின்றன. அவை நீண்ட கால யுத்தம் காரணமாக ஏற்பட்ட பிரச்சினைகளாகும். குறிப்பாக, சில உள்ளூராட்சிச் சபைகளுடைய எல்லைகளில் பிரச்சினைகள் இருக்கின்றன. ஓர் உள்ளூராட்சிச் சபை இன்னுமோர் உள்ளூராட்சிச் சபையின் நிலத்தை ஆட்சி செய்கின்றது. இன்னுமோர் உள்ளூராட்சிச் சபை பலவந்தமாகச் சில சபைகளின் நிலங்களைப் பிடித்து ஆட்சி செய்கின்றது. இதற்குக் காரணம் சரியான முறையில் அவற்றின் எல்லைகள் காட்டப்படாமல் இருப்பதுதான். யுத்த காலத்தில் இவற்றின் எல்லைகளை அடையாளப்படுத்த முடியவில்லை. எனவே, மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற எல்லைப் பிரச்சினைகளை குறிப்பாக, மட்டக்களப்பு மாநகர சபைக்கும் காத்தான்குடி நகர சபைக்கும் இடையில் இருக்கின்ற எல்லைப் பிரச்சினைகளையும், காத்தான்குடி நகர சபைக்கும் மண்முனைப்பற்று பிரதேச சபைக்கும் இடையில் இருக்கின்ற எல்லைப் பிரச்சினைகளையும் - boundary issuesஐ - settle பண்ணுவதற்காக கௌரவ அமைச்சர் அவர்கள் separate Committee ஒன்றை உடனடியாக நியமித்து, அவற்றின் எல்லைகளை அடையாளப்படுத்திக் கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று, இன்னுமொரு பிரச்சினையும் இருக்கின்றது. அதாவது, சுமார் 25 ஆண்டுகளுக்கு முன்பு Cabinetஇன் அனுமதியுடன் உருவாக்கப்பட்ட கோரளைப்பற்று மத்தி பிரதேச செயலகமும் கோரளைப்பற்று தெற்கு - கிரான் - பிரதேச செயலகமும் இன்னும் வர்த்தமானி மூலம் பிரகடனம் செய்யப்படாமல் இயங்கிக்கொண்டு இருக்கின்றன. இதனால் அந்தப் பிரதேசத்தில் வாழுகின்ற மக்கள் கடும் கஷ்டங்களை எதிர்நோக்குகின்றார்கள். அந்த மக்கள் சேவைகளைப் பெறுவதற்காக வாழைச்சேனை பிரதேச செயலகத்துக்குப் போனால் கிரான் பிரதேச செயலகத்துக்குப் போகுமாறு சொல்கிறார்கள். அவர்கள் கிரான் பிரதேச செயலகத்துக்குப் போனால் வாழைச்சேனைப் பிரதேச செயலகத்துக்குப் போகுமாறு சொல்கின்றார்கள். இவ்வாறு அந்த மக்கள் 25 வருடங்களாக மிகவும் கஷ்டப்படுகின்றார்கள். நான் இந்த விடயம் தொடர்பில் இங்கு Adjournment Motion ஒன்றைக் கொண்டுவந்தபோது, இதற்கென Committee ஒன்றை நியமித்து, உடனடியாக இந்தப் பிரச்சினைக்கு இன முரண்பாடு இன்றி எல்லோருடைய ஆலோசனைகளையும் பெற்று தீர்வு காணுவதாக கௌரவ அமைச்சர் அவர்கள் சொன்னார். எனினும், இதுவரை அந்த Committee நியமிக்கப்பட்டதாக நான் அறியவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய அமைச்சின் அதிகாரிகளைக் கொண்டு உடனடியாக அந்த Committeeஐ நியமித்து, 25 வருடங்களாக இயங்கிக்கொண்டு இருக்கின்ற அந்த இரண்டு பிரதேச செயலகங்களுடைய எல்லைகளை அடையாளப் படுத்தி, அதை Gazette பண்ணுவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். அத்துடன், அந்த இரண்டு பிரதேச செயலகங்களுக்கும் இரண்டு பிரதேச சபைகளையும் நீங்கள் உருவாக்கிக் கொடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, வெளிநாட்டுப் பிரஜைகளாக இருக்கும் இலங்கை முஸ்லிம்கள், இலங்கையில் இருக்கும் முஸ்லிம்களைத் திருமணம் செய்வதில் பாரிய பிரச்சினை இருக்கின்றது. அவ்வாறான திருமணங்களை முஸ்லிம் விவாக, விவாகரத்துச் சட்டத்தின்கீழ் பதிவு செய்யக்கூடாதென அனைத்து முஸ்லிம் விவாகப் பதிவாளர்களுக்கும் பதிவாளர் நாயகத்தால் கடிதமொன்று

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

அனுப்பப்பட்டு இருக்கின்றது. உண்மையிலேயே இது அவருடைய பிரச்சினையல்ல! முஸ்லிம் விவாக, விவாகரத்துச் சட்டத்தின் 2ஆம் சரத்தில் இருக்கின்ற சட்ட ரீதியான சிக்கல் காரணமாகவே மேற்குறித்த திருமணங்களை இச்சட்டத்தின்கீழ் பதிவுசெய்ய வேண்டாமென பதிவாளர் நாயகம் கூறியிருக்கிறார். அதன்படி, முஸ்லிம் விவாகப் பதிவாளர்கள் அத்தகைய திருமணங்களைப் பதிவு செய்வதைத் தவிர்த்து வருகின்றனர். இதனால் இவ்வகையான திருமணத்தை பொது திருமணச் சட்டத்தின்கீழ் பதிவுசெய்ய வேண்டிய தேவை இருக்கின்றது.

வெளிநாட்டுப் பிரஜை ஒருவர் இலங்கையிலுள்ள சட்டத்தின் பிரகாரம் விவாகம் செய்ய வேண்டுமென்றால், பதிவாளர் நாயகத்தினூடாக பாதுகாப்பு அனுமதி அறிக்கையைப் பெற வேண்டும். பதிவாளர் நாயகத் திணைக்களமானது, முன்னர் இந்தப் பாதுகாப்பு அனுமதி அறிக்கையை முஸ்லிம்களுக்கு எந்தவித நிபந்தனையும் இல்லாமல் வழங்கி வந்தது. தற்போது அந்த அறிக்கையை வழங்குவதாக இருந்தால், குறித்த நபர் தான் முஸ்லிம் இல்லையென affidavit ஒன்றை வழங்க வேண்டுமெனச் சொல்கிறார்கள். உதாரணத்துக்கு, American citizen உள்ள இலங்கையைச் சேர்ந்த முஸ்லிம் ஒருவர், "I hereby declare that I do not practise, adhere to or belong to any particular religion. I consider myself to be non-religious.'' என்று affidavitஐ கொடுத்தால் மட்டும்தான் அவருக்கு பதிவாளர் நாயகம் பாதுகாப்பு அனுமதி அறிக்கையைக் கொடுப்பார். அதன்பிறகுதான் அவர் அந்தத் திருமணத்தைச் செய்யக்கூடியதாக இருக்கும்.

வாழ்க்கையில் மிக முக்கிய தருணமான திருமணத்தை அவர் தான் பின்பற்றுகின்ற மதத்தின்படி பதிவுசெய்ய முடியாமல், தான் எந்த மதத்தையும் பின்பற்றவில்லை என்று பொய்கூறி, தனது மனச்சாட்சிக்கு விரோதமாகக் கரம்பிடிக்க வேண்டிய துரதிருஷ்டமான ஒரு நிலையே காணப்படுகின்றது. எனவே, முஸ்லிம் விவாக, விவாகரத்துச் சட்டத்தின் 2வது பிரிவு திருத்தப்பட வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அதற்குரிய நடவடிக்கைகளை உடனடியாக மேற்கொள்ள வேண்டும். இந்தச் சட்டத் திருத்தம் செய்யப்படும் வரை, வெளிநாட்டுப் பிரஜையாக இருக்கின்ற இலங்கை முஸ்லிம்கள் இலங்கையிலுள்ள முஸ்லிம்களைத் திருமணம் செய்தவதற்கு கடந்த காலங்களில் பதிவாளர் நாயகம் எவ்வாறு அனுமதி வழங்கினாரோ, அந்த அடிப்படையில் அனுமதி வழங்குவதற்கு நீங்கள் ஆவன செய்ய வேண்டும்.

குறிப்பாக, RG/MBD/1/2012 என்ற சுற்றுநிருபத்தை தற்காலிகமாக நிறுத்தி, அவர்கள் எந்தவித நிபந்தனையும் இல்லாமல் - affidavit வழங்காமல் - இலங்கையில் திருமணம் செய்வதற்கு அனுமதி வழங்க வேண்டும். அது தொடர்பில் உரிய நடவடிக்கை எடுப்பதற்காக இது தொடர்பான சகல ஆவணங்களையும் நான் உங்களுக்கு வழங்குகின்றேன். இது எமது மார்க்கம் சார்ந்த மிக முக்கியமானதொரு பிரச்சினை! இஸ்லாமிய மார்க்கத்தில் ஒருவர் நிக்காஹ் செய்வதாக இருந்தால், அவர் மஹர் கொடுக்க வேண்டும். "வலி" ஒருவர் இருந்து அதனைச் செய்து முடிக்க வேண்டும். இதுதான் இஸ்லாமிய சட்டம்! இந்த இரண்டுமே பொதுத் திருமணச் சட்டத்தில் இல்லை. இதனால் அவர் மார்க்கத்தின் 2 கட்டளைகளையும் நிறைவேற்ற முடியாத நிலையில் இருக்கிறார். எனவே, இது தொடர்பில் கௌரவ அமைச்சர் அவர்கள் உரிய நடவடிக்கைகளை உடனடியாக மேற்கொள்ள வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

மேலும், முகாமைத்துவ சேவை உத்தியோகத்தர்கள் - Management Service Officers - தங்களுடைய பணிகளை மிகத் திறமையாகச் செய்துகொண்டு இருக்கின்றார்கள். இவர்கள் நாடு முழுவதும் நிருவாகத்தில் மிக முக்கிய பங்காற்றுகின்ற ஒரு தரப்பினர். தேர்தல் காலங்களில்கூட அதிகமான பணிகளைச் செய்கின்றவர்கள். "எம்மை மாற்றாந்தாய் மனப்பான்மையுடன் நோக்கும் நிலைமை ஏற்பட்டுள்ளது; ஏனைய சேவைகள் அனைத்துக்கும் சம்பள நிர்ணய சபையால் ஊதிய உயர்வுகளும் பதவி உயர்வுகளும் வழங்கப்பட்டபோதும், நாங்கள் இன்னும் MN 2 சம்பள நிலையிலேயே இருக்கின்றோம்; எம்மை MN 3 சம்பள நிலைக்கு உயர்த்துவதற்கான சட்ட ரீதியான விடயங்கள் தீர்மானிக்கப்பட்டு இருந்தபோதும், அரச சேவைகள் ஆணைக்குழு அதனைத் தடுத்து வைத்திருப்பது துரதிருஷ்டமாகும். நாங்கள் போட்டிப் பரீட்சைகள் மூலம் சேவைக்கு வந்தவர்கள். பல வருட காலமாக குறித்த சேவைத் தரத்துக்கு வந்திருந்தாலும் பட்டங்களைப் பெற்றிருந்தாலும் எங்களுக்கு இழைக்கப்பட்டுள்ள அநீதிகளால் MN 3 என்ற இடத்தை அடைய முடியாமல் இருக்கின்றோம்" என்று அவர்கள் புலம்புகின்றார்கள். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் கவனம் செலுத்தி, இவர்களுக்கான தீர்வைப் - solutionஐப் - பெற்றுக்கொடுக்க வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

மாகாண சபைத் தேர்தல் நடத்தப்படாமல் இருக்கின்றது. கடந்த ஆட்சிக் காலத்தில் உள்ளூராட்சி மன்றத் தேர்தலுக்கு "no money" என்று சொன்னார்கள். ஆனால், மாண்புமிகு சனாதிபதி அவர்கள் மாகாண சபைத் தேர்தலுக்கு நிதி ஒதுக்கீடு செய்திருக்கிறார். முடியுமான அளவு விரைவாக அந்தத் தேர்தலை நடாத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, நீங்களும் உள்ளூராட்சிச் சபைகள் பற்றி பதிலளித்து இருந்தீர்கள். உள்ளூராட்சிச் சபைகள் தமது ஊழியர்களுக்கான சம்பளத்தைக் கொடுப்பதில் மிகவும் கஷ்டப்படுகின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. Member, your time is up.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

Please give me one more minute, Madam. I will wind up.

பெரும்பாலான உள்ளூராட்சிச் சபைகள் தமது ஊழியர்களின் சம்பளத்தைக்கூட வழங்க முடியாத நிலையில் இருக்கின்றன. இன்று கிழக்கு மாகாணத்தில் இருக்கின்ற பல உள்ளூராட்சிச் சபைகள் தமது Budgetஐக்கூட தயாரிக்க முடியாமல் இருக்கின்றன. அவற்றின் வருமானம் முழுவதும் ஊழியர்களின் சம்பளத்துக்குப் போகின்றது. எதிர்வரும் ஆண்டில் உள்ளூராட்சிச் சபைகள்தான் ஊழியர்களின் சம்பளத்தில் 40 சதவீதத்தைச் செலுத்த வேண்டும். கிழக்கு மாகாணத்திலுள்ள சில உள்ளூராட்சிச் சபைகளுக்கு எந்தவித வருமானமும் இல்லை. அதற்கான மாற்றீடு ஏதும் இருப்பதாக இதுவரை எங்களுக்குத் தெரியவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் உரிய நடவடிக்கை

எடுக்க வேண்டும். இப்பொழுது உள்ளூராட்சிச் சபைகளுக்கு இடமாற்றம் செய்யப்படுகின்ற உத்தியோகத்தர்கள் அங்கு வருகிறார்கள் இல்லை. ஏனெனில், அங்கு சம்பளம் கொடுக்கப்பட மாட்டாது என்று அவர்கள் பயப்படுகிறார்கள். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் இது தொடர்பில் கவனம் செலுத்தி, இவர்களுக்கு ஏதோவோர் அடிப்படையில் சம்பளம் வழங்கப்படுவதற்கான நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) ROHINI KUMARI WIJERATHNA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 5.04]

**ගරු සංජීව රණසිංහ මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ)
(The Hon. Sanjeewa Ranasingha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විවිධ ක්ෂේත්‍ර ආවරණය කරමින් මේ රටේ ජනතාවගේ අභිලාෂයන් ඉටු කරන "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යන රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අප විසින් ඉදිරිපත් කරන ලද ලංකා ඉතිහාසයේ සුවිශේෂී දෙවන අය වැය යටතේ පැවැත්වෙන, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේත්, කම්කරු අමාත්‍යාංශයේත් වැය ශීර්ෂ පිළිබඳ කාරක සභා අවස්ථාවේ විවාදයට එක් වන්නේ ගොඩක් සතුටින්. ඒකට හේතුව, අපේ රටේ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න, මේ රටේ මිනිසුන්ගේ ජීවිතවලට උපතේ සිට මරණය දක්වා වග කියන්න, ඒ සියලු සුබසාධන කාර්යයන් ඉටු කරන්න විතරක් නොවෙයි, මේ රටේ සුවහසක් කම්කරුවන්ගේ අපේක්ෂා, අරමුණු, මුදුන්පත් කරවා ගන්න හේතු වන ප්‍රබල යෝජනා කිහිපයක් පිළිබඳව අප විසින් මෙහිදී විවාද කරනු ලැබීමයි.

පසුගිය වසර ගණනාවක් තිස්සේ අපේ රටේ සංවර්ධනය පිළිබඳව ජනතාවට තිබුණේ සිහිනයක් විතරයි. ඒ කාලයේ මේ රටේ ජනතාව තුළ "සංවර්ධනය" කියන එක මිහිරි වචනයක් බවට පත් වෙලා තිබුණේ නැහැ. මේ රටේ තිබුණු විවිධ ව්‍යාපෘති වෙන්න පුළුවන්, මාර්ග සැලසුම් වෙන්න පුළුවන්, පළාත් පාලන ආයතනවල අභ්‍යන්තරික සහ බාහිර ක්‍රියාවලි වෙන්න පුළුවන්, රාජ්‍ය ක්‍රියාවලිය වෙන්න පුළුවන්, ඒවා සම්බන්ධයෙන් මේ රටේ ජනතාවට තිබුණේ අඳුරු චිත්‍රයක්. ඒ තුළ අල්ලස, දූෂණය, වංචාව ඉහ වහා ගිහිල්ලායි තිබුණේ. ඒවා තුළ කාර්යක්ෂමතාව පිළිබඳ ප්‍රශ්න නිර්මාණය වෙලා තිබුණා; අකාර්යක්ෂම පාලනයක් නිර්මාණය වෙලා තිබුණා. හැබැයි, ලංකා ඉතිහාසයේ වසර ගණනාවකට පසුව නැවත වතාවක් අපට දකින්න පුළුවන්, සංවර්ධනයේ මායිම් මේ රටේ ජනතාවට ස්පර්ශ කරන්න අවස්ථාවක් ලැබී තිබෙන ආකාරය; අහිංසක ගම් වැසියන්ගේ සිහින සැබෑ වන අවස්ථාවක් නිර්මාණය වෙලා තිබෙන ආකාරය. ගම්වල මං මාවත් නැවත සංවර්ධනය වෙමින්, ඉදි වෙමින් තිබෙනවා. වසර ගණන් එළි පෙහෙළි නොවුණු ගංගා එළි පෙහෙළි වෙමින් තිබෙනවා. වසර ගණනාවක් නිවාස සිහිනවල හිටපු මේ රටේ මිනිසුන්ට නිවාස ඉදි වෙමින් තිබෙනවා. මේ රටේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව රාජ්‍ය නිලධාරින් ඒ සඳහා ඉතා කාර්යක්ෂමව වැඩ කරමින් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් අපි අපේ ගෞරවය, ආචාරය ඒ ආදරණීය රාජ්‍ය නිලධාරින් වෙනුවෙන් පුද කරන්න ඕනෑ. මොකද, ඒක විශාල අභියෝගයක්. වසර මැද ආරම්භ කළ සමහර සංවර්ධන යෝජනා අවසන් ඉම දක්වා ගෙන යන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

අපි දැක්කා, විපක්ෂය පැත්තෙන් විවිධ අවස්ථාවල චෝදනාවක් එල්ල කරන්න උත්සාහ කළා, ආණ්ඩුව මුදල් වෙන් කළාට ඒ වැඩ වෙන්නේ නැහැ කියලා. හැබැයි, මම උදාහරණයක් කියන්නම්. කළුතර දිස්ත්‍රික්කයේ, මතුගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, ඒ සම්බන්ධීකරණ කමිටුව මෙහෙයවන්නේ මමයි. හැම මොහොතකම ඒ ආයතන සම්බන්ධ කරගෙන, ඒ සංවර්ධනයේ ප්‍රගතිය ප්‍රතිශත අගයන් වශයෙන් අපි ගන්නවා. විමධ්‍යගත අරමුදල් ඔස්සේ ව්‍යාපෘති 7ක් සඳහා රුපියල් මිලියන 8.5ක් වෙන් වෙලා තිබෙනවා; ප්‍රගතිය සියයට 100යි. පළාත් සංවර්ධන ප්‍රදාන, ව්‍යාපෘති 21යි; 21ම අවසන් කරලා තිබෙනවා. මුදල රුපියල් මිලියන 33.5යි. උපමාන පාදක ව්‍යාපෘති 7යි; 7ම අවසන් කරලා තිබෙනවා. රුපියල් මිලියන 3.5යි. රේඛීය අමාත්‍යාංශය හරහා කෙරෙන ග්‍රාමීය සංවර්ධන, මාර්ග සංවර්ධන ව්‍යාපෘති 4යි; එකක් අවසන් කරලා තිබෙනවා. මේ වසර අවසන් වෙන්න කලින් ඉතිරි ව්‍යාපෘති 3ත් අවසන් කරන්න අපි කටයුතු කරනවා. එහෙම බලන කොට අපි සියයට 81.2ක ප්‍රගතියක් අත් කරගෙන තිබෙනවා. අපි ඒ සංවර්ධනය ළඟා කරගෙන තිබෙනවා. ඒ වාගේම රුපියල් මිලියන 20කට ආසන්න නිවාස ව්‍යාපෘතිවලට අදාළව සියයට 100ක ප්‍රගතියක් අත් පත් කරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් වෙහෙස වුණු, ඒ වෙනුවෙන් කැප වුණු රාජ්‍ය නිලධාරින්ට අපි අපේ ආචාරය, ගෞරවය මේ අවස්ථාවේදී පුද කරනවා.

විපක්ෂයේ ඔබතුමන්ලා අපට දිගින් දිගටම පහර එල්ල කරන්න උත්සාහ කළා, මහජන ආරක්ෂක කමිටු හරහා අප අයුතු බලපෑම් කරනවා කියලා. මේ device එකේ වීඩියෝ එක අප ළඟ තිබෙනවා. හැබැයි, ඒක මෙතැන ප්‍රචාරය කරන්නේ නැහැ, මට වෙලාව නැති නිසා. මට තවත් විනාඩි 2යි තිබෙන්නේ. OICsලාගේ පුටු උඩ වාඩි වෙලා නීතිය ක්‍රියාත්මක කරපු අය, ස්ථානාධිපතිවරුන් 150කට වැඩි ප්‍රමාණයක් තමන්ගේ කැමැත්ත අනුව - රුචිකත්වය අනුව - අනීතිකව පත් කරපු අය, රාජ්‍ය සේවකයන් ගස් බැඳපු අය, මේ රටේ රාජ්‍ය නිලධාරින්ට අයුතු බලපෑම් කරපු අය නැවත මේ රටේ යුක්තිය, සාධාරණත්වය පිළිබඳ කථා කරන්න උත්සාහ කරනවා.

ලංකා ඉතිහාසයේ පළමු වතාවට වතු කම්කරුවන් සතුටින් ජීවත් වන යුගයක් අපට ආරම්භ කරන්න පුළුවන් වුණා. වතු කම්කරුවන්ගේ වැටුප වැඩි කරන්න කටයුතු කළ අපේ ආණ්ඩුව ගත් ඒ ක්‍රියා මාර්ගය විවේචනය කරන්න විපක්ෂය කටයුතු කළා; උසාවි ගියා. පසුව ඒ කරපු වැඩේ වහගන්න බැරුව ගලේ පහරපු බළලුන් වාගේ ඒ ගොල්ලන් පැල්වත්තට, සෙවණගලට පහර ගහන්න කටයුතු කරමින් ඉන්නවා. අපි නැවත වතාවක් කියනවා, මේ රටේ වතු කම්කරු ජනතාව රවට්ටන්න බැරි බව.

ඒ විතරක් නොවෙයි. අපි නිසි ක්‍රමවේදය අනුව රාජ්‍ය සේවයට 76,000කට ආසන්න පිරිසක් බඳවා ගන්නවා. මොකද, අපට ආයතනවලට යන්න බැහැ. අපි ආයතනවලට ගියාම කියනවා,

[ගරු සංජීව රණසිංහ මහතා]

"මන්ත්‍රීතුමා, අපට වැඩ කරන්න බැහැ; TO මහත්වරු නැහැ; මේකේ වැඩ කරන්න කාර්ය මණ්ඩලය නැහැ" කියලා. ඒ නිසා අපි නිසි ක්‍රමවේදය අනුව, තරග විභාගයකින් රාජ්‍ය සේවයට 76,000ක් පමණ බඳවා ගන්න කටයුතු සැලසුම් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. දැන් අපට පෙනෙනවා, පළාත් පාලන ආයතන අද සක්‍රියව ගම් බිම්වල වැඩ කරනවා. ඒ පළාත් පාලන ආයතනවලට නව උපකරණ ලබා දෙමින්, නව සැලසුම් ඇති කරමින් පළාත් පාලන ආයතනවල කාර්ය භාරය ඉටු කරන්න මේ රජය සහය දෙමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පුද කරමින් මම සමු ගන්නවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ජී. ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 5.10]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எனக்கு ஒதுக்கப்பட்டிருந்த பத்து நிமிட நேரம் ஆறு நிமிடமாகக் குறைக்கப்பட்டிருக்கின்றது. எனவே, குறிப்பிட்ட சில விடயங்களை மாத்திரம் சொல்லவேண்டியிருகின்றது.

மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையில் அங்கு 14 பிரதேச செயலங்கள் காணப்படுகின்றன. அவற்றுள் ஏறாவூர்ப்பற்று 630 சதுர கிலோமீற்றர் பரப்பளவுடைய மிகப் பெரிய பிரதேச செயலகப் பிரிவாகும். இங்கு 39 கிராம சேவையாளர் பிரிவுகள் காணப்படுகின்றன. அதன் வீதி வழியான தூரம் 50 கிலோமீற்றருக்கும் மேற்பட்டதாக இருக்கின்றபடியால், இந்த ஏறாவூர்ப்பற்று பிரதேச செயலகத்தை இரண்டாகப் பிரிக்க வேண்டிய தேவை இருக்கின்றது என்பதைக் குறிப்பிட விரும்புகின்றேன். அதுபோல், கிராம உத்தியோகத்தர் பிரிவுகளைப் பொறுத்தவரையில், காஞ்சிரங்குடா கிராமம் பரப்பளவில் கூடியதாக இருக்கின்றது. அதனால் அங்குள்ள கிராம உத்தியோகத்தர் அலுவலகத்திலிருந்து வெகுதொலைவிலும் மக்கள் வாழ்கின்றபடியால், அதையும் இரண்டாகப் பிரிக்க வேண்டிய தேவை இருக்கின்றது.

அடுத்து, இலங்கை நிருவாக சேவையைப் பொறுத்தவரை SLAS, SLEAS, SLAcS, SLOAS, SLPS போன்றவற்றுக்கான பரீட்சைகள் நடைபெறுவதுண்டு. 'கொரோனா' காலங்களில் இந்தப் பரீட்சைகளை நடாத்த முடியாத சூழ்நிலை காணப்பட்டதால், இந்த நிருவாக சேவைகளுக்கான பரீட்சைக்குத் தோற்றவிருந்த பரீட்சார்த்திகள் குறித்த வயதெல்லையை விஞ்சிய நிலையில், அந்தப் பரீட்சைக்குத் தோற்ற முடியாமற் போய்விட்டது. எனவே, நிருவாக சேவைக்கான பரீட்சார்த்திகளின் வயதெல்லையை அதிகரிக்கவேண்டிய தேவை இருக்கின்றது என்பதை அவர்கள் என்னிடம் குறிப்பிட்டிருந்தார்கள். எனவே, இந்த விடயத்திலும் கவனம் செலுத்துமாறு கேட்டுக் கொள்கின்றேன்.

அடுத்ததாக, மாகாண சபைகள் பற்றிய ஒரு விடயத்தையும் நான் சொல்லியாக வேண்டும். மாகாண சபைகள் இயங்காதபடியால், மக்களால் தெரிவுசெய்யப்பட்டாத, ஜனாதிபதியால் நியமிக்கப்படுகின்ற ஆளுநர் சகல அதிகாரங்களையும் பிரயோகிக்கின்ற நிலைமை காணப்படுகின்றது. இதை ஒரு ஜனநாயகப் படுகொலையாகத்தான் பார்க்க வேண்டும். ஏனென்றால், முதலமைச்சர், மாகாண சபை அமைச்சர்கள், மாகாண சபை உறுப்பினர்கள் இருந்து பரிபாலனம் செய்யவேண்டிய மாகாண சபைகள், ஜனாதிபதியால் நியமிக்கப்படுகின்ற Governorமூலம் இயக்கப்படுகின்ற சூழ்நிலையானது ஜனநாயகத்துக்கு முரணான செயற்பாடாக அமைகின்ற படியால், தயவுசெய்து மாகாண சபைத் தேர்தலை விரைவாக நடாத்தும்படி கேட்டுக் கொள்கின்றோம். நீங்கள் பாராளுமன்றத் தேர்தல் மற்றும் உள்ளூரதிகாரச் சபைத் தேர்தல்களை நடாத்தினீர்கள். அதற்கு நன்றி கூறுவதோடு, இந்த மாகாண சபைத் தேர்தலை கிட்டத்தட்ட 7 வருடங்களாக நடாத்தாமல் இருப்பதால், அங்கு மக்கள் நிர்வாகமற்ற, ஜனநாயகத்துக்கு முரணான தன்மை காணப்படுகின்றது என்பதையும் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

அடுத்ததாக, உள்ளூராட்சிச் சபைகளை எடுத்துக் கொண்டால், உள்ளூராட்சிச் சபை ஊழியர்களின் சம்பளத்தின் 20 சதவீதத்தை இந்த வருடம் அச்சபைகளே செலுத்த வேண்டுமென்றும் அடுத்த வருடம் 40 சதவீதத்தையும், அதற்கடுத்த வருடம் 60 சதவீதத்தையும் தொடர்ந்து அவ்வாறு ஒவ்வொரு வருடத்திலும் அதிகரிக்கின்ற வகையில் அவர்களின் சம்பளத்தைச் சபைகளே கொடுப்பனவு செய்ய வேண்டுமென்று கூறப்பட்டுள்ள நிலையில், சில உள்ளூராட்சிச் சபைகளால் இதனை வழங்க முடியாத நிலைமை காணப்படுகின்றது. அதன் காரணமாக அவற்றுக்குக் கிடைக்கின்ற வருமானத்தை அபிவிருத்திக்குப் பயன்படுத்த முடியாத ஒரு நிலைமை ஏற்படுகின்றது. எனவே, இவ்வாறாக உள்ளூராட்சிச் சபைகள்மூலம் சம்பளம் வழங்குகின்ற செயற்பாட்டைத் தவிர்க்குமாறு கேட்டுக் கொள்கின்றேன். அதுபோல், யுத்தத்தால் பாதிக்கப்பட்ட சில கஷ்டப் பிரதேசங்களில் இருக்கின்ற உள்ளூராட்சிச் சபைகளுக்குத் தேவையான நிதியோ இயந்திர சாதனங்களோ இல்லாத ஒரு நிலைமை காணப்படுவதால், அந்தப் பிரதேசங்களுக்குச் சில உதவிகளைச் செய்யவேண்டிய தார்மீகப் பொறுப்பு மத்திய அரசாங்கத்துக்கு இருக்கின்றது.

வயது கூடிய, வசதி குறைந்தவர்களுக்கு வழங்கப்படுகின்ற மாதாந்த உதவு தொகை - பொது உதவி என்கின்ற தர்மச் சம்பளம் - இதனை சாதாரணமாகப் பிச்சைச் சம்பளம் என்றும் சொல்லுவார்கள் - 250 ரூபாய் முதல் 500 ரூபாய் வரைதான் கொடுக்கப்படுகின்றது. இது எப்போதோ தீர்மானிக்கப்பட்ட தொகை. அது நிர்ணயிக்கப்பட்டுக் காலங்கள் கடந்திருக்கின்ற படியால் இந்த உதவித் தொகையை அதிகரிக்க வேண்டிய தேவை இருக்கின்றது என்பதை அவர்கள் சார்பாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், அரச சேவையிலிருந்து ஓய்வுபெற்ற சிலரது வேண்டுகோளாக இருக்கின்ற இன்னுமொரு விடயத்தையும் குறிப்பிட வேண்டும். அதாவது, ஓய்வுபெற்ற ஆசிரியர்கள், அதிபர்களைக் கொண்ட ஓர் ஆசிரியர் சம்மேளனம், ஓய்வூதியக் கொடுப்பனவில் காணப்படும் ஏற்றத்தாழ்வுகள் தொடர்பாக 28 ஆண்டுகளாகப் போராட்டமொன்றை நடாத்திக் கொண்டிருக்கின்றது. அந்த வகையில், 2026ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தின் மூலமாக அந்த ஓய்வூதியக் கொடுப்பனவில் காணப்படுகின்ற ஏற்றத்தாழ்வுகளைக் குறைக்குமாறு அவர்கள் வேண்டுகோள் விடுக்கின்றார்கள். 1997ஆம் ஆண்டு பி.சி. பெரேரா

ஆணைக்குழுவானது ஒரு பரிந்துரையை முன்வைத்திருந்தது. அதன் அடிப்படையில், 60 சதவீதமான சம்பள உயர்வு என்று குறிப்பிடப்பட்டிருந்தது. இதனால் சம்பள முரண்பாடுகள் ஏற்பட்டன, ஓய்வூதியத்திலும் முரண்பாடுகள் ஏற்பட்டது. இதற்காக சுபோதினி ஆணைக்குழு உருவாக்கப்பட்டது. அந்த ஆணைக்குழு இந்தச் சம்பள ஏற்றத் தாழ்வுகளைக் குறைப்பதற்குரிய நடைமுறையைச் செய்வதாகச் சொன்னது. ஆனால், அந்தச் செயற்பாடுகளை அரசு நடைமுறைப்படுத்தவில்லை. குறிப்பாக, 1997இல் இருந்து 2021இற்கு இடையில் ஓய்வுபெற்றவர்கள் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டிருக்கிறார்கள். 2021.12.31ஆம் திகதி ஓய்வுபெற்றவருக்கு 67,500 ரூபாய் ஓய்வூதியமாகக் கிடைக்கின்றதென்றால், 2022.01.01ஆம் திகதி - அடுத்த நாள் - ஓய்வுபெற்றவர்களுக்கு 30,000 ரூபாய் அதிகமாகக் கிடைக்கும் வகையில் ஓய்வூதியக் கொடுப்பனவில் வித்தியாசம் காணப்படுகின்றது. இது ஒரு பாரபட்சமான செயற்பாடாக இருக்கின்ற காரணத்தால் இந்த ஓய்வூதியத்தை ஏற்றத்தாழ்வற்ற முறையில் வழங்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

முகாமைத்துவ சேவையில் உள்ளவர்கள் தொடர்பாக அகில இலங்கை முகாமைத்துவ சேவையாளர் சங்கம் விடுத்திருக்கின்ற ஒரு வேண்டுகோளை அதன் வடக்கு, கிழக்கு இணைப்பாளர் என்னிடம் தந்திருக்கிறார். 'முகாமைத்துவ சேவையாளர்களின் குரல்' என்ற வகையில் இதனைக் கூற விரும்புகின்றேன். முகாமைத்துவ சேவை என்பது மிக முக்கியமானதாக இருக்கின்றது. தேர்தல்களை நடத்துவதிலும் அவர்கள் வெற்றிகரமாகத் தமது பணியைச் செய்கிறார்கள். போராட்டத்தின் மூலமாகப் பெற்றுக்கொண்ட MN-2, MN-3 தரங்களுக்கான சம்பள உயர்வு அரச சேவை ஆணைக்குழுவால் அவர்களுக்கு வழங்கப்படவில்லை. போராடிப் பெற்ற அந்த விடயம் தமக்குக் கிடைக்கவில்லையென்று அவர்கள் மனத்தாங்கலுடன் இருக்கிறார்கள். எனவே, அவர்களது இந்தக் குறையைத் தீர்க்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Please give me one more minute.

2018இன் பின்னர் இதுவரை 'முகாமை மித்திர சேவையாளர்' எனக் கருதக்கூடிய முகாமைத்துவ சேவையாளர்களை இணைப்பதற்கான போட்டிப் பரீட்சை நடாத்தப்படவில்லை. அதனால் இளைஞர், யுவதிகள் அத்தொழில்வாய்ப்பைப் பெறுவதில் மிகவும் சிரமப்படுகிறார்கள். எனவே, முகாமைத்துவ சேவையாளர்களுக்கான போட்டிப் பரீட்சைகளை நடத்துமாறும் கேட்டுக்கொண்டு, எனது மேற்படி கோரிக்கைகள் தொடர்பில் கவனஞ்செலுத்தும்படி வேண்டி, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පී. රුවන් සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.18]

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ කම්කරු අමාත්‍යාංශයට අදාළ කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙනවා. අද උදෑසන සිට මෙම අමාත්‍යාංශ දෙක පිළිබඳ විවාදයට සහභාගි වූ හැම මන්ත්‍රීවරයෙක්ම, මන්ත්‍රීවරියක්ම විවිධ අදහස් පළ කළා.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය අපේ රටේ තිබෙන ප්‍රධානම අමාත්‍යාංශයක් නිසා රටේ සිව් කොනේම ඉන්න ජනතාව සෑම ක්ෂේත්‍රයකින්ම මේ අමාත්‍යාංශයත් එක්ක බද්ධ වෙලා තිබෙනවා. 2026 මේ අය වැයෙන් අනෙකුත් අමාත්‍යාංශවල ශීර්ෂවලට මුදල් වෙන් කළා වාගේම, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයටත් රුපියල් මිලියන 674,000ක් වෙන් කර තිබෙනවා, අමාත්‍යාංශයේ කටයුතු සඳහා. ඉන් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 24,620ක් වෙන් කර තිබෙනවා, ජනතාවගේ සුබසාධනය වෙනුවෙන්.

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ පළාත් සභා සහ පළාත් පාලන විෂයට අදාළව පළාත් පාලන ආයතන 341ක් රට පුරාම විහිදිලා තිබෙනවා, මහ නගර සභා 29ක්, නගර සභා 36ක්, ප්‍රාදේශීය සභා 276ක් විධියට. පසුගිය කාල සීමාව තුළ මේ ආයතනවල මහජන නියෝජිතයන් නැතිව හිටියේ. මොකද, මැතිවරණ කල් දමා තිබුණේ. නව රජය - අපි - බලයට පත් වුණාට පස්සේ ඒ මැතිවරණය පැවැත්වුවා. දැන් ජනතාවගේ මූලික අවශ්‍යතා සම්පූර්ණ කිරීම වෙනුවෙන් මහජන නියෝජිතයන් ඒ පළාත් පාලන ආයතනවල වැඩ කරමින් ඉන්නවා. 2025 අවුරුද්දේ පළමුවෙනි අය වැයෙන් පළාත් පාලන ආයතන සක්‍රිය කරන්න, ශක්තිමත් කරන්න විශාල මුදලක් වෙන් කළා. ඒ අනුව 2025 වසරේදී මූලික අඩිතාලමක් විධියට ඒ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා මැදිහත් වීමක් කළා. එහි දෙවැනි පියවර මෙන්ම ඊළඟ දිගුව විධියට 2026 වසර සඳහා මේ රජයේ දෙවැනි අය වැයෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා, පළාත් පාලන ආයතන නඟා සිටුවන්න, ශක්තිමත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අකර්මණ්‍ය වෙලා තිබුණු පළාත් පාලන ආයතන අපි 2025 අවුරුද්දේ නැවත සක්‍රිය කරලා, ශක්තිමත් කරන්න ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භ කළා. එහි දෙවැනි අදියර ලෙස පළාත් පාලන ආයතන 341ම ආවරණය වන පරිදි "පුනරුදයේ පුරවර" පළාත් පාලන සතිය ආරම්භ කරලා, ලංකා ඉතිහාසයේ පළමු වතාවට ජනතාව පළාත් පාලන ආයතන වෙත සමීප කරන්න සැලසුම් හැදුවා. එතැනින් පටන් ගත්ත මේ ගමන තුළින් ආණ්ඩුවේ දෙවැනි අවුරුද්දේ, ඒ කියන්නේ 2026 වසරේ පළාත් පාලන ආයතන සක්‍රිය කිරීමට හැකි වෙයි කියලා අපි විශ්වාස කරනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරු පළාත් පාලන ආයතනවල කටයුතු ගැන විටින් විට ප්‍රශ්න ගණනාවක් මතු කළා. ඔව්, පළාත් පාලන ආයතන සක්‍රිය මට්ටමෙන් පවත්වාගෙන යෑමට නොහැකි ආකාරයේ ගැටලු ගණනාවක් මේ වන විට නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවලට ගෙනෙන වාහන සම්බන්ධව ලොකු සංවාදයක් මතු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතන සතුව

[ගරු පී. රුවන් සෙනරත් මහතා]

තිබෙන යන්ත්‍ර සූත්‍ර වසර 10ක්, 15ක් පැරණි ඒවා. ඒ පැරණි යන්ත්‍ර සූත්‍ර නඩත්තු කරන්න විශාල මුදලක් වැය වනවා. අපේ රටේ පළාත් පාලන ආයතන තුළ පැරණි යන්ත්‍ර සූත්‍ර සහ වාහන 4,000ක් පමණ තිබෙනවා. ඒ යන්ත්‍ර සූත්‍ර සහ වාහන නඩත්තු කරන්න විතරක් රුපියල් මිලියන 3,350ක අතිවිශාල ධනයක් වියදම් කරන්න සිදු වෙලා තිබෙනවා. ඒක නිසා තමයි ග්‍රාමීය ජනතාවගේ උපතේ සිට මරණය දක්වා සම්පව කටයුතු කරන පළාත් පාලන ආයතනවලට ජනතාවගේ මූලික පහසුකම් වෙනුවෙන් වූ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර සහ වාහන ටික ලබා දෙන්න නව රජය තීරණය කළේ. ඒ අනුව තමයි ලබන වසරේ මුල් කාල සීමාව තුළ පළාත් පාලන ආයතනවලට අත්‍යවශ්‍ය වාහන 700ක් ලබා දීම සඳහා අපි කටයුතු කරන්නේ. සෑම පළාත් පාලන ආයතනයකටම එම යන්ත්‍ර සූත්‍ර ටික සහ වාහන ටික ලබා දෙන්න අපට පුළුවන්.

අපි අමාත්‍යාංශය විධියට සෑම පළාත් පාලන ආයතනයකටම දැනුම් දුන්නා, ඔබේ පළාත් පාලන ආයතනයට අවශ්‍ය කරන වාහන මොනවාද කියලා දැනුම් දෙන්න කියලා. ඒ අනුව අපට ලැයිස්තුවක් ලැබුණා. පළාත් පාලන ආයතන සඳහා වාහන 1,067ක අවශ්‍යතාව තිබෙනවා. එම වාහන 1,067න් පළමු අදියරේම වාහන 700ක් ලබා දෙන්න අපි සූදානම්. එම පළාත් පාලන ආයතනවල කටයුතු ක්‍රියාත්මක කරගෙන යෑම සඳහා, ඒවා ශක්තිමත් කිරීම, නඟා සිටුවීම, ජනතාවගේ මූලික පහසුකම් සංවර්ධනය කිරීම වෙනුවෙන් එම වාහන ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමාගේ කථාවේදීත් එතුමා කිව්වා, ට්‍රැක්ටර් 175ක්, ගලි බවුසර් යන්ත්‍ර 100ක්, බැකෝ යන්ත්‍ර 100ක්, ටිපර් රථ 160ක් හා මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර 75ක් ලබා දෙන්න අපි කටයුතු කරන බව. ඒ වාගේම පළාත් පාලන ආයතනවල දෛනික කටයුතු සඳහා ත්‍රිරෝද රථ 90ක් ලබා දෙන්නත් කටයුතු කරමින් තිබෙනවා. අපේ මේ සැලැස්ම ඇතුළේ ඉදිරි වසර කිහිපය තුළ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම, නඟා සිටුවීම සඳහා මෙවර අය වැයෙන් මෙවැනි මැදිහත් වීමක් කරමින් තිබෙනවා.

අපි කවුරුත් දන්නවා, නව රජයේ ප්‍රධාන තේමාවක් තමයි ඩිජිටල්කරණ වැඩසටහන. ඩිජිටල්කරණ වැඩසටහනට සමගාමීව පළාත් පාලන ආයතනවල නව මෘදුකාංගයක් හඳුන්වා දෙමින්, නව ඒ වාගේම, මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනකොට කටයුතු කරමින් තිබෙනවා. දැනටමත් පළාත් පාලන ආයතන 130ක එම මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක වනවා. මෙම වසර අවසන් වන විට අපේ රටේ පළාත් පාලන ආයතන 341හිම එම මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනවා. ජනතාවට ඉක්මනින් සේවා සැපයීමට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් තිබෙනවා. ලබන වසර වනකොට සියලු පළාත් පාලන ආයතනවලට මෙම මෘදුකාංගය හඳුන්වා දීලා, ජනතාවට වඩා පහසුවෙන් ගනුදෙනු කිරීම සඳහා අවශ්‍ය කරන මැදිහත් වීම කරමින් තිබෙනවා. 2026 වසරේ පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමට අපි බලාපොරොත්තු වනවා. ඒ සඳහා මෙවර අය වැයෙන් රුපියල් මිලියන 2,500ක් අපි වෙන් කරලා තිබෙනවා. අද මෙතැන සාකච්ඡා වුණා, පළාත් පාලන ආයතනවල ප්‍රතිපාදන සියයට 20කින් කපා හැරලා තිබෙනවා; පළාත් පාලන ආයතන මේ විධියට පවත්වාගෙන යන්න බැහැ කියලා. ඔව්, අපි දන්නවා. අපි පළාත් පාලන ආයතන සමඟ සාකච්ඡා කළා. මා ළඟ තිබෙනවා 2023 වසරේ අය වැය කථාව. එම කථාවේ බොහොම පැහැදිලිව තිබෙනවා, පළාත් පාලන ආයතනවල ප්‍රතිපාදන සියයට 20කින් කපන්න ඕනෑ කියලා. මෙහෙම තිබියදීත් විපක්ෂයේ මන්ත්‍රීවරු කවුරුත් කථා වෙලා, 'අපි මුකුත් දන්නේ නැති විධියට කථා කරමු' කියලා සාකච්ඡා කරගෙනද දන්නෙත් නැහැ. එහෙම නැත්නම් කෝමා තත්ත්වයෙන් ඉඳගෙන කථා කරනවාද කියලා අපට තේරෙන්නේ නැහැ. මොකද, මේ අය තමයි අය වැය 78ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අද මොකක්වත් දන්නේ නැති, මුකුත් නොතේරෙන කණ්ඩායමක් විධියට කථා කරන්නේ.

අපි කවුරුත් දන්නවා, මේ වන විට පළාත් පාලන ආයතන සඳහා විදේශ ආධාර ව්‍යාපෘති ගණනාවක් රට තුළ ක්‍රියාත්මක වන බව. උදාහරණයක් විධියට ගත්තොත්, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය මේ වන විට ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ග්‍රාමීය පාලම් වැඩසටහන යටතේ නෙදර්ලන්ත රජයෙන් ණය සහ ආධාර මත ග්‍රාමීය පාලම් 162ක වැඩ මේ වන විට අවසන් වෙමින් තිබෙනවා. ලබන වසරේ සිට වසර කිහිපයක්, වසර 4ක් අවසන් වන විට පාලම් 800ක් ඉදි කිරීම සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන් කරමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් පාලන ආයතනවලට අදාළ අණ පනත් ප්‍රමාණයක් තිබෙනවා. ඔබ අපි කවුරුත් දන්නවා, 1947 අගෝස්තු 15 සිට ක්‍රියාත්මක වන 252 වන අධිකාරිය යටතේ වූ මහ නගර සභා ආඥාපනත, ඒ වාගේම නගර සභා ආඥාපනත සහ ප්‍රාදේශීය සභා පනත මේ වන විට අපි සංශෝධනය කර තිබෙන බව. පළාත් පාලන ආයතන ඇතුළු අනෙකුත් ආයතනවලට පහසුවෙන් වැඩ කරන්න පුළුවන් විධියට, යල් පැන ගිය නීති, පනත් ඉදිරි කාල සීමාව තුළ සංශෝධනය කරන්න මේ වන විට කටයුතු කරමින් තිබෙනවා.

ඒ වාගේම පළාත් පාලන ආයතනවල සේවක ගැටලු ගණනාවක් තිබෙනවා. ඒ පිළිබඳවත් සාකච්ඡා කරමින් ඒ ගැටලු විසඳීමට අවශ්‍ය මැදිහත්වීම මේ වන විට සිදු කරමින් තිබෙනවා. සේවකයන් ස්ථිර කිරීම පිළිබඳව සාකච්ඡා වුණා. නව රජය තීන්දුවක් අරගෙන තිබෙනවා අනියම්, තාවකාලික සහ ස්ථිර නොකළ සේවකයන් 9,000 ගණනක් ස්ථිර කරන්න. ඒ අනුව පළාත් පාලන ආයතනවල එවැනි සේවකයන් ස්ථිර කිරීමට අවශ්‍ය මැදිහත්වීම කරමින් තිබෙනවා.

විශේෂයෙන් පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ඇවර කරන්න එතුමන්ලා ලැහැස්ති වෙලා තිබුණා. අපි අපේ පාලනය ඇතුළේ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය ශක්තිමත් කරලා ක්‍රියාත්මක කරමින්, නැවත පළාත් පාලන ආයතන නියෝජිතයන් පුහුණු කරන්න වැඩසටහන් ආරම්භ කරමින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු - නැඟෙනහිර පළාත් මූලික කරගෙන අපේ උතුරේ නැඟෙනහිර මන්ත්‍රීවරු කාරණා ටිකක් ඉදිරිපත් කළා. ඒ සියල්ල සඳහාත් අපි මැදිහත් වෙමින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම සියලු ඉලක්ක, අරමුණු යථාර්ථයක් බවට පත් කර ගැනීම සඳහා අවශ්‍ය මූලික අඩිතාලම සවිමත්ව දමමින් දැවැන්ත ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කරමින් පරිවර්තනීය වෙනසකට මුල පිරීමට රජය සමත් වී තිබෙනවා. මේ සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, පළාත් සභා, පළාත් පාලන ආයතන, සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු සියලු ආයතන අත්වැල් බැඳ ගනිමින් ක්‍රියාත්මක වෙමින් සිටින බව මම සතුටින් ප්‍රකාශ කරනවා. එසේම ශ්‍රී ලංකාවාසී සමස්ත ජනතාවට පොහොසත් රටක ලස්සන ජීවිතයක් ගත කිරීමට අවස්ථාව සැලසීම සඳහා "පුනරුදයේ පුරවර" ගොඩ නැඟීමයි අපේ ජනතාවාදී ආණ්ඩුවේ අභිප්‍රාය. ඒ සඳහා අමාත්‍යාංශයට මඟ පෙන්වන මගේ අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා, මේ වෙනුවෙන් කැප වෙන අමාත්‍යාංශ ලේකම්තුමා ඇතුළු අතිරේක ලේකම්වරු, අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ඇතුළු අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ට

මගේ ප්‍රසංශාව හිමි කරනවා. ඒ වාගේම ඉදිරියේදී මේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඔබ සියලුදෙනාගේම සහයෝග ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින්, මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු එම්. නිසාම් කාරියප්පර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.28]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මගේ කථාවේදී සම්පූර්ණයෙන්ම පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් කරුණු දැක්වීමට බලාපොරොත්තු වෙනවා. ඊට පෙර, ගරු ඇමතිතුමාගෙන් යම්කිසි ඉල්ලීමක් කරන්න තිබෙනවා. ඒ, දීප ව්‍යාප්ත උප්පැන්න, මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් සංගමය විසින් ඉදිරිපත් කර තිබෙන ඉල්ලීමක් සම්බන්ධයෙන්. දැනට අවුරුදු 11කට ඉස්සෙල්ලා, 2014දී පමණ සිට ඔවුන්ට උප්පැන්න, මරණ සහ විවාහ ලියාපදිංචි කිරීමකට ලැබෙන්නේ රුපියල් 75ක් වාගේ සොච්චම් දීමනාවක්. ඒකේ යම්කිසි වැඩි කිරීමක් සිදු කරන මෙන් ඔවුන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ඊට අමතරව තීන්ත සඳහා කියලා මේ අයට මාසික දීමනාවක් දෙනවා. ඒකත් වැඩි කරන ලෙස ඉල්ලා සිටිනවා.

இந்தப் பதிவாளர்கள் பிறப்பு, இறப்பு மற்றும் திருமணங்களைப் பதிவுசெய்யும்போது அவர்களுக்குச் சிறிய தொகையே - 75 ரூபாய் - கிடைக்கின்றது. இந்தத் தொகையை அதிகரித்துத் தருமாறு அகில இலங்கை பிறப்பு, இறப்பு மற்றும் விவாகப் பதிவாளர் சங்கத்தினூடாக அவர்கள் கேட்டிருக்கின்றார்கள். ஆகவே, இதனை உங்களுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, குறைந்தபட்ச அதிகாரப் பரவலாக்கலுக்காக ஏங்கிக் கொண்டிருக்கின்ற எங்களுக்குச் சாவுமணி அடித்த நாளாக இன்றைய தினத்தை நாம் காணுகின்றோம். சொல்வதற்கு வெட்கமாகவும் மிகவும் வேதனையாகவும் இருக்கின்றது. மாகாண சபைத் தேர்தல் தொடர்பாக முன்னர் முன்னாள் பாராளுமன்ற உறுப்பினர் கௌரவ சுமந்திரன் அவர்களும் அதன் பின்னர் பாராளுமன்ற உறுப்பினர் கௌரவ சாணக்கியன் இராசமாணிக்கம் அவர்களும் கொண்டுவந்த தனி உறுப்பினர் சட்டமூலத்தை ஏற்றுக்கொள்ள முடியாது என்று சொல்கிறார்கள். மேலும், இது சம்பந்தமான அவர்களுடைய அறிக்கையில், “இந்த விடயத்துக்காக விரைவில் பாராளுமன்றத் தெரிவுக் குழுவொன்றை நியமித்து, மிகவும் பொருத்தமான முறையொன்றின்படி மாகாண சபைத் தேர்தலை நடத்துவதற்குத் தேவையான பின்னணி தயாரிக்கப்படும்” என்று குறிப்பிட்டிருக்கிறார்கள். இது வேதனைக்குரிய விடயம். ஜனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள், இந்த நாட்டில் வாழுகின்ற தமிழ் பேசுகின்ற தமிழ், முஸ்லிம், மலையக மக்களுக்கு மாத்திரமல்ல, அதிகாரப் பரவலாக்கலை விரும்புகின்ற சிங்கள மக்களுடைய விருப்பத்துக்கும் தான் செவிசாய்ப்பாரெனச் சொல்லியிருந்தார். ஆனால், இப்பொழுது நீங்கள் உங்களுடைய அசல் முகத்தைக் காட்ட வந்துவிட்டீர்கள்!

1989ஆம் ஆண்டு மாகாண சபைத் தேர்தலுக்கு எதிராக நீங்கள் வன்முறையில் இறங்கினீர்கள். 2018ஆம் ஆண்டு அந்தச் சட்டத்துக்குத் திருத்தம் கொண்டுவந்தபோது அந்தச் சட்டமூலத்துக்கு எதிராக 139 உறுப்பினர்கள் வாக்குகளைப் பிரயோகித்தபோது, JVP பாராளுமன்ற உறுப்பினர்கள் யாருமே சாதகமாகவோ, பாதகமாகவோ வாக்களிக்கவில்லை. அப்பொழுது எங்களுக்குப் புரியவில்லை, ஏன் இவர்கள் இப்படிச் செய்கிறார்கள் என்று. இப்பொழுது உங்களுடைய அசல் புரிகின்றது. நீங்கள் மாகாண சபை முறைமைக்கு எதிர்ப்பு என்பதை இப்பொழுது இங்கே காட்டியிருக்கிறீர்கள். நீங்கள் செய்கின்ற விடயம் மிகப் பயங்கரமானது என்பதை மறந்து விடாதீர்கள்! நீங்கள் நினைக்கலாம், 1989ஆம் ஆண்டு நீங்கள் ஆரம்பித்த மாகாண சபை முறைமைக்கு எதிரான கோஷசத்தை இப்பொழுது மிகக் கச்சிதமாக, பட்டும்படாமலும் இங்கே நடைமுறைப்படுத்திக்கொண்டிருப்பதாக.

අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා එතුමාගේ ආසනයේ ඉඳගෙන කිව්වා, "අපි පළාත් සභා මැතිවරණය පවත්වනවා" කියලා. එහෙම කිව්වාද? ඔව්, කිව්වා. හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න. ඒ විතරක් නොවෙයි. එතුමා හැම වේදිකාවකම කිව්වා, පළාත් සභා මැතිවරණය පවත්වනවා කියලා. ඊයේ-පෙරේදා මෙතැනට ඇවිල්ලා පොඩි සමච්චල් හිනාවකුත් දාලා අපට කිව්වා, "මම කොහොමද මැතිවරණය පවත්වන්නේ, නීතියක් නැහැ, නීතියක් හදලා දෙන්න" කියලා. මට වෙලාවකට හිතුණා, මම අහගෙන හිටියේ අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ කථාවද, නැත්නම් රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමාගේ කථාවද කියලා. එතුමා කිව්වා නේ, "මැතිවරණයකුත් නැහැ, මැතිවරණයක් තියන්න සල්ලිත් නැහැ" කියලා. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ඇවිල්ලා කියනවා, "පළාත් සභා මැතිවරණය තියන්න සල්ලි තිබෙනවා, නීතියක් නැහැ, ඒ සඳහා නීතියක් හදලා දෙන්න" කියලා. මන්ත්‍රීවරුන් 159ක් තමන් ළඟ තියාගෙන අපි දිහා බලලා කියනවා, නීති හදලා දෙන්න කියලා. අපි කොහොමද නීති හදලා දෙන්නේ? ඔව්, අපි නීති හැදුවා. ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා එක ක්‍රමයක් හදලා ඉදිරිපත් කළා. ඒක කුණු කූඩයට විසි කරලා, ඒක යටතේ ක්‍රියා කරන්න ඕනෑ නැහැ කියලා දැන් වාර්තාවක් සකස් කරලා කියනවා, "නැහැ, අපි අපේම ක්‍රමවේදයක් හදාගන්න අලුත් විශේෂ කාරක සභාවක් පත් කරනවා" කියලා. ඒකට වැඩිය හොඳයි නේ, ජනතාවට බොරු නොකියා ප්‍රසිද්ධියේ කියන්න, "අපි පළාත් සභාවලට කැමැති නැහැ" කියලා. එහෙම කියන්න, කමක් නැහැ. හරි, අපි භාර ගන්නම්. එතකොට අපට ඒක ජනතාවට කියන්න පුළුවන්. ඇයි, මේ වෙට්ටු දමමින් බොරු කියන්නේ? කෙළින්ම කියන්න, "අපි පළාත් සභාවලට කැමැති නැහැ, ජනතාවට බලය බෙදන්න කැමැති නැහැ" කියලා. ඔබතුමන්ලා පුන පුනා කියනවා නේ, "අපි පළාත් සභා මැතිවරණයට භය නැහැ, අපට දිනන්න පුළුවන්" කියලා. ඔබතුමන්ලාට දිනන්න පුළුවන් කියලා ඔච්චරම sure නම්, මැතිවරණය නොතියන්නේ ඔබතුමන්ලා ඒ මැතිවරණය ක්‍රමයට කැමැති නැති නිසාද? පළාත් සභා මැතිවරණය පැවැත්වීම සඳහා දැනට තිබෙන ක්‍රමයට ඔබතුමන්ලා කැමැති නැහැ. ඒක තමයි ඔබතුමන්ලාගේ හිත්වල තිබෙන්නේ. ඕක කොළේ වහලා ගහන්න ඕනෑ නැහැ නේ. ඕක පැහැදිලිවම හා විවෘතව කියන්න තිබුණා නේ. මීට පස්සේ අපි අතහරින්නේ නැහැ. ඇත්තටම ඇමතිතුමාට ගරු කිරීමක් වශයෙන් අඩුම ගණනේ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට පක්ෂව ඡන්දය දෙන්න හිටියත්, දැන් පළාත් සභා මැතිවරණය ඔබතුමන්ලා නැති කරන්න හදනවා. මම ඔබතුමන්ලාගේ මේ වාර්තාව ඉරලා දමනවා. මේ වාර්තාව අපි පිළිගන්නේ නැහැ. අපි මේකට විරුද්ධව ඡන්දය දෙනවා. අද පළාත් සභාව නැති කරන්න ඔබතුමන්ලා දාපු පළමුවැනි වෙඩි මුරයට විරුද්ධව අපි සටන් කරනවා, සටන් කරනවා කියමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
එතැන point එකක් නැහැ; පැහැදිලිවම නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ජනාධිපතිතුමා එදා කරපු කථාව විකෘති කරමින් තමයි ගරු නිසාම් කාරියප්පර් මැතිතුමා දැන් කථා කළේ. ජනාධිපතිතුමා ඉතාම පැහැදිලිව කිව්වේ, මෙතුමන්ලාට නීති හදලා දෙන්න කියන එක නොවෙයි. මේ පාර්ලිමේන්තුව විසින් නීති හදලා දෙන්න කියන එකයි කිව්වේ. එහෙම නැතුව විපක්ෂයට නීති හදන්න කියන එක නොවෙයි කිව්වේ. *[බාධා කිරීමක්]* නැහැ, බලපු දිහා නොවෙයි, එතුමා කිව්වේ මේ පාර්ලිමේන්තුවට. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා උගත් නීතිඥවරයෙක් නේ. රටේ නීතිය ගැන අපට වඩා හොඳට දන්න කෙනෙක් නේ. ගරු ජනාධිපතිතුමා ඇවිල්ලා පාර්ලිමේන්තුවටයි කිව්වේ, නීති හදලා දෙන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාරණය පැහැදිලියි. *[බාධා කිරීමක්]* අපි දැන් ඔය විවාදය නවත්වමු. කාරණය පැහැදිලියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

මීළඟට, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.36]

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ගිහිල්ලා ඉස්සෙල්ලාම ගුරුවරුන්ගේ ගැටලු ටික විසඳලා එන්න, පළාත් සභා ගැන අපි බලාගන්නම්. ගුරුවරුන් ඔබතුමාට විරුද්ධව දැන් පෙළගැහිලා ඉන්නේ. ඔබතුමා ගිහිල්ලා ඉස්සෙල්ලා ඒ ප්‍රශ්න ටික විසඳලා එන්න. පළාත් සභා පිළිබඳව ජනාධිපතිතුමා මොනවාද කිව්වේ, ඔබතුමා මොනවාද කිව්වේ, ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මොනවාද තිබෙන්නේ, ඒ ඔක්කෝම පිළිබඳව අද දවල් එකට අපි ජනාධිපතිතුමා හමුවුණු වෙලාවේ එතුමාටත් කිව්වා. ඒක නිසා ඔබතුමා කලබල වෙන්නේ නැතුව පොඩ්ඩක් වාඩිවෙන්න. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, කලබල වෙන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මැතිවරණය රටේ අනෙක් ප්‍රදේශවල සිටින ජනතාවට කෙසේ බලපානවාද, අනෙක් පක්ෂවලට කෙසේ බලපානවාද කියලා මම දන්නේ නැහැ. මම නියෝජනය කරන පක්ෂයට සහ අපට මේ පළාත් සභා මැතිවරණය ඉතාම වැදගත්.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
අපටත්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
පැහැදිලිවම.

මම හිතන විධියට, ඔබතුමන්ලාගේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව අවුරුද්දක් තුළ මැතිවරණය පවත්වනවා කියපු පොරොන්දුවත් එක්ක තමයි උතුරේ සහ නැඟෙනහිර ඉන්න ජනතාව ඔබතුමන්ලාට යම් mandate එකක් ලබා දුන්නේ. අද ඒ mandate එක විසි කරලා තිබෙනවා. මම මේ කාරණාව කියන්නේ ඉතාම කනගාටුවෙනුයි.

Hon. Presiding Member, today, I have received a copy of the "Report submitted by the Minister under Parliamentary Standing Order No. 52(6) on the Private Members' draft Bill submitted by Hon. Member of Parliament Shanakiyan Rajaputhiran Rasamanickam." Hon. Minister, please respond after my speech since I have very limited time. After I submitted this draft Bill, it was gazetted in the month of May and was taken up for its First Reading in the month of June. With regard to the draft Bill I submitted, the Report of the Minister states that the Legal Draftsman has said that it is the same Bill that the Hon. Sumanthiran presented in the previous Parliament and that the Supreme Court had given certain directives and those directives had not been included in my Bill and therefore, they cannot take up this Bill. It is an absolute untruth! When the Hon. Sumanthiran submitted his draft Bill, it went before the relevant Committee which goes into Private Members' Bills after they are submitted under Standing Orders - I cannot recall the name of that Committee - and there were certain recommendations made by that Committee. Then, the Hon. Sumanthiran's Bill was amended accordingly so that it is as per what the Supreme Court said; after the Supreme Court gave its Determination, the Hon. Sumanthiran's Private Members' Bill was amended accordingly. So, when I submitted my Private Members' Bill this time, we ensured that we included all the requirements that were put forward by the Supreme Court. Hon. Minister, you do not have a backbone!

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
He is saying untruth!

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
You are telling untruth to this Parliament and the people. - *[Interruption.]* Hon. Minister, just stay quiet! You do not know anything about these things; you have no idea about any of these things. You go to court and make a few quick bucks while you are in power. Do not try to comment on Provincial Councils Elections. You all were opposed to it then; you all seem opposed to it now. So, do not try to tell us sugar-coated stories. You can say that to any other Member here, but do not try to play that joke on me. Right?

Sir, we respect the President. We met him today in his Office. The President clearly told us that the Provincial Councils Elections will be held. And, the President himself, in this Chamber, wanted the Opposition to bring in a law on that. අද උදෑසන ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්වා, විපක්ෂයෙන් එකඟයි මම submit කරපු Bill එක ගෙනෙන්න කියලා. දැන් ඒ Bill එක ගෙනෙන්න භය නම්, ඒ Bill එක ගෙනෙන්න කැමැති නැත්නම්, ඔබතුමාට කොන්ද පණ තිබෙනවා නම්, ඔබතුමාට කොන්දක් තිබෙනවා නම් ගරු ඇමතිතුමනි, මොකක්ද කරන්න තිබුණේ? මේ පාර්ලිමේන්තුව පටන් ගත්ත ගමන්ම කී වරක් මේ සභාවේ අපි ඔබතුමාගෙන් ඒ ගැන ප්‍රශ්න කළාද? ඔබතුමාට කොන්ද පණ තිබෙනවා නම් එතකොටම ඔබතුමාට කමිටුවක් පත් කරන්න තිබුණා මේ ගැන හොයන්න. අවුරුද්දක් ඉඳලා, අවුරුද්දක් හැංගි හොරා සෙල්ලම් කරලා,- *[බාධා කිරීමක්]* රනිල් වික්‍රමසිංහ වාගේයි ඔබතුමා. කමිටු පත් කරන එක රනිල් වික්‍රමසිංහගේ ක්‍රමවේදයක් නේ. ඔබතුමා රනිල් වික්‍රමසිංහගේ ගෝලයෙක් වාගේයි මට නම් පෙනෙන්නේ. කමිටු පත් කරලා මැතිවරණ කල් දමන්න ලජ්ජා නැද්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පළාත් සභා මැතිවරණය පවත්වන්න.

මම අද දවල් ජනාධිපතිතුමාව හමු වෙද්දී මේ Report එක දැකලා තිබුණා නම් එතුමාටත් මම කාරණය කියලායි එන්නේ. මේ Report එකේ කියා තිබෙනවා, 2017දී ගෙනාපු පළාත් සභා පනත සංශෝධනය කරන්නේ නැතුව මගේ Private Members' Bill එක ගෙනෙන්න බැහැ කියලා. මගේ Private Members' Bill එකේ තිබෙන්නේම 2017 ගෙනාපු එම පනත අහෝසි කරලා පැරණි ක්‍රමයට යන එක ගැනයි. ඒක එම පනත් කෙටුම්පත ඇතුළේම තිබෙනවා. Supreme Court එකත් කියලා තිබෙනවා. එතකොට පළාත් සභා මැතිවරණය පවත්වන එක පරක්කු කරන්න දේශපාලන කාරණා තිබෙනවා නම් ඒවා කියන්න, අපි පිළිගන්නම්. එහෙම නැතුව මේ නීතිය Legal Draftsmanගේ පිට දමලා, එහෙම නැත්නම් වෙන වෙන කමිටු පත් කරලා පළාත් සභා මැතිවරණයෙන් පැනලා යන්න හදන එක ඉතාම පහත්, නින්දිත ක්‍රියාදාමයක්. මොකද, පළාත් සභා මැතිවරණය ගැන අපි නොවෙයි කිව්වේ. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනය ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය.

இந்த அரசாங்கம் மாகாண சபைத் தேர்தலை நடத்துவதற்குப் பயப்படுகின்றது. வடக்கு, கிழக்கிலே இன்று அரசாங்கத்தின் செல்வாக்கு இந்தப் புத்தர் சிலை விவகாரத்துடன் மொத்தமாக இல்லாமற் போய்விட்டது. ஜனாதிபதி அவர்கள் நேற்றுச் சொல்கிறார், “இது ஒரு முடிந்த சம்பவம்; ஏன் இந்த முடிந்த சம்பவத்தைப் பற்றி இன்னும் பேசுகிறீர்கள்?” என்று. அந்தச் சிலை அந்த இடத்தில் இருக்கும் வரைக்கும் இந்தச் சம்பவம் முடிந்த சம்பவம் அல்ல! உங்களைப் பொறுத்தவரையிலே, உங்களுடைய அரசாங்கத்தின் நிகழ்ச்சி நிரலின்படி அந்த இடத்தில் ஒரு சிலையை வைத்தது முடிந்த விடயமாக இருந்தாலும்கூட, எங்களைப் பொறுத்தளவிலே, அந்த சிலை அந்த இடத்திலே இருக்கும் வரைக்கும் வடக்கு, கிழக்கில் வாழும் தமிழ் பேசும் மக்களுக்கு இந்த அரசாங்கத்தின் இனவாதமான செயற்பாட்டை ஞாபகமூட்டும் ஒரு விடயமாகவே அது அமையும். அந்தச் சிலையைப் பார்க்கும் போதெல்லாம் தேசிய மக்கள் சக்திக்கு வாக்களித்த அனைவரும் என்ன செய்யவேண்டுமென்று Hon. (Dr.) Ramanathan Archchuna நேற்றுச் சொல்லிவிட்டார். அதாவது, வலது கையால் சாப்பிட வேண்டாம், இடது கையால் சாப்பிட வேண்டுமென்று சொல்லிவிட்டார். மீண்டும் அதைச் சொல்ல வேண்டிய அவசியம் இல்லை.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
முடித்துக் கொள்கிறேன்.

அந்த வகையிலே, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் வரவு செலவுத்திட்ட நிதியொதுக் கீட்டுக்கு எதிராக இலங்கைத் தமிழரசுக் கட்சி வாக்கெடுப்பொன்றைக் கோருகின்றது. இந்த வாக்கெடுப்புக்கு எங்களுக்கு ஒத்துழைப்பை வழங்குவீர்கள் என்று நான் எதிர்பார்க்கின்றேன். குறிப்பாக, இரண்டு விடயங்களுக் காகவே நாங்கள் வாக்கெடுப்பைக் கோருகின்றோம். ஒன்று, மாகாண சபைத் தேர்தல் நடத்தப்படாமைக்கு எதிரானது; இன்னொன்று, கல்முனை வடக்கு பிரதேச செயலகம் சம்பந்தமாக எங்களுக்கும் ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸுக்குமிடையில் மாறுபட்ட கருத்துகள் இருந்தாலும் இந்த அரசாங்கம் கடந்த ஒரு வருட காலமாக கல்முனை வடக்கு பிரதேச செயலகத்தை வைத்து தமிழ் - முஸ்லிம் மக்களுக்கிடையில் தொடர்ந்தும் குழப்பங்களை ஏற்படுத்துவது. அரசாங்கம் ஆட்சியில் இருக்கிறது; குழுவொன்றை நியமித்து ஆராய்வதாகச் சொல்லியது. ஆனால், ஒரு வருடம் கடந்தும் குழுவும் இல்லை எதுவும் இல்லை. கல்முனையில் உள்ள தமிழ் பேசும் மக்கள் இன்றும் ஒருவரோடொருவர் முரண்பாட்டுடன் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். இந்த இரண்டு விடயங்களுக்காகவும் இன்று பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சின் நிதி ஒதுக்கீடுகளுக்கு எதிராக இலங்கைத் தமிழரசுக் கட்சி வாக்கெடுப்பொன்றைக் கோருகின்றது. நீங்கள் வடக்கு, கிழக்கில் மாகாண சபைத் தேர்தலை இன்று நடத்தினாலும் தோல்வியடைவீர்கள்! இன்னும் 6 மாதத்தின் பின் நடத்தினாலும் தோல்வி யடைவீர்கள்! ஒரு வருடத்தின் பின் நடத்தினாலும் தோல்வியடைவீர்கள்! நீங்கள் மாகாண சபைத் தேர்தலை நடத்தாமலே விட்டாலும் எதிர்வரும் பாராளுமன்றத் தேர்தலிலே நீங்கள் முழுமையாக விரட்டியடிக்கப்படுவீர்கள்! என்பதை இந்த இடத்தில் பகிரங்கமாகச் சொல்லுகின்றேன். நன்றி!

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Point of Order එකක් නැතුව කොහොමද ඔබතුමා කථා කරන්නේ?

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මොකක්ද? Point of Order එක තමයි, මගේ නම කියපු එක. එතුමා මගේ නම කියලා ප්‍රකාශයක් කළා. *[බාධා කිරීමක්]* අර්ච්චුනා මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉන්න. ආන්, චූන් වුණා. හැම වෙලාවේදීම චූන් වෙන්න එපා, මේ පාර්ලිමේන්තුවේ කාලය කා දමන්න. මම එක් දෙයක් කියන්න ඕනෑ. ගුරුවරුන්ගේ ප්‍රශ්නය මම බලා ගන්නම්. ඒකට කවුරුත් වද වෙන්න ඕනෑ නැහැ. ඒ වාගේම, රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට මේ කාරණය කියන්න ඕනෑ. සද්දවලට අපි භය නැහැ. ඔයිට වඩා අපි සද්ද දාලා තිබෙනවා; සද්ද දැකලා තිබෙනවා. අපි සද්දවලට භය නැහැ. ඒක හොඳට මතක තබා ගන්න. යක්කුන්ට භය නම් සොහොනේ ගෙවල් හදන්නේත් නැහැ. ඒකත් හොඳට මතක තියා ගන්න. පළාත් සභා මැතිවරණය පවත්වන එක ගැන අපි ඉතා පැහැදිලිව කියලා තිබෙනවා. එදා ගරු ජනාධිපතිතුමාත් පාර්ලිමේන්තුවේදී ඒ ගැන කිව්වා. ඒ වාගේම අපි නැවත නැවතත් පළාත් සභා මැතිවරණය ගැන කියලා තිබෙනවා. ඒ නිසා නිකම් සද්දය දාලා අපිව යට කරන්න හදනවා නම්, ඒවාට නම් අපි භය නැහැ මහත්තයෝ. ඒක හොඳට මතක තියා ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, විවාදයේ අවසානය,-

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට තත්පර 30ක් දෙන්නම්.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මගේ කට හඬින් සද්දෙන් කථා කළේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ගති ලක්ෂණවලින් මට මෙතැන බලපෑම් කරලා භය කරන්න හදනවා. මේගොල්ලන්ගේ ඉතිහාසය ගැන කථා කරන්න අපි ආවේ නැහැ. මම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඡන්දයෙන් තේරී පත් වෙලා පාර්ලිමේන්තුවට ආපු නිසා මට කෑ ගහන්න පුළුවන්; අඬලා කථා කරන්නත් පුළුවන්; හෙමින් කථා කරන්නත් පුළුවන්. ඔහොම තර්ජනය කරන්න එන්න එපා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කරපු කාලය ගියා. මතක තියා ගන්න. මිනී මැරුම් කරපු කාලය ගියා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි මේ විවාදය අවසන් කළ යුතුයි.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
එතුමා මට අපහාස කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා මටත් කථා කරන්න විනාඩියක් දෙන්න.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න අමාත්‍යතුමා.

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ෂාණක්කියන් මන්ත්‍රීතුමා සඳහන් කළා, පළාත් සභා මැතිවරණය පිළිබඳව වාගේම එතුමා ඉදිරිපත් කරපු පෞද්ගලික මන්ත්‍රී යෝජනාව පිළිබඳව. ඊට අදාළ කාරණා අද උදේ මම ඉදිරිපත් කළා. එතුමා,"මගේ කොන්දක් තිබෙනවා නම්..." වාගේ කථාවකුත් කිව්වා. මම එතුමාට අභියෝග කරනවා, කොන්දක් තිබෙනවා නම් Lobby එකේදී මාත් එක්ක කියපු කථාව පාර්ලිමේන්තුව ඇතුළේ දී කියන්න කියලා. Lobby එකේදී එතුමා කිව්වේ, "අපි ගිහිල්ලා අපේ මිනිස්සුන්ට මොනවා හෝ කියන්නත් ඕනෑ නේ" කියලා. ඒක තමයි ඇත්ත. ඒක තමයි ප්‍රශ්නය. අපි පළාත් සභා මැතිවරණය අනිවාර්යයෙන්ම පවත්වනවා. ඊට අදාළ නීතිමය කරුණු ටිකක් විසඳා ගන්න තිබෙනවා. ඒකට අදාළ යෝජනාව අපි ඉදිරිපත් කරලා තිබෙනවා. පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේදී ඔබතුමන්ලා සියලු දෙනාටම පුළුවන්, ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කරලා අවශ්‍ය කටයුතු කරන්න. එහෙම කරලා අපිට මැතිවරණය පවත්වන්න පුළුවන්. අපි මැතිවරණය කල් දාන්න භය නැහැ. මෙවර අපි ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. භයක් නැහැ, මැතිවරණය පවත්වන්න. අපි මැතිවරණය කල් දාන්නේ නැහැ, කිසිසේත්ම. ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ඒ අනුව මැතිවරණය පවත්වනවා. දීර්ඝ කාලයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ හිටපු අය ඇති. නමුත්, අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග අරගෙන තිබුණේ නැහැ. දීර්ඝ කාලයක් තිස්සේ පැවැති සාකච්ඡාවකින් පසුව තමයි මේ මැතිවරණය නතර වෙලා තිබෙන්නේ. ඒ නිසා අපිට ඒක කඩිනමින් විසඳන්න පුළුවන්කමක් නැහැ. විධිමත් ක්‍රමවේදයකට අනුව අපි ඒ සඳහා අවශ්‍ය මැදිහත්වීම කරලා මැතිවරණය පවත්වනවා. ඒ පිළිබඳව සැකයක් තියා ගන්න එපා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අපි මේ විවාදය අවසන් කරමු.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම ඔබතුමාට තත්පර 30ක කාලයක් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
මගේ point of Order එක මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. Standing Order No. 91(h), සභාව නොමඟ යැවීම. මෙතුමා සභාව නොමඟ යවනවා. මම Lobby එකේදී හමු වෙලා එතුමාට කිව්වේ නැහැ, මගේ ගෙදරට පාරක් දාලා දෙන්න කියලා. මම එතුමාට කිව්වේ, "අපේ ජනතාව දිගින් දිගටම පළාත් සභා මැතිවරණය පවත්වන්න කියලා ඉල්ලනවා. අපිත් ජනතාවට ගිහිල්ලා පිළිතුරක් කියන්න ඕනෑ. මම ඉදිරිපත් කළ පළාත් සභා Bill එක ගැන ඔබතුමා මාස 6ක් ඇතුළත report එකක් දෙන්න ඕනෑ. ඒ report එක ගැන මොනවා හෝ කියන්න. එතකොට තමයි ජනතාවට ගිහිල්ලා කියන්න පුළුවන් වෙන්නේ" කියායි. එහෙම නැතුව මේ සභාව නොමඟ යවන්න එපා, Lobby එකේදී කියපු දේ මෙතැනදී කියන්න කියලා. Lobby එකේදී මම ඔබතුමාගෙන් මොනවා හෝ ඉල්ලුවාද? ඉල්ලුවේ නැහැ නේ. බොරු කියන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. කාරණය පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.49]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වැය ශීර්ෂත්, කම්කරු අමාත්‍යාංශයේ වැය ශීර්ෂත් පිළිබඳව අද දින පැවති විවාදය අවසානයේ කරුණු දැක්වීමයි මම සිදු කරන්නේ. විශේෂයෙන්ම මම කම්කරු අමාත්‍යවරයා විධියට කම්කරු අමාත්‍යාංශය සම්බන්ධයෙන් සහ එහි විෂය පථය වාගේම කරන ලද වැඩකටයුතු සහ එහි ප්‍රගතියත්, අපි ඉදිරියේදී කටයුතු කරන්න බලාපොරොත්තු වෙන කරුණු ගැනත් කථා කරන්න සූදානම්. ඒකට ප්‍රවේශයක් ලබා ගැනීම සඳහායි මම මේ අවස්ථාවේදී මුල පුරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම කම්කරු අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රධාන ආයතනයක් තමයි, කම්කරු දෙපාර්තමේන්තුව. කම්කරු අමාත්‍යාංශයත්, කම්කරු දෙපාර්තමේන්තුවත්, ඒ හා බැඳුණු ආයතන පිළිබඳවත් සමාජයේ ඇති වෙලා තිබුණු ප්‍රතිරූපය හා මතය හොඳ එකක් නොවෙයි. වැඩක් කෙරෙන්නේ නැහැ, රස්තියාදු වෙනවා වාගේ ප්‍රතිරූපයක් තමයි ඒ සම්බන්ධයෙන් තිබුණේ. විශේෂයෙන්ම යම් යම් දේවල් යටතේ කම්කරුවන්ට වන්දි ලබා ගන්න ගියාම ඇති වන තත්ත්වයන් සැලකිල්ලට භාජන කළාම හොඳ තත්ත්වයක් නොවෙයි, වැරදි ප්‍රතිරූපයක් තමයි තිබුණේ. මේ මොහොත වෙනකොට අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, ඒ ප්‍රතිරූපය ක්‍රමයෙන් හොඳ පැත්තට පරිවර්තනය කර ගන්න. විශේෂයෙන්ම කම්කරු අමාත්‍යාංශයේ නිලධාරින්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (PROF.) SENA NANAYAKKARA left the Chair and THE HON. SPEAKER took the Chair.*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු සභාපතිතුමනි, අපට පුළුවන් වුණා, අවුරුද්දක් වැනි කෙටි කාලයක් ඇතුළත දී අනෙකුත් ක්ෂේත්‍ර වාගේම කම්කරු අමාත්‍යාංශය පිළිබඳවත් සමාජය තුළ තිබුණු ප්‍රතිරූපය ක්‍රමයෙන් වෙනස් කරන්න. අපට තව ගොඩක් වෙනස් කරගත යුතු දේවල් තිබෙනවා. මම පළමුකොටම කම්කරු අමාත්‍යාංශයේ සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ට ස්තුතිවන්ත වෙනවා, මේ වෙනුවෙන් මැදිහත්වෙලා වැඩ කටයුතු කිරීම සම්බන්ධව. විශේෂයෙන් ඩිජිටල්කරණය හරහා තාක්ෂණය අපේ වැඩකටයුතුවලට සම්බන්ධ කර ගනිමින්, මහජනතාව කම්කරු අමාත්‍යාංශයේ ආයතනවලට ඇවිල්ලා කාලය මිඩංගු කරන, රස්තියාදු වෙන ක්‍රමය වෙනුවට තාක්ෂණය උපයෝගී කර ගනිමින් නව ක්‍රමවේද හරහා ඉදිරියට වැඩකටයුතු කරන්න අපි සූදානම් වෙමින් ඉන්නවා.

ඒ වාගේම මෙතැනදී සඳහන් කරන්න ඕනෑ, කොච්චර දුරට මේ ප්‍රතිරූපය බිඳ දැමුවාද කියන එක ගැනත්. ඔබ කවුරුත් දන්නවා, "මෙහෙවර පියස" කියලා විශාල ගොඩනැඟිල්ලක් කම්කරු අමාත්‍යාංශය යටතේ තිබෙන බව. හැබැයි, පසුගිය කාල වකවානුවල සිදු කළ විවිධ දේවල් අතරේ, ප්‍රධාන වශයෙන් මෙය මහජනතාවට කාර්යක්ෂම සේවයක් සපයන ආයතනයක් බවට පරිවර්තනය කරනවා වෙනුවට, ඒ හිටපු මැතිඇමතිවරු කටයුතු කර තිබුණේ තමන්ගේ අභිමතාර්ථ අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටයි. ඒකට මම උදාහරණයක් කියන්නම්. 2024 මැතිවරණ පැවැත්වීමට මාසයකට දෙකකට පෙර -2024 අගෝස්තු මාසයේ- ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවක් තිබෙනවා. කම්කරුවන්ට සේවය සැපයීම, පහසුකම් දෙන මුවාවෙන් "මෙහෙවර පියස" ගොඩනැඟිල්ලේ 31වැනි තට්ටුවට canteen එකක් ඇතුළුව තවත් දේවල් යෝජනා කරන ගමන් *à la carte* menus සහිත restaurant එකක් සහ night club එකක් ඇති කරන්න කියලාත් යෝජනා කරලා තිබෙනවා. ඒ පිළිබඳ කැබිනට් පත්‍රිකාව තිබෙනවා. හැබැයි, ඔවුන්ට එය ක්‍රියාත්මක කරන්න කාල වේලාව ලැබුණේ නැහැ. මෙවැනි දේවල් වෙනුවෙන් තමයි හිටපු මැතිඇමතිවරුන් යුහුසුළුව වැඩකටයුතු කරලා තිබුණේ.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

නොවැම්බර් 14වැනි දා විසර්ජන පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම සම්මත වුණා. එහි දී විශේෂයෙන් තිරසර සංවර්ධනයක්, ණය තිරසරභාවය, අපනයන ප්‍රවර්ධනය කිරීම, නිෂ්පාදන ආර්ථිකයක්, දූෂ්පත්කම තුරන් කිරීම සහ ඩිජිටල්කරණය කියන තේමා 6ක් යටතේ මුදල් වෙන් කිරීම සිද්ධ කළා. ඒ අනුව අපි පැහැදිලිව පෙන්නුවා, ගිය අය වැය වාගේම මේ අය වැය යටතේදිත් රාජ්‍ය මූල්‍ය විනය පෙන්නුම් කරන්නේ කොහොමද කියලා. ඒ වාගේම අපි එකඟ වෙලා තිබෙන framework එක යටතේ වැඩකටයුතු කරන්නේ කොහොමද කියලා. එහිදී ඉතා වැදගත් වෙනවා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය මූල්‍ය විනය ඇතුළේ අය වැය පරතරය අපට පාලනය කරන්න පුළුවන් සීමාවක් ඇතුළේ පවත්වාගෙන යාම. ඒක අපි ගිය අය වැයෙනුත් පෙන්නුවා. මේ අය වැයෙනුත් නිසි පරිදි පෙන්වලා තිබෙනවා. අපට පුළුවන්කම ලැබුණා, 2026 අය වැය තුළ අය වැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 5.1 දක්වා අඩු කරන්න. අතීතයේ හැම දාමත් වුණේ, අපි ඇස්තමේන්තු කරන අය වැය පරතරයට වඩා වැඩි අය වැය පරතරයකින් රාජ්‍ය මූල්‍ය අවසන් කිරීමයි. එහි ප්‍රතිඵලයක් විධියට වැඩිපුර ණය ගන්න, ණය උගුලට තව බර පටවන්න සිද්ධ වුණා. හැබැයි, අපට අපේ ආණ්ඩුව යටතේ පුළුවන්කම ලැබුණා, අර්බුදයක් පැවති තත්ත්වයකදී රාජ්‍යය අරගෙන එය ස්ථායීකරණය කිරීමේදී අය වැය පරතරය ක්‍රමිකව අඩු කරගෙන, ණය ගැනීමේ අවශ්‍යතාව සහ සීමාව පල්ලෙහාට ගෙන එන්නට.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
Order, please! පාර්ලිමේන්තුව යළි රැස්වේ.

*ඊට අනුකූලව පාර්ලිමේන්තුව එක්රැස් විය.*
*அதன்படி பாராளுமன்றம் மீண்டும் கூடியது.*
*Accordingly, Parliament resumed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින සභාවේ වැඩකටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

*කාරක සභාවෙහිදී තවදුරටත් සලකා බලන ලදී -*
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***

*குழுவில் மேலும் ஆராயப்பட்டது. -*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered further in Committee. -*
*[THE HON. SPEAKER in the Chair.]*

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
ගරු සභාපතිතුමනි, මම සඳහන් කරමින් හිටියේ අපේ මූල්‍ය විනය ඇතුළේ අය වැය පරතරය අඩු කරමින් ණය සීමාව අඩු කර ගත්තේ කොහොමද කියන එක ගැනයි. ඒ නිසාම තමයි අපි මේ වසර ඇතුළේදී අත්පත් කර ගත්තු ස්ථාවරභාවයෙන් අප ඔබ්බට යන්නට ඕනෑ. මේ අර්බුදයෙන් රට ගොඩ ගන්න, සංවර්ධනය කරන්න, ආර්ථික වෘද්ධිය ගෙනෙන්න, ගම දක්වා මේ සංවර්ධනය ගෙන යන්න අවශ්‍යයි. මොකද, ප්‍රාදේශීය වශයෙන් ආර්ථික විෂමතා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය වන ප්‍රධාන කාරණා ඇතුළේ තිබෙන එකක් තමයි ආයෝජන කැන්දා ගැනීම. අන්න ඒ ආයෝජන කැන්දා ගැනීමට ආයෝජකයන්ගේ විශ්වාසය ගොඩ නඟා ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් තිබෙන මොහොතකයි අපි අද මේ විවාදය සිදු කරන්නේ.

අපි මේ මූල්‍ය විනය තවදුරටත් විශ්ලේෂණය කරලා බැලුවොත්, අපේ පඩි නඩි ගෙවන්න රුපියල් බිලියන 1,464කුත්, විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා රුපියල් බිලියන 510කුත් අවශ්‍ය වනවා. ඒවා අනිවාර්යයෙන්ම ගෙවිය යුතුයි. ඊට අමතරව ණය පොලිය විධියට රුපියල් බිලියන 2,617කුත් වශයෙන් ගත්තාම, අපි රුපියල් 100ක ආදායමක් හොයන කොට එයින් විශාල ප්‍රමාණයක් මේ සඳහා වැය වෙනවා. එම නිසා අපට ඉතාම සැලකිලිමත්ව, සැලසුම් සහගතව මේ කටයුතු කරන්න සිද්ධ වෙනවා. එහිදී ආයෝජනවලට අමතරව විශේෂයෙන් කම්කරු අමාත්‍යාංශය පැත්තෙන් සැලකුවත්, මේ රටේ තිබෙන විභවතා පැත්තෙන් ගත්තත්, අපේ රට සංවර්ධනය කිරීමේදී අනෙකුත් කාරණාවලට අමතරව මානව සම්පත සංවර්ධනය කිරීම ඉතාම වැදගත් වෙනවා. අපට ලොකු විභවතාවක් තිබෙනවා, හැකියාවක් තිබෙනවා, අධ්‍යාපනයෙන් ඉහළ ප්‍රගතින් අත් පත් කර ගනිමින් ඉන්නවා. ඒ වාගේම නව ප්‍රතිසංස්කරණ අපි යෝජනා කරලා තිබෙනවා. ඒ, මානවයාගේ හැකියාව, ධාරිතාව වර්ධනය කර ගැනීම සඳහායි. මේ අය වැයේදි ඒ සඳහා ප්‍රමුඛ වෙන සෞඛ්‍ය සහ අධ්‍යාපනය වෙනුවෙන් අපි ප්‍රාථමික වියදම්වලින්, -අපට වෙන් කරන්න, පාලනය කරන්න තිබෙන්නේ ප්‍රාථමික වියදම්- සියයට 30ක්; තුනෙන් පංගුවක්ම වෙන් කරනවා. එහිදි වැදගත් වෙනවා, මානව සම්පත දියුණු කර ගැනීම.

ගරු සභාපතිතුමනි, මේ විවාදයේදී යම් යම් චෝදනා ඉදිරිපත් කළා. මම ඒ ඔක්කෝටම පිළිතුරු දෙන්න යන්නේ නැහැ. එකක්, දෙකක් පමණක් ගන්නම්. ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන වියදම් පිළිබඳව වැරැදි තොරතුරු සමාජගත කළා. විපක්ෂයෙන් කියා සිටියා, 2025 වර්ෂයේදී තමයි අඩුම ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය පෙන්නුම් කරන්නේ කියලා. ඒක වැරදියි. තවම 2025 වර්ෂය අවසාන වෙලා නැහැ. ඔක්තෝබර් මාසය අවසන් වනකොට ප්‍රතිශෝධිත ප්‍රාග්ධන වියදම්වලින් අපි සියයට 58ක් වැය කරලා තිබෙනවා. අතීතය බැලුවාම, ඒ චෝදනාව කරපු මන්ත්‍රීතුමා හිටපු ආණ්ඩු කාලයේම තමයි -2016දී තමයි- ඉතිහාසයේ අඩුම ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය වාර්තා කරලා තිබෙන්නේ. ඒ තොරතුරු ඒ අය කියන්නේ නැහැ. ඒ ප්‍රතිශතය කීයද? 50.2යි. ඒ, 2016 වර්ෂයේදී තිබූ ප්‍රාග්ධන වියදම් ප්‍රතිශතය. මෙවැනි තත්ත්වයන් තිබෙද්දී තමයි අනවශ්‍ය චෝදනා ඉදිරිපත් කරන්නේ. අපි සංසන්දනය සඳහා සැප්තැම්බර් මාසය විතරක් අරගෙන බැලුවත්, 2019න් පසුව, 2020 වසරේ සිට 2025 වසර වෙනකොට ප්‍රතිශෝධිත ප්‍රාග්ධන වියදම්වලින් වැඩිම අගය තමයි 2025දී වාර්තා කරලා තිබෙන්නේ. සැප්තැම්බර් මාසය වනකොට සියයට 45.3ක් වැය කරලා තිබෙනවා. ඊට කලින් හැම වර්ෂයකදීම ඊට වඩා අඩු තත්ත්වයක් තමයි වාර්තා කරලා තිබෙන්නේ.

ඊළඟට, කම්කරු දෙපාර්තමේන්තුවේ කාරණා කෙරෙහි අවධානය යොමු කළොත්, කම්කරු අමාත්‍යාංශය යටතේ මුදල් වියදම් නොවන වැඩසටහන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. වැය බර විධියට ගත්තාම කම්කරු අමාත්‍යාංශයට රුපියල් මිලියන 6,400ක් වෙන් වෙනවා. ඉන් පුනරාවර්තන වියදම් විධියට මිලියන 5,200ක්, ප්‍රාග්ධන වියදම් විධියට රුපියල් මිලියන 1,200ක් වෙන් වෙනවා. පුනරාවර්තන වියදම් ඇතුළේ විශේෂ වූ වැඩසටහන් තිබෙනවා, පඩි නඩිවලට අමතරව. ජාත්‍යන්තර ආයතන සමඟ සම්බන්ධ වෙලා අපට වැඩකටයුතු කරන්න අපට සිද්ධ වෙනවා.

මෙහිදී වෘත්තීය ශ්‍රමයේ ගුණත්වය ඉහළට නැංවීම, ජාත්‍යන්තර තිබෙන සම්මුතීන් සමඟ එක්ව වැඩකටයුතු කිරීම සඳහා මුදල් වෙන් වීම, ඒ වාගේම මහජනතාව සහ සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවා.

ඊළඟට, කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ක්ෂේත්‍ර සැලකිල්ලට භාජන කළොත්, කම්කරු අමාත්‍යාංශය යටතේ කම්කරු දෙපාර්තමේන්තුව, මිනිස්බල සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව, ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය, ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය, කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රම වාසනා අරමුදල යනුවෙන් ක්ෂේත්‍ර 6ක් තිබෙනවා.

මම මේවායේ ප්‍රගතිය පිළිබඳ කරුණු ටිකක් සැකෙවින් ඉදිරිපත් කරන්නම්. පොදුවේ ගත්තාම, අපේ ශ්‍රම බලකාය දියුණු කිරීමේදී, මානව සම්පත දියුණු කිරීමේදී විශේෂ අවධානයක් යොමු කරන්න සිද්ධ වෙනවා, කාන්තා ශ්‍රමය සම්බන්ධයෙන්. අපේ ශ්‍රම බලකායෙන් කාන්තාව ශ්‍රමය යෙදවීමේ ප්‍රතිශතය සියයට 31ක් තරම් අඩු ප්‍රමාණයකයි තිබෙන්නේ. අපට අවශ්‍ය කරන ආර්ථික වෘද්ධිය, වේගය ළඟා කර ගන්න එම ප්‍රතිශතය ඉහළට ඔසවන්න ඕනෑ. කම්කරු අමාත්‍යාංශය විධියට අපේ අමාත්‍යාංශයේත්, අනෙකුත් අමාත්‍යාංශවලත් මේ සඳහා වැඩ කටයුතු කරනවා. අපි විවිධ වූ වැඩසටහන් යෝජනා කරනවා, ඒ අනෙකුත් අමාත්‍යාංශත් එක්ක සම්බන්ධ වන අතරතුරේදී. විශේෂයෙන්ම ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ තිබෙන සම්මුතීන්වල C190; සේවයේ යෙදී සිටීමේදී තිබෙන හිංසනය සහ ප්‍රචණ්ඩත්වය පිටු දැකීම කියන කාරණය සම්බන්ධයෙන් වන සම්මුතියට අපරානුමිතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිද්ධ කරලා, ඉදිරියේදී -මේ වර්ෂය අවසාන වන කොට- ඊට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා අපි වැඩ කටයුතු කරමින් ඉන්නවා.

ඒ වාගේම, වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය ඉතාම වැදගත්. ඒ සම්බන්ධයෙනුත් සම්මුතියක් තිබෙනවා. අපි ඒ අනුව වැඩ කටයුතු කරමින් ඉන්නවා. ඒවායේ යම් සංකීර්ණතා තිබෙනවා; ගැටලු තිබෙනවා. ඒවා අධ්‍යයනය කරනවා; අදාළ වැඩමුළු පවත්වමින් ඉන්නවා. මොකද, අපි මේ සඳහා අපරානුමිතිය ලබාගත යුතු වෙනවා. එක පැත්තකින්, වැඩ කරන සේවකයාගේ සෞඛ්‍ය තත්ත්වය, වෘත්තීමය තත්ත්වය ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒවා හරියාකාරව ආරක්ෂා කර ගත්තේ නැත්නම් ආර්ථිකයට අනවශ්‍ය බරපැනක් පැටවෙනවා. දැනට කරලා තිබෙන අධ්‍යයනවලින් ඔප්පු වෙනවා, විශේෂයෙන් සෞඛ්‍ය ගැටලු සහ ආරක්ෂාව පිළිබඳ ගැටලු හේතුවෙන් සේවකයන්ට ඇති වන අනතුරු, ජීවිත හානි නිසා දළ දේශීය නිෂ්පාදිතයට හානි සිදු වන බව. එය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ත්, 5ත් අතර ප්‍රමාණයක් වනවා. එය අවම කිරීම සඳහාත් අපි වේගයෙන් කටයුතු කරමින් ඉන්නවා.

ඊළඟට, කාන්තා ශ්‍රමය පැත්තෙන් ගත්තාම, ILO C103 කියන මාතෘ ප්‍රතිලාභ සම්බන්ධයෙන් වන සම්මුතියේදී ගැටලුවක් පැන නඟිනවා. මාතෘත්වය සම්බන්ධයෙන් අදාළ නිවාඩු ලබා දිය යුතු වෙනවා. නමුත් ඒ වගකීම සම්පූර්ණයෙන් සේවා යෝජකයා මත පැටවෙන කොට ඇති වන තත්ත්වය තමයි, ඒ සේවා යෝජකයන් කාන්තාවන් සේවයේ යොදවා ගැනීමට යම් මැළිකමක් දක්වන එක. අපි එය වෙනස් කර ගැනීම සඳහා; කාන්තාවන් වැඩිපුර ශ්‍රමය යෙදවීම සඳහා වූ වැඩ කටයුතු යෝජනා කරමින් ඉන්නවා, නව සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළ පිළිබඳව ද සාකච්ඡා කරමින් ඉන්නවා. ඒ වාගේම, කාන්තාවන් ශ්‍රමය යෙදවීමේදී අපට තිබෙන නීතිමය රාමුව අනුව, කාන්තාවන් රාත්‍රියේ සේවයේ යෙදවීමේදී ගැටලු පැන නැඟිලා තිබෙනවා. කෙසේ වෙතත්, විශේෂයෙන් සංචාරක කර්මාන්තයේ, ආහාර පාන සපයන ක්ෂේත්‍රවල රාත්‍රි වැඩ කටයුතු කිරීමේදී ඒ සඳහා අවසරය ලබා දෙන නීති අපි සකස් කර තිබෙනවා. අපි සේවා යෝජකයන් එක්ක සාකච්ඡා කරලා යම් යම් කොන්දේසිවලට යටත්ව ඔවුන්ට අවශ්‍ය ආරක්ෂාව සැපයීම, ආහාර පාන ලබා දීම, නවාතැන් ලබා දීම කියන කටයුතුත් ඇතුළුව ඒ සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් යොමු කර තිබෙනවා.

ඒ වාගේම, විශේෂයෙන් සමාජයේ කථා බහට ලක් වුණා, අපේ කම්කරු නීති රීති ගැන. අපේ රටේ තිබෙන කම්කරු නීති රීති අරගෙන බැලුවාම, ඒවායින් වැඩි ප්‍රමාණයක් අවුරුදු 50කටත් වඩා පැරණියි. නව සමාජයට, නව ලෝකයට ගැළපෙන විධියට ඒවා වෙනස් කරගත යුතු වෙනවා. අපි බලයට එනකොටත් යම් ආකාරයක නීති සංශෝධනයක් කර තිබුණා. නමුත් එය අරගෙන බැලුවාම, එය අවසාන වෙලා නැති බවත්, එහි ගැටලු ගණනාවක් නිර්මාණය වෙලා තිබෙන බවත් පෙනී ගියා. ඒ නිසා අපි වේගයෙන් පත් කළා, විද්වතුන්ගේ කමිටුවක්. දැනට අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් එවැනි විද්වතුන් 17දෙනෙකු සිටින කමිටුවක් මඟින් මේ කාරණා කටයුතු සාකච්ඡා වෙමින් යනවා. දැනටත් අපි සාකච්ඡා නොකරපු, නව ලෝකයට ගැළපෙන නීතිත් මෙතැනට ඇතුළත් කරලා ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ ඉදිරියේදී ඒ නීති ඉදිරිපත් කරනවා.

මෙහිදී විශේෂත්වයක් තිබෙනවා. අපේ නීති රීති හදන කොට අතීතයේ තිබ්බෙ භාවිතාව තමයි, ඒ නීති රීති හදන්න එන විවිධ පාර්ශ්ව; සේව්‍යයා, සේවකයා, රාජ්‍ය ආයතනය කියන තුන් පාර්ශ්වයෙන් කේවල් - bargain - කිරීමේ ක්‍රමවේදයක් හරහා තමයි, ඒ අණ පනත් සම්මත කර ගැනීම සිද්ධ වුණේ. හැබැයි අප මෙය පටන් ගන්න කොටම සභාපතිතුමා මෙහි අරමුණ ඒ කමිටුවට පැහැදිලි කළා. අපේ අරමුණ වන්නේ මෙයයි. මේ අණ පනත් හදන කොට ප්‍රශ්න නිර්මාණය කරලා ඒ ප්‍රශ්නවලට උත්තරය හොයනවා වෙනුවට, තමන්ගේ කේවල් කිරීමේ ශක්තිය මත අලුත් නීති රීති හදනවා වෙනුවට වඩාත් හොඳ කාර්මික සාමයක් අපට අවශ්‍ය කරනවා; හොඳ නිෂ්පාදන සම්බන්ධතා ගොඩනැඟෙන, එකිනෙකා අන්‍යෝන්‍ය වශයෙන් විශ්වාස කරන, අවබෝධ කර ගන්නා ආකාරයෙන් මේ අණ පනත් හදන්න අපට අවශ්‍ය කරනවා. ඒ සඳහා තමයි විවිධ කණ්ඩායම් එතැනට යොමු කරලා තිබෙන්නේ. එහි ප්‍රගතිය හොඳ මට්ටමක තිබෙනවා. මේ වර්ෂය අවසානය වන කොට එහි දළ කෙටුම්පත ඉදිරිපත් කරලා ලබන අවුරුද්දේ මුලදී ඒ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අපි අදහස් කරනවා. ඒ අනුව වැඩ කටයුතු කරන්න අදහස් ලබා ගැනීමට වෘත්තීය සමිති සහ ඇල්මක් දක්වන පාර්ශ්වවලට අපි මෙය විවෘත කරනවා, දෙසැම්බර් මාසයේදී. ඒ වාගේම තමයි, නව සම්බන්ධතා ගොඩනඟන කොට ගැටුම්කාරී සම්බන්ධතාවකදී ශ්‍රමයේ ඵලය, ඵලදායිත්වය, කාර්යක්ෂමතාව ඉහළට ගන්න බැහැ. ඒ නිසා අපට අවශ්‍ය කළා හැම තිස්සේම සම්මුතීන්, එකඟතාවන් සහ ඒ වැඩ කිරීමේදී රට ඇතුළේ ත්‍රෛපාර්ශ්විකව සාකච්ඡා සිදු කිරීමට.

කම්කරු උපදේශක සභාව 2023 ඉඳලා කැඳවා තිබුණේ නැහැ. අපි ආණ්ඩුව පිහිටුවූ සැනින් ඒ සභාව කැඳෙව්වා විතරක් නොවෙයි, අමාත්‍යවරයා විසින් ඒ සභාව පත් කිරීමේදී කාන්තා නියෝජනත්වය වැඩි කළා. ඒ නිසා ඒ රැස්වීම්, උපදේශන සභා ඉතාම සුහද මට්ටමින් යනවා; වාද විවාද කරනවා; එකඟතා ඇති වෙනවා. ඔවුන් විසින්ම සේවක පාර්ශ්වයෙනුත්, සේව්‍යයන්ගේ පාර්ශ්වයෙනුත්, කම්කරු අමාත්‍යාංශයට, නිලධාරින්ට වැඩ කිරීමේ කලාව පිළිබඳව විශේෂ ඇඟැයීම් ඉදිරිපත් කරනවා. අපි ඒක විශේෂයෙන් සඳහන් කරන්නට ඕනෑ. ඒ අනුව මේ වනකොට අපි අපේ ආණ්ඩුව යටතේ එවැනි රැස්වීම් 6ක් පවත්වා තිබෙනවා; අනුකමිටු රැස්වීම් 6ක් පවත්වා තිබෙනවා. ඒවාත් වේගයෙන්

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඉදිරියට යනවා. පසුගිය දා අපේ ගරු ජනාධිපතිතුමා අයවැය කථාව ඉදිරිපත් කරමින් වතු ක්ෂේත්‍රයේ වැටුප් වැඩි වීම ගැනත් කථා කළා. එහිදී අප එකවර නියෝගයක් කරලා වැටුප් වැඩි කිරීමකට නොයා විවිධ ආකාරයේ සාකච්ඡා ගණනාවකට ගියා. ඒ සාකච්ඡාවලදී විශේෂයෙන් ජනාධිපතිතුමාගේ මැදිහත්වීම, මහ පෙන්වීම මත, ඔවුන්ගේ එකඟතාව මත, වැටුප් වැඩි කිරීමෙන් ඔවුන්ට ඇති වන මූල්‍ය පීඩනය අවම කර ගැනීම සඳහා තනිව තෝරලා තනි සමාගමකට දෙනවා වෙනුවට, තමුන්ගේ හිතවතෙකුට යම් රාජ්‍ය මුදල් වෙන් කිරීමක් කරනවා වෙනුවට, කර්මාන්තය වෙනුවෙන් පොදුවේ ඒ රාජ්‍ය මුදලත් වෙන් කළා, කර්මාන්තය දියුණු කර ගැනීම සඳහා. එවැනි ආදර්ශයනුත් අපි ලබා දී තිබෙනවා.

ඒ වාගේම ආන්දෝලනයට තුඩු දෙන තවත් කාරණයක් තමයි ළමා ශ්‍රමය සහ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම. 2025දී ලංකාවෙන් ළමා ශ්‍රමය සම්පූර්ණයෙන් ඉවත් කිරීම සඳහා අපි වැඩ කටයුතු කරමින් ඉන්නවා. මෙයට වැඩි ප්‍රවණතාවක් තිබෙන ධීවර සහ වතු ක්ෂේත්‍රවල ළමා ශ්‍රමය ඉවත් කිරීමට මැදිහත් වන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් අපි පියවර ගනිමින් ඉන්නවා. අපි ක්ෂේත්‍ර පරීක්ෂණ වැඩි කර තිබෙනවා; සේවා යෝජකයන් දැනුවත් කිරීම් කර තිබෙනවා. අධ්‍යාපන වැඩසටහන් මඟිනුත් මේ කටයුත්ත වේගයෙන් ස්ථාපිත කරමින් ලංකාවෙන් ළමා ශ්‍රමය සහ බලහත්කාරයෙන් ශ්‍රමයේ යෙදවීම තුරන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. නීතිමය පැත්තෙන් ගත්තත්, දැනට ළමා ශ්‍රමය යොදවා තිබුණොත් ඒ සඳහා වන අවම දඩ මුදල රුපියල් 10,000යි. අපි නීති, අණ පනත් මඟින් එය රුපියල් 100,000 දක්වා වෙනස් කර ගත්තා. ඒ තත්ත්වයත් වෙනස් කරගෙන, ඒ සඳහා අපට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානය වැනි ආයතනත් අපි යොදා ගන්නවා.

ගරු සභාපතිතුමනි, මා සතුටින් කියන්න කැමැතියි, අපි තවත් ක්ෂේත්‍ර ගණනාවක ප්‍රගතිය අත් පත් කරගෙන තිබෙන බව. විශේෂයෙන්ම සත්කාරක ආර්ථිකය - care economy - කියන තැනදී කාන්තා ශ්‍රමය එතැනට එකතු කර ගැනීමේදී ඔවුන්ට ඵලදායී ආර්ථික කාර්යයක නියැළෙන්නට, ඔවුන්ගේ හැකියාව සඳහා ආර්ථික කාර්යයක නියැළෙන්නට යාමේදි වැට කඩුළු ගණනාවක් තිබෙනවා. මේ සත්කාරක ආර්ථිකය හරහා ඒවා මහ හැරවීම සිදු කරන්න තමයි අප මේ සාකච්ඡා කරන්නේ. ඒ වාගේම කාන්තා ශ්‍රමයේ ආරක්ෂිතභාවය -සුරක්ෂිතතාව- වැඩි කිරීම සඳහා තිබෙන අරමුදල්, අණ පනත් පාවිච්චි කරලා මේ කටයුතු ඉදිරියේදී වර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, දැන් මගේ අදහස් දැක්වීම අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා. අපේ රට පැවැති අර්බුදකාරී තත්ත්වයෙන් මුදාගෙන, ස්ථාවරත්වයෙන් යුතුව ඉදිරියට අරගෙන ගිහින් අප බලාපොරොත්තු වූ අරමුණු ඉෂ්ට කර ගැනීමේදී රට තුළ වඩාත් ඉහළ ගුණත්වයෙන් යුතු මානව සම්පතක් නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය වැඩ කටයුතු අපි කරමින් ඉන්නවා. ඒ සඳහා වැඩ කටයුතු කරන කම්කරු අමාත්‍යාංශයේ සියලු නිලධාරි මහත්ම මහත්මීන්ටත්, ලේකම්තුමා ඇතුළු සියලුදෙනාටත් මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපි සහතික වෙනවා, අතීතයේ තිබිච්ච, කම්කරු අමාත්‍යාංශය සේවකයන් වෙනුවෙන් වැඩ කරන්නේ නැහැ කියන ප්‍රතිරූපය වෙනුවට වඩාත් ඵලදායී, කාර්යක්ෂම සේවා ලබා දෙමින් ඔවුන්ට අමාත්‍යාංශයට එන්නේ නැතිව ගෙදර සිටම තමුන්ගේ සේවාවන් කර ගැනීමට හැකි වන පරිදි මේ කටයුතු ඉදිරියේදී සූදානම් කරන්න. එම කාරණයත් සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, ශීර්ෂ අංක 130 කාරක සභාව එකඟද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ தவிசாளர் அவர்களே, இந்த அமைச்சின் செலவினத் தலைப்புக்கு நாங்கள் வாக்கெடுப்பைக் கோருகின்றோம். இதற்குப் பல காரணங்கள் இருக்கின்றன. முதலாவது, வரவு செலவுத்திட்டத்தில் மாகாண சபைத் தேர்தலுக்கு 5 பில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டதாகச் சொல்லப்பட்டது. ஆனாலும், அதற்கு 12 பில்லியன் ரூபாய் தேவை. இரண்டாவது, கல்முனை வடக்குப் பிரதேச செயலகம் சம்பந்தமாக எந்தவித நடவடிக்கையும் இல்லை. மூன்றாவது, மாகாண சபைத் தேர்தலை வேண்டுமென்றே இழுத்தடிப்புச் செய்வதும் ஒரு குழுவை நியமித்து அந்தத் தேர்தலை இல்லாமல் செய்ய முயற்சிப்பதும். இந்தப் பிரதான மூன்று காரணங்களுக்காகவும் நாங்கள் வாக்கெடுப்பைக் கோருகின்றோம்.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව.

ශීර්ෂ අංක 130 සංශෝධන රහිතව සම්මත කිරීමට පක්ෂ මන්ත්‍රීවරයන් කොළ පැහැති බොත්තමත්, විරුද්ධ මන්ත්‍රීවරයන් රතු පැහැති බොත්තමත්, ඡන්දය දීමෙන් වැළකී සිටින මන්ත්‍රීවරයන් කහ පැහැති බොත්තමත් භාවිත කර ඡන්දය ප්‍රකාශ කළ හැකියි.

ගරු මන්ත්‍රීවරුනි, දැන් ඡන්දය දීම ආරම්භ කරන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීවරුනි, ඔබගේ ඡන්දය ඩිජිටල් පුවරුවේ නිවැරදිව සටහන් වී ඇත්දැයි තහවුරු කරගන්න.

මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න.

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ පක්ෂවද, විපක්ෂවද?

**ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා**
(மாண்புமிகு ஆர்.எம். காமினி ரத்நாயக்க)
(The Hon. R. M. Gamini Rathnayake)
පක්ෂයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
මගේ වම් අත පැත්තේ ඡන්දය දීමට නොහැකි වූ මන්ත්‍රීවරු සිටී නම් කරුණාකර නැඟී සිට ඒ බව දැනුම් දෙන්න. කවුරුවත් නැති බවයි පෙනෙන්නේ.

ඡන්දය ප්‍රකාශ කිරීමේ කාලය දැන් අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***
*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 102; විරුද්ධව 09; වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 102; எதிராக 09; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 102; Noes 09; Abstain 0.*

| | |
|---|---|
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 015. Dammika Patabendi | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 1,504,000,000

Question, "That the sum of Rs. 1,504,000,000, for Head 221, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 221, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 436,000,000

Question, "That the sum of Rs. 436,000,000, for Head 221, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 221, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 328.- DEPARTMENT OF MANPOWER AND EMPLOYMENT

Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 729,000,000

Question, "That the sum of Rs. 729,000,000, for Head 328, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 328, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01.- Operational Activities - Capital Expenditure, Rs. 8,000,000

Question, "That the sum of Rs. 8,000,000, for Head 328, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 328, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02.- Development Activities - Capital Expenditure, Rs. 35,000,000

Question, "That the sum of Rs. 35,000,000, for Head 328, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 328, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

ගරු සභාපතිතුමනි, "කාරක සභාව ප්‍රගතිය වාර්තා කළ යුතු යයි ද, නැවත රැස්වීම සඳහා අවසර ගත යුතුය" යි ද මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අ.භා. 6.23ට පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2025 නොවැම්බර් 20වන බ්‍රහස්පතින්දා.***

*பி.ப. 6.23 மணிக்கு, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2025 நவம்பர் 20, வியாழக்கிழமை.*

*At 6.23 p.m., the Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Thursday, 20th November, 2025.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශීර්ෂ අංක 312 සංශෝධන සහිතවද, ශීර්ෂ අංක 130, ශීර්ෂ අංක 253 සිට 279 දක්වාද, ශීර්ෂ අංක 313 සිට 319 දක්වාද, ශීර්ෂ අංක 321, ශීර්ෂ අංක 193, 221, හා 328 සංශෝධන රහිතවද කාරක සභාවේදී සම්මත වූ බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 2 ඉදිරිපත් කිරීම, ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා.

## කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන විශේෂ කාරක සභාව

## கொழும்பு துறைமுகத்திலிருந்து 323 கொள்கலன்களை கட்டாய பௌதிகப் பரிசோதனைக்கு உட்படுத்தாமல் விடுவித்தமை தொடர்பில் ஆராய்ந்து அறிக்கையிடுவதற்காகவும் அது குறித்த அதன் முன்மொழிவுகளையும் விதப்புரைகளையும் சமர்ப்பிப்பதற்குமான தெரிகுழு

## SELECT COMMITTEE TO LOOK INTO AND REPORT TO PARLIAMENT ON THE RELEASE OF 323 CONTAINERS FROM THE PORT OF COLOMBO WITHOUT UNDERGOING MANDATORY PHYSICAL INSPECTION AND SUBMIT ITS PROPOSALS AND RECOMMENDATIONS IN THAT REGARD

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ගරු සජිත් ප්‍රේමදාස මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු රවි කරුණානායක මහතා
ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
ගරු ජීවන් තොන්ඩමන් මහතා
ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා
ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු චාමර සම්පත් දසනායක මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය
ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා
ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු කිංස් නෙල්සන් මහතා
ගරු ජේ.සී. අලවතුවල මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු චානක මාදුගොඩ මහතා
ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා
ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා
ගරු බී. ආරියවංශ මහතා
ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා
ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා
ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු රෝහණ බංඩාර මහතා
ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා
ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු චතුර ගලප්පත්ති මහතා
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා
ගරු දිලිත් ජයවීර මහතා

ගරු සුරංග රත්නායක මහතා,- කොළඹ වරායේ සිට බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කිරීම සම්බන්ධයෙන් සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,- ස්ථාපිත පිළිගත් රේගු කාර්ය පරිපාටිවලට පටහැනි ලෙස කොළඹ වරායේ සිට ආනයන බහලුම් 323ක් අනිවාර්ය භෞතික පරීක්ෂණයට භාජනය කිරීමකින් තොරව නිදහස් කර ඇති බව හෙළි වී ඇති හෙයින් ද;

මෙම අක්‍රමිකතාවයන් පිළිබඳ පළ වන ප්‍රවෘත්ති පිළිබඳව සැලකිල්ල යොමු කරමින් ජනාධිපතිවරයා විසින් ලබාදුන් උපදෙස් අනුව භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පරීක්ෂණ කමිටුවක් පත් කරන ලදුව, එම පරීක්ෂණ කමිටුව විසින් සිය වාර්තාවේ අදාළ කරුණු පිළිබඳ සිය නිරීක්ෂණ ඉදිරිපත් කරමින් බහලුම් නිදහස් කිරීමේ ක්‍රමවේදය නීතියට පටහැනි බවත්, "නිසි පරීක්ෂාවකින් තොරව බහලුම් නිදහස් කිරීම ජාතික ආරක්ෂාව, ආදායම් එකතු කිරීම සහ මහජන ආරක්ෂාව විෂයයෙහි බරපතළ අවදානම් ඇති කරන" බවට නිරීක්ෂණය කරනු ලැබ ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා රේගු නිලධාරින්ගේ සංගමය විසින් එකී බහලුම් නිදහස් කිරීමේ අක්‍රමික ස්වරූපය සැලකිල්ලට ගනිමින් එම බහලුම්වල අන්තර්ගතය පිළිබඳ ඔවුන්ට වගකීම භාරගත නොහැකි බවට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කොට ඇති හෙයින් ද;

එම බහලුම් මත්ද්‍රව්‍ය, ආයුධ සහ වෙනත් තහනම් ද්‍රව්‍ය නීති විරෝධීලෙස මෙරටට ගෙන ඒම සඳහා භාවිතා කර තිබිය හැකි බවට පාර්ලිමේන්තුවේ දී සහ වගකිව යුතු බලධාරින් විසින් ද බරපතළ චෝදනා එල්ල කර ඇති හෙයින් ද;

මත්ද්‍රව්‍ය විශාල තොගයන් සොයා ගැනීම සහ නීති විරෝධී ගිනි අවි සම්බන්ධ සිදුවීම්වල වර්ධනය ද ඇතුළුව ශ්‍රී ලංකාව තුළ මෑතක දී අනාවරණය වූ කරුණු සැලකිල්ලට ගත්කළ මෙයාකාරයේ සදොස් තත්ත්වයන් මහජනතාව මුහුණ දෙන තර්ජනවලට සෘජුව සම්බන්ධ වන බවට පවත්නා වූ සාධාරණ බිය තවදුරටත් තීව්‍ර වී ඇති හෙයින් ද;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මෙම කරුණ ජාතික ආරක්ෂාව, නීතිය ක්‍රියාත්මක කිරීම, මහජන ආරක්ෂාව සහ රටේ වරාය සහ රේගු පරිපාලනයේ අඛණ්ඩතාව සහ අව්‍යාජත්වය යන කරුණු හා සම්බන්ධවන අතර, මේ සියල්ල අතිශය ජාතික වැදගත්කමකින් යුත් කරුණු වන හෙයින් ද; සහ

මෙම කාරණය සමාජය තුළ අවිනිශ්චිතතාවයේ මූලාශ්‍රයක් බවට පත්ව ඇති හෙයින්;

ඉහත කරුණුවලටම සීමා නොවී පහත කරුණු ද ඇතුළත් වන පරිදි එකී බහලුම් නිදහස් කිරීමට අදාළ සියලු කරුණු සොයා බලා වාර්තා කිරීමටත් ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි:

(අ) භෞතික පරීක්ෂාවකින් තොරව බහලුම් නිදහස් කිරීමේ නීත්‍යනුකූලභාවය සහ යෝග්‍යතාව;

(ආ) ඒ හා සම්බන්ධ රජයේ බලධාරීන්, නිලධාරීන් සහ පෞද්ගලික ආයතනවල වගවීම;

(ඇ) එකී බහලුම් කිසිවක් තුළ හෝ නීති විරෝධී, තහනම් කරන ලද හෝ හානිකර භාණ්ඩ අඩංගු වී පැවතියේද යන්න;

(ඈ) මෙම ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකා රේගුවේ සහ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යභාරය සහ වගකීම;

(ඉ) එවැනි අක්‍රමිකතාවයන්ගෙන් ආරක්ෂා වීම සඳහා පවත්නා නීති, රෙගුලාසි සහ ක්‍රියාපටිපාටිවල ප්‍රමාණවත්භාවය; සහ

(ඊ) ඉදිරියේදී එවැනි සිදුවීම් ඇතිවීම වළක්වාලනු ලබන බවට සහතික කිරීම සඳහා අවශ්‍ය නීතිමය, පරිපාලනමය සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සඳහා නිර්දේශ.

2\. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් නම් කළ යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දොළොස් දෙනෙකුට (12) නොවැඩි විය යුතු ය.

3\. එම කාරක සභාවට -

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සභාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතු ය.

4\. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ දින සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළත දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය."

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES took the Chair.*

## විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සීමිත සමාගමක් බවට පත් කිරීමේ යෝජනාව
## விசேட பொருளாதார மத்திய நிலையங்களை வரையறுக்கப்பட்ட கம்பனியாக மாற்றுவதற்கான முன்மொழிவு
## PROPOSAL TO CONVERT DEDICATED ECONOMIC CENTRES INTO A LIMITED COMPANY

[අ.භා. 6.25]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන යනු ශ්‍රී ලංකාවේ එළවළු ගොවියා සහ මහ පරිමාණ වෙළෙඳුන් සම්බන්ධ කරන පුරුක ලෙස සැලකිය හැකිය.

දැනට ලංකාවේ ක්‍රියාත්මක විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන 14ම ඒ ඒ ප්‍රදේශයේ දිසාපතිතුමා, ප්‍රාදේශීය ලේකම්තුමා ප්‍රධාන වූ භාරයක් මඟින් ක්‍රියාත්මක වන අතර ප්‍රදේශයේ ගොවි ජනතාවට මනා වූ සේවයක් එමඟින් ඉටු කරනු ලබයි.

නමුත්, 2025.05.07 දින වෙළෙඳ ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ සන්දේශය මඟින්, ආර්ථික මධ්‍යස්ථාන සියල්ලම සීමිත සමාගමක් බවට පත් කිරීමට යෝජනා වී තිබේ. ඒ ඒ ආර්ථික මධ්‍යස්ථානවලට අයිති ඉඩකඩම්, ගොඩනැඟිලි ආදිය මාස 6ක් ඇතුළත සීමිත සමාගමට පැවරීමට යෝජනා වී තිබේ. ආර්ථික මධ්‍යස්ථාන 14 සඳහා කළමණාකරුවන් 14දෙනෙකු පත් කරන අතර, තීන්දු තීරණ ගනු ලබන්නේ එම කළමණාකරුවන් විසිනි.

හුදෙක් එළවළු ගොවියා හෝ පාරිභෝගික ජනතාව ගැන නොසිතා, මෙම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සීමිත සමාගමක් බවට පත් කිරීමෙන් පොදු ජනතාව සතු දේපළ පෞද්ගලික සමාගමකට අයිතිවීමට ඉඩ ඇත.

එබැවින් මෙම කරුණු කෙරෙහි ගැඹුරින් සිතාබලා මෙම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සීමිත සමාගමක් බවට පත් කිරීමේ පනත වහා ඉල්ලා අස් කර ගත යුතු යැයි මම මෙම සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වෙනකොට ශ්‍රී ලංකාවේ ආර්ථික මධ්‍යස්ථාන 14ක්, National Agri Market Services Limited කියන පෞද්ගලික සමාගමකට දෙන්න, අපේ වෙළෙඳ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය තීරණය කරලා තිබෙනවා. 1999 ඉඳලා වරින්වර ආර්ථික මධ්‍යස්ථාන හැදුණා. ගොවි ජනතාව එක්ක එකතු වෙලා අද එම ආර්ථික මධ්‍යස්ථානවල සාර්ථකව එම ව්‍යාපාර කරගෙන යනවා. රටේ ප්‍රශ්න නැතුව නොවෙයි. මීට වැඩිය රටේ ප්‍රශ්න තිබෙනවා. මේ සම්බන්ධව කිසිම ප්‍රශ්නයක් පසුගිය කාලයේ පැන නැඟුණේ නැහැ. දැනට දිසාපතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම් ඇතුළු භාරයක් යටතේ මේ ආර්ථික මධ්‍යස්ථාන ක්‍රියාත්මක වෙනවා. හැබැයි, මේක අලුතින් පෞද්ගලික සමාගමකට දෙන්නේ මොන පදනමක් මතද කියන එක මම දන්නේ නැහැ.

අධ්‍යක්ෂ මණ්ඩලය පත් කිරීමේ බලය ඇමතිතුමාට තිබෙනවා. ඇමතිවරයාගේ අනුමැතියෙන් තොරව ඒ පත් කිරීම් කරන්න බැහැ කියන එක ලිඛිතවත් තිබෙනවා. ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධයෙන් මේ ගත්ත තීරණය වෙනුවෙන් ඒ ජනතාව නඩු කිහිපයකුත් දමලා, උසාවි යන තත්ත්වයකට පත්ව තිබෙනවා. "දිසාපති" කියන්නේ කොම්පැනියක් නොවෙයි නේ. දිසාපති ඉන්නේ කච්චේරියේ. එහෙම නම් කච්චේරියත් කොම්පැනියක් කරන්න ඕනෑ නේ. දිසාපති කියන්නේ රටේ වගකිව යුතු ගණන් දීමේ නිලධාරියෙක්. බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති යටතේ වැලිමඩ ප්‍රාදේශීය ලේකම් තමයි කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානය බලන්නේ. ඒ බලන වෙලාවේත් මේක කොම්පැනි එකකට දීලා. ඇමතිතුමාට අයිතිය තිබෙනවා, මේ ගැන ඕනෑම තීරණයක් ගන්න. ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් වගකීම් විරහිතව ඒගොල්ලන් කටයුතු කරනවා නම්, මුදල් අපතේ යනවා නම්, මේකෙන් යම්කිසි ප්‍රශ්නයක් ඇති වෙනවා නම් ඇමතිතුමාට පුළුවන්, දිසාපතිට අමතරව අමාත්‍යාංශයෙන් වෙනම නියෝජිතයෙකුත් ඒ පළාතේ ආර්ථික මධ්‍යස්ථානයට සම්බන්ධ කරවන්න. ඒ සම්බන්ධයෙන් නියෝජිතයෙක් පත් කරලා ඒ ගැන සොයා බලා කටයුතු කරන්න පුළුවන්. නමුත්, මේක කරන්නේ මොන පදනමකින්ද කියලා මට නම් තේරෙන්නේ නැහැ. මොකද, ඇමතිතුමාට වැඩ නැතිව නොවෙයි නේ. ඇමතිතුමාට කරන්න මීට වඩා වැඩ තිබෙනවා නේ. මේ ආර්ථික මධ්‍යස්ථාන 14ක් බදාගෙන මේකට දඟලන එක නොවෙයි නේ කරන්න ඕනෑ. දැන් මේකට ලොකු විරෝධතාවක් තිබෙනවා. එක්කෝ, ඔබතුමා ඒ අය කැඳවා කථා කරන්න. නැත්නම් ඔබතුමා ඒ අය කැඳවා අහන්න, මේ සම්බන්ධයෙන් දක්වන විරෝධතාව මොකක්ද, ඔයගොල්ලන් මේකට අකැමැති ඇයි කියලා.

මම දන්නා විධියට කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානයෙන් ලොකු සේවාවක් වෙනවා. පසුගිය දවසක නියෝජ්‍ය ඇමතිතුමාත් ගිහිල්ලා ඒ ආර්ථික මධ්‍යස්ථානය බැලුවා. එතුමා ගිහිල්ලා මේ අයත් එක්ක කථා කළා. මේ වන විට ඒ ආර්ථික මධ්‍යස්ථානයට මුදලක් වෙන් වෙලා තිබෙනවා, ලොකු වහලයක් ගහන්න. ඒ වාගේ වැඩ ගොඩක් කරන්න තිබෙනවා. ඇමතිතුමනි, මම එදාත් ඔබතුමාගෙන් ඇහුවා, කළ යුතු වැඩ තිබියදී වෙනත් වැඩ කරන්නේ මොකද කියලා. වැඩ නැතිව නොවෙයි නේ. ඕනෑ තරම් වැඩ තිබෙනවා. ජනතාවගේ විරෝධතා මැද කටයුතු කරන්න ගියොත් ඒක ආණ්ඩුවටත් හොඳ නැහැ; ඔබතුමාටත් හොඳ නැහැ. මේ සම්බන්ධව දඹුල්ල, නුවරඑළිය, කැප්පෙටිපොල ව්‍යාපාරිකයින්ට ප්‍රශ්නයක් තිබෙනවා. මේක මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයට ප්‍රශ්නයක් නැහැ. මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය කියන්නේ කොළඹ දිස්ත්‍රික්කයට තැනක් නේ. ඒක ගොවීන් එක්ක සම්බන්ධ වන ආර්ථික මධ්‍යස්ථානයක් නොවෙයි නේ. මීගොඩ ඇතුළු තව ආර්ථික මධ්‍යස්ථාන කිහිපයක සිද්ධ වෙන්නේ ව්‍යාපාර කටයුතු විතරයි. කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානය එහෙම නැහැ. දඹුල්ලේ ගොවියා, කැප්පෙටිපොල ගොවියා සහ ආර්ථික මධ්‍යස්ථාන අතර තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වාගේ දෙයක් කළොත් වෙන්නේ මේකයි. මෙහිදී වෙන හැඟීමකුත් එනවා. ඇමතිතුමාගේ කොම්පැනියක් දාලා මේක කරනවාය කියලා ඇමතිතුමාට මේකෙන් නරක නාමයකුත් එනවා. ඇමතිතුමාගේ කොම්පැනියේ නියෝජිතයෝ පත් කරලා ඇමතිතුමා වෙන ගේමක් ගහන්න යනවා කියලා තමයි මේක ගැන රටට කියන්නේ; රටට හෙළි වන්නේ. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයෙන් පනතක් හදලා තිබෙනවා. ඒ පනතත් මා ළඟ තිබෙනවා. ඒ පනතත් මම කියවා බැලුවා.

ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධව මිනිසුන්ගේ විරෝධතාවක් තිබෙනවා නම් ඒ විරෝධතාව මැද මේක කරන්න බැහැ නේ. ඔබතුමන්ලා කලින් හොඳ තීන්දුවක් ගත්තා. ඒ තමයි, දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත reverse කළ එක. ඒකට රටේ විරෝධතාවක් ආවා, ඒක reverse කළා. ඒක හොඳයි. ආණ්ඩුව ගෙන එන සෑම අණ පනතක්ම මේ සභාවේදී සම්මත කරන්න බැහැ. මම අහන්නේ, පෞද්ගලික සමාගමක් දාගෙන තමුන්නාන්සේලා මේ වැඩේට අත ගැහුවේ මොකටද කියලයි. මේ සම්බන්ධව කටයුතු කරන්න දිසාපති ඉන්නවා නේ; ප්‍රාදේශීය ලේකම් ඉන්නවා නේ; භාරයක් තිබෙනවා නේ. බදුල්ල දිසාපතිතුමා ඉන්නවා, ඒ වාගේම වැලිමඩ ප්‍රාදේශීය ලේකම් ඉන්නවා. මෙතැන වංචාවක් සිද්ධ වෙනවා නම් ඔබතුමාට මේවා සම්බන්ධව වෙන වැඩක් කරන්න පුළුවන් නම් ඒක කරන්න. මේ ගැන යන්නේ වෙන මතයක්, ඇමතිතුමා. ඒ නිසා මම මේ යෝජනාව ගෙනාවේ විශේෂයෙන්ම මෙන්න මේ කාරණා නිසායි. මොකද, කැප්පෙටිපොල කියන්නේ බදුල්ල දිස්ත්‍රික්කයේ ආර්ථික මධ්‍යස්ථානයක් තිබෙන තැනක්. අපි ගෙන එන යෝජනාවලට සමහර අවස්ථාවලදී ඇමතිතුමා විරුද්ධ වෙන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, අපි සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවාම ඒ ගැන දෙපාරක් හිතන්න.

මම මීට පෙර වතාවකදීත් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ගෙනාවා. එදා නියෝජ්‍ය ඇමතිතුමා හිටියා. එදා සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ඉදිරිපත් කළේ අපේ රටේ අල ගොවියා සහ ලූනු ගොවියා ගැන. ගරු ඇමතිතුමනි, එදා ඒ තීන්දුව අරගෙන තිබුණා නම් අද අල ගොවීන් සහ ලූනු ගොවීන් එක්කෙනෙක්වත් පාරට බහින්නේ නැහැ. නමුත්, දැන් ඒකට කරන්න දෙයක් නැහැ. ගරු ඇමතිතුමනි, මේ ආර්ථික මධ්‍යස්ථානයේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ආර්ථික මධ්‍යස්ථානවල ඉන්න අයගේ දැඩි විරෝධතාවක් තිබෙනවා. ඇමතිතුමනි, ඉස්සර මේ අය දඹුල්ලේ ඔරලෝසු කණුව ගාව පෙට්ටි කඩ ටික නේ කර කර සිටියේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මට තත්පරයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

ගරු ඇමතිතුමනි, ඔබතුමා අනුරාධපුරේ යනකොට දකිනවා ඇති, එතැන තේ ඒ අය වෙළෙඳාම් කරගෙන හිටියේ. ඊට පස්සේ තේ, ඔය ආර්ථික මධ්‍යස්ථානය හදලා දඹුල්ලේ එක තැනකට ඒ අය shift වුණේ. ඉතින් ඒක ඒ අය බොහෝ කාලයක් කරගෙන ගියා. ප්‍රශ්න තිබෙනවා, ගොවීන්ගෙන් කොමිස් ගන්නවා. ගොවියෝ තේ ගිහින් දෙන්නේ, ඉතින් ගොවීන්ගෙන් complaints එන්න ඕනෑ. ඒ ගැන බලලා කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 4ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.33]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව ස්ථිර කරමින්, මම ඒ සම්බන්ධයෙන් කරුණු කීපයක් කථා කරන්න කැමැතියි. විශේෂයෙන්ම මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන, ඒ වාගේම ආර්ථික මධ්‍යස්ථානයක් තිබෙන ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරියක් හැටියට ඒක මගේ යුතුකමක් හා වගකීමක් හැටියට මා දකිනවා. ඒ වාගේම මේ ගැන කථා කරන්න මට අයිතියකුත් තිබෙනවා. "විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන හා මිලදී ගැනීමේ මධ්‍යස්ථාන" කියන තේමාව යටතේ 1988 ජනාධිපතිවරණයේදී ගරු ආර්. ප්‍රේමදාස මහතාගේ මැතිවරණ ප්‍රකාශයේ ආපු ප්‍රතිපත්තියක් අනුව තමයි මේ යෝජනාව එන්නේ, ගරු ඇමතිතුමනි. 1994 වර්ෂය වෙනකොට එහි වගකීම තිබුණේ මගේ පියාට. ඒ, කෘෂිකර්ම නිෂ්පාදන හා අළෙවි ඇමතිතුමා හැටියට. එතුමන්ලා එකතු වෙලා තමයි මේ ක්ෂේත්‍රය මේ තත්ත්වයට ගෙනාවේ. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ, පෙට්ටි කඩවල තමයි ඉස්සර මේවා තිබුණේ. ඒ වාගේම අතරමැදියන් වන මේ රටේ ගොවීන් දැවැන්ත අර්බුදයකට මුහුණ දීපු ඉරණමක් තිබුණු කාලයක්, ඒක. ඒ වාගේම නිෂ්පාදිත ද්‍රව්‍ය ගබඩා කර ගන්න විධියක් නැතුව, ඒවා විසි කරන කාලයක් අපි දැක්කා. මෙන්න මේවාට විසඳුම් හැටියට තමයි විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන, මිලදී ගැනීමේ මධ්‍යස්ථාන, ශීතාගාර කියන මේ සියල්ලම එකට ආවේ. මේවා හැදුවේ ඇයි කියන එක පිළිබඳව කථා කළොත්, විශේෂයෙන්ම ගොවියාගේ නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලබා දෙන්නත්, පාරිභෝගිකයාට සාධාරණ මුදලකට ඒ නිෂ්පාදිත ද්‍රව්‍ය ලබා ගැනීමත් මේ තුළින් බලාපොරොත්තු වුණා.

ගරු ඇමතිතුමනි, දැන් මේ ආර්ථික මධ්‍යස්ථාන ටික දෙන්න යන සමාගම ඇතුළේ මේ කියන බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ වනවාද කියන එක පිළිබඳව අපට සලකා බලන්න වෙනවා. ඔබතුමන්ලා කථා කරන්නේ, පෞද්ගලික සමාගමක් ගැනද කියන්න මට ඇත්තටම අවබෝධයක් නැහැ. නමුත් ඒකේ තිබෙනවා මම දැක්කා, "විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය කළමනාකරණය කිරීම පිණිස වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම සඳහා අනුමැතිය" කියලා. මම අහන්න කැමැතියි, මම කථා කරපු මේ නිෂ්පාදකයාට සහ පාරිභෝගිකයාට මේ තුළින් සාධාරණයක් වෙනවාද කියලා. ඔබතුමන්ලා එය තහවුරු කරන්න ඕනෑ. එහෙම නොවුණොත්, මේ අය කබලෙන් ළිපට වැටෙනවා නම් මොන සමාගමක් හැදුවත් වැඩක් වෙන්නේ නැහැ. එහෙම නම් මේකට සාධාරණයක් නොවී ආණ්ඩුවේ යන්ත්‍රණයකට, නිලධාරි තන්ත්‍රයකට යටත් කරගෙන කටයුතු කිරීම තුළින් මොකද වෙන්නේ? ඉතිහාසයේ කටයුතු කළ ආකාරයටම නැවත නැවත ක්‍රියා කරන්න ඕනෑය කියලා මම කියන්නේ නැහැ. අපි දන්නවා, ආණ්ඩු බිස්නස් කරන්න ගිහිල්ලා සළුසල වහන්න සිද්ධ වුණු බව. ඊළඟට, සතොසට අත්ව තිබෙන ඉරණම පිළිබඳවත් අපි දන්නවා. එවැනි තත්ත්වයක් මේ ආර්ථික මධ්‍යස්ථානවලට සිදු නොවිය යුතුයි. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ පිළිබඳව නැවත වතාවක් හොඳ කතිකාවක් කරන්න කියලායි. ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ මධ්‍යස්ථානවල සිටින අයත් එක්ක කථා කරලා, ප්‍රදේශයේ ගොවියොත් එක්ක කථා කරලා මේ සම්බන්ධයෙන් ගන්න තිබෙන තීරණය ගන්න කියා මේ වෙලාවේ මා ඉල්ලා සිටිනවා. එහෙම නොවුණොත්, විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ටිකත් විනාශ මුඛයට යන්න ඉඩ තිබෙනවා.

ඒ වාගේම ගරු ඇමතිතුමනි, කරනවා නම් කරන්න වැඩ ඇත්තටම තිබෙනවා. ශීතාගාර ගැන බලන්න. එදා ගරු හර්ෂ ද සිල්වා මහතා ඇමතිවරයෙකු විධියට සිටියදී ශීතාගාර සම්බන්ධව ව්‍යාපෘතියක් ගෙනාවා. මේ වනකොට එතැනට electricity connection එක දී ගන්න බැරිව තේ තිබෙන්නේ. ඒක දුන්නොත් අර විධියට එළවලු, ලූනු විසි කරන්න වන්නේ නැහැ. එහෙම නැත්නම් ලූනු වෙළෙන්දාට වැඩි අස්වැන්නක් ලැබෙනකොට ඒ අස්වනු ශීතාගාරවල ගබඩා කරන්න හැකියාව ලැබෙනවා. මේ රජය තුනෙන් දෙකකට වඩා බලයක් අරගෙන තිබෙන නිසා මේ යෝජනා යහපත් විධියට හොඳ පැත්තට ගෙනිහිල්ලා, මේ කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මොකද, ඉන්දියාවේ අගමැතිතුමාත් රැවටුවා. ඒ විධියට ගොවියෝත්, වෙළෙන්දෝත් රැවටීමකට ලක් කරන්න එපා කියා මම මේ වෙලාවේ ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 6.38]

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආර්ථික මධ්‍යස්ථාන පිළිබඳව සාකච්ඡාව මතු වුණු මේ වෙලාවේ විශේෂයෙන්ම මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය පිළිබඳව සඳහන් කළ යුතුයි. ගරු චාමර මන්ත්‍රීතුමාත් ඒ පිළිබඳව විශේෂයෙන් අවධාරණය කළා. අපේ රටේ පිහිටා තිබෙන ආර්ථික මධ්‍යස්ථාන අතරින් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය කියන්නේ ඉතාම සුවිශේෂී වූ ආර්ථික මධ්‍යස්ථානයක් කිව්වොත් එය නිවැරදියි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් සඳහන් කළා වාගේ මේ ආර්ථික මධ්‍යස්ථාන පාලනය සඳහා කළමනාකරණ භාරයක් පිහිටුවා තිබෙනවා. නමුත් පසුගිය කාලය තුළ මේ කළමනාකරණ භාරය

ක්‍රියාත්මක වුණේ කොහොමද? ගරු චාමර සම්පත් මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා, පසුගිය කාලය තුළ ප්‍රදේශය නියෝජනය කරන ඇමතිවරයා වාඩිවෙලා තමයි කළමනාකරණ භාරයට වෙළෙඳ සංගමයේ සභාපති පත් කළේ කියන එක. ඔබතුමා ගත් උදාහරණයම ඒකට සාක්ෂියක්. සමහර අවස්ථාවලදී දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ "සභාපතිවරයා මෙයා තමයි" කියලා ඒ සභාපතිවරයා පත් කළේ ප්‍රදේශයේ දේශපාලනඥයා මැදිහත් වෙලා. එසේ කළමනාකාරවරයෙක් පත් කර තිබෙනවා. ඒ කළමනාකාරවරයාගේ කාර්යභාරය මොකක්ද? මේ සංයුතිය දිසාපතිගෙන්, ප්‍රාදේශීය ලේකම්ගෙන්, වෙළෙඳ සංගම්වලින්, ගොවීන්ගෙන් සමන්විත වුණාට අර දේශපාලන අධිකාරියේ හස්තයට කළමනාකාරිත්වය යට කරලා තිබුණේ. ඒ නිසාම මේ කළමනාකරණ භාරය පසුගිය කාලයේ මොකක්ද කළේ?

ඒ ආර්ථික මධ්‍යස්ථානය හැදුවේ ගොවීන්ගේ යහපත වෙනුවෙන්. හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? ගොවියා තමන්ගේ අස්වැන්න අරගෙන මධ්‍යස්ථානයට එනකොට ගේට්ටුව ළඟදී රුපියල් 50ක ටිකට් එකක් කඩනවා, ගොවියාට. නොවිදිනා දුක් විඳලා අස්වැන්න නෙළා ගෙන මධ්‍යස්ථානයට ආවාම, රුපියල් 50ක ටිකට් එකක් ගොවියාට කඩනවා. කවුද ඒ ටිකට් එක කඩන්නේ? ගොවීන්ගේ සුබසාධනය වෙනුවෙන්ද එහෙම කරන්නේ? නැහැ. අන්න අර පිහිටවපු කළමනාකරණ භාරය තමයි ගොවීන්ට එසේ ටිකට් පත් නිකුත් කරන්නේ. අපි ගණනය කර බැලුවාම පෙනුණා, සාමාන්‍යයෙන් මාසිකව රුපියල් ලක්ෂ 20කට වැඩි ආදායමක් එන බව. හැබැයි, ඒකෙන් කළමනාකරණ භාරයට යන්නේ කීයද? රුපියල් ලක්ෂ 2යි. කළමනාකරණ භාරයක් ගැන කිව්වාට, පසුගිය කාලය පුරාම මේ කළමනාකරණ භාරය ඉතාම අවිධිමත්ව තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේත් දන්නවා, මේ ආර්ථික මධ්‍යස්ථාන ඇතුළේ වැසිකිළි පද්ධතියක් තිබෙන බව. අමාරුවෙන් එළවලු ටික කඩා ගෙන, මධ්‍යස්ථානවලට ඒ එළවලු ටික අරගෙන එන එම ගොවීන් තමන්ගේ ශරීර අවශ්‍යතාවක් වෙනුවෙන් ටොයිලට් එකට ගියොත් රුපියල් 100ක් අය කරනවා. ඒවා ගොවියාගේ සුබසාධනය වෙනුවෙන් පිහිටවපු ආර්ථික මධ්‍යස්ථාන. නමුත් ඒවායේ කටයුතු මේ විධියට සිද්ධ වෙනකොට, දේශපාලන අධිකාරියේ ආශීර්වාදය ලැබුණා. ඒ නිසා තමයි ඒවා ඒ විධියට සිද්ධ වුණේ.

විශේෂයෙන්ම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය කියන්නේ කවුරුත් දන්නා ආර්ථික මධ්‍යස්ථානයක්. ඒ ආර්ථික මධ්‍යස්ථානයේ කඩ ටික ආරම්භ කරලා, විධිමත්ව පවත්වා ගෙන ගියා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය කාලය තුළ දේශපාලන බල අධිකාරිය පාවිච්චි කරලා ඉතා අවිධිමත් විධියට එම කඩ ටික බෙදුවා. තමුන්නාන්සේලා, අපි කවුරුත් වාගේ දන්නවා, පසුගිය කාලයේ මැතිවරණ වේදිකාවලදී "ආයුබෝ වේවා මහරජාණනි" කියන සිංදුව කිව්ව ගායකයාටත් කඩයක් දුන්න බව, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන්. මොන ලජ්ජා නැති වැඩක්ද? අලුතින් කඩ හදලා ඒහෙමයි කළේ. එහෙමයි මේ ආර්ථික මධ්‍යස්ථාන පවත්වාගෙන ගියේ.

මේ කළමනාකරණ භාරවල තිබෙන අවිධිමත්භාවය නැති කර ඒවා විධිමත් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ නිසා තමයි අපි අපේක්ෂා කරපු ආකාරයට ගොවියාට ලැබිය යුතු ඒ වාසි අත්කර දීම අරමුණු කරගෙන අපේ විෂය භාර අමාත්‍යතුමා ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක්, ව්‍යුහයක් යෝජනා කර තිබෙන්නේ. ඒ වාගේ විධිමත් ව්‍යුහයකින් මේ ආයතන ක්‍රියාත්මක වෙනකොට, ඒවායෙන් අනිසි විධියට ප්‍රතිලාභ ලබන කට්ටිය කලබල වෙනවා. ඒ අය තමයි කලබල වෙලා ඇවිල්ලා තමුන්නාන්සේලාට ඔය ලියකියවිලි භාර දුන්නේ. තමුන්නාන්සේලාට ඔය ලියවිල්ල භාර දෙන්න එන්න ඒ කට්ටිය රාත්‍රී කාලය තෝරා ගත්තේ ඇයි? එහෙම රාත්‍රී කාලය තෝරා ගත්තේ එතැන ඉන්නා ගොවීන්, ව්‍යාපාරිකයින් දැක්කොත් ඒක ඔවුන්ට ගැටලුවක් වෙන නිසායි. රාත්‍රී කාලයේ ඇවිල්ලා තමයි තමුන්නාන්සේලාට ඔය ලියවිල්ල භාර දුන්නේ. මොකද, මේකෙන් හැම දාම යැපුණු කණ්ඩායමක් හිටියා. ඒ කණ්ඩායමට මේ නව ක්‍රමවේදය ඇතුළේ පහර වදිනවා. ඒක වළක්වන්න තමයි මේ කටයුත්ත කළේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ නිසා මේ ආර්ථික මධ්‍යස්ථාන විධිමත් කිරීමේ අවශ්‍යතාව මතු වී තිබෙනවාය කියන කාරණය අවධාරණය කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සභාව නොමඟ යවන්න එපා. ඒ මිනිස්සු අපිව හමු වෙන්න රෑ ආවේ නැහැ, දඹුල්ලෙන්. අපේ කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානයක් තිබෙනවා. කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානයෙන් තමයි අපි මේ සියල්ල ගැන දැනුවත් වුණේ.

ඊළඟ කාරණය මේකයි. ඔබතුමා දැන් මාතලේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති නේ. දැන් ඔබතුමා ඔය කියපු ආකාරයට ඒ ආණ්ඩුවලින් එහෙම කරපු නිසා නේ ඒ මිනිස්සු ගෙදර යැව්වේ. නමුත් සම්බන්ධීකරණ කමිටුවේ සභාපති හැටියට ඔබතුමාට දැන් ඊට වඩා විධිමත් විධියට ඒක පාලනය කර ගන්න පුළුවන්. මොකද, දිසාපති, ප්‍රාදේශීය ලේකම් ඔක්කෝම ඉන්නේ ඔබතුමා යටතේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[පි.ව. 6.44]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

இலங்கையில் இருக்கின்ற சகல பொருளாதார மத்திய நிலையங்களையும் private companyயாக மாற்றுவதற்கு இந்த அரசாங்கம் மேற்கொண்டுள்ள Cabinet தீர்மானத்துக்கு எதிராகவே இன்றைய தினம் கௌரவ சாமர சம்பத் தசநாயக்க அவர்கள் இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையை முன்மொழிந்து இருக்கிறார். அதையிட்டு எனக்கு மிகவும் சந்தோசம்! வடக்கு மாகாணத்தில் பொருளாதார மத்திய நிலையம் இல்லை என்றுதான் சொல்ல வேண்டும். இது

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

மிகவும் கவலைக்குரிய விடயமாகும். இதைச் சிங்களத்தில் சொல்வதென்றால், අපේ උතුරේ பொருளாதார மத்திய நிலையம் නැහැ. ඒ නිසා ගරු මන්ත්‍රීවරුනි, ඇත්තටම තිබෙනවා එකක්,- தமிழில் சொல்கின்றேன். சாவகச்சேரியில் ஒரு பொருளாதார மத்திய நிலையம் இருக்கிறது. நாங்கள் கடந்த ஒரு வருடமாக உங்களுடைய அமைச்சர் ராமலிங்கம் சந்திரசேகர் அவர்களிடம் சொல்லி வருகிறோம், "ஐயா, அதை வந்து பாருங்கள்!" என்று. அதன் பின்னர், மேள, தாளங்களுடன் உங்களுடைய சில பாராளுமன்ற உறுப்பினர்கள் வந்து அதைத் திறந்து வைத்தார்கள். உங்களுக்கே தெரியும், அது என்ன நிலையில் இருக்கின்றது என்று. உங்களைக் குறைகூறுவதோ அல்லது உங்களைக் கேவலப்படுத்துவதோ என்னுடைய நோக்கம் இல்லை. உங்களை எந்தளவு pressure பண்ண முடியுமோ, அந்தளவு pressure பண்ணி அதன்மூலம் ஒரு விடயத்தை செய்யவைக்க வேண்டும் என்பதுதான் என்னுடைய அரசியல்! உங்களுக்கு நன்றாகவே தெரியும், எனக்குப் பின்னால் எந்தவோர் அரசியல்வாதியும் இல்லை; எந்தக் கட்சியும் இல்லை என்று. உங்களை அடியடி என்று அடித்தால், நீங்கள் அங்குவந்து சில வேலைகளைச் செய்வீர்கள் என்ற ஒரு நப்பாசை மட்டும்தான் இந்தத் தமிழனுக்கு இருக்கிறதே ஒழிய, வேறொன்றும் இல்லை.

நீங்கள் 'பிரஜாசக்தி' என்ற ஒரு திட்டத்தைக் கொண்டுவருகிறீர்கள். உங்களுக்கே தெரியும், அது நீங்கள் நடத்துக்கின்ற ஒரு கபட நாடகம் என்று. அதை நாங்கள் எதிர்ப்போம். நான் இந்த இடத்தில் அரசாங்கத்தின் மிகப் பெரிய பொய் ஒன்றைச் சொல்ல வேண்டும். அதாவது, Type Bஇல் இருக்கின்ற புத்தளம் வைத்தியசாலையை Type Aஆக -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මාතෘකාවට අදාළව කථා කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අපට නේ කියන්නේ. අපි කථා කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මාතෘකාවට අදාළව නේ, කථා කරන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමිය මම කථා කරනවාට කැමති නැත්නම් කථාව අවසන් කරනවා. ඔබතුමියට ඕනෑද, මගේ කථාව නවත්වන්න? මගේ time එක නේ නාස්ති කරන්නේ.

புத்தளம் வைத்தியசாலையை Type Bஇலிருந்து Type Aஆகத் தரமுயர்த்தப்போவதாக மாண்புமிகு சனாதிபதி உட்பட பலரும் சொல்கிறார்கள். அது பெரியதொரு பொய்! நான் hospitalஇல் administratorஆக இருந்த ஒருவன். அதை எப்படி Type Bஇலிருந்து Type Aஆக மாற்றாமல் DGHஆகக் கொண்டுவரலாம்? *[இடையீடு]* පාපිස්සෝ, කෑ ගහන්න එපා පාපිස්සෝ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මාතෘකාවට අදාළව කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
වාඩි වෙන්න. அங்கு ஆகக் குறைந்தது ஒரு MSகூட இல்லை. பக்கத்திலுள்ள hospitalஇல் வேலைசெய்கின்ற MSதான் அங்கும் வேலைசெய்கிறார். எல்லோரும் கத்துகிறார்கள். கத்துங்கள்! எனக்கு வெட்கம் என்ன வென்றால், -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔක්කෝම ඉවර කරලා "විනාඩියක්" කියනවා. එහෙම නම් මම කථාව නවත්වන්නම්. එතකොට දෙන්න, වෙන කාට හරි. මම කථාව නවත්වන්නම් එහෙම නම්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, ඔක්කෝම කරදර කරලා ඉවරයි නේ මගේ වෙලාවේ. මේ බලන්නකෝ. මට විනාඩියක් දෙන්න, මම කථාව ඉවර කරන්නම්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා විනාඩියෙන් කථාව ඉවර කරන්න.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Thank you, Hon. Deputy Chairperson of Committees.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි. විනාඩියයි. *[බාධා කිරීම්]*

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
බලන්නකෝ පාපිස්සෝ ටික කෑ ගහන විධිය. අපේ එක්කෙනෙක් නැඟිට්ටාම මේ පාපිස්සන්ට ඉන්න බැරි වෙලා තිබෙන්නේ.

ஏன் நீங்கள் முஸ்லிம் மக்களுக்கு இந்தப் பெரிய பொய்யைச் சொல்கின்றீர்கள்? அந்த Type B வைத்தியசாலையை Type A வைத்தியசாலையாக மாற்றவே

முடியாது. நான் அமைச்சருக்கு தொலைபேசி அழைப்பை ஏற்படுத்தி இது பற்றி கேட்டேன். இது மிகப் பெரிய பொய்! பைசல் என்ற பாராளுமன்ற உறுப்பினர் சொல்கிறார், அதை Type Aஆக மாற்றப் போகிறோம் என்று. அதை அவ்வாறு மாற்ற இயலாது. நான் hospitalஇல் MSஆக இருந்தவன் என்ற அடிப்படையில் சொல்கிறேன், Boardஐ மாற்றுவதால் ஒரு வைத்தியசாலையை Type Bஇல் இருந்து Type Aக்குக் கொண்டுவர முடியாது. நீங்கள் சொல்வது மிகப் பெரிய பொய்! நான் இதனைச் சொன்னவுடன் எத்தனை செருப்புக் கட்டைகள் எழும்புகின்றன என்று பாருங்கள்! ஐயா, உங்களுக்கு வெட்கமாக இல்லையா?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
තත්පර 20ක් දෙන්න, මම කථාව ඉවර කරන්නම්.

நீங்கள் மாகாண சபைத் தேர்தலை நடாத்த மாட்டீர்கள் என்று சொல்லிவிட்டீர்கள். தனியாளான இராமநாதன் அர்ச்சுனாவுக்கு நீங்கள் இவ்வளவு பயம் என்றால், எனக்கு வெட்கமாக இருக்கிறது. நீங்கள் 159 பேரும் சோறா சாப்பிடுகின்றீர்கள்? எனக் கேட்டு விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.47]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නිද්‍රාශීලීව තිබුණු සභාවට මේ වාගේ විහිළුවක් සපයපු එක පිළිබඳව මොකුත් කථා නොකර ඉන්න එක හොඳයි කියලා මම හිතුවා. ගැරඬින්ට සාමාන්‍යයෙන් බූමිතෙල් ගහන්නේ නැහැ අපි. ගැරඬින්ට බූමිතෙල් ගහන්නේ නැහැ. හැබැයි, කක්කුස්සි කටවලට අපි බූමිතෙල් ගහනවා. මොකද, ගඳ ගහන එක නවත්වන්න. ඒ නිසා එහෙම ගැහුවාම හොඳයි.

මේ යෝජනාව ඉදිරිපත් කළ චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමාත්, යෝජනාව ස්ථිර කළ රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියත් කථා කළේ ආර්ථික මධ්‍යස්ථාන ගැන. ඉතින්, ආර්ථික මධ්‍යස්ථාන ගැන කථා කරන්න ඇවිල්ලා මන්ත්‍රීවරු පළාත් සභා ගැන කථා කළා. ඒ නිසා චාමර සම්පත් මන්ත්‍රීතුමාට හිතෙන්න ඇති, වෙලාව දුන්නේ ඇයි කියලා. අපරාදේ, ඒ විනාඩි හතරත් අරගෙන ඒ ගැන කථා කරන්න තිබුණා.

මම මේ යෝජනාව පිළිබඳව පැහැදිලි කරන්නම්, ඔබතුමන්ලා ඉදිරිපත් කළ කරුණු අතර තිබෙන සැකය දුරු කරන්න. ගරු මන්ත්‍රීතුමනි, මේක රාජ්‍ය සමාගමක්. අපේ ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමාත් සඳහන් කළා, මේක භාණ්ඩාගාර ලේකම්වරයා සතු රාජ්‍ය සමාගමක් කියන එක. රජය සතු අර්ධ රාජ්‍ය සමාගම් තිබෙනවා, අතිවිශාල ප්‍රමාණයක්. මේ, ඒ හා සමාන රාජ්‍ය සමාගමක්. ඒ රාජ්‍ය සමාගමේ සියයට සියයක කොටස් අයිතිය තිබෙන්නේ භාණ්ඩාගාර ලේකම්වරයාට. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය හත්දෙනායි. හත්දෙනාගෙන්, හතරදෙනෙක් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ නියෝජිතයන්. ඇමතිවරයා පත් කරනවා, තුන්දෙනෙක්. එතකොට මේක හත්දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පාලනය වන රාජ්‍ය සමාගමක්. ආර්ථික මධ්‍යස්ථාන 14ක් නොවෙයි ගරු මන්ත්‍රීතුමා, 18ක් තිබෙනවා. ඒ ආර්ථික මධ්‍යස්ථාන 18න්, 2ක් වහලා තිබුණා; අපි ඒවා විවෘත කළා; ඒ, වවුනියාවේ සහ යාපනයේ. මන්ත්‍රීතුමා සභාවෙන් ගියා නේ. මම ඒ ගැන කියන්න හිටියේ. ඒ ගැන අහන්නේත් නැතුව එතුමා සභාවෙන් ගියා. යාපනය විශේෂ ආර්ථික මධ්‍යස්ථානය විවෘත කළා, පසුගිය සැප්තැම්බර් මාසයේ 30වැනි දා. ඒ අනුව සැප්තැම්බර් මාසයේ වවුනියාවේ සහ යාපනයේ ආර්ථික මධ්‍යස්ථාන විවෘත කළා. ඒ අනුව දැන් ආර්ථික මධ්‍යස්ථාන 18ම විවෘතයි.

හැබැයි මේ අතර තිබෙනවා, විශේෂ ආර්ථික මධ්‍යස්ථාන; දඹුල්ල, තඹුත්තේගම, කැප්පෙටිපොළ. මොකද, මේවායේ තමයි වැඩිපුර එළවලු සහ පලතුරු පරිහරණය වෙන්නේ, එහා මෙහා යන්නේ, ගොවීන් වැඩිපුර මැදිහත් වෙන්නේ. මේ ආයතන ටික ක්‍රියාත්මක වනවා වාගේම මේවාට රුපියල් මිලියන 1,085ක් ආයෝජනය කරලා තිබෙනවා. තවම මේ ආයෝජනය ආපසු භාණ්ඩාගාරයට ඇවිල්ලා නැහැ. ඒ නිසා දිස්ත්‍රික් ලේකම්වරු - දිසාපතිවරු - ප්‍රාදේශීය ලේකම්වරු මැදිහත් වෙලා හදපු භාර තිබෙනවා. මේවායේ ක්‍රියාවලිය විවිධයි. එක තැනක තීරණ ගන්න විධියට නොවෙයි අනෙක් තැන තීරණ ගන්නේ. ඒ නිසා විවිධ ක්‍රියාවලි හරහා යනවා, audit queries එනවා, පිළිතුරු නැහැ. අමාත්‍යාංශ 4ක් යටතේ මේ වනකොට මේක ගිහිල්ලා තිබෙනවා. 1998 ස්ථාපිත කරපු දවසේ ඉඳන් අමාත්‍යාංශ 4ක් යටතේ ගිහිල්ලා තිබෙනවා. ඔබතුමාට ඔය තොරතුරු දුන් අයගෙන්ම අහලා බලන්න. තමන් දීපු සල්ලි තිබෙනවා. දඹුල්ලේ කඩ්ඩිය දුන්නා වාගේම කැප්පෙටිපොළ කඩ්ඩිය දුන්නා වාගේම තඹුත්තේගම කඩ්ඩිය දුන්නා වාගේම හැම ආර්ථික මධ්‍යස්ථානයකම කඩ්ඩිය කඩ ගන්න සල්ලි දුන්නා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අද වනකල් දුන්න සල්ලි දමපු accounts නැහැ, දුන්න සල්ලි ගත්ත මිනිස්සුත් නැහැ. මේවාටත් පරීක්ෂණ අපට පටන් ගන්න වෙලා තිබෙන්නේ. මොකද, සල්ලි දුන් මිනිස්සුන්ට සල්ලි දුන් විධියක් නැහැ.

ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා බියක් ඇති කර ගන්න එපා, මේ ආණ්ඩුව කිසිදු රාජ්‍ය ආයතනයක් පෞද්ගලීකරණය කරන්න ආපු ආණ්ඩුවක් නොවෙයි කියන කාරණය විතරක් මතක තබා ගන්න. මොකද, මේක ගොවීන්ගේ විතරක් නොවෙයි, මේ රටේ ආර්ථික ක්‍රියාවලිය ඇතුළේ ගොවියාටත්, පාරිභෝගිකයාටත් අත්‍යවශ්‍ය වෙච්ච මධ්‍යස්ථානයක්; විධිමත්ව මෙහෙයවන්න හදපු සමාගමක්. විධිමත්ව මෙහෙයවන්න හදපු එකක්. මොකද, ආර්ථික මධ්‍යස්ථාන හැටියට තිබෙන සමහර තැන් මේ සමාගම ඇතුළට එන්නෙත් නැහැ. නොරොච්චෝලේ තිබෙනවා, මේකට අයිති නැහැ; වාරියපොළ තිබෙනවා, මේකට අයිති නැහැ; මැදවච්චිය තිබෙනවා, මේකට අයිති නැහැ. හදපු ඒවා. ආර්ථික මධ්‍යස්ථාන ලෙස තැන් තැන්වල හදලා තිබෙනවා. අඩුම ගානේ මේවා මේ ආර්ථික මධ්‍යස්ථාන ක්‍රියාවලියට අයිතිත් නැහැ. තැන් තැන්වල වෙනම හදලා තිබෙන්නේ. අපි මේ කරලා තිබෙන්නේ, මේවා විධිමත් කරන්න කටයුතු කිරීම. මේවා අවිධිමත් ලෙස ක්‍රියාත්මක වුණේ. ආර්ථික මධ්‍යස්ථාන සංකල්පය සම්පූර්ණ dilute කරලා තිබෙන්නේ. ඒ නිසා එක විධියකට ක්‍රියාත්මක වෙන්න, එක

[ගරු වසන්ත සමරසිංහ මහතා]

තැනකින් තීන්දු තීරණ ගන්න මේකට අදාළ කරන පහසුකම් සැපයීමේ ක්‍රියාවලිය තමයි අපි සිදු කර තිබෙන්නේ. ඒ නිසා මේ ආර්ථික මධ්‍යස්ථාන විධිමත් ලෙස ක්‍රියාත්මක කරන්න පමණක් නෙවෙයි, පහසුකම් සපයන්න කටයුතු කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, අපේ රටේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි, පසු අස්වනු හානිය. අපේ රටේ එළවලුවලින් සියයට 30කට පසු අස්වනු හානියක් වනවා, ගොවියාගේ සිට පාරිභෝගිකයා දක්වා එනකොට. ඒක මාර්කට් කිහිපයක් පසු කරගෙන එනවා. ඇසුරුම් ක්‍රමවේදයේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. තවම අපට එළවලු ටික ඇසුරුම් කරන්න ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා ඇසුරුම් ක්‍රමවේදයට අපට උත්තරයක් ඕනෑ. ඒ නිසා අපි දඹුල්ල පදනම් කරගෙන ඇසුරුම් නිෂ්පාදන මධ්‍යස්ථානයක් - factory එකක් - පටන් ගන්න සූදානම් කරමින් තිබෙන්නේ. කොරියාවෙන් දෙනවා fund එකක්; අපි ඒ ගැන සාකච්ඡා කරමින් යනවා. තඹුත්තේගම, දඹුල්ල, කැප්පෙටිපොළ කියන ආර්ථික මධ්‍යස්ථාන තුන පදනම් කරගෙන තමයි, අපි මේ අසුරුම් ක්‍රියාවලිය ප්‍රචලිත කරන්න සූදානම් වෙන්නේ.

ඒ විතරක් නොවෙයි. අපි හදන National Agri Marketing Services Limited කියන සමාගමට තමයි දඹුල්ලේ තිබෙන ශීතාගාරය දෙන්නේ. එතකොට මේක විකුණනවා නම් ශීතාගාරය මේකට දෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. ශීතාගාරය මෙතැනට දෙන්නේ ඇයි? මේකත් එක්කම ශීතාගාරයත් අදාළ වනවා. එකක්, බඩු ටික ගෙනැල්ලා විකුණනවා වාගේම අතිරික්තයක් තිබුණොත් ගබඩා කිරීමේ ක්‍රියාවලියටත් අපට මේක අදාළ වනවා. ඒ වාගේම ගරු මන්ත්‍රීතුමියනි, කරන්ට් එක දෙන ප්‍රශ්නය විතරක් නොවෙයි තිබෙන්නේ; මේ කාරණයත් ඔබතුමියගේ අවබෝධයට කියන්න ඕනෑ. මේක ඉන්දියානු ආධාරයක්. 2019දී පටන් ගත්තේ. හදන්නේ ඉන්දියානු කොන්ත්‍රාත්කරුවෙක්. Consultancy එක කරන්නේ අපේ ලංකාවේ ආයතනයක් - CECB එක. දැන් consultant කියනවා, මේක හදපු ප්‍රමිතිය අප්සෙට් කියලා. කොන්ත්‍රාත්කරුට ගෙවන්න තිබෙනවා, මිලියන 68ක්; ගෙවන්න එපා කියනවා. කොන්ත්‍රාත්කරු කියනවා, ඔයගොල්ලන් ගෙවන්නේ නැත්නම් ඉතුරු වැඩ ටික ඉවර කරන්නේ නැහැ කියලා. ඉතුරු වැඩ ටික ඉවර කරන්නේ නැතිව අපට භාර ගන්න බැහැ. දැන් මොකක්ද ප්‍රශ්නය? මේ දවස් ටිකේ අපේ අරගළය - struggle එක - මොකක්ද? මේ දෙගොල්ලන් එක්ක එකතු වෙලා මේක ඉවර කරලා භාර ගන්න ක්‍රියාවලිය. දැන් අපට මේක භාර ගන්න ඕනෑ. මේක භාර අරගෙන දෙසැම්බර් මාසයේ ඉඳන්ම වැඩ ටික පටන් ගන්න අපි හදන්නේ. මොකද, රජය තීරණය කර තිබෙනවා, අල සහ ලූනු මිලදී ගැනීමේ ක්‍රියාවලිය පටන් ගන්න. අල සහ ලූනු මිලදී ගන්නකොට ගබඩා කිරීමේ පහසුකම් තිබෙන්න ඕනෑ. මේකේ මෙට්‍රික්ටොන් 5,100ක් අපට ගබඩා කරන්න පුළුවන්. ඒකට උපකරණ මිලදී ගන්න රජය මුදල් වෙන් කර තිබෙනවා. අල, ලූනු මිලදී ගන්න මුදල් වෙන් කර තිබෙනවා. ඒ නිසා මේ ක්‍රියාවලිය පටන් ගන්න නම් කොන්ත්‍රාත්කරුවා වැඩ ටික අවසන් කරලා භාර දෙන්න ඕනෑ. Consultancy company එක අපට කියන්න ඕනෑ, මේක භාරගන්න කියලා. මේ දෙකම නැත්නම් අපට ආපහු මුල ඉඳන් ටෙන්ඩර් කරන්න වෙනවා, ඉතුරු වැඩ ටික පටන් ගන්න. එහෙම නැතිව කරන්ට් එක නැති නිසා මේක භාර නොගෙන ඉන්නවා නොවෙයි, ගරු මන්ත්‍රීතුමියනි. ඒ නිසා එතැන ප්‍රශ්නයක් තිබෙනවා. National Agri Marketing Services Limited කියන company එකට මේ ශීතාගාරයත් භාර දීලා තිබෙන්නේ.

තඹුත්තේගම විශාල කරන්න තවත් කඩ ප්‍රමාණයක් අපට හදන්න තිබෙනවා. මේක අපි relocate කරනවා, තඹුත්තේගම railway station එකට. හැබැයි, ඒකට යන්න තව අවුරුදු 3ක් විතර යනවා. ඒ යනකල් තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානය වහලයත් සහිතව ඒ කඩ ටික නැවත අලුත් කරන්න ඕනෑ.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ හදන්න දේවල් ගොඩක් තිබෙනවා. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමා ඒවා ගැන කිව්වා. ප්‍රශ්න ගොඩයි. මිනිසුන්ට විතරක් නොවෙයි, එතැන ඉන්න ව්‍යාපාරිකයන්ටත් ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ප්‍රශ්න ටික විසඳන්න ඕනෑ. එම ප්‍රශ්න ටික විසඳන්න හදපු භාරයන් කටයුතු කරන ආකාරය පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා තිබෙන ප්‍රශ්න ටික විසඳන්න සහ මීට පසුව ප්‍රශ්න නැතිව කටයුතු කරන්න අපි හදන මේ සමාගම විතරක් නොවෙයි, අපි Centre Management Committee හදනවා. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට වාගේම කැප්පෙටිපොළට, තඹුත්තේගමට, නාරාහේන්පිටට මේ හැම ආර්ථික මධ්‍යස්ථානයකටම Centre Management Committee එකක් හදනවා. ඒ Centre Management Committee එකට ව්‍යාපාරික සංගම්, ගොවි සංගම්, ප්‍රාදේශීය සභාව, නගර සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, දිස්ත්‍රික්ක ලේකම් කාර්යාල, පොලීසිය සහ බැංකු කියන හැම ආයතනයක්ම සම්බන්ධ කළ Centre Management Committee එකක් එක්ක අපේ company එකෙනුත් කෙනෙක් සම්බන්ධ වෙලා ඒ අදාළ ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකාරිත්වයට අවශ්‍ය කරන මැදිහත් වීම කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ක්‍රියාවලිය විධිමත් ලෙස එක ආකාරයකට කරගෙන යනවා වාගේම මෙම ක්‍රියාවලිය ඇතුළේ අපට එන audit queries නවත්වන එක විතරක් නොවෙයි, මෙතෙක් කල් මේකට ආයෝජනය කළ සල්ලි නැවත භාණ්ඩාගාරයට ගෙවන්නත්, එම ආයතන වෙනුවෙන් ව්‍යාපාරිකයන් ගෙවපු මුදල් කොහාටද ගියේ කියලා හොයන්නත්, ඒ මුදල් අරගෙන මේ ආයතනවල කඩ ටික බෙදපු කට්ටිය, කඩ ටික බෙදා ගත්තු කට්ටිය පිළිබඳ පරීක්ෂණ වාගේම, ඒ තැන්වලින් තවදුරටත් මහජනතාවගේ මුදල් කොල්ලකන එක නවත්වන්නත් කටයුතු කරනවා. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වැසිකිළියට යන්න ගොවීන්ගෙන් රුපියල් 100ක් ගන්නවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. එම නිසා මෙතැන් සිට සියලු දේවල් නිවැරදි කරන්නත් අවශ්‍ය ලෙස, විධිමත් ආයතන පද්ධතියක් යටතේ ක්‍රියාත්මක කරන්න තමයි National Agri Marketing Services Limited එක අපි පටන් ගත්තේ.

සමහර අයට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා ඒකේ අත්සන් කරන ගිවිසුම මොකක්ද කියලා. සමහර අයට ගිවිසුම දුන්නේ අවුරුදු 30යි කියලා. අවුරුදු පහෙන් පහට ගිවිසුම ඇතුළේ බදු වැඩි කරනවා. සමහර අය හිතාගෙන ඉන්නවා අවුරුදු පහෙන් පහට ඒක ආපහු ටෙන්ඩර් කරයි කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වෙළෙඳාම් කරන්නේ වෙළෙන්දෝ. වෙළෙන්දෝ ටික වෙළෙඳාම් කරනවා. ගොවියෝ බඩු ටික ගෙනැත් දෙයි. වෙළෙඳාම් කරන අයට ඒ අදාළ කඬේ බිස්නස් එක කරගෙන යන්න පුළුවන්. Valuation එකක් කරලා කුලී මුදල වැඩි කරන එක සාමාන්‍ය බදු ගිවිසුමක කොන්දේසියක්. එම නිසා අපි අවුරුදු පහෙන් පහට ගිවිසුමක් දෙනවා. අවුරුදු පහෙන් පස්සේ ඒ valuation එක කරලා, කුලිය වැඩි කරලා ඊළඟ අවුරුදු පහට ආපහු ගිවිසුම දෙනවා. ඒක තමයි අපේ ගිවිසුම. සමහර අය නැති ප්‍රශ්න හදලා, ඔබතුමන්ලාටත් සමහර දේවල් කියනවා ඇති, ප්‍රශ්නයක් හදන්න ඕනෑ නිසා. අර ත්‍රිකුණාමලයේ හැදුවා වාගේ ප්‍රශ්න හදන්න උත්සාහ කරනවා. National Agri Marketing Services Limited එක හැදුවේ - National Agri Marketing (Private) Limited නොවෙයි - සියලු දේවල් විධිමත් ආකාරයෙන් ක්‍රියාත්මක කරන්නයි. ප්‍රයිවෙට් ලිමිටඩ් කියලාත් කැල්ලක් හදාගෙන තිබුණා, මොකද, ඒකේ draft එක දැකලා. ඒකේ draft

එක දැකලා හදාගෙන තිබුණේ. අපි National Agri Marketing Services Limited එකයි හැදුවේ. එම ආයතනය අපි ගොඩනැඟුවේ-

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු ඇමතිතුමා, මේකේ තිබෙන්නේ, "නැෂනල් ඇග්‍රි මාර්කටින් පුද්ගලික සමාගම" කියලා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමාට හම්බ වෙලා තිබෙන්නේ draft එක.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම දන්නේ නැහැ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු මන්ත්‍රීතුමා, "පුද්ගලික සමාගම" කියලා තිබෙන්නේ draft එක. ඔබතුමාට හම්බ වෙලා තිබෙන්නේ, draft එක.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේ අලුතින් දාලා තිබෙන්නේ.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
කවාදාද? දිනය කියවන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඔබතුමාට මම එවන්නම්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔබතුමා දිනය කියවන්න කෝ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මම මේ පනත ඔබතුමාට එවන්නම්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
නැහැ, draft එකක් තිබෙනවා. ඔබතුමා දිනය කියන්න කෝ. "පුද්ගලික සමාගම" කියලා ඉස්සෙල්ලා යෝජනාව තිබුණා. ඒ විතරක් නොවෙයි, අවුරුදු පහෙන් පස්සේ ටෙන්ඩර් කරනවා කියලාත් තිබුණා, ගරු මන්ත්‍රීතුමා. නිලධාරින් එය draft කරද්දී ඒකට අදාළව යෝජනා ආවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. යෝජනා එනකොට ඒ යෝජනා වෙනස් කරලා අපි අලුතින් එය හැදුවා, ගරු මන්ත්‍රීතුමා. ඉතින්, යෝජනා දැකලා භය වෙන්න දෙයක් නැහැ නේ. යෝජනාවට භය වෙන්න ඕනෑ නැහැ. යෝජනා වෙනුවට අවසානයේ අපි කළ දේ දිහායි බලන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, මේ ගැන අවබෝධය තියා ගන්න. අපි රටට යහපත් දෙයක් කරනවා වාගේම ව්‍යාපාරිකයාටත්, ගොවියාටත්, පාරිභෝගිකයාටත් යහපත් දේවල් කරන්න කටයුතු කළා මිස එය කිසිදු ලෙසකින් පෞද්ගලික සමාගමක් කරන්නවත්, එය පෞද්ගලීකරණය කරන්නවත් කටයුතු නොකළා කියන කාරණය බොහොම පැහැදිලිව අවබෝධ කරලා දෙන්න ඕනෑ. ඔබතුමාට දිනය හොයා ගන්න බැරි වුණා නේ. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමා, ඔය draft එක. Draft එක ගෙනැල්ලා ඔබතුමා රැවැට්ටුවාට ඔබතුමාගේ අවබෝධයට මේ කියන්නේ. කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානයේ අය එක්ක අපි සාකච්ඡා කළා. දඹුල්ලේ ආර්ථික මධ්‍යස්ථානයේ අය එක්ක හතර වතාවක් සාකච්ඡා කළා. තඹුත්තේගම ආර්ථික මධ්‍යස්ථානයේ අය එක්කත් හතර වතාවක් සාකච්ඡා කළා. හැමෝටම මේක අවබෝධ කරලා දුන්නා. සමහරුන්ට ප්‍රශ්නයක් තිබෙනවා. එය ප්‍රසිද්ධියේ කියන්න ඕනෑ නැති නිසා මම කිව්වේ නැත්තේ. සමහර අය ඒ කඩ කුලියට දීලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. පොඩි ගණන්වලට නොවෙයි දීලා තිබෙන්නේ. සමහරු භය වුණා කුලියට දීපු ගණන් අනුව, ආපසු කුලී ගෙවන්න වෙයිද කියලා. මට කියන්න ඕනෑ මේකයි. ඒ අය ව්‍යාපාරය කරන එකට අපි විරුද්ධ නැහැ. ඒ අයට ව්‍යාපාර කරගෙන යන්න කියන්න. හැබැයි සාධාරණ කුලියක් අපේ සමාගමට ගෙවන්න ඕනෑ. ඒ සාධාරණ කුලිය වසර පහෙන් පහට අලුත් කරද්දීත් සාධාරණ විධියට අලුත් කරනවා මිස අසාධාරණ ලෙස අලුත් කරන්නේ නැහැ. National Agri Marketing Services Limited එක මේ රටේ ආර්ථිකය ඇතුළේ ව්‍යාපාරිකයන්ටත් පහසුකම් සපයන සමාගමක් බවට පරිවර්තනය කිරීම තමයි අපේ කටයුත්ත, අපේ අරමුණ. ඒ නිසා ඒ සමාගමත් එක්ක වැඩ කරන්න රටේ සියලු ව්‍යාපාරිකයන් එකඟ වෙලා ඉන්නවා කියන කාරණය කියන්න ඕනෑ.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ Cabinet Paper එකක් තිබෙනවා, 2025.05.07. "විශේෂ ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණය පිණිස සීමිත වගකීම් සමාගමක් සංස්ථාවක් කිරීම සඳහා අනුමැතිය" එහි සඳහන් වනවා. *[බාධා කිරීමක්]* සීමිත සමාගමක්.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ඔව්, හරි. පෞද්ගලික නොවෙයි නේ. "සීමිත" කියන එකයි "පෞද්ගලික" කියන එකයි දෙකක්. *[බාධා කිරීමක්]* ඔව්.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
